ලෙනින්

තෝරාගත් කෘති

වෙළුම් දොළහ

*

වෙළුම

8

අපේ කාලයේ ප්‍රධාන කර්තව්‍යය

සෝවියට් ආණ්ඩුවේ හදිසි කර්තව්‍යයන්

විද්‍යා සහ තාක්ෂණික වැඩ සඳහා කෙටුම්පත් සැලැස්ම

''වාමාංශික ළදරු ගතිය'' සහ සුළු ධනපති චිත්ත ස්වභාවය

ඇමෙරිකානු කම්කරුවන්ට ලිපිය

ප්‍රගති ප්‍රකාශක මන්දිරය

ලෙනින් * තෝරාගත් කෘති 8

තෝරාගත් කෘති නවවැනි වෙළුමෙහි වී. අයි. ලෙනින්ගේ පහත දැක්වෙන ලිපි පළවේ:

නිර්ධන පංති විප්ලවය සහ කෞට්ස්කි ද්‍රෝහියා

කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ පළමුවැනි සම්මේලනය
1919 මාර්තු 2–6

ධනපති ප්‍රජාතන්ත්‍රවාදය සහ නිර්ධන පංති ආඥාදායකත්වය ගැන ප්‍රවාද සහ වාර්තාව

රුසියානු කොමියුනිස්ට් (බො) පක්ෂයේ අටවැනි සම්මේලනයේ වාර්තා

https://liberationbase.wordpress.com

සකල දේශවාසී නිර්ධනයිනි, එක්වව්!

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (*NMSG Library* ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

LIBERATIONBASE

සූචිකරණ දත්ත

කෘතිය: ලෙනින් තෝරාගත් කෘති වෙළුම් දොළහ, වෙළුම 8
කතෘ/පරිවර්තක: වී.අයි. ලෙනින්/උ. මු. අබයරත්න
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-22
ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-22, V2:2019-05-29
පිටු ගණන: 272
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com



https://liberationbase.wordpress.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත
කෘතිය: ලෙනින් තෝරාගත් කෘති වෙළුම් දොළහ, වෙළුම 8
කතෘ/පරිවර්තක: වී.අයි. ලෙනින්/උ. මු. අබයරත්න
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-22
ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-22, V2:2019-05-29
පිටු ගණන: 272
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

ලෙනින්

තෝරාගත් කෘති

වෙළුම් දෙළහ

*

වෙළුම

8

මොස්කව්
ප්‍රගති ප්‍රකාශක මන්දිරය

අනුවාදය. උ. මු. අබයරත්න

В. И. Ленин

ИЗБРАННЫЕ ПРОИЗВЕДЕНИЯ В 12 ТОМАХ

Том 8

на языке синхала

LIBERATIONBASE

© සිංහල අනුවාදය, ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්

සෝවියට් දේශයේ මුද්‍රණය කරන ලදී.

Л $\frac{10102—608}{014(01)—81}$ 810—80 0101020000

පටුන

අපේ කාලයේ ප්‍රධාන කර්තව්‍යය 7
අති විශේෂ හතරවැනි සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනය 13
I. සාම ගිවිසුම අනුමත කිරීම පිළිබඳව මාර්තු 14 දින ඉදිරි පත් කළ වාර්තාව 13
II. බ්‍රෙස්ට් ගිවිසුම අනුමත කිරීම ගැන යෝජනාව . . . 32
සෝවියට් ආණ්ඩුවේ හදිසි කර්තව්‍යයන් 35
විද්‍යා සහ තාක්ෂණික වැඩ සඳහා කෙටුම්පත් සැලැස්ම . . . 76
සෝවියට් ආණ්ඩුවේ හදිසි කර්තව්‍යයන් ගැන ප්‍රවාද හය . . . 78
“වාමාංශික” ළදරු ගතිය සහ සුළු ධනපති චිත්ත ස්වභාවය . . 82
වර්තමාන දේශපාලන තත්වය ගැන ප්‍රවාද 115
දුර්භික්ෂය ගැන (පෙට්‍රොග්‍රෑඩ් කම්කරුවන්ට ලිපියක්) 121
ප්‍රථම සමස්ත රුසියා ආර්ථික මණ්ඩල සම්මේලනයේදී කළ කථාව 130
“ජනසතු ව්‍යවසායයන් කළමණාකරණය සඳහා රෙගුලාසි” කෙටුම් පත ගැන අදහස් 139
පස්වැනි සමස්තරුසියා කම්කරු, ගොවිජන, සොල්දදු සහ රතු හමුද නියෝජිත සෝවියට් සභා සම්මේලනය 140
ප්‍රෙස්න්‍යා දිස්ත්‍රික්කයේ රැස්වීමකදී කළ කථාව 165
සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ, මොස්කව් සෝවියට් සභාවේ, පැක්ටරි කාරක සභාවල සහ මොස්කව් වෘත්තීය සමිතිවල ඒකාබද්ධ සැසිවාරයකදී කළ කථාව 167
සහෝදර කම්කරුවනි, අවසාන, තීරණාත්මක සටන සඳහා පෙරට යමු!.. 187
ඇමෙරිකානු කම්කරුවන්ට ලිපිය 193

https://liberationbase.wordpress.com

සමස්ත-රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ, මොස්කව් සෝවියට් සභාවේ, පැක්ටර් කාරක සභාවල සහ වෘත්තීය සමිතිවල ඒකාබද්ධ රැස්වීම 210
පිතිරිම් සරෝකින්ගේ වැරදි පිළිගැනුම 213
සංස්කාරකගේ සටහන් 225
නාමාවලිය 258

අපේ කාලයේ ප්‍රධාන කර්තව්‍යය

රුසියා මව්නි — ඔබ කාලකණ්ණිය,
ඔබ සමෘද්ධිමත්ය, ඔබ බෙලහීනය.[1]

මේ කාලයේ මානව ඉතිහාසය භාරදූර සහ ඉතාමත් දුෂ්කර වංගුවක් පසු කරමින් සිටී. එය ලෝක-විමුක්තිය සඳහා ඉතාමත් වැදගත් වංගුවක් වන බව කෙනෙකුට අතිශයෝක්තියෙන් තොරව කිව හැකිය. එය යුද්ධයේ සිට සාමය දක්වා හැරෙන වංගුවකි; බලවත්ම මංකොල්ලකරුවන් කොල්ලකාගත් වස්තුව ඔවුනතර බෙදා ගැනීමේ නව ක්‍රමයක් ඇති කිරීම උදෙසා, වැඩ කරන සහ පීඩිත ජනතාව කෝටි ගණන් මස් මඩුවට යවමින් කොල්ලකරුවන් අතර කෙරෙන යුද්ධයක සිට, ප්‍රාග්ධනයේ වියගසෙන් නිදහස ලැබීම සඳහා පීඩකයන්ට විරුද්ධව පීඩිතයන් කරන යුද්ධයකට හැරෙන වංගුවකි; වධ වේදනාවේ, චිත්ත සන්තාපනයේ, හාමතේ සහ අවක්‍රමණයේ සිට කොමියුනිස්ට් සමාජය, විශ්වීය සෞභාග්‍යය හා කල්පවත්නා සාමය පිළිබඳ දීප්තිමත් අනාගතයට හැරෙන වංගුවකි. මෙම තියුණු වංගුවේ ඉතාමත් තියුණු නැමිවලදී, පරණ ක්‍රමය සතර වටෙහිම බිඳ වැටෙනු හා බියකරු ලෙස දෙදරා හැලෙනු පෙනෙද්දී සහ විස්තර කළ නොහැකි තරම් දරුණු වධ වේදනා මධ්‍යයේ නව ක්‍රමය බිහි වෙද්දී, අපේක්ෂා භංගත්වයෙන් ඇලලීයන සමහර අය, හිස කැරකිල්ලට පත්වන සමහර අය, සමහර විට, ඉතාමත් අමිහිරි යථාර්ථයෙන් සැඟවීමට මිහිරි හඬ දෙන සහ මෝහනය කරවන වාක්‍ය කොටස් පිටුපස සැඟවෙන සමහර අය සිටීම පුදුමයක් නොවේ.

ඉතිහාසය අධිරාජ්‍යවාදයේ සිට කොමියුනිස්ට් විප්ලවය දෙසට හැරී යන විට එය පසු කළ තියුණු වංගු අතුරෙන් ඉතාමත් තියුණු ඒවා ඉතාමත් පැහැදිලි ලෙස දැකීමේත්, තදබල සහ වේදනා සහගත ලෙස අත් දැකීමේත් ඉරණම රුසියාවට අත් විය. දින කීපයක් අතරතුරදී, අපි ඉතාමත් පැරණි, ඉතාමත් බලවත්, අශිෂ්ට සහ ම්ලේච්ඡ රාජාණ්ඩුවලින් එකක් විනාශ කෙළෙමු. මාස කීපයක් අතරතුරදී අපි ධනපති පංතිය සමග හවුල් කටයුතු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කිරීමේ සහ සුළු ධනපති පංති මායාමත ගසා දැමීමේ අවධි කීපයක් පසු කෙළෙමු. ඒ සඳහා වෙනත් රටවලට අවුරුදු දශක ගණන් අවශ්‍ය විය. සති කීපයක් තුළ ධනපති පංතිය බලයෙන් පහකර දමා, සිවිල් යුද්ධයේදී එහි විවෘත ප්‍රතිරෝධය සුන් කර දැමුවෙමු. අති දැවැන්ත රටක එක් කොනක සිට අනිත් කොන දක්වා බොල්ෂෙවික්වාදය ගමනේ යෙදෙනු අපි අත්දැක ඇත්තෙමු. අපි, සාර්වාදයෙන් සහ ධනපති පංතියෙන් පීඩිත වූ වැඩ කරන ජනතාවගේ පහළම ස්ථරය විමුක්ති සහ නිදහස් ජීවිතයක් දක්වා ඔසවා තැබුවෙමු. අපි සෝවියට් සමූහාණ්ඩුවක් පිහිටුවා එය තහවුරු කෙළෙමු. එය නව වර්ගයේ රාජ්‍යයකි. එය ධනපති පාර්ලිමේන්තුවාදී සමූහාණ්ඩු අතුරෙන් හොඳම එකටත් වඩා අතිශයින්ම උසස්ය. ඊට වඩා ප්‍රජාතන්ත්‍රවාදීය. දුප්පත් ගොවි ජනතාවගේ ආධාරය ලබන නිර්ධන පංති ආඥාදායකත්වය පිහිටවූ අපි පුළුල් ලෙස කල්පනා කර බලා ඇති සමාජවාදී ප්‍රතිසංස්කරණ මාලාවක් ආරම්භ කෙළෙමු. අපි, සියළුම රටවල සිටින කෝටි සංඛ්‍යාත කම්කරුවන් තුළ, ඔවුන්ගේ ශක්තිය කෙරෙහි වූ විශ්වාසය පුබුදු කෙළෙමු. එසේම ඔවුන් තුළ උද්යෝගයේ ගිනි සිළු දැල්වූයෙමු. සකල දේශයෙහිම ලෝක කම්කරු විප්ලවයක් සඳහා වූ හඬනැගීම කෙළෙමු. අපි සියලුම රටවල කොල්ලකරු අධිරාජ්‍යවාදීන් වෙත අභියෝගයක් කෙළෙමු.

ඊළඟට, නිරායුධව සිටින අය මතට කඩා වැදුනු අධිරාජ්‍යවාදී මංකොල්ලකරුවා විසින් අප බිම හෙළන ලදී. මෙතෙකැයි කිව නොහැකි තරම් බරක් අප පිට දමන හා අවමානකාරී වන සාමයක්[2] අත්සන් කරන ලෙස, ඔහු අපට බල කළේය. ඔහු එසේ කළේ අධිරාජ්‍යවාදී යුද්ධයේ අයෝමය ග්‍රහණයෙන් මඳ කලකට හෝ බිඳී වෙන්වීමට තරම් නිර්භීත වීම ගැන අපෙන් කප්පම් ගැනීමක් වශයෙනි. තමන්ගේම රටෙහි කම්කරු විප්ලවයේ සෙවනැල්ල වඩ වඩාත් තර්ජනාත්මක ලෙස නැගී ආ තරමට, රුසියාව මිරිකා දැමීමෙහි දී, මොටකර දැමීමෙහිදී සහ ඇය කැබලිවලට ඉරා දැමීමෙහිදී මංකොල්ලකරුවා දක්වන රෞද්‍රභාවය වැඩිවන්නේය.

අපට ''ටිල්සිට්''[3] සාම ගිවිසුමක් අත්සන් කිරීමට සිදුවිය. අපට ආත්ම වංචනයක් අවශ්‍ය නැත. අම්හිරි සහ සැරසිළි රහිත සත්‍ය සමග අපි මුහුණට මුහුණ බැලිය යුත්තෙමු. අප තල්ලුකර දමනු ලැබ තිබෙන ඒ පරාජයේ, කැබලි කර දැමීමේ, වහල් භාවයේ සහ අවමානයේ පාතාලය සම්පූර්ණයෙන්ම, එහි පතුළ දක්වාම, මිනිය යුත්තෙමු. අපට මෙය වඩාත් පැහැදිලි ලෙස අවබෝධ වුනු තරමට, විමුක්තිය සඳහා වූ අපගේ ආත්ම ශක්තියත්, වහල් භාවයේ සිට නැවත නිදහස දක්වා නැගීමට ඇති අපගේ අභිලාෂයත්, මොන කැප කිරීමක් හෝ කර රුසියාව කාලකණ්ණි නොවන හා බෙලහීන නොවන බව මෙන්ම, වචනයේ පූර්ණ අර්ථයෙන්ම ඇය

මහ බලවත් වන සහ සමෘද්ධිමත් වන බව සහතික කිරීමට ඇති අපගේ අචල අධිෂ්ඨානයත්, තව තවත් දැඩි වන්නේය, ශක්තිමත් වන්නේය, පන්නරය ලබන්නේය.

තවද, මහ බලවත් සහ සමෘද්ධිමත් වීමේ හැකියාවද ඇයට ඇත. මක්නිසාදයත්, සැම සියලු දෙනාටම සෞභාග්‍යමත් තත්වයෙන් නොවුවත්, යටත්පිරිසෙයින් ප්‍රමාණවත් තරම් ජීවන මාධ්‍යයන්වත් සැපයීමට සෑහෙන තරම් භූමිප්‍රමාණයක් සහ ස්වාභාවික සම්පත් තවමත් අපට ඉතිරිව ඇති හෙයිනි. අපට ඇති ස්වාභාවික සම්පත්, අපගේ මිනිස් බලය සහ ශ්‍රේෂ්ඨ විප්ලවයෙන් ජනතාවගේ නිර්මාණශීලී බලවේගයන්ට ලැබී තිබෙන මාහැඟි දිරිගැන්වීම, සැබැවින්ම මහ බලවත් සහ සමෘද්ධිමත් රුසියාවක් ගොඩ නැගීමට ප්‍රමාණවත් සාධක වෙයි.

රුසියාව සියලු දුර්මුඛකම් සහ සියලු වදන් හරඹ ඉවතලන්නී නම්, අද දත් විකාගෙන ඇගේ සියලු බලවේගයන් මෙහෙයවන්නී නම් සහ ඇගේ සැම නහරයක්ම හා මස් පිඬුවක්ම සම්පූර්ණ ශක්තියෙන් ක්‍රියාත්මක කරන්නී නම්, එකම ගැලවිල්ල තිබෙන්නේ අප ආරම්භ කර තිබෙන ලෝක සමාජවාදී විප්ලවයේ මාර්ගය ඔස්සේ යාමෙන් පමණක් බව ඇය වටහා ගන්නී නම්, ඇය මහ බලවත් සහ සමෘද්ධිමත් වනු ඇත. පරාජය වීමෙන් පසුබට නොවී එම මාර්ගය ඔස්සේ පෙරට ගමනේ යෙදෙනු. ගලින් ගල තබන සේ ශක්තිමත් ලෙස සමාජවාදී සමාජයේ අත්තිවාරම දමනු. විනය සහ ස්වයං විනය ස්ථාපිත කිරීම සඳහා මුළු වැර යොදා වැඩ කරනු. සංවිධානවත් භාවය, ක්‍රමානුකූල භාවය, කාර්යක්ෂමතාවය සහ ජනතා බලවේගයන්ගේ සංගත සහයෝගය සැම තන්හිම තහවුරු කරනු. නිෂ්පාදනය හා බෙදහැරීම කෙරෙහි අංග සම්පූර්ණ ගිණුම් තැබීම සහ පාලනය ක්‍රියාත්මක කරනු. යුද්ධමය සහ සමාජවාදී බලය ගොඩ නගා ගන්නා මාර්ගය එය ය.

බරපතල පරාජයට පත්වීමෙන් පසුව වාගාඩම්බර දෙඩීම හෝ බලාපොරොත්තු සුන් කර ගැනීම නියම සමාජවාදියෙකුට තරම් නොවේ. අප සිටින්නේ කිසිම ජයක් නොගත හැකි තත්වයක යයි කීම, අපට ඇත්තේ මෙම කෲර ගිවිසුමෙන් නියෝජනය කෙරෙන පරිදි ''නින්දනීය'' ලෙස (පෝලන්ත රදළයින්ගේ අර්ථයෙන් නින්දනීය ලෙස) මියයාම හෝ ජයගත නොහැකි සටනක් කරමින් ''නිර්භීත'' ලෙස මියයාම හෝ යන දෙකෙන් එකක් තෝරා ගැනීම පමණකැයි කීම සත්‍ය නොවේ. ''ටිල්සිට්'' සාමයක් අත්සන් කිරීමෙන් අප අපගේ පරමාර්ථ හෝ අපගේ මිතුරන් හෝ පාවාදී ඇතැයි කීම සත්‍ය නොවේ. අපි කිසිම දෙයක් හෝ කිසිම කෙනෙක් පාවා නොදුන්නෙමු. අපි කිසිදු බොරුවක් ශුද්ධත්වයෙහි ලා සැලකීම හෝ වසංකිරීම නොකෙළෙමු. කුමණ මිතුරෙක් හෝ සහෝ-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දරයෙක් වුව අභාග්‍යයට පත් අවස්ථාවක, අපට හැකි සෑම ආකාරයෙන්ම හා ඇති මුළු ශක්තියෙන්ම ඔහුට ආධාර කිරීම අපි කිසි විටෙකත් ප්‍රතික්ෂේප නොකෙළෙමු. තමන්ගේ හමුදාව පරාජයට පත්වූ විට, නැතහොත් බිය වැද පළා දුවන විට ඉන් ඉතිරි කොටස රට අභ්‍යන්තරයට පසුබස්වන හෝ, එසේ නැතහොත්, ඉතාමත් දුෂ්කර අවස්ථාවක එම පසු බැසීමට ආරක්ෂාව සලසනු සඳහා කෲර සහ අපහාසකාරී සාමයක් ඇති කරගන්නා හමුදාපති වරයෙක්, තමන්ගේ ආධාරයක් ලැබිය නොහැකිව හා සතුරා විසින් කොන් කරනු ලැබ සිටින තමන්ගේ එම හමුදා කොටසට එයින් කරන්නේ ද්‍රෝහි කමක් නොවේ. එවැනි හමුදාපතිවරයෙක් තමන්ට තවදුරටත් රැකගත හැකි කොටස රැක ගැනීමේ එකම මාර්ගය තෝරා ගැනීමෙන්, නොසැලකිලිමත්ව ඔට්ටු අල්ලන කලෙක මෙන් ක්‍රියා කිරීමට ප්‍රතික්ෂේප කිරීමෙන්, ජනතාවට අමිහිරි සත්‍යය හපන්කමක් ලෙස හුවා නොදක්වීමෙන්, ‘‘කාලය ලබා ගැනීමට අවකාශය කැප කිරීමෙන්’’, තමන්ගේ හමුදාව බිඳී විසිරී ගොස් හා අධෛර්යයට පත්ව ඇති කලෙක, තම බලවේග එකලස් කර ගැනීමටත්, තම හමුදාවට විවේකය හෝ සුවය ලැබීම පිණිස ඉඩ දීමටත්, ඕනෑම සහ සෑම පහසුවක්ම වාසියට හරවා ගැනීමෙන් කරන්නේ ස්වකීය යුතුකම ඉටු කිරීම ය.

අපි ‘‘ටිල්සිට්’’ සාමයක් අත්සන් කර ඇත්තෙමු, 1807 දී ටිල්සිට් සාමය අත්සන් කරන ලෙස පළමුවැනි නැපෝලියන් ප්‍රැසියාවට බල කරන විට එම ජයග්‍රාහී ආක්‍රමණිකයා මුළු මහත් ජර්මන් හමුදාවම විනාශ කළේය. ඔවුන්ගේ අගනුවර සහ විශාල නගර සියල්ලම අත්පත් කරගත්තේය. තමන්ගේම පොලිස් හමුදාව එරටට ගෙන ආවේය. තමන්ට, එනම්, ජයග්‍රාහී ආක්‍රමණිකයාට, අළුත් කොල්ලකාරී යුද්ධ කිරීම සඳහා අවශ්‍ය අතිරේක හමුදා සපයන ලෙස පරාජිත රටට බල කරන ලදී. එසේම, සමහර ජර්මන් රාජ්‍යයන් සමග අනිත් ජර්මන් රාජ්‍යයන්ට විරුද්ධව සන්ධානයන් ඇති කර ගත් ආක්‍රමණිකයා ජර්මනිය කැබලි කළේය. එසේ නමුත්, එවැනි සාමයකින් වුව නොනැසී ආරක්ෂාවී, තමන්ගේ බලවේගයන් සංවිධානය කරගෙන නැගී සිටීමට සහ විමුක්තිය හා නිදහස සඳහා අයිතිය දිනා ගැනීමට ජර්මන් ජනතාවට හැකි විය.

සෑම තත්වයක්ම යටතේ අවමානකාරී සාමයක් යනු විනාශයේ අගාධයක් වන අතර යුද්ධය, වීරත්වයේ සහ ගැලවීමේ මාර්ගයක් යයි අදහස් කිරීම කොතරම් බොළඳ ද යනු, කල්පනාව ඇති සහ කල්පනා කිරීමට කැමති සියලු දෙනාටම ටිල්සිට් සාමයේ (එය ඒ කාලයේ ජර්මන්වරු මත බලෙන් පටවන ලද අවාසිදායක සහ අපහාස සහගත ගිවිසුම්වලින් එකක් පමණක් විය) ආදර්ශයෙන් මනාව පැහැදිලි විය. ඉතිහාසයේ දී සාමය ඉස්පාසුවක් සහ නව සටන් සඳහා බලවේග සංවිධානය කරගැනීමේ

මාර්ගයක් ලෙසට ප්‍රයෝජනවත් වීය යන පාඩම යුද්ධ කාලසීමාවලින් අපට ලැබී ඇත. ටිල්සිට් සාමය ජර්මනියට මහා අපහාසයක් වූයේය. නමුත්, ඒ අතරම, ශ්‍රේෂ්ඨ ජාතික පුනර්ජීවයක් වෙත හැරීමද එයින් සලකුණු විය. එවකට බලපැවති ඓතිහාසික කොන්දේසි යටතේ මෙම පුනර්ජීවය හැරවිය හැකිව තිබුණේ ධනපති පංති රාජ්‍යයක් පැත්තට පමණකි. අවුරුදු සියයකට වඩා ඈත ඒ අතීතයේදී කම්කරු සහ ගොවිජන පොදු ජනකාය නිද්‍රාශීලීව හා උදාසීනව සිටි අතර, ඉතිහාසය නිර්මාණය කෙරුණේ වංශවතුන් අතලොස්සක් සහ ධනපති බුද්ධිමතුන් දෙතුන් දෙනෙක් විසිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඒ කාලයේ ඉතිහාසයේ ගමන ඉතාමත් අඩුවේගී බඩගෑමක් පමණක් විය.

නමුත් දැන් ධනපති ක්‍රමය නිසා සංස්කෘතික මට්ටම ඊට වඩා බෙහෙවින් උසස් වී ඇත. එය විශේෂයෙන්ම, පොදු ජනතාවගේ සංස්කෘතිය උසස් කර තිබේ. යුද්ධය විසින් පොදු ජනතාවගේ අතිමහත් දුක් කම්කටොළුත් සමග ඔවුන් අවදි කරන ලදී. යුද්ධය නිසා ඉතිහාසයට නම්‍යතාවය ලැබී තිබේ. දැන් එය ධූම යන්ත්‍රයක වේගයෙන් ඉගිලෙයි. දැන් ඉතිහාසය දශලක්ෂ සහ කෝටි සංඛ්‍යාත ජනතාවන් විසින් ස්වාධීන ලෙස නිමවනු ලබන්නකි. දැන් ධනපති ක්‍රමය සමාජවාදයට සුදුසු සේ මෝරා ඇත.

එහෙයින් දැන් රුසියාව ‘‘ටිල්සිට්’’ සාමයක සිට ජාතික පුනර්ජීවයක් වෙත, මහා දේශප්‍රේමී යුද්ධයක් වෙත, ගමන් කරමින් සිටින බව නිසැකය. එය එසේ නම්, එම ගමන යොමුවිය යුත්තේ ධනපති රාජ්‍යයක් පැත්තට නොවේ. එය යොමුවිය යුත්තේ ලෝක සමාජවාදී විප්ලවය දෙසට ය. 1917 ඔක්තෝබර් 25 දින පටන් අපි ආරක්ෂාවාදීන් වී සිටියෙමු. අපි ‘‘පිතෘභූමිය ආරක්ෂා කිරීමට’’ පක්ෂ වෙමු. නමුත් අප ළඟා වෙමින් සිටින්නේ, සමාජවාදී පිතෘ භූමියක් සඳහා වූ, සමාජවාදය පිතෘ භූමිය කොට ගත්තා වූ, සමාජවාදයේ ලෝක හමුදාවේ එක් සේනාංකයක් වන සෝවියට් සමූහාණ්ඩුවක් සඳහා වූ දේශප්‍රේමී යුද්ධයක් වෙත ය.

‘‘ජර්මන්වරුන්ට වෛර කරනු. ජර්මානුවන් මරා දමනු’’ — සාමාන්‍ය, එනම්, ධනපති දේශප්‍රේමයේ සටන් පාඨය වූයේ හා වන්නේ එය ය. නමුත් අපි මෙසේ කියමු. ‘‘අධිරාජ්‍යවාදී මංකොල්ල කරුවන්ට වෛර කරනු. ධනපති ක්‍රමයට වෛර කරනු. ධනපති ක්‍රමය නසා දමනු.’’ නමුත් ඒ අතරම ‘‘ජර්මන්වරුන්ගෙන් උගෙන ගනිමු! ජර්මන් කම්කරු පංතියේ සහෝදරාත්මක සංධානයට විශ්වාසය තබන්න. ඔවුහු අපගේ ආධාරයට ඒමට ප්‍රමාදය හ. අපි කාලය ලබා ගනිමු. ඔවුන් අපගේ ආධාරයට එනු දැකීමට අපි ජීවත්ව සිටින්නෙමු. ඔවුන් එසේ එනු නිසැකය.’’

ඔවු, ජර්මන්වරුන්ගෙන් උගෙන ගනිමු! ඉතිහාසය ගමන් ගන්නේ ඇද කුද සහිත වට වංගු මාර්ගවලිනි. දැන් ජර්මානුන් විසින් මූර්තිමත්

https://liberationbase.wordpress.com

කෙරෙන්නේ තිරශ්චීන අධිරාජ්‍යවාදයක් පමණක් නොවේ. ඊට අමතරව නවීන යන්ත්‍ර කර්මාන්තය පදනම් කරගත් විනයේ, සංවිධානයේ, සංගත සහයෝගිතාවය පිළිබඳ ප්‍රතිපත්තියේ සහ දැඩි ගිණුම් තැබීමේ හා පාලනයේ ද මූර්තිය ඔවුන් වී තිබේ.

එසේම අපට අඩුව ඇත්තේ ද එය ය. අප උගෙන ගත යුත්තේ ද එයමය. විජයග්‍රාහී ලෙස ආරම්භ වූ අපගේ ශ්‍රේෂ්ඨ විප්ලවය, පිට පිට එන දුෂ්කරතාවයන් මාලාවක් මැද්දෙන් ඉදිරියට යමින් එහි විජයග්‍රාහී අරමුණු ඉටුකර ගැනීම සඳහා එම විප්ලවයට අවශ්‍ය වන්නේ ද එයම ය. කාලකණ්ණිකම සහ බෙලහීන කම කෙළවර කර දමනු සඳහාත් සදාකාලිකවම මහ බලවත් සහ සමෘද්ධිමත් වීම සඳහාත්, රුසියානු සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවට අවශ්‍ය වන්නේද එයම ය.

1918 මාර්තු 11

''ඉස්වෙස්තියා ව්ට්සික්'', අංක 46, 1918 මාර්තු 12

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 36, පිටු 78-82

අති විශේෂ හතරවැනි සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනය[4]

1918 මාර්තු 14-16

සාම ගිවිසුම අනුමත කිරීම පිළිබඳව මාර්තු 14 දින ඉදිරි පත් කළ වාර්තාව

සහෝදරවරුනි, රුසියානු විප්ලවයේ සන්ධිස්ථානයක් සලකුණු කරන ප්‍රශ්නයක් ගැන අපට අදදින තීරණය කිරීමට සිදුවී තිබේ. එය රුසියානු විප්ලවයේ පමණක් නොව ජාත්‍යන්තර විප්ලවයේද සන්ධිස්ථානයක් සලකුණු කරන්නකි. එනිසා, සෝවියට් බලයේ නියෝජිතයන් විසින් බ්‍රෙස්ට්-ලිතොව්ස්ක්හිදී ඇති කරගන්නා ලද සහ සම්මත කරන ලෙස නැතහොත් අනුමත කරන ලෙස සෝවියට් බලය ඔබට කියන, මෙම ඉතා අහිතකර සාම ගිවිසුම ගැන නිවැරදි ලෙස තීරණයක් ගත යුතුව ඇත. මෙම ප්‍රශ්නය ගැන නිවැරදි ලෙස තීරණයක් ගැනීම සඳහා, අප දැනට පැමිණ සිටින සන්ධිස්ථානයේ ඓතිහාසික අර්ථය ගැන අවබෝධයක්ද, විප්ලවයේ වර්ධනයේ මේ දක්වා වූ ප්‍රධාන අංග ලක්ෂණය, බරපතල ලෙස පරාජය වීමට ප්‍රධාන හේතුව සහ අප පසුකළ අතිශය දුෂ්කර තත්වයන් ගැන අවබෝධයක්ද ලබා ගැනීම අපට වෙන කවර දකටත් වඩා අවශ්‍ය වන්නේය.

මෙම ප්‍රශ්නය ගැන සෝවියට් පක්ෂ අතර අසමඨයට[5] ප්‍රධාන වශයෙන් හේතුවී තිබෙන්නේ, අධිරාජ්‍යවාදය විසින් සෝවියට් සමූහාණ්ඩුව පරාජය කරනු ලැබීම ගැන ඇතිවන යුක්ති යුක්ත සහ සාධාරණ කෝපය පිළිබඳ හැඟීමට ඉතා පහසුවෙන්ම යට වන සමහර අය සමහරවිට ඉතා ලෙහෙසියෙන්ම බලාපොරොත්තු සුන් කර ගත් තත්වයට පත් වී, විප්ලවයේ කොන්දේසි වර්තමාන සාමයේ කාලය දක්වා සංවර්ධනය වූ ආකාරය සහ සාමයෙන් පසුව අපට ඒවා පෙනෙන ආකාරය ගැන නොසලකා හැරීම බව මට හැඟී යයි. ඒ ගැන සැලකිල්ලට ගන්නවා වෙනුවට, ඔවුහු තමන්ගේ ක්ෂණික හැඟීම් පදනම් කරගෙන, විප්ලවයේ උපක්‍රම පිළිබඳ ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරති. එසේවුවද විප්ලවවල මුළු ඉතිහාසයම අපට උගන්වන්නේ අනිකකි. ඒ අනුව පොදු ජන ව්‍යාපාරය, නැත-

https://liberationbase.wordpress.com
LIBERATIONBASE

හොත්, පංති අරගලය ගැන අප කටයුතු කරන විට, විශේෂයෙන්ම, අතිවිශාල රටක වුවද, එක රටක් මුළුල්ලේ පමණක් නොව, සියළුම ජාත්‍යන්තර සම්බන්ධකම් ද හසුවන සේ සංවර්ධනය වන වර්තමාන අරගලය වැනි එකක් සම්බන්ධයෙන් කටයුතු කරන විට, අපි ප්‍රථමයෙන්ම සහ අන් සියල්ලටම වඩා, වාස්තවික තත්වය ගැන අගය කිරීමක් මත අපගේ උපක්‍රම පදනම් කළ යුත්තෙමු. විප්ලවය මෙම මොහොත දක්වා අනුගමනය කළ ගමන් මාර්ගයක්, එතරම් තර්ජනාත්මක හා එතරම් තියුණු, එමෙන්ම අපට එතරම් අවාසිදයක වෙනසක් එහි ඇතිවීමට හේතුවක්, පරීක්ෂා කර බැලිය යුත්තෙමු.

අපි එම දෘෂ්ටි කෝණයෙන් අපගේ විප්ලවයේ සංවර්ධනය ගැන පරීක්ෂා කරන්නෙමු නම්, එය මේ දක්වා සාපේක්ෂ වශයෙන් හා බොහෝ දුරට පෙනෙන ලෙසට ස්වාධීන වූ සහ තාවකාලික වශයෙන් ජාත්‍යන්තර සම්බන්ධකම්වලින් නිදහස් වූ කාල පරිච්ඡේදයක් බව අපට පැහැදිලිව පෙනේ. 1917 පෙබරවාරි පටන් ජර්මන් ප්‍රහාරය ආරම්භ වූ දිනය වන මෙම වර්ෂයේ පෙබරවාරි 11 දින දක්වා වූ කාලයේ දී අපගේ විප්ලවය ගමන් කළේ බොහෝ දුරට පහසු සහ සීඝ්‍ර ජයග්‍රහණ සහිත මාර්ගයක් ඔස්සේ ය. එම විප්ලවය ජාත්‍යන්තර වශයෙන් සංවර්ධනය වූ ආකාරය ගැන අපි රුසියානු විප්ලවයේ ස්ථාවරයෙන් පමණක් අධ්‍යයනය කරන්නෙමු නම්, ගත වූ අවුරුද්ද තුළ අප කාල පරිච්ඡේද තුනක් පසු කර තිබෙන බව අපට පැහැදිලිව පෙනෙනු ඇත. ඉන් පළමුවැන්න, රුසියාවේ කම්කරු පංතිය සහ එය සමග එකතු වූ දියුණු, පංති විඥනය ඇති සහ ක්‍රියාශීලී ගොවිජන කොටස් සියල්ලම විසින් සුළු ධනපති පංතියේ පමණක් නොව ලොකු ධනපති පංතියේද ආධාරය ඇතිව දින කීපයක් ඇතුළත රාජාණ්ඩුව අතුගා දමන ලද කාලය ය. මෙම මවිතකර ජයග්‍රහණයට හේතු වූයේ එක් අතකින් රුසියානු ජනතාව 1905 අත් දැකීම්වලින් මහත් විප්ලවවාදී සටන්කාරී ශක්‍යතා සංචිතයක් අත් කරගෙන තිබීම සහ අනිත් අතින් අන්ත නොදියුණු රටක් වූ රුසියාව අන් සෑම රටකටම වඩා යුද්ධයෙන් අලාභ හානි විඳ තිබුණු අතර පරණ රාජ්‍ය පාලනය යටතේ තවදුරටත් කිසිසේත් යුද්ධය කරගෙන යාමට නොහැකි අවධියකට එය ඉතා ඉක්මනින්ම පත්ව තිබීම ය.

මෙම කුණාටු සහිත කෙටි ජයග්‍රහණ ලත් කාලයේදී නව සංවිධානයක්, එනම්, කම්කරු, ගොවිජන සහ සොල්දාදු නියෝජිත සෝවියට් සභා නිර්මාණය විය. ඉන් පසුව අපගේ විප්ලවය සංක්‍රමනීය ස්වභාවයක් ගත් දීර්ඝ මාස ගණන් වූ කාලයක් විය. මෙම කාලය තුළ සෝවියට් සභා නිසා වහාම දුර්වල වූ ධනපති පංති ආණ්ඩුව එයට ආධාර කළ සම්මුතිවාදී සුළු ධනපති පක්ෂ විසින්, එනම් මෙන්ෂෙවික් සහ සමාජවාදී-විප්ලවවාදී

පක්ෂ[6] විසින් ආරක්ෂා කරගන්නා සහ ශක්තිමත් කරන ලදී. එම ආණ්ඩුව අධිරාජ්‍යවාදී යුද්ධයට සහ අධිරාජ්‍යවාදී රහස් ගිවිසුම්වලට ආධාර කළේය; කම්කරු පංතිය සැනසීමට පොරොන්දු දුන්නේය; නියම වශයෙන් කිසිවක් නොකළ අතර, ආර්ථික විනාශයේ තත්වය පවත්වා ගත්තේය. අපට, රුසියානු විප්ලවයට, දීර්ඝ කාලයක් වූ මේ සමයේ දී සෝවියට් සභා ඒවායේ බලවේග සංවිධානය කරගත්තේය. රුසියානු විප්ලවයට එය දීර්ඝ කාලයක් වූ නමුත්, ජාත්‍යන්තර දෘෂ්ටි කෝණය අනුව එය කෙටිකාලයක් විය. මන්දයත්, ප්‍රධාන රටවල් බොහොමය කම සුළු ධනපති මායා මත පරාජය කිරීමේ සහ විවිධ පක්ෂ, කණ්ඩායම් සහ උපනති විසින් කරන ලද පාවාදීම්වල කාලසීමාව මාස ගණන් නොව දශක ගණන් දීර්ඝ වූ බැවිනි. අප්‍රේල් 20 දින[7] පටන් ජූනි මස[8] කෙරෙන්ස්කි තෙමේ යුද්ධය අළුත් කළ මොහොත (රහස් අධිරාජ්‍යවාදී ගිවිසුම ඔහුගේ මඩියේ වියේ) දක්වා වූ කාලාන්තරය තීරණාත්මක විය. මෙම දෙවැනි කාල පරිච්ඡේදයට අපගේ ජූලි මස පරාජය[9] සහ කර්නිලව් කැරැල්ලද[10] අයත් විය. ඉන් පසුව ඔක්තෝබර් විප්ලවයට බිම සකස්වූයේ සුළු ධනපති සම්මුති සියල්ලක්ම ඵල රහිත බව දේශනා මගින් නොව තමන්ගේම අත් දැකීම් අනුව කම්කරු පංතියට සහ ගොවි ජනතාවට අවබෝධ වූ පසු පමණකි. එනම්, දීර්ඝ දේශපාලන සංවර්ධනයකින්ද, දීර්ඝ සූදනම් වීමකින් සහ පක්ෂ කණ්ඩායම්වල ඉරියව් සහ අදහස් වෙනස් වීමෙන්ද පසුව පමණකි. රුසියානු විප්ලවය ලෝක විප්ලවයෙන් කොන්වී, නැතහොත්, තාවකාලික වශයෙන් එයින් වෙන්වී තිබුණු, ඒ මුල් අවධියේ තුන්වැනි කාල පරිච්ඡේදයට එය සම්ප්‍රාප්ත වූයේ ඉන් පසුව පමණකි.

සංවිධාන කිරීමේ සමය වූ මෙම තුන්වැනි, නැතහොත්, ඔක්තෝබර් කාල පරිච්ඡේදය වඩාත්ම දුෂ්කර එකක් විය.ඒ අතරම, එය ඉතාමත් විශාල සහ ඉතාමත් සීඝ්‍ර ලෙස ජයග්‍රහණ ලැබූ කාලය විය. ඔක්තෝබරයෙන් පසුව අපගේ විප්ලවය ජයග්‍රාහීව විජයෝන්නත ලෙස ඉදිරියට ගියේය. අපගේ එම විප්ලවය නිර්ධන පංතියට බලය අත්පත් කර දුන්නේය; නිර්ධන පංති ආඥදායකත්වය ස්ථාපිත කළේය; එම ආඥදායකත්වය සඳහා නිර්ධන පංතියේ හා දුප්පත් ගොවිජනතාවගේ අති බහුතරයෙහි කැමැත්ත දිනා ගත්තේය. අනතුරුව අධිරාජ්‍යවාදීන්ගෙන් කොටසක සහයෝගය ලබමින් සූරාකන්නන්, ඉඩම්හිමියන් සහ ධනපතියන් දක්වන ප්‍රතිරෝධයේ ස්වභාවයෙන් රුසියාව සෑම තන්හිම සිවිල් යුද්ධය ආරම්භවිය.

සිවිල් යුද්ධය ආරම්භ වූ පසු සෝවියට් බලයේ සතුරන්ගේ බලවේග, වැඩ කරන සහ සූරා කනු ලබන ජනතාවගේ සතුරන්ගේ බලවේග ඉතා සුළු බව එම යුද්ධයේදී ඔප්පු විය. සෝවියට් බලයේ සතුරන් වූ සූරා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කන්නන්ට, ඉඩම් හිමියන්ට හා ධනපතියන්ට දේශපාලන සහයෝගය වත්, ආර්ථික සහයෝගයවත් නොලැබුණු හෙයින්, ඔවුන්ගේ ප්‍රහාරය බිඳ වැටුනු අතර, සිවිල් යුද්ධය දිගින් දිගටම සෝවියට් බලයේ විජයග්‍රහණයක් විය. ඔවුන්ට විරුද්ධව කෙරුණු අරගලය, යුද්ධමය ප්‍රහාරයකට වඩා උද්ඝෝෂණයක් විය. කොසාක්වරුන්[11] දක්වාම ජනතාව කොටසින් කොටස, ජනකායයෙන් ජනකායය, තමන් සෝවියට් බලයෙන් බැහැරට මෙහෙයවීමට උත්සාහ කරන සූරාකන්නන් අත්හැර දැමූහ.

නිර්ධන පංති ආඥාදායකත්වයේ සහ සෝවියට් බලයේ මෙම ජයග්‍රාහී සහ විජයෝන්නත ඉදිරි ගමනේ කාලයේ දී, රුසියාවේ වැඩ කරන සහ සූරා කනු ලබන මහා ජනතා කොටස් නිශ්චිත ලෙස සහ නොවෙනස් කළ හැකි ලෙසට සෝවියට් බලය පැත්තට ඇදී ගියේය. මේ දක්වා ලෝක අධිරාජ්‍යවාදයෙන් නිදහස සේ පෙනීමට තිබුණු තත්වයන් යටතේ ඉදිරියට යමින් තිබුණු රුසියානු විප්ලවයේ සංවර්ධනයේ අවසාන උච්ඡතම ලක්ෂය මෙම කාල පරිච්ඡේදයෙන් නියෝජනය විය. ඉතාමත් නොදියුණු සහ 1905 අත්දැකීම් අනුව විප්ලවය සඳහා සූදානම අතින් ඉහළම තත්වයක් දැරූ රටකට, රුසියානු විප්ලවයේ පමණක් නොව, බටහිර යුරෝපීය කම්කරුවන්ගේ විප්ලවයේද උසස්ම නිර්මාණය වූ ඒ දේශපාලන ව්‍යුහය වෙත එළඹෙන තෙක් විවිධ දේශපාලන පෙළගැසීම් බැහැර කරමින් සීඝ්‍ර ලෙස, පහසුවෙන් සහ ක්‍රමානුකූලව පංතියකින් පසුව තවත් පංතියක් යන ආකාරයෙන් බලයට පත් කළ හැකිවූයේ එහෙයිනි. එසේ කළ හැකි වූයේ සෝවියට් බලය රුසියාවේ තහවුරු කර තිබුණු හෙයින්ද, පීඩනයේ යන්ත්‍රයක් වූ පැරණි රාජ්‍යය විනාශ කිරීම සහ පැරිස් කොමියූනයේ[12] පූර්වාදර්ශය අනුව ගිය නව උසස් ආකෘතියක රාජ්‍යයට අත්තිවාරම දැමීම තුළින් එය වැඩ කරන සහ පීඩිත ජනතාවගේ සම්පූර්ණ අනුගාමිකත්වය දිනාගෙන තිබුණ හෙයින්ද වේ. පැරණි රාජ්‍ය යන්ත්‍රය විනාශ කළ කොමියූනය ඒ වෙනුවට පොදු ජනතාවගේම ආයුධ සන්නද්ධ බලය ආදේශ කළේය. එය ධනපති පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රය වෙනුවට වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය ආදේශ කළේය. එනිසා සූරාකන්නන් බැහැර කෙරුණු අතර ඔවුන්ගේ ප්‍රතිරෝධය මර්දනය විය.

මෙම කාල පරිච්ඡේදය තුළදී රුසියානු විප්ලවය විසින් ඉටු කරන ලද්දේ එය ය. තවද, මෙම සීඝ්‍ර විජයෝන්නත ඉදිරි ගමන තවදුරටත් ජයග්‍රහණ සහිතව දිගටම පවතිනු ඇතැයි අපේක්ෂා සහගත වීමට රුසියානු විප්ලවයේ කුඩා පෙරමුණු බල ඇණිය යොමු වන්නේද එනිසාය. ඔවුන්ගේ වරදත් නියත වශයෙන්ම එයමය. රුසියානු විප්ලවය සංවර්ධනය වෙමින් තිබුණු, රුසියාවේ සීමාවන් තුළ පමණක් රාජ්‍ය බලය එක් පංතියකින් තවත් පංතියකට මාරුවෙමින් සහ පංති සම්මුති ඉවත ලමින් තිබුණු කාල පරිච්ඡේදයේ පැවතීමට ඓතිහාසික වශයෙන් හේතු වූයේ, ලෝක අධිරාජ්‍යවාදී යෝධයන් සෝවියට් බලයට විරුද්ධව එන ඉදිරි ගමන තාවකාලික වශයෙන් නැවතුනු නිසා පමණක් හෙයින්, අපි එසේ කියමු. එය වූ කලී දින කීපයකින් රාජාණ්ඩුව පෙරළා දැමූ, ධනපති පංතිය සමග සම්මුතිගත වීමේ සියලු හැකියාවන් මාස කීපයකදී ක්ෂය කර දැමූ සහ සති කීපයක සිවිල් යුද්ධයකින් ධනපති පංතියේ සියලු ප්‍රතිරෝධය පරාජය කර දැමූ විප්ලවයකි. සමාජවාදී සමූහාණ්ඩු විප්ලවයක් වන මෙම විප්ලවයට අධිරාජ්‍යවාදී බලවතුන් සමග එක පෙළට පැවතිය හැකි වූයේ, ජාත්‍යන්තර මංකොල්ල කරුවන් අතර ජීවත්විය හැකි වූයේ, ධනපති පංතිය අන්‍යොන්‍ය වශයෙන් කරන මාරක යුද්ධයක පැටළී සිටීම නිසා රුසියාවට විරුද්ධ ඔවුන්ගේ ප්‍රහාරය අකර්මන්‍යව පැවතිතාක් පමණකි.

ඊළඟට අපට මෙතරම් තදින් දැනෙන හා අපගේ ඇස් ඉදිරියේ පෙනෙන කාල පරිච්ඡේදය ආරම්භවිය. එය රුසියානු විප්ලවයට භයානක පරාජය අත්වූ සහ දරුණු දුෂ්කරතාවයන් හමුවූ කාලය ය. විප්ලවයේ සතුරන්ට විරුද්ධව වේගවත් ලෙස, එක එල්ලේ සහ විවෘත ලෙස පහර දීමේ කාලය මේ වන විට ඉක්ම ගොස් ඒ වෙනුවට උදාවී ඇත්තේ අපට භයානක පරාජය අත් දැකීමට සිදුවී තිබෙන, අපගේ බලවේගයන්ට වඩා අපරිමිත තරම් විශාල බලවේගයන් හමුවේ, එනම්, ජාත්‍යන්තර අධිරාජ්‍යවාදයේ සහ මූල්‍ය ප්‍රාග්ධනයේ බලවේගයන් හමුවේ, ස්වකීය නවීන ආයුධ සහිත මුළු මහත් ධනපති පංතිය සහ එහි සංවිධානය කුඩා ජාතීන් කොල්ලකෑමේ, පීඩාවට පත් කිරීමේ හා මිරිකා ගැනීමේ උවමනාව ඉටු කර ගනු රිසිව අපට විරුද්ධව මෙහෙයවන යුද්ධමය මහා බලවේගය හමුවේ අපට පසු බැසීමට සිදුවී තිබෙන කාලයකි. අපට බලතුලනය කිරීම පිළිබඳ කල්පනා කිරීමට සිදුවිය, අපට මිනිය නොහැකි තරම් අසීරු ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවිය, රොමානව් හා කෙරෙන්ස්කි වැනි බැහැරකළ හැකි සතුරන්ට වඩා භතුරන් ඍජු සටන්වලදී අපි දුටිමු. ජාත්‍යන්තර අධිරාජ්‍යවාදී ධනපති පංතියේ බලවේගයන්ට, එහි සම්පූර්ණ යුද්ධ ශක්තියට මුහුණ දීමට අපට සිදු විය. ලෝක කොල්ල කරුවනට විරුද්ධව මුහුණට මුහුණ ලා නැගී සිටීමට අපට සිදු විය. ජාත්‍යන්තරවාදී නිර්ධන පංතියේ ආධාරය ලැබීම ප්‍රමාද නිසා, මෙම බලවේගයන් සමග ගැටීමේ වගකීම අප මත පවරා ගැනීමට සිදුවූයෙන්, අපි භයානක පරාජයක් ලැබුවෙමු.

එනිසා, මෙය භයානක පරාජය ලැබීමේ යුගයකි, පසුබැසීමේ යුගයකි. මෙය අධිරාජ්‍යවාදය හමුවේ පසුබසිමින්, පොදුවේ ලෝක තත්වයෙහි වෙනස් කම් ඇති වන කාලය එන තෙක්, යුරෝපීය නිර්ධන පංති බලවේගයන්, එනම්, දැනට පවතින හා මෝරමින් තිබෙන, එහෙත්, අපට තරම්

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

පහසුවෙන් ස්වකීය සතුරන් පරාජය කරගත හැකි නොවූ බලවේගයන් පැමිණෙන තෙක්, ප්‍රමාද වෙමින් අපගේ ජයග්‍රහණයන්ගෙන් කුඩා කොටසක් හෝ බේරා ගැනීමට කටයුතු කළ යුතු යුගයකි. රුසියානු විප්ලවයට ආරම්භය පහසු වූ නමුත් තව දුර පියවරයන් ගැනීම දුෂ්කර බව අමතක කිරීම ඉතා විශාල මුළාවක්, ඉතා විශාල වරදක් වනු ඇත. අපට පටන් ගැනීමට සිදු වූයේ ඉතාමත් නොදියුණු සහ වඩාත්ම කුණුවී ගිය දේශපාලන ක්‍රමයෙන් වූ හෙයින් මෙය නොවැළැක්විය හැකි දෙයක් විය. යුරෝපීය විප්ලවයට පටන් ගැනීමට සිදුවනු ඇත්තේ ධනපති පංතියට විරුද්ධවය, බරපතලකමින් බෙහෙවින් වැඩි සතුරෙකුට විරුද්ධව හා අපරිමිත තරම් වැඩියෙන් දුෂ්කර කොන්දේසි යටතේය. යුරෝපීය විප්ලවයේ පටන් ගැන්ම ඊට වඩා බෙහෙවින් දුෂ්කර වනු ඇත. විප්ලවය වළක්වන ක්‍රමයේ පවුර පළමු වරට බිඳීම මෙතෙකැයි කිව නොහැකි තරම් දුෂ්කර බව අපට පෙනේ. යුරෝපීය විප්ලවයට, එහි දෙවැනි හා තුන්වැනි අවධි වෙත ඉදිරියට යාම ඊට වඩා බෙහෙවින් පහසු වනු ඇත. ලෝකයේ විප්ලවවාදී සහ ප්‍රතිගාමී බලවේගයන්ගේ දැනට පවතින පෙළ ගැස්ම අනුව කරුණු වෙනත් ආකාරයකට සිදුවිය නොහැකිය. ඓතිහාසික ස්ථාවරයෙන් නොව තමන්ගේම හැඟීම්වල හා තම කෝපයේ ස්ථාවරයෙන් වර්තමාන තත්වය ගැන, විප්ලවයේ ඉතාමත් බරපතල තත්වය ගැන සලකන අය නිතරම අමතක කරන්නේ සිදුවීම් පිළිබඳව ඇති වී තිබෙන මෙම වෙනස්කම ය. විප්ලවයක් සීඝ්‍ර ජයග්‍රහණවල සිට බරපතල පරාජිතවීම් දක්වා හදිසි ලෙස හැරෙන කාලයක දී, විප්ලවයේ සංවර්ධනයට අනිවාර්ණීය වශයෙන්ම බරපතල හානි සිදු කරන ව්‍යාජ විප්ලවවාදී වදන් නිර්මාණයේ කාලසීමාවක් නිතරම හා සෑම විප්ලවයකදීම ඇතිවන බව ඉතිහාසයේ අත්දැකීම් අපට උගන්වයි. එනිසා සහෝදරවරුනි, අපට අපගේ උපක්‍රම ගැන නිවැරදි ලෙස අගය කළ හැකි වන්නේ, අප සීඝ්‍ර, පහසු සහ පූර්ණ ජයග්‍රහණවල සිට බරපතල පරාජිතවීම් දක්වා ආපස්සට විසි කළ සිදුවීම් ඇති වූ ආකාරය ගැන සලකා බැලීම ආරම්භ කළ විට පමණකි. මෙය විප්ලවයේ සංවර්ධනයෙහි වර්තමාන සන්ධිස්ථානය අනුව පැන නගින, රට තුළදී ලබන ලද පහසු ජයග්‍රහණවල සිට රටින් පිටතදී ලබන අතිශයින් බරපතල පරාජයවීම් වෙත හැරීමෙන් පැන නගින, ඉතාමත් දුෂ්කර හා ඉතාමත් බරපතල ප්‍රශ්නයකි. මෙය මුළු ලෝක විප්ලවයේද සන්ධිස්ථානයක් වන්නේය. මෙය අධිරාජ්‍යවාදය කල් බලමින් සිටිය දී රුසියානු විප්ලවය ප්‍රචාරය හා උද්ඝෝෂණය කළ කාලයේ සිට සෝවියට් බලයට විරුද්ධව අධිරාජ්‍යවාදය ගසන ප්‍රහාරය දක්වා වෙනස් වීමක් වන්නේය. මෙම වෙනස් වීම බටහිර යුරෝපයේ ජාත්‍යන්තර ව්‍යාපාරය හමුවේද මතු කරන්නේ විශේෂයෙන්ම දුෂ්කර හා තියුණු ප්‍රශ්නයකි. පවතින තත්වයේ

මෙම ඓතිහාසික පැත්ත අමතක නොකිරීමට නම්, වර්තමාන කෘෂර, නැතහොත්, එය නම් කර තිබෙන ලෙසට, අශික්ෂිත සාමය සම්බන්ධයෙන් රුසියාවේ මූලික අවශ්‍යතාවයන් හැඩ ගැසී තිබෙන්නේ කෙසේද යන්න වටහා ගැනීමට අපි උත්සාහ දැරිය යුත්තෙමු.

එම සාමය පිළිගැනීමට ප්‍රතික්ෂේප කළ අයට විරුද්ධව තර්ක කිරීමේදී මට බොහෝ විට හමුවූ ප්‍රකාශයකි, සාමය ඇතිකර ගැනීමේ අදහසින් ප්‍රකාශිත වන්නේ වෙහෙසට පත් ගොවීන්, පංතියෙන් බැහැර වූ සොල්දාදුවන්, ආදීන්ගේ උවමනාවන්ය යන්න. මෙවැනි ප්‍රකාශයන් ඇසෙන විට, මෙවැනි කරුණු ගැන සඳහන් කරනු ඇසෙන විට මම නිතරම පුදුම වෙමි. මා පුදුම වන්නේ සහෝදරවරු සංවර්ධනයේ පංති සංකල්පය ගැන අමතක කරන හෙයිනි. මේ අය නිතරම හේතු දැක්වීමට පමණක් සීමාවන හෙයිනි. මෙවැනි ප්‍රකාශයන් කරන්නේ, නිර්ධන පංතියේ පක්ෂය බලය ගන්නාවිට නිර්ධන පංතියේ සහ අර්ධ නිර්ධන පංතියේ, නැතහොත්, දුප්පත් ගොවිජනතාවගේ (එනම්, රුසියාවේ ගොවිජනතාවගෙන් බහුතරයෙහි) සන්ධානය කෙරෙහි එය විශ්වාසය නොතැබූ කලෙක මෙනි; බහුතරයෙහි, ජනතාවගේ නියම බහුතරයෙහි බලය වන සෝවියට් සභාවල විප්ලවවාදී බලයට රුසියාවේ ආණ්ඩුව පවරාදීමෙහි සමත්වන්නේ එවැනි සන්ධානයක් පමණක් බව නොදැන සිටි කලෙක මෙනි; මෙම සන්ධානය නොමැතිව, විශේෂයෙන්ම, ඉතිහාසයේ මෙම සන්ධිස්ථානයේදී බලය ස්ථාපිත කිරීමට දරන ඕනෑම ප්‍රයත්නයක් නිෂ්ඵලවන බව නොදැන සිටි කලෙක මෙනි! දැන් මෙම සත්‍යය අත්හැර දමා ගොවිජනතාවගේ විඩාපත් තත්වය ගැන සහ සොල්දාදුවන් ඔවුන්ගේ පංතියෙන් බැහැර වූ තත්වය ගැන පිළිකුල් සහගත ලෙස සඳහන් කිරීමට සීමාවී සිටීම අපට කළ හැකි කලෙක මෙනි! ගොවිජනතාවගේ විඩාපත් තත්වය හා පංතියෙන් බැහැර වූ සොල්දාදුවන් ගැන අප කිවයුත්තේ, රට ප්‍රතිරෝධය දක්වනු ඇති බව හා දුප්පත් ගොවිජනතාව ප්‍රතිරෝධය දැක්වීමෙහි සමත් වන්නේ එම දුප්පත් ගොවීන්ගේ බලවේගයන් අරගලය සඳහා මෙහෙයවීමට ඔවුන් සමත්වූතාක් දුරට පමණක් වන බවය.

ඔක්තෝබරයේදී අප බලය අත්පත් කර ගැනීමට ආසන්නව සිටියදී, සිදුවීම් අනිවාර්ණීය වශයෙන්ම යොමු වී තිබුණේ ඒ වෙතට බවත්, සෝවියට් සභා අභ්‍යන්තරයෙහි බොල්ෂෙවික්වාදය දෙසට ඇතිවූ නැඹුරුව රට මුළුල්ලේම හටගත් නැඹුරුවක් සනිටුහන් කළ බවත්, බොල්ෂෙවික්වරු අනිවාර්ණීය වශයෙන්ම බලය ගත යුතු බවත්, පෙනී ගියේය. මෙය වටහාගෙන අප ඔක්තෝබරයේදී බලය ගන්නා විට, එය නිර්ධන පංතියට හා දුප්පත් ගොවි ජනතාවට බලය පැවරීමක් බවත්, නිර්ධන පංතිය සාමය සඳහා — කුමක් සඳහා දැයි ඔබ දැන සිටියෙහිය — කරන ක්‍රියාශීලී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සටනේදී සහ ලොකු මූල්‍ය ප්‍රාග්ධනයට විරුද්ධව සටන් කිරීමට එය දක්වන සූදනම සම්බන්ධයෙන් ගොවි ජනතාවගේ සහයෝගය ලැබෙනු ඇතැයි නිර්ධන පංතිය දන සිටි බවත් අපි අපටමත්, සියලුම ජනතාවටත් ඉතාමත් පැහැදිලි ලෙස හා ඒකාන්ත ලෙස කීවෙමු. මෙම කරුණෙහිදී අපි වරදක් නොකරමු. එසේම, බටහිර යුරෝපීය නිර්ධන පංතියේ ආධාරය අපට ලැබෙනු ඇතැයි වැඩ වර්ජන ආදී කරුණුවලින් පෙනෙතත්, එම ආධාරය නිසැක වශයෙන්ම ප්‍රමාදවී තිබිය දී, දුෂ්කර තත්වයන් යටතේ, ඉතාමත් දුෂ්කර තත්වයන් යටතේ, අරගලය කරගෙන යන ලෙස සුළු-ගොවි රටකට, ලෝක විප්ලවය සඳහා එතරම් පරිත්‍යාගයන් කළ රටකට කීම අපට කළ නොහැකිය යන්න පංති බලවේගයන් හා පංති පෙළගැසීම පිළිබඳ සංකල්පය අත් නොහරින කෙනෙකුට මගහැරිය නොහැකි සත්‍යයක් වන්නේය. ගොවිජනතාව විඩාපත් වී සිටීම ගැන ඒ ආකාරයෙන් සඳහන් කරන්නේ තර්කයක් සොයා ගත නොහැකි, එවැනි තර්ක සෙවී-මෙහිදී සම්පූර්ණයෙන්ම අසරණ වන පංති සම්බන්ධකම් සමස්තයක් වශයෙන් ගෙන එහි එකතු සමස්තය ගැන අවබෝධ කර ගැනීමෙහි අසමත් වන අය යයි මා කියන්නේ එහෙයිනි. විය හැකි කරුණු ගැන කරන ලද විශ්ලේෂණයක බලවත් රුකුල අපට ඇති බව හැඟෙන්නේ, ඉතිහාසය තියුණු වංගුවක් පසුකරන සෑම විටෙකදීම, අපි පංති සම්බන්ධකම් සමස්තය ගැන, එනම්, සියලුම පංතිවල සම්බන්ධකම් ගැන අගය කරන්නෙමු නම්, ඒ සඳහා තනි අවස්ථා පිළිබඳ තනි නිදර්ශන තෝරා නොගන්නෙමු නම් පමණකි. විප්ලවීය යුද්ධයක් කිරීමේ කිසිම හැකියාවක් අද අපට නැතිව තිබියදී එවැනි යුද්ධයක් කරන ලෙස අප පෙළඹීමෙහි රුසියානු ධනපති පංතිය යෙදී සිටින බව මට හොඳින් වැටහෙන්නේය. ධනපති පංතියේ පංති උවමනාවන් සඳහා මෙය අත්‍යාවශ්‍ය දෙයකි.

අශික්ෂිත සාමයක් ගැන කථා කරන විට, යුද්ධ හමුදව එහි වර්තමාන තත්වයට පත් කළේ කවුද යන්න ගැන ඔවුහු වචනයක් වත් නොකියති. එසේ කළේ ධනපති පංතිය සහ ඊට එකතු වූ ''දියල නරෝද්'' පිරිසත්[13], ට්සෙරතෙලි හා චෙර්නොව් මෙන්ෂෙවිකයන් හා ඔවුන්ගේ හෙංචයියලාත් බව මම හොඳින්ම දනිමි (අත්පොළසන්). විප්ලවවාදී යුද්ධයක් සඳහා හඬා වැලපෙන්නේ ධනපති පංතිය බව මම හොඳින්ම දනිමි. ඔවුන්ගේ පංති උවමනාවන් අනුව ඔවුන්ට එය උවමනා වී තිබේ. සෝවියට් බලය වැරදි පියවරක් තබනු දැකීමට ඔවුන්ගේ ඇති ආශාව අනුව ඔවුන්ට එය උවමනා වී තිබේ. එක් අතකින් ස්වකීය ප්‍රවෘත්ති පත්‍ර ප්‍රතිවිප්ලවවාදී කුරුටුගෑම්වලින් පුරවන අයගෙන් මෙය අසන්නට ලැබීම ගැන මම පුදුම නොවෙමි... (සභාවෙන්: ''ඒවා සියල්ලම මර්දනය කරලා!'') අවාසනාව-කට මෙන් තවමත් ඒවා සියල්ලම මර්දනය කර නැත. නමුත් අපි ඒ සියල්-

ලම වසා දමන්නෙමු. (අත්පොළසන්.) ධනපති පංතියේ අබිං කවා ජනතාව මත් කිරීමට ප්‍රතිගාමීන්ට, නැතහොත්, ධනපතියන්ට හා ඔවුන් සමග සහයෝගී වන්නවුනට ඔවුන්ගේ ධනය පිළිබඳ ඒකාධිකාරයෙන් ප්‍රයෝජන ගැනීමට ඉඩ දෙන නිර්ධන පංතියක් වේනොත් එය දැකීමට මම කැමැත්තෙමි. එවැනි නිර්ධන පංතියක් නැත. (අත්පොළසන්.)

ඒ ප්‍රකාශනයන්ගේ පිටුවලින් නිකුත්වන්නේ අශික්ෂිත සාමය ගැන මුරගෑම්, උඩුබිරුලෑම් හා ගෝරනාඩු පමණක් බව මට අවබෝධ වී තිබේ. මෙම විප්ලවවාදී යුද්ධයට පක්ෂවන, කැඩෙට්වරුන්ගේ[14] පටන් දක්ෂිණාංශික සමාජවාදී-විප්ලවවාදීන් දක්වා වූ පිරිස් වනාහි, ජර්මන්වරු ඉදිරියට එනවිට ජර්මානුන් මේ එන්නේ යයි කියමින්, ස්වකීය නිලධාරී-න්ට නැවතත් ඔවුන්ගේ නිල ලාංඡනවලින් සැරසී ජර්මන් අධිරාජ්‍යවාදී ආක්‍රමණිකයන් විසින් අල්ලාගන්නා ලද ප්‍රදේශවල අඩි හප්පා ගමන් කිරීමට ඉඩ දෙන අය බව මට අවබෝධ වී තිබේ. මෙම ධනපතියන් හා හවුල් කාරයන් විප්ලවවාදී යුද්ධයක් ගැන දේශනා කිරීම දැක මා නම් මඳක්වත් පුදුම වන්නේ නැත. ඇත්තෙන්ම නැත. ඔවුන්ට උවමනා කර තිබෙන්නේ සෝවියට් බලය උගුලක අසුවෙනවා දැකීමට ය. මෙම ධනපතියන් හා හවුල්කාරයින් තමන් කරන්නට යන දේ පෙන්නුම් කර තිබේ. අපි ඔවුන් දැක ඇත්තෙමු. අපට ඔවුන්ගේ ජීවමාන ප්‍රතිමූර්ති තවත් දකින්නට පුළුවන. උක්‍රේනියාවේ උක්‍රේනියානු කෙරෙන්ස්කිලා, උක්‍රේනියානු චෙර්නොව්ලා සහ උක්‍රේනියානු ට්සෙරතෙලිලා සිටින බව අපි දනිමු. එහි වින්නිචෙන්කොලා සිටිති. ඒ මහත්වරු, උක්‍රේනියානු කෙරෙන්ස්කිලා, චෙර්නොව්ලා සහ ට්සෙරතෙලිලා, තමන් ජර්මන්වරු සමග ඇති කරගත් සාමය ජනතාවගෙන් වසං කළහ. දැන් ඔවුන් උත්සාහ කරන්නේ ජර්මන් බයිනෙත්තුවල ආධාරයෙන් උක්‍රේනියාවේ සෝවියට් බලය පෙරළා දැමීමට ය. ඒ ධනපතියනුත්, හවුල්කාරයනුත් ඔවුන්ගේ සහචරයිනුත් කර තිබෙන්නේ එයයි (අත්පොලසන්). ඒ උක්‍රේනියානු ධනපතියන් හා හවුල්කාරයන් කර ඇත්තේ එයයි. ඔවුන් පිළිබඳ නිදර්ශන ඔබගේ ඇස් හමුවේම ඇත. ඔවුහු තමන්ගේ රහස් ගිවිසුම් ජනතාවගෙන් වසං කළහ, තවමත් වසං කරති. ඔවුහු ජර්මන් බයිනෙත්තුවල ආධාරයෙන් සෝවියට් බලයට පහර දෙති. රුසියානු ධනපතියන්ට උවමනා වී තිබෙන්-නේ එයයි. ධනපති පංතියේ අනුචරයන් දැන හෝ නොදැන සෝවියට් බලය තල්ලුකර දැමීමට උත්සාහ කරන්නේ එතැනටය. කුමණ තත්වය යටතේ වුවද, අධිරාජ්‍යවාදයේ යෝධ ශක්තියට විරුද්ධව අධිරාජ්‍යවාදී යුද්ධයක් කිරීමට සෝවියට් බලයට මේ අවස්ථාවේ දී පුළුවන් කමක් නොමැති බව ඔවුහු දනිති. සියලු විප්ලවවල ඉතිහාසයේ දුෂ්කර අවස්ථාවලදී පොදුවේ දක්නා ලද, අර්ධවශයෙන් කර කියාගත හැකි දෙයක් නොමැතිකමද,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අර්ධ වශයෙන් හිස් වදන් දෙසා බැම ද නියෝජනය කරන න්‍යායකින් තමන් මුළාවීමට ඉඩ දුන් වාම සමාජවාදී-විප්ලවවාදීන්[15] වැනි අයගේ වරදෙහි සම්පූර්ණ බරපතලකම මෙම ජාත්‍යන්තර තත්වය යටතේ පමණක්, මෙම පොදු පංති තත්වය යටතේ පමණක්, අපට වටහාගත හැකි වන්නේ එනිසාය. මෙම න්‍යාය අනුව ඔබට කියනු ලැබෙන්නේ යථාර්ථය ගැන කල්පනාකාරී ලෙස සලකා බැලීමක්ද, අභ්‍යන්තර සහ බාහිර සතුරා සම්බන්ධයෙන් විප්ලවයේ කර්තව්‍යයන් අගය කිරීමක්ද නොමැතිව, ඒ වෙනුවට, ඔබගේ හැඟීම්වල බලපෑම් අනුව, හුදෙක්ම හැඟීම් පිළිබඳ ස්ථාවරයේ සිට බරපතල ප්‍රශ්නයක්, එසේම ඉතා දරුණු ප්‍රශ්නයක් නිරාකරනය කරන ලෙසය. සාමය ඇදහිය නොහැකි තරමට අවාසි සහගතය, නින්දසහගතය. එය, ප්රුසියානු හා ජර්මානු ජනතාවන් බරපතල පරාජය මාලාවක් ලැබූ පසු ජයග්‍රාහක නැපෝලියන් ඔවුන් මත බලෙන් පැටවූ ටිල්සිට් සාමයට සමාන බව මගේ ප්‍රකාශන සහ කථා කීපයකදීම කීමට මට සිදුවිය. සැබෑය. මෙම සාමය සෝවියට් බලයට බරපතල පරාජයක් හා අවමානයක් වේ. නමුත්, ඔබ මේ අනුව කටයුතු කරමින් හා එය පමණක් සැලකිල්ලට ගෙන යෝධ ප්‍රශ්න විසඳීමට ප්‍රයත්න දරමින්, හැඟීම් කුපිත කරවන ආයාචනා මගින් අප්‍රසන්නතාවය අවුස්සන්නේ නම්, ඔබ වැටෙනු ඇත්තේ වරක් සමාජවාදී-විප්ලවවාදී පක්ෂය වැටුනු විකට හා කණගාටුදයක තත්වයට ය. 1906 දී හා 1907 දී අපගේ විප්ලවය බරපතල ලෙස පරාජය වීමෙන් පසුව ස්තලීපින්ගේ තුන්වැනි දූමා සභාවේ[16] නීති — ඉතාමත් තුච්ඡ නියෝජිත ආයතනවලින් එකක් තුළ වැඩ කිරීමේ නින්ද සහගත සහ අන්ත දුෂ්කර කොන්දේසි — අප වෙත ඉදිරිපත් කළ විට 1907 දී යම් යම් කරුණු අතින් තරමක් දුරට මේ හා සමාන වූ තත්වයක් යටතේ එම පක්ෂය විප්ලවවාදීන්ගේ හැඟීම් කුපිත කරවන අදහසින් ඔවුන් වෙත ආයාචනා කළේය. එම තත්වය යටතේ අප පක්ෂය සුළු කාලයක අවිනිශ්චිත තාවයකින් පසුව (එද ප්‍රශ්නය ගැන පැවති අවිනිශ්චිතතාවය අදට වඩා වැඩි ය) ඒ ගැන මේ ආකාරයට තීරණය කළේය: නින්ද සහගත තුන්වැනි දූමා සභාව සමග අපගේ කෝපය හා අප්‍රසන්නතාවය කොතරම් විශාල වුවත්, එය අභිබූවක් නොව, තවදුර යාමට ශක්තිය නැති, එහෙත්, බලෙන් පනවන ලද මෙම නින්ද සහගත කොන්දේසි යටතේ වුවද ඒ ශක්තිය උපදවාගත හැකිවන හා වර්ධනය වෙමින් පවතින පංති අරගලයේ ඓතිහාසිය අවශ්‍යතාවයක් ලෙස පිළිගැනීමට අපට සිදුවේ. අපේ තීරණය නිවැරදි බව ඔප්පු විය. විප්ලවවාදී වදන්මාලා මගින්, සාධාරණත්වය ඉල්ලා කරන ආයාචනා මගින් (ඔවුන් පළ කළේ තුන් ගුණයක් සාධාරණ හැඟීමය) ජනතාව ආකර්ෂණය කිරීමට

උත්සාහ කළ අයට ලැබුණේ කල්පනාව ඇති සහ අදහස් ඇති ඕනෑම විප්ලවවාදියෙකුට අමතක නොවන පාඩමකි.

සීඝ්‍ර සහ පහසු ප්‍රගතියක් සහතික කළහැකි තරම් සුමට ආකාරයෙන් විප්ලව ගමන් කරන්නේ නැත. පරාජයේ කටුක කාල පරිච්ඡේදයන් අත් නොදුටු කිසිම විප්ලවයක් ජාතික පරිමාණයෙන් වුවද කිසි කලෙකත් ඇති නොවීය. එනිසා පොදුජන ව්‍යාපාර, නැතහොත්, වර්ධනය වන විප්ලව හා සම්බන්ධ බරපතල ප්‍රශ්න කෙරෙහි විප්ලවවාදියා දැක්විය යුත්තේ, මෙම සාමය අශික්ෂිත හා අවමාන සහගත යයි කීමේ සහ ඊළඟට තමාට එය ඉවසිය නොහැකි යයි කීමේ ආකල්පයක් නොවේ. එය විප්ලවයේ 'අ' යන්න 'ආ' යන්න මෙන් ප්‍රකට මෙන්ම සියළුම විප්ලවවල අත්දැකීමද වන අතර, උද්ඝෝෂණකාරී වදන් මාලා උපුටා දැක්වීම හා මෙම සාමය නිසා අප මත දෝෂාරෝපන පැටවීම ප්‍රමාණවත් නොවේ. 1905 පටන් අප ලැබූ අත් දැකීම් අනුව අපට කිසියම් පොහොසත්කමක් ඇත්නම්, රුසියානු කම්කරු පංතිය සහ දුප්පත් ගොවි ජනතාව ලෝක සමාජවාදී විප්ලවය ආරම්භ කිරීමේ ඉතාමත් දුෂ්කර සහ ගෞරවනීය කර්තව්‍යය තමන් පිට පවරා ගැනීමට කිසියම් හේතුවක් වී නම්, එය අහිකක් නොව, විශේෂ ඓතිහාසිය තත්වයන් නිසා විසිවැනි ශත වර්ෂය ආරම්භයේදී රුසියානු ජනතාවට ශ්‍රෙෂ්ඨ විප්ලව දෙකක් කිරීමට හැකි වීමය. අපි එම විප්ලවවල අත්දැකීම්වලින් පාඩම් උගත යුත්තෙමු. එම අත් දැකීම්වලින් අපට වටහා ගැනීමට තිබෙන්නේ, මෙම අවස්ථාවේදී අපට සංග්‍රාමයට මුහුණ දිය නොහැකි බව නිශ්චිත ලෙස ඔප්පු කිරීම, එක් හා තවත් රටක් අතර පංති සම්බන්ධකම් අධ්‍යයනය කිරීම මගින් පමණක් කළ හැකි බවය. මෙය සැලකිල්ලට ගෙන අපි අපටම මෙසේ කියාගත යුත්තෙමු. අප ලබාගන්නා විරාමය කෙබඳු වුවත්, සාමය කොතරම් අස්ථිර වුවත්, කොතරම් කෙටි, අවාසි සහ නින්ද සහගත වුවත්, එය යුද්ධයට වඩා හොඳය. එසේ කියන්නේ පොදු ජනතාවට හුස්ම ගැනීමට තරම්වත් විවේකයක් එයින් ලැබෙන බැවිනි; ධනපතියන් කර තිබෙන වැරදි, එනම්, විශේෂයෙන්ම ජර්මානුන් අල්ලාගෙන තිබෙන ප්‍රදේශවල සිටිමින්, සෝෂා කිරීමට ලැබෙන සෑම අවස්ථාවකම සෝෂා කරන, ධනපතියන් කර තිබෙන වැරදි නිවරද කිරීමට අපට එයින් අවස්ථාවක් ලැබෙන හෙයිනි. (අත්පොළසන්.)

යුද්ධ හමුදව බිඳී විසිරී යාම ගැන බොල්ෂෙවික් වරු වගකිව යුතුයයි ධනපතියෝ කියති. යුද්ධ හමුදවක් නැතැයිද, ඒ බොල්ෂෙවික්වරුන්ගේ වරද නිසා යයිද ඔවුහු කියති. නමුත් සහෝදරවරුනි, අපි අතීතය දෙස හැරී බලමු. ප්‍රථමයෙන්ම අපේ විප්ලවයේ සංවර්ධනය දෙස බලමු. අපගේ යුද්ධ හමුදවෙන් සොල්දදුවන් පැන යාම සහ එය බිඳී විසිරී යාම ආරම්භ

https://liberationbase.wordpress.com

වූයේ විප්ලවයට බොහෝ ඉහත දී, 1916 දී බවත්, යුද්ධ හමුදව දක ඇති සෑම කෙනෙකුටම එය පිළිගැනීමට සිදුවන බවත් ඔබ නොදන්නෙහිද? එය වැළැක්වීමට අපගේ ධනපතියන් කළේ කුමක්ද? ඒ අවස්ථාවේ දී අධිරාජ්‍යවාදයෙන් ගැලවීමේ එකම පිළියම තිබුනේ ඔවුන් අතය. ධනපති පංතියට විරුද්ධව හුදෙක් සරල අත වැනීමකින් මෙන් සෝවියට් සංවිධාන වලට බලය අත්පත් කරගත හැකි තත්වයක් මාර්තු සහ අප්‍රියෙල් මාසවලදී ඇති විය. ඒ බව පැහැදිලි නොවේද? ඒ අවස්ථාවේදී සෝවියට් සභා බලය අත්පත් කර ගත්තේ නම්, ධනපතියෝ සහ සුළුධනපති බුද්ධිමත්හුද ඔවුන් සමග එක් වූ සමාජවාදී-විප්ලවවාදීහු සහ මෙන්ෂෙවිකයෝද ජනතාව රැවටීමට, රහස් ගිවිසුම් සඟවා තැබීමට හා යුද්ධ හමුදව ප්‍රහාරය සඳහා මෙහෙයවීමට කෙරෙන්ස්කිට ආධාර නොකර, ඒ වෙනුවට ඔවුහු යුද්ධ හමුදවේ ආධාරයට පැමිණියෝ නම්, එයට වෙඩි උණ්ඩ සහ සලාක ද්‍රව්‍ය සැපයීමට කටයුතු කළෝ නම්, පීතෘ භූමියට — ජාවාරම් කාරයන්ගේ සහ ජනතාව ඝාතනය කිරීමට උපකාරවන ගිවිසුම්වල පීතෘ භූමියට නොවේ (අත්පොළසන්) — ආධාර කරන ලෙස ධනපති පංතියට බල කළෝ නම්, එසේම ඔවුන්ද එම කාර්යයනට සහභාගි වූවෝ නම්, කම්කරුවන්ගේ සහ වැඩ කරන ජනතාවගේ පීතෘ භූමියට ආධාර කරන ලෙස සෝවියට් සභා විසින් ධනපති පංතියට බල කරන ලද්දේ නම් සහ එම සභා, වැරහැලි ඇඟලාගත්, සපත්තු නැති හා සාගතයෙන් පෙළෙන යුද්ධ හමුදවට ආධාර කළේ නම්, ඒවා එසේ වී නම්, අපට යුද්ධ හමුදවට විවේකයක් දීමට හා ඒ සඳහා ඒකමතික සහයෝගය ලබාගැනීමට ප්‍රමාණවත් තරම් දීර්ඝ වූ දහමාසයක කාලයක් ලබා ගත හැකිව තිබුණු අතර, ඒ අනුව යුද්ධ හමුදව පොදු වශයෙන් පෙරමුණෙන් ඉදිරියට එක අඩියක්වත් නොයවාම ප්‍රජාතන්ත්‍රවාදී සාමයක් යෝජනා කිරීමටත්, රහස් ගිවිසුම් ඉරා දැමීමටත්, එක අඩියක් වත් පසු නොබැස පෙරමුණ රැක ගැනීමටත් අපට හැකිවන්නට තිබිණි. එවිට කම්කරුවන් හා ගොවිජනතාව කැමැත්තෙන් ආධාර කරන සහ අනුමත කරන සාමයක් ඇති කර ගැනීමට අවස්ථාවක් තිබිණි. පීතෘ භූමිය ආරක්ෂා කිරීමේ, රොමානොව්ලාගේ, කෙරෙන්ස්කිලාගේ හෝ චෙර්නොව්ලාගේ පීතෘ භූමිය නොව, රහස් ගිවිසුම්වල පීතෘ භූමියක් නොව, ද්‍රෝහී ධනපතියන්ගේ පීතෘ භූමියක් නොව, ඒ පීතෘ භූමිය නොව, වැඩකරන ජනතාවගේ පීතෘ භූමිය ආරක්ෂා කිරීමේ උපක්‍රම එසේ වන්නට තිබිණි. යුද්ධයේ සිට විප්ලවයට සහ රුසියානු විප්ලවයේ සිට ලෝක සමාජවාදයට පරිවර්තනය වීම අතිමහත් දුෂ්කරතාවයන්ගෙන් පිරි කාලපරිච්ඡේදයක් කිරීම ගැන වගකිව යුතු අය ඔවුන් ය. අපට යුද්ධ හමුදවක් නොමැති කල, යුද්ධ හමුදව පවත්වා ගැනීමට අපට කිසිම හැකියාවක් නොතිබුණු බව අප දන්නා කල, විප්ලවවාදී යුද්ධයක් කිරීම සඳහා කරන

වැනි යෝජනාවලින්, හිස් වාක්‍ය කොටස්වලින් මෙන් බොල් හඬක් නැගෙන්නේ එනිසාය. තවද, හමුදු විසුරුවා හැරීම පිළිබඳ අපගේ ආඥව මවාගත් දෙයක් නොව පැහැදිලි අවශ්‍යතාවයක ප්‍රතිඵලයක් වූ බව, තත්වය ගැන දන්නා අයට නොපෙනී යා නොහැක. එසේ කියන්නේ යුද්ධ හමුදව පවත්වා ගැනීමට කිසිම හැකියාවක් නොතිබුණු හෙයිනි. හමුදව පවත්වා ගත නොහැකි විය. යුද්ධ හමුදවට සටන් කළ නොහැකි බවත්, එය සටන් නොකරනු ඇති බවත් ඔක්තෝබර් විප්ලවයට පෙර කී, ඒ බොල්ෂෙවික්වරයෙකු නොවූ නිලධාරියා නිවැරදි විය[17]. ධනපති පංතිය සමග මාස ගණන් තිස්සේ කේවෙල් කිරීමෙන් සහ යුද්ධය දිගටම කරගෙන යාමේ අවශ්‍යතාවය ගැන කළ සියලු කථාවලින් ලැබී තිබෙන ප්‍රතිඵලය මෙය යි. විප්ලවවාදීන් බොහෝ දෙනෙකුගේ හෝ විප්ලවවාදීන් ස්වල්ප දෙනෙකුගේ හෝ හැඟීම් කොතරම් උත්තම වූවත් ඉන් වන වැඩක් නැත. ඔවුන්ගේ එම කථා අධිරාජ්‍යවාදීන්ගේ උගුලට හසුවීමටත්, — බ්‍රෙස්ට් ගිවිසුම අත්සන් නොකිරීමෙන් අප කළ උපක්‍රමීය නැතහොත් රාජ්‍යතන්ත්‍රීය වරදෙන් අනතුරුව සිදුවී ඇති පරිදි අධිරාජ්‍යවාදය විසින් අප නැවතත් හා තවත් වැඩියෙන් කොල්ල කනු ලැබීමටත් ආධාර කරන පුහු වදන් බව ඔප්පු විය. කිසියම් කාලයක විරාමයක් අපට ලැබුණහොත්, යුද්ධ හමුදවේ ශක්තිය නැවත ඇති කරගැනීම හා වැඩ කරන ජනතාවගේ යහපත අන්කිසිවකටත් වඩා වැදගත් වන බව පෙනෙනු ඇතැයිද, එනිසා සාමය අත්සන් කළ යුතුව තිබුණේයයිද, අපි සාමය අත්සන් කිරීමට විරුද්ධ වූ අයට කීවෙමු. විරාමයක් ඇතිවිය නොහැකි යයි ඔවුහු කීහ.

නමුත් අපගේ විප්ලවය ඉහත ඇති වූ සියළු විප්ලවවලට වඩා වෙනස් ය. එය පොදුජනතාව අතර ඉදි කිරීමේ සහ නිර්මාණය කිරීමේ අභිලාෂයක් ජනිත කර තිබේ. එය ඉතාමත් දුර බැහැර ගම්වල ජනතාව, නැතහොත්, සාර්වරුන්, ඉඩම් හිමියන් සහ ධනපතියන් විසින් නින්දවට, පෑගීමට සහ පීඩනයට භාජනය කරනු ලැබූ ජනතාව කුල්මත් කර තිබේ. මෙය විප්ලවයේ කාල පරිච්ඡේදයකි. ග්‍රාමීය විප්ලවය දැන් සිදුවෙමින් පවතින්නක් හෙයින්, මෙය මේ දැන් සිදුකෙරෙන විප්ලවයේ කාලයකි. මෙය නවජීවනයක් ගොඩනගන විප්ලවයේ කාලයකි. ස්වකීය කඩු හප්පන හා සටන් කරන ලෙස අපට කියන ධනපති වීරයන්ගේ අවශ්‍යතාවයන්ට වඩා ඉහළින් වැඩකරන ජනතාවගේ උවමනාවන් තබන අපගේ යුතුකම වී තිබුණේ, කොතරම් කෙටි වූවත්, කොතරම් සුළු වූවත්, මෙම විරාමය ලබාගැනීම සඳහා ගිවිසුම අත්සන් කිරීමය. විප්ලවය උගන්වන්නේ එයයි. අප රාජ්‍ය තන්ත්‍රීය වැරදි කරන විට, ජර්මන් කම්කරුවන්ගේ ආධාරය හෙටම අපට ලැබෙතැයි අප සිතන විට, ලිබ්නෙෂ්ට් වහාම ජයග්‍රහණය කරනු ඇතැයි අප බලාපොරොත්තු තබන විට (මොන

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ක්‍රමයෙන් හෝ ලීබ්නෙෂ්ට් ජයගන්නා බව අපි දනිමු; කම්කරු ව්‍යාපාරයේ සංවර්ධනයෙහි දී එය අනිවාරණීය දෙයකි [අත්පොළසන්]), එයින් අදහස්වන්නේ, දුෂ්කර සමාජවාදී ව්‍යාපාරයේ විප්ලවවාදී සටන් පාඨ සිතා නොබලා පාවිච්චි කළ විට ඒවා හිස් වදන් වන බව යයි විප්ලවය උගන්වයි. ජර්මනියේ සමාජවාදී ව්‍යාපාරයට ආධාර කිරීම සඳහා හැකි ඉහළම පරිත්‍යාගය කිරීමට ප්‍රතික්ෂේප කරන වැඩ කරන ජනතාවගේ එකම නියෝජිතයෙක්වත්, එකම අවංක කම්කරුවෙක්වත් නැත්තේය. එයට හේතුව ජර්මන් අධිරාජ්‍යවාදීන් ද, ජර්මන් විනයෙන් හිරිහැර වින්ද හා වැඩි දෙනෙක් අපට හිතවත්කම් දක්වන සෝල්දාදුවන් ද, අතර වෙනස මේ කාලය මුළුල්ලේම ඔහු පෙරමුණෙහි දී දනගෙන තිබීමය. රුසියානු විප්ලවය ව්‍යවහාරයෙන් අපගේ වැරදි නිවරද කර තිබෙන බවත්, මෙම විරාමයෙන් ඒවා නිවරද කර තිබෙන බවත්, මා කියන්නේ එනිසා ය. එය ඉතා කෙටි විරාමයක් වන්නට ඉඩ තිබේ. නමුත්, දැඩි වෙහෙසට පත්ව හා හාමතේ සිටින යුද්ධ හමුදුවට එහි දුබල කම මකා ගැනීම සඳහා අවස්ථාවක් දී ඇතැයි යන අවබෝධය එයට ලැබෙන පරිද්දෙන්, කෙටි විරාමයක් දීමේ අවස්ථාව වත් එයින් අපට ලැබෙන්නේය. පැරණි අධිරාජ්‍යවාදී යුද්ධවල කාලය අවසන් වී ඇති බවත්, අළුත් යුද්ධ ඇති වීමේ මහා භීතියේ තර්ජනය අප වෙත එල්ල වී තිබෙන බවත්, එහෙත්, ඉතිහාසයේ බොහෝ අවධිවල යුද්ධ සහිත එවැනි කාල පරිච්ඡේද තිබුණු බවත්, ඒ හැම එකක්ම අවසාන භාගයේදී ඉතාමත් දරුණු වූ බවත්, අපට පැහැදිලිය. මෙය වටහා ගත යුතුය. එය වටහා ගත යුත්තේ පෙට්‍රොග්‍රෑඩ් සහ මොස්කව් රැස්වීම්වලදී පමණක් නොවේ. ගම්බද පෙදෙස්වල සිටින කෝටි ගණන් ජනයාද එය වටහා ගත යුතුය. එය වටහා ගනු පිණිස ගම්බද පෙදෙස්වල සිටින වඩාත් කරුණු දත් අය, පෙරමුණේ සිට ආපසු එන අය, යුද්ධයේ භයානක කම් අත්දුටු අය, එම ජනයාට ආධාර කළ යුතුය. විප්ලවීය පෙරමුණක අවශ්‍යතාවය පිළිබඳ අවබෝධය ගොවි හා කම්කරු මහා පොදුජන පිරිස්වලට අවබෝධ විය යුතුය. අප නිවැරදි ලෙස කටයුතු කර තිබෙන බව එවිට ඔවුන් කියනු ඇත.

අප උක්‍රෙනියාව හා පින්ලන්තය පාවා දී ඇතැයි ඔවුහු අපට කියති — මොන අවමානයක්ද! පින්ලන්තය සම්බන්ධයෙන් මතු වී තිබෙන්නේ අප එයින් වෙන් වූ තත්වයකි. විප්ලවයට පෙර[18] අප එය සමග නොලියන ලද ගිවිසුමක් ඇති කරගත් අතර දැන් එය සමග විධිමත් ගිවිසුමක් අත්සන් කර තිබේ[19]. චෙර්නොව්, කෙරෙන්ස්කි හා ට්සෙරතෙලි විනාශ කරන්නට යන උක්‍රෙනියාව යටත් වීමට හැරීමේ චෝදනාව ඔවුහු අප වෙත එල්ල කරති. අප ද්‍රෝහීන් සේ හඳුන්වන ඔවුහු අප උක්‍රෙනියාව පාවාදී ඇතැයි කියති! මම මෙසේ කියමි: සහෝදරවරුනි, ස්වකීය හැඟීම්වලට යටවන

සහ පැහැදිලි තීරණ ගැනීමෙහි අසමත් අයගේ රැවුම් සහ ගෙරවුම් නිසා කලබල නොවීමට තරම් විප්ලවයේ ඉතිහාසය මම දැක ඇත්තෙමි. මම ඔබ වෙත සරල නිදර්ශනයක් ඉදිරිපත් කරන්නෙමි. මිතුරන් දෙදෙනෙක් රාත්‍රියේ ඇවිදින්නට ගියහයි සිතමු. ඔවුන් ඇවිදිමින් සිටියදී මිනිසුන් දහ දෙනෙක් ඔවුනට පහර දුනහොත් සහ ඒ දෙදෙනාගෙන් එකෙක් කොටු කරගතහොත් අනික් මිනිහා කළ යුත්තේ කුමක්ද? ආධාර දීමේ හැකියාවක් ඔහුට නැති කල, ඔහු පැන දිවුවහොත් ඔහු ද්‍රෝහියෙක්ද? එසේම, එය පුද්ගලයන් හා සම්බන්ධ සහ එක එල්ලේ මතුවන හැඟීම් සැනසීම පිළිබඳ කරුණක් නොවේ යයි සිතමු. ලක්ෂයක් බැගින් පිරිස ඇති යුද්ධ හමුදු පහක් විසින් දෙලක්ෂයක යුද්ධ හමුදුවක් වට කරන ලදැයිද, වටකරන ලද හමුදුවේ ආධාරයට පැමිණිය යුතු තවත් හමුදුවක් ඇතැයිද සිතමු. නමුත් දෙවැනි හමුදුව ස්ථිර වශයෙන්ම උගුලකට හසුවන බව එය දන්නේ නම් එය පසු බැස්ස යුතුය. පසුබැසීම සඳහා අශික්ෂිත, කැත සාමයක් මගින් ආරක්ෂාව සැලසීමට සිදු වුවත් එය පසු බැස්ස යුතුය. ඔබට ඕනෑ තරමක් ශාප කරන්න. නමුත් සාමය ඇති කර ගැනීම අවශ්‍ය ය. අවමානකාරී සාමයකට අත්සන් කරන ලෙස තමාට බල කරනු ලැබෙන නිසා තමා මිය යායුතු යයි කියමින් තම කඩුව ඇදගන්නා ද්වන්ද්ව සටන්කරුවෙකුගේ හැඟීම් ගැන සලකා බැලීමේ අවශ්‍යතාවයක් නැත. නමුත් අප කුමණ තීරණ ගත්තත් අපට යුද්ධ හමුදුවක් නැති බවත්, අපගේ යුද්ධ හමුදුවේ දුබල කම් මකාගන්නා තෙක් පසුබැසීමට ඇති අවශ්‍යතාවයෙන් ගැලවීමට කුමණ සංඥා දක්වීමෙන් වුවද බැරි බවත් අපි සියලු දෙනාම දන්නෙමු. යථාර්ථය දෙස එක එල්ලේ බලන සහ විප්ලවවාදී වදන් හරඹයෙහි යෙදෙමින් තමන්ම රවටා නොගන්නා සෑම කෙනෙක්ම මෙයට එකඟ වනු ඇත. වදන් හරඹයෙහි හා වගාඩම්බරයෙහි නොබැඳෙන හා සත්‍ය කරුණුවලට මුහුණ දෙන ඕනෑම කෙනෙක් මෙය දත යුතුය.

අපි මෙය දන්නෙමු නම්, මෙම අවාසිදායක, අතිශයින්ම අවාසිදායක හා මංකොල්ලකාරී සාමය වුවද අත්සන් කිරීම අපගේ විප්ලවවාදී යුතුකම ය.

එසේ වන්නේ, එය අත්සන් කිරීමෙන් අපටත් අපගේ මිතුරන්ටත් වඩාත් යහපත් වන තත්වයකට අප එළඹෙන බැවිනි. මාර්තු 3 දින සාම ගිවිසුම අත්සන් කිරීමෙන් අපට ඇත්ත වශයෙන්ම කිසියම් දෙයක් අහිමිවී ගියේද?

යුද්ධ හමුදුවක් නොමැතිව, නැතහොත්, රෝගී හා සුන්බුන් වූ හමුදුවක් ඇතිව, සංග්‍රාමාවතීරණව, එය විප්ලවවාදී යුද්ධයක් වශයෙන් හැඳින්වීම ආත්ම වංචනයක් හා ජනතාවට කරන මහා රැවටිල්ලක් බව, රදළ ද්වන්ද්ව සටන්කාරයාගේ නොව බහුජන සම්බන්ධකම් වල

https://liberationbase.wordpress.com

ස්ථාවරයෙන් කරුණු විමසා බැලීමට ඉදිරිපත්වන ඕනෑම කෙනෙකුට අවබෝධ වෙනවා ඇත. ජනතාවට සත්‍ය ප්‍රකාශ කිරීම අපගේ යුතුකම ය. එය අහිතකර සාමයක් බව සැබවි. උක්‍රේනියාව සහ පින්ලන්තය විනාශ වෙමින් පවතින නමුත් අපි මෙම සාමය පිළිගත යුත්තෙමු. රුසියාවේ සිටින පංති විඥනය ඇති වැඩ කරන ජනයා සියලු දෙනාම නියම සත්‍යය දන්නා නිසා, ඔවුන් යුද්ධයේ අර්ථය දන්නා නිසා, ජර්මන් විප්ලවය වහාම ආරම්භ වනු ඇතැයි යන විශ්වාසයෙහි එල්බගෙන එය මත්තේ සියල්ල ඔට්ටු තැබීම ආත්ම වංචනයක් බව ඔවුන් දන්නා නිසා, ඔවුන් මෙම සාමය පිළිගනු ඇත. අපි අපගේ පින්ලන්ත මිත්‍රයන්ට විනාශය නොව විරාමයක් නැතහොත් ආධාරයක් දුන්නෙමු. සාමය අත්සන් කිරීමෙන් අපිද එම විරාමය ලබා ගන්නෙමු.

මීට වඩා බොහෝ සෙයින් මංකොල්ලකාරී ගිවිසුම් ඇති කර ගැනීම පිළිබඳ නිදර්ශන ඉතිහාසයේ එන බව මම දන්නෙමි. ජයග්‍රාහකයාට කැමති දෙයක් කිරීම සඳහා ප්‍රරෝහණ ශක්තිය සහිත ජාතීන් යටත් කර දුන් ගිවිසුම් ගැන මම දන්නෙමි. අපි අපගේ සාමය ටිල්සිට් සාමයට සම කරමු. ටිල්සිට් සාමය ජයග්‍රාහකයා විසින් ප්‍රැසියාව සහ ජර්මනිය මත පටවන ලද්දක් විය. එය ඉතාමත් අහිතකාරී සාමයක් විය. එයින් කරන ලද්දේ සියළුම ජර්මන් රාජ්‍යයන්ගේ අග නගර අල්ලාගැනීම පමණක්ද, අප ඕම්ස්ක් හා තොම්ස්ක් දක්වා පස්සට තල්ලු කිරීමක් වැනි යයි කිව හැකි ලෙසට ප්‍රැසියානුන් ටිල්සිට් දක්වා ආපසු තල්ලු කර දැමීම පමණක්ද නොවේ. එහි නරකම දෙය වූයේ ස්වකීය යුද්ධ සඳහා අවශ්‍ය අතිරේක හමුද සපයන ලෙස නැපෝලියන් එයින් පරාජිත ජාතීන්ට නියම කර තිබීම ය. ඒ එසේ වුවත්, අවස්ථාව පැමිණි විට, එනම්, ප්‍රංශයේ විප්ලවවාදී යුද්ධ අවධිය අවසන් වී එහි අධිරාජ්‍යවාදී යුද්ධ අවධිය ආරම්භ වූ විට, ජයග්‍රාහකයාගේ ප්‍රහාරයට විරුද්ධව නැගී සිටීමට ජර්මන් ජනතාවට සිදු විය. හිස් වාක්‍ය ඛණ්ඩ උද්වේගී ලෙස ඇද බැමෙහි රුචිවන අය, සාමය ඇති කර ගැනීම ඇදවැටීමක් ලෙසට සිත්තම් කරන ඒ අය වටහා ගැනීමට අකැමති කාරණය එවිට හෙළිදරව් විය. කම්කරුවෙකු හා ගොවියෙකු තුළ නොව රදළ ද්වන්ද්ව සටන් කාරයෙකු තුළ මෙවැනි මනෝස්වභාවයක් තිබීම වටහා ගත හැකිය. මින් මුළින් සඳහන් අය අමාරුකම් විඳ ඇති හෙයින් සිතා බැලීමට පුරුදුව ඇත. මීටත් වඩා දුෂ්කර තත්වයන් පැවති අවස්ථා වී නමුත්, මීටත් වඩා නොදියුණු ජාතීන් ඒවා ජය ගෙන ඇත. මීට වඩා අවාසිදයක ගිවිසුම් ඇති කරගත් අවස්ථා තිබේ. ජර්මානුන්ට යුද්ධ හමුදවක් නැතිව තිබුණු, එසේ නැතහොත්, ඔවුන්ටද අපේ වැනි රොගී හමුදවක් තිබුණු අවස්ථාවක ඔවුහු එම ගිවිසුම්වලින් එකකට අත්සන් තැබූහ. ඔවුහු නැපොලියන් සමග ඉතා අහිතකාරී ගිවිසුමට අත්සන්කළහ. නමුත් සාමය

ජර්මනියේ ඇදවැටීම නොවී ය. ඊට ප්‍රතිකූල වශයෙන් එය සන්ධිස්ථානයක් විය, ජාතියේ ආරක්ෂාව විය, පුනර්ජීවයක් විය. අපිද එවැනිම සන්ධිස්ථානයක පූර්වාසන්නයට පැමිණ සිටින්නෙමු. එයටම සමාන කොන්දේසිවලට මුහුණ දෙමින් සිටින්නෙමු. අපි සත්‍යයට එක එල්ලේ මුහුණ දිය යුත්තෙමු. හිස් වදන් මාලා සහ ප්‍රකාශන සියල්ල ඉවත දැමිය යුත්තෙමු. සාමය අවශ්‍ය නම් එය ඇති කළ යුතු යයි අපි කිව යුත්තෙමු. නැපෝලියන් යුද්ධවල තැන ගැනීමට විමුක්ති යුද්ධය, පංති යුද්ධය, ජනතා යුද්ධය එනු ඇත. නැපෝලියන් යුද්ධ ක්‍රමය වෙනස් වනු ඇත. යුද්ධය ඉවත් වී සාමයත්, සාමය ඉවත් වී යුද්ධයත් එනු ඇත. එසේම ඉතා දුෂ්කර සාමයකින් නිතරම පැන නැංගේ යුද්ධය සඳහා වඩාත් විස්තෘත සූදනමකි. සාම ගිවිසුම් අතරින් අහිතකාරී හා අවාසිදයක වූ ටිල්සිට් සාමය, ජර්මන් ජනතාව පිබිදීමට පටන්ගත් කාලය වෙත ඔවුන් හැරුණු සන්ධිස්ථානයක් ලෙසට ඉතිහාසයේ සටහන් වී තිබේ. ඔවුන් ටිල්සිට් දක්වා පසු බැසීම රුසියාවට පෙනෙන්නේ ඔවුන් ඇත්ත වශයෙන්ම කාලය ලබා ගැනීම සඳහා කළ දෙයක් ලෙසට ය. එය ජාත්‍යන්තර තත්වය බලාපොරොත්තුවෙන්, වරක් නැපෝලියන්ට — ඔහුද හොහෙන්ට්සොලර්න් හා හින්දෙන්බුර්ග් වැනි මංකොල්ලකාරයෙක් විය — වාසිදයකව තිබූ තත්වය වෙන්ස්වන තෙක්ද, දශක ගණන් තිස්සේ පැවති නැපෝලියන් යුද්ධවලින් සහ පරාජිත වීම් වලින් ගැහැට වින්ද ජර්මන් ජනතාවගේ මනෝභාවයේ දූර්වල කම් මග හැරෙන තෙක් හා ජර්මන් ජනතාවට නැවත ශක්තිය ලැබෙන තෙක්ද ප්‍රමාදවීමක් විය. ඉතිහාසය අපට උගන්වන්නේ එයයි. දූර්මුඛවීම් සහ හිස් වදන් සියල්ලම සාපරාධී වන්නේ එහෙයිනි. ඔව්, පරණ අධිරාජ්‍යවාදී යුද්ධ කෙළවර වී ඓතිහාසික සන්ධිස්ථානයක් මතුවී ඇත යනුවෙන් සෑම කෙනෙක්ම කියනු ඇත්තේ එහෙයිනි.

අපගේ විප්ලවය ඔක්තෝබරයේ පටන් එක දිගටම පැවති විජයග්‍රහණයක් විය. දැන්, දීර්ඝ ලෙස දුෂ්කරතාවයන් පවතින කාලය පැමිණ තිබේ. එය කොතරම් දීර්ඝ දැයි අප නොදන්නෙමු. නමුත් එය පරාජය ලැබෙන පසුබැසීම් සහිත දීර්ඝ කාලයක් වනු ඇති බව අපි දන්නෙමු. එසේ කියන්නේ බලවේග ඒ ආකාරයට පෙළ ගැසී තිබෙන හෙයිනි; පසු බැසීමෙන් අප කරන්නේ නැවත ශක්තිය ඇති කර ගැනීමට ජනතාවට අවස්ථාවක් සලසා දීම වන හෙයිනි. පීඩිත ජනතාවන්ට විරුද්ධව අධිරාජ්‍යවාදී මංකොල්ල කරුවන් කරන යුද්ධ නැවතත් ආරම්භ වන බව සෑම කම්කරුවෙකුටම හා ගොවියෙකුටම අවබෝධ වන සේ, ඒ හැම කෙනෙකුටම සත්‍යය වටහාගැනීමට ඉඩ කඩ සලස්වන්නෙමු. ඔක්තෝබරයේ පටන්ම අප ආරක්ෂාවාදීන් වී සිටි නිසා අප පිතෘ භූමියේ ආරක්ෂාව සඳහා නැගී සිටිය යුතු බව එවිට සෑම කම්කරුවෙකුටම හා ගොවියෙකුටම වැටහී යනු ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අපි පීතෘ භූමියේ ආරක්ෂාව සඳහා සටන් කරන බව ඔක්තෝබර් 25 දින පටන් විවෘතවම කීවෙමු. අප එසේ කීවේ අපට පීතෘ භූමියක් තිබෙන හෙයිනි. අප එම පීතෘ භූමියෙන් කෙරෙන්ස්කි ලා සහ චෙර්නොව්ලා පන්නා දැමූ නිසාද, රහස් ගිවිසුම් ඉරා දැමූ නිසාද, ධනපති පංතිය මැඩ දැමූ නිසාද අපට පීතෘ භූමියක් තිබේ. ධනපතියන් මැඩලීමේ කාර්ය මෙතෙක් හරිහැටි කර නැතත්, එය වඩාත් හොඳින් කිරීමට අපි උගෙන ගන්නෙමු.

ජර්මන් ජනතාවගේ තත්වයත්, ජර්මන් ආක්‍රමණිකයන් අතින් තදබල ලෙස පරාජයට පත් රුසියානු ජනතාවගේ තත්වයත් අතර කවත් වැදගත් වෙනසක් ඇත, සහෝදරවරුනි. මෙහිදී සඳහන් කළ යුතු විශාල වෙනසක් තිබේ. මගේ කථාවේ මුල් කොටසෙහිදී ඒ ගැන දළ වශයෙන් සඳහන් කෙළෙමි. සහෝදරවරුනි, අවුරුදු සියයකට පෙර, ජර්මන් ජනතාව රටවල් අල්ලා ගැනීමේ ඉතා කෲර යුද්ධ සහිත කාල පරිච්ඡේදයට පා තබන විට, ඔවුන් පිබිදී ඒමට පෙර, ඔවුන්ට පසුබැසීමටත්, එකක් පස්සේ තව එකක් යන ආකාරයෙන් නින්ද සහගත ගිවිසුම් අත්සන් කිරීමටත් සිදු විය — ඒ වකවානුවේදී ජර්මන් ජනතාව දුර්වලව හා නොදියුණුව සිටියහ. ඔවුන්ගේ තත්වය එසේවිය. ඔවුන්ට එරෙහිව සිටියේ ආක්‍රමණික නැපෝ-ලියන්ගේ යුද්ධ හමුද හා බලවේග පමණක් නොවේ. විප්ලවවාදී සහ දේශපාලන අර්ථයෙන් මෙන්ම අන් සෑම අර්ථයෙන්ද ජර්මනියට වඩා බොහෝ උසස් වූ රටක්, අන් සියලු රටවලට වඩා බොහෝ ඉහළට නැඟුනු රටක්, මුදුනට පත් රටක්, ඔවුන්ට එරෙහිව සිටියේය. ඒ රට, අධිරාජ්‍යවාදීන්ට හා ඉඩම් හිමියන්ට යටත්ව ලැග සිටි ජනතාවන්ට වඩා බොහෝ උසස් තත්වයක සිටියේය. සැබැවින්ම දුර්වල හා නොදියුණු වූ — මම එය නැවතත් කියමි — ජනතාවක් තමන්ට ලැබුණු අමිහිරි පාඩම්වලින් කරුණු උගෙන ගෙන නැගී සිටීමට සමත් විය. අපේ තත්වය ඊට වඩා යහපත්ය. අපි හුදෙක්ම දුර්වල හා නොදියුණු ජනතාවක් පමණක් නොවෙමු. විශේෂ සේවාවක් හෝ ඓතිහාසික වශයෙන් පූර්ව නිශ්චිත ඉරණමක් හෝ නිසා නොව, ඓතිහාසික කරුණු එක්තරා නිශ්චිත ආකාරයකින් ගැලපීම නිසා, ජාත්‍යන්තර සමාජවාදී විප්ලවයේ ධජය එසවීමේ ගෞරවය පිළිගැනීමට සමත් වූ ජනතාවද අපි වෙමු. (අත්පොළසන්.)

මෙම ධජය අල්ලාගෙන සිටින අත් දුර්වල බව මම දනිමි. මම මීට පෙර කීපවරක්ම ඒබව එක හෙළාම කියා ඇත්තෙමි. සියලුම දියුණු රටවල කම්කරුවන් ආධාරයට එතොත් මිස, ඉතාමත් නොදියුණු රටේ කම්කරුවන්ට එම ධජය අල්ලාගෙන සිටීමට නොහැකි වන්නේය. අප ක්‍රියාත්මක කර තිබෙන සමාජවාදී ප්‍රතිසංස්කරණ කිසිසේත් අංග සම්පූර්ණ නොවේ. ඒවා දුර්වලය, අප්‍රමාණවත්ය. බටහිර යුරෝපීය කම්කරුවන්ට ඔවුන්ගේ මඟ සලකුණු කර ගැනීම සඳහා ඔවුන්ට ඒවා ප්‍රයෝජනවත් වනු ඇත.

"කළ යුතු වූ කාර්යය ආරම්භ කිරීමේදී රුසියානුන් වැඩ කර තිබෙන හැටි හොඳ නැතැ" යි ඔවුන් කියනු ඇත. ජර්මානුන් හා සමග සසඳන කල අපගේ ජනතාව හුදෙක් දුර්වල සහ නොදියුණු පමණක් නොව, විප්ලවයේ ධජය එසවූ ජනතාව ද වන්නේය. වැදගත් කාරණය එයයි. ඔබ සිතන ඕනෑම රටක ධනපති පංතිය ඔවුන්ගේ පුවත්පත් තීරු ගණන් පුරවමින් බොල්ෂෙවික් වරුන්ට ගරහන නමුත්, ප්‍රංශය, බ්‍රිතාන්‍යය, ජර්මනිය ආදී රටවල අධිරාජ්‍යවාදී පුවත්පත් එක හඬින් බොල්ෂෙවික්වරුන්ට ශාප කරන නමුත්, අපගේ සමාජවාදී ආණ්ඩුවේ නම් හෝ සටන් පාඨ නිසා කෝපාග්නිය මතුවන කම්කරු රැස්වීමක් කුමණ රටෙහිදීවත් ඔබට දකින්නට නුපුළුවන. (සභාවෙන් හඬක්: "ඒ බොරු!") නැත. එය බොරුවක් නොවේ. එය ඇත්ත ය. පසුගිය මාස කීපය තුළදී ජර්මනියට ඔස්ට්‍රියාවට, ස්විට්සර්ලන්තයට හෝ ඇමෙරිකාවට ගිය ඕනෑම කෙනෙක්, එය බොරුවක් නොවන බවත්, එය ඇත්ත බවත් ඔබට කියනු ඇත. රුසියාවේ සෝවියට් බලයේ නියෝජිතයන්ගේ නම් හා සටන් පාඨ කම්කරුවන් විසින් ඉමහත් උනන්දුවෙන් පිළිගනු ලබන බවත්, ජර්මනිය, ප්‍රංශය ආදී රටවල ධනපති පංතිය පතුරුවන බොරු නොතකාම, එසේම, අප කොතරම් දුර්වල වුවත්, තමන්ගේ යහපත සඳහා රුසියාවේ කටයුතු කෙරෙන බව කම්කරු පංති පොදු ජනතාව වටහාගෙන සිටින බව එරටවලට ගිය කෙනෙක් ඔබට කියනු ඇති. ඔව්, අපගේ ජනතාව දැරිය යුතු බර ඉතා විශාලය. එය ඔවුන්ම කරට ගත් බරකි. නමුත් සෝවියට් බලය ස්ථාපිත කිරීමෙහි සමත් වූ ජනතාවක් විනාශ විය නොහැක. එනිසා මම නැවතත් මෙසේ කියමි. සෝවියට් බලය — දුර්වල කම් රැසක් සහිත බව මා දන්නා නමුත් හා ඒවායේ බරපතලකම මා සම්පූර්ණයෙන්ම පිළිගන්නා නමුත් — උසස්ම වර්ගයේ රාජ්‍යය බවත්, එය පැරිස් කොමියුනයේ සෘජු අනුප්‍රාප්තිකයා බවත් පිළිනොගෙන සිටිය හැකි දේශපාලන විඥනය ඇති එකම සමාජවාදියෙක්වත්, විප්ලවයේ ඉතිහාසය ගැන සිතා බලන අය අතර වන එකම කම්කරුවෙක්වත් නොමැත්තේය. එය යුරෝපයේ අනිකුත් විප්ලවවලට වඩා එක හිණක් ඉහළට නැඟ තිබේ. එනිසා අවුරුදු සියයකට පෙර ජර්මන් ජනතාව අත්දුටු දුෂ්කරතාවයන් අත්දැකීමට අපට සිදු වී නැත. වැඩවසම් ක්‍රමයෙන් පීඩනයට පත් ජර්මන් ජනතාවට ඉතිරි වූයේ එකම දෙයකි. තිබුණේ එකම අවස්ථාවකි. එනම්, කොල්ලකරුවන් අතර බල තුලනය වෙනස් වීම හා ඔවුන් අතර ඝට්ටනයෙන් ප්‍රයෝජන ගනිමින් කොල්ලකරු නැපෝලියන්ගේ, කොල්ලකරු පළමුවැනි ඇලෙක්සැන්දර්ගේ සහ කොල්ලකාරී බ්‍රිතාන්‍ය රාජාණ්ඩුවේ නියමයන් ඉටු කිරීම ය. එසේ ද වුවත් ටිල්සිට් සාමය නිසා ජර්මන් ජනතාව වැනසුනේ නොවේ. නමුත් අපගේ තත්වය ඊට වඩා හොඳ බව මම නැවතත් කියමි. අපගේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සතුරන් මොනවා කීවත් අපට බටහිර යුරෝපීය රටවල බලවත් මිත්‍රයෙක් ඇත්තේය. ඒ අපගේ පැත්ත ගන්නා නිර්ධන පංතිය වන ජාත්‍යන්තර සමාජවාදී නිර්ධන පංතියයි. (අත්පොළසන්.) 1917 පෙබරවාරි මස අග වන තෙක් අපට අපගේ හඬ නැඟීම දුෂ්කර වූ සේම, එම මිතුරාටද ඔහුගේ හඬ නැඟීම පහසු නොවන බව සැබවි. එම මිතුරා වාසය කරන්නේ රහසිගත තත්වයන් යටතේය. ඔහු ජීවත්වන්නේ දූන් සියලුම අධිරාජ්‍යවාදී රටවල පවතින යුද්ධ සිරගෙවල් වැනි තත්වයන් යටතේය. නමුත් ඔහු අප ගැන දන්නේය, අපගේ ව්‍යාපාරය ගැන අවබෝධ කරගෙන සිටින්නේය. අපගේ ආධාරයට පැමිණීම ඔහුට දුෂ්කර වී ඇත. එනිසා ඔහු අපගේ ආධාරයට එන්නට පෙර බොහෝ කාලයක් සිටීමටත්, බොහෝ ඉවසිලිමත් වීමටත්, මහත් දුෂ්කරතාවයන්ට මුහුණ දීමටත් සෝවියට් හමුදාවලට සිදුවනු ඇත. කාලය අපට පක්ෂව මෙහෙ කරන හෙයින්, ප්‍රමාදයේ ඉතාමත් සුළු අවස්ථාවෙන් පවා අපි ප්‍රයෝජන ගන්නෙමු. අපගේ අභිමතාර්ථය ශක්තියෙන් වැඩෙන්නේය. අධිරාජ්‍යවාදීන්ගේ බලවේග දුර්වල වන්නේය. එනිසා ''ටිල්සිට්'' සාමයෙන් කුමණ දුෂ්කරතාවයන් හා පරාජය වීම් උද්ගත වුවත්, අපි පසුබැසීමේ උපක්‍රම ආරම්භ කරන්නෙමු. තවද දේශපාලන විඥානය ඇති නිර්ධන පංතිය හා එසේම දේශපාලන විඥානය ඇති ගොවිජනතාවද අපේ පැත්තෙහි සිටින බවත්, වීරෝදාර ප්‍රහාර දීම පමණක් නොව, වීරෝදාර පසුබැසීම්ද කිරීමට අප සමත් බවත් නිසැක යයිද, අපි ජාත්‍යන්තර නිර්ධන පංතිය අපගේ සහායට එනතෙක් සිටින්නෙමු යයිද, අනතුරුව දෙවැනි සමාජවාදී විප්ලවයක් කරන්නෙමු යයිද, එය ලෝක පරිමාණයෙන් සිදුවන විප්ලවයක් වනු ඇතැයිද මම නැවතත් කියන්නෙමි. (අත්පොළසන්).

II

බ්‍රෙස්ට් ගිවිසුම අනුමත කිරීම ගැන යෝජනාව

අපගේ නියෝජිතයන් 1918 මාර්තු 3 දින බ්‍රෙස්ට්-ලිතොව්ස්ක්හි දී අත්සන් කළ සාම ගිවිසුම මෙම සම්මේලනය විසින් ස්ථිර (අනුමත) කරනු ලැබේ.

අපට යුද්ධ හමුදාවක් නොමැති නිසා සහ ජනතාව යුද්ධයෙන් වෙහෙසට පත්ව සිටින නිසා මෙම ඇදහිය නොහැකි තරම් අවාසි, මංකොල්ලකාරී හා අවමානකාරී සාමය අත්සන් කිරීමට තීරණය කිරීමෙන් මධ්‍යම විධායක කාරක සභාව සහ මහජන කොමිසාර් මණ්ඩලය කළ කටයුතු නිවැරදි බව සම්මේලනයේ පිළිගැනීමයි. ධනපතියෝ සහ ධනපති බුද්ධිමත්හු ආපදාවට පත් ජනතාවට ආධාර නොකළ අතර එම ආපදාව තමන්ගේ ආත්මාර්ථකාමී පංති අරමුණු සඳහා උපයෝගි කර ගැනීමට කටයුතු කළහ.

ජර්මානුන් ඉදිරිපත් කළ සාම කොන්දේසි පැහැදිලි අවසාන නිවේදනයක සහ නිරුවත් බලහත්කාරකමක ස්වභාවයෙන් අප මත දමන ලද නිසා, එම කොන්දේසි ගැන විස්තර කරුණු සාකච්ඡා කිරීමට ප්‍රතික්ෂේප කිරීමෙන් සාම නියෝජිත මණ්ඩලය ගත් නිසැක ලෙසම නිවැරදි පියවරද මෙම සම්මේලනය විසින් පිළිගනු ලැබේ.

මෙම මොහොතේ ප්‍රධාන, හදිසි සහ ඉතාමත් වැදගත් කර්තව්‍ය වන විනය හා වැඩ කරන ජනතාවගේ ස්වයං විනය ක්‍රියාත්මක කරන ලෙසත්, හැකි තාක් දුරට සියළුම නිෂ්පාදන සහ බෙදා හැරීමේ කටයුතු බලාකර ගැනීම සඳහා ශක්තිමත් හා මනාව පිහිටුවන ලද සංවිධාන රට සෑම තන්හිම ඇති කරන ලෙසත්, ඉතාමත් විස්මය ජනක යුද්ධයකින් අනිවාරණීය ලෙස උරුම කොට ලැබෙන, එහෙත්, සමාජවාදයේ පූර්ණ ජයග්‍රහණයට හා සමාජවාදී සමාජයේ අඩිතාලම ශක්තිමත් කිරීමට හරස්වන ප්‍රධාන බාධකය වන අවුල් සහගත භාවයට අසංවිධානයට සහ ආර්ථික විනාශයට විරුද්ධව නිර්දය අරගලයක් කරන ලෙසත්, මෙම සම්මේලනය සියළුම කම්කරුවන්ගෙන්, සොල්දාදුවන්ගෙන් සහ ගොවිජනයාගෙන් ඉතාමත් දැඩි ලෙස ඉල්ලයි.

අද, ඔක්තෝබර් විප්ලවයෙන් පසුව, රුසියාවේ ධනපති පංතියේ දේශපාලන බලය පෙරළා දැමීමෙන් පසුව, රහස් ගිවිසුම් සියල්ලම හෙළා දැක ඒවා ප්‍රසිද්ධ කිරීමෙන් පසුව, විශේෂයක් නොමැතිව සියළුම ජනතාවන්ට කම්කරුවන්ගේ සහ ගොවි ජනතාවගේ ආණ්ඩුව විසින් සාධාරණ සාමයක් යෝජනා කරනු ලැබීමෙන් පසුව, තමන් වෙනත් රටවල් කොල්ලකෑමට සහ පීඩාවට පත් කිරීමට හවුල් නොවන බව ප්‍රකාශ කිරීමේ අයිතිය, අධිරාජ්‍යවාදී යුද්ධයේ දඩු අඩුවෙන් නිදහස් වූ රුසියාට ඇත.

මංකොල්ලකාරී යුද්ධ ඒකමතික ලෙස හෙළා දුටු රුසියානු සෝවියට් ඒකාබද්ධ සමූහාණ්ඩුව, ඕනෑම අධිරාජ්‍යවාදී බලවතෙකුගෙන් එන සෑම ප්‍රහාරයකින්ම මෙතැන් පටන් සමාජවාදී පිතෘ භූමිය ආරක්ෂා කිරීම තමන්ගේ අයිතිය සහ යුතුකම ලෙසට සලකයි.

එනිසා රටේ ආරක්ෂක ශක්‍යතාවය නැවත ඇති කර වැඩි දියුණු කිරීම සහ සමාජවාදී මිලීෂියා හමුදාවක් පදනම් කරගෙන හා පුරුෂ සහ ස්ත්‍රී යන දෙපාර්ශ්වයේම තරුණ සහ වැඩිහිටි යන සියළු දෙනාටම විශ්වීය යුද්ධ පුහුණුව දීමෙන් රටේ යුද්ධ ශක්තිය නැවත තහවුරු කිරීම යඳහා සියළුම බලවේගයන් ඒකරාශී කිරීම සියළුම වැඩ කරන ජනයාගේ කොන්දේසි විරහිත යුතුකම බව මෙම සම්මේලනය අදහස් කරයි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ප්‍රාග්ධනයේ වියගසට විරුද්ධව සියළුම රටවල කම්කරුවන් විසින් වේතන වහල්භාවයෙන් නිදහස් වීමට මිනිස් වර්ගයා මෙහෙයවන මාවත සුරක්ෂිත හා කෙටි කිරීමටත්, සමාජවාදී සමාජයක් හා ජනතාවන් අතර කල්පවත්නා සහ සාධාරණ සාමයක් ඇති කිරීමටත්, හැකි සියල්ලම කරනු ඇතැයි යනුවෙන් සම්මේලනය තම විශ්වාසය පළ කරයි.

ජාත්‍යන්තර කම්කරු විප්ලවය ඈතක නොවේ යයිද, සමාජවාදී ව්‍යාපාරය මර්දනය කිරීම සඳහා ඉතාමත් තිරිසන් ක්‍රම යොදා ගැනීමට සියළුම රටවල අධිරාජ්‍යවාදීන් නොපැකිළෙන නමුත් සමාජවාදී නිර්ධන පංතියේ පූර්ණ ජයග්‍රහණය සහතික යයිද සම්මේලනය තරයේ විශ්වාස කරයි.

යෝජනාව 1918 මාර්තු 13 හෝ 14 දින ලියන ලදී.

''සාම ගිවිසුම අත්සන් කිරීම ගැන වාර්තාව'' 1918 මාර්තු 16 හා 17 (3 හා 4) දිනවල ''ප්‍රාව්ද'' (''සොට්සල්දිමොක්‍රාට්'') අංක 47 හා 48 කලාපවල පළ කරන ලදී. යෝජනාව 1918 මාර්තු 16 (3) දින ''ප්‍රාව්ද'' (සොට්සල්-දිමොක්‍රාට්'') අංක 47 හි පළකරන ලදී.

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 36, පිටු 92—111, 122—123

සෝවියට් ආණ්ඩුවේ හදිසි කර්තව්‍යයන්[20]

රුසියානු සෝවියට් සමූහාණ්ඩුවේ ජාත්‍යන්තර තත්වය සහ සමාජවාදී විප්ලවයේ මූලික කර්තව්‍යයන්

දිනා ගෙන තිබෙන සාමය අතිශයින්ම බැරෑරුම් සහ අතිශයින්ම අස්ථිර වූයේ නමුත්, එම සාමයට ස්තූති වන්නට, සමාජවාදී විප්ලවයේ ඉතාමත් වැදගත් සහ ඉතාමත් අමාරු අංශය වන සංවිධාන කටයුතු පිළිබඳ කර්තව්‍යය කෙරෙහි රුසියානු සෝවියට් සමූහාණ්ඩුවේ ප්‍රයත්නයන් යොමු කිරීමට සුළු කලක හෝ අවසරයක් එයට ලැබී තිබේ.

1918 මාර්තු 15 දින මොස්කව්හි රැස්වූ අති විශේෂ සෝවියට් සභා සම්මේලනය අනුමත කළ යෝජනාවේ (4 වැනි කොටස) හතරවැනි ඡේදයෙන්, වැඩ කරන ජනතාවගේ ස්වයං විනය ගැන සහ අවුල් සහගත භාවයට හා අසංවිධානයට විරුද්ධව නිර්දය අරගලයක් කිරීම ගැන කියන එම ඡේදයෙන් (හෝ කොටසෙන්), මෙම කර්තව්‍යය පැහැදිලි ලෙස හා නිශ්චිත ලෙස සියළුම වැඩ කරන සහ පීඩිත ජනයා හමුවේ තබන ලදී*.

රුසියානු සෝවියට් සමූහාණ්ඩුව දිනා ගෙන තිබෙන සාමය අස්ථිර වන්නේ දැන් එය නැවතත් යුද්ධ කටයුතු ආරම්භ කිරීමට කල්පනා කරන නිසා නම් නොවේ. ධනපති ප්‍රතිවිප්ලවවාදීන් සහ ඔවුන්ගේ අනුචරයින් (මෙන්ෂෙවික්වරු සහ වෙනත් අය) හැර, එසේ කිරීමට සිතන වෙනත් සිහි කල්පනා ඇති දේශපාලනඥයෙක් නැත. සාමය අස්ථිර වී තිබෙන්නේ, බටහිරෙන් සහ නැගෙනහිරෙන් රුසියාවේ දේශ සීමා යාබදව තිබෙන අධිරාජ්‍යවාදී රටවල් අතිවිශාල යුද්ධ හමුදා ඇතිව සිටින අතර, රුසියාවේ මේ මොහොතේ දුර්වලකම දැකීමෙන් ඇතිවන ආකර්ෂණය නිසාද, සමාජවාදයට වෛර කරන සහ කොල්ලයට ගිජු ධනපතියන්ගේ පෙළඹවීමෙන්ද, එරටවල යුද්ධ පාක්ෂිකයන් ඕනෑම මොහොතක බලවත්වීමට ඉඩ ඇති හෙයිනි.

---

* මෙහි පිටු 13—34 බලන්න.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මෙම තත්වයන් යටතේ, සාමය පිළිබඳව, කඩදසියේ නොව යථාර්ථ වශයෙන් අපට ඇති එකම සහතිකය, බලවත් අධිරාජ්‍යවාදී රටවල් අතර පවතින සතුරුකාවය ය. එය සීමාන්තික තත්වයට පත්ව තිබේ. එක් අතකින් බටහිර රටවල අධිරාජ්‍යවාදී මිනිස් ඝාතනය නැවත ආරම්භ කිරීමෙන්ද, අනික් අතින් ශාන්තිකරය හා ශාන්තිකර වෙරළ සඳහා ජපානය සහ ඇමෙරිකාව අතර අධිරාජ්‍යවාදී තරඟය අතිශයින් උග්‍රවීමෙන්ද මෙය පෙනේ.

ආරක්ෂාවට ඇත්තේ එබඳු රැකවලක් වන කල, අපගේ සෝවියට් සමූහාණ්ඩුව අතිශයින්ම අස්ථාවර සහ නියත වශයෙන්ම බැරෑරුම් ජාත්‍යන්තර තත්වයක පසුවන බව කිවමනා නොවේ. රුසියාවේ සමස්ත සමාජ දේහයේම ඇති බරපතල යුද්ධ තුවාල සුව කර ගැනීම සහ ආර්ථික පුනර්ජීවයක් ඇති කර ගැනීම, අප රටේ ආරක්ෂක ශක්‍යතාවය වර්ධනය කර ගැනීමට නැතිවම බැරි අතර, එම අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා, අපට මෙම ඒකාබද්ධ වූ තත්වයන් හේතුවෙන් ලැබී ඇති විරාමයෙන් ප්‍රයෝජන ගැනීමට අප මුළු ධෛර්යයෙන් ප්‍රයත්න දැරිය යුතුය.

හේතු සාධක ගණනාවක් නිසා ප්‍රමාද වී තිබෙන බටහිර රටවල සමාජවාදී විප්ලවයට ඵලදායක ලෙස ආධාර කිරීමට අපට හැකි වන්නේ, අප හමුවේ තිබෙන සංවිධානය කිරීමේ කර්තව්‍යය සපුරාලීමට අප සමත් වූ තාක් දුරට පමණකි. එය නොකීවත් පැහැදිලි කරුණකි.

අප හමුවේ තිබෙන මෙම ප්‍රධාන කර්තව්‍යය සාර්ථක ලෙස ඉටු කිරීමට අදාල වන මූලික කොන්දේසියකි, ජනතාවගේ දේශපාලන නායකයන්, එනම්, රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ (බොල්ෂෙවික්) සාමාජිකයන්ද, පසුව, වැඩ කරන පොදු ජනතාවගේ පංති විඥානය ඇති නියෝජිතයන්ද, යන සියළු දෙනාම, එම නායකයන් අනුගමනය කරමින්, කලින් ඇති වූ ධනපති විප්ලව සහ වර්තමාන සමාජවාදී විප්ලවය අතර මූලික වෙනස සම්පූර්ණයෙන්ම වටහා ගැනීම.

ධනපති විප්ලවවලදී වැඩ කරන පොදු ජනතාවගේ ප්‍රධාන කර්තව්‍යය වූයේ, වැඩවසම් ක්‍රමය, රාජාණ්ඩුව සහ මධ්‍යකාලීන ස්වභාවය නැති කර දැමීමේ ප්‍රතිෂේධාත්මක කටයුත්ත ඉටු කිරීමය. එහිදී නව සමාජය සංවිධානය කිරීමේ අභිවර්ධනාත්මක නැතහොත් නිර්මාණශීලී කටයුත්ත ජනගහනයේ අල්පතරය වූ දේපල හිමි ධනපති පංතිය විසින් ඉටු කරන ලදී. එසේම මෙම පසු කී අය සාපේක්ෂ පහසුවකින් මෙම කර්තව්‍යය ඉටු කළහ. කම්කරුවන් සහ ගොවි ජනතාව ප්‍රතිරෝධය දැක්වූ නමුත්, එකල ප්‍රාග්ධනය විසින් සූරාකන ලද ජනතාව විසිරී සහ නූගත්ව සිටි නිසා, ඔවුන් ඉතාමත් දුර්වලව සිටි හෙයින් පමණක් නොව, අරාජික ලෙස ගොඩ නැගුනු ධනපති සමාජයේ ප්‍රධාන සංවිධායක බලවේගය සාංසිද්ධික

වශයෙන් වැඩෙන සහ ප්‍රසාරණය වන දේශීය සහ විදේශීය වෙළඳ පොළ වූ හෙයින්ද, ඔවුනට එය අපහසු නොවීය.

එසේ වුවද, සෑම සමාජවාදී විප්ලවයකදීම, එසේම, 1917 ඔක්තෝබර් 25 දින රුසියාවේ ආරම්භ වූ සමාජවාදී විප්ලවයේදීද, එයට නායකත්වය දෙන නිර්ධන පංතියේ සහ දුප්පත් ගොවි ජනතාවගේ ප්‍රධාන කර්තව්‍යය වන්නේ, කෝටි ගණන් ජනතාවගේ පැවැත්මට අවශ්‍ය වන භාණ්ඩ සැලැස්මානුකූල ලෙස නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම දක්වා විහිදී ගිය අතිශයින්ම සංකීර්ණ සහ සියුම් නව සංවිධාන ක්‍රමයක් පිහිටුවීමේ අභිවර්ධනාත්මක, නැතහොත්, නිර්මාණශීලී කටයුත්ත ඉටු කිරීමය. එවැනි විප්ලවයක් සාර්ථක ලෙස ඉටු කළ හැක්කේ, ජනතාවගෙන් බහුතරය, එමෙන්ම, ප්‍රධාන වශයෙන් වැඩ කරන ජනතාවගෙන් බහුතරය, ඉතිහාසයේ නිර්මාණකයන් ලෙසට ස්වාධීන නිර්මාණශීලී වැඩ කටයුතු කිරීමෙහි යෙදෙන්නේ නම් පමණකි. සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණය සහතික කළ හැකි වන්නේ, නිර්ධන පංතිය සහ දුප්පත් ගොවි ජනයා ප්‍රමාණවත් තරම් පංති විඥානයක්, ප්‍රතිපත්තියට කැප වීමක්, ආත්ම පරිත්‍යාගයක් සහ ධෛර්යයක් පෙන්වන්නේ නම් පමණකි. නව සමාජයක් ස්වාධීන ලෙස ගොඩනැගීමේ කටයුත්තට ක්‍රියාශීලී ලෙස සහභාගී වීමේ අවස්ථාවක් වැඩ කරන සහ පීඩිත ජනතාවට සලසා දෙන පරිද්දෙන් නව, සෝවියට් වර්ගයේ රාජ්‍යයක් ඇති කිරීමෙන් අප විසඳා තිබෙන්නේ දුෂ්කර ප්‍රශ්නයෙන් කුඩා කොටසක් පමණකි. ප්‍රධාන දුෂ්කරතාවය ඇත්තේ ආර්ථික අංශයෙහි ය. එය නම්, භාණ්ඩ නිෂ්පාදනය සහ බෙදා හැරීම පිළිබඳව දැඩි කම සහ විශ්වීය ගිණුම් තැබීමක් සහ පාලනයක් ආරම්භ කිරීම, ශ්‍රම ඵලදායකත්වය වැඩි කිරීම සහ නිෂ්පාදනය ව්‍යවහාරයෙන් සමාජමය කිරීම යනුයි.

රුසියාවේ අද ආණ්ඩු කරන පක්ෂය වන බොල්ෂෙවික් පක්ෂයේ සංවර්ධනය විසින් අප දැන් සම්ප්‍රාප්තව සිටින ඓතිහාසික සන්ධිස්ථානයේ ස්වභාවය සිත් කාවදින ලෙස සනිටුහන් කෙරෙයි. එය වර්තමාන දේශපාලන තත්වයේ අමුතු අංගලක්ෂණයක් වන අතර එනිසා සෝවියට් බලයේ නව හැඩ ගැස්මක්, එනම්, නව කර්තව්‍යයන් නව ආකාරයකින් ඉදිරිපත් කිරීමක් අවශ්‍ය වන්නේය.

අනාගතයේ සෑම පක්ෂයකම ප්‍රථම කර්තව්‍යය වන්නේ එහි වැඩ පිළිවෙළ සහ උපක්‍රම නිවැරදි බව ජනතාවගෙන් බහුතරයට ඒත්තු ගැන්වීම වේ. සාර්වාදී කාලවලදී මෙන්ම කෙරෙන්ස්කිලා සහ කිෂ්කින්ලා සමග සම්මුතිගත වීමේ වෙර්නොව්ලාගේ සහ ට්සෙරතෙලිලාගේ ප්‍රතිපත්-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තිය බල පැවති කාලයෙදීද ඉදිරියෙන්ම තිබුණේ මෙම කර්තව්‍යය. දැන් මෙම කර්තව්‍යය බොහෝ දුරට සම්පූර්ණ කර ඇත. රුසියාවේ කම්කරුවන්ගෙන් සහ ගොවි ජනයාගෙන් බහුතරය පැහැදිලිවම බොල්ෂෙවික්වරුන්ගේ පැත්ත ගෙන සිටින බව මෑතදී මොස්කව්හි පවත්වන ලද සෝවියට් සභා සම්මේලනයේදී අවිවාදී ලෙස පෙනී යාමෙන් ඒ බව ඔප්පුවේ. නමුත් එය කිසිසේත් ඉටු කර හමාර කර නැත. (තවද එය කිසි කලෙකත් ඉටු කර හමාර කළ හැකි කර්තව්‍යයක් නොවේ).

අප පක්ෂය මුහුණ දුන් දෙවැනි කර්තව්‍යය වූයේ බලය අල්ලා ගැනීම සහ සූරාකන්නන්ගේ ප්‍රතිරෝධය මර්දනය කිරීම ය. මෙම කර්තව්‍යය ද සම්පූර්ණ වශයෙන් ඉටු කර නොමැත. තවද, එක් අතකින් රාජාණ්ඩුවාදීන් සහ ව්‍යවස්ථානුකූල-ප්‍රජාතන්ත්‍රවාදීන් ද, අනිත් අතින් ඔවුන්ගේ අනුවරයින් සහ අන්තේවාසිකයන් වන මෙන්ෂෙවික්වරු සහ දක්ෂිණ සමාජවාදී-විප්ලවවාදීන්ද, සෝවියට් බලය පෙරළා දැමීමේ අරමුණ ඇතිව එක්සත් වීමට දරන ඔවුන්ගේ ප්‍රයත්නයන් නොනවත්වාම ගෙන යන හෙයින්, එම කර්තව්‍යය අමතක කළ හැකිද නොවේ. එහෙත්, 1917 ඔක්තෝබර් 25 දින පටන් (දළ වශයෙන්) 1918 පෙබරවාරි නැතහොත් බගයෙව්ස්කිගේ යටත්වීම දක්වා වූ කාල සීමාවේදී, සූරා කන්නන්ගේ ප්‍රතිරෝධය මර්දනය කිරීමේ කර්තව්‍යය බොහෝ දුරට ඉටු කරන ලදී.

තුන්වැනි කර්තව්‍යයක් දැන් හදිසි කර්තව්‍යය ලෙස ඉදිරියට එයි. එය වර්තමාන තත්වයේ අමුතු අංග ලක්ෂණය අනුව සැදුනකි. එය නම්, රුසියාවේ පරිපාලනය සංවිධානය කිරීමේ කර්තව්‍යය. 1917 ඔක්තෝබර් 25 දිනට පසු දිනම අප මෙම කර්තව්‍යය ඉදිරියෙන් තබා එය ඉටු කළ බව සැබවි. එසේ වුවද, මේ දක්වාම සූරාකන්නන්ගේ ප්‍රතිරෝධය විවෘත සිවිල් යුද්ධයේ ස්වරූපය ගත් නිසා, පරිපාලනයේ කර්තව්‍යය ප්‍රධාන සහ මධ්‍යම කර්තව්‍ය බවට පත් වීමේ අවකාශයක් මෙතෙක් නොවීය.

දැන් එය ප්‍රධාන සහ මධ්‍යම කර්තව්‍යය බවට පත්වී තිබේ. බොල්ෂෙවික්වරු වන අපි රුසියාවට කරුණු ඒත්තුගන්වා ඇත්තෙමු. අපි රුසියාව දුප්පතුන් සඳහා පොහොසතුන්ගෙන්, වැඩ කරන ජනතාව සඳහ සූරාකන්නන්ගෙන් දිනා ගෙන ඇත්තෙමු. දැන් අපි රුසියාව පරිපාලනය කළ යුත්තෙමු. වර්තමාන තත්වයේ මුළු අමුත්තම, සම්පූර්ණ දුෂ්කරත්වයම රඳා පවත්නේ ජනතාවට කරුණු ඒත්තුගැන්වීමේ සහ සූරාකන්නන් අවිබලයෙන් මර්දනය කිරීමේ ප්‍රධාන කර්තව්‍යයේ සිට පරිපාලනය කිරීමේ ප්‍රධාන කර්තව්‍යය දක්වා පරිවර්තනය වීමේ විශේෂ අංග ලක්ෂණ වටහා ගැනීම තුළය.

මිනිස් ඉතිහාසයේ ප්‍රථම වතාවට සමාජවාදී පක්ෂයක් බලය අල්ලා ගැනීම සහ සූරාකන්නන් මර්දනය කිරීම බොහෝ දුරට සම්පූර්ණ කොට,

එක එල්ලේම පරිපාලනය පිළිබඳ ප්‍රශ්නය වෙත ළඟා වීමට සමත් වී තිබේ. අපි සමාජවාදී විප්ලවයේ මෙම ඉතාමත් දුෂ්කර (සහ ඉතාමත් ප්‍රසන්න) කර්තව්‍යය ඉටු කිරීමට තරම් හපන් කම් ඇතියවුන් බව ඔප්පු කළ යුත්තෙමු. පරිපාලන කටයුතු සාර්ථක ලෙස කරනු පිණිස, ජනතාවට කරුණු ඒත්තු ගැන්වීමට අමතරව, සිවිල් යුද්ධයක් ජයගැනීමට සමත් වීමට අමතරව, ප්‍රායෝගික සංවිධාන කටයුතු කිරීමෙහි අප සමත් විය යුතු බව අපි සම්පූර්ණයෙන්ම වටහා ගත යුත්තෙමු. මෙය ඉතාමත් දුෂ්කර කටයුත්ත වන්නේය. එය දුෂ්කරවන්නේ, කෝටි සංඛ්‍යාත ජනතාවන්ගේ ජීවිතයෙහි ඉතාමත් ගැඹුරට මුල් බැස ගත් ආර්ථික අඩිතාලම් නව ක්‍රමයකට සංවිධානය කිරීම එයින් අවශ්‍ය කෙරෙන බැවිනි. එසේම එය ඉතාමත් ප්‍රසන්න කර්තව්‍යයද වන්නේය. මන්දයත්, රුසියාව සෝවියට් පමණක් නොව, සමාජවාදී වූද සමූහාණ්ඩුවක් වී ඇති බව කිව හැක්කේ එම කර්තව්‍යය (ප්‍රධාන සහ මූලික දළ සටහන් වශයෙන්) සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් හෙයිනි.

වර්තමාන අවස්ථාවේ
පොදු සටන් පාඨය

යුද්ධයෙන් සහ ධනපති පංතියේ (කෙරෙන්ස්කි සහ ඔහුට ආධාර කළ මෙන්ෂෙවික්වරුන් සහ දක්ෂිණාංශික සමාජවාදී-විප්ලවවාදීන් විසින් නියෝජනය කෙරුණු) පාලනයෙන් අප උරුම කොට ලැබූ අතිශයින් බැරෑරුම් සහ අස්ථාවර සාමය හා විනාශය, විරැකියාව සහ සාගතය පිළිබඳ භයානක තත්වය විසින් නිර්මාණය කෙරුණු, ඉහත විමර්ශිත වාස්තවික තත්වය හේතු කොටගෙන, ඒ සියල්ලම හේතු කොට ගෙන, වැඩ කරන ජනතාවගේ විශාල කොටස් අනිවාරණීය ලෙසටම අන්ත විඩාවට සහ ශක්ති ශූන්‍ය තත්වයට පවා පත්ව සිටිති. මෙම ජනතාව එක දිගටම ඉල්ලන්නේ විවේකයකි. ඔවුන්ට එය නොඉල්ලා බැරිය. දැන් දවසේ කර්තව්‍යය වී තිබෙන්නේ යුද්ධයෙන් සහ ධනපති පාලනයෙන් විනාශ වී ගිය නිෂ්පාදනීය බලවේගයන් යළි ප්‍රකෘතිමත් කිරීම ය; — යුද්ධයෙන්, යුද්ධය පරාජය වීමෙන්, ධනපති පංතියේ ලාභ ගැරීමෙන් සහ පෙරළා දමන ලද සූරාකන්නන්ගේ පාලනය යළි ස්ථාපිත කිරීමට ඔවුන් දරූ ප්‍රයත්නයෙන් ලැබුණු තුවාල සුව කිරීමය; — ආර්ථික පුනර්ජීවය සාර්ථක කිරීමය; — යම්තමින් හෝ සාමය පවත්වා ගැනීමට අවශ්‍ය විශ්වාසදායක ආරක්ෂාවක් සැලසීමය. මෙය තේරවිල්ලක් ලෙස පෙනෙන්නට පුළුවන. නමුත්, ඉහත පෙන්වන ලද වාස්තවික තත්වයන් යටතේ වර්තමාන අවස්-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ථාවේදී රුසියාව සමාජවාදයට පරිවර්තනය කිරීමෙහි ලා සෝවියට් ක්‍රමයට හැකියාව ලැබෙන්නේ, මෙම ඉතාමත් ප්‍රාථමික ප්‍රශ්න, එනම්, ධනපති පංතියේ, මෙන්ෂෙවික්වරුන්ගේ සහ දක්ෂිණාංශික සමාජවාදී විප්ලව-වාදීන්ගේ ප්‍රතිරෝධය තිබිය දීම, ජන ජීවිතය පවත්වා ගැනීම පිළිබඳ වූ අතිශයින්ම මූලික ප්‍රශ්න ප්‍රායෝගික වශයෙන් විසඳා ගතහොත් පමණකි. වර්තමාන තත්වයේ විශේෂ අංග ලක්ෂණ අනුව බලන කල සහ සෝවියට් බලයත්, එහි ඉඩම් සමාජ සන්තක කිරීමේ නීතිය, කම්කරු පාලන නීතිය, ආදියත් පවතින කල, මෙම ඉතාමත් ප්‍රාථමික ප්‍රශ්න විසඳීම සහ සමාජවාදය දෙසට යන ඉදිරිගමනේ ප්‍රථම අදියරෙහි දී පැන නගින සංවිධානමය ගැටළු විසඳා ගැනීම යන දෙක එකම පින්තූරයක අංශ දෙකක් බව පෙනේ.

නිති පතා සහ අවංකව මුදල් පිළිබඳ ගිණුම් තබන්න; අරපිරිමැස්මෙන් කළමණාකරණයෙහි යෙදෙන්න; සොරකම් නොකරන්න; ශ්‍රම විනය තදින් පිළිපදින්න — දැන් ධනපති පංතිය බලයෙන් නෙරපා දැමීමෙන් පසු, අවස්ථාවේ හදිසි සහ ප්‍රධාන සටන්පාඨ වන්නේ ඒවාය. ධනපති පංතිය, සූරාකන පංතියක් ලෙසට ගෙන ගිය එහි පාලනය වසං කිරීමට ධනපතියන් විසින් මෙම සටන් පාඨ යොදා ගන්නා ලද කල විප්ලවවාදී කම්කරුවෝ යුක්ති සහගත ලෙස ඒවා පිළිකුල් කළහ. නමුත්, එක් අතකින්, අධිරාජ්‍යවාදී යුද්ධය හා කෙරෙන්ස්කිගේ නායකත්වයෙන්යුත් අධිරාජ්‍යවාදී මංකොල්ලකාරයන් විසින් මරණාසන්න වන තරමට තලා පෙළා දමන ලද රටකට ගැලවීමේ එකම කොන්දේසිය වන්නේ වැඩ කරන පොදුජන සමූහයා විසින් මෙම සටන් පාඨ ප්‍රායෝගික ලෙස ක්‍රියා-ත්මක කරනු ලැබීමය. අනිත් අතකට සෝවියට් රාජ්‍යයේ නීති පදනම් කරගෙන, එම රාජ්‍ය විසින්, එය අනුගමනය කරන ක්‍රම මගින් මෙම සටන් පාඨ ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක කරනු ලැබීම සමාජවාදයේ අවසාන ජයග්‍රහණය සඳහා ප්‍රමාණවත් වන කොන්දේසියකි. මෙවැනි "පට්ටා ගැසුනු" සහ "අවශේෂ" සටන්පාඨ පෙරමුණෙහි තැබීමේ අදහස පිළිකුල් සහගත ලෙස පසෙක දමන අයට වටහා ගත නොහැකි කාරණය එය මය. මෙම සුළු ගොවි ජනතාවගේ රටෙහි සාර්වාදය පෙරළා දමා අවුරුද්දකට වඩා නැත. එය කෙරෙන්ස්කිලාගෙන් නිදහස් වී හය මාසයක්වත් නැත. එනිසා එහි ඉතිරි වූ සාංසිද්ධික අරාජිකභාවය සුළු පටු නොවේ. දීර්ඝ සහ ප්‍රතිගාමී සෑම යුද්ධයක්ම සමග සමගාමී වන කෲරත්වය හා තිරිසන් ස්වභාවය නිසා එම අරාජික භාවය උත්සන්න විය. ඒ අනුව බලාපොරො-ත්තු සුන්වීම සහ අරමුණක් නැති අප්‍රසාදය පිළිබඳ හැඟීම් බහුල ලෙස පැතිරී ඇත. තවද, ධනපති පංතියේ (මෙන්ෂෙවික්වරුන් දක්ෂිණාංශික සමාජවාදී-විප්ලවවාදීන්, යනාදී) අන්තේවාසිකයන්ගේ ප්‍රකෝපකාරී

ප්‍රතිපත්තියද අපි මෙයට එකතු කරන්නෙමු නම්, ජනතාවගේ ඉරියව් සම්පූර්ණයෙන්ම වෙනස් කිරීම සහ ඔවුන් විනය සම්පන්න ශ්‍රමයේ නියම මාවතට ගෙන ඒම පිණිස හොඳම සහ වැඩිම පංති විඥානයක් ඇති කම්ක-රුවන් සහ ගොවි ජනතාව කොතරම් දීර්ඝ ලෙස හා අනවරත ලෙස ප්‍රයත්න දැරිය යුතු වන්නේදැයි මනාව පැහැදිලි වේ. ධනපති පංතිය අභිභවා, විශේෂ-යෙන්ම වඩාත් මුරණ්ඩු සහ සංඛ්‍යාවෙන් බහුල ගොවි ධනපති පංතිය අභිභවා ලැබූ ජයග්‍රහණය උච්චස්ථානයට පත් කළහැකි වන්නේ, දුප්පත් බහු ජනතාව (නිර්ධන පංතිකයන් හා අර්ධ නිර්ධන පංතිකයන්) විසින් ක්‍රියාත්මක කරනු ලබන එවැනි පරිවර්තනයකින් පමණකි.

ධනපති පංතියට විරුද්ධව කරන අරගලයේ නව අදියර

LIBERATIONBASE

අප රටේ ධනපති පංතිය පරාජය කර තිබේ. නමුත් තවමත් එය මුලින් උපුටා දමා නැත— විනාශ කර දමා නැත. එපමණක් නොව එය සම්පූර්ණ-යෙන්ම බෙලහීන වූ තත්වයට පවා තවමත් පත් වී නැත. ධනපති පංතියට විරුද්ධව කරන අරගලයේ නව සහ වඩාත් උසස් ආකෘතියකට, එනම්, තවදුරටත් ධනපතියන් අසන්තක කිරීමේ ඉතා සරල කර්තව්‍යයේ සිට ධනපති පංතියට පැවතීමේ ඉඩ නැති කිරීමේ, නැතහොත්, නව ධනපති පංතියක් පැන නැගීමේ අවකාශය නැති කිරීමේ වඩාත් සංකීර්ණ හා දුෂ්කර කර්තව්‍යය දක්වා පරිවර්තනය වීමකට මුහුණ දීමට අපට සිදුවී තිබෙන්නේ එනිසාය. මෙම කර්තව්‍යය අප කලින් මුහුණ පෑ කර්තව්‍යයට වඩා පමණ නොකළ හැකි තරම් වැදගත් බව පැහැදිලිය. එසේම මෙය සපුරාලන තෙක් සමාජවාදයක්ද නොවනු ඇත.

අපි බටහිර යුරෝපීය විප්ලවවල පරිමාණයෙන් අපගේ විප්ලවය මනින්නෙමු නම්, මේ අවස්ථාවේදී අප 1793 හා 1871 මට්ටමට පැමිණ සිටින බව පෙනෙනු ඇත. මෙම මට්ටමට උසස්වී සිටීම ගැනත්, එක් කරුණක් අතින් නිශ්චිත වශයෙන්ම ඊට වඩා තරමක් දුර ඉදිරියට ගොස් සිටීම, එනම්, උසස්ම වර්ගයේ රාජ්‍යය වන සෝවියට් බලය රුසියාව මුළුල්ලේම නීතිගත කර හා ක්‍රියාත්මක කර තිබීම ගැනත්, අපට සාධාරණ ලෙස ආඩම්බර විය හැකිය. එසේ වුවත්, අප සමාජවාදයට පරිවර්තනය වීම හුදෙක් ආරම්භ කළා පමණකි. මේ හා සම්බන්ධයෙන් අපි තවමත් තීරණාත්මක දෙය කර නැත්තෙමු. එනිසා අප ඉටු කළ දෙයින් සෑනසී සිටීමේ හැකියාවක් අපට කිසිසේත්ම නැත.

තීරණාත්මක දෙය නම්, භාණ්ඩ නිෂ්පාදනය සහ බෙදා හැරීම ගැන

https://liberationbase.wordpress.com

දඬිතම සහ දේශව්‍යාප්ත ගිණුම් තැබීම හා පාලනය සංවිධානය කිරීමය. නමුත් ධනපතියන්ගෙන් අත්පත් කරගත් ඒ ව්‍යවසායයන් තුළ සහ ආර්ථිකයේ ඒ අංශ සහ ක්ෂේත්‍රවල අපි තවමත් ගිණුම් තැබීම සහ පාලනය ආරම්භ කර නැත්තෙමු. මෙය ඉටු නොකර, සමාජවාදී ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අදාළ වන දෙවැනි සහ අත්‍යවශ්‍යකම අතින් නොඅඩු ද්‍රව්‍යමය කොන්දේසිය, එනම්, ජාතික පරිමාණයෙන් ශ්‍රම ඵලදායකත්වය වැඩි කිරීම, සාර්ථක කිරීම ගැන සිතන්නට පවා නොපුළුවන.

ප්‍රාග්ධනයට විරුද්ධ ප්‍රහාරය දිගටම ගෙන යනුයි කියන සරල සූත්‍රයෙන් වර්තමාන කර්තව්‍යය නිරූපනය කළ නොහැකි වන්නේ එහෙයිනි. ඇත්ත වශයෙන්ම අප තවමත් ප්‍රාග්ධනය අවසන් කර දමා නැති නමුත්, වැඩ කරන ජනතාවගේ සතුරාට විරුද්ධ ප්‍රහාරය දිගටම කරගෙන යාම නියත වශයෙන්ම අවශ්‍ය නමුත්, එවැනි සූත්‍රයක් හරියටම නිවැරදි නොවනු ඇත. එය යථාභූත නොවනු ඇත. අනාගතයේදී සාර්ථක ලෙස දිගටම ඉදිරියට යාහැකි වනු පිණිස අපගේ ප්‍රහාරය දැන් "තාවකාලිකව නතර කිරීමේ" අවශ්‍යතාවය සහිත වර්තමාන තත්වයේ අමුතු ස්වභාවය එයින් පිළිබිඹු නොවේ.

ප්‍රාග්ධනයට විරුද්ධව කරන යුද්ධයේදී අප පත්ව සිටින තත්වය, සතුරාගේ භූමියෙන් අඩක් හෝ තුනෙන් දෙකක් අත්පත් කරගත්, එහෙත් ස්වකීය හමුදාව එකලස් කර ගැනීමට, එයට අවශ්‍ය වෙඩි උණ්ඩ ආදිය නැවත රැස්කර ගැනීමට, පණිවුඩ මාර්ග අළුත්වැඩියා කිරීමට සහ ශක්තිමත් කිරීමට, අළුත් ගබඩා තැනීමට, අළුත් අතිරේක හමුද පෙරමුණට ගෙන ඒමට ආදිය සඳහා නතර වීමට සිදු වී තිබෙන ජයග්‍රාහී යුද්ධ හමුදාවක් හා සම කිරීමෙන් මෙය විස්තර කළ හැකිය. සතුරාගේ ඉතිරි භූමි භාගය දිනා ගැනීම සඳහාම, එනම්, සම්පූර්ණ ජයග්‍රහණය ලබා ගැනීම සඳහාම, එවැනි තත්වයක් යටතේ ජයග්‍රාහී හමුදාවක ප්‍රහාරය තාවකාලිකව නතර කිරීම අවශ්‍ය වේ. වර්තමාන අවස්ථාවේ බලපවත්වන වාස්තවික තත්වයන් යටතේ ප්‍රාග්ධනයට විරුද්ධව ප්‍රහාරය හරියට එලෙසම "නතර කිරීම" අපට අවශ්‍ය වන බව අවබෝධ කර ගැනීමට අසමත් වූ අය වර්තමාන දේශපාලන තත්වය ගැන කිසිම දෙයක් අවබෝධ කර ගැනීමට සමත් වී නැත.

ප්‍රාග්ධනයට විරුද්ධ ප්‍රහාරය "තාවකාලිකව නතර කිරීම" ගැන අපට කථා කළ හැක්කේ උපුටා දැක්වීමේ ලකුණු සහිතව පමණක් බව, ව්‍යංගයෙන් පමණක් බව, නොකීවත් පැහැදිලි දෙයකි. සාමාන්‍ය යුද්ධයේදී ප්‍රහාරය නතර කරන ලෙස පොදු නියෝගයක් නිකුත්කළ හැකිය. එසේම ඒ අනුව ප්‍රහාරය ඇත්ත වශයෙන්ම නතර කළ හැකිය. එසේ වුවත්, ප්‍රාග්ධනයට විරුද්ධව කරන යුද්ධයේදී ඉදිරිගමන නතර කළ හැකි නොවේ.

එසේම ප්‍රාග්ධනය තවදුරටත් අසන්තක කිරීම අත් හැරීමක් ගැන අපට සිතන්නටවත් පුළුවන් කමක් නැත. අපි අදහස් කරන්නේ අපගේ ආර්ථික සහ දේශපාලන වැඩ කටයුතුවල ගුරුත්වාකර්ෂණ කේන්ද්‍රය වෙනස් කිරීම ගැනය. මේ දක්වා අසන්තක කරන්නන් එක එල්ලේම අසන්තක කිරීම පෙරමුණ ගෙන තිබුණේය. ධනපතියන්ට අසන්තක කරන ලද ඒ ව්‍යවසායයන්හි සහ අනිකුත් සියලුම ව්‍යවසායයන්හි ගිණුම් තැබීම සහ පාලනය සංවිධානය කිරීම දැන් පෙරමුණට එන්නේය.

අපි මේ දක්වා ගිය වේගයෙන්ම තව දුරටත් ප්‍රාග්ධනය අසන්තක කිරීමට තීරණය කරන්නෙමු නම්, අප පරාජය විය හැකිය. එයට හේතුව, නිර්ධන පංතික ගිණුම් තැබීමේ හා පාලනය සංවිධානය කිරීමේ කටයුතු එක එල්ලේම "අසන්තක කරන්නන් අසන්තක කිරීමේ" කටයුතුවලට වඩා බෙහෙවින් පසුව තිබීමය. මෙය ඉතා පැහැදිලි, කල්පනා කරන සෑම කෙනෙකුටම පැහැදිලි දෙයකි. දැන් අපි අපගේ සියලු ධෛර්යය ගිණුම් තැබීම සහ පාලනය සංවිධානය කිරීම කෙරෙහි යොමු කරන්නෙමු නම්, අපට මෙම ප්‍රශ්නය විසඳිය හැකි වනු ඇත. ඒ අනුව ගතවූ කාලයේදී වූ අඩුව සම්පූර්ණ කර ගත හැකි වනු ඇත. එවිට අපට ප්‍රාග්ධනයට විරුද්ධ අපගේ "සටන් ව්‍යාපාරය" සම්පූර්ණයෙන් ජයගත හැකි වනු ඇත.

නමුත් ගත වූ කාලයේදී වූ අඩුව සම්පූර්ණ කිරීම ගැන කථා කරන විට, එය කිසියම් විධියක වරදක් පිළිගැනීමට සමාන නොවන්නේද? නැත, කිසිසේත්ම එසේ නොවේ. යුද පිටියෙන් තවත් නිදර්ශනයක් ගනිමු. හුදෙක්ම සාමාන්‍ය අශ්වාරෝහක හමුදාව පමණක් යොදා සතුරා පරාජය කර පස්සට තල්ලු කළ හැකි නම් එසේ කළ යුතුය. නමුත් මෙය කළ හැක්කේ එක්තරා තැනක් දක්වා පමණක් නම්, එම තැනට පැමිණි පසු ලොකු තුවක්කු ගෙන ඒම අවශ්‍ය වන බව පහසුවෙන් වටහා ගත හැකිය. ලොකු තුවක්කු ගෙන ඒම පිළිබඳව ගත වූ කාලයේදී සිදු වූ අඩුව දැන් සම්පූර්ණ කිරීම අවශ්‍ය බව පිළිගැනීමෙන්, සාර්ථක වූ අශ්වාරෝහක ප්‍රහාරය වරදක් වී යයි පිළිගැනීමක් නොකෙරේ.

ප්‍රාග්ධනයට විරුද්ධව අප "රතුහට" ප්‍රහාරයක් දුන්නේ යයි කියමින් ධනපති පංතියේ අතවැස්සන් අපට දෝෂාරෝපනය කරති. ප්‍රාග්ධනයට විරුද්ධව කරන ලද "රතුහට" ප්‍රහාරය එක් අවස්ථාවක පැවති තත්ත්වය අනුව නොකරම බැරි දෙයක් වූ නිසා මෙම දෝෂාරෝපනය අර්ථ විරහිතය. එම දෝෂාරෝපනය කිරීමට සූදුස්සන් වන්නේ මුදල් මළු කාරයන්ගේ අන්තේවාසිකයන් පමණකි. ප්‍රථමයෙන්ම, ප්‍රාග්ධනය එම අවස්ථාවේදී කෙරෙන්ස්කි හා ක්‍රස්නොවිද, සවින්කොව් සහ ගොත්ස්ද (දැනුදු ගෙගෙච්කෝරි එවැනි ප්‍රතිරෝධයක් දක්වයි), දුතොව් සහ බගායෙව්ස්කිද මගින් යුද්ධමය ප්‍රතිරෝධයක් දැක්විය, යුද්ධමය මාර්ගවලින් හැර වෙනත්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ආකාරයකින් යුද්ධමය ප්‍රතිරෝධය බිඳ හෙළිය නොහැකිය. ඒ අනුව සූරාකන්නන්ගේ වියගසෙන් වැඩ කරන සහ සූරාකනු ලබන ජනයා නිදහස් කර ගැනීමේ උත්තර සහ ශ්‍රෙෂ්ඨ ඓතිහාසික සත් ව්‍යාපාරයේ සටනට රතුභටයෝ සහභාගි වූහ.

දෙවැනිව, පරිපාලනය කිරීමේ කලාව ආවේනික දෙයක් නොව, පළපුරුද්දෙන් ලබා ගත යුතු දෙයක් වන නිසා මර්දනකාරී ක්‍රම වෙනුවට පරිපාලන ක්‍රම පෙරමුණෙන් තැබීම අපට එම අවස්ථාවේදී නොකළ හැකි විය. එවකට අපට පළපුරුද්දක් නොතිබුණි. දැන් අපට පළ පුරුද්ද ඇත. තුන්වැනිව, එම අවස්ථාවේදී දැනුම සහ කාර්මික ශිල්පය පිළිබඳ විවිධ ක්ෂේත්‍රයන්හි යෙදිය හැකි විශේෂඥයන් අපට නොවීය. ඒ අවස්ථාව වන විට ඔවුහු එක්කෝ බගායෙව්ස්කිගේ පිරිස් අතර සටන් කරමින් සිටියහ. නැතහොත්, කඩාකප්පල් කිරීමේ මාර්ගයෙන් ක්‍රමානුකූල සහ මුරණ්ඩු නිහඬ ප්‍රතිරෝධයක් දැක්වීමට තවමත් සමත්ව සිටියහ. දැන් අපි කඩාකප්පල් කිරීම පරාජය කර ඇත්තෙමු. ප්‍රාග්ධනයට විරුද්ධව දුන් "රතුභට" ප්‍රහාරය සාර්ථක විය, ජයග්‍රාහී විය. අපි ප්‍රාග්ධනයේ යුද්ධමය ප්‍රතිරෝධයක්, කඩාකප්පල් කිරීමේ ප්‍රතිරෝධයක් පරාජය කෙළෙමු.

LIBERATIONBASE

"රතුභට" ප්‍රහාරය නිතරම සුදුසු වන බවක්, සියලු තත්වයන්ම යටතේ සුදුසු වන බවක්, එයින් අදහස් වේද? ප්‍රාග්ධනයට විරුද්ධව සටන් කිරීමේ වෙනත් මාර්ගයක් අපට නැති බවක් එයින් අදහස් වේද? එසේ සිතීම ලාබාල කමක් වනු ඇත. සාමාන්‍ය අශ්වාරෝහක හමුදාවේ ආධාරයෙන් අපි ජයග්‍රහණය අත්පත් කර ගත්තෙමු. නමුත් ලොකු තුවක්කුද අපට තිබේ. මර්දනය කිරීමේ මාර්ගවලින් අපි ජයග්‍රහණය ලැබුවෙමු. පරිපාලන ක්‍රමවලින්ද අපට ජයග්‍රහණය ලැබිය හැකි වනු ඇත. තත්වයේ වෙනස් වීම්වලට ගැලපෙන පරිදි සතුරාට විරුද්ධව අප යොදන සටන් ක්‍රමද වෙනස් කිරීමට අපි දැනගත යුත්තෙමු. සවින්කොව්ලා සහ ගෙගෙච්කෝරිලාත්, අනෙකුත් ඉඩම් හිමි සහ ධනපති ප්‍රතිවිප්ලවවාදීනුත්, මර්දනය කිරීමට "රතුභට" ක්‍රම යෙදීම අපි මොහොතකටවත් අත් නොහරින්නෙමු. එසේ වුවද රතුභට ප්‍රහාරය අවශ්‍ය වූ කාලය බොහෝ දුරට (සහ ජයග්‍රාහී ලෙස) ගෙවී ගිය පසු, කුමන හෝ වර්ගයේ ධනපතියන් වර්ධනය වීම වැලැක්වීම පිණිස නැවත බිම සකස් කිරීමේ අරමුණ ඉටු කරගනු සඳහා, ධනපති විශේෂඥයන් උපයෝගි කර ගැනීමේ අවශ්‍යතාවය දෙරට තට්ටු කරන විට, "රතුභට" ක්‍රම ඉදිරියෙන් තැබීමට තරම් අපි අඥාන නොවෙමු.

මෙය අමුතු සමයකි. නැතහොත් අමුතු සංවර්ධන යුගයකි. එනිසා ප්‍රාග්ධනය සම්පූර්ණයෙන්ම පරාජය කරනු පිණිස, අපගේ අරගල ආකෘති මෙම අවධියේ පවතින අමුතු කොන්දේසිවලට ගලපා ගැනීමට අපි සමත්විය යුත්තෙමු.

ධනපති ක්‍රමය සමග සසඳන කල සමාජවාදය සඳහා වැඩි ශ්‍රම ඵලදයකත්වයක් කරා පොදුජන පරිමාණයෙන් අවබෝධ සහිතව ඉදිරියට යාම අවශ්‍ය වන අතර එය ධනපති ක්‍රමය ඇති කළ පදනම මත සිට ඉටු කළ යුතු වූවකි. එනිසා දැනුම, කාර්මික ශිල්පය සහ අත්දැකීම් පිළිබඳ විවිධ ක්ෂේත්‍රයන්හි විශේෂඥතාවය ඇතියවුන්ගේ මග පෙන්වීම නොමැතිව සමාජවාදයට පරිවර්තනය වීම කළ නොහැකි වනු ඇත. සමාජවාදය මෙම ඉදිරි ගමන සාර්ථක කර ගත යුත්තේ තමන්ගේම ක්‍රමයෙනි. නැතහොත්, වඩාත් නිශ්චිත ලෙසට කියතොත්, සෝවියට් ක්‍රමවලිනි. නමුත්, විශේෂඥයෝ ඔවුන්ගේ විශේෂඥතාවය ලැබීමට අදාළ වූ වාතාවරණය නිසා, බොහෝ කොටම ඔවුහු ධනපති පංතියට අයත් වෙති. අපගේ නිර්ධන පංතිය බලය අල්වා ගැනීමෙන් පසුව, ගිණුම් තැබීම, පාලනය හා සංවිධානය පිළිබඳ මෙම ප්‍රශ්නය ඉක්මණින්ම ජාතික පරිමාණයෙන් විසඳන ලද්දේ නම් (යුද්ධය හා රුසියාවේ නොදියුණු කම නිසා එය කළ හැක්කක් නොවීය), එවිට කඩාකප්පල් කිරීම පරාජය කිරීමෙන් අනතුරුව, විශ්වීය ගිණුම් තැබීමේ සහ පාලනයේ මාර්ගයෙන් මෙම ධනපති විශේෂඥයන් සම්පූර්ණයෙන්ම අපට යටත් කර ගැනීමටද පුළුවන් කම තිබිණි. කඩාකප්පල් කිරීම පරාජය කර අප ජය ලැබුවේ වී නමුත්, ගිණුම් තැබීම සහ පාලනය ආරම්භ කිරීම පොදු වශයෙන් බොහෝ "ප්‍රමාද" වී තිබෙන නිසා විශේෂඥයන් අපගේ අවශ්‍යතාවයන් සඳහා යොදා ගත හැකි වන තත්ත්වයන් ඇති කිරීමට මෙතෙක් අපට පුළුවන් වී නැත. කඩාකප්පල්කාරී මහා පිරිසක් "වැඩ කරන්නට යති." නමුත්, ඉතාමත් හොඳ සංවිධායකයන් හා ඉහළම විශේෂඥයන් රජයේ කටයුතු සඳහා යොදා ගත හැකිය, එක්කෝ ඔවුන් පරණ ක්‍රමයට, ධනපති ක්‍රමයට (එනම් ඉහළ වැටුප් දී) යොදා ගත හැකිය. නැතහොත් ඔවුන් අළුත් ක්‍රමයට, නිර්ධන පංති ක්‍රමයට (එනම් ගිණුම් තැබීමේ හා පහළින් පාලනය කිරීමේ තත්ත්වයන් ජාතික වශයෙන් ඇති කිරීමෙන් — ඒ අනුව හා එයම හේතු කොට ගෙන, විශේෂඥයන් අපට යටත් වන හා ඔවුන් අපේ වැඩට බැඳෙන ආකාරයට) යොදා ගත හැකිය.

දැන් ධනපති ක්‍රමය අනුව කටයුතු කරමින්, උසස් පෙළේ ධනපති විශේෂඥයන්ගේ "සේවය" ලබා ගැනීම සඳහා ඉතා ඉහළ මිළක් ගෙවීමට අපට සිදු වී තිබේ. මෙම විෂය ගැන දන්නා සියළු දෙනාම එය වටහා ගනිති. නමුත් නිර්ධන පංති රාජ්‍යය විසින් ගනු ලබන මෙම පියවරෙහි වැදගත් කම ගැන සිතා බලන්නේ සෑම කෙනෙක්ම නොවේ. පැහැදිලිවම මෙම පියවර සම්මුතියකි. එය වනාහි වැටුප් සාමාන්‍ය කම්කරුවාගේ වේතන මට්ටමට පහත දැමිය යුතු යයිද තනතුරු ආත්ම ලාභය සඳහා යොදා ගැනීමට විරුද්ධව හුදෙක් වචනයෙන් නොව ක්‍රියාවෙන් සටන්

https://liberationbase.wordpress.com

කළ යුතු යයිද, කියන පැරිස් කොමියුනයේ සහ සැම නිර්ධන පංති බලයකම ප්‍රතිපත්තිවලට වෙනස්ව යාමකි.

එපමණක් නොව, මෙම පියවර ප්‍රාග්ධනයට (ප්‍රාග්ධනය මුදල් ප්‍රමාණයක් නොව, නිශ්චිත සමාජ සම්බන්ධතාවයකි) විරුද්ධව කරන ප්‍රහාරය එක්තරා ක්ෂේත්‍රයක, එක්තරා දුරකට නතර කිරීමක් අදහස් කරන්නක්ද වේ. එය, ආරම්භයේ පටන්ම අධික වැටුප් සාමාන්‍ය කම්කරුවාගේ වේතන මට්ටමට පහත දැමීමේ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කළ හා අනුගමනය කළ අපගේ සමාජවාදී සෝවියට් රාජ්‍ය බලය විසින්ද ආපසු තබන ලද පියවරක් වන්නේය[21].

අප පියවරක් ආපසු ගැනීම ගැන, අපගේ වියවුල ගැන, ධනපති පංතියේ අත වැස්සන්, විශේෂයෙන්ම, මෙන්ෂෙවික්වරු සහ ''නොවයා ෂිස්න්[22] පිරිස වැනි එහි අවශේෂ කොටස් අපට සිනාසෙනු ඇත. නමුත් ඔවුන්ගේ සිනාසීම ගැන අපි කලබල නොවිය යුත්තෙමු. අපගේ වැරදි සඟවන්නේ නැතිව, සමාජවාදයට යන ඉතාමත් දුෂ්කර සහ නව මාවතේ විශේෂ අංග ලක්ෂණ අධ්‍යයනය කරමින්, අපි මෙතෙක් ඉටු නොකළ කරුණු ඉක්මණින් සපුරාලීමට උත්සාහ දැරිය යුත්තෙමු. ඉතා ඉහළ වටුප් ගෙවීමෙන් ධනපති විශේෂඥයන් සේවයට බඳවා ගැනීම යනු, පැරිස් කොමියුනයේ ප්‍රතිපත්තිවලින් පසු බැසීමක් බව ජනතාවගෙන් සැඟවීම, ධනපති දේශපාලනඥයන්ගේ මට්ටමට පහත වැටීමක් සහ ජනතාව රැවටීමක් වන්නේය. අප මෙම ආපසු පියවර ගත්තේ කෙසේද සහ මන්ද යනු අවංකව පැහැදිලි කර, නැවත, ගත වූ කාලයේ දී වූ අඩුව මකා ගැනීමට තිබෙන මාර්ගයන් ගැන ප්‍රසිද්ධියේ සාකච්ඡා කිරීම යනු, ජනතාවට උගන්වන අතරම ඔවුන්ගේ අත්දැකීම්වලින් උගෙන ගැනීමකි, සමාජවාදය ගොඩ නගන්නේ කෙසේද යන්න ජනතාව සමග එක්ව උගෙන ගැනීමකි. ජයග්‍රාහකයාට යම් යම් වැරදීම් සිදුවූ තැන් නැති, අර්ධ අවාසි සිදු නොවූ, තාවකාලික ලෙස සමහර දේ අත්හැර දැමීමට හා සමහර තැන්වලදී පසු බැසීමට සිදු නොවූ සාංග්‍රාමික ව්‍යාපාර එකක්වත් ඉතිහාසයේ නැති තරම්ය. ධනපති ක්‍රමයට විරුද්ධව අප අරඹා තිබෙන ''ව්‍යාපාරය'' ඉතාමත් දුෂ්කර සාංග්‍රාමික ව්‍යාපාරයට වඩා දශ ලක්ෂ වාරයක් දුෂ්කරය. එනිසා, තනි සහ අර්ධ පසු බැසීමක් හමුවේ අධෛර්යයට පත් වීම අඥාන කමක් හා අවමානයක් වන්නේය.

දැන් ප්‍රායෝගික දෘෂ්ටි කෝණයෙන් අපි මෙම ප්‍රශ්නය ගැන සාකච්ඡා කරමු. හැකි තරම් සීඝ්‍රයෙන් ආර්ථික පුනර්ජීවයක් ළඟා කර ගැනීම අරමුණු කරගෙන ජනතාවගේ ශ්‍රම කාර්යයන් මෙහෙයවීම සඳහා, දැනුම, කාර්මික ශිල්පය, හා ප්‍රායෝගික පුහුණුව පිළිබඳ විවිධ ක්ෂේත්‍රයන්හි නිපුණ පළමු පෙළේ විද්‍යාඥයන් හා විශේෂඥයන් දහසක් රුසියානු සෝවියට් සමූහාණ්ඩුවට අවශ්‍යව ඇතැයි සිතමු. ''පළමු පෙළේ දීප්තිතාවය සහිත මෙම තරු'' වලට — කම්කරුවන්ගේ දූෂණ ගැන වැඩියෙන් සෝෂා කරන්නවුන්ගෙන් බහුතරය තමන්ම ධනපති සදචාරයෙන් දූෂිත බව අපි අමතක නොකරමු — එක් අයෙකුට වසරකට රූබල් 25,000 බැගින් ගෙවීමට අපට සිදුවෙතැයිද සිතමු. මේ අනුව මොවුන්ට ගෙවිය යුතු (රූබල් 2,50,00,000) මුදල් (ඉතාමත් වැදගත් සංවිධාන සහ තාක්ෂණික කර්තව්‍යයන් විශේෂ සාර්ථකත්වයකින් සහ සීඝ්‍රතාවයකින් සපුරාලීම සලකා ප්‍රසාද දීමනා ගෙවීමට අපට සිදුවෙතැයි සිතා) දෙගුණ කරන ලදැයි සිතමු. නැතහොත්, (ඊටත් වඩා ගෙවීම් අය කරන විදේශීය විශේෂඥයන් සිය ගණනක් බඳවා ගැනීමට අපට සිදුවෙතැයි සිතා) එය සිව්ගුණ පවා කරන ලදැයි සිතමු. ප්‍රශ්නය මෙයයි. නවීන විද්‍යාත්මක සහ තාක්ෂණික ක්‍රියා මාර්ග අනුව ජනතාවගේ ශ්‍රම කාර්යයන් ප්‍රති සංවිධානය කිරීම පිණිස සෝවියට් සමූහාණ්ඩුව රූබල් පන් කෝටියක හෝ දස කෝටියක හෝ වාර්ෂික වියදමක් කිරීම පමණට වැඩිද? නැතහොත් නොදැරිය හැකිද? ඇත්තෙන්ම නැත. අපගේ නොදියුණුකම නිසා අපට රූබල් සිය කෝටි ගණනින් අලාභ සිදු වන බවත්, ධනපති බුද්ධිමතුන් අතර ''තරු'' වශයෙන් සැලකෙන සියළු දෙනාම අපගේ වැඩ කටයුතුවලට ස්වෙච්ඡාවෙන් සහභාගි වනසේ උනන්දු කරන මට්ටමට අපගේ ගිණුම් තැබීම සහ පාලනය දියුණු වී නැති බවත්, ප්‍රායෝගික අත්දැකීම් අනුව දන්නා පංති විඥානය ඇති කම්කරු හා ගොවි ජනතා අති බහුතරය මෙම වියදම අනුමත කරනු නිසැකය.

මෙම ප්‍රශ්නයට තවත් පැත්තක් තිබෙන බව ඉතා පැහැදිලිය. ඉතා ඉහළ වැටුප් නිසා සෝවියට් අධිකාරීන් සහ පොදු කම්කරු ජනතාව යන දෙකොටසම කෙරෙහි දූෂණකාරී බලපෑමක් සිදුවන බව අවිවාදයෙන් පිළිගත යුතුය (විශේෂයෙන්ම, විප්ලවය එතරම් සීඝ්‍ර ලෙස සිදුවීම නිසා කපටින් හා සොරුන් කිසියම් ගණනක් අධිකාරී බල සහිත තැන්වලට රිංගා ගැනීම වැලැක්විය නොහැකි විය. ඔවුන් හා සමග අදක්ෂ හෝ වංක කොමිසාර්වරු කිසියම් සංඛ්‍යාවක්ද රාජ්‍ය අරමුදල් වංචාකර ගැනීමට අකැමති නොවනු ඇත). එසේ වුවත්, ධනපති ක්‍රමයේ නපුරු උරුමයෙන් අපට වහාම නිදහස් විය නොහැකි බවටත්, රූබල් පන්කෝටියක හෝ දස කෝටියක වාර්ෂික ''කප්පමක්'' (දේශ ව්‍යාප්ත ගිණුම් තැබීම හා පහළින් පාලනය සංවිධානය කිරීමේදී අප දක්වන නොදියුණුකම වෙනුවෙන් ගෙවිය යුතු කප්පමක්) ගෙවීමේ යුතු කමින් අපට සෝවියට් සමූහාණ්ඩුව නිදහස් කළ හැකි වන්නේ අප සංවිධානය වීමෙන්, අපගේම පිරිස් අතර විනය දැඩි කිරීමෙන් සහ පර පුට්ටන් හා රාජ්‍ය අරමුදල් (දැන් ඉඩම් සියල්ලම, පැක්ටරි සියල්ලම හා දුම්රිය සේවා සියල්ලම සෝවියට්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමූහාණ්ඩුවේ "රාජ්‍ය අරමුදල්" වන්නේය) වංචා කරන්නන් අපගේ පිරිස් අතරින් එළවා දැමීමෙන් පමණක් බවටත්, සිතන හා අවංක සෑම කම්කරුවෙක්ම හා දුප්පත් ගොවියෙක්ම අප සමග එකඟ වනු ඇත, පිළිගනු ඇත. සෝවියට් ආයතනවල ආධාර ඇතිව විනය සම්පන්න වීමටත්, සංවිධානය වීමටත්, බලවත් ශ්‍රම විනයක් ඇති කිරීමටත්, අපගේ පංති විඥානය ඇති, දියුණු කම්කරුවන් හා දුප්පත් ගොවි ජනතාව එක් අවුරුද්දක කාලයක් ඇතුලත සමත් වුවහොත්, එසේ නම්, අවුරුද්දකින් මෙම "කප්පම" ඉවත දැමීමට අපට හැකි වනු ඇත. ඊට පෙර වුවද, අපගේ කම්කරු සහ ගොවිජන ශ්‍රම විනයේ සහ සංවිධානයේ සාර්ථකත්වයට හරියටම අනුපාතික වන පරිද්දෙන් එම කප්පම අඩු කිරීමට ද වන්නේය... අපට උගැන්වීම සඳහා ධනපති විශේෂඥයන් යොදා ගෙන ඔවුන්ගෙන් ප්‍රයෝජන ගනිමින්, අපමත්, කම්කරුවන් හා ගොවීනුත්, හොඳම ශ්‍රම විනය හා ඉතාමත් නවීන ශ්‍රම ශිල්පය ඉක්මණින් උගත් තරමට මෙම විශේෂඥයන්ට ගෙවන කුමණ හෝ "කප්පමකින්" අප නිදහස් වීමද ඉක්මන් වනු ඇත.

නිර්ධන පංතියේ අධීක්ෂණය යටතේ නිෂ්පාදනය සහ බෙදාහැරීම පිළිබඳව දේශ ව්‍යාප්ත ලෙස ගිණුම් තැබීම සහ පාලනය සංවිධානය කිරීමේ අපගේ කටයුතු, අසන්තක කරන්නන් ඍජු ලෙස අසන්තක කිරීමේ අපගේ කටයුතුවලට වඩා බෙහෙවින් පසු වූ තත්ත්වයක් ඇති වී තිබේ. වර්තමාන තත්වයේ විශේෂ අංග ලක්ෂණ සහ එයින් පැන නගින සෝවියට් ආණ්ඩුවේ කර්තව්‍යයන් වටහා ගනු පිණිස මෙම කරුණ මූලික වශයෙන් වැදගත් වේ. ධනපති පංතියට විරුද්ධව කරන අරගලයේ ගුරුත්වාකර්ෂණ කේන්ද්‍රය ඉහත සඳහන් වැනි ගිණුම් තැබීමක් හා පාලනයක් සංවිධානය කිරීම වෙතට මාරුවෙමින් තිබේ. මෙය අපගේ ආරම්භක ස්ථානය ලෙස ගැනීමෙන් පමණකි, බැංකු ජනසතු කිරීම, විදේශ වෙළෙඳාම ඒකාධිකාරයක් කොට ගැනීම, මුදල් සංසරණය රාජ්‍ය පාලනයට යටත් කිරීම, නිර්ධන පංති දෘෂ්ටි කෝණය අනුව සතුටුදායක වන දේපල බද්දක් ආරම්භ කිරීම සහ අනිවාර්ය ශ්‍රම සේවය ආරම්භ කිරීම යන ක්ෂේත්‍රයන්හි ආර්ථික සහ මූල්‍ය ප්‍රතිපත්තියේ හදිසි කර්තව්‍යයන් නිවැරදි ලෙස නිශ්චය කළ හැක්කේ.

මෙම ක්ෂේත්‍රයන්හි (අති මහත් සේ වැදගත් ක්ෂේත්‍රයන්හි) සමාජවාදී ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම අතින් අපි බෙහෙවින් පසු බා සිටියෙමු. එයට හේතු වූයේ, ගිණුම් තැබීම සහ පාලනය පොදු වශයෙන් ප්‍රමාණවත් තරමින් සංවිධානය වී නොතිබීමය. මෙය ඉතාමත් දුෂ්කර කර්තව්‍යයන්ගෙන් එකක් බව නොකිව මනාය. එසේම යුද්ධයෙන් සිදු වී තිබෙන විනාශය නිසා එය සපුරාලිය හැකි වන්නේ දීර්ඝ කාලයකින් පමණකි.



ලෙනින් ලියූ "වර්තමාන තත්ත්වය යටතේ සෝවියට් ආණ්ඩුව ඉටුකළ යුතු කර්තව්‍යයන්" යන කෘතියෙහි අත් පිටපතෙහි කටු සටහනකි, 1918 අප්‍රියෙල් (කුඩා කළ ආකාරයෙනි)

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

එහෙත් ධනපති පංතිය, විශේෂයෙන්ම සංඛ්‍යාවෙන් විශාල,සුළු සහ ගොවි ධනපතියන්, නිදසුනක් ලෙසට දැනටමත් සංවිධානය කරනු ලබන පාලනය කඩාකප්පල් කිරීමෙන්ද, ධාන්‍ය ඒකාධිකාරය කඩා කප්පල් කිරීමෙන්ද, ලාභ ගැරීම සහ සමපේක්ෂණ වෙළෙඳාම සඳහා තත්ත්වයන් දිනා ගැනීමට ඉතාමත් දරුණු සටන කරන්නේ හරියටම මෙහිදී බව අපි අමතක නොකළ යුත්තෙමු. අප නිකුත් කළ ආඥවන් මගින් නියම කරන ලද බොහෝ දේ තවමත් කළ යුතුව තිබේ. එනිසා මෙම අවස්ථාවේ ප්‍රධාන කර්තව්‍යය වන්නේ දැනටමත් නීති ගත වී ඇති (එහෙත් යථාර්ථයක් බවට පත්ව නැති) ප්‍රතිසංස්කරණ පිළිබඳ ප්‍රතිපත්ති කාර්ය පරවශ ලෙස හා ප්‍රායෝගික ආකාරයෙන් ඉටුකිරීම සඳහා අපගේ ප්‍රයත්න සියල්ලම ඒ වෙත යොමු කිරීම ය.

බැංකු ජනසතුව කරගෙනයාමත්, බැංකු සමාජවාදය යටතේ රාජ්‍ය ගිණුම් තැබීමේ නිෂ්පාදන ලක්ෂයන් බවට පත් කිරීම දෙසටත්, ඒකාන්ත ලෙස යොමු වීම පිණිස, අපි ප්‍රථමයෙන්ම සහ අන් සියල්ලටම වඩා මහජන බැංකුවේ ශාඛා සංඛ්‍යාව වැඩි කිරීම, තැන්පතු අද්ද ගැනීම, මහජන තැන්පතු ගැනීමේ හා ගෙවීමේ ක්‍රියා මාර්ගය සරල කිරීම, පෝලිම් නැති කිරීම, අල්ලස්ගන්නන් හා හොරුන් අල්ලා වෙඩි තැබීම ආදියෙහි දී සැබෑ සාර්ථකත්වයක් ලැබිය යුත්තෙමු. ප්‍රථමයෙන්ම අපි ඇත්ත වශයෙන්ම සරල කර්තව්‍යයන් ඉටු කළ යුත්තෙමු; තිබෙන දේ නිසි ලෙස සංවිධාන කළ යුත්තෙමු. ඊළඟට, වඩාත් ගැටළු සහිත කටයුතු සඳහා සූදනම් විය යුත්තෙමු.

දැනටමත් ආරම්භ කර තිබෙන (ධාන්‍ය, සම් ආදී) රාජ්‍ය ඒකාධිකාරයන් තහවුරු කර වැඩි දියුණු කරමු. එසේ කිරීමෙන් විදේශ වෙළඳාමෙහි රාජ්‍ය ඒකාධිකාරය ක්‍රියාත්මක කිරීමට සූදනම් වෙමු. මෙය නොමැති කල ''කප්පමක්'' ගෙවීම මගින් විදේශීය ප්‍රාග්ධනයෙන් ''නිදහස් වීමට'' අපට නොහැකි වන්නේය.[23] තවද, සමාජවාදය ගොඩනැගීමේ හැකියාව සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ කිසියම් පරිවර්තනීය කාල සීමාවක් තුළ දී විදේශීය ප්‍රාග්ධනයට කිසියම් කප්පමක් ගෙවීම මගින් අපගේ රට අභ්‍යන්තර ආර්ථික නිදහස ආරක්ෂා කර ගැනීමට අපට හැකිවේද, යන්න මතය.

පොදු වශයෙන් බදු අය කිරීම හා විශේෂයෙන්ම, දේපල සහ ආදයම් බදු අය කිරීම අතින් අපි බොහෝ දුර පසු බා සිටින්නෙමු. ධනපතියන්ගෙන් වන්දි අයකර ගැනීම ඉතාමත් සුදුසු සහ නිර්ධන පංතියේ අනුමැතිය ලැබිය යුතු ප්‍රතිපත්තියක් වන නමුත්, එයින් පෙනෙන්නේ මේ සම්බන්ධයෙන් අප පරිපාලන ක්‍රමවලට වඩා යුද්ධමය ක්‍රමවලට (රුසියාව දුප්පතුන් වෙනුවෙන් පොහොසතුන් දිනා ගැනීමට) ආසන්නව සිටින බවය. නමුත්,

https://liberationbase.wordpress.com

වඩාත් ශක්තිමත් වීමට හා අපේ දෙපය දැඩි වීමට අප යොද ගත යුත්තේ පරිපාලන ක්‍රමය. අපි ධනපති පංතියෙන් අය කරන වන්දි වෙනුවට දේපල සහ ආදායම් බදු නිතර හා නිතිපතා එකතු කිරීම ආදේශ කළ යුත්තෙමු. එයින් නිර්ධන පංති රාජ්‍යයට වැඩි ආදායමක් ලැබෙන්නේය. ඒ සඳහා අපට වඩා හොඳින් සංවිධාන විය යුතු අතර වඩා හොඳ ගිණුම් තැබීමක් සහ පාලනයක් තිබිය යුතුය.[24] අනිවාර්ය ශ්‍රම සේවය ආරම්භ කිරීමට අප ප්‍රමාද වීමෙන්ම පෙනෙන්නේ, එක් අතකින් අපගේ ජයග්‍රහණයන් අවසාන වශයෙන් තහවුරු කරන සහ අනිත් අතින් ප්‍රාග්ධනය "වටලා" "යටත් වන" සේ එයට බල කිරීමේ ක්‍රියාවලිය සූදනම් කරන නිශ්චිත වශයෙන්ම සූදනම් කාරී සහ සංවිධානාත්මක කටයුතු දැන් මුල්තැන ගන්නා බවය. අපි වහාම අනිවාර්ය ශ්‍රම සේවය ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කළ යුත්තෙමු. නමුත් එය කළ යුත්තේ ක්‍රමානුකූලව සහ සිහි කල්පනාවෙන් යුතුවය; ගන්නා සෑම පියවරක්ම ප්‍රායෝගික අත්දැකීම අනුව පරීක්ෂාවට භාජනය කිරීමෙනි; නොවරදවාම, පොහොසතුන් විෂයෙහි අනිවාර්ය ශ්‍රම සේවය ක්‍රියාත්මක කිරීම ප්‍රථම පියවර ලෙසට ගැනීමෙනි. සෑම ග්‍රාමීය ධනපතියෙක්ම ඇතුළුව, ධනපතියන් සියළු දෙනාම සඳහා පාරිභෝගික අය වැය පොත් පටන් ගැනීම, සතුරා සම්පූර්ණයෙන්ම "වට කිරීම" හා භාණ්ඩ නිෂ්පාදනය සහ බෙද හැරීම පිළිබඳ නියම පොදු ජන ගිණුම් තැබී-මක් හා පාලනයක් නිර්මාණය කිරීම කරා වුනු වැදගත් පියවරක් වනු ඇත.

දේශ ව්‍යාප්ත ගිණුම් තැබීම
සහ පාලනය සඳහා
අරගලයේ වැදගත්කම

රාජ්‍යය ශතවර්ෂ ගණනාවක් තිස්සේ ජනතාව පීඩාවට පත් කිරීමේ හා කොල්ලකෑමේ ආයතනයක් වී තිබුණේය. ඒ අනුව රාජ්‍යය හා සම්බන්ධ සියළු දෙයක්ම කෙරෙහි ජනතාව දක්වන වෛරයක් හා සැකයක් අපට උරුම වී තිබේ. මෙය නැති කිරීම ඉතා අමාරුය. එය කළ හැකි වන්නේ සෝවියට් ආණ්ඩුවට පමණකි. එසේ වුවද, එය සාර්ථක ලෙස නැති කිරීම සඳහා සෝවියට් ආණ්ඩුවට වුවද දීර්ඝ කාලයක් හා අති මහත් ධෛර්ය-යකින් කටයුතු කිරීම අවශ්‍ය වන්නේය. ධනපති පංතිය බලයෙන් නෙරපා දැමීමෙන් පසුව, ඒ වහාම සමාජවාදී විප්ලවය හමුවේ මතු වන ගිණුම් තැබීම හා පාලනය පිළිබඳ ප්‍රශ්නයේදී විශේෂයෙන්ම මෙම "උරුමය" විද්‍යාමාන වේ. භාණ්ඩ නිෂ්පාදනය සහ බෙදා හැරීම ගැන අංග සම්පූර්ණ රාජ්‍ය ගිණුම් තැබීමක් සහ පාලනයක් නොමැතිව වැඩ කරන ජනතාවගේ

බලය, නැතහොත්, වැඩ කරන ජනතාවගේ නිදහස පවත්වා ගත නොහැකි බව හා එසේ වූ විට ධනපති බලය නැවත ආපසු ඒම වැලැක්විය නොහැකි බව, ජනතාව, එනම්, දැන් ඉඩම් හිමියන් හා ධනපතියන් බලයෙන් පහකර දමා සිටින නිසා ප්‍රථම වතාවට නිදහස් හැඟීම ඇතිව සිටින ජනතාව, පොත්වලින් නොව තමන්ගේම අත් දැකීමෙන්, සෝවියට් අත්දැකීමෙන් වටහා ගනු හා හඟිනු ඇති නමුත්, ඔවුන්ට එම වැටහීම හා හැඟීම ඇති වීමට පෙර කිසියම් කාලයක් ගත වීම වැලැක්විය නොහැකිය.

ධනපති පංතියේ සහ විශේෂයෙන්ම, සුළු ධනපති පංතියේ ගති සිරිත් හා සම්ප්‍රදයයන්ද රාජ්‍යය මගින් කෙරෙන පාලනයට විරුද්ධ වන්නේය. ඒවා "ශුද්ධ පෞද්ගලික දේපලෙහි" සහ "ශුද්ධ" පෞද්ගලික ව්‍යවසාය-යෙහි අනුල්ලංඝනීයත්වය රකියි. අරාජිකවාදය සහ අරාජික-සම්මේලවා-දය ධනපති උපනති බවත්, සමාජවාදයට, නිර්ධන පංති ආඥාදායකත්වයට සහ කොමියුනිස්ට්වාදයට කිසිසේත් නොගැලපිය හැකි සේ ඒවාට විරුද්ධ බවත් කියන මාක්ස්වාදී ප්‍රවාදය කොතරම් නිවැරදිද යනු අපට විශේෂයෙ-න්ම පැහැදිලිව පෙනේ. සෝවියට් රාජ්‍යමය පාලනය සහ ගිණුම් තැබීම පිළිබඳ අදහස ජනතාවගේ සිත් තුළට කාවැද්දීමට කරන සටන සහ මෙම සටන ප්‍රායෝගික වශයෙන් කර ගෙන යාමද, පාන් සහ ඇඳුම් ලබා ගැනීම "පෞද්ගලික" කටයුත්තක් සේ සැලකීමට සහ මිළට ගැනීමේ සහ අලෙවි කිරීමේ ගනු දෙනුව "මා හා පමණක් සම්බන්ධ" එකක් සේ සැලකීමට උගැන්නු ඒ ජරා අතීතයෙන් බිඳී වෙන් වීමට කරන සටනද ශ්‍රේෂ්ඨ ඓතිහාසික වැදගත් කමක් සහිත සටනකි, සමාජවාදී විඥනය සහ ධනපති අරාජිකවාදී සාංසිද්ධිකතාවය අතර සටනකි.

අපි කම්කරු පාලනය නීතියක් වශයෙන් ආරම්භ කර ඇත්තෙමු. නමුත් තවමත් මෙම නීතිය ක්‍රියාත්මක වීමට පටන් ගත්තා පමණකි. එය පුළුල් ජනතා කොටස්වල සිත් තුළට විනිවිද යාම පටන් ගත්තා පමණකි. භාණ්ඩ නිෂ්පාදනය හා බෙදහැරීම සම්බන්ධයෙන් ගිණුම් තැබීමක් සහ පාලනයක් නොතිබීම, සමාජවාදයේ මූලාකෘතිවලට මරණයත්, රාජ්‍ය අරමුදල් (සියළු දේපල රාජ්‍යයට අයත්ය. රාජ්‍යය සෝවියට් රාජ්‍යය වන අතර, එහි බලය වැඩ කරන ජනතාවගෙන් බහුතරයට අයත්ය.) වංචා කිරීමත් ගෙන එන්නක් බව අපි අපගේ උද්ඝෝෂණයෙහිදී ප්‍රමාණවත් තරම් පැහැදිලි කර නැත්තෙමු. ජර්මානුවෝ සහ රුසියානු කර්නිලව්ලා, මුළු ගම්බද ධනපති පංතියේම ආධාරය ලබමින්, ව්‍යවස්ථානුකූල-ප්‍රජාතන්-ත්‍රවාදීන්ගේ, මෙන්ෂෙවික්වරුන්ගේ සහ දක්ෂිණාංශික සමාජවාදී-විප්ලව-වාදීන්ගේ ද සහයෝගය ලබමින් අප ගැන "පරීක්ෂාවෙන්" සිටිමින් අපට පහර දීමට අවස්ථාවක් එළඹෙන තෙක් බලා සිටිති. වැඩ කරන ජනතාව බලයෙන් පහ කර දැමීමට ඔවුන්ට හැකි වන්නේ ගිණුම් තැබීම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සහ පාලනය පිළිබඳ කර්තව්‍යය ඉටු කිරීමට අප අසමත් වුවහොත් පමණකි. ඒ අනුව ගිණුම් තැබීමේදී හා පාලනයෙහිදී අපරීක්ෂාකාරිත්වය දැක්වීම එක එල්ලේම ජර්මානුන්ට සහ කර්නිලව්ලාට ආධාර කිරීමක්ය යන්න අපි ප්‍රමාණවත් තරම් පැහැදිලි කර නැත්තෙමු. දියුණු කම්කරුවන් හා ගොවීන්ද මේ ගැන ප්‍රමාණවත් තරම් සිතන්නේ සහ කථා කරන්නේ නැත. කම්කරු පාලනය යථාර්ථයක් බවට පත්වන තුරු, පාලනය උල්ලංඝනය කරන්නන්ට, නැතහොත්, පාලනය හා සම්බන්ධ කටයුතුවලදී අපරීක්ෂාකාරිත්වයක් දක්වන්නවුන්ට විරුද්ධව දියුණු කම්කරුවන් විසින් කුරුස යුද්ධයක් සංවිධානය කර ක්‍රියාත්මක කරනු ලබන තුරු, සමාජවාදයේ ප්‍රථම පියවරේ (කම්කරු පාලනයේ) සිට සමාජවාදයේ දෙවන පියවර, එනම් කම්කරුවන් විසින් නිෂ්පාදනය ක්‍රමාණුකූල ලෙස හැසිරවීම දෙසට කිසිසේත් ගමන් කළ නොහැකි වේ.

සමාජවාදී රාජ්‍යය උද්ගත විය හැක්කේ, ස්වකීය නිෂ්පාදනය හා පරිභෝජනය ගැන විඥත ලෙස ගිණුම් තබන, ශ්‍රමය පිරිමසින හා ශ්‍රම ඵලදායකත්වය නොකඩවාම උසස් කරන, එමගින් වැඩ දිනය පැය හත, හය හා ඊටත් අඩු ගණනක් පවා දක්වා පහත දැමීමට හැකියාව සලසන, නිෂ්පාදක සහ පාරිභෝගික කොමියුනවල පාලනයක් ලෙසට පමණකි. ධාන්‍ය සහ ධාන්‍ය නිෂ්පාදනය (සහ කල්යාමේදී අන් සියළුම අත්‍යවශ්‍ය භාණ්ඩ) පිළිබඳව දැඩි තම, දේශ ව්‍යාප්ත, අංග සම්පූර්ණ ගිණුම් තැබීම සහ පාලනයද ක්‍රියාත්මක කරන තෙක් කිසිවක් සාර්ථක කර ගත නොහැකි වනු ඇත. භාණ්ඩ නිෂ්පාදනය සහ බෙදා හැරීම පිළිබඳ පොදු ජන ගිණුම් තැබීමක් හා පාලනයක් වෙත පරිවර්තනය වීමට අපට ආධාරකාරී වන පොදු ජන සංවිධාන, එනම් පාරිභෝගිකයන්ගේ සමූපකාර සමිති ධනපති ක්‍රමයෙන් අපට උරුම වී තිබේ. රුසියාවේ මෙම සමිති, දියුණු ධනපති රටවල තරම් හොඳින් සංවර්ධනය වී නැත. එසේ වුවත් ඒවායේ සාමාජිකත්වය කෝටිය ඉක්මවා සිටී. මෑතදී පරිභෝගික සමූපකාර සමිති සම්බන්ධයෙන් නිකුත් කරන ලද ආඥාව,[25] ඉතාමත් වැදගත් ප්‍රපංචයකි. වර්තමාන අවස්ථාවේදී සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවේ විශේෂ තත්වය සහ එහි නිශ්චිත කර්තව්‍යයන් එයින් සිත්කාවදින ලෙස පිළිබිඹු වේ.

මෙම නියෝගයෙන් පිළිබිඹු වන්නේ තවමත් ධනපති අදහස් වෙත එල්බ සිටින ධනපති සමූපකාර සමිති සහ කම්කරු සමූපකාර සමිති සමග වූ එකඟත්වයකි. ප්‍රථම වශයෙන්ම එම ආඥාව ගැන කෙරුණු සාකච්ඡාවලට එම ආයතන සහභාගී වීම පමණක් නොව, ඒවායේ බලවත් විරෝධතාවයට ලක් වූ ආඥාවෙහි කොටස් අත්හැර දැමීමද සිදු වූ නිසා, එම කාරණයෙහිදී තීරණාත්මක බලයක් ඒවා සතු වූ හෙයින් එය එකඟත්වයක් නැතහොත් සම්මුතියක් වේ. දෙවැනිව, ඇතුලත් වීමේ ගාස්තු නොමැතිව

සමූපකාර සමිතිවලට නව සාමාජිකයන් ඇතුලත් කර ගැනීමේ ප්‍රතිපත්තිය (සසංගත එකම නිර්ධන පංති ප්‍රතිපත්තිය එයයා) අත් හැර දැමීමට සෝවියට් ආණ්ඩුව එකඟ වීම සම්මුතියේ හරය වේ. කිසියම් ප්‍රදේශයක මුළු ජනගහනයම එකම සමූපකාර සමිතියක් තුළ එක්සත් කිරීමේ අදහසද එය අත්හැර දමා තිබේ. මෙම, එකම, සමාජවාදී, සහ පංති අහෝසි කිරීමේ කර්තව්‍යයට ගැලපෙන, ප්‍රතිපත්තියට පටහැනි ලෙසට, ''කම්කරු පංති සමූපකාර සමිති'' වලට (මෙහිදී මෙම සමිති තමන් ''පංති'' සමිති ලෙසට හඳුන්වා ගන්නේ ඒවා ධනපති- පංතියේ පංති උවමනාවන්ට යටත් වී සිටින බැවින් පමණකි) තවදුරටත් පැවතීමට ඉඩ දෙන ලදී. අවසාන වශයෙන් සමූපකාර සමිතිවල පාලන මණ්ඩලවලින් ධනපතියන් සම්පූර්ණයෙන්ම නෙරපා දැමීමට සෝවියට් ආණ්ඩුව කළ යෝජනාවද බොහෝදුරට වෙනස් කරන ලදී. ඒ අනුව, එම මණ්ඩලවල සේවය කිරීම තහනම් කරන ලද්දේ පෞද්ගලික ධනපති වෙළෙඳ සහ කාර්මික ව්‍යවසායයන් හිමි කර ගෙන සිටියවුන්ට පමණකි.

සෝවියට් ආණ්ඩුව මගින් ක්‍රියාත්මක වෙමින්, ජාතික පරිමාණයෙන් ගිණුම් තැබීම හා පාලනය සංවිධානය කිරීමට, නැතහොත්, යටත් පිරිසෙයින් එවැනි පාලනයක් සඳහා අඩිතාලමක් හෝ දැමීමට නිර්ධන පංතියට හැකි වී තිබුණේ නම්, එවැනි සම්මුති ඇති කර ගැනීමේ උවමනාවක් නොවන්නට තිබුණි. සෝවියට් සභාවල ආහාර දෙපාර්තමේන්තු මාර්ගයෙන්, සැපයුම් සංවිධාන මාර්ගයෙන්, ජනගහනය නිර්ධන පංති කළමණාකාරිත්වය යටතේ පවතින තනි සමූපකාරයකට සංවිධානය කිරීමට හැකිව තිබුණි. ධනපති සමූපකාර සමිතිවල ආධාරය ලබා නොගෙන, එසේම, ධනපති සමූපකාර සමිති සම්පූර්ණයෙන්ම කම්කරු සමූපකාර සමිතිවලට යටත් කරමින් ඒ දෙකම එකට සංයෝජනය කර, සමිතියේ සම්පූර්ණ කළමණාකරණය හා පොහොසතුන්ගේ පරිභෝජනය ගැන අධීක්ෂණය තමන් අතටම ගන්නවා වෙනුවට, එම කම්කරු සමූපකාර සමිති ධනපති සමිති සමග එක පෙළට සිටින්නට පොළඹවන, පිරිසිදු ධනපති ප්‍රතිපත්තියට ඉඩක් නොදී අපට ජනගහනය තනි සමූපකාරයට සංවිධානය කිරීමට හැකිව තිබුණි.

සෝවියට් සමූහාණ්ඩුව ධනපති සමූපකාර සමග එකඟත්වයකට එළඹීමේදී, එය වර්තමාන සංවර්ධන අවධියේදී අනුගමනය කරන ස්වකීය උපක්‍රමීය අරමුණු සහ තමන් ක්‍රියාත්මක වන විශේෂ ආකාරය මෙසේ නිශ්චිත ලෙස පැහැදිලි කළේය: ධනපති කොටස් මෙහෙයවීමෙන්, ඔවුන්ගෙන් ප්‍රයෝජන ගැනීමෙන්, ඔවුන්ට අර්ධ සහන දීමෙන් අපි ප්‍රථමයෙන් බලාපොරොත්තු වූවාට වඩා අඩු වේගයකින්, එහෙත්, පදනම සහ පණිවුඩ මාර්ග සුරක්ෂිත වීම සහ දිනාගත් තත්වයන් වඩා හොඳින්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තහවුරු වීම නිසා වඩාත් නිසැක ලෙස තවදුර ප්‍රගතිය ලැබීම සඳහා සරිලන කොන්දේසි නිර්මාණය කරමු. සමාජවාදය ගොඩනැගීමේ ක්ෂේත්‍රයෙහි දී සෝවියට් සභා ලබන ජයග්‍රහණ මැනීමට ඉතාමත් පැහැදිලි, සරල හා ප්‍රායෝගික ප්‍රමාණිකයන්, එනම්, ප්‍රජා (කොමියුන, ගම් හෝ නිවාස කාණ්ඩ ආදී) සමුපකාර සමිති කීයක් සංවිධානය කර තිබේද, ඒවා මුළු ජනගහනයම වැළඳ ගන්නා තත්ත්වය කරා කොතෙක් දුරට සංවර්ධනය වී තිබේද යන්න සහ වෙනත් කරුණු මිම්මක් ලෙසට ගැනීමේ හැකියාව හා යුතුකම දැන් සෝවියට් සභාවලට ඇත.

ශ්‍රම ඵලදායකත්වය වැඩි කිරීම

සෑම සමාජවාදී විප්ලවයකදීම නිර්ධන පංතිය බලය අල්ලා ගැනීමේ ප්‍රශ්නය විසඳූ ඉක්බිතිව හා අසන්තක කරන්නන් අසන්තක කිරීම සහ ඔවුන්ගේ ප්‍රතිරෝධය මැඩලීම ප්‍රධාන වශයෙන් සාර්ථක කළ තරමට, ධනපති ක්‍රමයට වඩා උසස් සමාජ ක්‍රමයක් නිර්මාණය කිරීමේ, නැතහොත්, ශ්‍රම ඵලදායකත්වය වැඩි කිරීමේ හා ඊට අදාළ ලෙසට (හා ඒ සඳහා) වඩාත් යහපත් ශ්‍රම සංවිධානයක් ඇති කර ගැනීමේ මූලික කර්තව්‍යය පෙරමුණ ගන්නේය. කෙරෙන්ස්කිගේ සිට කර්නිලව් දක්වා වූ සූරාකන්නන් පරාජය කර ලත් ජයග්‍රහණවලට ස්තුති වන්නට, අපගේ සෝවියට් රාජ්‍යය දැන් නියත වශයෙන් පැමිණ තිබෙන්නේ මෙම කර්තව්‍යය වෙත එක එල්ලේම ළඟා විය හැකි හා ඉත සිතින් එය විසඳීමට ව්‍යාවෘත විය හැකි තත්වයටය. එසේම, මෙහිදී එක්වරම පැහැදිලි වන්නකි, දින කීපයකින් මධ්‍යම ආණ්ඩුව අත්පත් කරගත හැකි වුවත්, මහා විශාල රටක විවිධ කොටස්වලින් පවා සූරාකන්නන් දැක්වූ යුද්ධමය ප්‍රතිරෝධය (සහ කඩා කප්පල් කිරීම්) සති කීපයක් තුළ මර්දනය කළ හැකි වුවත්, ශ්‍රම ඵලදායකත්වය වැඩි කිරීමේ ප්‍රධාන ප්‍රශ්නය විසඳීම සඳහා (විශේෂයෙන්ම ඉතාමත් භයානක හා අති මහත් විනාශකාරී යුද්ධයකින් පසුව) අවුරුදු ගණනාවක් ගත වීම නොවැලැක්විය හැකිය යන්න. මෙම කර්තව්‍යයේ දිග්ගැස්සුනු ස්වභාවය නියත වශයෙන්ම වාස්තවික වාතාවරණයෙන් නියමිත වූවකි.

ශ්‍රම ඵලදායකත්වය වැඩි කිරීම සඳහා ප්‍රථමයෙන්ම මහා පරිමාණ කර්මාන්ත සඳහා අවශ්‍ය ද්‍රව්‍යමය පදනම තිබීම සහතික විය යුතුය. නැතහොත්, ඉන්ධන හා යකඩ නිෂ්පාදනයත්, ඉන්ජිනේරු සහ රසායනික කර්මාන්තත් දියුණු වී තිබිය යුතුය. බ්‍රෙස්ට් ගිවිසුමෙන් පසුව වුවද, (උරාල්හි) යපස්, බටහිර සයිබීරියාවේ ඉන්ධන (ගල් අඟුරු), කොකේසියාවේ හා මධ්‍යම ආසියාවේ (තෙල්), මධ්‍යම රුසියාවේ (පර්ණක) අති විශාල සංචිතයන්ද, අති විශාල දැව සංචිතයන්ද, ජල ශක්තියද, රසායනික කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍යයද (කාබයිඩ්) ආදිය තිබීමේ වාසිදයක තත්වය රුසියානු සෝවියට් සමූහාණ්ඩුව සතුය. නවීන කාර්මික ශිල්පයේ ක්‍රම අනුව මෙම ස්වාභාවික සම්පත් සංවර්ධනය කිරීමෙන් නිෂ්පාදනීය බලවේගයන්ගේ පෙර නොවූ විරූ ප්‍රගතියට පදනම සැපයේ.

ශ්‍රම ඵලදායකත්වය වැඩිවීම සඳහා තවත් ඉටුවිය යුතු කොන්දේසියකි, ප්‍රථමයෙන්ම පොදු ජනතාවගේ අධ්‍යාපන සහ සංස්කෘතික මට්ටම උසස් කිරීම. මෙය දැන් ඉතා සීඝ්‍ර ලෙස ඉටුවෙමින් පවතී. ධනපති පංතික අනුබැඳියාවෙන් අන්ධවූවන්ට එය පෙනෙන්නේ නැත. සෝවියට් ක්‍රමයේ සංවිධානයට ස්තුති වන්නට ජනතාවගේ ''පහළ පිරිස්'' අතර දැන් සංවර්ධනය වෙමින් පවතින දැනුම ලැබීම හා ක්‍රියාරම්භකතාවය සඳහා වූ බලවත් උනන්දුවක් ඇතත්, ඒ බව ඔවුනට නොවැටහේ. දෙවැනිව, ආර්ථික පුනර්ජීවයක් සඳහා ඉටුවිය යුතු කොන්දේසියකි, වැඩ කරන ජනතාවගේ විනය,දක්ෂතාවයන්, කාර්යක්ෂමතාවය හා ශ්‍රම සූක්ෂමතාවය උසස් කිරීම සහ දියුණු ශ්‍රම සංවිධානයක් තිබීම.

ධනපති පංතියේ බලපෑමට යටත් වූවන්ගේ හෝ තමන්ගේම උවමනාවන් ඉටු කරගැනීමට ධනපති පංතියට මෙහෙ කරන්නන්ගේ හෝ කියමන් අපි විශ්වාස කරන්නෙමු නම්, මේ හා සම්බන්ධයෙන් තත්වය ඉතා නරකය. කලින් පැවති ක්‍රමයේ ආධාර කරුවන් විසින් අවුල් වියවුල්, අරාජිකභාවය ආදිය ගැන කරනු ලබන උඩුබිරුලෑමෙන් තොරව විප්ලවයක් සිදු නොවූ බවත්, සිදු නොවන බවත් මොවුනට වැටහෙන්නේ නැත. පෙර නොවූ විරූ තරම් දරුණු බන්ධනයන් මේ දැන් ඉවත ලූ ජනතාව අතර ගැඹුරු සහ පැතිරී ගිය පිටාර යාමක් හා කලබල ස්වභාවයක් තිබීම ස්වාභාවිකය. ජනතාව විසින් නව ශ්‍රම ප්‍රතිපත්ති සකස් කර ගැනීම දිග්ගැස්සුනු ක්‍රියාවලියකි. එමනිසා ඉඩම් හිමියන් සහ ධනපතියන් පරදවා සම්පූර්ණ ජයග්‍රහණය ලබන තෙක් මෙම ක්‍රියාවලිය ආරම්භ කිරීමටවත් පුළුවන් කමක් නොමැත. .

එසේ වුවද, (ස්වකීය පැරණි වරප්‍රසාද රැක ගැනීමේ බලාපොරොත්තු සුන් කරගත්) ධනපතියන් හා ධනපති බුද්ධිමතුන් පතුරුවන බලාපොරොත්තු බිඳී ගිය ස්වභාවයේ ව්‍යාජ හැඟීමට යම්තමින් හෝ යට නොවන අපි පැහැදිලි අයහපතක් වන දෙය ද කිසි කලෙකත් නොසඟවන්නෙමු. ඊට ප්‍රතිකූල වශයෙන් අපි එය හෙළිදරව් කර එයට විරුද්ධව සටන් කිරීමේ සෝවියට් ක්‍රම උත්සන්න කරන්නෙමු. මක්නිසාදයත් කෙරෙන්ස්කිවාදය සහ කර්නිලව්වාදය නැවත ආපසු ගෙන්වීමේ හැකියාව පිළිබඳ නියම සහතිකය වන සාංසිද්ධික සුළු ධනපති අරාජිකත්වය පරදවා නිර්ධන පංතියේ විඥාන විනය ලබන ජයග්‍රහණයෙන් තොරව සමාජවාදයේ ජයග්‍රහණය ගැන සිතීමටවත් නොහැකි හෙයිනි.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

රුසියානු **නිර්ධන** පංතියේ වැඩි පංති විඥනයක් සහිත පෙරමුණු බල ඇණිය ශ්‍රම විනය නංවාලීමේ කර්තව්‍යය දැනටමත් තමන් වෙත පවරාගෙන තිබේ. නිදසුනක් වශයෙන් ලෝහ කම්කරු සංගමයේ මධ්‍යම කාරක සභාව සහ වෘත්තීය සමිති මධ්‍යම මණ්ඩලය මේ සඳහා අවශ්‍ය පියවරයන් හා ආඥා කෙටුම්පත් කිරීමට පටන් ගෙන ඇත.[26] මෙම කාර්යය සඳහා ආධාර කළ යුතුය. එය මුළු වේගයෙන් ඉදිරියට ගෙන යා යුතුය. කෑලි ගණනේ වැඩ ක්‍රමය සහ එය ක්‍රියාත්මක කර ව්‍යවහාරයෙන් අත්හදා බැලීමේ ප්‍රශ්නය අපි මතු කරන්නෙමු. ටේලර් ක්‍රමයේ ඇති විද්‍යාත්මක සහ ප්‍රගතිශීලී අංග බොහොමයක්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රශ්නය අපි මතු කළ යුත්තෙමු. වේතන ප්‍රමාණය නිපදවූ මුළු භාණ්ඩ ප්‍රමාණයට, නැතහොත් දුම්රිය සේවාවන්හි, ජලප්‍රවාහණ ක්‍රමයේ ආදියෙහි වැඩ ප්‍රමාණය සමග සැසඳෙන තත්වයක් ඇති කළ යුත්තෙමු.

දියුණු රටවල ජනතාව හා සමග සසඳන කල රුසියානු මිනිහා හොඳ වැඩ කාරයෙක් නොවේ. සාර්වාදී පාලනය යටතේ සහ වැඩවසම් ක්‍රමයේ පසු මතෙහි තද බලකම අනුව එහි අමුත්තක් විය නොහැකිව තිබුණි. සෝවියට් ආණ්ඩුව පූර්ණ පරිමාණයෙන්ම ජනතාව හමුවෙහි තැබිය යුතු කර්තව්‍යය නම්, වැඩ කිරීමට උගෙන ගන්න යන්නය. මේ හා සම්බන්ධයෙන් ධනපති ක්‍රමයේ උච්චතම නිමැවුම වන ටේලර් ක්‍රමය, ධනපති ප්‍රගතියේ සියල්ලක්ම මෙන්ම, ධනපති සූරා කෑමේ දරුණු කම හා සමග ශ්‍රෙෂ්ඨ විද්‍යාත්මක සොයා ගැනීම් වන, වැඩ කිරීමේදී සිදුවන යාන්ත්‍රික චලනයන් විශ්ලේෂණය කිරීම, අනවශ්‍ය හා අපහසු චලනයන් ඉවත් කිරීම, වැඩ කිරීමේ නිවැරදි ක්‍රම පැහැදිලි කිරීම, ගිණුම් තැබීමේ හා පාලනයේ හොඳම ක්‍රම ආරම්භ කිරීම ආදිය ඒකාබද්ධ කර ගැනීමක් වන්නේය. සෝවියට් ආණ්ඩුව කෙසේ හෝ කළ යුත්තකි, මෙම ක්ෂෙත්‍රයෙහි විද්‍යාවේ හා තාක්ෂණ ශිල්පයේ වටිනා ජයග්‍රහණයන් සියල්ලම ස්වකීය කටයුතු සඳහා යොදා ගැනීම. සමාජවාදය ගොඩ නැගීමේ හැකියාව නියත වශයෙන්ම රඳා පවතින්නේ සෝවියට් බලය සහ සෝවියට් පරිපාලනය සංවිධානය කිරීමත්, ධනපති ක්‍රමයේ නවීනතම ජයග්‍රහණයනුත් ඒකාබද්ධ කිරීමේදී ලැබෙන සාර්ථකත්වය මතය. රුසියාව තුළ ටේලර් ක්‍රමය අධ්‍යයනය කිරීම සහ උගැන්වීමද, එය ක්‍රමානුකූල ලෙස අත්හදා බැලීම සහ එය අපගේ උවමනාවන් සඳහා යොදා ගැනීමද සංවිධානය කිරීමට අපි පියවර ගත යුත්තෙමු. ඒ අතරම, ශ්‍රම ඵලදායකත්වය වැඩි කිරීමට කටයුතු කිරීමේදී අපි ධනපති ක්‍රමයේ සිට සමාජවාදය දක්වා පරිවර්තනය වීමේ කාලසීමාවේ විශේෂ අංගලක්ෂණද සැලකිල්ලට ගත යුත්තෙමු. එම අංග ලක්ෂණ අනුව එක් අතකින් තරඟය සමාජවාදී ආකාරයෙන් සංවිධානය කිරීමට අඩිතාලම් දැමීමත්; අනිත් අතින්, නිර්ධන පංති

ආඥාදායකත්වය පිළිබඳ සටන් පාඨය බිය සුළු නිර්ධන පංතික ආණ්ඩුවක කටයුතුවලින් කෙළෙසී නොයනු පිණිස බලකිරීම උපයෝගී කර ගැනීමත් අවශ්‍ය වේ.

තරඟය සංවිධාන කිරීම

ධනපතියන් සමාජවාදය ගැන ප්‍රචාරය කිරීමට ප්‍රිය කරන විකාර අදහස්වලින් එකකි, සමාජවාදීහු තරඟයේ වැදගත්කම ප්‍රතික්ෂේප කරතියි යන්න. නමුත්, ඇත්ත වශයෙන්ම පංති අහෝසි කිරීමෙන් සහ ඒ අනුව ජනතාව වහල් කිරීම අහෝසි කිරීමෙන් ප්‍රථම වරට නියම පොදුජන පරිමාණයෙන් තරඟය ඇති වීමට මාර්ගය විවෘත කරන්නේ සමාජවාදය පමණකි. ධනපති සමූහාණ්ඩුවේ පවතින නාමික ප්‍රජාතන්ත්‍රවාදයේ සිට වැඩ කරන ජනතා සමූහයා සැබැවින්ම පරිපාලනයට සහභාගි වීම දක්වා පරිවර්තනය වීම සහතික කිරීමෙන් ප්‍රථම වතාවට තරඟය පුළුල් පදනමක් මත තබනු ලබන්නේ සෝවියට් සංවිධාන ආකෘතිය විසින්ම ය. ආර්ථික ක්ෂේත්‍රයට වඩා දේශපාලන ක්ෂේත්‍රයෙහි මෙය සංවිධානය කිරීම බොහෝ පහසුය. නමුත් සමාජවාදයේ ජයග්‍රහණය සඳහා ප්‍රධාන වන්නේ ආර්ථික ක්ෂේත්‍රය ය.

නිදසුනක් වශයෙන් ප්‍රසිද්ධිය දීම වැනි දෙයක් තරඟය සංවිධානය කිරීමේ මාධ්‍යයක් ලෙස ගෙන බලමු. ධනපති සමූහාණ්ඩුව ප්‍රචාරය සහතික කරන්නේ නාමික වශයෙන් පමණකි. ව්‍යාවහාරික වශයෙන් එය පුවත්පත් ප්‍රාග්ධනයට යටත් කරයි. ත්‍රාස ජනක දේශපාලන වල්පල් ලියා "නොහික්මුණු රංචුව" සතුටු කර තබන එය කර්මාන්ත ශාලා තුළ සිදු වන දේත්, වාණිජ ගනු දෙනු, කොන්ත්‍රාත් ආදියෙන් සිදු කෙරෙන, "දේපල පිළිබඳ ශුද්ධ උරුමය" රකින "වෙළෙඳ රහස්" වලින් මුවා කර තබයි. සෝවියට් ආණ්ඩුව වෙළෙඳ රහස් අහෝසි කළේය. එය නව මාවතක් ඔස්සේ යයි. නමුත් ආර්ථික තරඟය සඳහා ප්‍රසිද්ධියක් දීම උපයෝගී කර ගැනීමට අප කිසිවක් කර නොමැති තරම් ය. මහා බොරු දෙසන සහ උද්ධච්ච සේ අපහාසකාරී වන ධනපති ප්‍රවෘත්ති පත්‍ර නිර්දය ලෙස මර්දනය කරන අතර දේශපාලන සන්ත්‍රාසයෙන් සහ අවශේෂ කරුණුවලින් ජනතාව සැනසීම හා රැවටීම නොකරන එහෙත්, දෛනික ආර්ථික ජීවිතයේ ප්‍රශ්න ජනතාවගේ විනිශ්චය සඳහා ඉදිරිපත් කරන හා එම ප්‍රශ්න ගැන බරපතල අධ්‍යයනයකට ආධාර කරන පුවත්පත් ඇති කිරීම සඳහා අපි ක්‍රමාණුකූල වශයෙන් වැඩ කිරීමට පටන් ගත යුත්තෙමු. සෑම පැක්ටරියක්ම සහ සෑම ගමක්ම නිෂ්පාදක සහ පාරිභෝගික කොමියුනයකි. පොදු සෝවියට්

https://liberationbase.wordpress.com

නීති තමන්ට සුදුසු ආකාරයෙන් (“තමන්ට සුදුසු ආකාරයෙන්”, එනම්, ඒවා උල්ලංඝනය කිරීමේ අර්ථයෙන් නොව, එහෙත් ඒවා විවිධ ආකාරයෙන් ක්‍රියාත්මක කළ හැකිය යන අර්ථයෙන්) ක්‍රියාත්මක කිරීම සහ භාණ්ඩ නිෂ්පාදනයේ හා බෙදහැරීමේ ගිණුම් තැබීම හා සම්බන්ධ ප්‍රශ්නය තමන්ට සුදුසු ආකාරයට විසඳා ගැනීම එම කොමියුනවල හිමිකම හා යුතුකම වන්නේය. ධනපති ක්‍රමය යටතේ මෙය තනි තනි ධනපතියාගේ, ඉඩම් හිමියාගේ හෝ කුලාකයාගේ “පෞද්ගලික කටයුත්ත” වූයේය. සෝවියට් ක්‍රමය යටතේ එය පෞද්ගලික කටයුත්තක් නොව, ඉතාමත් වැදගත් රාජ්‍ය කටයුත්තක් වන්නේය.

කොමියුන අතර තරඟය සංවිධාන කිරීමේද, ධාන්‍ය, රෙදිපිළි හා වෙනත් ද නිෂ්පාදනයේ ක්‍රියාදමයෙහිදී ගිණුම් තැබීම සහ ප්‍රසිද්ධියක් දීම ආරම්භ කිරීමේද, නීරස, මැළවුණු, නිලධාරිවාදී ගිණුම් සමහරක් පිළිකුල් සහගත සහ අනිත් ඒවා ආකර්ෂණීය නිදසුන් බවට පත් කිරීමේද, දැවැන්ත, දුෂ්කර, එහෙත්, මහත් ඵලදායී කර්තව්‍යය ආරම්භ කිරීමවත් අපි මෙතෙක් හරිහැටි කර නැත්තෙමු. ධනපති නිෂ්පාදන ක්‍රමය යටතේ, වෙන්ව ගත්ත තනි ආදර්ශයේ වැදගත්කම, නිදසුනක් වශයෙන්, සමුපකාර වැඩ පලක ආදර්ශයේ වැදගත්කම අනිවාරණීය වශයෙන් සීමා වී තිබුණු අතර යහපත් ආයතනවල ආදර්ශය මගින් ධනපති ක්‍රමය “නිවැරදි” කිරීම ගැන සිහින දැකිය හැකිව තිබුණේ සුළු ධනපති මායාවන්ගෙන් මෝහනය වී සිටි අයට පමණකි. දේශපාලන බලය නිර්ධන පංතිය අතට පත්වූ පසු, අසන්තක කරන්නන් අසන්තක කළ පසු, තත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වන්නේය. එවිට ප්‍රමුඛ සමාජවාදීන් නිතර පෙන්වා දුන් පරිදි, ජනතාව කෙරෙහි බලපෑමේ හැකියාව ප්‍රථම වරට ආදර්ශයේ බලයට ලැබෙන්නේය. නොදියුණු කොමියුන ශික්ෂකයන් හා ගුරුවරුන් වශයෙන් කටයුතු කරමින් ඒවා නංවාලීමට ආදර්ශ කොමියුන කටයුතු කරනු ඇත, කටයුතු කළ යුතුය. පුවත්පත් සමාජවාදය ගොඩ නැගීමේ උපකරණයක් ලෙසට කටයුතු කළ යුතුය. ආදර්ශ කොමියුන ලබා ගන්නා ජයග්‍රහණ ගැන සම්පූර්ණ විස්තර සහිතව ප්‍රචාරය කළ යුතු පුවත්පත්, එම ජයග්‍රහණවලට හේතු සාධක වූ කරුණුද, මෙම කොමියුන යොදා ගන්නා කලමණාකාර ක්‍රමද අධ්‍යයනය කළ යුතු අතර, “ධනපති සම්ප්‍රදය” එනම්, අරාජිකත්වය, අලසකම, අසංවිධානය හා ලාභ ගැරීම අත් නොහරින කොමියුන “අප ලේඛනගත” කළ යුතුය. ධනපති සමාජයේ සංඛ්‍යා ලේඛන සම්පූර්ණයෙන්ම “ආණ්ඩුවේ සේවකයන්ට” නැතහොත් පටු විශේෂඥයන්ට පමණක් සීමා වූ විෂයක් විය. කොතරම් කාලයක් වැඩ කළ යුතුද, වැඩ කළ යුත්තේ කෙසේද, අයෙක් කොතරම් කාලයක් හා කෙසේ විවේක ගත යුතුද යනු ක්‍රමානුකූල ලෙස වටහා ගැනීමට වැඩ කරන ජනතාවට

හැකි වනු පිණිස, විවිධ කොමියුනවල ව්‍යාපාරික කටයුතුවල ප්‍රතිඵල සසඳා බැලීම පොදු උනන්දුවට හේතු වන හා අධ්‍යයනයට මාතෘකාවක් වනු පිණිස සහ ඉතාමත් විශිෂ්ඨ කොමියුනවලට වහාම (වැඩ දිනය කෙටි කිරීමෙන්, පාරිශ්‍රමික වැඩි කිරීමෙන්, සංස්කෘතික, නැතහොත් රසිකත්ව පහසුකම් හෝ සම්පත් ඒවායේ ප්‍රයෝජනය සඳහා දීමෙන් ආදී වශයෙන්) තෑගි ප්‍රදානය කළ හැකි වනු පිණිස, අපි සංඛ්‍යා ලේඛන ජනතාව අතරට ගෙන ගොස් ඒවා ජනප්‍රිය කළ යුත්තෙමු.

සමාජයේ නායකයා හා මාර්ග දේශකයා වශයෙන් නව පංතියක් ඓතිහාසික දර්ශන පථයට පැමිණෙන විට එක් අතකින් ප්‍රචණ්ඩ “සෙලවීම්” කම්පන, අරගල සහ කුණාටුද, අනිත් අතින්, නව වාස්තවික තත්වයට ගැලපෙන නව ක්‍රම තෝරා ගැනීමේදී දක්නට ලැබෙන අනිස්ථිර පියවරයන්, අත්හද බැලීම්, වැනෙන සුලු හා පැකිලීම් සහිත කාල සීමාවක්ද ඇති වීම වැළැක්විය හැකි නොවේ. මාරාභිමුකව සිටින වංශවතුන්, තමන් පරාජයට පත් කොට තමන්ගේ තැන උදුරාගත් ධනපති පංතියෙන් පළි ගත්තේ කුමන්ත්‍රණ කිරීමෙන් හා කැරළි ගැසීමෙන්, යළි බලයට පැමිණීමට ප්‍රයත්න දැරීමෙන් පමණක් නොව, කුමාරවරුන්ට, සිටුවරුන්ට, වංශාධිපතියන්ට හා ප්‍රභූවරුන්ට තිබුණු ශත වර්ෂාධික පුහුණුව රහිතව රාජ්‍යයේ “ශුද්ධ නියමුකම” අත්පත් කර ගත් “අලුත් බලවතුන්ගේ” සහ “ආඩම්බරකාරයන්ගේ” නුපුරුදු කම්, අපිළිවෙළ හා වැරදි ගැන ඔවුන්ට කරන නින්ද අපහාසවලින් ඔවුන් නැහැ වීමෙන්ද වේ. හරියටම ඒ ආකාරයෙන්ම, කර්නිලව්ලා හා කෙරෙන්ස්කිලාද, ගොත්සේලා හා මාර්තව්ලාද, ධනපති වංචාවේ නැතහොත් ධනපති සංශයවාදයේ වීරයන් මුළු පිරිසද, නිර්ධන පංතිය බලය ගැනීමට තරම් “එඩිතර” වීම නිසා ඔවුන්ගෙන් පළිගනිති.

නව සමාජ පංතියකට, විශේෂයෙන්ම මේ දක්වා දුප්පත් කමෙන් හා නූගත් කමෙන් පරිපීඩිතව සිටි පංතියකට, නව තත්වයට පුරුදු වීම, වටපිටාව ගැන අවබෝධ කර ගැනීම සහ තමන්ගේ වැඩ සංවිධානය කර ගැනීම හා තමන්ගේම සංවිධායකයන් ඉදිරිපත් කිරීම සඳහා සති ගණන් නොව දීර්ඝ මාස ගණන් හා අවුරුදු ගණන් කාලය අවශ්‍ය වනු ඇත. දශ ලක්ෂ සංඛ්‍යාත හා කෝටි සංඛ්‍යාත පුරවැසියන් සඳහා වූ විශාල සංවිධානාත්මක ව්‍යාපාරවල අත් දැකීම හා පුරුදු කම්, විප්ලවවාදී නිර්ධන පංතිය මෙහෙයවන පක්ෂයට නොතිබීම වටහා ගත හැකි දෙයකි. තනිකරම උද්ඝෝෂකයන්ගේ වූ පැරණි පුරුදුකම් යළි හැඩගැස්වීම යනු ඉතා දීර්ඝ ක්‍රියාදමයකි. නමුත් මෙහි නොකළ හැකි කිසිවක් නොමැත. වෙනසක් කිරීමේ අවශ්‍යතාවය පැහැදිලිව වැටහී ගිය වහාම, වෙනස කිරීම සඳහා ස්ථිර අධිෂ්ඨානයත්, උසස් හා දුෂ්කර අරමුණක් කරා යාමට ධෛර්යයත්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඇතිවූ වහාම, අපි එය ඉටු කරන්නෙමු. ''ජනතාව'' අතර, එනම්, කම්කරුවන් හා අන්‍යයන්ගේ ශ්‍රමය සූරා නොකන ගොවීන් අතර, අතිමහත් සංවිධාන දක්ෂකම් ඇත්තේය. ප්‍රාග්ධනය, මෙම දක්ෂ ජනයා දහස් ගණනින් මිරිකා දැම්මේය. ඔවුන්ගේ දක්ෂකම් මරා දැමූ එය, එම ජනයා කසළ ගොඩට ඇද දැම්මේය. ඔවුන් සොයාගෙන, ඔවුන් ධෛර්යමත් කර, දෙපයින් සිටුවා ඉදිරිපත් කිරීමට අපට තවමත් පුළුවන් වී නොමැත. නමුත්, අපි විප්ලවවාදී උද්යෝගය පෙරදැරි කරගෙන මෙම කර්තව්‍යයෙහි නිරත වන්නෙමු නම්, අපි එය ඉටු කිරීමට උගෙන ගැනීමෙහි සමත් වන්නෙමු. එම උද්යෝගය නොමැතිව ජයග්‍රාහී විප්ලව ඇති විය නොහැකිය.

කුණු කැදලි උඩට මතුවන්නේ නැතිව, කපටියන් සහ සොරුන්, පුච්චානම් කාරයන් සහ පුහු කථාකාරයන් නුපුරුදු නවීකාරකයන් කෙරෙහි එල්බ ගැනීමක් නැතිව, නුවූමනා කැළඹීලි, අනුවන ක්‍රියා හා දනිපනිගෑම් රහිතව තනි ''නායකයන්'' වැඩ විස්සක් එක්වරම කිරීමට උත්සාහ දරා ඉන් එකක්වත් අවසන් නොකර තැබීම නොමැතිව, ඉතිහාසයේ ගැඹුරු හා දැවැන්ත පොදුජන ව්‍යාපාරයක් කිසි කලෙකත් සිදු වූයේ නැත. මහ පැරණි ගස් කපා හෙළීමේදී විසි වන සෑම අතිරේක අතු කැබැල්ලම ගැන, බෙලොරුසොව්ගේ පටන් මාර්තව් දක්වා වූ ධනපති සමාජයේ සුරතල් බල්ලන් කෙදිරි ගෑවාවේ, බිරුවාවේ. නිර්ධන පංති ඇතා දක්‍කා බිරීමට නොවේ නම්, ඒ සුරතල් බල්ලන් සිටින්නේ කුමකටද? ඔවුන් බිරුවාවේ. අපි අපේ මහ යන්නෙමු. අපි හැකි තරම් සුපරීක්ෂාකාරී ලෙස සහ ඉවසිලිමත් ලෙස කටයුතු කරමින්, සමාජවාදයට පක්ෂපාත කමක්, සෝවියට් සංවිධානයේ රාමු කට්ටුව තුළ සහෝදරාත්මක ලෙස සහ ප්‍රත්‍යක්ෂ ලෙස එක්ව වැඩ කරන විශාල ජන පිරිසක් කලබල රහිතව (අවුල් වියවුල් සහ කලබල තිබියදීම) එක් රැස්කර ගැනීමේ හැකියාවක් ඒකාබද්ධ කරගත්, නැනවත් හා ප්‍රායෝගික සිතුවිලි දරන ජනයාවන නියම සංවිධායකයන් සොයා ගන්නෙමු. ඔවුන් පරීක්ෂා කර බලන්නෙමු. එවැනි ජනයා ජනතා ශ්‍රමයේ නායක තනතුරුවලට, පරිපාලනයේ නායක තනතුරුවලට උසස් කළ යුත්තේ සරලතම කර්තව්‍යයන්ගේ පටන් ඉතාමත් දුෂ්කර කර්තව්‍යයන් දක්වා මාරු කිරීමෙන් වාර දුසිම් ගණනක් පරීක්ෂා කර බැලීමෙන් පසුව පමණකි. අපි එය තවම ඉගෙනගෙන නැත. අපි එය ඉගෙනගනිමු

''සංගත සංවිධානය'' සහ ආඥාදායකත්වය

මෑතදී මොස්කව් හි පැවැත්වුනු සෝවියට් සභා සම්මේලනයේදී අනුමත වුනු යෝජනාවෙහි සඳහන් පරිදි මෙම අවස්ථාවෙහි මූලික කර්තව්‍යය වන්නේ ''සංගත සංවිධානයක්'' පිහිටුවීම සහ විනය දැඩි කිරීමය*. දැන් සෑම කෙනෙක්ම මෙවැනි යෝජනාවලට කැමැත්තෙන් ම ''ඡන්දය'' දෙයි, ''සම්මාදම්'' වෙයි. නමුත් එවැනි යෝජනා ක්‍රියාත්මක කිරීමේදී බල කිරීම, අවශ්‍ය වන්නේය යන කරුණ ගැන ජනයා සාමාන්‍ය වශයෙන් කල්පනා කරන්නේ නැත. එහෙත් බල කිරීම නොමැතිව, ආඥාදායකත්වය නොමැතිව, ධනපති ක්‍රමයේ සිට සමාජවාදයට පරිවර්තනය විය හැකියයි සිතීම අන්ත මෝඩකමක් සහ විකාර මනෝරාජ්‍යයක් වනු ඇත. මෙම සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විකාරයට විරුද්ධව මාක්ස්වාදී න්‍යාය බොහෝ ඉහතදීම ඒකාන්ත ලෙස නැගී සිටියේය. එසේම, රුසියාවේ 1917–1918 සිදුවීම් මාක්ස්ගේ මෙම න්‍යායෙහි නිරවද්‍යතාවය ඉතාමත් සිත් කාවදින ලෙස, ඉතා ප්‍රකට ලෙස හා බලවත් ලෙස සනාථ කළේය. එනිසා මේගැන කිසියම් හෝ අවිශ්වාසයක් ඇති කර ගත හැක්කේ අන්ත අඥාන නැතහොත් මුරණ්ඩු ලෙස මෙම සත්‍යයට පස්ස හරවා ගෙන සිටින අයට පමණකි. එක්කෝ කර්නිලව් (ඔහු රුසියානු වර්ගයේ ධනපති කැවිග්නැක් කෙනෙක් ලෙසට ගනිමු නම්) ආඥාදායකත්වයක් විය යුතුය, නැතහොත්, නිර්ධන පංතියේ ආඥාදායකත්වයක් විය යුතුය. ඉතිහාසයේ ඉතාමත් භයානක යුද්ධයක් විසින් ඇති කරන ලද අතිදරුණු විනාශය මධ්‍යයේ ඉතාමත් තියුණු වංගු සහිත මාර්ගයක් ඔස්සේ අති මහත් වේගයකින් සංවර්ධනය වෙමින් පවතින රටක වෙනත් දෙයක් තිබීම සිදුවිය නොහැක්කකි. මැද මාවතක් යෝජනා කරන සෑම විසඳුමක්ම රැවට්ල්ලකි. මන්දයත්, ධනපති පංතිය සත්‍ය ප්‍රකාශ කිරීමට තරම්, ඔවුනට කර්නිලව් කෙනෙක් අවශ්‍ය බව කීමට තරම් එඩිතර නොවන හෙයිනි. නැතහොත්, එවැනි විසඳුම් ප්‍රජාතන්ත්‍රවාදයේ, නිර්ධන පංති ආඥාදායකත්වයේ, පොදු ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණෙහි සමගිය හා එවැනි අර්ථ විරහිත දේ ගැන මැතදෙඩන සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ, චෙර්නොව්ලාගේ, ට්සෙරතේලිලාගේ සහ මාර්තව්ලාගේ නුනුවණ කම පිළිබඳ ප්‍රකාශනයක්වේ. මැද මාවතක් තිබිය නොහැකි බව 1917-1918 විප්ලවයේ ක්‍රියාවලියේදී වත් උගෙනගෙන නැති අය අතරමං වූවන් සේ සලකා අත් හැර දැමීම සුදුසු ය.

අනිත් අතට ධනපති ක්‍රමයේ සිට සමාජවාදය දක්වා වන සෑම පරිවර්තනයකදීම ප්‍රධාන හේතු දෙකක් නිසා, නැතහොත්, ප්‍රධාන මාර්ග දෙකක් තුළදී ආඥාදායකත්වය අවශ්‍ය බව වටහා ගැනීම අපහසු නොවේ. ප්‍රථමයෙන්ම, සූරා කන්නන්ගේ වස්තුව, සංවිධානාත්මක භාවය අතින් ඔවුන්ට ඇති වාසිදායක තත්වය හා දැනුම එක් වරම ඔහුට අහිමි කළ නොහැකි

* මෙම වෙළුමෙහි 32 වැනි පිටුව බලන්න. — සංස්කාරක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අතර ඔවුන්ගේ වෛරයට පාත්‍ර වූ දුප්පතුන්ගේ පාලනය පෙරළා දැමීමට ඔවුන් තරමක් දීර්ඝ කාලයක් යන තෙක් අනිවාර්‍ය්‍යණීය වශයෙන්ම උත්සාහ කරනු ඇති හෙයින් සූරාකන්නන්ගේ ප්‍රතිරෝධය නිර්දය ලෙස මර්දනය නොකර ධනපති ක්‍රමය පරාජය කර, එය අවසන් කර දැමිය නොහැකිය. දෙවැනිව, බාහිර යුද්ධයක් නොතිබුණත්, සෑම මහා විප්ලවයක්ම, විශේෂ-යෙන්ම සමාජවාදී විප්ලවයක් සිදුවීම අභ්‍යන්තර යුද්ධයකින් තොරව, එනම්, සිවිල් යුද්ධයෙන් තොරව, වෙතැයි සිතන්නටවත් නොපුළුවන. එම සිවිල් යුද්ධය බාහිර යුද්ධයටක් වඩා විනාශ කාරී වේ. එහි දී අස්ථිර භාවයේ සහ එක් පැත්තක සිට අනිත් පැත්තට පැන යාමේ අවස්ථා දහස් ගණන් හා ලක්ෂ ගණන් ඇති වේ. එයින් අදහස් වන්නේ, අන්ත අවිනිශ්චි-තතාවයත්, සමතුලිතය විරහිත කමත්, අවුල් සහගත භාවයත් රජයන තත්වයකි. එසේම, පැරණි සමාජය බිඳ වැටීමේ ගති ලක්ෂණ සියල්ලම, එනම්, ඉතාමත් බහුල සහ ප්‍රධාන වශයෙන් සුළු ධනපති පංතිය සමග සම්බන්ධ වූ (සෑම යුද්ධයකින්ම හා සෑම අර්බුදයකින්ම ප්‍රථමයෙන්ම විනාශ වී නැසී යන්නේ සුළු ධනපති පංතිය ය) දිරාපත්වන ගති ලක්ෂණ එවැනි මහා බරපතල විප්ලවයකදී "එළි දැකීම" නොවැළැක්විය හැකි ය. තවද, අපරාධ, දමරිකකම්, දූෂණය, ලාභ ගැරීම හා සෑම වර්ගයකම දුෂ්ඨාපරාධ ලෙසට හැර වෙනත් ආකාරයකින් "එළි දැකීමට" පුළුවන් කමක් මෙම දිරාපත්වන ගතිලක්ෂණයන්ට නොමැත. මේවා මර්දනය කිරීමට අයෝමය හස්තයක් අවශ්‍ය වන්නේය.

සහජාසයෙන් මෙන් ජනතාව මෙය වටහා ගැනීම සහ ලත් තැනම සොරුන් වෙඩිතබා දැමීමෙන් ප්‍රසාදජනක දැඩි බවක් පෑම සිදු නොවූ එකම ශ්‍රේෂ්ඨ විප්ලවයක්වත් ඉතිහාසයේ ඇති නොවීය. ඉහත විප්ලවවල අභාග්‍යය වූයේ, ජනතාව ඔවුන්ගේ නොසන්සුන් තත්වයෙන් රඳවාගත් හා දිරාපත් වීමේ ගති ලක්ෂණ නිර්දය ලෙස මර්දනය කිරීමට ඔවුන්ට ශක්තිය දුන් විප්ලවවාදී උද්වේගය දීර්ඝ කාලයක් නොපැවතීම ය. විප්ලව-වාදී උද්වේගයේ මෙම අස්ථාවරත්වයට හේතු වූ සමාජමය, නැතහොත්, පංතිමය සාධකය වූයේ නිර්ධන පංතියේ දුර්වල කමය. වැඩ කරන සහ සූරා කනු ලබන ජනතා බහුතරය (සරල ලෙස සහ පොදුජන වචනයෙන් කියතොත් දුප්පතුන්ගෙන් බහුතරය) තමන් පැත්තට දිනාගෙන සූරා-කන්නන් සියළු දෙනාමත්, එසේම, දිරාපත් වීමේ ගති ලක්ෂණ සියල්ලමත්, සම්පූර්ණයෙන්ම මර්දනය කර දැමීමට සෑහෙන තරම් දීර්ඝ කාලයක් බලය රැක ගත හැකි වන්නේ, නිර්ධන පංතියට (එහි සංඛ්‍යාව හා පංති විඥනය ප්‍රමාණවත් නම්, සහ එය විනය සම්පන්න නම්) පමණකි.

මාක්ස් ඉදිරිපත් කළ නිර්ධන පංති ආඥදායකත්වය යන කෙටි, තියුණු, සංක්ෂිප්ත හා පැහැදිලි යෙදුමෙන් ඔහු සාරාංශ කොට දැක්වූයේ සියළු

විප්ලවවලින් ලැබුණු මෙම අත් දැකීමය — ලෝක ඓතිහාසික වැදගත් කමකින් යුත් මෙම ආර්ථික සහ දේශපාලන පාඩමය. තවද, රුසියානු විප්ලවය මෙම ලෝක ඓතිහාසික වැදගත් කමකින් යුත් කර්තව්‍යය වෙත සමීප වූ ආකාරය නිවැරදි බව සෝවියට් සංවිධාන ආකෘතිය රුසියාවේ සියළුම ජනතාවන් හා ජාතීන් අතර ජයග්‍රාහී ලෙස ඉදිරියට යාමෙන් ඔප්පු වී තිබේ. එසේ කියන්නේ, සෝවියට් බලය අන් කිසිවක් නොව, නිර්ධන පංති ආඥදායකත්වයේ, එනම්, නව ප්‍රජාතන්ත්‍රවාදයක් දක්වා සහ කෝටි ගණන් වැඩ කරන සහ සූරා කනු ලැබූ ජනතාව ස්වාධීන ලෙස රාජ්‍ය පාලනයට සහභාගි වීම දක්වා ඉහළට නැගෙන දියුණු පංතියේ ආඥදායකත්-වයේ සංවිධාන ස්වරූපය වන හෙයිනි. විනය සම්පන්න සහ පංති විඥන-යෙන් යුත් පෙරමුණු බල ඇණිය තමන්ගේ ඉතාමත් විශ්වාසදායක නායකයා ලෙස සැලකීමට එම ජනතාව තමන්ගේම අත් දැකීමෙන් උගෙන ගනිති.

නමුත් ආඥදායකත්වය යන්න ලොකු වචනයකි. ලොකු වචන අපරීක්ෂාකාරී ලෙස එහා මෙහා නොවීසි කළ යුතුය. ආඥදායකත්වය යනු අයෝමය පාලනයකි.විප්ලවවාදී වශයෙන් එඩිතර, සූරාකන්නන් සහ දමරිකයන් මර්දනය කිරීමෙහිදී වේගවත් සහ නිර්දය ලෙස ක්‍රියා කරන ආණ්ඩුවකි. නමුත් අපගේ ආණ්ඩුව අතිශයින් මෘදුය. බොහෝ අවස්ථාවල එය යකඩවලට වඩා ජල්ලිවලට සාමානය. ධනපති සහ සුළු ධනපති කොටස් සෝවියට් ක්‍රමයට විරුද්ධව දෙ ආකාරයකින් සටන් කරන බව අපි මොහොතකට හෝ අමතක නොකළ යුත්තෙමු. එක් අතකින් සවින්-කොව්ලාගේ, ගොත්සේලාගේ, ගෙගෙච්කෝරිලාගේ සහ කර්නිලව්ලාගේ ක්‍රමවලින්, කුමන්ත්‍රණ හා කැරළි මගින් සහ ඔවුන්ගේ කැත "දෘෂ්ටිමය" පිළිබිඹුව වන, ව්‍යවස්ථානුකූල-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ, දක්ෂිණ සමාජවාදී-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සහ මෙන්ෂෙවික්වරුන්ගේ ප්‍රවෘත්ති පත්‍රවල පළ කෙරෙන බෙගල් සහ අපවාද මගින්, ඔවුහු පිටත සිට ක්‍රියා කරති. අනිත් අතට, අල්ලස් දීමත්, විනය රහිත භාවය, නොසැලකිලිමත් කම සහ අවුල් සහගත බව වැඩි කිරීමත් සඳහා දක්නට ලැබෙන සෑම දුර්වල කමක්ම සහ සෑම දිරාපත් වීමේ අංග ලක්ෂණයක්ම වාසියට හරවා ගැනීමෙන් ඔවුහු අභ්‍යන්තරයේ සිට ක්‍රියා කරති. ධනපති පංතිය යුද්ධමය වශයෙන් සම්පූ-ර්ණයෙන්ම යටකර දැමීමට අප වැඩි වැඩියෙන් සමීප වෙක්ම, සුළු ධනපති අරාජිකත්වය පිළිබඳ ගති ලක්ෂණය වඩ වඩාත් අන්තරාදායක වන්නේය. නමුත් මෙම ගති ලක්ෂණයට විරුද්ධව කරන සටන හුදෙක් ප්‍රචාරයෙන් සහ උද්ඝෝෂණයෙන් පමණක්, තරහය සංවිධානය කිරීමෙන් සහ සංවිධායකයන් තෝරා ගැනීමෙන් පමණක් සාර්ථක කළ හැක්කක් නොවේ. බල කිරීමේ මාර්ගයෙන්ද එම අරගලය කළ යුතුවේ.

ආණ්ඩුවේ මූලික කර්තව්‍යය වන්නේ, යුද්ධමය වශයෙන් මර්දනය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කිරීම නොව පරිපාලනය ය. එනිසා මර්දනය කිරීම සහ බල කිරීම නියම ලෙසට ප්‍රකට වනු ඇත්තේ ලත්තැනම වෙඩිතබා දැමීමෙන් නොව උසාවියේ නඩු ඇසීමෙනි. මේ හා සම්බන්ධයෙන් ද 1917 ඔක්තෝබර් 25 දිනෙන් පසුව විප්ලවවාදී ජනතාව නිවැරදි මග ගත්හ.ධනපති නිලධාරිවාදී අධිකරණය අවලංගු කිරීමේ ආඥාව සම්මත කිරීමටත් පෙර පවා, තමන්ගේම කම්කරු හා ගොවි උසාවි පිහිටුවා ගැනීමෙන් ඔවුහු විප්ලවයේ ජීව බලය පෙන්නුම් කළහ. නමුත් අපගේ විප්ලවවාදී මහජන උසාවි අතිශයින්ම සහ නොඇදහිය හැකි තරමට ම දුර්වලය. ජනතාව උසාවි කෙරෙහි දක්වූ ආකල්පය තවමත් ඉවත් වී නැතැයි යන හැඟීම අයෙකුට ඇති වේ. ඔවුන් ඒ කෙරෙහි දක්වන්නේ නිලධර හා අන්‍යතර දෙයක් සේ සලකන, එමෙන්ම ඉඩම් හිමි සහ ධනපති බන්ධනයන් අනුව උරුම කොට ගත් ආකල්පයකි. උසාවි යනු රාජ්‍ය පාලන කටයුතුවලට දුප්පතුන් සම්බන්ධ කර ගැනීමේ, ඔවුන් සියළු දෙනාම සම්බන්ධ කර ගැනීමේ ආයතනයක් ද (උසාවිවල කටයුතු රාජ්‍ය පාලනයේ කාර්යයන්ගෙන් එකකි), උසාවි යනු නිර්ධන පංතියේ සහ දුප්පත් ගොවීන්ගේ බලය සහිත ආයතනයක් ද, උසාවි යනු විනය හුරු පුරුදු කිරීමේ ආයතනයක් ද, වනබව හරි හැටි වටහා ගෙන නැත. වර්තමාන අවස්ථාවේ රුසියාවේ ප්‍රධාන අභාග්‍යය වන්නේ සාගින්න හා විරැකියාව නම්, පිම් මගින් එම අභාග්‍යයන් ජයගත නොහැකි යයිද, ඒවා ජයගත හැක්කේ, ජනතාවට පාන් සහ කර්මාන්තයට පාන් (ඉන්ධන) නිෂ්පාදනය වැඩි කිරීමට, ඒවා අවශ්‍ය ස්ථානවලට කල්වේලා ඇතිව ප්‍රවාහණය කිරීමට සහ ඒවා නිසිලෙස බෙද හැරීමට, අංග සම්පූර්ණ, සර්වග්‍රාහී දේශව්‍යාප්ත සංවිධානය හා විනය ඇති කිරීම මගින් පමණකැයි ද, යන සරල සහ පැහැදිලි සත්‍යය තවමත් සම්පූර්ණ වශයෙන් අගය කරනු නොලැබේ.ඒ අනුව බලන කළ සාගතයෙන් සහ විරැකියාවෙන් ඇතිවන දුක්වේදනා ගැන වග කිව යුත්තේ පැක්ටරියෙහිදි, ඕනෑම ව්‍යාපාරයක හා ඕනෑම කටයුත්තක දී ශ්‍රම විනය උල්ලංඝනය කරන ඒ අය බවත්, වැරදි කරුවන් සොයා ගැනීමට, ඔවුනට විරුද්ධව නඩු ඇසීමට සහ ඔවුනට නිර්දය ලෙස දඬුවම් දීමට අප දැනගත යුතු බවත්, සම්පූර්ණ වශයෙන් අගය කිරීමක් සිදු නොවේ. දැන් අපගේ ඉතාමත් අනවරථ අරගලය එල්ල විය යුත්තේ සුළුධනපති පංතික අරාජිකවාදයට විරුද්ධව වන අතර, එක් අතකින් සාගතය සහ විරැකියාවත්, අනික් අතින් සංවිධාන සහ විනය පිළිබඳ කරුණුවලදී දක්වනු ලබන පොදු නොසැලකිල්ලත් අතර පවතින ආර්ථික සහ දේශපාලන සම්බන්ධය වටහා ගැනීමට අසමත් වීමෙන් ද, සුළු දේපල හිමියාගේ දෘෂ්ටියෙහි, එනම්, මම මට හැකි තරමක් ගන්නෙමි, අනිත් එවුන් කුද ගහ ගත්තාවේ යන හැඟීමෙහි දුර්වාරණීයත්වයෙන් ද, එම අරාජිකත්වය පිළිබිඹුවේ.

ධනපති ක්‍රමය විසින් නිර්මාණය කරන ලද මහා පරිමාණ ආයතනයකට ආවේණික අර්ථික බැඳීම් සමහර විට වඩාත්ම පැහැදිලි ලෙස ඇතුලත් කොට ගත් දුම්රිය ප්‍රවාහණ සේවයෙහි, මෙම සුළු ධනපති නොසැලකිල්ල පිළිබඳ ගති ලක්ෂණය හා නිර්ධන පංති සංවිධානය අතර අරගලය විශේෂයෙන්ම ප්‍රකට ලෙස දක්නට ලැබේ "පරිපාලක" කොටස් අතර කඩා කප්පල්කාරයන් හා අල්ලස් ගන්නවුන් රැසක් ඇත. නිර්ධන පංති පිරිස් අතරින් හොඳම කොටස විනය සඳහා සටන් කරයි. නමුත්, වැනෙනසුලු හා "දුර්වල" චරිත ඇති අයද, එසේම ලාභ ගැරීමේ, අල්ලස් ගැනීමේ හා සාගතය සහ විරැකියාව ජයගැනීම පිණිස මුළු යන්ත්‍රයම නිසි ලෙස ක්‍රියාත්මක වීම අත්‍යාවශ්‍යව තිබියදී එය නරක් කිරීමෙන් පෞද්ගලික වාසි සලසා ගැනීමේ "ආශාව" මැඩ ගත නොහැකි අයද මෙම දෙකොටසෙහිම සිටින බව ඇත්තය.

දුම්රිය මාර්ග කළමණාකරණය සම්බන්ධයෙන් මැත දී නිකුත් කරන ලද ආඥාව[27] වටා, තනි විධායක නිලධාරීන්ට ආඥාදායක බලතල (නැතහොත් "අසීමිත" බලය) දෙන එම ආඥාව වටා, වර්ධනය වෙමින් පවතින්නේ ස්වභාව නිරූපී අරගලයකි. පුද්ගලයන්ට මෙසේ "අසීමිත" (එනම්, ආඥාදායක) බලතල පැවරීම තුළ සාමූහික ප්‍රතිපත්තියෙන්, ප්‍රජාතන්ත්‍රවාදයෙන් සහ සෝවියට් ආණ්ඩු ප්‍රතිපත්තියෙන් පිට පැනීමක් දැකීමට සුළු ධනපති නොසැලකිල්ලෙහි විඥාන (සමහරවිට බොහෝ දුරට අවිඥාන) නියෝජිතයෝ කැමති වෙති. තැනක හෝ දෙකක, වාම සමාජවාදී-විප්ලවවාදීන් අතර, ආඥාදායක ආඥාවට විරුද්ධව, ඒකාන්ත වශයෙන්ම දමරික ස්වභාවයේ වූ උද්ඝෝෂණයක්, එනම්, පහත් සහජාසයන් හා සුළු දේපල හිමියාගේ "තමන්ට හැකි පමණ ගැනීමේ" ආශාව අවුස්සන උද්ඝෝෂණයක් ඇති වී තිබේ. මෙය ඇත්ත වශයෙන්ම මහත් වැදගත්කමකින් යුත් ප්‍රශ්නයක් වී ඇත. ප්‍රථමයෙන්ම ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රශ්නය මතුවේ. අසීමිත බලතල සහිත පුද්ගලයන්, නැතහොත්, ආඥාදායකයන් පත් කිරීම සෝවියට් ආණ්ඩුවේ මූලික ප්‍රතිපත්තිවලට එකඟ වන්නේද? දෙවැනිව, මෙම පත්කිරීම් — ඔබ එසේ කීමට රිසියෙහි නම්, මෙම පූර්වාදර්ශය — සහ වර්තමාන යථාභූත තත්වය යටතේ ආණ්ඩුවට ඉටු කිරීමට සිදුවන විශේෂ කර්තව්‍යයන් අතර ඇති සම්බන්ධය කුමක්ද? අපි මෙම ප්‍රශ්න දෙකම ගැන තරයේ විමසා බැලිය යුත්තෙමු.

විප්ලවීය ව්‍යාපාරවල ඉතිහාසයේ බොහෝ අවස්ථාවල, විප්ලවවාදී පංතිවල ආඥාදායකත්වයේ පිළිබිඹුවත්, වාහනයත්, මාර්ගයත් වූයේ වෙන්ව ගත් පුද්ගල ආඥාදායකත්වය බව, ඉතිහාසයේ අත්දැකීම්වලින් ප්‍රතික්ෂේප කළ නොහැකි සේ ඔප්පුවී තිබේ. පුද්ගල ආඥාදායකත්වය ධනපති ප්‍රජාතන්ත්‍රය සමග ගැලපුනු බවට සැකයක් නැත. එසේ වුවත්, මෙම ප්‍රශ්නයේ දී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සෝවියට් ක්‍රමයේ ධනපති වැදගත්තු සහ ඔවුන්ගේ අනුචරයෝ නිතරම ඇස්බැන්දුම් දක්වති. එක් අතකින් සෝවියට් ක්‍රමය විකාරයක් හා අරාජිකවාදී අශිෂ්ට එකක් බව ප්‍රකාශ කරන ඔවුහු, සෝවියට් සභා වඩාත් උසස් ආකාරයේ ප්‍රජාතන්ත්‍රයක් හා ඊටත් වඩා සමාජවාදී ආකාරයේ ප්‍රජාතන්ත්‍රයේ ආරම්භයක් බව පැහැදිලි කරන අපගේ ඓතිහාසික නිදසුන් සහ න්‍යායික තර්ක සියල්ලම ප්‍රවේසම් සහිතව මග හරිති. අනිත් අතින් ඔවුහු අපගෙන් ධනපති ප්‍රජාතන්ත්‍රයට වැඩි ප්‍රජාතන්ත්‍රයක් ඉල්ලමින් මෙසේ කියති: පෞද්ගලික ආඥාදායකත්වය ඔබගේ බොල්ෂෙවික් (එනම් ධනපති නොව, එහෙත් සමාජවාදී) ප්‍රජාතන්ත්‍රවාදය සමග කොහෙත්ම නොගැලපෙන්නේය.

මේ තර්ක අතිශයින්ම දුර්වලය. අපි අරාජික වාදීන් නොවෙමු නම්, ධනපති ක්‍රමයේ සිට සමාජවාදී ක්‍රමයට පරිවර්තනය වීම සඳහා රාජ්‍යයේ අවශ්‍යතාවය, එනම්, බලකිරීම අවශ්‍ය වන බව අපි පිළිගත යුත්තෙමු. බලකිරීමේ ආකාරය තීරණය වන්නේ, අදාළ විප්ලවීය පංතියේ සංවර්ධන මට්ටමද, නිදසුනක් වශයෙන්, දීර්ඝ සහ ප්‍රතිගාමී යුද්ධයකින් ලත් උරුමයන් සහ ධනපති පංතිය සහ සුළු ධනපති පංතිය දක්වන ප්‍රතිරෝධයේ ආකාරයන් වැනි විශේෂ තත්වයන්ද අනුවය. එනිසා, සෝවියට් එනම්, සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රතිපත්තිය සහ පුද්ගලයන් විසින් ආඥාදායක බලතල ක්‍රියාත්මක කිරීම අතර කිසිම ප්‍රතිපත්තිමය ප්‍රතිවිරෝධතාවයක් නොමැත. නිර්ධන පංති ආඥාදායකත්වය සහ ධනපති ආඥාදායකත්වය අතර ඇති වෙනස මෙයයි. ඉන් පළමුවැන්න සූරාකන අල්පතරයට පහර දෙමින් සූරා කනු ලබන බහුතරයේ යහපත උදෙසා කටයුතු කරන අතර, එය වැඩ කරන සහ සූරා කනු ලබන ජනතාවන් මගින්-පුද්ගලයන් මගින්ද පමණක් නොව, ජනතාව ඉතිහාස නිර්මාණක ක්‍රියාකාරිත්වයට පුබුදුවාලන ආකාරයට ගොඩ නැගුනු සංවිධාන මගින් ද ක්‍රියාත්මක වීමය (සෝවියට් සංවිධාන මෙම වර්ගයේ සංවිධාන වේ).

වර්තමාන අවස්ථාවේ ඉටු කළ යුතු විශේෂ කර්තව්‍යයන් අනුව බලන කල, තනි පුද්ගල ආඥාදායක බලතලවල වැදගත්කම පිළිබඳ වූ දෙවැනි ප්‍රශ්නය ගැන කිව යුත්තේ, මහා පරිමාණ යන්ත්‍ර කර්මාන්තය — සමාජවාදයේ ද්‍රව්‍යමය මූලාශ්‍රය, නිෂ්පාදනීය ආරම්භය හා අඩිතාලම වන එය — සඳහා සියගණන්, දහස් ගණන් හා දස දහස් ගණන් ජනයාගේ ඒකාබද්ධ ශ්‍රම ව්‍යායාමයන් මෙහෙයවන අභිමතයෙහි, නිරපේක්ෂ සහ ඒකාන්ත ඒකීයත්වය අවශ්‍ය බවය. මෙහි තාක්ෂණික, ආර්ථික හා ඓතිහාසික අවශ්‍යතාවය පැහැදිලි දෙයකි. සමාජවාදය ගැන සිතා බැලූ සෑම කෙනෙක්ම මෙය සමාජවාදය සඳහා අවශ්‍ය කොන්දේසියක් බව කවදක් පිළිගත්තේය. නමුත් අභිමතයෙහි ඒකාන්න ඒකීයත්වය ඇති වීම සහතික කරන්නේ කෙසේ ද? එය කළ හැක්කේ, දහස් ගණන් අය ඔවුන්ගේ අභිමතයන් එක් අයෙකුගේ අභිමතයට යටත් කිරීමෙනි.

පොදු වැඩ කටයුතුවලට සහභාගිවන අයට උසස් මට්ටමේ පංති විඥනයක් සහ විනයක් ඇතොත් මෙම යටත් කිරීම වාදක කණ්ඩායමක සන්නායකගේ මෘදු නායකත්වය හා සමාන දෙයක් වනු ඇත. නමුත් උසස් විනයක් සහ පංති විඥනයක් නොමැති නම්, එය තියුණු ආකෘතියක ආඥාදායකත්වයක් වන්නේය. නමුත්, එය කෙසේ වුවත්, මහා පරිමාණ යන්ත්‍ර කර්මාන්තයේ රටාව අනුව සංවිධාන කළ ක්‍රියාදාමයක සාර්ථකත්වය සඳහා ප්‍රශ්න නොකරම එක අභිමතයකට යටත් වී ම ඒකාන්ත ලෙසම අවශ්‍ය වන්නේය. දුම්රිය සේවාවන් හි මෙය දෙතුන් ගුණයකින් අවශ්‍ය වන්නේය. වර්තමාන තත්වයේ සත්‍ය ස්වභාවය මුළුමනින්ම රඳා පවත්නේ එක දේශපාලන කර්තව්‍යයක සිට තවත් එකකට, එනම්, පළමු කර්තව්‍යයට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් සේ මතුපිටින් පෙනෙන කර්තව්‍යයකට මෙසේ පරිවර්තනය වීම කෙරෙහිය. බලකිරීම යටතේ ජනතා අවනතිය ලබාගත්, පැරණිතම, ඉතාමත් ශක්තිමත්, සහ බරපතලම බන්ධනයන් විප්ලවය විසින් විනාශ කර කලක් ගත වූයේ නොවේ. එය සිදු වූයේ ඊයේ දිනය. එසේ වුවත්, එම විප්ලවයේම සංවර්ධනය සහ තහවුරුතාවය උදෙසා, සමාජවාදයේම යහපත පිණිස, ජනතාව ප්‍රශ්න නොකරම ශ්‍රමයේ නායකයන්ගේ ඒකීය අභිමතයට යටත් වීම එම විප්ලවයම විසින් අපේක්ෂා කරනු ලැබේ. එවැනි පරිවර්තනයක් එක පියවරකින් ඉටු කළ නොහැකි බව ඇත්තකි. එය ඉටු කරගත හැක්කේ, දවැන්ත ගැස්සීම්, කම්පන, පැරණික්‍රම වෙතට ආපසු යාමේ අවස්ථා සහ ජනතාව නව මාර්ගයේ මෙහෙයවන නිර්ධන පංති පෙරමුණු බල ඇණිය දරන ඉමහත් ප්‍රයත්න යන මේවායේ ප්‍රතිඵලයක් වශයෙන් පමණකැයි යන්න පැහැදිලිය. ''නොවායා ෂිස්න්'', නැතහොත් ''වපිරියොද්'', ''දියල නරෝද'', එසේත් නැතහොත්, ''නාෂ් වියෙක්''[28] ස්වභාවයේ අමන සත්නි වැළඳෙන අය මේ ගැන කල්පනා කර බැලීමට තරම් ප්‍රමාද වන්නේ නැත.

වැඩකරන හා සූරා කනු ලබන පොදු ජනතාවගේ සාමාන්‍ය සහ සුපුරුදු නියෝජිතයාගේ මානසික ස්වරූපය ගෙන ඔහු සමාජයේ ගත කරන ජීවිතයේ වාස්තවික ද්‍රව්‍යමය තත්වයන් සමග සසඳා බලන්න. දේපල හිමි සහ සූරා කන පංතිය එම නියෝජිතයා වෙනුවෙන් කිසිවක් ඇත්තෙන්ම කැප කරන, නැතහොත්, ඔහුගේ යහපත පිණිස කිසිවක් අත්හැර දමන කිසිම අවස්ථාවක් ඔක්තෝබර් විප්ලවයට පෙර ඔහුට දක්නට ලැබී නැත. ඔවුන් ඔහුට දෙන බවට නැවත නැවතත් පොරොන්දු වූ ඉඩම් සහ නිදහස දෙන බවක්වත්, ''මහබලවත්'' උවමනාවන් හා මහබලවත් රහස් ගිවිසුම්වල අවශ්‍යතාවයන් කැපකරමින්, ප්‍රාග්ධනය හා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ලාභ කැප කරමින් ඔහුට සාමය දෙන බවක්වත් ඔහුට පෙනුනේ නැත. ඔහු මෙය දුටුවේ 1917 ඔක්තෝබර් 25 දිනට පසුව, තමන් ම එය බලයෙන් ගත් පසුව පමණකි. ඔහු එසේ ගත් දෙය බලය යොදා ආරක්ෂා කර ගැනීම පිණිස කෙරෙන්ස්කිලාට, ගොත්සේ ලාට, ගෙගෙච්කෝරිලාට, දූතවිලාට හා කර්නිලව්ලාට විරුද්ධව සටන් කිරීමට ඔහුට සිදුවිය. ස්වාභාවික වශයෙන්ම, කිසියම් කාලයක් ගත වනතෙක් ඔහුගේ අවධානය මුළුමනින්ම, ඔහුගේ සිතුවිලි සියල්ල, ඔහුගේ අධ්‍යාත්ම ශක්තිය සම්පූර්ණයෙන්ම යොමු වී තිබුණේ, හුස්ම කටක් ගැනීම, ඔහුගේ කොන්ද කෙළින් කර ගැනීම, උරහිස්වල කුදය දිගහැර ගැනීම සහ පෙරළා දමන ලද සූරාකන්නන් විසින් ඔහුව සැම කල්හිම ප්‍රතික්ෂේපකරන ලද, එහෙත් ගත හැකිව තිබුණු ජීවිත-යේ ආශිර්වාදයන් ලබා ගැනීම කෙරෙහිය. සාමාන්‍ය වැඩ කරන මිනිසාට යම් යම් දේ නිකම් ම "ගැනීම", උදුරා ගැනීම හා ඩැහැගැනීම නොකළ හැකි බවත්, එසේ කිරීමෙන් කඩා කප්පල් වීම, විනාශය හා කර්නිලව්ලා ආපසු එන මග සකස් වීම වැඩි වීමට හේතුවන බවත්, ඔහුටම පෙනී යාමට හා වැටහී යාමට පමණක් නොව හැඟී යාමට, යම් කාලයක් අවශ්‍ය බව සැබවි. සාමාන්‍ය වැඩ කරන මිනිසුන්ගේ ජීවන තත්වයන්හි (ඒ අනුව මානසික ස්වරූපයෙහි) ඊට අනුරූප වෙනස සිදුවීම ආරම්භ වුවා පමණකි. එනිසා අපගේ මුළු කර්තව්‍යය වන්නේ, සූරා කනු ලබන්නාවුන් විමුක්තිය සඳහා දරන ප්‍රයත්නයන්ගේ පංති විඥානය සහිත කපිකයා වන කොමියු-නිස්ට් පක්ෂයේ (බොල්ෂෙවික්) මුළු කර්තව්‍යය වන්නේ, මෙම වෙනස අගය කිරීමය; එය අවශ්‍ය බව වටහා ගැනීමය; ආයාසයෙන් ගැලවීමේ මගක් සොයන විඩාපත් ජනතාවගේ නායකත්වය ගනිමින් ඔවුන් නියම මාවත ඔස්සේ, විනයේ මාවත ඔස්සේ, සේවා කොන්දේසි ගැන පොදුජන රැස්වීම්වලදී තර්ක කිරීමේ සහ වැඩ කරන විට ප්‍රශ්න නොකරම සෝවියට් නායකයාට, ආඥාදායකයාට යටත් වීමේ කර්තව්‍යයන් ඒකාබද්ධ කිරීමේ මාවත ඔස්සේ ඔවුන් මෙහෙයවීමය.

අවුල්, වියවුල් සහ සුළු දේපල හිමියාගේ ආත්මාර්ථයේ ඉස්මතුවීම් පමණක් දකින ධනපතියෝ, මෙන්ෂෙවික් වරු හා "නොවායාෂිස්න්" ජනයා "රැස්වීම් තැබීමේ පිස්සුව" ගැන සමච්චල් කරති. තවත් බොහෝ විට වෛරයෙන් පිඹිති. නමුත් ප්‍රසිද්ධ රැස්වීම්වලදී සාකච්ඡා පැවැත්වීමක් නොවීනම්, පීඩිත ජනතාව, සූරාකන්නන් විසින් ඔවුන් මත බලෙන් පටවන ලද විනයේ සිට විඥත, ස්වේච්ඡා විනයක් දක්වා වෙනස්වීම කිසිකලෙකත් නොවන්නට තිබිණි. ප්‍රසිද්ධ රැස්වීම්වලදී ප්‍රශ්න මතුකිරීම වැඩ කරන ජනතාවගේ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයයි. එය ඔවුන්ගේ කොන්ද කෙළින් කරගන්නා ක්‍රමයයි. එය ඔවුන් නව ජීවනයකට පිබිදෙන ආකාරයයි. ඒ වූකලී, ඔවුන්ම සර්පයන් (සූරාකන්නන්, අධිරාජ්‍යවාදීන්, ඉඩම් හිමියන් හා ධනපතියන්) වඳ කොට ශුද්ධ කරගත් හා ඔවුන් කැමති ආකාරයටත්, අන්‍යතර නොවන, රදළවාදී නොවන, ධනපති නොවන, ඔවුන්ගේ ම සෝවියට් පාලනයේ ප්‍රතිපත්ති අනුවත්, ඔවුන් ම ඉදිකර ගැනීමට කැමති වන මාර්ගයේ ඔවුන් තබන ප්‍රථම පියවරයනුයි. ශ්‍රම විනයේ උසස් ආකෘති දක්වාද, නිර්ධන පංති ආඥාදායකත්වයක් අවශ්‍ය බව විඥත ලෙස අගය කිරීම දක්වාද, වැඩ කරන විට ප්‍රශ්න නොකරම සෝවියට් ආණ්ඩුවේ තනි පුද්ගල නියෝජිතයන්ගේ නියෝගවලට කීකරුවීම දක්වාද, කල්පවත්නා ආකාරයේ පරිවර්තනයක් සිදුවීම පිණිස සූරාකන්නන් පරදවා වැඩ කරන ජනතාව ජයග්‍රහණය ලැබූ ඔක්තෝබර් විප්ලවයට නියත වශයෙන් අවශ්‍ය විය. එසේම වැඩ කරන ජනතාවටම නව ජීවන තත්වයන් හා නව කර්තව්‍යයන් ගැන ප්‍රථමයෙන් සාකච්ඡා කිරීමට හැකිවන මුළු ඓතිහාසික කාල පරිච්ඡේදයක්ම ඒ සඳහා අවශ්‍ය විය.

මෙම පරිවර්තනය දැන් ආරම්භ වී තිබේ.

අපි විප්ලවයේ ප්‍රථම කර්තව්‍යය සාර්ථක ලෙස ඉටු කර ඇත්තෙමු. මෙම ජයග්‍රහණය සඳහා අවශ්‍ය වූ මූලික කොන්දේසිය වැඩ කරන ජනතාවම විසින් පරිණාම කරගන්නා ලද්දේ කෙසේද යන්න අපි දුටු-වෙමු. සූරාකන්නන් බලයෙන් පහකර දැමීම සඳහා ඔවුහු ඔවුන්ගේ ප්‍රයත්-නයන් එක්සත් කළහ. 1905 ඔක්තොබර්, 1917 පෙබරවාරි සහ ඔක්තෝ-බර්[29] වැනි අවධි ලෝක ඓතිහාසික වැදගත් කමක් සහිත වේ.

අපි විප්ලවයේ දෙවැනිකර්තව්‍යය සාර්ථක ලෙස ඉටු කර ඇත්තෙමු. සූරාකන්නන් විසින් පහළට තල්ලු කර දමන ලද්දවුද, සූරාකන්නන් බලයෙන් පහ කර දැමීමට සහ පවතින කරුණු ගැන සැලකිල්ලට ගනිමින් තමන් කැමති ආකාරයෙන් නව ජීවිතයක් සකස් කර ගැනීමට 1917 ඔක්තෝබර් 25 දිනෙන් පසුව පමණක් නිදහස ලද්දවුද සමාජයේ ඒ "පහළ පිරිස්ම" අවදි කර නගා සිටුවා ඇත්තෙමු. ඉතාමත් පිඩිත සහ පෑගුනු ජනයා විසින්, උගත් කමින් අඩුම වැඩ කරන පොදු ජනතාව විසින් ප්‍රසිද්ධ රැස්වීම්වලදී ප්‍රශ්න මතු කරනු ලැබීම, ඔවුන් බොල්ෂෙවික්වරුන්ගේ පැත්ත ගැනීම, ඔවුන් ඔවුන්ගේම සෝවියට් සභා සැම තන්හිම පිහිටුවීම — මේ විප්ලවයේ දෙවැනි මහා අවධිය විය.

තුන්වැනි අවධිය දැන් ආරම්භ වෙමින් පවතී. අපම දිනාගත් දැ, අපම ආඥා පැන වූ, නීතිගත කළ, සාකච්ඡා, කළ හා සැලසුම් කළ දෑ තහවුරු කළ යුත්තෙමු. මේ සියල්ලම දෛනික ශ්‍රම විනය පිළිබඳ ස්ථාවර ආකෘති ආකාරයෙන් තහවුරු කළ යුත්තෙමු. මෙය ඉතාමත් දුෂ්කර කර්තව්‍යයකි. එහෙත් අපට සමාජවාදී ක්‍රමය ලැබෙනු ඇත්තේ මෙය ඉටු කිරීමෙන් පසුව වන නිසා, මෙය ඉතාමත් ප්‍රසාද ජනකා කර්තව්‍යය. වසන්තයේ ගලන ගං වතුරක් මෙන් කැළඹිලි සහිත, පෙරට ඇදෙන හා දෙගොඩ

https://liberationbase.wordpress.com

තලා යන "ප්‍රසිද්ධ රැස්වීම්" ප්‍රජාතන්ත්‍රවාදය හා සමග වැඩ පලෙහි අයෝමය විනයක්, වැඩ කරන විට එක් තනි පුද්ගලයෙකුගේ, සෝවියට් නායකයාගේ අභිමතයට ප්‍රශ්න කිරීමෙන් තොරව කීකරුවීමක්, ඒකාබද්ධ කිරීමට අපි උගත යුත්තෙමු.

අපි තවමත් මෙය කිරීමට උගෙන ගෙන නැත්තෙමු.

අපි එය උගෙන ගන්නෙමු.

කර්නිලව්ලාගෙන්, ගොත්සේලාගෙන්, දුතොව්ලාගෙන්, ගෙගෙච්කෝරිලාගෙන් සහ බගායෙව්ස්කිලාගෙන් සංකේතාත්මක වුනු ධනපති සූරා කෑම යළි ස්ථාපිත වීමේ තර්ජනය ඊයේ අප වෙත එල්ල වූයේය. අපි ඔවුන් පරදවා ජයගත්තෙමු. ඒ ප්‍රතිෂ්ඨාපනය, එම ප්‍රතිෂ්ඨාපනයම අද අපට වෙනත් ආකාරයකින් තර්ජනය කරන්නේය. සුළු ධනපති මත්බව හා අරාජිකත්වය, එසේ නැතහොත් සුළු දේපොල හිමියන්ගේ "එය මගේ කාර්යය නොවේය" යන ගතිලක්ෂණය පිළිබඳ මනෝභාවය විසින් නිර්ධන පංති විනයට විරුද්ධව දින පතාම දෙනු ලබන, සුළු, එහෙත් අප්‍රමාණ ප්‍රහාරයන්ගේ ස්වභාවයෙන්, එය අපට තර්ජනය කරන්නේය. අපි සුළු ධනපති පංතික අරාජිකවාදයේ ගති ලක්ෂණ පරාජය කළ යුත්තෙමු. අපි එය පරාජය කරන්නෙමු.

සෝවියට් සංවිධානය සංවර්ධනය කිරීම

සෝවියට්, එනම්, නිර්ධන පංතික ප්‍රජාතන්ත්‍රවාදය අද ප්‍රත්‍යක්ෂ ලෙස ක්‍රියාත්මක කෙරෙන ආකාරයෙන් ගත් කළ, පහත සඳහන් කරුණුවලින් එහි සමාජවාදී ස්වභාවය පිළිබිඹු වන්නේය. ප්‍රථමයෙන්ම, ඡන්දදායකයන් වන්නේ වැඩ කරන සහ සූරාකනු ලබන ජනයාය. ධනපතියන් බැහැර කර ඇත. දෙවැනිව, මැතිවරණ සම්බන්ධයෙන් පැවති නිලධාරිවාදී උපචාර හා සීමාවන් අවලංගු කර තිබේ. මැතිවරණ පවත්වන පිළිවෙළ හා අවස්ථාව ජනතාව විසින්ම තීරණය කරනු ලැබෙන අතර තෝරාපත් කරගත් අය ඉවත් කිරීමේ සම්පූර්ණ නිදහස් අයිතිය ඔවුන්ට ඇත. තුන්වැනිව, වැඩකරන ජනතාවගේ පෙරමුණු බල ඇණියෙහි, එනම්, මහා පරිමාණ කර්මාන්තයේ නියුතු නිර්ධන පංතියේ ඉතාමත්ම හොඳ පොදුජන සංවිධානය නිර්මාණය කර තිබේ. එනිසා සූරා කනු ලබන විශාල පොදු ජනකායට නායකත්වය දෙමින්, ඔවුන් ස්වාධීන දේශපාලන ජීවිතයක් කරා ගෙන ඒමටත්, ඔවුන්ගේ අත් දැකීමෙන්ම ඔවුන්ට දේශපාලන අධ්‍යාපනයක් ලබා දීමටත්, එම පෙරමුණු බල ඇණියට හැකි වී තිබේ. එනිසා පරිපාලනය කිරීමේ කලාව උගෙන ගැනීමත්, පරිපාලන කටයුතු ඇරඹීමත් සඳහා ප්‍රථම වතාවට මුළු මහත් ජනතාවම විසින් මුල පිරීමක් කර තිබේ.

දැන් රුසියාවේ ක්‍රියාත්මක කෙරෙන ප්‍රජාතන්ත්‍රවාදයේ විශේෂත්වය දක්වන අංගලක්ෂණ මේවාය. එය උසස් වර්ගයක ප්‍රජාතන්ත්‍රවාදයකි. එය ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ධනපති විකෘතියෙන් වෙන්වී සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදය හා රාජ්‍යය හැකිළීයාමට ඉඩ සැලසෙන තත්වයන් ද දක්වා පරිවර්තනය වීමකි.

සුළු ධනපති අසංවිධානයේ ගති ලක්ෂණය, සෝවියට් සභා මතද එහි මුද්‍රාව තබනු ඇති බවට සැකයක් නැත (සෑම නිර්ධන පංති විප්ලවයකදීම එය එක්තරා දුරකට අනිවාරණීය වශයෙන්ම දක්නට ලැබෙනු ඇත. රටේ සුළු ධනපති ස්වභාවය, එහි නොදියුණුකම සහ ප්‍රතිගාමී යුද්ධයේ ප්‍රතිඵල නිසා මෙහි එය විශේෂයෙන්ම දක්නට ලැබේ).

සෝවියට් සභාවල හා සෝවියට් ආණ්ඩුවේ සංවිධානය සංවර්ධනය කිරීමට අපි වෙහෙස නොබලා වැඩ කළ යුත්තෙමු. සෝවියට් සභා සාමාජිකයන් "පාර්ලිමේන්තු විවාදකයන්" හෝ නිලධාරීන් හෝ බවට පරිවර්තනය කිරීමේ සුළුධනපති ප්‍රවණතාවයක් ඇත. පරිපාලනයේ ප්‍රායෝගික වැඩ කටයුතුවලට සෝවියට් සභා සාමාජිකයන් සියළු දෙනාම අද්ද ගැනීමෙන් අපි මෙයට විරුද්ධව සටන් කළ යුත්තෙමු. බොහෝ තැන්වල සෝවියට් සභාවල දෙපාර්තුමේන්තු, ක්‍රමයෙන් කොමිසාර් අංශ සමග ඒකාබද්ධ වන්නේය. මුළු දුප්පත් ජනතාවම පරිපාලනය කිරීමේ ප්‍රායෝගික කටයුතුවලට අද්ද ගැනීමේ අරමුණ ඇතිව අපි කටයුතු කරන්නෙමු. ඒ අනුව, ඒ යොමුව ඇතිව ගන්නා සියළු පියවරයන් සුපරීක්ෂාකාරී ලෙස වාර්තාගත කර, අධ්‍යයනය කර, අනුසන්ධානය කර, වඩාත් පුළුල් ව්‍යවහාරයෙන් අත්හද බලා නීතිගත කළ යුතුය. එසේ ගන්නා පියවරයන් වැඩි වූ තරමට හොඳය. වෙහෙස වී වැඩ කරන සෑම කෙනෙක්ම, ඔහුගේ පැය අටක නිෂ්පාදනීය ශ්‍රම "කර්තව්‍යය" නිම කළ පසු, ඔහු ගෙවීමක් නොලබා රාජ්‍ය කාර්යයන් කරනු දැකීම අපගේ අරමුණය. ඒ දක්වා පරිවර්තනය වීම විශේෂයෙන්ම දුෂ්කරය. නමුත් සමාජවාදය සම්පූර්ණයෙන්ම තහවුරු වන බව සහතික කළ හැක්කේ මෙම පරිවර්තනය තුළින් පමණකි. වෙනසෙහි නවතාවය සහ දුෂ්කරතාවය නිසා ස්වභාවික වශයෙන්ම අඳුරේ අතගාන කලෙක මෙන් පියවර රැසක් ගැනීමට සිදුවන අතර එනිසා නිතර වැරදීම් සිදුවේ. අස්ථිර ගති ඇතිවේ. මේවා නොමැතිව, සැලකිය යුතු ප්‍රගතියක් දැකීමට කිසිම ඉඩක් නැත. තමන් සමාජවාදීන් ලෙසට හඳුන්වනු ලැබීමට කැමති අය බොහෝ දෙනෙකුට වර්තමාන තත්වය අමුත්තක් ලෙසට පෙනෙන්නේ, ඔවුන් ධනපති ක්‍රමය සහ සමාජවාදය වියුක්ත ලෙස සංසන්දනය කිරීමට පුරුදුව සිටි හෙයින් හා මහත් ගාම්භීරතා පූර්වකව ඔවුන් ඒ දෙක අතරට "පිම්ම" යන වචනය යෙදූ නිසාද වේ. (ඉන් සමහර දෙනෙක් තමන් එංගල්ස්ගේ කෘතිවලින් කියවූ කොටස්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සිහි කරමින් තව තවත් ගාම්භීර ලෙස "අවශ්‍යතාවයේ රජදහනේ සිට නිදහසේ රජදහන දක්වා වූ පිම්ම[30] යන වාක්‍ය කොටස එකතු කරති). "පිම්ම" යනුවෙන් සමාජවාදයේ ගුරුවරුන් අදහස් කළේ ලෝක ඉතිහාස පරිමාණයේ සන්ධිස්ථාන ගැන බවද, මෙම වර්ගයේ පිම් දශක ගණන් හා සමහර විට ඊට වඩා දීර්ඝ කාලයක් වසා පැතිරෙන බවද, සමාජවාදය ගැන "පොත්වලින්" කිය වූ එහෙත් ඊට අදාළ කරුණු ගැන කිසිකලෙකත් භාරදූර ලෙස සිතා නොබැලූ, මෙම ඊනියා සමාජවාදීන් අතුරෙන් බහුතරයට සලකා ගත නොහැකි වේ. එවැනි කාලවලදී ස්වාභාවික වශයෙන්ම, මළවුන් වෙනුවෙන් හැඬීමට අපකීර්තිමත් "බුද්ධිමතුන්" විසින් සපයනු ලබන පිරිස අති විශාලය. සමහරු ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලය[31] ගැන හඬති. සමහරු ධනපති විනය ගැන හඬති. වෙනත් අය ධනපති ක්‍රමය ගැන හඬති. තවත් සමහරු සත්ගුණවත් ඉඩම් හිමියා ගැන හඬති. තවත් වෙන අය අධිරාජ්‍යවාදී මහ බලවත් ප්‍රතිපත්තිය ගැන හඬති. මේ ආදී වශයෙනි.

මහා පිම් සහිත අවධියේ නියම අවශ්‍යතාවයන් ඉටු කිරීමට නම්, අළුත් ක්‍රමයෙහි බීජාංකුරවලට වඩා (ඒවා අප්‍රමාදව හඳුනාගත හැක්කේ සැම විටම නොවේ) සීඝ්‍ර ලෙස එකතුවන පැරණිහි කැට කැබලි බහුලතාවය මධ්‍යයේම, සංවර්ධන මාර්ගයෙහි, නැතහොත්, දමයෙහි ඉතාමත් වැදගත් දේ කුමක්ද යන්න තෝරා බේරා ගැනීමේ හැකියාව අවශ්‍ය වේ. හැකිතරම් විශාල කැට කැබලි ගොඩක් එකතු කිරීම, එනම්, පැරණි ආයතන හැකි තරම් විශාල සංඛ්‍යාවක් පුපුරවා හැරීම විප්ලවයේ සාර්ථකත්වය සඳහා ඉතාමත් වැදගත් කටයුත්ත වූ අවස්ථා ගැන ඉතිහාසය දනී. පුපුරුවා හැරිය තරම ප්‍රමාණවත් වන සහ ඊළඟට කැට කැබලි ඉවත් කිරීමේ "හැඩ නැති" (සුළු ධනපති විප්ලවවාදියාට "අප්‍රසන්න") කර්තව්‍යය ඉටු කළයුතු අවස්ථාද මතු වන්නේය. විනාශයේ වටපිටාවක් මධ්‍යයේ, තවමත් ගල් මුල් ඉවත් නොකළ බිමක වැඩෙන නව ක්‍රමයේ බීජාංකුරවලට ප්‍රවේසම් සහිතව සාත්තුකිරීම ඉතාමත් වැදගත් කර්තව්‍යය වන අවස්ථාවන්ද උද්ගත වේ.

විප්ලවවාදියෙකු වීම සහ සාමාන්‍යයෙන් සමාජවාදයට හෝ කොමියුනිස්ට්වාදයට පක්ෂ වීම ප්‍රමාණවත් නොවේ. මුළු දම්වැලම අල්ලා ගැනීම සඳහා සහ ඊළඟ පුරුක වෙත සංක්‍රමණය වීමට දැඩිසේ සූදානම් වීම සඳහා, එක් එක් විශේෂ අවස්ථාවෙහිදී ඔබ ඔබගේ මුළු වැර යොදා අල්ලා ගත යුත්තේ දම්වැලෙහි කුමණ පුරුකද යන්න සොයා ගැනීමට ඔබට පුළුවන් විය යුතු ය. ඓතිහාසික සිදුවීම් පිළිබඳ දම්වැලෙහි පුරුක් එකතු කොට තිබෙන අනු පිළිවෙළත්, ඒවායේ ආකෘතිත්, ඒවා එකට අමුණා තිබෙන ආකාරයත්, ඒවා එකක් අනිකෙන් වෙනස්වන ආකාරයත් සරල

නොවේ — කම්මල් කුරුවෙකු විසින් තනනු ලබන සාමාන්‍ය දම්වැලක මෙන් අර්ථ විරහිත නොවේ.

සෝවියට් සභා සහ "ජනතාව", එනම් වැඩකරන සහ සූරාකනු ලබන ජනතාව අතර සම්බන්ධයේ බලවත් කමත්, මෙම සම්බන්ධයේ සුනම්‍යතාවය හා ප්‍රත්‍යාස්ථතාවයත්, අනුව බලන කළ සෝවියට් සංවිධාන ආකෘතිය නිලධාරිවාදී ලෙසින් විකෘති කිරීමට විරුද්ධව සටන සිදුවන බව ඒකාන්තය. ලෝකයේ ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවල පවා ධනපති පාර්ලිමේන්තුව "තමන්ගේ" ආයතනයක් ලෙසට දුප්පතුන් විසින් කිසිකලෙකත් නොසලකන ලදී. නමුත් කම්කරු සහ ගොවි පොදු ජනතාවට සෝවියට් සභා "තමන්ගේ" ආයතන වෙති — අන්‍යයන්ගේ ආයතන නොවෙති. අවුරුදු හැටකට පෙර තුර්ගේනෙව්, දබ්‍රලුබව්ගේ සහ චෙර්නිෂෙව්ස්කිගේ ගොවි ජන ප්‍රජාතන්ත්‍රවාදයෙන් විකර්ෂණය වී මධ්‍යස්ථ රාජාණ්ඩුවාදී හා වංශාධිපති ව්‍යවස්ථාවාදය වෙතට ඇදී ගිය පරිද්දෙන්ම, ෂෙයිඩමාන් වර්ගයේ හෝ එවැනිම වූ මාර්තව් වර්ගයේ නවීන "සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීහු", සෝවියට් සභාවලින් විකර්ෂණය වෙමින්, නම්බුකාර ධනපති පාර්ලිමේන්තු වෙතට ඇදී යති.

පත් කළ අය ඉවත් කිරීමේ විශේෂ ආකෘති සහ පහළ සිට කෙරෙන පාලනයේ අනිකුත් මාර්ග නිර්මාණය වන්නේ, සෝවියට් සභා "ජනතාවට", එනම්, වැඩ කරන ජනතාවට සමීපව තිබීමේ හේතුවෙනි. ඒවා ඉතාමත් උත්සුක්ත ලෙස සංවර්ධනය කළයුතු වේ. නිදසුනක් වශයෙන්, මහජන අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු සෝවියට් අධිකාරීන්ගේ කටයුතු ගැන සාකච්ඡා කිරීමට හා ඒවා පාලනය කිරීමට කලින් කලට කැඳවන සෝවියට් ඡන්ද දායකයන්ගේ සහ ඔවුන්ගේ නියෝජිතයන්ගේ සාකච්ඡා සභා වැනි මහජන අධ්‍යාපන ආයතනවලට සම්පූර්ණ අනුබලය හා ආධාරය දීම සුදුසුය. සෝවියට් සභා ඝන වූ ස්වයං පූර්ණ තත්වයට පත් කිරීමට වඩා තවත් මෝඩ කමක් නොවනු ඇත. නිර්දය වූ දැඩි පාලනයකටත්, වැඩ පිළිබඳ නිශ්චිත ක්‍රියාදමයන්හිදී, තනිකරම විධායක කාර්යයන්ගේ නිශ්චිත අංශවලදී, තනි පුද්ගල ආඥාදායකත්වයටත්, වඩාත් දැඩිලෙස පක්ෂ වීමට අපට සිදුවූ තරමට, සෝවියට් ආණ්ඩුවේ ප්‍රතිපත්ති විකෘති කිරීමේ හැකියාවක සේයාවකුදු මතුවිය නොදී වැළැක්වීම පිණිස ද, නැවත නැවතත් හා වෙහෙස නොබලා නිලධාරිවාදය උදුරා දමනු පිණිසද, පහළින් ක්‍රියාත්මක කෙරෙන පාලනයේ ආකෘති හා ක්‍රම වඩාත් විවිධාකාර විය යුතුය.

අවසානය

ජාත්‍යන්තර කටයුතු සම්බන්ධයෙන් අතිශයින් ම දුෂ්කර, සංකීර්ණ සහ අන්තරාදායක තත්වයක් පවතී. උපක්‍රම යොදමින් මග හැරීමටත්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පසුබැසීමටත් සිදුවී තිබේ. මෙය, බටහිර රටවල වේදනාකාරී තරම් අධිවේගයකින් මෝරා එන විප්ලවයේ නව අරගල ඇතිවීමේ බලාපොරොත්තුවෙන් සිටීමේ කාල පරිච්ඡේදයකි. රට තුළ පවත්නේ හෙමින් ගොඩනැගීමේ සහ නිර්දය ලෙස "තද කිරීමේ", නැතහොත්, සුළු ධනපති මත් බව හා අරාජික භාවය පිළිබඳ මූලිකාංගයට විරුද්ධව දැඩි, නිර්ධන පංති විනයෙන් කෙරෙන දීර්ඝ සහ අනවරථ අරගලයේ කාලයකි. සමාජවාදී විප්ලවයේ අප ජීවත්වන විශේෂ අවධියේ ස්වභාවය මෙබඳුයයි පැහැදිලි කරන අංග ලක්ෂණ, සංක්ෂිප්ත වශයෙන් එසේය. විශේෂ දීප්තියක්, එනම්, ජාත්‍යන්තර නිර්ධන පංති විප්ලවයේ ජයග්‍රහණයන්ගේ දීප්තිය විසින් අප ඊළඟ පුරුක වෙත අදනා ලැබෙන අතර, එම පුරුක වෙත යාමට පෙර, අප හමුවේ මතුවී ඇති කර්තව්‍යයන් සපුරාලීමට සමත් වනු පිණිස අපගේ මුළු වැර යොදා අල්ලා ගත යුතු ඉතිහාසයීය සිදුවීම් පිළිබඳ දම්වැලේ පුරුක මෙයයි.

සාමාන්‍ය දිනපතා "විප්ලවවාදී" සංකල්පයත්, වර්තමාන අවධියේ විශේෂ තත්වය අනුව, එනම්, උපක්‍රමීය ලෙසට මගහැරීම, පසුබැසීම, නැවතී සිටීම, හෙමින් ගොඩ නැගීම, නිර්දය ලෙස තදකිරීම, දැඩි ලෙස විනය සම්පන්න කිරීම, මත්බව සුන් කිරීම, ආදිය අනුව යන සටන් පාඨත් සැසඳීමට උත්සාහ ගන්න. සමහර "විප්ලවවාදීන්ට" මෙය ඇසෙන විට ඔවුහු මහත් සේ කෝපයට පත්ව, ඔක්තෝබර් විප්ලවයේ සම්ප්‍රදයයන් අමතක කිරීම ගැන, ධනපතියන් සමග සම්මුතිගත වීම ගැන, සුළු ධනපතියන්, ප්‍රතිසංස්කරණවාදීන් යනාදීන් වීම ගැන අපට "ගුගුරමින්" බැන වදිති.

මෙම අසරණ විප්ලවවාදීන්ගේ, ඔවුනතුරෙන් ලෝකයේ හොඳම අපේක්ෂාවන් අනුව යන සහ සමාජවාදයේ සත් ව්‍යාපාරයට සම්පූර්ණයෙන්ම පක්ෂපාත අයගේ පවා අවාසනාව වන්නේ, ප්‍රතිගාමී සහ මහා විනාශකාරී යුද්ධයකින් දරුණු ලෙස කැපුම් කෙටුම් ලැබුවා වුද, වඩාත් දියුණු රටවලට වඩා බොහෝ කලින් සමාජවාදී විප්ලවය ආරම්භ කළාවූද, නොදියුණු රටකට අනිවාරණීය වශයෙන් ම පසුකිරීමට සිදුවන විශේෂ සහ "අප්‍රසන්න" ලෙස විශේෂ වූ තත්වය වටහා ගැනීමට ඔවුන්ගේ ඇති අසමත් කමය. දුෂ්කර පරිවර්තනයක දුෂ්කර අවස්ථාවලදී ඉවසා සිටීමේ ශක්තිය ඔවුනට නැත්තේය. ස්වාභාවික වශයෙන්ම, අප පක්ෂයට එරෙහි මෙම වර්ගයේ "නිල" විරුද්ධ පාර්ශවයක් ලෙසට කටයුතු කරන්නේ "වාම සමාජවාදී-විප්ලවවාදීන්" ය. කණ්ඩායම් සහ පංතිමය වර්ගයේ කොටස්වලට අමතරව තනි පුද්ගල විශේෂත්වයන් නිතරම පවතින සහ පවතිනු ඇති බව සැබවි. නමුත් සමාජමය වර්ග කල් පවතින්නේය. සුළු දේපල හිමි ජනගහනය සංඛ්‍යාවෙන්, පිරිසිදු නිර්ධන පංතික ජනගහනයට වඩා බෙහෙවින් අධික රටක, නිර්ධන පංතික විප්ලවවාදියා සහ සුළු ධනපති පංතික විප්ලවවාදියා අතර වෙනස නොවැළැක් විය හැකි ලෙසට මතුවනු ඇත. කුලින් කලට එය ඉතා තියුණු ලෙස දනෙනු ඇත. සිදුවීම්වල වෙනසක් ඇතිවන සෑම අවසථාවකදීම සුළු ධනපති විප්ලවවාදියා, දෙගිඩියාවට පත්වෙයි, එහා මෙහා වැනෙයි. 1917 මාර්තුවේදී ඔහු උග්‍ර විප්ලවවාදියෙකි. එම මැයි මාසයේදී ඔහු "සහාගය" වර්ණනා කරයි. ජූලි මාසයේ දී ඔහු බොල්ෂෙවික් වරුන්ට වෛර කරයි. (නැතහොත් ඔවුන්ගේ "අතිධාවනකාරිත්වය" ගැන වැලපෙයි). ඔක්තෝබර් මාසයේදී සැක ඇති කර ගනිමින් ඔවුන් කෙරෙන් ඉවතට හැරෙයි. දෙසැම්බරයේදී ඔවුන්ට ආධාර කරයි. අවසාන වශයෙන් 1918 මාර්තු සහ අප්‍රියෙල් මාසවලදී මෙම වර්ගයේ අය බොහෝ විට උද්ධච්ච බැල්මකින් යුතුව මෙසේ කියති: "මම, 'සංයුක්ත' වැඩ ගැන, ප්‍රායෝගිකභාවය හා ක්‍රමානුකූලවාදය ගැන ස්තෝත්‍ර ගයන්නන්ගෙන් කෙනෙක් නොවෙමි".

එවැනි වර්ගවල අයගේ ප්‍රභව මූලය වූයේ යුද්ධයේ මහා භයෙන්, උන්හිටි ගමන් ආ විනාශයෙන්, සාගතයේ සහ ව්‍යසනයේ අභූත පූර්ව දුක් කරදරවලින් වියරු වැටුනා වූද, විසඳීමේ මගක්, ගැලවීමක් සොයමින්, මායා රෝගයෙන් මෙන් ඒ මේ අත දුවමින්, නිර්ධන පංතිය කෙරෙහි විශ්වාසය තබන හා ඊළඟ මොහොතේ බලාපොරොත්තු සුන් වීමේ සන්නියට ගොදුරු වූද, සුළු දේපල හිමියා ය. එවැනි සමාජ පදනමක් මත අපට සමාජවාදය ගොඩනැගිය නොහැකි බව අපි අවබෝධ කර ගත යුත්තෙමු, තරයේ සිහි තබා ගත යුත්තෙමු. වැඩ කරන හා සූරා කනු ලබන ජනතාවට නායකත්වය දීමෙහි සමත් එකම පංතිය නම්, ඉතාමත් දුෂ්කර, දුර්ගම සහ අන්තරාදායක අවධිවලදී පවා අධෛර්යයට පත්නොවී, බලාපොරොත්තු සුන් වූ හැඟීමට යට නොවී, අචල ලෙස ස්වකීය මාවතෙහි ඉදිරියට යන පංතිය ය. මායා රෝග ස්වභාවයේ ආවේගයන්ගෙන් අපට ඇති වැඩක් නැත. අපට අවශ්‍ය වන්නේ නිර්ධන පංතියේ අයෝමය බල ඇණිවල අනවරථ ඉදිරි ගමනයි.

1917 අප්‍රෙල් 13 හා 26 අතර
ලියන ලදී

1918 අප්‍රියෙල් 28 දින "ප්‍රාව්දා",
අංක 83 හි සහ "ඉස්වෙස්තියා
වට්සික්", අංක 85 අතිරේකයෙහි
පළ කරන ලදී

සම්පූර්ණ කෘති, 5 වැනි
මුද්‍රණය, වෙළුම 36,
පිටු 165–208

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විද්‍යා සහ තාක්ෂණික වැඩ සඳහා කෙටුම්පත් සැලැස්ම[32]

විද්‍යා ඇකඩමිය රුසියාවේ ස්වාභාවික නිෂ්පාදනීය බලවේගයන් පිළිබඳ ක්‍රමානුකූල අධ්‍යයනයක් සහ විමර්ශනයක් ආරම්භ කර තිබේ.* රුසියාවේ කර්මාන්ත සහ ආර්ථික ප්‍රගතිය ප්‍රතිසංවිධානය කිරීම සඳහා හැකිතරම් ඉක්මණින් සැලැස්මක් සකස් කිරීම පිණිස විශේෂඥයන් ගෙන් සමන්විත කොමිසම් කීපයක් පිහිටුවන ලෙස ප්‍රධාන ආර්ථික මණ්ඩලය වහාම එයට නියම කළ යුතුය.

සැලැස්මෙහි පහත සඳහන් දෑ ඇතුලත් විය යුතුය:

අමුද්‍රව්‍ය සමීපස්ථව තිබීම සහ අමුද්‍රව්‍ය පිරියත් කිරීමේ පටන්, ඉන් ඉක්බිතිව එන නිමිභාණ්ඩ නිෂ්පාදනය ඇතුලත්ව, ඒ දක්වා වන අර්ධ නිමි භාණ්ඩ පිරියත් කිරීමේ අවධි සියල්ලම ගෙවීමෙහිදී අවම ශ්‍රම පරිභෝජනය පිළිබඳ ස්ථාවරය අනුව තර්කානුකූල ලෙස රුසියාවේ කර්මාන්ත බෙදා හැරීම;

ඉතාමත් අංග සම්පූර්ණ මහා පරිමාණ කර්මාන්තය, විශේෂයෙන්ම, සංගත ව්‍යාපාර පිළිබඳ ස්ථාවරයෙහි පිහිටා කර්මාන්තය විශාල ව්‍යවසායයන් කීපයක් තුළ සංයෝජනය හා සංකේන්ද්‍රණය කිරීම;

වර්තමාන රුසියානු සෝවියට් සමූහාණ්ඩුවට (උක්‍රේනියාව හා ජර්මානුන් අත්පත් කරගත් කොටස් හැර) අවශ්‍ය වන අමුද්‍රව්‍ය වර්ග සියල්ලම හැකි තරම් දුරට ස්වාධීන ලෙස ලබා ගැනීමට හා ප්‍රධාන කර්මාන්ත අංශ ප්‍රතිසංවිධානය කර ගැනීමට එයට හැකියාව ලබා දීම;

කර්මාන්තය සහ ප්‍රවාහණය විද්‍යුතනය කිරීම හා ගොවිතැන සඳහා විදුලි බලය යොදා ගැනීමත්, බාල ඉන්ධන වර්ග (ජර්ණක සහ බාල වර්ගයේ ගල් අඟුරු විදුලි බලය නිෂ්පාදනය සඳහා යොදා ගැනීමත්, ඒවා නිෂ්කර්ෂණය හා ප්‍රවාහණය සඳහා වියදම හැකි තරම් අඩු කිරීමත් ගැන විශේෂ අවධානයක් යොමු කිරීම;

සාමාන්‍ය වශයෙන් ජල බලය හා සුලං බලෙන් ක්‍රියා කරන මෝටර් යන්ත්‍ර උපයෝගි කර ගැනීම සහ ඒවා ගොවිතැන සඳහා යොදා ගැනීම.

1918 අප්‍රේල් 18 සහ 25 අතර
ලියන ලදී

1924 මාර්තු 4 දින "ප්‍රාව්දා",
අංක 52 ප්‍රථමයෙන් පළ කරන ලදී

සම්පූර්ණ කෘති, 5 වැනි
මුද්‍රණය, වෙළුම 36,
පිටු 228–231

* මෙම තොරතුරු පළ කිරීම අතිශයින්ම ඉක්මන් කළ යුතුය. ඒ පිළිබඳ සටහනක් අධ්‍යාපන කොමිසාර් අංශයට ද, මුද්‍රණ කම්කරුවන්ගේ වෘත්තීය සමිතියට ද, කම්කරු කොමිසාර් අංශයට[33] ද යැවිය යුතුය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සෝවියට් ආණ්ඩුවේ හදිසි කර්තව්‍යයන් ගැන ප්‍රවාද හය[34]

රුසියාවට විරුද්ධව යුද්ධමය ප්‍රහාරයක් දීමට පමණක් නොව රුසියාව බෙදා ගැනීම සහ සෝවියට් බලයේ ගෙල මිරිකා දැමීම සඳහා එකඟත්වයක් ඇති කර ගැනීමට ද, ජාත්‍යන්තර ප්‍රාග්ධනය හා අධිරාජ්‍යවාදය එහි ගැඹුරුතම සහ මූලික අවශ්‍යතාවයන් විසින් පොළඹවනු ලැබෙන නිසා, සෝවියට් සමූහාණ්ඩුවේ ජාත්‍යන්තර තත්වය ඉතාමත් දුෂ්කරය, එසේම අවදානම් සහිතය.

මෙම අපේක්ෂාවන් අකර්මන්‍ය වන්නේ නැතහොත් වැළකෙන්නේ, බටහිර යුරෝපයේ අධිරාජ්‍යවාදී මිනිස් ඝාතනය උත්සන්න වීම සහ ඈත පෙරදිග ජපානයේ සහ ඇමෙරිකාවේ අධිරාජ්‍යවාදී තරඟය නිසාය. එයද අර්ධ වශයෙනි, එසේම කිසියම් කාලයකට, සමහරවිට, කෙටි කාලයකට පමණකි.

එනිසා සෝවියට් සමූහාණ්ඩුවේ උපක්‍රම යොමු විය යුත්තේ, එක් අතකින් හැකි තරම් වේගයකින් රටේ ආර්ථික පුනරුත්ථාපනයක් ඇති කිරීමත්, එහි ආරක්ෂක ශක්තිය වර්ධනය කිරීමත්, බලවත් සමාජවාදී යුද්ධ හමුදවක් ගොඩ නැගීමත් වෙත ය. අනිත් අතින් එහි ජාත්‍යන්තර ප්‍රතිපත්තියේ උපක්‍රම යොමු විය යුත්තේ, උපක්‍රමීය ලෙස මග හැරීම, පසු බැසීම හා පෙර කලට වඩා ඉක්මණින් දැනට දියුණු රටවල් ගණනාවක මෝරා එමින් පවතින ජාත්‍යන්තර නිර්ධන පංති විප්ලවය සම්පූර්ණයෙන් මෝරන අවස්ථාව එන තෙක් සිටීම වෙතය.

2. 1918 මාර්තු 15 දින සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනය විසින් සම්මත කරන ලද යෝජනාව අනුව, වර්තමාන කාලයේ දී දේශීය ප්‍රතිපත්තියේ ක්ෂේත්‍රයෙහි මුල් තැන ගන්නේ සංවිධානය පිළිබඳ කර්තව්‍යය. 1917 ඔක්තෝබර් 25 දින රුසියාවේ පටන් ගත් සමාජවාදී විප්ලවයේ ප්‍රධාන සන්ධාරයක්, එහි පූර්ණ ජයග්‍රහණය සඳහා ඉටුවිය යුතු කොන්දේසියක් වන්නේ, සමාජමය කළ මහා පරිමාණ යාන්ත්‍රික (ශ්‍රමයේ) නිෂ්පාදනය පදනම් කරගත් නව සහ වඩාත් උසස් නිෂ්පාදන සහ බෙදා හැරීමේ සංවිධානයක් ඇති කිරීම හා සම්බන්ධ වූ මෙම කර්තව්‍යය ය.

3. හුදු දේශපාලන දෘෂ්ටි කෝණයෙන් බලන කල, වර්තමාන තත්වයේ හරය නියෝජනය වන්නේ, රුසියාවේ සමාජවාදී විප්ලවයේ වැඩ පිළිවෙළ නිවැරදි බවත්, වැඩ කරන ජනතාව වෙනුවෙන් රුසියාව සූරාකන්නන්ගෙන් දිනා ගැනීමේ කර්තව්‍යය බොහෝ දුරට හා මූලික වශයෙන් සාර්ථක කර තිබෙන බවත්, දැන් පෙරමුණ ගන්නා ප්‍රධාන ප්‍රශ්නය රුසියාව පරිපාලනය කරන්නේ කෙසේද යන්න බවත්, රුසියාවේ වැඩ කරන ජනතාවට වටහා දීමේ කර්තව්‍යයෙනි. සෝවියට් සභාවල හදිසිතම කර්තව්‍යය වන්නේ, නිසිලෙස පරිපාලනය කිරීම හා සෝවියට් ආණ්ඩුවේ තීරණ ඒ ආකාරයෙන් ම ක්‍රියාවට නැගීම ය. සෝවියට් වර්ගයේ රාජ්‍යය පූර්ණ ජයග්‍රහණයට පත්වීම සඳහා ඉටුවිය යුතු කොන්දේසිය මෙයයි. සෝවියට් වර්ගයේ රාජ්‍යයක් පිහිටුවන ලද බව ප්‍රකාශයට පත් කරමින් විධිමත් ආඥා නිකුත් කිරීමවත්, එය රටේ සෑම කොටසකටම හඳුන්වාදී එය ස්ථාපිත කිරීමවත් ප්‍රමාණවත් නොවේ. එම රාජ්‍යය ප්‍රායෝගික වශයෙන් සංවිධාන කිරීම සහ නිතිපතා සහ දිනපතා කෙරෙන පරිපාලනයේ වැඩ කටයුතු මගින් එය පරීක්ෂණයට භාජනය කිරීමද අවශ්‍ය වන්නේය.

4. සමාජවාදය ගොඩනැගීමේ ක්ෂේත්‍රයෙහි වර්තමාන තත්වයේ සාරාර්ථය පිළිබිඹු කෙරෙන්නේ නිෂ්පාදනය සහ බෙදාහැරීම සම්බන්ධයෙන් දේශ ව්‍යාප්ත ලෙස ගිණුම් තැබීම හා පාලනය සංවිධානය කිරීමේ සහ නිෂ්පාදනය විෂයෙහි නිර්ධන පංති පාලනය ආරම්භ කිරීමේ අප කටයුතු, අසන්තක කරන්නන්, එනම්, ඉඩම් හිමියන් හා ධනපතියන් ඍජු ලෙස අසන්තක කිරීමේ කටයුතුවලට වඩා බෙහෙවින් පසුවූ තත්වයක් පැවතීමෙනි. අපගේ කර්තව්‍යයන් නිශ්චය කරන මූලික කරුණ එයයි.

මෙම කරුණ අනුව එක් අතකින් නිගමනය කළ යුත්තේ ධනපති පංතියට විරුද්ධ අරගලයේ නව අදියරක් ආරම්භ වන බවය. එනම්, ගුරුත්වාකර්ෂණ කේන්ද්‍රය ගිණුම් තැබීම සහ පාලනය වෙතට මාරු වෙමින් තිබෙන බවය. ප්‍රාග්ධනයට විරුද්ධව එල්ල වී ඇති සියළු ආර්ථික ජයග්‍රහණයන් ද, ඔක්තෝබරයෙන් මෙපිට ජාතික ආර්ථිකයේ එක් එක් අංග ජනසතු කිරීමට අප ගත් පියවරයන් සියල්ලද, තහවුරු කර ගැනීමට හැකි වන්නේ මේ මගින් පමණකි. ධනපති පංතියට විරුද්ධ අරගලය උච්චස්ථානයට පත් කළ හැක්කේ, එනම්, සමාජවාදය සම්පූර්ණයෙන්ම තහවුරු කළ හැක්කේ මේ මාර්ගයෙන් පමණකි.

සෝවියට් ආණ්ඩුවට සමහර අවස්ථාවලදී අඩියක් පස්සට තැබීමට,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නැතහොත්, ධනපති උපනති සමග සම්මුතිගත වීමට එකඟ වීමට සිදු වූයේ මන්ද යන්න අනිත් අතින් මෙම මූලික කරුණෙන් පැහැදිලි වන්නේය. නිදසුනක් ලෙසට ධනපති විශේෂඥයන් ගණනාවකට අධික වැටුප් ගෙවීමට කටයුතු සැලැස්වීම එසේ පියවරක් පස්සට තැබීමක් සහ පැරිස් කොමියුනයේ ප්‍රතිපත්තිවලින් පිට පැනීමක් විය. මුළු ජනතාවම ක්‍රමානුකූල ලෙස සමූපකාර යටතට ගෙන ඒමේ පියවරයන් සහ කටයුතු සම්බන්ධයෙන් ධනපති සමූපකාර සමග ඇති කර ගත් එකඟත්වය එවැනි සම්මුතියක් විය. දේශ ව්‍යාප්ත පාලනය සහ ගිණුම් තැබීම ශක්තිමත් ලෙස දෙපයින් නගා සිටුවීමට නිර්ධන පංති ආණ්ඩුවට හැකි වන තුරු මෙම වර්ගයේ සම්මුති අවශ්‍ය වනු ඇත. එහිදී අපගේ කර්තව්‍ය වන්නේ, සම්මුතිවල තිබෙන අවාසිදායක අංගලක්ෂණ ජනතාවගෙන් කිසිසේත් නොසඟවමින්, මෙම වර්ගයේ සම්මුති සම්පූර්ණයෙන්ම බැහැර කිරීමේ එකම මාර්ගය ලෙසට ගිණුම් තැබීම සහ පාලනය වැඩි දියුණු කිරීමට උත්සාහ දැරීමය. අඩුතර වේගයකින් (ගිණුම් තැබීම සහ පාලනය අතින් අප ප්‍රමාදී නිසා) නමුත්, වඩාත් ඒකාන්ත ලෙස ප්‍රගතියට පත්වීමේ එකම සහතිකය ලෙසට මෙම වර්ගයේ සම්මුති වර්තමානයේදී අවශ්‍ය වේ. නිෂ්පාදනය හා බෙදාහැරීම සම්බන්ධයෙන් ගිණුම් තැබීම සහ පාලනය සම්පූර්ණයෙන්ම ස්ථාපිත කළ පසු එවැනි සම්මුති ඇති කර ගැනීමේ අවශ්‍යතාවය අතුරු දහන් වන්නේය.

5. ශ්‍රම විනය සහ ශ්‍රම ඵලදායකත්වය උසස් කිරීමේ පියවරයන් දැන් විශේෂයෙන්ම වැදගත් වන්නේය. විශේෂයෙන්ම වෘත්තීය සමිති විසින් මේ අරමුණෙන් දැනටමත් ආරම්භ කර තිබෙන සියවරයන් පවත්වා ගැනීමට, ශක්තිමත් කිරීමට සහ වැඩි දියුණු කිරීමට සෑම ධෛර්යයක්ම යෙදිය යුතුය. නිදසුනක් වශයෙන්, කෑලි ගණනට, වැඩ ක්‍රමය ආරම්භ කිරීමත්, ටේලර් ක්‍රමයේ විද්‍යාත්මක සහ ප්‍රගතිශීලී බොහෝ දෑ ප්‍රයෝජනයට ගැනීමත්, පැක්ටරියක වැඩ කටයුතුවල පොදු ප්‍රතිඵල අනුව වේතන ගෙවීමත්, දුම්රිය හා ජලමාර්ග ප්‍රවාහණය යොදා ගැනීමත්, ආදිය මෙම පියවරයන්ට අයත්ය. එක් එක් නිෂ්පාදක සහ පාරිභෝගික කොමියුන අතර තරඟය සංවිධාන කිරීම, සංවිධායකයන් තෝරා ගැනීම ආදියද ඊට අයත්ය.

6. ධනපති ක්‍රමයේ සිට සමාජවාදයට පරිවර්තනය වීමේ දී නිර්ධන පංති ආඥාදායකත්වය නැතිවම බැරි ඒකාන්ත අවශ්‍යතාවයකි. අපගේ විප්ලවයේ ව්‍යවහාරයෙන් මෙම සත්‍යය සම්පූර්ණයෙන්ම සනාථ වී තිබේ. නමුත් ආඥාදායකත්වය යන්නෙන් අදහස් වන්නේ සූරාකන්නන් සහ දමරිකයන් යන දෙකොටසම මර්දනය කිරීමෙහිදී දැඩි සහ නිර්දය ගතියක් පාන විප්ලවවාදී ආණ්ඩුවකි. එහෙත් අපගේ ආණ්ඩුව පමණට වඩා මෘදු ගති සහිතය. සෝවියට් ආයතන විසින්. තෝරා පත් කරන ලද, නැතහොත්, පත්කරන ලද හා (නිදසුනක් ලෙසට දුම්රිය ආඥාවෙන් අපේක්ෂා කෙරෙන පරිදි) ආඥාදායක බලතල ඇති සෝවියට් අධ්‍යක්ෂ වරුන්ගේ තනි පුද්ගල තීරණවලට කීකරුවීම, එපමණක් නොව, ප්‍රශ්න නොකරම කීකරුවීම සහතික වූ තත්වයක් ඇති වීමට තවදුර යායුතුය. තව බොහෝ දුර යායුතුය. මෙසේ වී තිබෙන්නේ, නිර්ධන පංති විනයට හා සමාජවාදයට මූලික වශයෙන් ප්‍රතිවිරෝධී වන සුළු ධනපති අරාජිකත්වයේ නැතහොත්, සුළු ධනපති ගති සිරිත්වල, අපේක්ෂා වන්ගේ සහ හැඟීම්වල අරාජිකත්වයේ ප්‍රතිඵලයක් වශයෙනි. එක එල්ලේම (නිර්ධන පංති ආණ්ඩුවට විරුද්ධව දක්වන සෑම ආකාරයකම ප්‍රතිරෝධයට ධනපතියන්, ඔවුන්ගේ හෙංචයියලා, මෙන්ෂෙවික්වරු, දක්ෂිණ සමාජවාදී-විප්ලවවාදීන්, ආදීන් දක්වන සහයෝගයෙන්) ප්‍රකාශවන පමණක් නොව වක්‍ර ආකාරයෙන්ද (සුළු ධනපති වාම සමාජවාදී-විප්ලවවාදීන්ද, සුළු ධනපති විප්ලවවාදීන්ගේ ක්‍රම දක්වා පහත බසින හා වාම සමාජවාදී-විප්ලවවාදීන් අනුකරණය කරන, ''වාම කොමියුනිස්ට්වාදීන්''.[35] යනුවෙන් හැඳින්වෙන හා අප පක්ෂය තුළවන උපනතියද යන දෙකොටසම ප්‍රධාන ප්‍රතිපත්තිමය ප්‍රශ්නවලදී දක්වන ඓතිහාසික චපලත්වයෙන්) ප්‍රකාශ වන සුළු ධනපති අරාජිකත්වයට විරුද්ධව සටන් කිරීම සඳහා නිර්ධන පංතිය එහි සම්පූර්ණ පංති විඥානය මෙහෙයවා කටයුතු කළ යුතුය.

මෙම අවස්ථාවේ පොදු සහ සම්පිණ්ඩනය කළ සටන්පාඨය මෙයයි — සුළු ධනපති චපලත්වයට විරුද්ධව අයෝමය විනය සහ නිර්ධන පංති ආඥාදායකත්වය තරයේ ක්‍රියාත්මක කරමු.

1918 අප්‍රෙල් 29 හා මැයි '3
අතර ලියන ලදී

1918 මැයි 9 දින ''බෙද්නතා''
අංක 33 හි පළ කරන ලදී

සම්පූර්ණ කෘති. 5 වැනි
මුද්‍රණය, වෙළුම 36,
පිටු 277–280

https://liberationbase.wordpress.com

''වාමාංශික'' ළදරු ගතිය සහ සුළු ධනපති චිත්ත ස්වභාවය

''වාම කොමියුනිස්ට්වාදීන්'' නැමති කුඩා කණ්ඩායමක් විසින් ඔවුන්ගේ ''කොමියුනිස්ට්[36] (අංක 1, 1918 අප්‍රේල් 20) සඟරාව පළ කරනු ලැබීමෙන් සහ ඔවුන්ගේ ''ප්‍රවාදවලින්, ''සෝවියට් ආණ්ඩුවේ හදිසි කර්තව්‍යයන්''*යන කුඩා පොතෙන් ප්‍රකාශිත මගේ අදහස් සිත්ගන්නා ලෙස සනාථ වී තිබේ. සමහර විට ''වාම'' සටන් පාඨවලින් මුවා කෙරෙන සුළු ධනපති මත්බව ආරක්ෂා කිරීමට යාමේ අන්ත බොළඳකම මීට වඩා හොඳින් සනාථ කිරීමක් දේශපාලන සාහිත්‍යයෙන් දැක්ක නොහැකිය. අප දැන් ගත කරමින් සිටින කාළ පරිච්ඡේදයේ ස්වභාවය ''වාම කොමියු-නිස්ට්වාදීන්'' ගේ තර්කවලින් නිරූපනය වන හෙයින්ද එම තර්ක මෙම කාල පරිච්ඡේදයේ ''අරටුවෙහි'' ප්‍රතිෂේධාත්මක පැත්ත ඉතාමත් පැහැ-දිලි ලෙස මතු කර දක්වන හෙයින්ද ඒ ගැන විමසා බැලීම ප්‍රයෝජනවත් සහ අවශ්‍ය වන්නේය. අපගේ විමසිල්ලට භාජනව සිටින්නේ, වර්තමාන තත්වය වටහා ගැනීමට අසමත් වුවන් අතුරෙන් හොඳම අය, නැතහොත්, එම වැරදි අදහස් ගෙන එන සාමාන්‍ය නියෝජිතයන්ට වඩා දැනුම හා පක්ෂපාතිත්වය අතින් බොහෝ උසස් පිරිසක්වන වාම සමාජවාදී-ප්‍රජාතන්-ත්‍රවාදීන් වන හෙයින් එම තර්ක උපදේශාත්මක වේ.

I

දේශපාලන කාර්ය කොටසක් ඉටු කිරීමට ඉදිරිපත් වන මහාර්ථයක් ලෙසට හෝ කණ්ඩායමක් ලෙසට හෝ ''වාම කොමියුනිස්ට්වාදී'' කණ්ඩායම එහි ''වර්තමාන තත්වය ගැන ප්‍රවාද'' ඉදිරිපත් කර තිබේ.

* මෙහි පිටු 35–75 බලන්න.

තමන්ගේ උපක්‍රමවලට මුල්ගල් වන ප්‍රතිපත්ති ගැන ගැලපීමෙන් යුතු සම්පූර්ණ විස්තරයක් කිරීම හොඳ මාක්ස්වාදී පුරුද්දකි. අපගේ ''වාම'' වාදීන් කරන වරද හෙළිදරව් කිරීමට මෙම පුරුද්ද ආධාරකාරී වී තිබේ. මක්නිසාද යත්, වාග් ප්‍රහාරයට නොව තර්කනයට ප්‍රයත්න දැරූ පමණින්ම ඔවුන්ගේ තර්කයෙහි දුර්වලකම හෙළිදරව් වන හෙයිනි.

ප්‍රථමයෙන්ම අයෙකුගේ අවධානයට ලක් වන්නේ, බ්‍රෙස්ට් සාම ගිවිසුම අත්සන් කිරීම හරිද යන පැරණි ප්‍රශ්නය සම්බන්ධයෙන් දක්නට ලැබෙන ව්‍යංගාර්ථයන්, ඉඟිකිරීම් හා මගහැරීම් බහුල බවය. එම ප්‍රශ්නය එක එල්ලේ ඉදිරිපත් කිරීමට තරම් ''වාම'' වාදීහු එඩිතර නොවෙති. ඔවුහු විකට ලෙසින් දනිපනි ගාති; තර්ක පිට තර්ක පටවති; කරුණු සොයා අතපත ගාති; ''එක් අතකින්'' එසේ විය හැකි නමුත් ''අනිත් අතින්'' එය එසේ විය නොහැකි යයි කියති; ඔවුන්ගේ සිතුවිලි සියළු සහ නියමයක් නැති මාතෘකා වටා දිවෙති; ඔවුහු තමන් ආත්මාභිභවනයෙහි යෙදෙනු නොදැකීමට සෑම මොහොතකම වෙහෙසෙති. සංඛ්‍යා විස්තර උපුටා දැක්වීමට තරම් ''වාම'' වාදීහු සුපරීක්ෂාකාරී වෙති. පක්ෂ සම්මේලනයේදී සාමයට විරුද්ධව ඡන්ද දෙළහකි, පක්ෂව ඡන්ද විසි අටකි. නමුත්, සෝවියට් සභා සම්මේලනයේ බොල්ෂෙවික් කණ්ඩායමේ දී දෙන ලද සිය ගණනක් ඡන්දවලින් ඔවුන්ට ලැබුණේ දහයෙන් එකකටත් අඩු සංඛ්‍යා-වක් බව සඳහන් කිරීම, ඔවුහු සුපරීක්ෂා කාරී ලෙස මග හරිති. සාමය කරගහගෙන සිටින්නේ ''විඩාපත් සහ පංතියෙන් පිටදැමුනු කොටස්'' වන අතර ''ආර්ථික ජීවනයේ වැඩි ජීවබලයක් ඇති සහ පාන් සැපයුම වඩාත් විශ්වාසදයක වන දක්ෂිණ ප්‍රාන්තවල කම්කරුවෝ සහ ගොවියෝ'' ඊට විරුද්ධ වුහයි කියන ''න්‍යායක්'' ඔවුන් විසින් නිර්මාණය කරනු ලැබ ඇත. ... මෙය අසා සිනාසීම හැර අයෙකුට කළ හැකි වෙනත් යමක් තිබේද? සාමයට පක්ෂව සමස්ත උක්‍රේනියා සෝවියට් සභා සම්මේලනයේදී දෙන ලද ඡන්දය ගැනවත්, සාමයට විරුද්ධ රුසියාවේ නියම සුළු ධනපති සහ පංතියෙන් පිටදැමුනු (වාම සමාජවාදී-විප්ලවවාදී පක්ෂය) දේශපාලන ලටපටයේ සමාජ සහ පංති ස්වභාවය ගැනවත් වචනයක්වත් නැත. ඔවුහු සිනහ උපදවන ''විද්‍යාත්මක'' විස්තරයන් කිරීමේ මාර්ගය උපයෝගි කර ගනිමින්, අන්ත ළදරු ගතියක් පාමින් තමන්ගේම බංකොලොත් භාවය සඟවා ගැනීමට, සත්‍ය කරුණු වසං කිරීමට උත්සාහ දරති. විප්ලව වාදී සුළු ධනපති වදන්මාලාවල දවටා ඉදිරිපත් කළ සටන්පාඨ මගින් සාමයට විරුද්ධ වුයේ පක්ෂයේ බුද්ධිමත් ''සාරය'' නැතහොත් අග්‍රයන්ම බවත්, සාමයට රුකුල් දුන්නේ කම්කරුවන්ගෙන් සහ සූරාකනු ලබන ගොවීන්ගෙන් සැදුනු පොදු ජනතාවම බවත්, හුදෙක් සත්‍ය කරුණු සමාලෝචනය කළ පමණින්ම පෙනී යනු ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එසේ වී නමුත්, යුද්ධය හා සාමය පිළිබඳ ප්‍රශ්නය ගැන වූ "වාම" වාදීන්ගේ ඉහත සඳහන් සියළුම ප්‍රකාශයන් හා මගහැරීම් මධ්‍යයේම, සරල සහ පැහැදිලි සත්‍යය එළි දකින්නේය. "ලෝක පරිමාණයෙන් ගනුදෙනු බේරුම් කර ගැනීමට අධිරාජ්‍යවාදීන් දරන ප්‍රයත්න තාවකාලික වශයෙන් දුර්වල වීමක් සාමය ඇතිකර ගැනීම නිසා ඇති වූ "බව" පිළි නොගෙන සිටීම ප්‍රවාදවල කතුවරුන්ට නොහැකි විය. ("වාම" වාදීන් මෙය වැරදි ලෙස වදන් ගත කර ඇති නමුත්, මෙය වැරදි හැඳීමට තැන නොවේ). "සාමය ඇති කර ගැනීම නිසා, දැනටමත් අධිරාජ්‍යවාදී බලවතුන් අතර ගැටුම තවත් උග්‍රවීමට හේතුවී ඇත."

මෙය සත්‍යයකි. තීරණාත්මක වැදගත් කමක් සහිත දෙයක් මෙහි ඇත. සාමය ඇතිකර ගැනීමට විරුද්ධ වූ අය, නොදැනුවත්වම අධිරාජ්‍යවාදීන් අතෙහි කෙළි බඩු වූ බවත්, අධිරාජ්‍යවාදීන් ඇටවූ උගුලට ඔවුන් හසු වූ බවත් කියන්නේ එහෙයිනි. මන්දයත්, එක රටක් (විශේෂයෙන්ම, නොදියුණු රටක්) ජයග්‍රහණය කරගත් සමාජවාදීන්ගේ සෘජු යුතු කම, ලෝක සමාජවාදී විප්ලවය හට ගන්නා තෙක්, එය රටවල් කීපයකම පැතිරගොස් ජාත්‍යන්තර අධිරාජ්‍යවාදය මැඩළීමට තරම් ශක්තිමත් වන තෙක්, අධිරාජ්‍යවාදී දැවැන්තයන්ට විරුද්ධව සටන පිළි නොගැනීම වන හෙයිනි. ඔවුන්ගේ යුතුකම වන්නේ සටන මගහැරීමට උත්සාහ දැරීමය; අධිරාජ්‍යවාදීන් අතර ගැටුම් නිසා ඔවුන් තව දුරටත් දුර්වල වන තෙක් සහ වෙනත් රටවල විප්ලව තව තවත් ආසන්න වන තෙක් සිටීමය. ජනවාරි, පෙබරවාරි සහ මාර්තු මාසවලදී අපගේ "වාම" වාදීන්ට මෙම සරල සත්‍යය වැටහුනේ නැත. දැන් වුවද, එය විවෘත ලෙස පිළි ගැනීමට ඔවුහු බිය වෙති. නමුත් "එක් අතකින් පාපෝච්චාරණය කළ යුතුය; අනිත් අතින් අයෙක් පිළිගත යුතුය"[37] යනාදී වශයෙන් වූ ඔවුන්ගේ මුළු අවුල් තර්කනයෙන්ම එම සත්‍යය දහවල් එළියට ඇදෙන්නේය.

"වාම" වාදීහු ඔවුන්ගේ ප්‍රවාදවල මෙසේ ලියති:

"ලබන වසන්තයේදී සහ ගිම්හානයේදී අධිරාජ්‍යවාදී ක්‍රමයේ බිඳ වැටීම ආරම්භ විය යුතුය. යුද්ධයේ වර්තමාන අදියරෙහි දී ජර්මන් අධිරාජ්‍යවාදයට ජය ලැබුණ හොත් එයින් සිදු විය හැක්කේ බිඳ වැටීම කල් යාමක් පමණකි. නමුත්, එසේ වුවහොත් බිඳ වැටීම තව තවත් උග්‍ර ආකාරයෙන් සිදු වනු ඇත.

මෙම වදන් ගත කිරීමෙන්, විද්‍යානුකූල වීමේ ක්‍රීඩාව කරනු ලැබෙතත්, එය වැඩි වැඩියෙන්ම ළදරු කම පාන සේ වැරදි සහගත වේ. විද්‍යාව යනු "බිඳ වැටීම ආරම්භ විය යුතු" වර්ෂයත්, ඒ වසන්තයේද, ගිමහානයේද, සරත් සමයේද, නැතහොත් ශීත කාලයේද යනුත් තීරණ කිරීමෙහි තමන් සමත් බව ළදරුවන් විසින් වටහා ගනු ලැබීම ස්වාභාවිකය.

මේවා නම්, නිශ්චය කළ නොහැකි දේ නිශ්චය කිරීමට දරන නිරර්ථක ප්‍රයත්නයන් ය. "ක්‍රමයක" මෙම හෝ අනිත් බිඳ වැටීම "ආරම්භ විය යුත්තේ" කවදාද යනු, බරපතල ලෙස සිතන කිසිම දේශපාලනඥයෙක් කිසි කලෙකත් නොකියනු ඇත. (ක්‍රමයේ බිඳ වැටීම දැනටමත් ආරම්භ වී තිබෙන අතර, දැන් ප්‍රශ්නය වී තිබෙන්නේ එක් එක් රටවල විප්ලවය හටගැනීම ඇරඹෙන්නේ කුමණ අවස්ථාවේද යන්න වන හෙයින් විශේෂයෙන් ම අයෙක් කිසිසේත්ම එසේ නොකියනු ඇත). නමුත් ළදරුවෙකු මෙන් කරන අසරණ වදන්ගත කිරීම තුළින් මතු වී ඉදිරියට එන සත්‍යයක් වේ. එය නම්, වෙනත්, වඩාත් දියුණු රටවල විප්ලවීය දෙදරායම් දැන්, "විවේකය" ඇරඹීමාසයක් ගතවීමෙන් පසුව, මාසයකට හෝ සති හයකට පෙර තිබුණට වඩා ආසන්න වී තිබෙන බවය.

මෙයින් වැටහෙන්නේ කුමක් ද?

මෙයින් වැටහෙන්නේ සාමයට රුකුල් දුන් අය සම්පූර්ණයෙන්ම නිවැරදි බවත්, ඔවුන් ගත් ස්ථාවරය සාධාරණ බව සිද්ධි මාර්ගය අනුව පෙනී ගොස් ඇති බවත්ය. සමාජවාදය තවමත් දුර්වලව තිබෙන කල, සටනෙන් වාසිලැබෙන්නේ සමාජවාදයට විරුද්ධ අයට බව පැහැදිලිව පෙනෙන විට, අයෙක් බලතුලනය තක්සේරු කර බැලිය යුතු යයි ද සමාජවාදයට විරුද්ධව අධිරාජ්‍යවාදීන් කරන සටන පහසු කිරීමෙන් ඔවුන්ට ආධාර නොකළ යුතු යයි ද, නුවුමනා වීරත්වය පෑමට ආශා කරන අයගේ සිත් තුළට කාවැද්දීමෙන් සාමයට පක්ෂවුවන් කළේ නිවැරදි දෙයකි.

එසේ වුවද, තමන් "නිර්ධන පංති" කොමියුනිස්ටවාදීන් යයි කියා ගැනීමට රුචි වන අපගේ "වාම" කොමියුනිසට්වාදීහු, ඔවුන් තුළ ඇති නිර්ධන පංතිභාවය ඉතා අල්ප සහ සුළු ධනපති කම ඉතා අධික නිසා, බල තුලනය ගැන සිතීමට හෝ එය තක්සේරු කිරීමට හෝ සමත් නොවෙති. මෙය මාක්ස්වාදයේ සහ මාක්ස්වාදී උපක්‍රමවල අරටුව වෙතත්, "අරටුව" වටේ යන ඔවුහු පහත සඳහන් වැනි "ආඩම්බර" වදන් දෙසති:

"... අක්‍රිය "සාමයක චිත්ත ස්වභාවය" පොදු ජනතාවගේ සිත් තුළට තදින් කාවැදී තිබීම, පවතින දේශපාලන තත්වයේ වාස්තවික තත්වයකි..."

මෙය මාණික්‍යයකි! හුදු වදන් නිර්මාණය දක්වා කිසි කලෙකත් පහත නොවැටුනු සෝවියට් බලයේ නිවැරදි උපක්‍රමවලට ස්තුති වන්නට, ජනතාව, මහත් වේදනාකාරී සහ ප්‍රතිගාමී යුද්ධයේ තුන් අවුරුද්දකින් පසුව ඉතාමත් කෙටි, ආරක්ෂා රහිත සහ කොහෙත්ම ප්‍රමාණවත් නොවන විවේකයක් ලබා ගත්හ. එසේ නමුත්, ආත්ම මෝහනයට පත් නර්ටසිස්[38]

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කෙනෙකුගේ උදරම්කමක් පාමින් ''වාම'' බුද්ධිමත් කොලු ගැටයෝ ''අක්‍රීය (!?) සාමයක චිත්ත ස්වභාවය පොදු ජනතාවගේ (!??) සිත් තුළට කා වැදී තිබීම (!!!)'' ගැන ගාම්භීර ලෙස කථා කරති. ''වාම'' වාදීන්ගේ පත්‍රයට, නැතහොත්, සඟරාවට දිය යුතුව තිබුණු නම ''කොමියුනිස්ට්'' නොව ''ෂ්ලායහ්තිච්* යන්න බව පක්ෂ සම්මේලනයේදී මා කීවා නිවැරදි නොවේද?

වෙහෙසෙන සහ සූරාකනු ලබන ජනතාවගේ චිත්ත ස්වභාවය සහ ජීවන තත්වයන් ගැන මඳකුදු වැටහීමක් ඇති කොමියුනිස්ට්වාදියෙකුට, ''සාමයක චිත්ත ස්වභාවය'' ''අක්‍රීය'' බව කියන සහ කාඩ්බෝඩ් කඩුවක් වැනීම ''ක්‍රියා කාරිත්වය'' යයි සිතන වංශවතෙකුගේ, නැතහොත් ෂ්ලායහ්ති මානසික දැක්මක් ඇති හා නියම වශයෙන්ම පංතියෙන් පිටත දැමුනු සුළු ධනපති බුද්ධිමතාගේ අදහස් දක්වා පහත වැටෙන්නට හැකිද? උක්‍රේනියාවේ යුද්ධයෙන් වැඩි දුරටත් ඔප්පුවූ පරිදි තුන් අවුරුද්දක ඝාතනයෙන් අන්ත විඩාවට පත්ව සිටින ජනතාවට විවේකයක් නැතිව දිගටම සටන් කළ නොහැකි බව නොතකා හරින අපගේ ''වාම'' වාදීන් එයින් කරන්නේ කාඩ්බෝඩ් කඩුවක් වැනීම ය. තවද එම යුද්ධය ජාතික පරිමාණයෙන් සංවිධානය කළ නොහැකි නම්, එයින් බොහෝ විට ඇති වන්නේ නිර්ධන පංතියේ අයෝමය විනය නොව, සුළු දේපල හිමියන්ට විශේෂ වූ බිඳී විසිරී යාමේ චිත්ත ස්වභාවයකි. අපගේ ''වාම'' වාදීන්ට නිර්ධන පංතියේ අයෝමය විනය ගැන හා එය ඇති කරගන්නේ කෙසේද යන්න ගැන, කිසිම වැටහීමක් නොමැති බවත්, පංතියෙන් පිට දැමුනු සුළු ධනපති බුද්ධිමතාගේ චිත්ත ස්වභාවය ඔවුන් තුළට තදින් කාවැදී ඇති බවත් ''කොමියුනිස්ට්'' සඟරාවේ සෑම පිටුව කින්ම පෙනේ.

II

සමහර විට ''වාම'' වාදීන්ගේ මෙම යුද්ධය ගැන වූ වදන්, වැඩි කොටම අතීතයට බලපාන හුදු ළදරු මනෝරංජනයක් සේ ගෙන, ඒ අනුව, එහි දේශපාලන වැදගත්කම පිළිබඳ ඡායා මාත්‍රයක්වත් නොමැති යයි සැලකිය හැකි ද? නමුත් මෙය වැරදිය. දේශපාලන නායකත්වය ගැනීමට බලාපොරොත්තුවන ඕනෑම කෙනෙක් දේශපාලන ගැටළු ගැන සිතා බැලීමට සමත් විය යුතුය. ''වාම'' වාදීන්ට මෙම හැකියාව නොමැති හෙයින් ඔවුහු චපලත්වයේ ප්‍රතිපත්තියක කොන්ද පණ නැති දේශකයන් බවට පත් වෙති. එම ප්‍රතිපත්තියෙන් ඇති විය හැක්කේ එක ප්‍රතිඵලයක් පමණකි. එය මෙසේය: නිසැක ලෙසම රුසියානු සෝවියට් සමූහාණ්ඩුවට අවාසිදායක

* පෝලන්ත වංශවතෙකි. — පරිවර්තක

වන යුද්ධයකට එය ඇද දැමීම පිණිස ''වාම'' වාදීහු ඔවුන්ගේ චපලත්වයෙන් අධිරාජ්‍යවාදීන්ට ආධාර කරති. අප උගුලකට හසු කර ගැනීම සඳහා ඔවුහු අධිරාජ්‍යවාදීන්ට ආධාරකරති. දැන් මෙයට කන් දෙන්න:

''... ලෝක විප්ලවයේ මාර්ගය අත්හැර දැමීමෙන්. එක දිගටම සටන මග හැරීමෙන් හා ''දේශීය ප්‍රාග්ධනයට'' සහන සැල සීම මගින් ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ බල පෑමට යට වීමෙන්, රුසියානු කම්කරු විප්ලවයට ''ගැලවී ගත'' නොහේ.

''මේ අනුව බලන කල, වචනයෙන් සහ ක්‍රියාවෙන් කරන ජාත්‍යන්තර විප්ලවවාදී ප්‍රචාරය හා සම්බන්ධ කරන අධිෂ්ඨාන සහගත පංතිමය ජාත්‍යන්තර ප්‍රතිපත්තියක් පිළිගැනීම සහ ජාත්‍යන්තර සමාජවාදය සමග (ජාත්‍යන්තර ධනපති පංතිය සමග නොව) ඓන්ද්‍රිය සම්බන්ධය ශක්තිමත් කිරීම අවශ්‍ය වන්නේය...''

මෙම ඡේදය මගින් දේශීය ප්‍රතිපත්තියට අනින පහරවල් ගැන මම වෙනම කරුණු සඳහන් කරන්නෙමි. නමුත් විදේශ ප්‍රතිපත්තියේ ක්ෂේත්‍රයෙහි කර ඇති මෙම වදන් හරඹ තොවිලය හා ක්‍රියාවෙන් දක්වන බියසුලු ගතිය පරීක්ෂා කර බලන්න. අධිරාජ්‍යවාදී ප්‍රකෝප කිරීමේ අතකොලු වීමට නොකැමති සහ උගුලට පය දැමීමට නොකැමති අය වර්තමානයේදී අනිවාර්යයෙන්ම අනුගමනය කළ යුතු උපක්‍රම මොනවාද? සෑම දේශපාලනඥයෙක්ම මෙම ප්‍රශ්නයට පැහැදිලි සහ ඍජු පිළිතුරක් දිය යුතුය. එයට අප පක්ෂය දෙන පිළිතුර සුප්‍රසිද්ධ ය. වර්තමාන අවස්ථාවේදී අපි පසුබැසිය යුත්තෙමු; සටන මගහැරිය යුත්තෙමු. මෙය ප්‍රතික්ෂේප කිරීමට තරම් එඩිතර කමක් නොදක්වන අපගේ ''වාම'' වාදීහු අහසට වෙඩි තබති: ''අධිෂ්ඨාන සහගත පංතිමය ජාත්‍යන්තර ප්‍රතිපත්තියක්''!!

මෙය නම් ජනතාව රැවටීමකි. ඔබට උමනා කරන්නේ දැන් සටන් කිරීමට නම්, ඒබව විවෘත ලෙස කියන්න. දැන් පසුබැසීමට ඔබ අකැමති නම්, ඒබව විවෘතව කියන්න. ඔබ එසේ නොකරන්නෙහි නම්, ඔබ ඉටු කරන වාස්තවික කාර්ය කොටස අනුව ඔබ අධිරාජ්‍යවාදී ප්‍රකෝප කිරීමෙහි අත කොලුවක් වන්නේය. එවිට ඔබගේ මනෝමූල ''චිත්ත ස්වභාවය'' අනිකක් නොව, උඩඟුකම් පාන සහ පුරාජේරු දෙඩන එහෙත්, පසුබැසීමෙන් හා සංවිධානත්මක ලෙස පසු බැසීමට උත්සාහ කිරීමෙන් නිර්ධන පංතිකයා කරන දේ නිවැරදි යයි සම්පූර්ණයෙන්ම හඟින, උන්මත් සුළු ධනපති පංතිකයාගේ චිත්ත ස්වභාවයමය. බටහිර විප්ලවය (''වාම'' වාදීන්ගේ නන්දෙඩවිලි ඇසුනත්) ''වසන්තයේ හෝ ගිම්හානයේ'' අනිවාර්යයෙන්ම ආරම්භ වීම ''විය යුතු'' නොවුවත්, එය සමීප වෙමින් සහ සෑම මාසයක්ම පාසා අනුමානය දුරු වී යන ලෙසින් මෝරා එමින් පවතිද්දී,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කාලය ලබා ගැනීමේ එකම අවස්ථාව රැඳී පවතින්නේ පසු බැසීම තුළ වන අතර, අපට ශක්තිය මදි නිසා උරල් කඳු දක්වා වුවද (බටහිර හා නැගෙනහිර අධිරාජ්‍යවාදය හමුවේ) අප පසු බැසිය යුතු යයි කියමින් තර්ක කරන නිර්ධන පංතිකයා නිවැරදි බව සුළු ධනපතියා හඟියි.

''වාම'' වාදීන්ට ''ස්වකීය'' ප්‍රතිපත්තියක් නැත. මෙම මොහොතේදී පසුබැසීම අනවශ්‍ය යයි කීමට තරම් ඔවුහු එඩිතර නොවෙති. ඔවුහු හැරෙති. පෙරළෙති. වචනවලින් ක්‍රීඩා කරති. මෙම මොහොතේ සටන මඟහැරීමේ ප්‍රශ්නය වෙනුවට ''එක දිගටම'' සටන මඟහැරීම ආදේශ කරති. ඔවුහු ''ක්‍රියාවෙන් කරන ජාත්‍යන්තර විප්ලවවාදී ප්‍රචාරය'' ගැන සබන් පෙන පිඹිති!! මෙහි අර්ථය කුමක්ද?

එහි අර්ථය විය හැක්කේ දෙකකින් එකක් පමණකි. එක්කෝ එය හුදෙක්ම නස්ද්‍රියොව්වාදය ය[39]. නැතහොත් එයින් අදහස් කරන්නේ ජාත්‍යන්තර අධිරාජ්‍යවාදය පෙරළා දැමීමට ආක්‍රමණික යුද්ධයක් කළ යුතු බවය. මෙවැනි විකාරයන් විවෘත ලෙස ප්‍රකාශ කළ නොහැකිය. දේශපාලන විඥානය ඇති සෑම නිර්ධන පංතිකයෙකුගේම සමච්චලයෙන් බේරීමට මහා ශාබ්දික සහ පුහු වදන් පිටුපස මුවා වීමට ''වාම'' කොමියුනිස්ට්වාදීන්ට සිදුවන්නේ එහෙයිනි. ''ක්‍රියාවෙන් කරන ජාත්‍යන්තර විප්ලවවාදී ප්‍රචාරය'' යන වාක්‍ය කොටසෙහි අර්ථය අපරීක්ෂාකාරී පාඨකයාට හසුනොවෙතැයි ඔවුහු අපේක්ෂා කරති.

මහා ශාබ්දික වදන්වලින් ජේත්තුවීම පංතියෙන් පිට දැමුනු සුළු ධනපති බුද්ධිමතුන්ගේ ගුණාංගයකි. නිර්ධන පංතික කොමියුනිස්ට්වාදීන් මෙම ''පුරුද්දට'' දෙන්නේ නිසැකවම සමච්චල් කිරීමට සහ වගකිවයුතු නිලවලින් පහ කිරීමට නො අඩු දඬුවමකි. ජනතාවට සරල ලෙස, පැහැදිලි ලෙස හා ඍජු ආකාරයෙන් අමිහිරි සත්‍යය කිව යුතුය. ජර්මනියේ යුද්ධකල්ලිය නැවතත් ප්‍රබලවීමට (එවිට අප්‍රමාදව අපට විරුද්ධව ප්‍රහාරයක් ඇරඹෙනු ඇත) හා ජර්මනියත්, ජපානයත් එක්ව නිල ගිවිසුමක් මගින් හෝ නිහඬ එකඟත්වයෙන් අපගේ රට බෙදගෙන අපගේ ගෙල මිරිකා දැමීමට ඉඩ තිබෙනවා පමණක් නොව, එය සිදු විය හැකිද දෙයකි. මැත දෙඩන්නන්ට ඇහුම්කන්දීමේ උවනාවක් අපට නොමැති නම්, අපගේ උපක්‍රම විය යුත්තේ, ප්‍රමාදවීම, සටන මග හැරීම සහ පසුබැසීමය. අපි මැත දෙඩනවුන් ඉවතට තල්ලු කර දමා, සැබැවින්ම අයෝමය, නියම වශයෙන්ම නිර්ධන පංතික සහ ඇත්තෙන්ම කොමියුනිස්ට්වාදී විනයක් ඇතිකර ගැනීමෙන් අපගේ ''ශක්තිය වර්ධනය කර ගන්නෙමු'' නම්, අපට මාස කීපයක් කාලය ලබා ගැනීමේ හොඳ අවස්ථාවක් ඇත. එවිට (තත්වය නරකින් නරකට ගියත්) අපි උරල් කඳු දක්වා පසු බැසීමෙන් වුව, අපගේ ආධාරයට ඒමත්, විප්ලවය සහ විප්ලවවාදී ඉදිරි ගමනාරම්-

භයත් අතර දුර (ක්‍රීඩාවලදී යෙදෙන වචනයක් ගනිතොත්) ''ඇල්ලීමටත්'' අපගේ මිතුරාට (ජාත්‍යන්තර නිර්ධන පංතියට) පහසු කරන්නෙමු.

ජාත්‍යන්තර සමාජවාදයේ තාවකාලික වශයෙන් තනි වූ කොටසත්, එහි අනිකුත් කොටසුත් අතර සම්බන්ධය ශක්තිමත් කළ හැක්කේ මෙම උපක්‍රම මගිනි-එමගින් ම පමණකි. නමුත් හිතවත් ''වාම කොමියුනිස්ට්වාදීනි'', ඔබගේ තර්ක සියල්ලම යොමුවන්නේ එක් මහා ශාබ්දික වදනක් සහිතව එකක් අතර''ඓන්ද්‍රීය සම්බන්ධය ශක්තිමත් කිරීමට'' පමණක්ය යන සත්‍යය ඔබට කියන්නෙමු. මෙය නම් නරක තාලයක ''ඓන්ද්‍රීය සම්බන්ධයකි''!

මගේ ප්‍රියමනාප මිත්‍ර වරුනි, මෙවන් ව්‍යසනයකට ඔබ හසු වූයේ කෙසේදැයි ඔබට පැහැදිලි කර දෙන්නෙමි. එසේ වූයේ විප්ලවවාදී සටන් පාඨ ගැන සිතා බලනවාට වඩා ඔබ ඒවා කටපාඩම් කරන හෙයිනි. එනිසා උපුටා දැක්වීමේ ලකුණු සහිතව ''පිතෘ භූමිය ආරක්ෂා කිරීම'' ගැන ලිවීමට ඔබ යොමුවන්නෙහිය. එම ලකුණු යෙදීමෙන් ඔබ සමහර විට අදහස් කරන්නේ උපහාසය දැනවීමට උත්සාහ දැරීමක් විය හැකි නමුත්, එයින් ඇත්ත වශයෙන් ඔප්පුවන්නේ ඔබ ඔල්මාද කාරයන් බවය. ''ආරක්ෂාවාදය'' පහත් හා පිළිකුල් සහගත දෙයක් ලෙස සැලකීමට ඔබ පුරුදු වී සිටී. ඔබ මෙය උගෙන ගෙන කටපාඩම් කරගත්තෙහි ය. ඔබ කොතරම් දුරට එය කට පාඩම් කරගත්තෙහිද යත්, අධිරාජ්‍යවාදී යුගයකදී පිතෘභූමිය ආරක්ෂා කිරීම නොකළ හැකි දෙයකැයි යන අර්ථය දෙන ප්‍රලාප දෙඩීමට ඔබ සමහර දෙනෙක් යොමුවන්නෙහිය (ඇත්ත වශයෙන් එය නොකළ හැක්කේ ධනපති පංතිය කරන අධිරාජ්‍යවාදී යුද්ධයකදී පමණකි). ''ආරක්ෂාවාදය'' පිළිකුල් සහගත වන්නේ මන්ද, ඒ කුමණ අවස්ථාවකද යන්න ඔබ සිතා බලා නැත.

පිතෘ භූමියේ ආරක්ෂාව පිළිගැනීම යනු යුද්ධයේ සාධාරණත්වය හා යුක්ති යුක්ත භාවය පිළිගැනීම වේ. ඒ කුමණ දෘෂ්ටි කෝණයකින් සාධාරණත්වය හා යුක්ති යුක්ත භාවයද? ඒ සමාජවාදී නිර්ධන පංතියේ සහ විමුක්තිය සඳහා එය කරන අරගලයේ දෘෂ්ටි කෝණයෙන් පමණකි. අපි වෙනත් කිසිම දෘෂ්ටි කෝණයක් පිළි නොගන්නෙමු. යුද්ධය කරනු ලබන්නේ සූරා කන පංතිය විසින් එහි පංති පාලනය ශක්තිමත් කිරීමට නම්, එවැනි යුද්ධයක් සාපරාධී යුද්ධයකි. එවැනි යුද්ධයකදී ''ආරක්ෂාවාදය'' යනු පහත් ලෙස සමාජවාදය පාවා දීමකි. යුද්ධය කරනු ලබන්නේ තම රටෙහි ධනපති පංතිය පරාජය කළ නිර්ධන පංතිය විසින් සමාජවාදය ශක්තිමත් කිරීමේ සහ සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව නම්, එවැනි යුද්ධයක් සාධාරණ සහ ''ශුද්ධ'' යුද්ධයකි.

1917 ඔක්තෝබර් 25 දින පටන් අපි ''ආරක්ෂාවාදීන්'' වූයෙමු. මම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මෙය වරකට වැඩිය සහ ස්ථිර වශයෙන්ම කීවෙමි. එය ප්‍රතික්ෂේප කිරීමට තරම් ඔබ එඩිතර නොවන්නෙහිය. සමාජවාදී පීතෘ භූමිය ආරක්ෂා කිරීමේ යුතුකමට අප බැඳී සිටින්නේ නියත වශයෙන්ම ජාත්‍යන්තර සමාජවාදය සමග "සම්බන්ධය ශක්තිමත් කිරීමේ" අවශ්‍යතාවය විසින්මය. දැනටමත් නිර්ධන පංතිය විසින් ජයග්‍රහණය කර තිබෙන රටක් ආරක්ෂා කිරීම ගැන නොසැලකිල්ලක් දක්වා කටයුතු කරන්නහු ජාත්‍යන්තර සමාජවාදය සමග සම්බන්ධය විනාශ කරන්නෝ වෙති. අපි පීඩනයට භාජනයව සිටි පංතියක්ව සිටි කල්හි, අධිරාජ්‍යවාදී යුද්ධයක දී පීතෘ භූමිය ආරක්ෂා කිරීම ගැන නොසැලකිලි ආකල්පයක් නොදැක්වූයෙමු. අපි එවැනි ආරක්ෂාවට ප්‍රතිපත්තියක් වශයෙන් විරුද්ධ වූයෙමු. දැන් අපි සමාජවාදය සංවිධානය කිරීම ආරම්භ කර සිටින පාලක පංතියේ නියෝජිතයන් වන නිසා, රට ආරක්ෂා කිරීම ගැන බරපතල ආකල්පයක් ඇතිව සියළු දෙනාම කටයුතු කළයුතු යයි බල කරන්නෙමු. තවද, රට ආරක්ෂා කිරීම ගැන බරපතල ආකල්පයකින් කටයුතු කිරීම යනු ඒ සඳහා තරයේ සූදනම් වීම සහ බලවේග තුලනය ඇති සැටියෙන්ම තක්සේරු කිරීම වේ. අපගේ බලවේගයන් කුඩා බව නිසැක නම්, ආරක්ෂාව සඳහා ගතයුතු හොඳම මාර්ගය රට අභ්‍යන්තරයට පසු බැසීමය. (මෙය අවස්ථාවේ අවශ්‍යතාවයන් පිරිමසා ගැනීමට කෘතිම වශයෙන් නිමවාගත් සූත්‍රයක් යයි සිතන කෙනෙක් වේ නම්, යුද්ධ කටයුතු ගැන ශ්‍රේෂ්ඨ වියතෙක් වන පැරණි ක්ලවුසෙවිට්ස් ගේ කෘතිවලින් මේ සම්බන්ධයෙන් ඉතිහාසයෙන් උගත යුතු පාඩම් ගැන කියවිය යුතුය). එසේ නමුත්, බලවේග තුලනය පිළිබඳ ප්‍රශ්නයේ වැදගත් කම ගැන "වාම කොමියුනිස්ට් වාදීන්ට" වැටහිමක් තිබෙන බවට සලකුණක් වත් ඔවුන් කෙරෙහි දක්නට නැත.

අප ආරක්ෂාවාදයට, ප්‍රතිපත්තියක් වශයෙන්, විරුද්ධව සිටි කල්හි, සමාජවාදයේ අවශ්‍යතාවයන් නාමයෙන් ස්වකීය පීතෘ භූමිය "බේරා ගැනීමට" ඉදිරිපත් වූවන්ට අප කළ සමච්චලය යුක්ති යුක්ත විය. අප නිර්ධන පංති ආරක්ෂාවාදීන් වීමේ අයිතිය දිනාගත් පසු මුළු ප්‍රශ්නයම මූලික වශයෙන් වෙනස් විය. අදළ විවිධ බලවේගයන් ගැන ඉතාමත් නිවැරදි ලෙස තක්සේරු කිරීම සහ කල් වේලා ඇතිව අපගේ ආධාරයට ඒමට අප මිතුරාට (ජාත්‍යන්තර නිර්ධන පංතියට) ඇති ඉඩ කඩ ඉතාමත් සූපරීක්ෂාකාරී ලෙස මැන බැලීම අපගේ යුතු කම වී තිබේ. සියළුම රටවල කම්කරුවන් එක්සත් වීමට (ඇත්ත වශයෙන්ම එක්සත් වීමට, එනම් විප්ලවය ආරම්භ කිරීමට) පෙර සතුරා (ජාත්‍යන්තර නිර්ධන පංතිය) ටිකෙන් ටික විනාශ කිරීම ප්‍රාග්ධනයේ උවමනාව වන්නේය. විප්ලවවාදී කම්කරු සේනාංකයන් එකම මහා ජාත්‍යන්තර හමුදවකට එක්සත් වන මොහොත (නැතහොත් එම මොහොතෙන් පසු අවස්ථාවක්) දක්වා තීරණාත්මක සටන කල් දැමීමට ලැබෙන ඉතාමත් සුළු අවසරයෙන් පවා ප්‍රයෝජන ගැනීමට හැකි සියල්ලක්ම කිරීම අපගේ යහපත පිණිස වන්නේය.

III

අපි, අපගේ "වාම" කොමියුනිස්ට්වාදීන්ට ස්වදේශ ප්‍රතිපත්ති ක්ෂේත්‍රයෙහිදි අත් වී තිබෙන අභාග්‍යය වෙත හැරෙමු. වර්තමාන තත්වය ගැන වූ ප්‍රවාදවල එන පහත සඳහන් වාක්‍ය කොටස කියවන විට සිනහ නොවී සිටීම දුෂ්කරය.

"... ඉතිරි නිෂ්පාදන මාධ්‍යයන්ගෙන් ක්‍රමානුකූල ලෙස ප්‍රයෝජන ගැනීම ගැන සිතන්නට හැක්කේ ඉතාමත් අධිෂ්ඨාන සහගත සමාජ සන්තක කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළහොත් පමණකි"... "ධනපති පංතියට සහ එහි සුළු ධනපති බුද්ධිවාදී පරිවර්තයන්ට යටත් නොවී ධනපති පංතිය අන්ත පරාජයට පත්කර කඩා කප්පල් කිරීම සම්පූර්ණයෙන්ම මර්දනය කිරීමට..."

ප්‍රිය මනාප "වාම කොමියුනිස්ට්වාදීන්" කොතරම් අධිෂ්ඨාන සහගත වූවත් ඔවුන් පෙන්නුම් කරන කල්පනාකාරිත්වය ඉතාමත් ඉල්පය. "ඉතාමත් අධිෂ්ඨාන සහගත සමාජ සන්තක කිරීමේ ප්‍රතිපත්තියක්" අනුගමනය කිරීම යනුවෙන් ඔවුන් අදහස් කරන්නේ කුමක්ද?

ජනසතු කිරීම, නැතහොත්, රාජ්‍ය සන්තක කිරීම පිළිබඳ ප්‍රශ්නයේදී, අයෙකුට අධිෂ්ඨාන සහහත වීමට හෝ නොවීමට හෝ හැකිය. නමුත් වැදගත් කාරණය වන්නේ ජනසතු කිරීමේ සහ රාජ්‍ය සන්තක කිරීමේ සිට සමාජ සන්තක කිරීම වෙත යාමට, ඇතිකර ගත හැකි විශාලතම "අධිෂ්ඨානය" වුවද ප්‍රමාණවත් නොවන බවය. අපගේ "වාම" වාදීන්ගේ අභාග්‍යය වන්නේ, "ඉතාමත් අධිෂ්ඨාන සහගත සමාජ සන්තක කිරීමේ ප්‍රතිපත්තියක්" යන වචන බොළඳ හා ලාමක ලෙස එකට තැබීමෙන් ප්‍රශ්නයේ අරටු කොටස, එනම්, "වර්තමාන" තත්වයේ හරය වටහා ගැනීමට ඇති ඔවුන්ගේ අන්ත අසමර්ථතාවය හෙළිදරව් කිරීමය. අපගේ "වාම" වාදීන්ගේ අභාග්‍යය වන්නේ, "වර්තමාන තත්වයේ", එනම්, රාජ්‍ය සන්තක කිරීමේ (එය ක්‍රියාත්මක කිරීම සඳහා අන් සියල්ලටම වඩා දේශපාලනඥයෙකුගේ අධිෂ්ඨානය අවශ්‍ය වේ) සිට සමාජ සන්තක කිරීම (එය ක්‍රියාත්මක කිරීම සඳහා විප්ලවවාදියෙකුට වෙනත් ගතිගුණ අවශ්‍යය) දක්වා යාමේ මුළු සාරාර්ථයම ඔවුන්ට මගහැරී යාමය.

ඊයේ දින ව්‍යාපාරයේ ප්‍රධාන කර්තව්‍යය වූයේ හැකි තරම් අධිෂ්ඨාන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සහගත ලෙස ජනසතු කිරීම, රාජ්‍ය සන්තක කිරීම, ධනපති පංතිය තලා දැමීම හා පොඩිපට්ටම් කර දැමීම සහ කඩා කප්පල් කිරීම මර්දනය කිරීම විය. අපට තක්සේරු කිරීමට පවා කාලයක් නොමැති වන තරමට අප ජනසතුකර, රාජ්‍ය සන්තක කර, තලා දමා සහ පොඩි පට්ටම් කර දමා තිබෙන බව අද නොපෙනෙනු ඇත්තේ අන්ධයෙකුට පමණකි. සරල රාජ්‍ය සන්තක කිරීම සහ සමාජ සන්තක කිරීම අතර ඇති වෙනස නම්, ගණන් බැලීමේ සහ නිසි ලෙස බෙදා හැරීමේ හැකියාව නොමැතිව, ''අධිෂ්ඨානයෙන්'' පමණක් රාජ්‍ය සන්තක කිරීම ක්‍රියාත්මක කළහැකි නමුත්, එම හැකියාව නොමැතිව සමාජ සන්තක කිරීම ක්‍රියාත්මක කළ නොහැකි වීමය.

ඊයේ දින අප ඉටු කළේ රාජ්‍ය සන්තක කිරීමේ දී, ධනපති පංතිය තලා දැමීමෙහි දී සහ කඩා කප්පල් කිරීම මර්දනය කිරීමේ දී අධිෂ්ඨානය දැක්වීමේ ඓතිහාසික සේවය ය (මෙවද අපි එය ඉටු කරන්නෙමු). අද ''වර්තමාන තත්වය ගැන ප්‍රවාද'' වල මේ ගැන ලිවීම යනු අයෙකුගේ බැල්ම අතීතය වෙත සවි කරගෙන සිටිමින්, අනාගතයට පරිවර්තනය වීම ගැන අවබෝධ කර ගැනීමට අසමත්කම දැක්වීම වේ.

''... කඩා කප්පල් කිරීම සම්පූර්ණයෙන්ම මර්දනය කිරීම...'' ඔවුන් සොයාගෙන තිබෙන කර්තව්‍යයක මහිමය! අපගේ කඩාකප්පල් කාරයන් හොඳටම සැහෙන තරමට ''මර්දනය කර'' ඇත. අපට අඩුව ඇත්තේ ඊට හාත්පසින්ම වෙනස් දෙයකි. අපට අඩුව ඇත්තේ, කුමණ කඩාකප්පල් කාරයන් වැඩට යෙදිය යුතුද, ඒ කුමණ තන්හිද යන්න හරිහැටි තක්සේරු කිරීමය. නිදසුනක් ලෙසට, දැන් අපගේ සේවයට බැඳෙමින් සිටින කඩා කප්පල් කාරයන් සියයක් දෙනෙකු පාලනය කිරීමේ හැකියාව එක බොල්ෂෙවික් නායකයෙකුට හෝ පාලකයෙකුට ගෙන දෙන පරිදි අපගේම බලවේගයන් සංවිධානය කිරීමය. පවතින තත්වය එසේ වූ කල. ''ඉතාමත් අධිෂ්ඨාන සහගත සමාජ සන්තක කිරීමේ ප්‍රතිපත්තියක්'', ''අන්ත පරාජයට පත්කර'' සහ ''සම්පූර්ණයෙන්ම වර්ධනය කිරීමට'' යන වදන් කියා පෑම යනු හුදෙක්ම ඉලක්කය වරද්ද ගැනීමකි. අන්ත පරාජයට පත් කිරීම, මර්දනය කිරීම ආදිය සමාජවාදය ගෙන ඒම සඳහා ප්‍රමාණවත් නොවන බව වටහා ගැනීමේ නොහැකියාව සුළු ධනපති පංතික විප්ලවවාදියාට ආවේණික ලක්ෂණයකි. ලොකු දේපල හිමියෙකුට විරුද්ධව සරොස්වූ සුළු දේපල හිමියෙකුට එය ප්‍රමාණවත් විය හැකිය. නමුත්, නිර්ධන පංති විප්ලවවාදියෙක් කිසිකලෙකත් එම වරදට නොවැටෙන්නේය.

අප උපුටා දැක්වූ වචන සිනහවක් මතු කිරීමට හේතු වී නම්, ''වාම කොමියුනිස්ට්වාදීන්'' ගේ පහත සඳහන් සොයා ගැනීම නිසා මතුවනු ඇත්තේ කොක් හඬ ලෑමකි. ඔවුන්ගේ මතය අනුව ''දකුණට නැඹුරු

වූ බොල්ෂෙවික් අපගමනය'' යටතේ සෝවියට් සමූහාණ්ඩුව ''රාජ්‍ය ධනපති ක්‍රමය දෙසට'' පරිනාම වීමේ තර්ජනය මතුවී තිබේ. මේපාර නම් ඔවුන් අපව හොඳටම බිය ගන්වා ඇත!'' ''වාම කොමියුනිස්ට්වාදීන්, ඔවුන්ගේ ප්‍රවාදවලින් සහ ලිපිවලින් මෙම තර්ජනාත්මක හෙළිදරව්ව යළිත් ප්‍රතිරාවය දෙවන්නේ මොන තරම් ජවයක් සහිතවද?

අපගේ සෝවියට් සමූහාණ්ඩුවේ දැන් පවතින තත්වය හා සමග සසඳන කල රාජ්‍ය ධනපති ක්‍රමය ඉදිරි පියවරක් වනු ඇති බව ඔවුන්ට කල්පනා වී නැත. සය මසක් පමණ කාලයකින් අපගේ සමූහාණ්ඩුව තුළ රාජ්‍ය ධනපති ක්‍රමය ස්ථාපිත වේ නම් එය විශාල ජයග්‍රහණයක් වනු ඇත. එවිට, අවුරුද්දක් ඇතුලත සමාජවාදය තදින් මුල් අල්ලන බවට හා එය අප රටේ අනභිභවනීයත්වයට පත්වන බවට එම රාජ්‍ය ධනපති ක්‍රමය සහතිකයක් වනු ඇත.

''වාම කොමියුනිස්ට්වාදියා'' මෙම වචන වලින් ඉවතට හැරෙනු ඇත්තේ මොන තරම් උත්තම උදහසකින්ද යනුත්, ''දකුණට යොමු වූ බොල්ෂෙවික් අපගමනයට'' විරුද්ධව ඔහු කම්කරුවන් අමතා කරනු ඇත්තේ මොන තරම් නිෂේධකාරී විවේචනයක් ද යනුත්, මට සිතා ගත හැකිය. හැබැට ම? සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව තුළ රාජ්‍ය ධනපති ක්‍රමය දිසාව බලා කෙරෙන පරිවර්තනය ඉදිරි පියවරක් වනු ඇත? ... මෙය සමාජවාදයට ද්‍රෝහි වීමක් නොවේද?

මෙහිදී, අපි ''වාම කොමියුනිස්ට්වාදීන්ගේ ආර්ථික දෝෂයේ මුල වෙත එළඹෙන්නෙමු. මෙම කරුණ ගැන වඩාත් විස්තර සහිතව විමසිය යුත්තේ එහෙයිනි.

ප්‍රථමයෙන්ම, අප රට සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව යනුවෙන් හැඳින් වීමට අපට අයිතියක් ලැබෙන්නේ සහ හේතු සාධක වන්නේ ධනපති ක්‍රමයේ සිට සමාජවාදය දක්වා සිදුවන කුමණ පරිවර්තනයක් නිසාද යනු ''වාම කොමියුනිස්ට්වාදීන්ට'' වැටහෙන්නේ නැත.

දෙවැනිව, අප රටේ සමාජවාදයට ප්‍රධාන සතුරා වන්නේ සුළු ධනපති ගති ලක්ෂණය බව නොපිළි ගැනීම නිසාම ඔවුහු ඔවුන්ගේ සුළු ධනපති චිත්ත ස්වභාවය හෙළිදරව් කරති.

තුන්වැනිව, සෝවියට් රාජ්‍යය ආර්ථික වශයෙන් ධනපති රාජ්‍යයට වඩා වෙනස් බව වටහා ගැනීමට ඔවුන්ගේ ඇති අසමර්ථතාවය ''රාජ්‍ය ධනපති ක්‍රමය'' ගැන ඔවුන් දක්වන බලවත් බිය අනුව හෙළිදරව්වේ.

අපි මෙම කරුණු තුන පරීක්ෂා කර බලමු.

රුසියාවේ ආර්ථික ක්‍රමය ගැන අධ්‍යයනය කිරීමේදී එහි පරිවර්තනීය ස්වභාවය නොපිළිගෙන ප්‍රතික්ෂේප කළ කෙනෙක් නැතැයි මම අදහස් කරමි. එසේම සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව යන පාඨයෙන් අදහස්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වන්නේ සමාජවාදය කරා පරිවර්තනය වීමට සෝවියට් බලයේ ඇති අධිෂ්ඨානය මිස පවතින නව ආර්ථික ක්‍රමය සමාජවාදය ලෙස පිළිගැනීමක් නොවන බව කිසිම කොමියුනිස්ට්වාදියෙක් ප්‍රතික්ෂේප කර නැතැයි ද සිතමි.

නමුත් මෙම ''පරිවර්තනය'' යන වචනයේ අර්ථය කුමක් ද? ආර්ථිකයට ගලපන ලද කල මෙයින් අදහස් කෙරෙන්නේ ධනපති ක්‍රමය සහ සමාජවාදය යන දෙකෙහිම ගති ලක්ෂණ, අංශු හෝ කැබලි වර්තමාන ක්‍රමයෙහි තිබෙන බවක් ද? ඒ එසේය යන්න ගැන කවුරුත් එකඟ වනු ඇත. නමුත්, වර්තමාන අවස්ථාවේ රුසියාවේ පවතින විවිධ සමාජ-ආර්ථික ව්‍යුහයන් ඇත්ත වශයෙන් ම සමන්විතවන්නේ කුමණ මූලිකාංගයන්ගෙන්ද යන්න ගැන සලකා බැලීමට තරම් කරදර වන්නේ ඉහත කරුණ පිළිගන්නා සෑම කෙනෙක්ම නොවේ.

අපි මෙම මූලිකාංගයන් නම් කරන්නෙමු:

1) පීතෘ මූලික, එනම්, බොහෝ දුරට, ස්වාභාවික ගොවිජන ගොවි තැන;

2) කුඩා පරිමාණ වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය (තමන්ගේ ධාන්‍ය විකුණන ගොවි ජනයා බොහෝ දෙනෙක් මෙයට ඇතුලත්ය);

3) පෞද්ගලික ධනපති ක්‍රමය;

4) රාජ්‍ය ධනපති ක්‍රමය;

5) සමාජවාදය.

රුසියාව කොතරම් විශාලද හා විවිධ ද යත්, මෙම නොයෙක් වර්ගයේ සමාජ ආර්ථික ව්‍යුහයන් සියල්ලම එකට පැටලී පවතී. වර්තමාන තත්වයේ විශේෂ අංගලක්ෂණය සෑදෙන්නේ එයිනි.

මෙම ප්‍රශ්නය පැන නගින්නේය: ප්‍රබලවන්නේ කුමණ මූලිකාංගයන් ද? කුඩා ගොවිජන රටක, ඉඩම් ගොවිතැන් කරන අතිබහුතරයක් ජනකාය සුළු වෙළඳ භාණ්ඩ නිෂ්පාදකයන් වන නිසා, සුළු ධනපති මූලිකාංගය ප්‍රබල වන්නේය, එය ප්‍රබල විය යුතුය. අපගේ රාජ්‍ය ධනපති ක්‍රමයේ (ධාන්‍ය ඒකාධිකාරය, රජයෙන් පාලනය කෙරෙන ව්‍යවසායිකයන් හා වෙළෙන්දන්, ධනපති සමූපකාරකයන්) කටුව වරෙක එක තැනකින් සහ තවත් වරෙක තවත් තැනකින් ලාභ ගරන්නන් විසින් සිදුරු කරනු ලැබේ. ලාභ ගැරීමේ ප්‍රධාන භාණ්ඩය වී තිබෙන්නේ ධාන්‍ය ය.

ප්‍රධාන අරගලය කරනු ලබන්නේ මෙම ක්ෂේත්‍රයෙහිය. ''රාජ්‍ය ධනපති ක්‍රමය'' වැනි ආර්ථික ප්‍රවර්ගයන් ගැන කථා කරන්නෙමු නම් මෙම අරගලය සිදුවන්නේ කුමණ මූලිකාංගයන් අතර ද? එම අරගලය සිදුවන්නේ මා ඒවා නම් කර ඇති පිළිවෙළ අනුව හතරවැනි සහ පස්වැනි මූලිකාංගයන් අතරද? ඇත්තෙන්ම නැත. සමාජවාදයට විරුද්ධව යුද්ධ

ප්‍රකාශ කර තිබෙන්නේ රාජ්‍ය ධනපති ක්‍රමය නොවේ. එසේ කර තිබෙන්නේ රාජ්‍ය ධනපති ක්‍රමයටත්, සමාජවාදයටත් යන දෙකටම විරුද්ධව එක්ව සටන් කරන සුළු ධනපති සහ පුද්ගලික ධනපති ක්‍රමය ය. රාජ්‍ය ධනපති ක්‍රමයේ වේවා. රාජ්‍ය සමාජවාදී ක්‍රමයේ වේවා, සෑම වර්ගයකම රාජ්‍ය ඇඟිලි ගැසීමකට, ගිණුම් තැබීමකට හා පාලනයකට සුළු ධනපති පංතිය විරුද්ධ වන්නේය. මෙය කිසිසේත් නැතැයි කිව නොහැකි යථාර්ථ කරුණකි. ''වාම කොමියුනිස්ට්වාදීන්ගේ'' ආර්ථික දෝෂයට මූල, ඔවුන් මෙය වටහා නොගැනීමය. අපගේ ප්‍රධාන ''අභ්‍යන්තර'' සතුරන් වන්නේ, සෝවියට් බලයේ ආර්ථික පියවරයන්ගේ සතුරන් වන්නේ ලාභ ගරන්නා, වාණිජ වංචාකාරයා සහ ඒකාධිකාරය කඩා කප්පල් කරන්නා යන මොවුන්ය. ''තෝරාගත්'' කීප දෙනෙකු මරා දැමීමෙන් සහ ගිගුරුම් හඬ දෙමින් කළ චතුර කථා මගින් ලාභ ගරන්නා මර්දනය කිරීමට එක සිය විසිපස් වසරකට පෙර ප්‍රයත්න දැරූ ඉතාමත් භක්තිමත් සහ අවංක විප්ලවවාදීන් වූ ප්‍රංශ සුළු ධනපතියන්ට සමාව දිය හැකි වන්නට තිබුණි. එසේ වුවත්, අද, මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් සමහර වාම සමාජවාදී-විප්ලවවාදීන් දක්වන චතුර කථා පැවැත්වීමේ ආකල්පය නිසා, දේශපාලන විඥනය ඇති සෑම විප්ලවවාදියෙක්ම තුළ පැන නගිනු ඇත්තේ අප්‍රසාදය හා පිළිකුළ මිස අන් කිසිවක් නොවේ. ලාභ ගැරීමේ ආර්ථික පදනම වන්නේ රුසියාවේ සෑම තන්හිම බහුල වශයෙන් පැතිරී සිටින සුළු දේපල හිමියන් සහ සෑම සුළු ධනපතියෙක්ම ඒජන්තවරයෙක් කොටගත් පුද්ගලික ධනපති ක්‍රමය යන දෙකොටසම බව අපි ඉතා හොඳින් දනිමු. මෙම සුළු ධනපති බූවල්ලා උගේ දශලක්ෂ සංඛ්‍යාත අඬුවලින් වරින් වර කම්කරු කොටස් වට කර ගනු ලබන බවත්, රාජ්‍ය ඒකාධිකාරය වෙනුවට, ලාභ ගැරීම අපගේ සමාජ හා ආර්ථික ජීවේන්ද්‍රියෙහි සෑම සිදුරක්ම තුළට කාවදින බවත් අපි දන්නෙමු.

මෙය නොදක්නාවුන් සුළු ධනපති පූර්ව මතයේ වහලුන් වී සිටින බව ඔවුන්ගේ මෙම අන්ධ කමෙන් පෙනේ. අපගේ ''වාම කොමියුනිස්ට්වරු'' ද වැටී සිටින්නේ මෙම තත්වයටමය. ඔවුන් වචනයෙන් (හා ගැඹුරුතම විශ්වාසය අනුව) සුළු ධනපති පංතියේ නිරනුකම්පික සතුරන් වන අතර ක්‍රියාවෙන් සුළු ධනපතියන්ට ම පමණක් ආධාර කරති. එසේම ජනගහනයේ මෙම කොටසට පමණක් සේවය කරති. 1918 අප්‍රේල් මාසයේදී!! ''රාජ්‍ය ධනපති'' ක්‍රමයට විරුද්ව සටන් කිරීමෙන්ද ඔවුන් ප්‍රකාශ කරන්නේ එම ජනකොටසේම අදහස පමණකි. ඔවුහු ඉලක්කය අසලකටවත් ළං නොවෙති!

යුද්ධ කාලය තුළදී ''අවංක'' හා විශේෂයෙන්ම වංක මාර්ගයෙන් සුළු ධනපතියෝ දෙතුන් දහසින් මුදලක් ඉතිරි කරගෙන සිටිති. ඔවුහු ලාභ

https://liberationbase.wordpress.com

ගරන සහ පෞද්ගලික ධනපති ක්‍රමයේ පදනම වශයෙන් ප්‍රයෝජනවත් වන ආර්ථික ප්‍රවර්ගයේ ලක්ෂණ ඇති පිරිසක් වෙති. මුදල යනු එය හිමියාට සමාජ වස්තුව ලබා ගැනීමට අයිතිය දෙන සහතිකයකි. කෝටි සංඛ්‍යාත සුළුදේපල හිමියෝ මෙම සහතිකය කෙරෙහි එල්බ ගෙන එය ''රාජ්‍යයෙන්'' වසං කරති. සමාජවාදය හෝ කොමියුනිස්ට් ක්‍රමය හෝ ගැන විශ්වාසයක් නොතබන ඔවුහු නිර්ධන පංති කුණාටුව හමායන තෙක් කල් බලති. එක්කෝ අපි සුළු ධනපතියන් අපගේ ග්‍රහණම් තැබීමට සහ පාලනයට යටත් කළ යුත්තෙමු (දේශපාලන විඥනය ඇති නිර්ධන පංතිය වටා ජනගහනයෙන් බහුතරය, නැතහොත් අර්ධ නිර්ධන පංතිකයන් සංවිධානය කරන්නෙමු නම්, අපට මෙය කළ හැකිය). එසේ නැතහොත්, මෙම සුළු දේපල හිමිකම නැමැති භූමියෙහිම පැනනැගුනු නැපෝලියන්ලා සහ කැවිග්නැක්ලා විසින් විප්ලවය පෙරළා දමන ලද මෙන්ම, ස්ථිරවම සහ අනිවාරණීය වශයෙන්ම, සුළු ධනපතියන් අපගේ කම්කරු බලය පෙරළා දමනු ඇත. ප්‍රශ්නය හා සම්බන්ධයෙන් දැන් පවතින තත්වය එසේය. මෙම සරල සහ පැහැදිලි සත්‍යය නොපෙනෙන්නේ වාම සමාජවාදී-විප්ලවවාදීන්ට පමණකි. ''වෙහෙසෙන'' ගොවි ජනයා ගැන ඔවුන් දොඩන හිස් වදන් පිළිබඳ මිහිදුම නිසා ඔවුන්ට එම සත්‍යය නොපෙනේ. නමුත් මෙම වාම සමාජවාදී-විප්ලවවාදීන් ගැන බරපතල ලෙස ගණන් ගන්නෝ කවරහුද?

තමන්ගේ දහස් ගණනක මුදල රැස්කර තබා ගන්නා සුළු ධනපතියා රාජ්‍ය ධනපති ක්‍රමයේ සතුරෙකි. ඔහුට අවශ්‍ය වී තිබෙන්නේ තමන්ම සඳහා, දුප්පතුන්ට විරුද්ධව, මොනම වර්ගයක හෝ රාජ්‍ය පාලනයට විරුද්ධව තමන්ගේ දහස් ගණනක මුදල යෙදීමටය. එසේම මෙම දහස් ගණන්වල මුළු එකතුවෙන් සැදෙන කෝටි සිය ගණනක මුදල අපගේ සමාජවාදය ගොඩ නැගීමේ කටයුතු දුර්වල කරන ලාභ ගැරීමේ පදනම වන්නේය. කිසියම් කම්කරුවන් සංඛ්‍යාවක්, දින කීපයක් තුළදී 1000 ක වටිනාකම් නිපදවතියි සිතමු. සුළු ලාභ ගැනීම සහ විවිධාකාර වංචා නිසා ද, සුළු දේපල හිමියන් සෝවියට් ආඥා සහ රෙගුලාසි මග හැරීම නිසාද, මෙම 1000 න් 200 ක් අතුරුදහන් වෙතැයි ද සිතමු. 1000 න් 300 ක් වැය කර වඩාත් හොඳ සංවිධානයක් ඇති කර ගත හැකි නම්, 200 වෙනුවට තමන් කැමැත්තෙන්ම 300 ක් දෙන බව දේශපාලන විඥනය ඇති සෑම කම්කරුවෙක්ම කියනු ඇත. මක් නිසාද යත්, පසුව, ක්‍රමානුකූලතාවය සහ සංවිධානය තහවුරු කළ පසු, සුළු ධනපතියන් විසින් රාජ්‍ය ඒකාධිකාරය කඩාකප්පල් කරනු ලැබීම පරාජය කළ පසු, මෙම ''කප්පම'' 100 ක් හෝ 50 ක් දක්වා අඩු කිරීම අපහසු නොවන හෙයිනි.

සම්පූර්ණ පැහැදිලිතාවය තකා, මා උවමනාවෙන්ම අන්තය දක්වා සරල කළ මෙම සංඛ්‍යාමය නිදර්ශනයෙන් රාජ්‍ය ධනපති ක්‍රමය සහ සමාජවාදය අතර වර්තමාන සහසම්බන්ධය පැහැදිලි වේ. කම්කරුවන්ට රාජ්‍ය බලය හිමිව තිබෙන නිසා සමාජවාදී අරමුණු සඳහා හැර වෙනත් කිසිවක් සඳහා කොපෙක් එකක් හෝ නොදී මුළු දහසම ගැනීමේ සෑම නීතිමය අවස්ථාවක්ම ඔවුනට ඇත. ඇත්ත වශයෙන්ම බලය කම්කරුවන් අතට පත්වීම මත රැඳී පවතින මෙම නීතිමය අවකාශය සමාජවාදයේ මූලිකාංගයකි.

නමුත්, සුළු දේපල හිමි සහ පෞද්ගලික ධනපති ගති ලක්ෂණය නොයෙක් ආකාරයෙන් මෙම නීතිමය අවකාශය දුර්වල කරයි; ලාභ ගැරීම වැද්ද ගනියි; සෝවියට් ආඥාවන් ක්‍රියාත්මක කිරීමට බාධා කරයි. එනිසා අප දැන් ගෙවනවාට වැඩිය ගෙව්වත්, රාජ්‍ය ධනපති ක්‍රමය යෝධ ඉදිරි පියවරක් වනු ඇත. (මා සංඛ්‍යාමය නිදසුනක් ගත්තේ කරුණ හොළින් පැහැදිලි කරනු පිණිසය). එසේ කියන්නේ, ''අධ්‍යාපනය'' ලැබීම කම්කරුවන්ට ප්‍රයෝජනවත් නිසා ඒ සඳහා ගාස්තු ගෙවීම පාඩුවක් නොවන හෙයිනි; අපිළිවෙළ, ආර්ථික විනාශය සහ නොසැලකිල්ල පරදවා ලබන ජයග්‍රහණය ඉතාමත් වැදගත් දෙය වන හෙයිනි; රාජ්‍ය ධනපති ක්‍රමයට වඩාත් බරපතල කප්පමක් ගෙවුවත් එයින් අප විනාශයට පත් නොවන හා ඉතාමත් විශ්වාසදයක මාර්ගය ඔස්සේ අපට සමාජවාදය කරා යාමට හැකි වන අතර, සුළු දේපලහිමි ක්‍රමයේ අරාජිකත්වය තවදුරටත් පැවැතීම ඉතාමත් විශාල හා බරපතල අන්තරායක් හා (එය පරාජය නොකළ හොත්) අපගේ ඒකාන්ත විනාශයද වන හෙයිනි. සුළු දේපල හිමි කමේ අරාජිකත්වයට විරුද්ධව රාජ්‍ය යන්ත්‍රය ආරක්ෂා කරන හැටි කම්කරු පංතිය උගෙන ගත් පසු, ජාතික පරිමාණයෙන් හා රාජ්‍ය ධනපති ක්‍රියාමාර්ග අනුව මහා පරිමාණ නිෂ්පාදනය සංවිධානය කිරීමට එය උගෙන ගත් පසු එයට — මෙම වචනය යෙදීම මනා නම් — තුරුම්පු සියල්ලම අත් වීමත්, සමාජවාදය තහවුරුවීමත් සහතික වනු ඇත.

ප්‍රථම කොටම, රාජ්‍ය ධනපති ක්‍රමය ආර්ථික වශයෙන් දැන් පවතින අපගේ ආර්ථික ක්‍රමයට වඩා අපරිමිත තරමින් උසස්ය.

දෙවැනිව, සෝවියට් රාජ්‍යය යනු කම්කරුවන්ගේ සහ දුප්පතුන්ගේ බලය සහතික වූ රාජ්‍යයක් වන හෙයින්, සෝවියට් බලයට එයින් වන භයානක අන්තරායක්ද නැත. මෙම අවිවාදී සත්‍යයන් වටහා ගැනීමට ''වාම කොමියුනිස්ට්වාදීහු'' අසමත් වූහ. සාමාන්‍ය වශයෙන්ම දේශපාලන අර්ථශාස්ත්‍රය පිළිබඳ අදහස් තම හිස තුළ ඒකාබද්ධ කර ගත නොහැකි ''වාම සමාජවාදී-විප්ලවවාදීන්ට'' මෙම සත්‍යයන් කිසි කලෙකත් වටහා ගත නොහැකි වනු ඇත. නමුත් සෑම මාක්ස්වාදියෙක්ම ඒවා පිළිගත

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යුක්තේය. වාම සමාජවාදී-විප්ලවවාදියෙක් සමග තර්ක කිරීම වුවද වැදගත් නොවන්නේ ය, හුළං මල්ලක් පිළිබඳ ''පිළිකුල් සහගත නිදර්ශනයක්'' දෙසට ඔහු ඇඟිල්ල දික්කර පෙන්නුම් කිරීම ප්‍රමාණවත්ය. නමුත් ''වාම කොමියුනිස්ට්වාදීන්'' සමග තර්ක කළ යුතුය. ඒ එහිදී වරද කරන්නේ මාක්ස්වාදීන් වන නිසා සහ ඔවුන්ගේ වරද විග්‍රහ කිරීම කම්කරු පංතියේ නියම මග සොයා ගැනීමට එයට ආධාරයක් වන නිසාය.

IV

කරුණු තවත් පැහැදිලි කිරීම සඳහා, රාජ්‍ය ධනපති ක්‍රමය පිළිබඳ ඉතාමත් යථාර්ථ නිදර්ශනය ගෙන බලමු. එම නිදර්ශනය කුමක්දැයි කවුරුත් දනිති. එය ජර්මනිය වේ. නවීන මහා පරිමාණ ධනපති ඉන්ජිනේරු කර්මාන්ත හා සැලැස්මානුකූල සංවිධානය ''තවත් කියන්නට දෙයක් නැති'' තත්වයට වර්ධනය වී ඇත්තේ එරටෙහි ජුන්කර්-ධනපති අධිරාජ්‍යවාදය යටතේ ය. මෙහි යටින් ඉරි ඇඳි වචන ඉවත් කර, යුද්ධවාදී, ජුන්කර්[40], ධනපති, අධිරාජ්‍යවාදී රාජ්‍යය වෙනුවට වෙනත් රාජ්‍යයක්, එහෙත්, වෙනත් වෙනස් සමාජමය වර්ගයක, වෙනත් පංති සන්ධාරයක් ඇති රාජ්‍යයක්, එනම්, සෝවියට් රාජ්‍යයක්, නිර්ධන පංති රාජ්‍යයක්, යන්න යොදන්න. සමාජවාදය සඳහා අවශ්‍ය කොන්දේසිවල එකතු සමස්තය එවිට එහි අන්තර්ගත වනු ඇත.

නවීන විද්‍යාවේ අළුත්ම සොයා ගැනීම් පදනම් කරගත් මහා පරිමාණ ධනපති ඉන්ජිනේරු කර්මාන්ත නොමැතිව සමාජවාදය ගැන සිතන්නට නොහැකිය. නිෂ්පාදනයේ සහ බෙදා හැරීමේ අනුමත සම්මතයන් තරයේ අනුගමනය කරන තත්වයෙන් කෝටි ගණන් ජනයා යොමු කර ගන්නා සැලසුම් කළ රාජ්‍ය සංවිධානයක් නොමැතිව එය ඇතිවීම ගැන සිතන්නටද නොපුළුවන. මාක්ස්වාදීන් වන අපි නිතරම මේ ගැන කථා කෙළෙමු. නමුත් මෙය පවා නොවැටහෙන (අරාජිකවාදීන් සහ වාම සමාජවාදී විප්ලවවාදීන්ගෙන් අඩක් පමණම) අය සමග කථා කිරීමට තත්පර දෙකක්වත් මිඩංගු කිරීමේ ප්‍රයෝජනයක් නොමැත.

ඒ අතරම, නිර්ධන පංතිය රාජ්‍යයේ පාලකයා නොවන්නේ නම්, එම තත්වය යටතේද සමාජවාදය ගැන සිතන්නට නොපුළුවන. මෙය අ යන්න ආ යන්න මෙන් පැහැදිලි කරුණකි. තවද ඉතිහාසය කොතරම් අමුතු මාවතක් ගෙන ඇත්තේද යත්, (ඉතිහාසය සන්සුන් ලෙස, මෘදු ලෙස, පහසුවෙන් හා සරල ලෙස සම්පූර්ණ සමාජවාදය ගෙන එනු ඇතැයි යනු, පළමු පෙළේ මෙන්ෂෙවික් මොට්ටයන් හැර අන් කිසිවෙක් කිසි කලෙකත් අපේක්ෂා නොකෙළේය) එය, ජාත්‍යන්තර අධිරාජ්‍යවාදයේ

කටුව තුළ වන අනාගත කුකුළු පැටවුන් දෙදෙනෙකු හා සමාන වන ලෙසට එකිනෙකට අසම්බන්ධව එක පෙළට පවතින සේ සමාජවාදය කොටස් දෙකකින් යුක්තව 1918 දී බිහි කළේය. එක් අතකින් සමාජවාදය සඳහා අවශ්‍ය ආර්ථික, නිෂ්පාදනීය සහ සමාජ-ආර්ථික කොන්දේසිද, අනිත් අතින් ඒ සඳහා අවශ්‍ය දේපාලන කොන්දේසිද ද්‍රව්‍යමය වශයෙන් ඉටුවීම පිළිබඳව 1918 දී පවතින ඉතාමත් සිත් ගන්නා ප්‍රතිමූර්තිය වී තිබෙන්නේ, ජර්මනිය සහ රුසියාව ය.

ජර්මනියේ සාර්ථක නිර්ධන පංති විප්ලවයක් ඇති වුව හොත් වහාම හා ඉතා පහසුවෙන්ම අධිරාජ්‍යවාදයේ කටුව පොඩි කෙරෙනු ඇත (අවාසනාවකට මෙන් එය ඉස්තරම්ම වානේවලින් සදා ඇති හෙයින් ඕනෑම... කුකුළු පැටවෙකුට බිඳිය හැකි නොවේ). එවිට නියත වශයෙන්ම, කිසි අමාරුවක් නොමැතිවම, නැතහොත්, ඉතා සුළු අමාරුවකින් ලෝක සමාජවාදයේ ජයග්‍රහණය සිදු කෙරෙනු ඇත. නමුත් මෙහිදී අප ''අමාරුව'' යනුවෙන් අදහස් කරන්නේ පටු අමන අර්ථයෙන් නොව, ලෝක ඓතිහාසික පරිමාණයේ ''දුෂ්කරතාවයන්'' වේ.

ජර්මනියේ විප්ලවය ''එළි දැකීම'' තවමත් ප්‍රමාද වන අතර, අපගේ කර්තව්‍යය වන්නේ ජර්මන් වරුන්ගේ රාජ්‍ය ධනපති ක්‍රමය අධ්‍යනය කිරීම, එය පිටපත් කර ගැනීමට හැකි සෑම වෙහෙසක්ම දැරීම සහ එම පිටපත් කිරීම කඩිනම් කරනු සඳහා ආඥාදායක ක්‍රම යොදා ගැනීමට මැලි නොවීම ය. අපගේ කර්තව්‍යය නම් මෙම පිටපත් කර ගැනීම ඉක්මන් කිරීමය. අසංස්කෘත රුසියාව විසින් බටහිර සංස්කෘතිය පිටපත් කරගනු දැකීමට පීටර් රජු ඉක්මන් වූවාටත් වැඩියෙන් අපි මෙහිදී කඩිනම් විය යුත්තෙමු. අසංස්කෘත ස්වභාවයට විරුද්ධව සටන් කිරීමට අසංස්කෘත ක්‍රම යොදා ගැනීමේදී අපි පසුබට නොවිය යුත්තෙමු. නාර්ට්සිස් ස්වභාවයේ සංකල්පනාවලින් සතුටුවන සහ ජර්මන් අධිරාජ්‍යවාදයෙන් ''පාඩම් උගෙන ගැනීම'' විප්ලවවාදීන් වන අපට තරම් නොවන බව කියන (මෙම මොහොතේ මට මතක් වන්නේ මධ්‍ය විධායක කාරක සභා රැස්වීමේදී කරේලින් සහ ගේ කළ කථාවන්ය) අරාජිකවාදීන් සහ සමාජවාදී-විප්ලවවාදීන් සිටිත් නම්, ඔවුනට පිළිතුරු වශයෙන් අපට කිව හැක්කේ මෙය පමණකි; මේ මිනිසුන් ගැන බරපතල ලෙස ගණන් ගන්නා විප්ලවයක් නොවැළැක්විය හැකි සේ (සහ යුක්ති යුක්ත ලෙස) වැනසී යනු ඇත.

දැනට සුළු ධනපති ක්‍රමය රුසියාවේ ප්‍රබලව පවත්නේය. එහි සිට රාජ්‍ය ධනපති ක්‍රමය සහ සමාජවාදය යන දෙකටම යායුත්තේ එකම මාර්ගයෙනි. එම මාවත වැටී ඇත්තේ ''නිෂ්පාදනය සහ බෙදා හැරීම පිළිබඳ ජාතික ගිණුම් තැබීම සහ පාලනය'' යනුවෙන් හැඳින්වෙන අතරමැද ඇති එකම නැවතුම්පල හරහාය. මෙය වටහා ගැනීමට අසමත් වන අය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ආර්ථික ක්ෂේත්‍රයෙහි දී කරන්නේ සමාව දිය නොහැකි වරදකි. එක්කෝ ඔවුහු ජීවිතයේ සත්‍ය කරුණු නොදනිති; යථාර්ථ වශයෙන් පවතින දේ නොදකිති; එනිසා, එක එල්ලේම සත්‍ය දෙස බැලීමට අසමත් වෙති. නැතහොත්, ඔවුහු ''ධනපති ක්‍රමය'' සහ ''සමාජවාදය'' වියුක්ත ලෙස සංසන්දනය කිරීමෙහි යෙදෙති; එහිදී, අප රටේ සිදුවෙමින් පවතින පරිවර්තනයේ නියත ආකෘති සහ අවධි ගැන අධ්‍යයනය කිරීමට අසමත් වෙති. ''නොවයා ෂීස්න්'' සහ ''විපිරියොද්'' කඳවුරේ හොඳම අය නොමඟ යාමට හේතු වූයේ ඉඳුරාම මෙම න්‍යායික වරද නිසාම බව අමතර වශයෙන් කිව යුතුය. එම කඳවුරේ නරකම සහ සාමාන්‍ය අය ධනපති පංතිය කෙරෙහි භය පක්ෂ ගතියක් දක්වමින් එය පස්සේ ඇදෙති. එයට හේතුව ඔවුන්ගේ මෝඩ ගතිය හා කොන්ද පණ නැති කම වන්නේය. මාක්ස්වාදයේ ගුරුවරු, ධනපති ක්‍රමයේ සිට සමාජවාදයට පරිවර්තනය වීමේ මුළු කාල පරිච්ඡේදයක් ගැන කියමින් නව සමාජයේ ''දීර්ඝ කාලයක් පවතින ප්‍රසව වේදනා'' ගැන අවධාරණය කළේ හේතුවක් නොමැතිව නොවන බව ඔවුන් අතර සිටින හොඳම අය පවා වටහා නොගත්හ. තවද, මෙම නව සමාජයද වියුක්ත සංකල්පයක් විය. එය ජනිත වූයේ එක් හෝ තවත් සමාජවාදී රාජ්‍යයක් නිර්මාණය කිරීමට දරන ලද විවිධාකාර, අඩු පාඩු සහිත නියත ප්‍රයත්නයන් මාලාවක් මගින් යාමෙන් පමණකි.

''රාජ්‍ය ධනපති ක්‍රමය දෙසට පරිනාම වීම'' (''කොමියුනිස්ට් අංක 1, පිටු 8, තීරුව 1) ගැන කීමෙන් අනුන් රැවටීමට සහ තමන්ම රවටා ගැනීමට දරන ප්‍රයත්නය අන්ත න්‍යායික විකාරයක් වනුයේ, ධනපති ක්‍රමයට සහ සමාජවාදයට පොදු භූමිය (වන ජාතික ගිණුම් තැබීම සහ පාලනය) පසු නොකර, දැනට මෙහි පවතින ආර්ථික තත්වයේ සිට ඉදිරියට යාමට නොහැකි හෙයිනි. මෙයින් පෙනෙන්නේ යමෙක් තමන්ගේ සංකල්පනා නියම ''පරිනාමයේ'' මාවතෙන් බැහැර යාමට ඉඩ හරින සහ මෙම මාවත කුමක්ද යන්න වටහා ගැනීමට අසමත් වන බවය. එය ව්‍යවහාරික වශයෙන් ගත් කල, සුළු දේපල හිමි ධනපති ක්‍රමය වෙත ආපසු ඇදගෙන යාමකට සමාන වේ.

රාජ්‍ය ධනපති ක්‍රමය මවිසින් මෙසේ ''උසස්'' ලෙස අගය කරන ලද ප්‍රථම අවස්ථාව මෙය නොවන බවත්, බොල්ෂෙවික්වරු බලය අල්ලා ගැනීමට පෙර මා එසේ කළ බවත්, පාඨකයාට ඒත්තු ගැන්වීම පිණිස, ''ළඟ එන මහා විපත සහ එයට විරුද්ධව සටන් කරන හැටි'' යන, 1917 සැප්තැම්බරයේ ලියන ලද මගේ කුඩා පොතෙන් පහත සඳහන් කොටස උපුටා දක්වමි.

''... ජුන්කර්-ධනපති රාජ්‍යයක් වෙනුවට, ඉඩම් හිමි-ධනපති ක්‍රමය වෙනුවට, විප්ලවවාදී-ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ආදේශ කිරීමට දැන් උත්සාහ ගන්න. එනම්, විප්ලවවාදී ක්‍රමයකින් සියළුම වරප්‍රසාද අහෝසි කරන සහ විප්ලවවාදී ක්‍රමයකින් සම්පූර්ණතම ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමට බිය නොවන රාජ්‍යයක් ආදේශ කිරීමට උත්සාහ ගන්න. නියම විප්ලවවාදී-ප්‍රජාතන්ත්‍රවාදී රජයක් ඇතොත්, රාජ්‍ය ඒකාධි කාරී ධනපති ක්‍රමය යනුවෙන් අනිවාරණීය ලෙසට හා නොවැලැක් විය හැකි ලෙස අදහස් වන්නේ සමාජවාදය දෙසට යොමුවූ පියවරක් බව, පියවර එකකට වැඩි ගණනක් බව, ඔබට පෙනෙනු ඇත!

''... එසේ කියන්නේ සමාජවාදය යනු හුදෙක්ම රාජ්‍ය ධනපති ඒකාධිකාරයේ සිට ඊළඟ ඉදිරි පියවර වන හෙයිනි.

''... රාජ්‍ය ඒකාධිකාරී ධනපති ක්‍රමය යනු සමාජවාදය සඳහා අවශ්‍ය සම්පූර්ණ ද්‍රව්‍යමය සූදනම් කිරීම වන්නේය; එය සමාජවාදයට එළඹෙන එළිපත්ත, නැතහොත්, එයත් සමාජවාදය නැමති හිණි පෙත්තත් අතර අන්තර් හිණි නොමැති හිණි පෙත්ත වන්නේය'' (පිටු 27 හා 28).*

මෙය ලියන ලද්දේ කෙරෙන්ස්කි බලයේ සිටියදී බව සහ එහි අප සාකච්ඡා කරන්නේ නිර්ධන පංති ආඥාදායකත්වය ගැන නොව, සමාජවාදී රාජ්‍යය ගැන නොව, ''විප්ලවවාදී-ප්‍රජාතන්ත්‍රවාදී'' රාජ්‍යය ගැන බව සටහන් කරගන්න. අප මෙම දේශපාලන හිණිමගෙහි වඩාත් ඉහළට නැග සිටි තරමට, සමාජවාදී රාජ්‍යය සහ නිර්ධන පංති ආඥාදායකත්වය සෝවියට් සභා තුළ සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කළ තරමට ''රාජ්‍ය ධනපති ක්‍රමය ''ගැන අප අඩුවෙන් බිය විය යුතු බව පැහැදිලි නොවේද? ද්‍රව්‍යමය, ආර්ථික සහ නිෂ්පාදනීය දෘෂ්ටි කෝණය අනුව බලන කල,අප තවමත් සමාජවාදයේ ''එළිපත්ත'' වෙත පැමිණ නැති බව පැහැදිලි නොවේද? අප තවමත් සම්ප්‍රාප්ත වී නොමැති ''එළිපත්ත'' පසු නොකර සමාජවාදයේ දෙරෙන් ඇතුළු විය නොහැකි බව නොපැහැදිලි ද?

අප කුමණ පැත්තෙන් ප්‍රශ්නයට සමීප වුවත්, බැස ගත හැක්කේ එකම නිගමනයකටය. ඒ මෙසේය: අපට තර්ජනයක් වී තිබේ යයි කියනු ලබන ''රාජ්‍ය ධනපති ක්‍රමය'' පිළිබඳව ''වාම කොමියුනිස්ට්වාදීන්'' ඉදිරිපත් කරන තර්කය ආර්ථික වශයෙන් කරන බරපතල වරදක් වන අතර, ඔවුන් සුළු ධනපති දෘෂ්ටියට සම්පූර්ණයෙන්ම වහල් වී සිටින බව එයින් මනාව ඔප්පු වේ.

V

මෙහි පහත දැක්වෙන කරුණද අතිශයින්ම උපදේශාත්මකය.

අප මධ්‍යම විධායක කාරක සභාවේදී බුහාරින් සහෝදරයා සමග

*පස්වැනි වෙළුමෙහි 261-263 පිටු බලන්න. — සංස්කාරක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තර්ක කළ විට ඔහු වෙනත් කරුණු ද සඳහන් කරමින් ප්‍රකාශ කළේ, විශේෂඥයන්ට ඉහළ වැටුප් ගෙවීම හා සම්බන්ධ ප්‍රශ්නය ගැන වූ කල, යම් යම් තත්වයන් යටතේ ''ඔවුන් බුරුත්තෙන් වන්දිගෙවා ගැළවීම''[41] (ධනපතීන් බුරුත්තෙන් එනම්, ඉඩම් පැක්ටරි, වැඩ පලවල් හා වෙනත් නිෂ්පාදන මාර්ග සියල්ලම ධනපතියන් ගෙන් මිළට ගැනීම) කම්කරු පංතියට වඩාත් අවස්ථාවෝචිත වන්නේ යයි කී මාක්ස්ගේ වචන මතක තබා ගෙන ''අපි'' (මෙයින් අදහස් කරන ලද්දේ ''වාම කොමියුනිස්ටවාදීන්'' බව පෙනේ) මෙම ක්‍රියා මාර්ගය ප්‍රතිපත්තියෙන් බැහැර වීමක් ලෙස නොසැලකූ හෙයින් ''අපි ලෙනින්ට වඩා නිවැරදි'' යනුයි.

ඉහත සඳහන් ඉතාමත් සිත් ගන්නා ප්‍රකාශයෙන් ප්‍රථමයෙන්ම පෙනෙන්නේ, බුහාරින් අනාෘ වාම සමාජවාදී-විප්ලවවාදීන්ට සහ අරාජිකවාදීන්ට වඩා බෙහෙවින් උසස් තත්වයක සිටින බවත්, ඔහු ගැලවීගත නොහැකි ලෙසට කිසිසේත්ම වදන් හරඹය නැමති මඩේ එරී නොමැති බවත්, එහෙත්, ඊට ප්‍රතිකූල වශයෙන් ඔහු ධනපති ක්‍රමයේ සිට සමාජවාදය දක්වා වූ පරිවර්තනයේ, එම වේදනා සහගත සහ අමාරු පරිවර්තනයේ නියත දුෂ්කරතාවයන් ගැන සිතා බැලීමට ප්‍රයත්න දරන බවත් ය.

දෙවැනිව, මෙම ප්‍රකාශය නිසා බුහාරින් ගේ වරද වඩාත් හොඳින් ප්‍රකට වන්නේය.

අපි මාක්ස්ගේ අදහස ගැන සුපරීක්ෂා කාරී ලෙස විමසා බලමු.

මාක්ස් සඳහන් කරන්නේ පසු ගිය ශත වර්ෂයේ හැත්තෑ ගණන්වල බ්‍රිතාන්‍යය ගැනය. එනම්, පූර්ව ඒකාධිකාර ධනපති සංවර්ධනයේ උච්ච අවස්ථාව ගැනය. එකල බ්‍රිතාන්‍යය අන් සෑම රටකටම වඩා යුද්ධවාදය සහ නිලධාරිවාදය අඩුවෙන් පෙනෙන්නට තිබුණු රට විය. එවිට එය, කම්කරුවන් ධනපතියන් ''වන්දිගෙවා ගැනීමේ'' අර්ථයෙන් සමාජවාදය ''සාමකාමී ලෙස'' ජයග්‍රහණයට පත් වීමේ වැඩිම හැකියාව ඇති රටක් විය. එනිසා, ඇතැම් කොන්දේසි යටතේ ධනපතියන් වන්දිගෙවා ගැනීමට කම්කරුවන් ඇත්තෙන්ම නොකැමති නොවනු ඇතැයි මාක්ස් කීවේය. තමන් හෝ සමාජවාදී විප්ලවයේ අනාගත නායකයන් හෝ විප්ලවය කිරීමට අනුගමනය කළ යුතු ආකාර, මාර්ග හා මාධ්‍ය ගැන නියමයක් මාක්ස් විසින් නොකරන ලදී. අළුත් ගැටළු අති විශාල ගණනක් මතු වන වගත්, විප්ලවය අතරවාරයේදී මුළු තත්වයම වෙනස් විය හැකි වගත්, තත්වය සහමුලින්ම සහ බොහෝ විට විප්ලවය සිදු වන විටම වෙනස් විය හැකි වගත් ඔහු මැනවින් දැන සිටියේය.

හොඳයි, සෝවියට් රුසියාව ගැන කිව හැක්කේ කුමක්ද? අඩ ශත වර්ෂයකට පෙර බ්‍රිතාන්‍යයේ සාමකාමී පරිවර්තනයකින් සමාජවාදයට සංක්‍රමණය වීම සිදුවූයේ නම්, එහි ඇති විය හැකි වූ තත්වයන්ට සමාන

සමහර කොන්දේසි මෙහි නිර්ධන පංතිය බලය අල්වා ගත් පසු හා සූරාකන්නන්ගේ ආයුධ සන්නද්ධ ප්‍රතිරෝධය හා කඩාකප්පල් කිරීම් පරාජය කළ පසු වුවද පවතින බව පැහැදිලි නැතිද? එවකට බ්‍රිතාන්‍යයේ බලපැවැති පහත සඳහන් තත්වයන් නිසා එහි ධනපතියන් ස්ථිරවම කම්කරුවන්ට යටත් වන්නට ඉඩ තිබුණි: (1) ගොවි ජනතාවක් නොමැති වීම නිසා (හැත්තෑ ගණන්වල බ්‍රිතාන්‍යයේ කෘෂිකාර්මික ශ්‍රම කරුවන් අතර සමාජවාදය ඉතාමත් සීඝ්‍ර ලෙස පැතිරී ඇතැයි යන බලා පොරොත්තුවක් විය) ජනගහනයේ අති විශාල කොටස කම්කරුවන් හා නිර්ධන පංතිකයන් විය. (2) නිර්ධන පංතිය විශිෂ්ඨ ලෙස වෘත්තීය සමිති තුළ සංවිධානය වී සිටියහ (මේ සම්බන්ධයෙන් එවකට ලෝකයේ ප්‍රධාන තැන ගත් රට බ්‍රිතාන්‍යය විය). (3) දේශපාලන නිදහසේ සංවර්ධනයෙහි ශතවර්ෂාධික කාලයක පුහුණුවක් ලත් නිර්ධන පංතිය තුළ සංසන්දනීය වශයෙන් උසස් සංස්කෘතික මට්ටමක් පැවැත්තේය. (4) හොඳින් සංවිධානය වී සිටි බ්‍රිතාන්‍ය ධනපතියන් අතර බල පැවති, සම්මුති මගින් දේශපාලන සහ ආර්ථික ප්‍රශ්න බේරුම් කර ගැනීමේ පැරණි පුරුද්දක් විය. එවකට බ්‍රිතාන්‍යයේ ධනපතියෝ ලෝකයේ අන් සෑම රටකම ධනපතියන්ට වඩා හොඳින් සංවිධානය වී සිටි යහ. (දැන් මෙම උසස් කම ජර්මනියට මාරු වී තිබේ). බ්‍රිතාන්‍ය ධනපතියන් කම්කරුවන් විසින් සාමකාමී ලෙස යටත් කරනු ලැබිය හැකිය යන අදහස එවකට උත්ගත වීමට හේතු වූයේ මෙම කරුණුය.

අප රටේ වර්තමාන අවස්ථාවේදී බල පවත්වන මූලික වැදගත් කමකින් යුත් කරුණු සමහරක් නිසා (ඔක්තෝබරයේ ජයග්‍රහණය සහ ඔක්තෝබරයේ සිට පෙබරවාරි දක්වා ධනපතියන්ගේ ආයුධ සන්නද්ධ ප්‍රතිරෝධය සහ කඩා කප්පල් ක්‍රියා මර්දනය කිරීම නිසා) මෙම යටත් වීම ඒකාන්ත දෙයක් වී ඇත. නමුත්, රුසියාවේ ජයග්‍රහණයට වැදගත් සාධකය වූයේ, කම්කරුවන්, නිර්ධන පංතිකයන් ජනගහනයෙන් අති බහුතර කොටස වීම නොව, ඔවුන් අතර පැවති උසස් සංවිධාන මට්ටම නොව, දුප්පත් ගොවීන්ගෙන් සහ ක්ෂණික විනාශයට පත් කොටස්වලින් නිර්ධන පංතියට ලැබුණු ආධාරය ය. අවසාන වශයෙන් අපට උසස් සංස්කෘතික මට්ටමක් හෝ සම්මුති ඇති කර ගැනීමේ පුරුද්දක් හෝ නොමැත. මෙම යථාභූත කොන්දේසි ගැන සුපරීක්ෂාකාරී ලෙස සැලකිලිමත් වන්නේ නම්, අපට එක් වරම ක්‍රම දෙකක් අනුගමනය කිරීමට හැකි බව හා සිදුවන බව පැහැදිලි වනු ඇත. ''රාජ්‍ය ධනපති ක්‍රමය'' හා කිසිම සම්බන්ධයක් පැවැත්වීම හෝ කුමණ ආකාරයක වුව සම්මුතියක් ගැන සැලකීම හෝ ප්‍රතික්ෂේප කරන සහ ලාභ ගැරීම, ගොවීන්ට අල්ලස් දීම ආදියෙහි යෙදෙමින් සෝවියට් සභා ගන්නා පියවරයන් දිගටටම කඩා

https://liberationbase.wordpress.com

කප්පල් කරන අසංස්කෘතික ධනපතියන් නිර්දය ලෙස මර්දනය කිරීමට* අප එක් අතකින් කටයුතු කළ යුතුය. අනිත් අතින්, අපි සම්මුති ක්‍රමය උපයෝගි කර ගත යුත්තෙමු. නැතහොත්, ''රාජ්‍ය ධනපති ක්‍රමයට'' උකහ වන, එය ක්‍රියාත්මක කිරීමට සමත් වන සහ කෝටි ගණන් ජනතාවන්ට ඇත්ත වශයෙන්ම භාණ්ඩ සම්පාදනය කරන විශාලතම වර්ගවල ව්‍යවසායයන් සංවිධානය කිරීමේ බුද්ධිය හා පළපුරුද්ද ඇතියවුන් ලෙස නිර්ධන පංතියට ප්‍රයෝජනවත් වන සදචාරවත් ධනපතියන් මුදලට ගැනීමේ කටයුතු කළ යුත්තෙමු.

බුහාරින් බොහෝ පොතපත කියවූ මාක්ස්වාදී අර්ථශාස්ත්‍රඥයෙකි. එනිසා, ඉඳුරාම සමාජවාදය කරා පරිවර්තනය වීම පහසු වීම සඳහාම, මහා පරිමාණ නිෂ්පාදන සංවිධාන රැක ගැනීමේ වැදගත්කම ගැන මාක්ස් කම්කරුවන්ට උගැන්වූ කරුණු ඉතාමත් නිවැරදී බව ඔහුට මතක් විය. ධනපතියන්ට ගෙවීම් කළහොත්, සාමකාමීව යටත් වන ලෙසටත්, සදචාරවත් හා සංවිධානාත්මක ලෙස සමාජවාදය පැත්තට ඒමටත් ඔවුන්ට බල කරන තත්වයක් පවතින්නේ නම්, ඔවුන්ට හරිහැටි ගෙවීම් කර ඔවුන් මිළට ගැනීම ගැන (විශේෂයක් වශයෙන් — එම විශේෂය බ්‍රිතාන්‍යය විය) සිතිය හැකි බව මාක්ස් උගැන් වීය.

නමුත් බුහාරින් රුසියාවේ පවතින වර්තමාන විශේෂ අංග ලක්ෂණ ගැන ගැඹුරට සිතා නොබැලූ නිසා ඔහු නොමග ගියේය. එනම්, අපගේ දේශපාලන ක්‍රමය අතින් ද, කම්කරුවන්ගේ දේශපාලන බලය අතින් ද අප, නැතහොත් රුසියානු නිර්ධන පංතිය, ඕනෑම බ්‍රිතාන්‍යකට හෝ ඕනෑම ජර්මනියකට හෝ වඩා ඉදිරියෙන් සිටින විට, එහෙත්, රාජ්‍ය ධනපති ක්‍රමය හොඳින් සංවිධාන කිරීම අතින් ද අපගේ සංස්කෘතික මට්ටම අතින් ද, සමාජවාදය ''ආරම්භ කිරීමට'' ඇති සූදනම අතින්ද අප ඉතාමත්

* මෙහිදී අපි එක එල්ලේම සත්‍යය පිළිගත යුත්තෙමු. සමාජවාදයේ සාර්ථකත්වය සඳහා නැතිවම බැරි ඒ නිර්දය භාවය අප වෙත ඇත්තේ ඉතා අල්ප වශයෙනි. එය අල්ප වූයේ අපට අධිෂ්ඨානය මදකම නිසා නොවේ. අපට අධිෂ්ඨානය ප්‍රමාණවත් තරම් ඇත. අපට අඩුව තිබෙන්නේ ලාභ ගරන්නන්, වංචා කාරයින් සහ ධනපතියන්, එනම් සෝවියට් සභා අනුමත කළ පියවරයන් උල්ලංඝනය කරන්නන්, සැහෙන සංඛ්‍යාවක්, අවශ්‍ය තරම් ඉක්මණින් අල්වා ගැනීමේ හැකියාව ය. මෙය කිරීමට ''හැකියාව'' ඇති කර ගත හැක්කේ ගිණුම් තැබීම හා පාලනය ස්ථාපිත කිරීමෙනි! උසාවි ප්‍රමාණවත් තරමින් දැඩි නොවීම තවත් කාරණයකි. අල්ලස් ගන්නවුන් වෙඩි තැබීමට නියම කරනවා වෙනුවට ඔවුහු ඔවුන්ට හය මසක සිර දඬුවමක් නියම කරති. මෙම වැරදි දෙකටම ඇත්තේ එකම සමාජමය ප්‍රභව මූලය ය. එනම්, සුළු ධනපති ගති ලක්ෂණයේ බලපෑම සහ එහි නොදැඩි ගතිය ය.

නොදියුණු බටහිර යුරෝපීය රටවත් වඩා පසුබා සිටින විට, එයින් පැන නගින විශෙෂ අංගලක්ෂනය ගැන සිතා නොබැලුවේය. වර්තමාන තත්වයේ එම විශේෂ ස්වභාවය නිසාම, සෝවියට් බලයට සේවය කිරීමට බැඳීමට සහ හැකි විශාලම පරිමාණයෙන් ''රාජ්‍ය'' නිෂ්පාදනය සංවිධානය කිරීමට ආධාර දීමට කැමැති ධනපතියන් අතර සිටින ඉතාමත් සදචාරවත්, ඉතාමත් කුසලතා පූර්ණ, ඉතාමත් දක්ෂ අය ''මිළට ගැනීමේ'' විශේෂ ක්‍රමයක් සහ කම්කරුවන් ඒ අනුව යෝජනා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පැනනගින බව පැහැදිලි නොවේ ද? මෙම විශේෂ තත්වය යටතේ අප වැරදි දෙකක් මග හැරීමට සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතු බවත්, එම වැරදි දෙකම සුළු ධනපති ස්වභාවයේ ඒවා බවත්, පැහැදිලි නොවේ ද? එක් අතකින් අපගේ ආර්ථික ''බලවේග'' සහ අපගේ දේශපාලන ශක්තිය අතර නොගැලපීමක් තිබෙන නිසා අප බලය අල්ලා නොගත යුතුව තිබිණි යයි කීම මරණීය වරදක් වනු ඇත.[42] එවැනි තර්කයක් ඉදිරිපත් කිරීමෙහි සමත් වන්නේ, ඒ ආකාර ''නොගැලපීමක්'' සෑම විටම පවතින බවත්, ස්වභාව ධර්මයේ සංවර්ධනයේදී මෙන්ම සමාජ සංවර්ධනයේදීද එය දක්නට ලැබෙන බවත්, සියළුම රටවල නිර්ධන පංත්තිකයන්ගේ විප්ලවීය සහයෝගය ඇතිව පූර්ණ සමාජවාදය නිර්මාණය කෙරෙනු ඇත්තේ තනි තනිව ගත් කල එක පැත්තකට බරවූ සහ යම් යම් දූර්වලකම් සහිත ප්‍රයත්න මාලාවක් මගින් බවත්, අමතක කරන ''මප්ලර් කාරයෙක්''[43] පමණකි.

අනිත් අතට, ''ඇස් නිලංකාර කරන'' විප්ලවවාදී ජීවගුණයෙන් මෝහනය වන, එහෙත් පරිවර්තනයේ ඉතාමත් දුෂ්කර අවධි ගැන සැලකිල්ලට ගනිමින් නොකඩවාම, කල්පනාකාරී ලෙස සහ උවමනාවෙන් කළ යුතු විප්ලවකාරී වැඩ කිරීමේ හැකියාව නැති සෝෂා කාරයන්ට සහ වදන් හරඹ කරුවන් කැමති පරිද්දෙන් කටයුතු කිරීමට ඉඩ හැරීමද වරදක් බව පැහැදිලි ය.

වාසනාවකට මෙන්, විප්ලවවාදී පක්ෂවල සංවර්ධනයේ සහ ඒවාට විරුද්ධව බොල්ෂෙවික්වාදය කළ අරගලයේ ඉතිහාසය විසින් පැහැදිලි ලෙස වෙන් කොට දැක්වෙන වර්ග පිළිබඳ උරුමයක් අපට ලැබී තිබේ. එම වර්ග අතුරෙන් වාම සමාජවාදී-විප්ලවවාදීහු සහ අරාජිකවාදීහු නරක විප්ලවවාදීන් පිළිබඳ සිත් කාවදින ආදර්ශ වෙති. දැන් ඔවුහු ''දක්ෂිණ බොල්ෂෙවික්වරුන්ගේ'' ''සම්මුතියට'' විරුද්ධව සන්නියක් වැළඳුනු කලෙක මෙන් කෑගසති, හුස්ම හිරවෙන තරමට හා උගුර බැරෑඩි වන තෙක් කෑගසති. නමුත් ''සම්මුතියෙහි'' නරක දෙය කුමක් ද යනුත්, ඉතිහාසය සහ විප්ලවයේ ගමන් මග විසින් ''සම්මුතිය'' යුක්ති යුක්ත

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ලෙස හෙළා දකින ලද්දේ මන්ද යනුත්, සිතා ගැනීමට පුළුවන් කමක් ඔවුනට නැත.

කෙරෙන්ස්කිගේ කාලයේදී සම්මුති ගත වීම යනු බලය අධිරාජ්‍යවාදී ධනපති පංතියට හිමි කර දීමක් හා සමාන විය. බලය පිළිබඳ ප්‍රශ්නය සෑම විප්ලවයකම මූලික ප්‍රශ්නය වන බව මෙහි දී මතක තබා ගත යුතුය. 1917 ඔක්තෝබර්-නොවැම්බර් සමයේදී බොල්ෂෙවික්වරු කොටසක් සම්මුති ගත වීමෙන් අදහස් කෙරුණේ නිර්ධන පංතිය බලය අල්වා ගැනීම ගැන ඔවුන් බිය වූ බව හෝ, එසේ නැතහොත්, වාම සමාජවාදී-විප්ලවවාදීන් වැනි ''අවිශ්වාසදයක සහචරයන්'' සමග පමණක් නොව, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය විසුරුවා හැරීම, බගයෙව්ස්කිල, නිර්දය ලෙස මර්ද-නය කිරීම, සෑම තන්හිම සෝවියට් ආයතන පිහිටු වීම හා රාජ්‍ය සන්තක කිරීමේ සෑම කටයුත්තක්ම වැනි මූලික කටයුතුවලදී-අපට අනිවාරණීය වශයෙන්ම බාධාවක් වන්නට තිබුණු වෙර්නොව්වාදීන් සහ මෙන්ෂෙවික් වරුන් වැනි සතුරන් සමගද සමසේ බලය බෙදු ගැනීමට ඔවුන් කැමැත්තක් දැක්වූ බවය.

දැන් ''අවිශ්වාසදයක සහචරයන්'' නොමැතිව පවා බලය අල්වාගෙන, එය එක පක්ෂයක, එනම්, නිර්ධන පංතියේ පක්ෂය අතෙහි තහවුරු කර තිබේ, බලය බෙදු ගැනීමේ, නැතහොත්, ධනපති පංතිය යටකරන නිර්ධන පංති ආඥාදායකත්වය අත් හැර දැමීමේ ප්‍රශ්නයක් පැන නැග නැති හා කිසිසේත් පැන නැගිය නො හැකි වර්තමාන අවස්ථාවේ සම්මුතිය ගැන කථා කිරීම යනු කටපාඩමෙන් උගත් එහෙත් වටහා නොගත් වචන ගිරා තාලයෙන් පුනරුච්චාරනය කිරීමක් පමණකි. රට පාලනය කිරීමට හැකි සහ පාලනය කළ යුතු තත්වයට පැමිණි අප, ධනපති ක්‍රමය විසින් පුහුණු කරන ලද ඉතාමත් දක්ෂ පිරිස් කුඩා දේපල හිමි ක්‍රමයට විරුද්ධව අපේ පැත්තට දිනා ගැනීමට, වියදම් ගැන අදිමදි නොකර ප්‍රයත්න දරන විට, එය ''සම්මුති'' ගත වීමක් ලෙස විස්තර කිරීමෙන් හෙළිදරව් වන්නේ, සමාජවාදය ගොඩ ගැනීමේ ආර්ථික කර්තව්‍යයන් ගැන සිතීමට හැකියා-වක් කොහෙත්ම නොමැති බව ය.

එනිසා කරේලින් සහ ගේ තමන්ට කළ ''සේවය'' ගැන බුහාරින් සහෝදරයා මධ්‍යම විධායක කාරක සභාවේදී ''ලජ්ජා වීම'' ඔහුගේ ගරුත්වයට හේතු වන නමුදු ''වාම කොමියුනිස්ට්'' උපනතිය හා සම්බන්-ධයෙන් වූ කල, ඔවුන්ගේ අතගත් දේශපාලන සහෝදරවරු ගැන කර තිබෙන ප්‍රකාශය තවමත් බලවත් අනතුරු හැඟවීමක් ලෙසට පවතී.

නිදසුනක් ලෙසට වාම සමාජවාදී-විප්ලවවාදීන්ගේ නිල ප්‍රකාශනය වන ''ස්නාමියා තෘද'',[44] එහි 1918 අප්‍රියෙල් 25 කලාපයෙන් කළ මෙම සාඩම්බර ප්‍රකාශය ගනිමු. ''අපගේ පක්ෂයේ වර්තමාන ස්ථාවරය බොල්-

LIBERATIONBASE

ෂෙවික්වාදයේ තවත් උපනතියක (බුහාරින්, පක්රොව්ස්කි සහ තවත් අය) ස්ථාවරය සමග සම්පාත වන්නේය.'' එසේ නැතහොත්, වෙනත් ලිපිද අතර, අපකීර්තිමත් මෙන්ෂෙවික්වර ඉසුව් විසින් ලියන ලද පහත දැක්වෙන ''ප්‍රවාදය'' ඇතුලත්, මෙන්ෂෙවික්වාදී ''වපිරියොද්'' ප්‍රකාශන-යේ එම දිනයේම කලාපය ගනිමු:

''ආරම්භයේ පටන්ම නියම නිර්ධන පංති ස්වරූපයකින් තොර වූ සෝවියට් බලයේ ප්‍රතිපත්තිය මෑත දී පටන් වඩ වඩාත් විවෘත ලෙසම ධනපති පංතිය සමග සම්මුතිගත වීමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කරමින් පැහැදිලි කම්කරු පංති විරෝධී ස්වභාවයක් ගත්තේය. කර්මාන්ත ජනසතු කිරීමේ මුවාවෙන් ඔවුහු කාර්මික සංගත ව්‍යාපාර ස්ථාපිත කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරති. එසේම, රටේ නිෂ්පාදනීය බලවේගය යළි පණ ගැන්වීමේ මුවාවෙන් ඔවුහු පැය අටේ වැඩ දිනය අවලංගු කිරී-මටද, කෑලි ගණනේ වැඩ ක්‍රමය සහ ටේලර් ක්‍රමයත්, අපලේඛන සහ නරක සහතික මගින් දඬුවම් කිරීමත් ආරම්භ කිරීමට උත්සාහ කරති. නිර්ධන පංතියේ ඉතාමත් වැදගත් ආර්ථික ජයග්‍රහණයන් එයට අහිමි වී යාමේ සහ එය ධනපති පංතියේ අබාධිත සූරාකෑමට ගොදුරු වීමේ තර්ජනය මෙම ප්‍රතිපත්තියෙන් මතුවේ''.

මෙය පුදුම සහගත නොවේ ද?

රුසියානු ධනපතියන්ට රටවල් අල්ලා ගැනීමේ ප්‍රතිඥාව දුන් රහස් ගිවිසුම් වෙනුවෙන් කෙරෙන්ස්කි සමග එක්ව අධිරාජ්‍යවාදී යුද්ධයක් ගෙන ගිය ඔහුගේ හිත මිතුරන්ද, ජූනි 11 දින කම්කරුවන් නිරායුධ කිරීමට තර්ජනය කළ ට්සෙරතෙලිගේ සගයන්ද[45], මහා ශාබ්දික වදන් කඩතුරාවක් කොට ගනිමින් ධනපති පංතියේ පාලනය ආරක්ෂා කළ ලිබෙර්දන්ලා[46] ද වන මේ මිනිසුන්ම නොවේද, ''ධනපති පංතිය සමග සම්මුති ගත වීම'' ගැන, සංගත ව්‍යාපාර පිහිටුවීම ගැන (එනම්, රාජ්‍ය ධනපති ක්‍රමය පිහිටුවීම ගැන!) ටේලර් ක්‍රමය ආරම්භ කිරීම ගැන සෝවියට් බලයට චෝදනා කරන්නේ.

ඇත්ත වශයෙන්ම බොල්ෂෙවික්වරු ඉසුව්ට පදක්කමක් ප්‍රදානය කළ යුත්තාහ. එසේම ඔහුගේ ප්‍රවාදය ධනපතියන්ගේ ප්‍රකෝපකාරී කථා පිළිබඳ නිදර්ශනයක් ලෙසට සෑම කම්කරු සමාජයකම ප්‍රදර්ශනය කිරීම වටී. මේ ලිබෙර්දන්ලා, ට්සෙරතේලිලා සහ ඉසුව්ලා කවුද යනු දැන් කම්කරුවෝ හොඳින් දනිති. කම්කරුවෝ අත් දැකීමෙන් ඔවුන් ගැන දනිති. ධනපති පංතියේ එවැනි අන්තේවාසිකයන් ටේලර් ක්‍රමයට සහ ''සංගත ව්‍යාපාර පිහිටු වීමට'' විරුද්ධවන ලෙස කම්කරුවන් උසිගන්-වන්නේ මන්ද යන්න ගැන සිතා බැලීම ඇත්ත වශයෙන් ම කම්කරුවන්ට ඉතාමත් ප්‍රයෝජනවත් වනු ඇත.

https://liberationbase.wordpress.com

ලිබර්දන්ලාගේ සහ ට්සෙරතේලිලාගේ මිතුරෙක් වන ඉසූව්ගේ "ප්‍රවාදය" "වාම කොමියුනිස්ට්වාදීන්" ගේ පහත සඳහන් "ප්‍රවාදය" සමග සුපරීක්ෂාකාරී ලෙස සංසන්දනය කර බැලීමට පංති විඥනය ඇති කම්කරුවෝ පෙළඹෙති:

"කර්මාන්තය තුළ ධනපතීන්ගේ කළමණාකරණය යළි ස්ථාපිත කිරීම හා සම්බන්ධයෙන් ශ්‍රම විනය ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රම ඵලදායකත්වයේ සැලකිය යුතු වැඩි වීමක් සිදු නොවේ. නමුත් එයින් සිදු වනු ඇත්තේ නිර්ධන පංතියේ පංති ක්‍රියාරම්භකත්වය, ක්‍රියා කාරිත්වය හා සංවිධානය හීන වීමය. කම්කරු පංතිය වහල් කිරීමේ තර්ජනයක් එයින් මතු වේ. එය නිසා නිර්ධන පංතියේ නොදියුණු කොටස් අතර මෙන්ම පෙරමුණු කොටස් අතරද අප්‍රසාදය පැන නගිනු ඇත. "ධනපති කඩාකප්පල් කාරයන්ට" විරුද්ධව නිර්ධන පංතිය අතර බලපවත්වන වෛරය මධ්‍යයේ මෙම ක්‍රමය ක්‍රියාත්මක කරනු පිණිස, කම්කරුවන්ට ප්‍රතිපාක්ෂික ආකාරයකින් සුළු ධනපතියන් කෙරෙහි විශ්වාසය තැබීමට කොමියුනිස්ට් පක්ෂයට සිදු වනු ඇත. මේ ආකාරයෙන් එය නිර්ධන පංතියේ පක්ෂය ලෙසට තමන් විනාශ කර ගනු ඇත" ("කොමියුනිස්ට් අංක 1, පිටු 8, තීරුව 2).

"වාම" වාදීන් උගුලෙහි අසු වී ඇති බවටත්, ඉසූව් ලා සහ ධනපති ක්‍රමයේ වෙනත් ජුදස්ලා විසින් තමන් ප්‍රකෝප කරනු ලැබීමට ඉඩ දී තිබෙන බවටත් මෙය කදිම සාධකයකි. ශ්‍රම විනය ක්‍රියාත්මක කිරීමට පක්ෂ වන්නේ නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණියම බව සහ මෙම විනය අවුල් වියවුල් කර දැමීමට හැකි සියල්ලක්ම කරන්නේ ඉඳුරාම සුළු ධනපති පංතිකයන්ම බවත් දන්නා කම්කරුවන්හට මෙය අගේ ඇති පාඩමක් වන්නේය. ඉහත උපුටා දක්වන ලද "වාම" වාදීන්ගේ ප්‍රවාදය වැනි කථා මහා අපවාදයක් සහ ව්‍යවහාරයෙන් කොමියුනිස්ට්වාදය අත් හැර දැමීමක්ද, සම්පූර්ණයෙන්ම සුළු ධනපති පංතියේ කඳවුරට පලා යාමක් ද වේ.

"ධනපතීන්ගේ කළමණාකරණය යළි ස්ථාපිත කිරීම හා සම්බන්ධයෙන්" — "වාම කොමියුනිස්ට්වාදීන්" "තම ආරක්ෂාව සලසා ගැනීමට" බලාපොරොත්තු වන්නේ මෙවැනි වචනවලිනි. එහෙත්, ප්‍රථමයෙන්ම සෝවියට් බලය "කළමණාකරණය" ධනපතියන් අතට පත් කරන විට කළමණාකරු ගැන පියවරක් පියවරක් පාසා සෝදිසියෙන් සිටීමට කම්කරු කොමිසාර්වරු, නැතහොත්, කම්කරු කාරක සභා පත් කරන අතර එම කොමිසාර්වරු, නැතහොත්, කාරක සභා කළමණාකරුගේ පළපුරුද්දෙන් උගෙන ගන්නා හෙයින් සහ ඔවුනට ඔහුගේ නියමයන්ට විරුද්ධව ආයාචනා කිරීමේ අයිතිය පමණක් නොව සෝවියට් බලයේ

ආයතන මගින් ඔහු ඉවත් කර වීමේ බලය ද ඇති හෙයින් "වාම කොමියුනිස්ට්වාදීන්ගේ" එම ආරක්ෂාව කිසිම වැඩකට නැති එකකි. දෙවැනිව, ධනපතියන්ට "කළමණාකරණය" පවරා තිබෙන්නේ වැඩ කරන විට ඉටු කරන විධායක කාර්යයන් සම්බන්ධයෙන් පමණකි. එසේම වැඩ කිරීම හා සම්බන්ධ කොන්දේසි සෝවියට් සභා විසින් නියම කර තිබෙන අතර, එම කොන්දේසි අවලංගු කිරීමට හා වෙනස් කිරීමට ද පුළුවන. තුන්වැනිව සෝවියට් බලය ධනපතියන්ට "කළමණාකරණය" භාර දෙන්නේ ඔවුන් ධනපතියන් වශයෙන් ගෙන නොව වැඩි වැටුපට සේවය සඳහා බඳවා ගත් කාර්මික ශිල්පීන් සහ සංවිධායකයන් වශයෙන් සලකාය. තවද, සැබැවින්ම මහා පරිමාණ සහ යෝධ ව්‍යවසායවල සංගතවල හෝ වෙනත් ආයතනවල සංවිධායකයන් සහ පළමු පෙළේ කාර්මික ශිල්පීන් අතුරෙන් සියයට අනූනවයක්ම ධනපති පංතියට අයත් බව කම්කරුවෝ හොඳින් දනිති. නමුත්, ශ්‍රම ක්‍රියාදමයේ "කළමණාකරණය" සහ නිෂ්පාදනය සංවිධානය කිරීම සඳහා අපට, නිර්ධන පංති පක්ෂයට පත් කිරීමට සිදු වී තිබෙන්නේ මේ මිනිසුන් මය. එයට හේතුව මෙම විෂයෙහි දී ප්‍රායෝගික පළපුරුද්ද ලැබූ වෙනත් අය නොමැති වීමය. කම්කරුවෝ "වාම" වාදීන්ගේ වදන්වලින්, නැතහොත්, ලිහිල් සුළු ධනපති සංකල්පවලින් නොමඟ යාමට හේතු සාධක වූ ළදරුභාවය ඉක්මවා වර්ධනය වී සමාජවාදය දෙසට ඉදිරියට ගමන් කරමින් සිටිති. ඔවුන් එසේ ඉදිරියට යන්නේ ඉඳුරාම සංගත ව්‍යාපාර ධනපති ක්‍රමයෙන් කළමණාකරණය කිරීම මගිනි; යෝධ යන්ත්‍ර කර්මාන්තය මගිනි; කෝටි ගණනක වාර්ෂික පිරිවැටුමක් ඇති ව්‍යවසායයන් මගිනි; එවැනි නිෂ්පාදන ක්‍රමයක් සහ එවැනි ව්‍යවසායයන් මගින් පමණකි. ඔවුහු මහා පරිමාණ "රාජ්‍ය ධනපති ක්‍රමයට" බිය නොවෙති. සුළු දේපල ආකාරයේ කැබලි වීමට සහ අසංවිධානයට විරුද්ධව තම සෝවියට් බලය විසින් යොද ගනු ලබන තමන්ගේ නිර්ධන පංති අවියක් ලෙසට කම්කරුවෝ එය අගය කරති.

මෙය වටහා ගත නොහැක්කේ පංතියෙන් පිට දැමුනු සහ එනිසා අත්‍යන්තයෙන්ම සුළු ධනපති වූ බුද්ධමතුන්ට පමණකි. "වාම කොමියුනිස්ට්වාදීන්" ගේ කණ්ඩායම එවැන්නකි. ඔවුන්ගේ සහරාවෙහි පහත සඳහන් පරිදි ලියන ඔසින්ස්කි ද එවැන්නෙකි.

"... ඕනෑම ව්‍යවසායයක් සංවිධානය කිරීමේදී සහ කළමණාකරණය කිරීමේදී මුළු ක්‍රියාරම්භකත්වයම "සංගත ව්‍යාපාරවල සංවිධායකයන්" සතුව පවතී. අප කරන්නට යන්නේ ඔවුනට උගැන්වීම, නැතහොත්, ඔවුන් සාමාන්‍ය කම්කරුවන් බවට පත් කිරීම නොවේ. අපි ඔවුන්ගෙන් උගෙන ගැනීමට යන්නෙමු" ("කොමියුනිස්ට්" අංක 1, පිටු 14, තීරුව 2).

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මෙහි උපහාසයට ලක් කිරීමට උත්සාහ කර ඇත්තේ ''සංගත ව්‍යාපාරවල සංවිධායකයන්ගෙන් සමාජවාදය උගෙන ගන්න'' යන මගේ වචනය. -

මෙය විහිළුවක් යයි ඔසින්ස්කි සිතයි. සංගත ව්‍යාපාරවල සංවිධායකයන් ගෙන් ''සාමාන්‍ය කම්කරුවන්'' තැනීමට ඔහුට උවමනා කර තිබේ. ''අවුරුදු පහළොවක්, පමණකි වැඩි නැත?..''[47] යනුවෙන් කවියෙක් සඳහන් කළ වයසේ මිනිසෙකු විසින් මෙය ලියන ලද නම් ඒ ගැන පුදුම වන්නට දෙයක් නැත. නමුත්, මහා පරිමාණ ධනපති ක්‍රමය විසින් නිර්මාණය කරන ලද ඉංජිනේරු කර්මාන්තවල සහ සංස්කෘතියේ ජයග්‍රහණ උපයෝගි කර නොගෙන සමාජවාදයක් ඇති විය නොහැකි බව උගෙන ගත් මාක්ස්වාදියෙකුගෙන් මෙවැනි කථාවක් අසන්නට ලැබීම විමතියට හේතුවකි. මෙහි නම් මාක්ස්වාදයේ සේයාවකුදු නැත.

නැත්තේමය. කොමියුනිස්ට් යන නම දැරීමට තරම් වන්නේ, සංගත ව්‍යාපාරවල සංවිධාකයන්ගෙන් උගෙන නොගෙන සමාජවාදය ඇති කිරීමට නැතහොත් ආරම්භ කිරීමට නොහැකි බව වටහා ගන්නා අය පමණකි. මන්ද යත්, සමාජවාදය යනු හුදෙක් පරිකල්පනයක් නොව, සංගත ව්‍යාපාර කළ නිර්මාණයන් තුළ බලය අල්වා ගත් නිර්ධන පංති පෙරමුණු බල ඇණිය විසින් ඒවා ස්වීකරණය කර ගැනීමක් සහ ක්‍රියාවට නැගීමක් වන හෙයිනි. නිර්ධන පංතියේ පක්ෂය වන අපට, සංගත ව්‍යාපාර ක්‍රියාමාර්ගය අනුව, සංගත ව්‍යාපාර සංවිධානය කර තිබෙන ලෙසට මහා පරිමාණ නිෂ්පාදනය සංවිධානය කිරීමේ දක්ෂකම් හිමි කර ගැනීම පිණිස, ප්‍රථම පෙළේ ධනපති විශේෂඥයන්ගෙන් එම දැනුම ලබා ගැනීම හැර වෙනත් මාර්ගයක් නොමැත.

ධනපති බුද්ධිමතුන්ට සමාජවාදය ''උගැන්වීමේ'' බොළඳ කර්තව්‍යය අප භාරගතහොත් මිස, අප ඔවුන්ට උගැන්විය යුතු කිසිවක් නොමැත. අප කළ යුත්තේ ඔවුනට උගැන්වීම නොවේ, ඔවුන් අසන්තක කිරීමය. (ප්‍රමාණවත් ''අධිෂ්ඨානයකින්'' රුසියාවේ එය කරනු ලැබේ). අප කළ යුත්තේ ඔවුන්ගේ කඩා කප්පල් ක්‍රියාවන් නැවැත්වීම සහ ස්තරයක් හෝ කණ්ඩායමක් ලෙසට ඔවුන් සෝවියට් ලෙසට යටත් කිරීම ය. අනිත් අතට අපි, ළදරු වියේ පසුවන හා ළදරු අවබෝධයක් ඇති කොමියුනිස්ට්වාදීන් නොවන්නෙමු නම්, ඔවුන්ගෙන් උගෙන ගත යුත්තෙමු. කෝටි ගණන් ජනතාවන්ගේ උවමනාවන් ඉටුකිරීමට අවශ්‍යවන යෝධ ව්‍යවසායයන් සංවිධානය කිරීමේ ස්වාධීන වැඩ කටයුතු පිළිබඳ පළපුරුද්දක් නිර්ධන පංති පක්ෂයට හා එහි පෙරමුණු බල ඇණියට නොමැති හෙයින් උගෙන ගත යුතු යමක් ඇත.

රුසියාවේ විශිෂ්ටතම කම්කරුවන්ට මෙය වැටහී තිබේ. ධනපති

සංවිධායකයන්ගෙන්, කළමණාකාර ඉන්ජිනේරුවරුන්ගෙන් සහ කාර්මික ශිල්පීන්ගෙන් උගෙන ගැනීම ඔවුන් පටන් ගෙන ඇත. පහසු දෙයින් පටන් ගනිමින් ක්‍රමාණුකූල ලෙස දුෂ්කර දෑ වෙත යමින් ඔවුන් අනවරථ ලෙස හා ප්‍රවේසම් සහිතව උගෙන ගැනීම ආරම්භ කර ඇත. යකඩ හා වානේ සහ ඉන්ජිනේරු කර්මාන්තවල මෙම කටයුතු වේගයෙන් අඩු බවක් පෙනෙන්නේ නම්, එයට හේතුව එහි දී මතුවන දුෂ්කරතාවයන් අධික වීමය. නමුත්, පේෂකර්ම සහ දුම්කොළ කම් කරුවන්ද, සම් පදම් කරන්නන්ද, පංතියෙන් පිටදැමුනු සුළු ධනපති බුද්ධිමතුන් මෙන් ''රාජ්‍ය ධනපති ක්‍රමයට'' හෝ ''සංගත ව්‍යාපාරවල සංවිධායකයන්ගෙන් උගෙන ගැනීමට'' හෝ බිය වන්නේ නැත. ප්‍රධාන සම් කාරක සභාව සහ මධ්‍යම පේෂ කර්ම කාරක සභාව වැනි මධ්‍යම නායක ආයතනවල සිටින මෙම කම්කරුවෝ, ධනපතියන් සමග එක පෙළට සිටිමින් තම කටයුතු කරති; ඔවුන්ගෙන් උගෙන ගනිති; සෝවියට් බලය යටතේ සමාජවාදයේ ඵළිපත්ත නියෝජනය කරන, එහි ස්ථිර ජයග්‍රහණය සඳහා කොන්දේසිය වන සංගත ව්‍යාපාර පිහිටුවති; රාජ්‍ය ධනපති ක්‍රමය පිහිටුවති.

රුසියාවේ දියුණු කම්කරුවන්ගේ මෙම කටයුතු සහ ඒ සමගම ශ්‍රම විනය ක්‍රියාත්මක කිරීමේ ඔවුන්ගේ කටයුතු ද ආරම්භ වී තිබේ. සමහර ''වාම'' වාදීන්ට නැතිවම බැරි ඝෝෂාව සහ කලබලය නැතිව, එම කටයුතු නිහඬ ලෙස හා ඉදිරියට පැනීමක් නැතිව කෙරී ගෙන යන්නේය. ප්‍රායෝගික අත් දැකීම්වලින් ලැබෙන පාඩම් සැලකිල්ලට ගනිමින්, එම කටයුතු ඉතාමත් ප්‍රවේසම් සහිත ලෙස හා ක්‍රමානුකූල ලෙස ඉදිරියට යයි. අප නිවැරදි මාවතේ ගමන් කරන බවට සහතික වන්නේත්, රුසියාවේ පංති විඥානය ඇති කම්කරුවන් සුළු දේපල ක්‍රමයේ එන ලෙසට කැබලි වීමට හා අසංවිධානයට විරුද්ධව, සුළු ධනපතියන්ගේ විනය රහිත භාවයට විරුද්ධව* අරගලය කරගෙන යන බවට සහතිකය වන්නේත්, නැතහොත්, කොමියුනිස්ට් ක්‍රමයේ ජයග්‍රහණය පිළිබඳ සහතිකය වන්නේත්, මෙම අමාරු වැඩ කටයුතුය; මහා පරිමාණ නිෂ්පාදනය ගොඩ නැගීමට ප්‍රායෝගික වශයෙන් උගෙන ගැනීමේ කටයුතුය.

* ආර්ථික ක්ෂේත්‍රයෙහි දී නිර්ධන පංති ආඥාදායකත්වයේ වැදගත් කම ගැන ප්‍රවාදවල කතු වරයා වචනයක්වත් කියා නොතිබීම ඉතාමත් ස්වභාව නිරූපීය. එහි සඳහන් කෙරෙන්නේ ''සංවිධානය'' යනාදිය ගැන පමණකි. නමුත් ආර්ථික සම්බන්ධකම් විෂයෙහි දී කම්කරුවන්ගේ ආඥාදායකත්වය මග හරින සුළු ධනපතියෝද එය පිළිගනිති. ධනපති ක්‍රමයේ අඩිතාලම්වලට විරුද්ධව එල්ලකර තිබෙන නිර්ධන පංති විප්ලවයේ මෙම ''අරටුව'' මෙම අවස්ථාවේ දී ''අමතක කිරීම නිර්ධන පංති විප්ලවවාදියෙකුට කිසිසේත්ම නොකළ හැකිය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

VI

අවසාන වශයෙන් කරුණු දෙකක් එකතුකරමු.

1918 අප්‍රියෙල් 4 දින ''වාම කොමියුනිස්ට්වාදීන්'' සමග තර්ක කිරීමේ දී (''කොමියුනිස්ට්'' අංක 1, පිටු 4, පාසටහන බලන්න) මම එක එල්ලේම ඔවුන්ට මෙසේ කීවෙමි: ''දුම්රිය ආඥාවෙහි[48] ඇති ඔබ නොකැමති දේ මොනවාදැයි පැහැදිලි කරන්න; එයට ඔබේ සංශෝධන ඉදිරිපත් කරන්න. එසේ කිරීම නිර්ධන පංතියේ සෝවියට් නායකයන් ලෙස ඔබගේ යුතුකම වන්නේය. ඔබ එසේ නොකරන්නෙහි නම්, ඔබ කියන්නක් හුදෙක් හිස් වදන් පමණක් වන්නේය.''

ප්‍රථම ''කොමියුනිස්ට්'' කලාපය 1918 අප්‍රියෙල් 20 දින නිකුත් විය. නමුත්, ''වාම කොමියුනිස්ට්වාදීන්'' සිතන ලෙසට දුම්රිය ආඥාව වෙනස් විය යුත්තේ හෝ සංශෝධනය විය යුත්තේ හෝ කෙසේද යන්න ගැන එහි එක වචනයක් වත් නොවීය.

''වාම කොමියුනිස්ට්වාදීහු'' ඔවුන්ගේ ම නිශ්ශබ්ද තාවය විසින් හෙළා දකිනු ලැබ සිටිති. ඔවුන් කළේ නොයෙක් ආකාරයේ අවලාද නගමින් දුම්රිය ආඥාවට පහර දීම පමණකි. (අංක 1 හි පිටු 8 සහ 16). ආඥාව වැරදි නම් එය සංශෝධනය කළ යුත්තේ කෙසේ ද?'' යන ප්‍රශ්නයට ඔවුන් නියම පිළිතුරක් දුන්නේ නැත.

ඒ ගැන විස්තර කිරීමක් අවශ්‍ය නැත. දුම්රිය ආඥාව ගැන කරන එවැනි ''විවේචන'' එක්කෝ ''ඉසුව්වාදී'' විවේචන ලෙසට, නැතහොත්, පුහු වදන් හරඹයක් ලෙසට පංති විඥානය ඇති කම්කරුවන් විසින් විස්තර කෙරෙනු ඇත (එම ආඥාව අපගේ ක්‍රියමාර්ගය, දැඩි භාවයේ ක්‍රියාමාර්ගය, ආඥාදායකත්වයේ ක්‍රියා මාර්ගය, නැතහොත් නිර්ධන පංති විනයේ ක්‍රියාමාර්ගය පිළිබඳ නියම නිදර්ශනයකි.).

දෙවැනි කරුණ. මගේ ''රාජ්‍යය සහ විප්ලවය'' යන පොත ගැන බුහාරින් සහෝදරයා ලියූ වර්ණනාත්මක සමාලෝචනයක් ''කොමියු-නිස්ට්'' පළමුවැනි කලාපයේ පළවිය. නමුත්, බුහාරින් වැනි අයගේ අදහස් ගැන මා කොතරම් අගය කළත් , මෙම සමාලෝචනයේ අංගලක්ෂණ නිසා එයින් ඛේදජනක සහ වැදගත් කරුණක් හෙළිදරව්වන බව නොකියා සිටීමට මගේ හෘදය සාක්ෂිය මට ඉඩ නොදේ. බුහාරින් නිර්ධන පංති ආඥාදායකත්වය ගැන සලකා බලන්නේ අතීතයේ ස්ථාවරයෙන් මිස අනාගතයේ ස්ථාවරයෙන් නොවේ. රාජ්‍ය පිළිබඳ ප්‍රශ්නයේදී නිර්ධන පංති විප්ලවවාදියාට සහ සුළු ධනපති විප්ලවවාදියාට පොදු විය හැකි දෙය සටහන් කරන බුහාරින් ඒ ගැන අවධාරණය කරයි. නමුත් ඒ දෙදෙන,

එකෙකුගෙන් අනිකා වෙන් කරන ඒ නියත කාරණයම බුහාරින්ට ''අමතක'' විය.

පැරණි රාජ්‍ය යන්ත්‍රය ''සුන් කර'' සහ ''පුපුරුවා'' දැමිය යුතුයයිද, ''අවසාන සහ සම්පූර්ණ වශයෙන්''ධනපති පංතියේ ''බෙල්ල අඹරවා දැමිය'' යුතු යයිද යනාදිය සටහන් කරන බුහාරින් ඒ ගැන අවධාරණය කරයි. වියරු වැටුනු සුළු ධනපතියන්ට ද මෙය අවශ්‍යව තිබිය හැක. 1917 ඔක්තෝබරය හා 1918 පෙබරවාරි අතර අපගේ විප්ලවය දැනටමත් ප්‍රධාන වශයෙන් කර තිබෙන්නේ මෙය ය.

එහෙත් ඉතාමත් විප්ලවවාදී සුළු ධනපතියාට වුවද අකමැති දෙය පංති විඥානය ඇති නිර්ධන පංති විප්ලවවාදියාට අවශ්‍ය වන දෙය, අපගේ විප්ලවය තවමත් ඉටු කර නොමැති දෙය, ආදිය ගැන මගේ පොතෙහි සඳහන් කර ඇත්තෙමි. මෙම කර්තව්‍ය ගැන, හෙට ඉටු කළයුතු කර්තව්‍යය ගැන බුහාරින් කිසි දෙයක් නොකීවේය.

මා මෙම කරුණ ගැන නිහඬ නොවීමට වැදගත් හේතු තිබේ. ඒ මෙසේය. ප්‍රථමයෙන්ම, ඊයේ කර්තව්‍යයන්ට නොව හෙට ඉටු කිරීමට තිබෙන කර්තව්‍යයන් ගැන වැඩි අවධාරණයක් යෙදීම කොමියුනිස්ට්වාදි-යෙකුගෙන් බලා පොරොත්තු වන දෙයකි. දෙවැනිව, මගේ පොත ලියන ලද්දේ, බොල්ෂෙවික්වරුන් බලය අල්ලා ගැනීමට පෙර වූ අතර, ''ඔව්, ඇත්ත තමයි, බලය අල්ලා ගැනීමෙන් පසුව අපි විනය ගැන කථා කරන්-නෙමු...'' යන වැනි පහත් සුළු ධනපති තර්කවලින් බොල්ෂෙවික් වරුන්ට සංග්‍රහ කිරීමට නො හැකි කාලයක් විය.

''ප්‍රචණ්ඩ භාවය සහ යටත් කිරීම නොමැතිව, සමාජ ජීවිතයේ මූලික කොන්දේසි පිළිපැදීමට ජනතාව පුරුදු වනු ඇති හෙයින්... සමාජවාදය කොමියුනිස්ට් ක්‍රමය දක්වා සංවර්ධනය වනු ඇත...''(රාජ්‍යය සහ විප්ලවය පිටු 77–78; බලය අල්ලා ගැනීමට පෙර ''මූලික කොන්දේසි'' ගැන සාක-ච්ඡා කරන ලද බව මෙයින් පෙනේ).

''... ප්‍රජාතන්ත්‍රවාදය හැකිළී යාමට පටන් ගනු ඇත්තේ ඉන් පසුව පමණකි...'' එවිට, ''ශතවර්ෂ ගණන් තිස්සේ දන්නා ලද සහ අවුරු දහස් ගණන් තිස්සේ නැවත නැවතත් කියන ලද ආප්තෝප දේශවල ඇතු ලත් සමාජ චර්යාව ගැනවූ මූලික නීති පිළිගැනීමට ජනතාව ක්‍රමානුකූල ලෙස පුරුදු වූ කල, බල කිරීම නොමැතිව, බලහත්කාරය නොමැතිව රාජ්‍යය නැමති බලහත්කාරයේ යන්ත්‍රය නොමැතිව එම නීති පිළි පැදීමට ඔවුන් පුරුදු වනු ඇත.'' (එම කෘතිය, පිටු 84; නැවත නැවතත් කියන ලද ආප්තෝපදේශ ගැන බලය අල්වා ගැනීමට පෙර සඳහන් කරන ලද බව මෙයින් පෙනේ).

''කොමියුනිස්ට් ක්‍රමයේ ඉහළ අදියර (හැම එකාගෙන්ම ඔහුගේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හැකියාව අනුව, හැම එකාටම ඔහුගේ අවශ්‍යතාවය අනුව) ඇති කිරීම සඳහා පැවතිය යුත්තේ වර්තමෘන ශ්‍රම ඵලදායකත්වය නොවේ; පොම්යාලොව්ස්කි ගේ කථාවල එන සෙමනේරි[49] ශිෂ්‍යයන් මෙන් හුදෙක් විනෝදයට මහජන වස්තුව විනාශ කිරීමෙහි හා දීමට නොහැකි දෙයක්ම ඉල්ලීමෙහි සමත් වර්තමාන සාමාන්‍ය ස්වභාවයේ ජනයා නොවේ.'' (එම කෘතිය පිටු 91).

''කොමියුනිස්ට් ක්‍රමයේ ඉහළ අදියර එන තෙක් ශ්‍රම ප්‍රමාණය සහ පාරිභෝජන ප්‍රමාණය හා සම්බන්ධයෙන් සමාජය සහ රාජ්‍යය විසින් දැඩිතම පාලනයක් පවත්වා ගත යුතුයයි සමාජවාදීහු කියති'' (එම කෘතිය).

''කොමියුනිස්ට් ක්‍රමයේ ප්‍රථම අදියර සුමට ලෙස ක්‍රියාත්මක වීමට, නිසි ලෙස ක්‍රියාත්මක වීමට ප්‍රධාන වශයෙන් අවශ්‍ය වන්නේ ගිණුම් තැබීම සහ පාලනය ය. (එම කෘතිය, පිටු 95) එසේම මෙම පාලනය ස්ථාපිත කළයුත්තේ ''ඉතා සුළු පිරිසක් වන ධනපති අල්පතරය, නැතහොත් ස්වකීය ධනපති ගති සිරිත් රැක ගැනීමට කැමති මහත්වරුන් සම්බන්ධයෙන් පමණක් නොව, ''ධනපති ක්‍රමය විසින් ඉතාමත් නරක ලෙසට දූෂණය වී සිටින කම්කරුවන්'' (එම කෘතිය-පිටු 96) හා ''පරපුට්ටන්, එනම්, පොහොසතුන් ගේ, වංචාකාරයින් ගේ සහ ධනපති සම්ප්‍රදායයන් රකින වෙනත් ආරක්ෂකයන් සම්බන්ධයෙන් ද වේ.'' (එම කෘතිය).

බුහාරින් මෙය අවධාරණය නොකිරීම සැලකිල්ලට ගත යුතු කරුණකි.

1918 මැයි 5

1918 මැයි 9, 10 හා 11 දිනවල ''ප්‍රාව්දා'', අංක 88, 89 හා 90 කලාපවල පලකරන ලදී

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 36, පිටු 283–314

වර්තමාන දේශපාලන තත්වය ගැන ප්‍රවාදය[50]

I

අධිරාජ්‍යවාදී බලවතුන් විසින් වටකරනු ලැබ තිබෙන සෝවියට් සමූහාණ්ඩුවේ ජාත්‍යන්තර තත්වයෙහි අන්ත අස්ථිර භාවය ගැන බොල්ෂෙවික් පුවත්පත්වල නිතර පෙන්නුම් කර තිබේ. එමෙන්ම සෝවියට් රජයේ ඉහළ මණ්ඩලවල යෝජනාවලින් ද එය පිළිගෙන තිබේ.

බාහිර සහ අභ්‍යන්තර යන දෙ ආකාරයේ ම හේතු සාධක නිසා පසු ගිය දින කීපය තුළ, එනම්, 1918 මැයි මස ප්‍රථම දින දහය තුළ දේශපාලන තත්වය අතිශයින් ම අවදානම් සහිත වී ඇත.

පළමුව, ජපනුන්ගේ ආධාර ලබන (සෙම්යානව් සහ වෙනත් අයගේ) ප්‍රතිවිප්ලවවාදී බලවේගයන්ගේ ඍජු ප්‍රහාරය ඈත පෙරදිග බලවත් කර තිබේ. එමෙන්ම, ඒ හා සම්බන්ධව, රුසියාවට අවසාන නිවේදනයක් කරමින්, එක්කෝ ජර්මනියට විරුද්ධව යුද්ධ කරන ලෙස හෝ එසේ නැතහොත් ස්වකීය ආධාරය ලබන ජපන් ආක්‍රමණයක් ඇති වන බව කීමට මුළු මහත් ජර්මන් විරෝධී සභාගයේ ම එකඟත්වයක් ඇති වීමේ ඉඩ කඩ පෙන්නුම් කරන ලකුණු ගණනාවක් ඇත.

දෙවැනිව, බ්‍රෙස්ට් ගිවිසුමෙන් අනතුරුව, ජර්මනියේ යුද්ධ පක්ෂය පොදු වශයෙන් එහි දේශපාලනයෙහි බලවත් වී ඇත. එනිසා, රුසියාවට වහාම ප්‍රහාරයක් දීමේ ප්‍රශ්නය හා සම්බන්ධයෙන් මෙම පක්ෂය ඕනෑම අවස්ථාවකදී බලවත් වීමට, එනම්, රුසියාවේ තවත් අළුත් ප්‍රදේශ අත්පත් කර ගැනීමට ප්‍රයත්න දරන නමුත් මෙම අවස්ථාවේ ඇය සමග සාමය අපේක්ෂා කරන සහ පොදු ප්‍රහාරයක් නොදීමේ අනිත් ජර්මන් ධනපති-අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිය පරාජය කර යුද්ධ පක්ෂය ජය ගැනීමට ඉඩ තිබේ.

තුන්වැනිව, මුළු රුසියාවේම ධනපති කොටස් වලට අයත් කැඩෙට්-ඔක්තෝබර්වාදීන්ගේ[51] ආධාරය ඇතිව සහ ජර්මන් හමුදවල ආධාරය ඇතිව, උක්‍රේනියාවේ ධනපති ඉඩම්හිමි රාජාණ්ඩුවාදය යළි ස්ථාපිත

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කිරීම නිසා, රුසියාවේ ප්‍රතිවිප්ලවයට විරුදධ අරගලය උත්සන්න වීමටත්, ප්‍රති විප්ලවවාදීන්ගේ සැලසුම් උනන්දුමත් වීමට හා ඔවුන් ගේ ධෛර්යය වැඩි වීමටත් හේතුවේ.

සිව් වැනිව, අසංවිධාන වූ ආහාර සම්පාදන තත්වය අතිශයින්ම උග්‍ර වීම නිසා බොහෝ තැන්වල නියම දුර්භික්ෂය ඇති වී තිබේ. එයට හේතු වී තිබෙන්නේ අප දොන් නදී බඩ රස්තොව් ප්‍රදේශයෙන් වෙන් කරනු ලැබීමත්, ධාන්‍ය ඒකාධිකාරය කඩා කප්පල් කිරීමට සුළු ධනපතියන් සහ ධනපතියන් පොදුවේ දරන ප්‍රයත්න සහ ඊට සමගාමී ලෙස එම තැත් දැරීම්, ප්‍රයත්නයන්, උත්සාහයන් කෙරෙහි පාලන පංතිය, එනම්, නිර්ධන පංතිය දක්වන විරුද්ධත්වය ප්‍රමාණවත් තරම් දැඩි, විනය සම්පන්න හා නිර්දය නොවීමත් යන දෙකම ය.

II

සෝවියට් බලයේ විදේශ ප්‍රතිපත්තිය කිසි ලෙසකින් හෝ වෙනස් නොකළ යුතුය. අපගේ යුද්ධ කටයුතු පිළිබඳ සූදානම් තවමත් සම්පූර්ණ වී නැත. එනිසා අපගේ පොදු සටන් පාඨය කලින් සේම පවතිනු ඇත. එනම් උපක්‍රමීය ලෙස මග හැරී ම, පසු බැසීම, අපගේ කාලය එනතෙක් සිටීම සහ අපගේ මුළු ශක්තියෙන්ම සූදනම් වීමේ කටයුතු දිගටම කරගෙන යාම ය.

එක අධිරාජ්‍යවාදී සභාගයකට විරුද්ධව තවත් අධිරාජ්‍යවාදී සභාගයක් සමග යුද්ධ ගිවිසුමකට එළඹීමෙන් සෝවියට් බලයේ පදනම දුර්වල නොකර, එය ශක්තිමත් කිරීමට සහ ඕනෑම අධිරාජ්‍යවාදී බලයක ප්‍රහාරය අකර්මන්‍ය කිරීමට හැකි අවස්ථාවක, එවැනි ගිවිසුමක් ඇති කර ගැනීම අප සාමාන්‍ය වශයෙන් ප්‍රතික්ෂේප නොකරන නමුත්, මෙම මොහොතෙහිදී ඉංග්‍රිසි-ප්‍රංශ සභාගය සමග යුද්ධ ගිවිසුමකට එළඹීමට අපට පුළුවන් කමක් නැත. මක්නිසාද යත් ඔවුන්ට වැදගත් වන්නේ ජර්මන් හමුද බටහිරෙන් වෙනතකට යොමු කිරීමය. ඔවුන් එසේ කිරීමට බලාපොරොත්තු වන්නේ ජපන් යුද්ධ හමුද ගණනාවක් යුරෝපීය රුසියාව අභ්‍යන්තරය දක්වා ඉදිරියට එවීමෙනි. මෙහි අර්ථය වනු ඇත්තේ සෝවියට් බලය සම්පූර්ණයෙන් ම බිඳ වැටීම හෙයින් එය අපට පිළිගත නොහැකි කොන්දේසියකි. ඉංග්‍රිසි-ප්‍රංශ සභාගය අප වෙත එවැනි අවසාන තර්ජනාත්මක නිවේදනයක් එවතත් අපි එය ප්‍රතික්ෂේප කළ යුත්තෙමු. අප එසේ කළ යුත්තේ, ජර්මන්වරු පෙට්‍රොග්‍රෑඩ්, මොස්කව් සහ යුරෝපීය රුසියාවේ විශාල කොටසක් අල්ලා ගැනීමේ තර්ජනයට වඩා පහසුවෙන් ජපනුන්ගේ ඉදිරිගමනක තර්ජනය අකර්මන්‍ය කළ හැකි (නැතහොත් වඩාත් දීර්ඝ කාලයකට ප්‍රමාද කළ හැකි) හෙයිනි.

III

වර්තමාන අවස්ථාවේදී සෝවියට් බලයේ විදේශ ප්‍රතිපත්තියේ කර්තව්‍යයන් ගැන සලකා බැලීමේ දී,අඥන නැතහොත් ඉක්මන් කාරී පියවරයන් ගැනීමෙන් ජපානයේ හෝ ජර්මනියේ යුද්ධ පක්ෂවල අන්තවාදී කොටස්වලට ආධාර කාරී නොවීම පිණිස ඉමහත් ප්‍රවේසම, සුපරීක්ෂාකාරිත්වය හා ඉවසීල්ල ඇතිව කටයුතු කළ යුතුය.

සත්‍ය කාරණය නම්, මෙම රටවල් දෙකෙහිම යුද්ධ පක්ෂවල අන්තවාදී කොටස්, රුසියාවේ මුළු දේශ භූමියම අත්පත් කර ගැනීමේ සහ සෝවියට් බලය පෙරළා දැමීමේ අරමුණෙන් ඇයට විරුද්ධව වහාම පොදු ප්‍රහාරයක යෙදීමට පක්ෂව සිටීමය. මෙම අන්තවාදී කොටස් ඕනෑම මොහොතක ප්‍රබල වන්නට ඉඩ තිබේ.

එසේ වුවත්, අනිත් අතට, ජර්මන් අධිරාජ්‍යවාදී ධනපති පංතියේ බහුතරය වර්තමාන අවස්ථාවේ එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට විරුද්ධ වන බව සුප්‍රකට කරුණකි. එයට පැහැදිලි හේතුව වන්නේ, යුද්ධය නිසා යුද්ධ හමුද බටහිරෙන් වෙන අතකට යොමු වන අතර, දැනටමත් ජර්මනිය තුළ දැනෙන්නට තිබෙන අභ්‍යන්තර අස්ථාවරත්වය වැඩි වීමට එයින් ඉඩ ලැබෙන බැවිනි; එසේ වූ කල, කැරළි සහිත නැගිටීම් පැතිරී ගිය, නැතහොත්, දුම්රිය මාර්ග වලට හානි සිදුවූ පෙදෙස්වලින් ද, ධාන්‍ය වගා නොකිරීමෙන්ද ආදියෙන් අමුද්‍රව්‍ය ලබා ගැනීම අපහසු වන හෙයිනි.

රුසියාවට පහර දීමට ජපනුන්ගේ ඇති උද්යෝගයට බාධක වන සාධකද ඇත. එක් අතකින් චීනයේ ව්‍යාපාරයෙන් සහ කැරළිවලින් ඔවුන් කෙරෙහි එල්ල වන අන්තරාය සහ අනිත් අතින්, ජපානය ශක්තිමත් වීම ගැන බිය වන සහ සාමකාමී තත්වයන් යටතේ වඩාත් පහසුවෙන් රුසියාවෙන් අමුද්‍රව්‍ය ලබා ගැනීමට බලාපොරොත්තු වන ඇමෙරිකාවේ යම් යම් විරුද්ධතාවයන්ද එම බාධාකාරී සාධක වෙති.

ජර්මනිය සහ ජපානය යන දෙරටෙහිම යුද්ධ පක්ෂවල අන්තවාදී කොටස් ඕනෑම මොහොතක බලවත් වීමට බොහෝ ඉඩ තිබෙන බව නොකිව මනා ය. ජර්මනියේ විප්ලවය හට ගන්නා තෙක් එම කොටස් බලවත් නොවන බවට සහතිකයක් නොමැත. ඇමෙරිකාවේ ධනපතියන් ජපන් ධනපතියන් සමග කුමන්ත්‍රණ කිරීමට හෝ ජර්මන් ධනපතියන් සමග ජපන් ධනපතියන් කුමන්ත්‍රණ කිරීමට හෝ ඉඩ ඇත. එනිසා ඉතාමත් බලවත් ලෙස යුද්ධය සඳහා සූදනම් වීම අපගේ අනිවාර්ය යුතුකම වන්නේය.

සාමය රැක ගැනීමේ ස්වල්පතම අවස්ථාවක් තිබිය දී හෝ ප්‍රදේශ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමහරක් යටත්, නැතහොත්, අහිමි වන තත්වය යටතේ හෝ වුව, පින්ලන්තය, උක්‍රෙනියාව සහ තුර්කිය සමග සාමයක් ඇති කර ගැනීමට අවස්ථාවක් තිබිය දී අධිරාජ්‍යවාදී රටවල යුද්ධ පක්ෂවල අන්තවාදී කොටස්වලට ආධාරකාරී විය හැකි එකද පියවරක් වත් නො ගැනීමට අපි වග බලා ගත යුත්තෙමු.

IV

දුර්භික්ෂයට විරුද්ධව සටන් කිරීමේ දී මෙන්ම, යුද්ධය සඳහා ශක්තිමත් ලෙස පුහුණු වීමේදී ද ප්‍රධාන කර්තව්‍යය වන්නේ සංවිධාන කිරීම ය.

ආහාර සම්පාදනයේ දුෂ්කරතාවයන් ජය නොගත හොත්, ජනතාවට පාන් සැපයීම නිසි ලෙස නොකළහොත්, දුම්රිය සේවා කටයුතු තරයේ ක්‍රමාණුකූල නොකළහොත්, වැඩ කරන ජනතාව අතර (ඉහළ තැන්වල පමණක් නොව) නියම අයෝමය විනයක් ඇති නොකළ හොත්, බරපතල ලෙස යුද්ධය සඳහා සූදනම් වීමක් කිසිසේත් සිදුවිය නොහැකිය. නමුත් අප ඉතාමත් නොදියුණු තත්වයේ සිටින්නේ මෙම ක්ෂේත්‍රයන්හි ය.

මෙම සත්‍යය ගැන වැටහීමකින් තොරව සිටීම පිළිබඳව ලොකුම වරද කරුවන් වන්නේ ''කැරළි ගසා නැඟී සිටීමේ කාරක සභා'' ගැන වේගයෙන් ගුගුරන සහ ''ආයුධ ගනිව්'' යනා දී වශයෙන් බෙරිහන් දෙන වාම සමාජවාදී-විප්ලවවාදී සහ අරාජිකවාදී කොටස් වෙති. එවැනි ගිගුරුම් සහ බෙරිහන් දීම් යනු මෝඩකමෙහි අන්තය ය. එසේම එය ශෝක ජනක, අප්‍රියකර සහ පිළිකුල් සහගත වදන් හරඹයක්ම වන්නේය. යුද්ධ පුහුණුව අරඹන ලෙස හා ආයුධ සන්නද්ධ වන ලෙස ජනතාව පෙළඹවීමට මධ්‍යම සෝවියට් බලයට හැකි සියල්ලක්ම එය කරමින් තිබිය දී, අපට ගණන් ගැනීමට හා බෙදහැරීමට නොහැකි තරමට ආයුධ තිබිය දී, ආර්ථික විනාශය හා විනය විරහිත භාවය නිසාම, තිබෙන ආයුධ වලින් ප්‍රයෝජන ගැනීමෙන් අප වලකින තත්වයක් හා පුහුණුව සඳහා යොදා ගත හැකි වටිනා කාලය අනිවාර්ය ලෙස ම අපතේ යවන තත්වයක් පවතිද්දී ''කැරළි ගසා නැඟී සිටීම'' හා ''කැරළි ගසා නැඟී සිටීමේ කාරක සභා'' ගැන කථා කිරීම විකාරයකි.

බරපතල යුද්ධයක් සඳහා උත්සන්න ලෙස පුහුණු වීම හිටි අඩියේ පැන නගින ආවේගයෙන්, යුද්ධ ඝෝෂාවකින්, නැතහොත් සටන් කාමී සටන් පාඨයකින් කළ හැකි දෙයක් නොවේ. ඒ සඳහා බහුජන පරිමාණයෙන් දීර්ඝ වශයෙන්, උත්සන්න ලෙස; අනවරථ ලෙස සහ විනය

සම්පන්නව කටයුතු කිරීම අවශ්‍ය වේ. මෙය වටහා ගැනීමට නොකැමතිවන වාම සමාජවාදී-විප්ලවවාදී සහ අරාජිකවාදී කොටස් වලට විරුද්ධව අපි නිර්දය ලෙස කටයුතු කළ යුත්තෙමු. අපගේ නිර්ධන පංතික කොමියුනිස්ට් පක්ෂයේ යම් යම් කොටස්වලට ඔවුන් ගේ සන්නි රෝගය බෝ කිරීමට ඉඩ නොදිය යුත්තෙමු.

V

ඉහත සටහන් තත්වයන් හේතු කොට ගෙන පසු ගිය දින කීපය තුළ හිස ඔසවා සිටින ධනපතියන්ට විරුද්ධව නිර්දය අරගලයක් කිරීමත්, හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කිරීම, පුවත්පත් තහනම් කිරීම, නායකයන් අත් අඩංගුවට ගැනීම යනාදියත් අත්‍යාවශ්‍ය වී තිබේ. ධාන්‍ය අතිරික්තයන් නොදී තබා ගන්නා සහ ධාන්‍ය ඒකාධිකාරය කඩ කරන ගම්බද ධනපතියන්ට විරුද්ධව ගෙන යන යුද්ධමය ව්‍යාපාරය තරමටම මෙම පියවරයන් ගැනීම ද වැදගත් වන්නේය. නිර්ධන පංතිය අයෝමය විනයක් ඇතිකර ගැනීම හැර ප්‍රතිවිප්ලවයෙන්වත්, සාගතයෙන්වත් මිදීමේ වෙනත් මාර්ගයක් නැත්තේය.

ධනපතියන්, පසු ගිය දින කීපය තුළ බොරු ප්‍රචාර මගින් තැතිගැන්ම පතුරුවා හරිමින්, එය නිර්ධන පංති බලයට විරුද්ධව ආයුධයක් වශයෙන් ඉතාමත් දක්ෂ ලෙස හා කපටි ලෙස උපයෝගි කර ගනිමින් සිටි බව විශේෂයෙන්ම මතක තබා ගත යුතුය. අපේ සහෝදරවරු සමහර දෙනෙක්, වාම සමාජවාදී-විප්ලවවාදී සහ අරාජිකවාදී කොටස්වල විප්ලවවාදී වදන් කෙරෙහි වැනෙන සහගත ආකල්පයක් දක්වන අය විශේෂයෙන්ම, තමන් මාවතෙන් ඉවතට යොමු වීමට ඉඩ දී ඇත; බොරු ප්‍රචාරවලින් තැතිගැන්මට පත්ව ඇත; නැතහොත්, ළඟ එන අන්තරාය ගැන සාධාරණ සහ අවශ්‍ය ලෙස කළයුතු අනතුරු හැඟවීමත්, තැතිගැන්ම පැතිරවීමත් අතර සීමාව සැලකිල්ලට ගැනීමෙහි අසමත්ව ඇත.

රුසියාවේ පවතින මුළු මහත් ආර්ථික සහ දේශපාලන තත්වයේම මූලික විශේෂ අංග ලක්ෂණ තරයේ සිත්හි තබා ගත යුත්තේය. මෙම අංග ලක්ෂණ නිසා කඩා පැනීම්වලින් අපගේ විප්ලවයට ආධාරයක් ලබා ගත නො හැකි ය. බටහිර විප්ලවය ප්‍රමාද වීමෙන් සෝවියට් බලය හමුවේ නොවැලැක්විය හැකි ලෙසට මතු වී තිබෙන පරිවර්තනයේ ඉතාමත් දුෂ්කර සහ අන්තරාදයක අවස්ථාවක් වන මෙම වර්තමාන මොහොතේ දී, සෝවියට් බලය ආරක්ෂා කළ හැක්කේ, දමරිකයන්ට, කුලාකයන්ට හා අසංවිධාන කරන්නන්ට විරුද්ධව නිර්දය පියවරයන් ගැනීම ඇතුළ-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ත්ව අයෝමය නිර්ධන පංති විනයක් ස්ථාපිත කිරීම සඳහා සංයමයෙන් සහ ඉවසීමෙන් යුතුව වැඩ කිරීමෙන් පමණකැයි යන සත්‍යය ප්‍රථමයෙන්ම අපි තරයේ අවබෝධ කර ගත යුත්තෙමු. එසේම එම අවබෝධය සියළුම කම්කරුවන්ට දීමට උත්සාහ දැරිය යුත්තෙමු.

1918 මැයි 12 හෝ 13 දින ලියන ලදී
1929 දී ලෙනින් කෘති එකතුවේ හි ප්‍රථමයෙන් පළ කරන ලදී

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 36, පිටු 322-326

දුර්භික්ෂය ගැන

(පෙට්‍රොග්‍රෑඩ් කම්කරුවන්ට ලිපියක්)

සහෝදරවරුනි, ඔබගේ නියෝජිතයෙක් සහ පක්ෂයේ සාමාජික සහෝදරයෙක් ද වන, පුතිලව් කර්මාන්ත ශාලාවේ කම්කරුවෙක් දින කීපයකට පෙර මා හමුවීමට පැමිණියේය. මෙම සහෝදරයා පෙට්‍රොග්‍රෑඩ් නගරයේ පවතින දුර්භික්ෂය ගැන ඉතාමත් සංවේග ජනක විස්තරයක් කළේය. කාර්මික පළාත් බොහොමයකම තත්වය එසේම ඛේදජනක බවත්, කෘෂිරතර සාගතය පොදු වශයෙන් කම්කරුවන්ගේ සහ දුප්පතුන්ගේ දෙරට තට්ටු කරන තත්වයක් පවතින බවත්, අපි සියළු දෙනාම දනිමු.

මෙවැනි තත්වයක් පවතින අතරම, ඒ හා සමගම, ධාන්‍ය හා වෙනත් ආහාර ද්‍රව්‍යවලින් අධික ලාභ ලැබීමේ කොල්ලයක් ද අපට දක්නට ලැබේ. දුර්භික්ෂය ඇති වී තිබෙන්නේ රුසියාව තුළ ධාන්‍ය නොමැති කමින් නොවේ. එය ඇති වී තිබෙන්නේ සියළු ප්‍රශ්න අතුරෙන් ඉතාමත් වැදගත් හා උග්‍ර වූ පාන් ප්‍රශ්නය මුල් කර ගෙන, වැඩ කරන ජනයාගේ පාලනයට, නැතහොත්, කම්කරු රාජ්‍යයට හා සෝවියට් බලයට විරුද්ධව අවසාන හා තීරණාත්මක සටනක් කිරීමට ධනපති පංතිය සහ පොහොසතුන් සියළු දෙනාම පටන්ගෙන තිබෙන නිසාය. ගම්බද පොහොසතුන් හා කුලාකයන් ඇතුළු ධනපති හා සියළුම පොහොසත්තු පොදු වශයෙන් ධාන්‍ය ඒකාධිකාරය අසාර්ථක කිරීමට කටයුතු කරති. සමස්ත ජනතාවටත්, ප්‍රථම වශයෙන්ම, කම්කරුවන්ට, වෙහෙස වී වැඩ කරන ජනයාට හා නැත්තන්ට පාන් සැපයීමේ අරමුණ ඇතිව හා එම අරමුණ ඉටු කිරීම සඳහා, රජය ධාන්‍ය බෙදා හැරීම භාරගෙන එය ක්‍රියාත්මක කිරීම නො ඉවසන ඔවුහු, එය කඩාකප්පල් කිරීමෙහි යෙදී සිටිති. ධනපතියෝ නියමිත මිළ ක්‍රමය කඩාකප්පල් කරති. ඔවුහු ධාන්‍යවලින් අධික ලාභ ගනිති. සෑම ධාන්‍ය පූඩ් එකකින්ම රූබල් සියයක, නැතහොත් දෙසියයක, සමහර විට ඊටත් වැඩි ලාභයක් ඔවුහු ගරා ගනිති. අල්ලස් හා දූෂණ උපයෝගි

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කර ගනිමින් ද, ''යමෙක් වැඩ නොකරයි නම්, හේ ආහාරද නොගත යුතුය'' යන ඉතා වැදගත්, ප්‍රධාන හා මූලික සමාජවාදී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරන කම්කරු බලය විනාශ කිරීමේ ප්‍රවණතාවයක් දක්වන සියල්ලටම උවමනාවෙන් ම ආධාර කිරීමෙන් ද ඔවුහු රාජ්‍ය ධාන්‍ය ඒකාධිකාරයත්, නිසි ආකාරව ධාන්‍ය බෙදා දීමේ වැඩ පිළිවෙළත් කඩා කප්පල් කරති.

''යමෙක් වැඩ නොකරයි නම් හේ ආහාරද නොගත යුතුය''. වැඩ කරන කාහටත් එය වැට හේ. සෑම කම්කරුවෙක්ම, සෑම දුප්පතෙක්ම හා සෑම මධ්‍යම ගොවියෙක් වුවද, ස්වකීය ජීවිත කාලයේදී නැතිබැරිකම් අත්දුටු සෑම කෙනෙක්ම හා කෙදිනක හෝ තමන්ගේම ශ්‍රමයෙන් ජීවත් වූ සෑම කෙනෙක්ම ද මෙයට එකඟ ය. රුසියාවේ ජනගහනයෙන් දහයෙන් නවයක්ම මෙම සත්‍යයට එකඟය. සමාජවාදයේ අඩිතාලම වන්නේ මෙම සරල මූලික හා ඉතාමත්ම පැහැදිලි සත්‍යය ය. සමාජවාදයේ සදතන ශක්ති ප්‍රභවයත්, එහි අවසාන ජයග්‍රහණයේ නොනැසෙන ප්‍රතිඥාවත් අන්තර්ගතව ඇත්තේ එම සත්‍යය තුළය.

එහෙත් මෙම සත්‍යය පිළිගැනීමත්, දිවුරා එයට පක්ෂ වීමත්, එය කට වචනයෙන් පිළිගැනීමත් එක් දෙයකි. එය ක්‍රියාවට නැංවීමෙහි සමත් වීම ඊට ඉඳුරාම වෙනස් දෙයකි. වැදගත් කාරණය එයයි. පොහොසතුන්, කුලාකයන් හා ජාවාරම් කාරයන් ධාන්‍ය පූඩ් කෝටි ගණන් සඟවා තබාගෙන සිටින රටක, සමජවාදී සමූහාණ්ඩුවකැයි කියාගන්නා රටක පෙට්‍රොග්‍රෑඩයෙහිත්, කාර්මික නොවන පළාත්වලත්, මොස්කව්හිත් ලක්ෂ ගණන් හා දශ ලක්ෂ ගණන් ජනයා සාගිනි වේදනාවට ගොදුරු වන විට, විඥනය ඇති සෑම කම්කරුවෙක්ම, ගොවියෙක්ම, බරපතල ලෙස හා ගැඹුරු ලෙස කල්පනා කර බැලිය යුතු දෙයක් එහි ඇත.

''යමෙක් වැඩ නොකරයි නම් හේ ආහාරද නොගත යුතුය''. මෙය ක්‍රියාවට නංවන්නේ කෙසේද? මෙය ක්‍රියාවට නැංවීමට නම් ප්‍රථමයෙන්ම ධාන්‍ය ඒකාධිකාරය රාජ්‍ය සන්තකව තිබිය යුතු බව සක් සුදක් සේ පැහැදිලිය. ඒ සඳහා පෞද්ගලික ධාන්‍ය වෙළෙඳම සම්පූර්ණයෙන්ම තහනම් කිරීමත්, අතිරික්ත ධාන්‍ය සියල්ලම නියමිත මිළකට රජයට භාර දීමට සැලැස්වීමත්, කවුරුහෝ වුව, අතිරික්ත තොග තබා ගැනීම හා සඟවා තැබීම සම්පූර්ණයෙන්ම තහනම් කිරීමත්, අවශ්‍ය බව පැහැදිලිය. දෙවැනිව, ඒ සඳහා අතිරික්ත ධාන්‍ය විස්තර ඉතාමත් නිවැරදි ලෙස ලේඛනගත කිරීමත්, සුලබ පෙදෙස්වල සිට හිඟ පෙදෙස් වලට ධාන්‍ය ප්‍රවාහණය අඩුපාඩුවක් නොමැතිව මනාව සංවිධානය කිරීමත්, පාරිභෝජනය, සකස් කිරීම හා බීජ ධාන්‍ය සංචිතයන් ගොඩනගා ගැනීමත් අවශ්‍ය වේ. තුන් වැනිව, කම්කරු රාජ්‍යයේ, නිර්ධන පංති රාජ්‍යයේ පාලනය යටතේ, රාජ්‍යයේ සියළුම පුරවැසියන් අතරේ සාධාරණ ලෙස හා නිසි ලෙස කෙරෙන පාන් බෙදා දීමද, පොහොසතුන්ට කිසිම වරප්‍රසාදයක් හෝ වාසියක් හෝ නොසලසන බෙදා දීමක්ද, අපට අවශ්‍ය වේ.

ධනපති ක්‍රමයේ සිට කොමියුනිස්ට් ක්‍රමයට පරිවර්තනය වීම සඳහා හා සියළු ආකාර පීඩාවෙන් සහ සූරා කෑමෙන් වැඩ කරන ජනතාව මුදා ගැනීම සඳහා, රාජ්‍ය බලය (ඊටත් වඩා ධනපති පංතිය කෙරෙහි සැරවැර ගතියක්ද, ආණ්ඩුව අවුල් කරන්නන් කෙරෙහි අනුකම්පා විරහිත ගතියක්ද දක්වන බලය) අවශ්‍ය නැතැයි කියන පිළිකුල් කටයුතු ආරාජිකවාදී පුස්සන්ගේ මෝඩකම කොතරම් බරපතලද යනු වටහා ගැනීමට, අයෙක් කළ යුත්තේ දුර්භික්ෂය මෙල්ල කිරීම සඳහා ඉටු කළ යුතු කොන්දේසි ගැන මඳක් කල්පනා කිරීම පමණකි. කෝටි හා දශ කෝටි ගණන් ජනයාගේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින් සමූහ වශයෙන් ජාතික පරිමාණයෙන් ආහාර ද්‍රව්‍ය එකතු කිරීම, ඒවා ප්‍රවාහණය කිරීම හා බෙදා හැරීම සංවිධානය කිරීමටත්, අවුරුද්දක හා (සමහර විට අවුරුදු ගණනකම අස්වනු පාළුවත් ධාන්‍ය අස්වැන්න වැඩි කිරීම පිණිස අවුරුදු ගණනාවක් තිස්සේ ඉඩම් සංවර්ධන වැඩ කිරීමත් ආදිය සිදුවිය හැකි නිසා) ඉදිරි අවුරුදු ගණනක නිෂ්පාදනයට අදාළ කොන්දේසි හා එහි ප්‍රතිඵල ගණනය කිරීමටත්, අයෝමය විප්ලවවාදී පාලනයක්, එනම්, නිර්ධන පංති ආඥාදයකත්වයක් තිබීමේ අවශ්‍යතාවය ඒකාන්ත ලෙස පැහැදිලි වන්නේ, අපගේ විප්ලවය කෙළින්ම, නියත හා ප්‍රායෝගික වශයෙන්ම සමාජවාදය සාර්ථක කර ගැනීම හා සම්බන්ධ කර්තව්‍යයන් වෙත ළඟාවූ මෙම මොහොතේ දී හා හරියටම මෙම ප්‍රශ්න අතරින් ඉතාමත් වැදගත් පාන් ප්‍රශ්නය හා සම්බන්ධ කරුණුවලින් වේ. මෙම මොහොත අගය නොකළ හැකි තරම් වැදගත් වන්නේ එහෙයිනි.

රොමානොව් හා කෙරෙන්ස්කි කම්කරු පංතියට ඉතිරි කළේ ඔවුන්ගේ කොල්ලකාරී, සාපරාධී හා ඉතාමත් දරුණු යුද්ධයෙන් අන්ත දරිද්‍රතාවයට පත් කරන ලද සහ රුසියානු හා විදේශ අධිරාජ්‍යවාදීන් විසින් සම්පූර්ණයෙන්ම සූරා ගන්නා ලද රටකි. පාන් සෑම දෙනාටම දීම සඳහා ප්‍රමාණවත් වන්නේ හැම ධාන්‍ය පූඩ් එකක්ම පාසා ඉතාමත්ම සුපරීක්ෂාකාරී ලෙස ගණනය කළහොත් හා සෑම පාන් රාත්තලක්ම ඒකාන්ත සමානාත්මතාවයකින් බෙදා දුනහොත් පමණකි. යන්ත්‍රවලට පාන්, එනම් ඉන්ධන හිඟයක්ද ඇත. ඉන්ධන පාරිභෝජනය පිළිබඳ තදබල හා බරපතල අරපිරිමැස්මක් හා නිසි බෙදා හැරීමක් ඇති කිරීමට සෑම ධෛර්යයක්ම යොදා අපි කටයුතු නොකරමු නම් දුම්රිය හා පැක්ටරි නැවතී යාමද, විරක්ෂාව හා දුර්භික්ෂයද, මුළු ජාතියටම විනාශය ද ගෙන එනු ඇත. අපි මහා විපත්තියකට මුහුණ ලා සිටිමු. එය ඉතා ළඟ ය. නොඉවසිය හැකි තරමේ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

මැයි මාසයකින් පසුව, ඊටත් වඩා දුෂ්කර ජූනි, ජූලි හා අගෝස්තු මාසවලට මුහුණ දීමට අපට සිදුවනු ඇත.

නීතිය අනුව අපගේ ධාන්‍ය ඒකාධිකාරයක් ඇත. එහෙත් අඩියක් අඩියක් පාසාම ධනපතියෝ එයට බාධා කරති. දශක ගණන් තිස්සේ අසල් වැසියන් කොල්ල කෑ පරපුටු ගම්බද පොහොසත්තු හා කුලාකයෝ අධික ලාභ ගැනීමෙන් හා හොර සුරා පෙරීමෙන් පොහොසත් වීමට වැඩි කැමැත්තක් දක්වති. එය ඔවුන්ගේ මඩිස්සලයට වාසිදායක වන අතර, දුර්භික්ෂය සම්බන්ධයෙන් දෝෂය සෝවියට් ආණ්ඩුව මත දැමීමේ හැකියාවද එයින් ඔවුන්ට ලැබේ. කුලාකයන්ගේ දේශපලන ආරක්ෂකයන්ගේ, නැතහොත්, ධාන්‍ය ඒකාධිකාරයට හා සෝවියට් බලයට විරුද්ධව ආවෘත ලෙස සහ විවෘත ලෙස ''වැඩ'' කරන ව්‍යවස්ථානු කුල-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ, දක්ෂිණාංශික සමාජවාදී-විප්ලවවාදීන්ගේ සහ මෙන්ෂෙවික්වරුන්ගේ ක්‍රියාමාර්ගයද එයමය. කොඳු ඇටය නැතියවුන්ගේ පක්ෂය වන වාම සමාජවාදී-විප්ලවවාදීන්ගේ පක්ෂය මෙහිදීද ඔවුන්ට කොන්දක් නොමැති බව ඔප්පු කළේය. ධනපති පංතියේ කෑදර කැනහිල් නාදයට යට වන ඔවුහු ධාන්‍ය ඒකාධිකාරයට විරුද්ධව ඝෝෂා කරති; ආහාර ආඥාදායකත්වයට විරුද්ධව ''විරෝධය ප්‍රකාශ කරති''. ඔවුහු ධනපතියන් ගේ තර්ජනවලට යටත් වී ඔවුන්ට ඉඩ දෙති. කුලාකයන්ට විරුද්ධව සටන් කිරීමට බිය වන ඔවුහු සන්නියෙන් මෙන් කැසකවමින් නියමිත මිළ වැඩි කිරීමත්, පෞද්ගලික වෙළෙඳාමට අවසර දීමත් යනාදිය නිර්දේශ කරති.

දේශපාලනයෙහි දී, මෙම කොන්දක් නැතියවුන්ගේ පක්ෂයෙන් පිළිබිඹුවන්නේ, කුලාකයෙක් විසින් සෝවියට් බලයට විරුද්ධව කුපිත කරනලද දුප්පත් ගොවියෙකුට, එම කුලාකයා ධාන්‍ය පුඩ් එකක් රූබල් හයකට වෙනුවට රූබල් තුනකට විකුණුව කලෙක, එයින් දූෂණයට පත්වූ ගොවියාටද ජාවාරම් කිරීමෙන් ''යමක් සොයාගත හැකි'' වූ කල, ධාන්‍ය පුඩ් එක රූබල් එකසිය පණහකට විකිණීමෙන් ''කාලයකට පසු වාසියක්'' අත් කර ගත හැකි වූ කල, ඔහුද, පෞද්ගලික ධාන්‍ය වෙළෙඳාම තහනම් කළ සෝවියට් පාලනය හෙළාදකින්නෙක් බවට පත් වූ වැනි තත්වයකි.

සිතා බැලීමට සමත් අයෙක් වේනම්, සිතා බැලීමට කැමති අයෙක් වේනම්, මෙම අරගලය ගනු ඇත්තේ කුමන මගක්ද යනු ඔහුට පැහැදිලි වනු නිසැකය.

එක්කෝ, දියුණු හා පංති විඥානයෙන් සන්නද්ධ කම්කරුවන් විජයග්‍රහණය අත්කර ගෙන, තමන් වටා දුප්පත් ගොවි පොදු ජනයාද එක්සත් කරගෙන, දැඩි, දයානුකම්පා විරහිත පාලනයක්, නැතහොත්, නියම නිර්ධන පංති ආඥාදායකත්වයක් පිහිටුවා, යටත් වන සේ කුලාකයන්ට

බලකර, ආහාර හා ඉන්ධන හරි ආකාර ලෙස බෙදා දීමේ ක්‍රමයක් ජාතික පරිමාණයෙන් ක්‍රියාත්මක කළ යුතුය.

එසේ නැතහොත්, කුලාකයන්ගේ ආධාරය සහ කොන්ද නැතියවුන්ගේත්, හිස අවුල් කර ගත්තවුන්ගේත් (අරාජිකවාදීන්ගේ සහ වාම සමාජවාදී-විප්ලවවාදීන්ගේ) වක්‍ර ආධාරයද ලබමින් සෝවියට් බලය පෙරළා දමන ධනපති පංතිය විසින් ඇති කරනු ලබන්නේ පින්ලන්තයේ සහ උක්‍රේනියාවේ සිදුවූ පරිද්දෙන්, පැය දහසයක වැඩ දිනයක්ද, සතියකට පාන් අවුන්ස දෙකක සලාකයක්ද දෙන, කම්කරුවන් තොග පිටින් වෙඩි තබා දමන, ඔවුන් සිර ගෙවල ලා ඔවුනට දස වධ දෙන රුසෝ-ජර්මන් හෝ රුසෝ-ජපන් කර්නිලව් පාලනයකි.

එක්කෝ — එසේ නැතහොත්.

මැද මාවතක් නොමැත.

රටේ පවතින තත්වය ඉතාමත් අවදානම් සහිතය.

''වඩාත් ප්‍රිය මනාප'' වන්නේ රුසෝ-ජර්මන් නැතහොත් රුසෝ-ජපන් කර්නිලව් කෙනෙක්ද, විප්ලවය වඩාත් සාර්ථක ලෙස හා නිසැක ලෙස මර්දනය කරන්නේ ඔටුනු පලන්, නැතහොත්, සමූහාණ්ඩුවාදී කර්නිලව් කෙනෙක්ද යන්න පිළිබඳව ව්‍යවස්ථානුකූල-ප්‍රජාතන්ත්‍රවාදීන්ද, දක්ෂිණාංශික සමාජවාදී-විප්ලවවාදීන් ද, මෙන්ෂෙවික්වරුන් ද එකඟත්වයට පැමිණෙමින් සිටින බව, දේශපාලන ජීවිතය ගැන සිතා බලන ඕනෑම කෙනෙකුට නොපෙනී යා නොහැක.

පංති විඥානය ඇති හා දියුණු කම්කරුවන් සියළු දෙනාම එකඟත්වයකට පැමිණිය යුතු වේලාව මෙයයි. සෑම මිනිත්තුවකම ප්‍රමාදය රටේ විනාශයටත්, විප්ලවයේ විනාශයටත්, හේතු විය හැකි බව ඔවුන් උනන්දුවෙන් අවබෝධ කරගත යුතු වෙලාව මෙයයි.

අර්ධ වශයෙන් ගන්නා පියවරයන්ගෙන් වැඩක් නැත. කංකෙදිරිගෑමෙන් අපට සිදුවන කිසිම සෙතක් නැත. ''සිල්ලර වෙළෙඳ ක්‍රමයෙන්'', ''හැම කෙනෙක්ම තමන්ගේ වැඩ බලාගන්නා ක්‍රමයෙන්'' එනම්, අපේ පැක්ටරියට, නැතහොත්, ''අපේ'' වැඩපලට පාන් හෝ ඉන්ධන සපයා ගැනීමේ ක්‍රමයෙන් දරන ප්‍රයත්න නිසා සිදු වන්නේ, වියවුල තවත් වැඩි වීමත්, ජාවාරම් කාරයින්ගේ ආත්මාර්ථකාමී, ජරා හා නින්දිත කටයුතුවලට පහසුකම් සැලසීමත් පමණකි.

සහෝදරවරුනි, පෙට්‍රොග්‍රෑඩ් කම්කරුවනි, ඔබට මෙම ලිපිය ලිවීමට අදහස් කළේ එනිසාය. පෙට්‍රොග්‍රෑඩය රුසියාව නොවේ. පෙට්‍රොග්‍රෑඩ් කම්කරුවෝ රුසියාවේ කම්කරු සමූහයාගෙන් කුඩා කොටසක් පමණක් වෙති. එහෙත්, ඔවුහු රුසියාවේ කම්කරු පංතියේ සහ මුළු මහත් ජාතාවගේ ම ඉතාමත් හොඳ, දියුණු, උසස්ම පංති විඥාන මට්ටමක් ඇති,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඉතාමත් විප්ලවවාදී සහ ඉතාමත් නොපසුබට වූ ද, පුහු සෝෂාවන්ට, බෙලහීන විපිළිසරයට හා ධනපති තර්ජනවලට යටත් නොවන සුලු වූ ද, සේනාංක අතුරෙන් එකක් වෙති. එමෙන්ම ජාතියක ජීවිතයේ ඉතාමත් තීරණාත්මක අවස්ථාවල දී එහි අනෙකුත් කොටස් ද තමන් සමඟ ඉදිරියට ඇදගෙන යමින්, පොදු ජනතාව විප්ලවවාදී උද්වේගයෙන් පණ ගන්වමින්, පෙරමුණු පංතිවල කුඩා සේනාංක පවා යෝධ ඓතිහාසික හපන්කම් කළ අවස්ථා බොහෝ ය.

"පූතිලව් වැඩ පලෙහි අපි හතළිස් දහසක් සිටියෙමු" යි පෙට්‍රොග්‍රෑඩ් කම්කරුවන්ගේ නියෝජිතයා මට කීවේය. "එහෙත් ඉන් බහුතරය "තාවකාලික කම්කරුවන් වූ අතර, නිර්ධන පංතිකයන් නොවීය. ඔවුහු විශ්වාස ගත නොහැකි, අධෛර්යමත් අය වූහ. දැන් ඉතිරිව සිටින්නේ පසළොස් දහසකි. එහෙත් ඔවුන් සටනෙහි දී උරගාබලන ලද පන්නරය ඇති නිර්ධන පංතිකයින්ය".

පෙට්‍රොග්‍රෑඩ් නගරයේ මෙන්ම, රටේ සෑම තන්හිමත් විප්ලවයේ පෙරමුණු බල ඇණිය ඒ ආකාරය. කාහල නාදය නිකුත් කළ යුත්තේද, පොදු ජනතාව සමග එක්සත්ව නැගී සිටිය යුත්තේ ද, රටේ විමුක්තිය තමන් අතේ රඳා පවතින බව අවබෝධ කර ගත යුත්තේද, ඔවුන්ම ය. ඔවුන් 1905 ජනවාරි හා ඔක්තෝබර් මාසවල ද, 1917 පෙබරවාරි සහ ඔක්තෝබර් මාසවලද, දැක්වූ වීරත්වයට නොඅඩු වීරත්වයක් ඔවුන්ගෙන් අපේක්ෂා කෙරෙන බවත්, ධාන්‍ය ජාවාරම් කාරයන්ට, කුලාකයන්ට, පරපුට්ටන්ට, කඩාකප්පල් කාරයන්ට හා පගා කාරයන්ට විරුද්ධව මහා "කුරුස යුද්ධයක්" ද, ජනතාවට පාන් හා යන්ත්‍රවලට පාන් එකතු කිරීම, ප්‍රවාහණය කිරීම හා බෙදා හැරීම පිළිබඳ වූ රජයේ අනිවාර්ය නියෝග උල්ලංඝනය කරන්නවුනට විරුද්ධව මහා "කුරුසයුද්ධයක්" ද ආරම්භ කළ යුතු බවත් අවබෝධ කර ගත යුත්තේ ඔවුන් ම ය.

රටත්, විප්ලවයත් මුදා ගත හැක්කේ පෙරමුණු කම්කරුවන්ගේ පොදු ජන ප්‍රයත්නය මගින් පමණකි. රටේ සෑම තන්හිම සිටින කෝටි සංඛ්‍යාත ගොවීන්ට කරුණු පැහැදිලි කිරීමට හා එම කෝටි ගණන් ජනයාගේ නායකත්වය ගැනීමට තරම් පංති විඥානය ඇති, තමන් අතර සිටින අය අතුරෙන් ජාවාරම් කාර ආශාවන්ට යටවී — ඇත්ත වශයෙන්ම සිදු වන පරිදි — තමන් "පෙළඹී යාමට" ඉඩ තබන, එසේම, ව්‍යාපාරය සඳහා සටන් කරන භටයන් ගේ තත්වයේ සිට ජනතාව කොල්ල කන්නන් බවට පත් වන එවුන් එළවා දමා වෙඩි තබා දැමීමට තරම් ධෛර්යය ඇති, දියුණු හා පන්නරය ලත්, කම්කරුවන් දස දහස් ගණන් අපට අවශ්‍ය ය. පාලනය තහවුරු කිරීමටත්, සෑම ධාන්‍ය පූඩ් එකක්ම, සෑම ඉන්ධන පූඩ් එකක්ම අඩංගුවන සේ ප්‍රදේශවල ඒ පිළිබඳ පාලනයක් ඇති කිරීමටත්,

කරන කුරුස යුද්ධය රටේ අස්සක් මුල්ලක් නැර ගෙන යාමට හා ඊට අදාළ දුෂ්කරතාවයන් සියල්ල සංවිධානය වූ ආකාරයෙන් දරා ගැනීමට සමත්, ස්ථිර සාර සහ විප්ලවයට කැපවූ නිර්ධන පංතිකයන් අපට අවශ්‍ය ය.

මෙම කර්තව්‍යය ඉටු කිරීම යනු, අයෙකුගේ සුපුරුදු ස්ථානය හැර නොයා, කුරුස යුද්ධයකට සම්බන්ධ නොවී සිටිමින්ම, මන්ද බුද්ධික රකුස් රොමානොව්ට හා මොට්ට පුරාජේරුකාර කෙරෙන්ස්කිට විරුද්ධ ආවේගී නැගීමකට සීමාවී දක්වන ටික දිනකට දක්වන වීරත්වයට වඩා බොහෝ දුෂ්කර දෙයකි. ජාතික පරිමාණයෙන් කෙරෙන දිග්ගැස්සුනු හා නොපසුබට සංවිධාන කටයුතුවලදී දක්වන වීරත්වය, නැගිටීමක දී දක්වන වීරත්වයට වඩා දුෂ්කරය. එමෙන්ම ඊට වඩා බොහෙවින් උසස්ය. එසේ වුවද කම්කරු පංති පක්ෂවල, නැතහොත්, කම්කරු පංතියේ ශක්තිය විදහා දැක්වූයේ අන්තරාය දෙස නිර්භීතව, එක එල්ලේ සහ විවෘතව බැලීමද, අන්තරාය තිබෙන බව නොබියව පිළිගැනීමද, "අපගේ" කඳවුරෙහි හා "අනිත්" නැතහොත් සූරාකන්නන්ගේ කඳවුරෙහි ඇති බලවේගයන් බුද්ධිමත් ලෙස මැන බැලීමද කම්කරු පංතියේ ක්‍රියාමාර්ගය වූ හෙයිනි. විප්ලවය දියුණු වෙමින්, සංවර්ධනය වෙමින් වැඩෙයි. අපට විසඳන්නට සිදුවී ඇති කර්තව්‍යයන් වර්ධනය වෙයි. අරගලය පුළුල් වෙයි. ගැඹුරු වෙයි. පාන් හා ඉන්ධන හරි ආකාර ලෙස බෙදා හැරීම හා ඒවා ජාතික පරිමාණයකින් කම්කරුවන් විසින් ගිණුම් ගත කරනු ලැබීම හා පාලනය කරනු ලැබීම යනු, සමාජවාදයේ සම්ප්‍රාප්තිය සලකුණු කරන නියත සහ මූලික පෙරනිමිත්තය. දැන් මෙය හුදෙක් "පොදු විප්ලවීය" කර්තව්‍යයක් පමණක් නොවේ. දැන් එය කොමියුනිස්ට් කර්තව්‍යයකි. වැඩ කරන ජනතාව සහ දුප්පතුන් ධනපති ක්‍රමයට විරුද්ධව තීරණාත්මක සංග්‍රාමයක යෙදීම අවශ්‍ය කෙරෙන කර්තව්‍යයකි.

එමෙන්ම, මෙම සංග්‍රාමය කෙනෙකුගේ මුළු ශක්තියම කැප කිරීමට තරම් වටිනා එකකි. එහිදී මතුවන දුෂ්කරතා ඉමහත්ය. එහෙත් පීඩනය හා සූරාකෑම අහෝසි කර දැමීමද එසේම ශ්‍රේෂ්ඨය. අප සටන් කරන්නේ ඒ සඳහාය.

ජනතාව සාගින්නෙන් වෙළී සිටිද්දී, විරැකියාව ඊටත් වඩා භයානක වෙමින් තිබෙද්දී, අතිරික්ත ධාන්‍ය පූඩ් එකක් පවා සඟවන කිසිවෙක් වෙතොත්, ඉන්ධන පූඩ් එකක් පවා රජයට අහිමි කරන කෙනෙක් වෙතොත්, හේ පරම අපරාධ කාරයෙකි.

එවැනි අවස්ථාවක, ධාන්‍ය සහ ඉන්ධන සෑම පූඩ් එකක්ම ශුද්ධ වස්තුවක් වැනිය. මෙලොව දී කරන දස වැඩ සඳහා දිව්‍යලෝකයේ රාජධානිය දීමට පොරොන්දු වෙමින්, මෝඩයන්ගේ සිත් අවුල් කිරීමට පූජකයන් යොදා ගන්නා දේට වඩා ඒවා ශුද්ධ වස්තු වෙති. නියම කොමියුනිස්ට්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමාජයක් ඇති කිරීම සඳහා ගන්නා දේ ශුද්ධ වස්තු වන බව කවදත් සැබෑ ය. මෙම සැබැවින්ම ශුද්ධ වූ දේ කෙරෙන් පූජකයන්ගේ ''ශුද්ධවන්තකම'' ඉවත් කිරීම සඳහා අපි එය ප්‍රායෝගික වශයෙන් අත්පත් කර ගත යුත්තෙමු. එය හරි ආකාරව බෙදා හැරීම ව්‍යවහාරයෙන් ක්‍රියාත්මක කළ යුත්තෙමු. සියල්ල හර නොකරම සම්පූර්ණයෙන්ම එකතු කරගත යුත්තෙමු. සෑම අතිරික්ත ධාන්‍ය ඇස්සක්ම පවා රජයේ ගබඩාවලට ගෙන ආ යුතුය. සැඟ වූ හා එකතු නොකළ අතිරික්ත ධාන්‍ය සියල්ලම රැස් කිරීම සඳහා රට මුළුල්ල අතු ගෑ කලෙක මෙන් ඒවා එකතු කළ යුතුය. ඉන්ධන නිෂ්පාදනය වැඩි කිරීමත්, ඉන්ධන අරපිරිමැස්ම තරයේ ක්‍රියාත්මක කිරීමත්, එය ප්‍රවාහණය හා පාරිභෝජනය කිරීමේදී උසස්ම කාර්යක්ෂමතාවයක් ඇති කර ගැනීමත් සඳහා, අපට කම්කරුවාගේ දැඩි හස්තය අවශ්‍ය ය.

සෑම ධාන්‍ය සහ ඉන්ධන නිෂ්පාදන මධ්‍යස්ථානයකට ම ගොස්, සම්පාදනය හා බෙදා හැරීම පිළිබඳ සෑම මධ්‍යස්ථානයකටම ගොස්, වැඩ කිරීම දස ගුණයකින් ප්‍රකර්ශවත් කිරීමටද, ගණනය කිරීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සෝවියට් සභා ආයතනවලට ආධාර කිරීමටද, අයිලාභ ලැබීම, අයුතු ලාභ ප්‍රයෝජන ලැබීම සහ දූෂණ කටයුතු බලයෙන් මර්දනය කිරීමටද, දියුණු කම්කරු ජන සමූහයාගේ ''කුරුස යුද්ධයක්'' අපට අවශ්‍යය. එය අළුත් කාර්යයක් නොවේ. හරියටම කියතොත් ඉතිහාසය නව කාර්යයන් ඉදිරිපත් නොකරයි. විප්ලවය පැතිර යන ප්‍රමාණයටද, එහි ඉස්මතුවන අසීරුකම් වැඩි වන ප්‍රමාණයටද, සමස්ත ලෝක ඓතිහාසික කර්තව්‍යයන් වර්ධනය වන ප්‍රමාණයට ද අනුකූලව, ඉතිහාසය පැරණි කර්තව්‍යයන් තව තවත් වැඩි දියුණු කරයි.

දුප්පතුන්ගේ නායකයා වශයෙන්, ගම්බද වෙසෙන ජනතාවගේ නායකයා වශයෙන්, වෙහෙසෙන ජනයාගේ රාජ්‍යය ගොඩ නගන නිර්මාණකයා වශයෙන්, දියුණු කම්කරුවා ''ජනතාව අතරට ගොස් සිටීම'' ඔක්තෝබර් විප්ලවයේ, සෝවියට් විප්ලවයේ, ශ්‍රේෂ්ඨතම හා අමරණීය ජයග්‍රහණ අතුරෙන් එකකි. පෙට්‍රොග්‍රෑඩ් සහ වෙනත් නිර්ධන පංතික මධ්‍යස්ථාන ඔවුන්ගේ විශිෂ්ඨතම කම්කරුවන් දහස් ගණනින් ගම්බද පෙදෙස්වලට දී ඇත. කලේදින්ලාට සහ දූතව්ලාට විරුද්ධ සටන්කරුවන්ගේ සේනාංක ද, ආහාර සේනාංකද, අළුත් දේ නොවෙති. විපත්තියේ ඒකාන්ත සමීපතාවයත්, තත්වයේ තීව්‍රතාවයත් විසින් පෙරට වඩා දස ගුණයකින් කළමණා කටයුතු කරන සේ අපට බල කෙරේ.

කම්කරුවා දුප්පතුන්ගේ නායකයා බවට පත් වූ විට, එයින් ඔහු ශුද්ධ ආත්මයක් බවට පරිවර්තනය වූයේ නැත. ඔහු ජනතාව ඉදිරියට මෙහෙය වීමෙහි යෙදුනේය. එහෙත්, ඒ අතරම ඔහුට සුළු ධනේශ්වර බිඳී යාමේ රෝග ද බෝ විය. ඉතාමත් හොඳින් සංවිධානය වූ, ඉතාමත් උසස් පංති විඥාන මට්ටමක් ඇති, ඉතාමත් විනය සම්පන්න හා නොපසුබට කම්කරුවන්ගේ සේනාංක අඩු වූ තරමට, එම සේනාංකයන් දිරාපත් වූ අවස්ථාද වැඩි විය. ඒ තරමටම, අනාගතයේ නිර්ධන පංතික කොමියුනිස්ට් විඥානය අභිබවා අතීතයේ සුළු ධනේශ්වර සහජාසයන් ජයගත් අවස්ථාවන්ද වැඩි විය.

කොමියුනිස්ට් විප්ලවය ආරම්භ කළ පමණින්ම, ඉඩම් හිමියන්ගේ හා ධනපතියන්ගේ සමාජයෙන්, නැතහොත් සූරා කන්නන්ගේ හා පරපුට්ටන්ගේ සමාජයෙන් උරුම කොට ලැබූ දුෂ්ඨ ආත්මාර්ථය හා වැඩි දෙනාගේ දරිද්‍රතාවයත්, සුළු පිරිසකගේ පෞද්ගලික ලාභයත් පදනම් කරගත් දුර්වල කම් හා දුශ්චරිත එක මොහොතකින් ඉවත් කිරීමට කම්කරු පංතියට නොපුළුවන. එහෙත්, අත්දැකීමෙන් ලබන අවබෝධයත්, අරගලයේ දුෂ්කර තාවයන්ගෙන් ලබන පන්නරයත් එන්න එන්නම වැඩි කර ගන්නා කම්කරු සේනාංකයන් වැඩි වැඩියෙන් සතුරාට විරුද්ධව ඉදිරිපත් කෙරේ නම්, පරණ ලෝකයේ දුශ්චරිතයන් සහ දුර්වල කම්ද සමගම, එය පරාජය කර දැමීමට කම්කරු පංතියට හැකි වනු ඇත. එමෙන්ම, අවසානයේදී කම්කරු පංතිය ඒකාන්තවම හා අනිවාරණීය වශයෙන්ම පැරණි ලෝකය පරාජය කරනු ඇත.

අද රුසියාවේ පවතින තත්වය එසේය. හුදෙක්ම එසේමය. තනිව හා අසමගිව සිටිමු නම්, දුර්භික්ෂයත්, විරක්ෂාවත් මෙල්ල කර ගැනීම අසීරු දෙයකි. මෙම අති විශාල රටේ, අස්සක් මුල්ලක් නැර පැතිරී යන දියුණු කම්කරුවන්ගේ ''කුරුස යුද්ධයත්'' අපට අවශ්‍යය පංති විඥානයෙන් සන්නද්ධ හා සීමා රහිත ලෙස කොමියුනිස්ට්වාදයට කැප වූ, අයෝමය නිර්ධන පංති සේනාංකයත් තවත් දසගුණයකින් වැඩි කිරීම අපට අවශ්‍ය ය. එවිට දුර්භික්ෂයත් විරක්ෂාවත් පරදවා අපට ජයග්‍රහණය අත්පත් කර ගත හැකිය. එවිට අපි, විප්ලවය සමාජවාදයේ නියම පූර්වාරම්භය බවට පත් කරන්නෙමු. එමෙන්ම, එවිට අධිරාජ්‍යවාදී ගිජු ලිහිණියන්ට විරුද්ධව ජයග්‍රාහී ආරක්ෂක යුද්ධයක් කිරීමට හැකි තත්වයකට ද අපි පත්වන්නෙමු.

1918 මැයි 22

එන්. ලෙනින්

''ප්‍රාව්ද'', අංක 101, 1918 මැයි 24

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 36, පිටු 357-364

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ප්‍රථම සමස්ත රුසියා ආර්ථික මණ්ඩල සම්මේලනයේදී කළ කථාව

1918 මැයි 26[53]

(ලෙනින් සභා ගැබට පැමිණි විට ඔහු මහා අත්පොලසන් හඬින් පිළිගන්නා ලදී.) සහෝදරවරුනි, ප්‍රථමයෙන්ම, මහජන කොමිසාර් මණ්ඩලය වෙනුවෙන් ආර්ථික මණ්ඩල සම්මේලනයට ශුභ ප්‍රාර්ථනා ඉදිරිපත් කිරීමට මට අවසර දෙන්න (අත්පොලසන්.)

සහෝදරවරුනි, ශ්‍රේෂ්ඨ ආර්ථික මණ්ඩලය[54] හමුවේ දැන් ඇත්තේ දුෂ්කර, එහෙත්, ඉතාමත් ප්‍රයෝජනවත් කර්තව්‍යයකි. ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණයන් තව තවත් ඉදිරියට යත්ම, එයින් ඇරඹුණු උත්ක්ෂේපණය වඩාත් ගැඹුරු වෙත්ම, සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණයන් වඩාත් ශක්තිමත් ලෙස ස්ථාපිත වෙත්ම සහ සමාජවාදී ක්‍රමය තහවුරු වෙත්ම, ආර්ථික මණ්ඩලවල කාර්ය කොටස වඩාත් උසස් වනු ඇත. රාජ්‍ය ආයතන අතුරෙන් කල් පවතිනු ඇත්තේ ඒවා පමණකි. අප සමාජවාදය ස්ථාපිත කිරීම වෙත වඩ වඩාත් සමීප වීමත්, හුදු පරිපාලන යන්ත්‍රයක, නැතහොත් පරිපාලන කටයුතුවල පමණක් නිරතවන යන්ත්‍රයක අවශ්‍යතාවය අඩු වීමත් සමග, ඒ තාක් දුරට, ආර්ථික මණ්ඩලවල තත්වය වඩාත් කල්පවත්නා ස්වභාවයක් ගන්නේය. සූරාකන්නන්ගේ ප්‍රතිරෝධනය අවසාන වශයෙන් බිඳ දැමූ පසු, කම්කරුවන් සමාජවාදී නිෂ්පාදනය සංවිධානය කිරීමට උගෙන ගත් පසු, මෙම පරිපාලන යන්ත්‍රය, එනම්, වචනයේ නියම, ඒකාන්ත, පටු අර්ථය අනුව කියතොත්, මෙම පැරණි රාජ්‍යයේ යන්ත්‍රය අභාවයට යාමට ඉරණම්ව ඇත. ඒ අතර, ශ්‍රේෂ්ඨ ආර්ථික මණ්ඩලය වැනි ස්වභාවයේ යන්ත්‍රය, සංවිධිත සමාජයේ සියළුම ප්‍රධාන කර්තව්‍යයන් ඉටු කරමින් වැඩී, වර්ධනය වී, ශක්තිමත් වීමට ඉරනම්ව ඇත.

සහෝදරවරුනි, අපගේ ශ්‍රේෂ්ඨ ආර්ථික මණ්ඩලයෙහි සහ එහි කටයුතු සමීප ලෙස හා අභේද්‍ය ලෙස සම්බන්ධ වී ඇති ප්‍රාදේශීය මණ්ඩලවල ද අත් දැකීම් දෙස බලන කල, අවසාන නොකළ, අසම්පූර්ණ හා සංවිධානය නොකළ කටයුතු කොතෙක් තිබුණත්, අපට අශුභවාදී නිගමනවලට එළඹීමට අල්ප මාත්‍ර හෝ හේතුවක් නොමැති බව මා කියන්නේ එහෙයිනි. ශ්‍රේෂ්ඨ ආර්ථික මණ්ඩලය එය සඳහාත්, පළාත් සහ ප්‍රාදේශීය මණ්ඩල ඒවා සඳහාත් නියම කරගෙන තිබෙන කර්තව්‍යයන් අති දැවැන්ත හා සර්වග්‍රාහී වන හෙයින්, අපගේ නිරීක්ෂණයට හසුවන දෙයින් බිය ගැනීමට කිසිම හේතුවක් නැත. "හත් වරක් මැන බලා එක් වරක් කපනු" යන ආප්තෝපදේශය පිළිනොපදින ලද අවස්ථා බොහෝ ය. අපගේ දෘෂ්ටි කෝණය අනුව බලන කළ එවැනි අවස්ථා ඉතා අධිකය. අභාග්‍යයකට මෙන්, සමාජවාදී ප්‍රතිපත්ති අනුව ආර්ථිකය සංවිධානය කිරීම හා සම්බන්ධ කරුණු ආප්තෝපදේශයෙන් කියවෙන තරමට සරල නොවේ.

මෙවර, දේශපාලන බලය පමණක් නොව, දේශපාලන බලයටත් වඩා ආර්ථික බලය, එනම් දෛනික මිනිස් පැවැත්මේ ගැඹුරුතම පදනම් කෙරෙහි බලපාන බලය, වෙනත් වචනවලින් කියතොත් සියළු බලය, නව පංතියක් අතට, එපමණක් නොව ජනගහනයේ අති බහුතරය වන වැඩ කරන සහ සූරාකනු ලබන ජනතාවගේ නායකයා වන පංතිය අතට, මිනිස් ඉතිහාසයේ ප්‍රථම වතාවට පත්ව තිබීම නිසා අපගේ කර්තව්‍යයන් ඉතාමත් සංකීර්ණ වී තිබේ. අපට මුහුණ පාන්නට සිදුවී තිබෙන සංවිධාන කර්තව්‍යයන් අතිශයින්ම වැදගත් හා අතිශයින්ම දුෂ්කර නිසා සහ සම්පූර්ණයෙන්ම නව ප්‍රතිපත්ති පදනම් කරගෙන දශ කෝටි ගණන් ජනතාවගේ ජීවිතයේ ගැඹුරුතම අඩිතාලම් සංවිධානය කිරීමට අපට සිදුවී තිබෙන විට "හත්වරක් මැන බලා එක් වරක් කපනු" යන ආප්තෝපදේශයෙන් කියන තරම් සරල ලෙස කාරණා කටයුතු පිළියෙළ කර ගැනීම පහසු නොවන බව නොකීවත් පැහැදිලි වන කරුණකි. යම් යම් දේ නිමක් නැති වාර ගණනක් මැන බැලීම සහ අවසාන වශයෙන් මැන සවි කර තිබෙන දේ කපා සවි කිරීමත් ඇත්තෙන්ම අපට කළ නොහැකි ය. අපට අපගේ ආර්ථික ප්‍රාසාදය ගොඩ නගා ගැනීමට සිදුවී තිබෙන්නේ, විවිධ ආයතන අත්හද බලමින්ද, ඒවායේ කටයුතු ගැන සුපරීක්ෂාකාරීව සිටිමින්ද, වැඩ කරන ජනතාවගේ අත් දැකීම් අනුව හා අන් සියල්ලටමත් වඩා ඒවායේ කටයුතුවල ප්‍රතිඵල අනුව ඒවා පරීක්ෂාවට භාජනය කරමින්ද, වෙනත් නොයෙක් කටයුතු කරන අතර ය. අප මෙම ගොඩනැගීම කළ යුතුව තිබෙන්නේ වෙනත් කාර්යයන්හි යෙදෙන අතරම ය; ඊටත් වඩා සූරාකන්නන් ගේ මාරාන්තික අරගලයක සහ උමතු ප්‍රතිරෝධනයක තත්වයන් යටතේය; ධනපති සූරාකෑමේ දිරාගිය අවසාන දත් කීපය ගලවා දැමීමට හැකි තත්වයට අප පත්වන කාලය එළඹෙන විට වැඩි වන එම උමතු තත්වය යටතේය. කෙටි කාලසීමාවක් තුළදී පවා ජාතික ආර්ථික-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යේ විවිධ අංශවල පරිපාලනයේ විධි, රෙගුලාසි හා මණ්ඩල කීප වරක් වෙනස් කිරීමට සිදු වන බව වටහා ගත හැකි අතර එම තත්වයන් නිසා අශුභවාදී වීමට කිසිම හේතුවක් නොමැති නමුත්, එයින් ධනපතියන්ගේ සහ සූරාකන්නන්ගේ පහන් සිත් පැරී යන හෙයින් ඔවුන්ගේ අගති සහිත කඩා පැනීම් ඇති වීමට බොහෝ විට ඉඩ සැලසේ. නමුත් පරිපාලන රෙගුලාසි, ප්‍රතිමාන සහ නීති තුන් යලක් වෙනස් කිරීම, නිදර්ශනයක් වශයෙන් ගතහොත් ප්‍රධාන ජල මණ්ඩලයට, නිතරම ප්‍රීතිය ගෙන දෙන්නක් නොවන බව මෙම කටයුතුවලට ඉතා සමීප ලෙස සහ එක එල්ලේම සහභාගි වන අය කියන බව සැබෑය. එවැනි වැඩ කිරීමෙන් ලැබෙන ප්‍රීතිය විශාල එකක් විය නොහැකිය. නමුත්, නිතර නිතරම ආඥවන් වෙනස් කිරීමේ ඒකාන්ත අප්‍රසන්නතාවයෙන් අපි තරමක් හෝ ඈත් වන්නෙමු නම් හා රුසියානු නිර්ධන පංතියට තමන්ගේම, තවමත් ප්‍රමාණවත් නොවන බලවේගයන් යොදා ගනිමින් සාර්ථක කිරීමට තිබෙන, අතිදැවැන්ත, ලෝක ඓතිහාසික කර්තව්‍යය ගැන මදක් ගැඹුරට හා දුරට බලන්නෙමු නම්, මීටත් වඩා වෙනස් කිරීම් සහ මීටත් වඩා පරිපාලන ක්‍රම හා විනය ආකෘති ගැන ව්‍යවහාරයෙන් අත් හදා බැලීම අනිවාර්ය අවශ්‍යතාවයක් බවද, එබඳු යෝධ කර්තව්‍යයක් ඉටු කිරීමේදී කිසියම් පූර්ව නිශ්චිත උපදේශයක් අනුව හා එක පහරින් නව සමාජයේ සංවිධාන ආකෘති වහාම ස්ථාපිත කිරීමට හා සකස් කර ගැනීමට අපට හැකි යයි කිසි කලෙකත් වහසි කිව නොහැකි බවද, සිහි බුද්ධිය ඇති කිසිම සමාජවාදියෙක් අනාගතය සඳහා කාර්ය විස්තරයක් ලියා හෝ සිතාවත් නැති බවද එක් වරම පැහැදිලි වනු ඇත.

අප දැන සිටියෙත්, ධනපති සමාජයේ විශිෂ්ටතම සූරීන්, නැතහොත්, එහි සංවර්ධනය කල්තබා දුටු ශ්‍රේෂ්ඨතම විද්වතුන් අපට නියත වශයෙන් පෙන්වා දුන්නේත්, පරිවර්තනය ඓතිහාසික වශයෙන් අනිවාර්ය වන සහ යම් ප්‍රධාන මාර්ගයක් ඔස්සේ ඉදිරියට යායුතු බවත්, නිෂ්පාදන මාධ්‍යයන් පිළිබඳ පුද්ගලික හිමිකම දෙදරා යාම ඉතිහාසයෙන් ඉරණම් වී ඇති බවත්, අසන්තක කරන්නන් අනිවාර්ය වශයෙන්ම අසන්තක කරනු ලැබෙනු ඇති බවත් පමණකි. මෙය විද්‍යාත්මක යථාතථ්‍යතාවයෙන් තහවුරු කරන ලදී. අපි සමාජවාදයේ ධජය අතට ගන්නා විට, අපි සමාජවාදීන් වන බව ප්‍රකාශ කරන විට, අපි සමාජවාදී පක්ෂ ආරම්භ කළ විට හා අපි සමාජය පරිවර්තනය කළ විට මේ බව දැන සිටියෙමු. සමාජවාදී ප්‍රති සංවිධානය කරගෙන යාම සඳහා බලය අත්පත් කර ගන්නා විට අපි මේ බව දැන සිටියෙමු. නමුත් පරිවර්තන ආකෘති හෝ යථාභූත ප්‍රති සංවිධානයේ සංවර්ධන වේග ප්‍රමාණය හෝ දැන ගැනීමේ හැකියාවක් අපට නොවීය. මේ හා සම්බන්ධයෙන් අපට තීරණාත්මක මග පෙන්වීමක් ලබා

ගත හැක්කේ සාමූහික අත්දැකීමෙන්, දශලක්ෂ සංඛ්‍යාත ජනයාගේ අත්දැකීමෙන් පමණකි. මක් නිසාද යත්, වැඩවසම් සමාජයේ සහ ධනපති සමාජයේ මේ දක්වා ඉතිහාසය හැඩගැස් වූ ඒ ඉහළ කොටස්වල සිය ගණන් හා දහස් ගණන් ජනයාගේ අත්දැකීම්, අපගේ කර්තව්‍යය සඳහා, සමාජවාදය ගොඩ ගැනීමේ කර්තව්‍යය සඳහා නියත වශයෙන්ම ප්‍රමාණවත් නොවන හෙයිනි. අපට ඒ ආකාරයෙන් ඉදිරියට යාමට නොපුළුවන. එයට හේතුව අපි ඒකාන්ත ලෙසටම සාමූහික අත්දැකීම් කෙරෙහි, දශ ලක්ෂ සංඛ්‍යත වැඩ කරන ජනයාගේ අත් දැකීම් කෙරෙහි විශ්වාසය තබා කටයුතු කිරීමය.

එනිසා, සෝවියට් සභාවල ප්‍රධාන සහ මූලික කර්තව්‍යය වන සංවිධානය කිරීමේදී, විශේෂයෙන්ම, අපට නුපුරුදු කාර්යයක් වන සෑම පුද්ගලයෙක්ම ඔහුට නියම තැනට පත් කිරීමේදී අති විශාල සංඛාවක් අත් හදා බැලීම් කිරීමටද, අති විශාල සංඛ්‍යාවක් පියවරයන් ගැනීමටද, බොහෝ ගණනක් වෙනස් කිරීම් කිරීමටද, බොහෝ ගණනක් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට ද සිදුවන බව අපි දන්නෙමු. අපට අත්දැකීම් නොමැති නිසා මෙහි දී සෑම පියවරක්ම අපට තනිවම සකස් කර ගැනීමට සිදුවේ. මෙම මාර්ගය ඔස්සේ යාමේදී අප අතින් සිදු වන වැරදි බරපතල වූ තරමට වෘත්තීය සමිති සාමාජිකත්වයේ සෑම වැඩි වීමත් සමග ද, මේ දක්වා සම්ප්‍රදාය හා චාරිත්‍ර අනුව ජීවත් වූ වැඩ කරන හා සූරා කනු ලබන ජනතාවගේ කඳවුරේ සිට සමාජවාදය ගොඩනගන්නන්ගේ කඳවුරට එන සෑම අතිරේක දහසක් දෙනා හා සෑම අතිරේක ලක්ෂයක් දෙනා සමගද, නිසි ප්‍රතිපත්ති අනුව වැඩ කටයුතු සංවිධානය කරනු ඇති ජන සංඛ්‍යාව වැඩි වන්නේය යන විශ්වාසය වර්ධනය වනු ඇත.

ආර්ථික මණ්ඩලයට, එනම්, ශ්‍රේෂ්ඨ ආර්ථික මණ්ඩලයට, නිතර නිතරම මුහුණ පෑමට සිදුවන ද්විතීය කර්තව්‍යයන්ගෙන් එකක් වන ධනපති විශේෂඥයන් උපයෝගි කර ගැනීම ගෙන බලමු. මෙම කර්තව්‍යය ඉටු කළ හැකි වන්නේ ජාත්‍යන්තර ධනපති ක්‍රමය විසින් විද්‍යාව පදනම් කර ගෙන අති දැවැන්ත පරිමාණයකින් සංවිධානය කරන ලද ශ්‍රමයේ ද්‍රව්‍යමය සහ තාක්ෂණික පූර්වාවශ්‍යතාවයන් සංවර්ධනය වුනු තාක් දුරට හා එනිසාම, විද්‍යා අධ්‍යාපනයක් ලත් විශේෂඥයන් අති විශාල සංඛ්‍යාවක් පුහුණු කිරීම අනුව බවත්, මෙම තත්වයන් ඇති වූ පසු බවත් අපි සියළු දෙනාම, නැතහොත්, යටත්පිරිසෙයින් විද්‍යාවේ සහ සමාජවාදයේ පදනම මත පිහිටා සිටින අයවත්, දන්නෙමු. මෙය නොමැතිව සමාජවාදය ඇතිවිය නොහැකි බව අපි දන්නෙමු. පසු ගිය අර්ධ ශත වර්ෂයක කාලයෙහි ධනපති ක්‍රමයේ සංවර්ධනය ගැන නිරීක්ෂණයන් කළ සහ සමාජවාදය අනිවාර්ය වශයෙන්ම ඇතිවන්නේය යන නිගමනය වෙත නැවත නැව-

https://liberationbase.wordpress.com

තත් එළඹුනු, ඒ සමාජවාදීන්ගේ කෘති අපි නැවත වරක් කියවමු නම්, විද්‍යාව එහි ධනපති බැම්වලින්ද, ධනපති ක්‍රමයට බැඳුනු එහි වහල් භාවයෙන්ද, කැත ධනපති කෑදරකමෙහි උවමනාවන් කෙරෙහි බැඳුනු එහි වහල් භාවයෙන්ද මුදගනු ලැබෙනු ඇත්තේ සමාජවාදය විසින් පමණකැයි යනු, ඒ සියළු දෙනාම, කිසිම විශේෂයක් නොමැතිව පෙන්වා දී තිබෙන බව දක්නට පිළිවන. සමාජමය නිෂ්පාදනය සහ බෙදා හැරීම විද්‍යාත්මක මාර්ගයක් අනුව පුළුල් ලෙස ව්‍යාප්ත කිරීමට ඒවා වැඩ කරන ජනතාවගේ ජීවිතය පහසු කිරීමේ සහ හැකි තරම් දුරට ඔවුන්ගේ යහ සාධනය වැඩි දියුණු කිරීමේ අරමුණට යටත් කිරීමටත් ඉඩ සලසන්නේ සමාජවාදය පමණකි. මෙය ඉටු කළ හැක්කේ සමාජවාදයට පමණකි. එසේම, සමාජවාදය මෙය ඉටු කළ යුතු බවද අපි දනිමු. මාක්ස්වාදයේ සම්පූර්ණ සංකීර්ණතාවයත්, එහි මුළු ශක්තියත්, රඳා පවතින්නේ මෙම සත්‍යය වටහා ගැනීම තුළය.

ප්‍රාග්ධනය විශාල වූ තරමට, ධනපති පංතිය වැඩියෙන් කම්කරුවන් මර්දනය කරන නිසා, අප මෙම පියවර සාර්ථක කරගත යුත්තේ ඊට විරුද්ධ කොටස් කෙරෙහි විශ්වාසය තබමිනි. දැන් බලය නිර්ධන පංතිය හා දුප්පත් ගොවිජනතාව අතට පත්ව ඇති හෙයින් සහ ආණ්ඩුව ජනතාවගේ ආධාරය ඇතිව තම කර්තව්‍යයන් නියම කර ගන්නා හෙයින්, අපට මෙම සමාජවාදී වෙනස් කම් කිරීමට සිදුව තිබෙන්නේ, ධනපති සමාජයේදී පුහුණුව ලැබූ, වෙනත් තත්වයන් ගැන නොදත්, වෙනත් සමාජ ක්‍රමයන් ගැන සිතීමෙහි අසමත් ධනපති විශේෂඥයන්ගේ ආධාරය ඇතිවය. එනිසා මෙම විශේෂඥයන් සම්පූර්ණයෙන්ම අවංක වන සහ ස්වකීය කාර්යයන්ට පක්ෂපාත වන අවස්ථාවලදී පවා ඔවුහු දහස් ගණන් ධනපති දුර්මතවලින් පිරී සිටිති; අභාවයට යමින් හා දිරාපත් වෙමින් පවතින සහ එනිසා වියරු ප්‍රතිරෝධනයෙහි යෙදෙන ධනපති සමාජය සමග තමන්ටම නොපෙනෙන දහස් ගණන් බැම්වලින් බැඳී සිටිති.

අපගේ ව්‍යායාමයට හා ජයග්‍රහණයට අදාළ මෙම දුෂ්කරතාවයන් අපෙන්ම සඟවා තැබීම අපට කළ හැක්කක් නොවේ. මෙම කරුණ ගැන ලියූ සමාජවාදීන් සියළු දෙනාම ගැන සිතා බැලුවත්, කම්කරු පංතිය බලය අත්පත් කරගත් පසු මතු වන ප්‍රශ්නයක් වන, ධනපති ක්‍රමය විසින් රැස්කරන ලද ඉතා සාරවත්, අපට ඓතිහාසික වශයෙන් අනිවාර්ය හා අවශ්‍ය සංස්කෘතික, ඥාන සහ ශිල්ප සම්භාරය ධනපති ක්‍රමයේ උපකරණයක තත්වයෙන් සමාජවාදයේ උපකරණයකට හැරවීමේ කර්තව්‍යය තමන් සඳහා නියම කරගත් කම්කරු පංතියට මුහුණ දෙන්නට සිදුවන මෙම නියත, ප්‍රායෝගික දුෂ්කරතාවය වෙත පෙන්නුම් කරමින් එකම සමාජවාදියෙක් හෝ කළ කෘතියක් ගැනවත්, අනාගත සමාජවාදී සමාජය

ගැන කිසිම ප්‍රමුඛ සමාජවාදියෙක් පළ කළ අදහසක් ගැනවත් මට මතක නැත. සාමාන්‍ය සූත්‍රයක් වශයෙන් හා වියුක්ත තර්කනයෙන් මෙම කර්තව්‍යය ඉදිරිපත් කිරීම පහසුය. නමුත්, ස්වකීය මරණය සමීප වත්ම වැඩි වැඩියෙන් ප්‍රතිරෝධය දක්වන ධනපති ක්‍රමයට විරුද්ධව අරගලයේදී එය ඉටු කිරීම සඳහා අති මහත් පරිශ්‍රමයක් අවශ්‍ය වේ. මෙම ක්ෂේත්‍රයෙහි අත්හදා බැලීම් සිදුවේ නම්, අර්ධ ස්වභාවයේ වැරදි හැදීමෙහි අපි නිතර යෙදෙමු නම්, එසේ වන්නේ එය නොවැළැක්විය හැකි හෙයිනි; එය අනිවාර්ය වන්නේ, ජාතික ආර්ථිකයේ එක් හෝ තවත් ක්ෂේත්‍රයක විශේෂඥයන් ධනපතියන් ගේ සේවක තත්වයේ සිට වැඩ කරන ජනතාවගේ සේවකයන් බවට, ඔවුන්ගේ උපදේශකයන් බවට පරිවර්තනය කිරීම අපට එක් වරම කළ නොහැකි වන බැවිනි. අපට වහාම මෙම කටයුත්ත කළ නොහැකි වුවත් එය මඳ වශයෙන් හෝ අශුභවාදී හැඟීම් ඇතිවීමට හේතු විය යුතු නොවේ. මක් නිසාද යත්, අද ඉටු කිරීමට නියම කරගෙන තිබෙන්නේ ලෝක-ඓතිහාසික දුෂ්කරතාවයෙන් හා වැදගත් කමෙන් යුත් කර්තව්‍යයක් බැවිනි. රුසියාවට වඩා බොහෝ අඩු නොදියුණුකමක් ඇති රටක වුවත්, අභූත පූර්ව, වේදනා සහගත, දරුණු සහ විනාශකාරී යුද්ධයේ හතර අවුරුද්දකින් පසුව පවතින තත්වයන්ට වඩා හොඳ තත්වයන් යටතේ අප සිටියත්, තනිකරම අපගේ පරිශ්‍රමයන් මගින් පමණක් අපට සමාජවාදී විප්ලවය සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කළ නොහැකිය යන කරුණ ගැන අපි ඇස් වසා නොගන්නෙමු. දැන් රුසියාවේ සිදුවන විප්ලවයෙන් ඉවතට හැරෙන සහ කාටත් පැහැදිලි බලවේග අසමානුපාතය වෙත පෙන්නුම් කරන තැනැත්තේ, තමන්ගේ නාසයට වඩා දුර නොදකින හා අවස්ථා ගණනාවකදීම බලවේග අසමානුපාතය ඇති වීමකින් තොරව කිසිම වැදගත් ඓතිහාසික වෙනසක් ඇති නොවන බව අමතක කරන ගතානුගතික "මජ්ලර්කාරයා" වැනි අයෙකි. අරගල ක්‍රියාදමයේදී, විප්ලවයේ වර්ධනයත් සමග බලවේගයන්ද වර්ධනය වන්නේය. ගැඹුරු විපර්යාසයේ මාවතට එළඹී රටක ඉහත දී වියුක්ත සහ න්‍යායික ආකාරයෙන් පමණක් මතු කරන ලද කර්තව්‍යයන් ගැන ප්‍රායෝගික වශයෙන් කටයුතු කිරීමට ආරම්භ කිරීම එම රටේ සහ එහි ජයග්‍රහණයට පත් කම්කරු පංති පක්ෂයේ ගෞරවයට හේතු වේ. මෙම අත් දැකීම කිසි කලෙකත් අමතක නොවනු ඇත. රුසියානු විප්ලවය සහ ජාත්‍යන්තර සමාජවාදී විප්ලවය ගෙවන මග කොතරම් දුෂ්කරතා සහිත වුවත්, දැනට වෘත්තීය සමිති තුළ හා ප්‍රාදේශීය සංවිධාන තුළ එක්සත් වී සිටින කම්කරුවන් ජාතික පරිමාණයෙන් මුළු නිෂ්පාදනයම සංවිධානය කිරීමේ ප්‍රායෝගික කටයුතුවලින් ලබන අත්දැකීම ඔවුන්ගෙන් උදුරා ගත නොහැකිය. එම අත්දැකීම සමාජවාදයේ ජයග්‍රහණයක් ලෙසට ඉතිහාස ගත වී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තිබේ. අනාගත ලෝක විප්ලවය එහි සමාජවාදී ප්‍රාසාදය ගොඩ නගනු ඇත්තේ එය මතය.

තවත් ප්‍රශ්නයක් ගැන මතක් කිරීමට මට අවසර දෙන්න. ශ්‍රේෂ්ඨ ආර්ථික මණ්ඩලයට ප්‍රායෝගික විසඳුමක් සෙවීමට සිදුවන ඉතාමත් දුෂ්කර ප්‍රශ්නය සමහර විට එය විය හැකිය. මෙය ශ්‍රම විනය පිළිබඳ ප්‍රශ්නය ය. මෙම ප්‍රශ්නය ගැන සඳහන් කිරීමේදී හරියටම කියතොත් අප පිළිගත යුතු සහ තෘප්තියෙන් අවධාරණය කළ යුතු කරුණක් ඇත. එය නම්, මෙම ප්‍රශ්නය, ලෝක ඓතිහාසික වැදගත් කමකින් යුත් මෙම ප්‍රශ්නය විසඳීමට ස්වාධීන ලෙස ප්‍රථමයෙන්ම කටයුතු ආරම්භ කළේ නියත වශයෙන්ම වෘත්තීය සමිතිම බව ය; ඒවායේ ලොකුම සංවිධාන වන ලෝහ කම්කරු සංගමයේ මධ්‍යම කාරක සභාව සහ සමස්ත රුසියා වෘත්තීය සමිති මණ්ඩලය බවය. මෙම ප්‍රශ්නය ගැන වටහා ගත හැකි වනු පිණිස අපි ඒ අර්ධ, සුළු අසාර්ථක වීම් වලින්ද, වෙනම ගත් කල ජයගත නොහැකි සේ පෙනෙන නො ඇදහිය හැකි තරම්වන දුෂ්කරතා කෙරෙන්ද ඉවතට හැරෙනු යුත්තෙමු. අපි උසස් මට්ටමකට නැගී සමාජ ආර්ථික ක්‍රමයන්ගේ ඓතිහාසික වෙනස් වීම් ගැන සමීක්ෂණය කළ යුත්තෙමු. අප භාරගෙන තිබෙන කර්තව්‍යයේ දැවැන්ත ස්වභාවය තක්සේරු කළ හැකි වන්නේ මෙම දෘෂ්ටි කෝණයෙන් පමණකි. මේ දක්වාම, රුසියාවේ 1861[55] දක්වාම ඉඩම් දේපල හිමියන් අතලොස්සක් විසින් තමන්ගේම කාර්යයක් සේ සලකා ඉටු කරන ලද කර්තව්‍යය, මෙම අවස්ථාවේදී සමාජයේ ඉතාමත් දියුණු නියෝජිතයන් වන වැඩ කරන සහ සූරාකනු ලබන ජනතාව විසින් ඔවුන්ගේම ක්‍රියාරම්භකත්වයෙන් තමන් වෙත පවරා ගනු ලැබ තිබීමේ වැදගත් කම අගය කළ හැකි වනු ඇත්තේ ඒ අනුව පමණකි. ඒ කාලයේදී රාජ්‍ය කටයුතු ඒකාබද්ධ කිරීම සහ විනය ඇති කිරීම එම අතලොස්සගේ කටයුත්තක් විය.

වැඩවසම් ඉඩම් හිමියන් විනය ඇති කළේ කෙසේද යන්න අපි දනිමු. එය ජනතාවගෙන් බහුතරයකට පීඩනය, අවමානය හා බරපතල වැඩ සහිත සිර ගෙයක බඳු නොඇදහිය හැකි තරම් වධ වේදනා ගෙන දෙන්නක් විය. ප්‍රවේණිදාස ක්‍රමයේ සිට ධනපති ආර්ථිකය දක්වා වූ මෙම පරිවර්තනය මුළුමණින්ම සිහියට නගන්න. 1861 න් පසුව නව ධනපති ආර්ථිකයට පරිවර්තනය වීම ඓතිහාසික වශයෙන් කොතරම් පහසු වීද යනු, නැතහොත්, පොල්ලේ විනයෙන්, ඉතාමත් අසාධාරණ, බල පුළුවන්කාර සහ තිරශ්චීන අවමානයේ සහ පෞද්ගලික හිංසනයේ විනයෙන් ධනපති විනය දක්වා, සාගින්නේ විනය දක්වා, සැබෑ ධනපති වහල් ක්‍රමයේ විනය වන ඊනියා නිදහස් කුලියට බැඳීම දක්වා පරිවර්තනය සිදු වූයේ ඓතිහාසික වශයෙන් කොතරම් පහසුවකින්ද යනු ඔබ දැක ඇති සියල්ලම අනුව,

ඔබ දැක නැතත්, වැඩිහිටි පරම්පරාවලින් අසා ඔබ දැනගත් සියල්ල අනුව, ඔබ දන්නෙහිය. එය එසේ පහසු සේ පෙනුනේ මිනිස් වර්ගයා එක සූරා කන්නෙකු වෙතින් තවත් සූරා කන්නෙක් වෙතට ගිය හෙයිනි; ජනතාවගේ ශ්‍රමය කොල්ල කෑ සහ සූරා කෑ එක් සුළු පිරිසක් ඉවත් වී ජනතාවගේ ශ්‍රමය කොල්ලකන සහ සූරා කන තවත් සුළු පිරිසකට ඉඩ දුන් හෙයිනි. වැඩවසම් ඉඩම් හිමියන් ඉවත්ව ධනපතියන්ට, නැතහොත් එක සුළු පිරිසක්ඉවත්ව තවත් සුළු පිරිසකට ඉඩ දුන් අතර වෙහෙසෙන සහ සූරාකනු ලබන පංති පීඩිත තත්වයේම සිටි හෙයිනි නමුත්, එක සූරා කන්නෙකුගේ විනයේ සිට තවත් සූරා කන්නෙකුගේ විනයට යාමේ මෙම වෙනස සඳහාද අවුරුදු දශක ගණනක නොවේ නම්, අවුරුදු ගණනාවක හෝ පරිශ්‍රමයන් අවශ්‍ය විය. එම වෙනස දශක ගණනක නොවේ නම්, වර්ෂ ගණනාවක පරිවර්තනීය කාලසීමාවක් තිස්සේ සිදුවූවක් විය. සියල්ලක්ම සිදී විනාශ වී යනු ඇතැයිද, ප්‍රවේණිදාස ක්‍රමය නොමැතිව කිසිසේත් රට පාලනය කළ නොහැකි යයිද එකල සිටි මහළු ඉඩම් හිමියෝ අවංකවම කල්පනා කළහ. ඒ අතර, අඩියක් අඩියක් පාසා ප්‍රායෝගික දුෂ්කරතාවයන්ට මුහුණ දුන් අළුත් ධනපති ලොක්කා අසාර්ථක දෙයක් ලෙස සලකා ඔහුගේ ව්‍යවසාය අත්හැර දැම්මේය. මෙම පරිවර්තනයේ දුෂ්කරතාවයන් ගැන කියන ප්‍රබල සාක්ෂියක් හා වැදගත් සාධක අතුරෙන් එකක් මෙසේය. රුසියාවේ ප්‍රයෝජනය සඳහා එකල පිටරටින් රුසියාවට හොඳම යන්ත්‍ර ආනයනය කරන ලද නමුත්, මෙම යන්ත්‍ර ක්‍රියාත්මක කරවීමට කිසිවෙක් නොසිටි අතර, කළමණාකරුවන්ද නොවීය. එනිසා රුසියාව සෑම තන්හිම ප්‍රයෝජනයට නොගෙන ඇති අනර්ඝ යන්ත්‍ර තිබෙනු දක්නා ලදී. පැරණි වැඩවසම් විනයේ සිට අළුත් ධනපති විනයට පරිවර්තනය වීම එතරම් දුෂ්කර දෙයක් විය.

එනිසා සහෝදරවරුනි, ඔබ ප්‍රශ්නය දෙස මේ පැත්තෙන් බලන්නෙහි නම්, ඒ මිනිසුන් විසින්, එම පංති විසින්, නැතහොත්, තැතිගැන්ම පැතිරවීම, අපේක්ෂා භංගත්වය පැතිරවීම, අපගේ කටයුතු සියල්ලම ගැන සම්පූර්ණ කලකිරීම ඇති කිරීම, එම කටයුතු සම්පූර්ණයෙන්ම අසාර්ථක සේ පෙන්වීම නම්, එකම කර්තව්‍යය කොටගෙන සිටින, එමෙන්ම, ජනතාව නව විනයක් නිර්මාණය කරන විට දූෂණයව නොතිබුණු, විනය රහිතකම නොතිබුණු, වේදනා සහිත අත්හද බැලීමේ පියවරයන් නොතිබුණු, සැබැවින්ම ශ්‍රේෂ්ඨවූ විප්ලව එකක් හෝ ලෝකයේ, නැතහොත් ඉතිහාසයේ ඇති වූ කලෙක මෙන්, අවිනය හා දූෂණය පිළිබඳ සෑම අවස්ථාවක්ම වෙත පෙන්වමින්, එය හේතුවක් කොට ගෙන විප්ලවය හරි නොයන දෙයක් සේ සලකා එය අත් හරින, ඒ ධනපතියන් හා ඔවුන්ගේ අන්තේවාසිකයන් විසින් ඔබ නොමග යවනු ලැබීමට ඔබ ඉඩ නොදෙනු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඇත. ඇත්ත වශයෙන්ම දශලක්ෂ සංඛ්‍යාත වැඩ කරන සහ සූරාකනු ලබන ජනතාව විසින් නව විනයක්, එනම්, ශ්‍රම විනය, සහෝදරාත්මක සම්බන්ධතාවයේ විනය, සෝවියට් විනය නිර්මාණය කරනු ලබන, ඉතිහාසයේ මෙම ප්‍රාථමික අවධියට එළඹුනු ප්‍රථම අවස්ථාව මෙය බව අපි අමතක නොකළ යුත්තෙමු. මෙම ක්ෂේත්‍රයෙහිදී ඉක්මන් ජයග්‍රහණ ලැබිය හැකි බවක් අප කියන්නේ හෝ අපේක්ෂා කරන්නේ හෝ නැත. මෙම කර්තව්‍යය සඳහා මුළු ඓතිහාසික යුගයක්ම ගත වනු ඇති බව අපි දන්නෙමු. අපි මෙම ඓතිහාසික යුගය ආරම්භ කර ඇත්තෙමු. එය වූකලී තවමත් ධනපති වන රටක සිටින අප, ධනපති සමාජයේ විනය කඩා බිඳ දැමීමට කටයුතු කරන යුගයකි. මෙම විනාශ කිරීමේ කර්තව්‍යයෙහි දී දේශපාලන විඥානය ඇති සියලුම කම්කරුවන්ද, වෙහෙස වී වැඩ කරන සියලුම ගොවි ජනයාද, සෑම තන්හිදීම අපට ආධාර කිරීම අපගේ ආඩම්බරයට හේතු වෙයි. එම යුගය වනාහි, වැඩ කරන ජනයා සූරාකෑම සහ වහල් කිරීම පදනම් කොටගත් මෙම විනය, එක්සත් ශ්‍රමයේ විනයක් වනසේ, එනම්, කෝටි සංඛ්‍යාත සහ දශ කෝටි සංඛ්‍යාත ජනගහනයක් සහිත රටක, මුළු රුසියාවේම, එක්සත් හා සංවිධානය වූ කම්කරුවන්ගේ සහ වැඩ කරන ගොවි ජනතාවගේ විනයක් වන සේ වෙනස් කළ යුතු බව, ඉහළින් ලැබෙන උපදෙස් අනුව නොව, ස්වේච්ඡාවෙන්ම, ජනතාව විසින් තමන්ගේම ක්‍රියාරම්භකතාවයෙන් අවබෝධ කරගනු ලබන සමයකි. මෙය මහා දුෂ්කර කර්තව්‍යයකි. නමුත් එය ප්‍රශංසනීය කර්තව්‍යයකි. මා එසේ කියන්නේ, අප දන් වල ලමින් සිටින ධනපති සමාජයේ මිනී පෙට්ටියෙහි අවසාන ඇණය වැදෙන්නේ අප එම කර්තව්‍යය ව්‍යවහාරයෙන් විසඳූ පසුව පමණක් වන හෙයිනි. (අත්පොළසන්.)

1918 මැයි 27 දින "පෙත්‍රොග්‍රාද්ස්කයා ප්‍රාව්දා", අංක 108 (සවස මුද්‍රණය), 1918 මැයි 28 දින, "ප්‍රාව්දා", අංක 104 සහ "ඉස්වෙස්තියා", විට්සික් අංක 106 යන පත්‍රවල වාර්තාවිය

1918 මොස්කව්හි පළ කෙරුණු "ප්‍රථම සමස්ත රුසියා ආර්ථික මණ්ඩල සම්මේලනයේ සම්පූර්ණ වාර්තාව" යන පොතෙහි සම්පූර්ණයෙන් පළවිය

වී. අයි. ලෙනින් සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 36, පිටු 377–386

මුළු රටෙහිම මහා පරිමාණ නිෂ්පාදනය උපරිම තම මට්ටමින් මධ්‍යගතව තිබීම කොමියුනිස්ට් ක්‍රමය සඳහා අවශ්‍යතාවයක්ද, කොමියුනිස්ට් ක්‍රමයෙන් අදහස් වන්නක්ද වේ. එනිසා කිසියම් කර්මාන්ත අංශයක සියලුම ව්‍යවසායයන් කෙළින්ම පාලනය කිරීමේ අයිතිය සමස්ත-රුසියා මධ්‍යස්ථානයට නිශ්චිත වශයෙන්ම දිය යුතුය. මධ්‍යස්ථානයෙන් දෙන පොදු නිෂ්පාදන නියමයන් සහ තීරණ අනුව, පළාත් මධ්‍යස්ථාන ප්‍රාදේශීය ජීවනයේ කොන්දේසි ආදිය සැලකිල්ලට ගනිමින් ඒවායේ කාර්යයන් පැහැදිලි කර ගනිති.

කොමිසමේ කෙටුම් පතෙන් අදහස් වන පරිදි, කිසියම් කර්මාන්තයකට අයත්ව රට මුළුල්ලේම ඇති සියලුම ව්‍යවසායයන් කෙළින්ම පාලනය කිරීමේ අයිතිය සමස්ත-රුසියා මධ්‍යස්ථානයට අහිමි කිරීම යනු කොමියුනිස්ට් ක්‍රමය නොව, අරාජික-සම්මේලවාදය වනු ඇත.

1918 ජූනි 2 දින ලියන ලදී

ප්‍රථමයෙන් පළ කරන ලද්දේ 1959 දී "ලෙනින් එකතු කළ කෘති XXXVI" හිය

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 36, පිටු 392

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

පස්වැනි සමස්ත රුසියා කම්කරු, ගොවිජන, සොල්දදු සහ රතුහමුද නියෝජිත සෝවියට් සභා සම්මේලනය[57]

1918 ජූලි 4–10

මහජන කොමිසාර් මණ්ඩලයේ වාර්තාව ජූලි 5 දින

මට කලින් කථා කළ කථිකයා සමහර අවස්ථාවල අතිශය කැළඹිල්ලට පත් වූ නමුත්[58] මම මහජන කොමිසාර් මණ්ඩලය වෙනුවෙන් මගේ වාර්තාව සුපුරුදු ආකාරයෙන් ඉදිරිපත් කරන්නෙමි. ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රශ්නවල වැදගත්කම අනුව ඒවා ගැන පිළිවෙළින් කරුණු ඉදිරිපත් කරන අතර කලින් කථිකයා බොහෝ රුචිවනු ඇති ඒ තර්කය වෙත ඇදී නොයාමට මම අදහස් කරමි. නමුත් එම තර්කය සම්පූර්ණයෙන්ම අමතක කිරීමටද මගේ බලාපොරොත්තුවක් නැත. පසු ගිය සම්මේලනයෙන් පසුව අපගේ ස්ථාවරය නිගමනය කළ, අපගේ ප්‍රතිපත්තිය වෙනස් කළ සහ රුසියාවේ වෙනත් යම් යම් පක්ෂ කෙරෙහි අප අනුගමනය කරන උපක්‍රම හා දක්වන ආකල්පය හැඩ ගැස් වූ ප්‍රධාන සාධකය වූයේ බ්‍රෙස්ට් ගිවිසුම බව ඔබ දන්නෙහි ය. පසුගිය සම්මෙලනයේ දී අපට කොතරම් දෝෂාරෝපනය කරන ලදද, අපට කොතරම් චෝදනා කරන ලදද යනුත්, සුප්‍රසිද්ධ විරාමයෙන් රුසියාවට වන වැඩක් නැතැයිද, කොහොම වුනත් ජාත්‍යන්තර අධිරාජ්‍යවාදී සන්ධානයක් ඇති කරගෙන ඇතැයිද, අප යෝජනා කළ සේ පසුබැසීමෙන් කිසිම යහපතක් නොවෙතැයිද කියමින් කී දෙනෙක් විසින් ඝෝෂා කරන ලදද යනුත්, ඔබට මතක ඇති. ධනපති රටවල මූලික ස්ථාවරය නිශ්චය වූයේද මෙම මූලික සාධකය අනුවය. එනිසා ස්වාභාවික වශයෙන්ම අපි ඒ ගැන විමසිය යුත්තෙමු. අපට කොතරම් දෝෂාරෝපනය කළත්, චෝදනා කලත්, අප නිවැරදි වූ බව පසු ගිය තුන් මස තුළ අවිවාදී සත්‍යයක් බවට පත් වී යයි මම සිතමි. නිර්ධන පංතිය සහ අනුන් සූරා නොකන හා ජනතාවගේ සාගින්නෙන් ලාභ නොඋපදවන ගොවි ජනතාව සම්පූර්ණයෙන්ම හා කොන්දේසි විරහිතව අපගේ පැත්ත ගෙන සිටින බව අපට කිව හැකිය. එසේම යුද්ධයට පැටලීමට හදන සහ බ්‍රෙස්ට් ගිවිසුමට විරුද්ධවන ඒ මෝඩ මිනිසුන් සමග ඔවුහු කොහොමටත් එකඟ නොවෙති. (කලබල ස්වභාවයක්.)

ජනතාවගෙන් දහයෙන් නව පංගුවක්ම අපගේ පැත්තේය. තත්වය තව තවත් පැහැදිලි වෙත්ම, එය වඩාත් ස්ථිර වේ. දැන් බටහිර යුරෝපීය අධිරාජ්‍යවාදී පක්ෂ, එනම්, ප්‍රධාන අධිරාජ්‍යවාදී කණ්ඩායම් දෙක මාරක අරගලයකින් බැඳී සිටින විට, අපට පැහැදිලි දළ සේයා ස්වරූපයෙන් පෙනෙන පාතාලය වෙත මසක් පාසාම, සතියක් පාසාම, දිනක් පාසාම ඔවුනොවුන් තල්ලුකරමින් සිටින විට, අපගේ උපක්‍රම නිවැරදි වූ බව අන්, කවර දටත් වඩා හොඳින් පැහැදිලි වන්නේය. ඒ බව වඩාත් හොඳින් හැඟෙන්නේ හා වැටහෙන්නේ යුද්ධය ගැන නන්දෙඩන අයට නොව එය අත්දුටු සහ යුද්ධ යනු කුමක්ද යනු දත් අයටය. මේ කණ්ඩායම් දෙකෙන් එකකටත් වඩා අපේ ශක්තිය අඩුව තිබෙන තාක් කල්, රුසියාවේ කම්කරුවන්ට හා පොදු වශයෙන් වැඩ කරන ජනතාවට විප්ලවයේ ඵල භුක්ති විඳීමටත්, වැදී තිබෙන පහරින් සිදු වූ තුවාළ සුව කරගෙන ඔවුන්ගේ පූර්ණ පෞරුෂත්වයෙන් නැගී සිටිමින්, නව පන්නයේ, නව ක්‍රියාමාර්ගයක් අනුව සංවිධානය වූ හා විනය සම්පන්න වූ යුද්ධ හමුදවක් ඇති කිරීමටත්, අපට හුදෙක් වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන්... (වම් පැත්තෙන් අත්පොළසන්. දකුණු පැත්තෙන් කෙනෙක්: ''කෙරෙන්ස්කි!'') එම කටයුතු කිරීමටත් ඉඩ සලසන ඒ මූලික වෙනස සිදුවී නොමැති තාක් කල්, අපට ප්‍රමාද වීමට සිදුවන බව ඉතාමත් පැහැදිලි දෙයකි. එනිසා, අපි පොදු ජනතා කොටස් අතර ගැඹුරට යන්නෙමු නම්, මෝල්වල සහ පැක්ටරිවල වැඩ කරන කම්කරුවන් වෙතද, ධාන්‍ය සඟවා තබන සහ ආහාර ආඥදායකත්වයට බිය වන කුලාකයාගේ ලාභ ගැරීමේ උවමනාවන් ආරක්ෂා නොකරන හා කුලී ශ්‍රමය සූරා නොකන, වැඩ කරන ගොවි ජනයා වෙතද වඩාත් සමීප වන්නෙමු නම්, එහිදීද අපට ලැබෙනු ඇත්තේ හා ලැබෙන්නේ සම්පූර්ණ සහයෝගය හා එකඟත්වය බව වඩාත් නිසැක ලෙස අපට කිව හැකිය. ඇත්ත වශයෙන්ම දැනටමත් අපට එසේ සහයෝගය හා එකඟත්වය දක්වා ඇති බව සම්පූර්ණ විශ්වාසයෙන් යුතුව කිව හැකිය. ඔව්, සමහරු ඔවුන්ගේ නොදැනුම් කම හෝ වදන්වලින් මෝහනය වීම හෝ නිසා, ජනතාව යුද්ධය වෙතට දැක්කීමට කොතරම් උත්සාහ කළත්, ඒ සඳහා ඔවුන් කඩතුරාවක් කොට ගන්නා උගුල් වදන් කොතරම් හැඩ වුවත්, ජනතාවට මෙම අවස්ථාවේදී යුද්ධ කිරීමේ උවමනාවක් නැති බවද, යුද්ධ කිරීමට පුළුවන් කමක් නැති බවද, ඔවුන් මෙම සතුරන්ට, එනම්, අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව යුද්ධ නොකරනු ඇති බවද සත්‍යයකි. සහෝදරවරුනි, මෙම අවස්ථාවේදී කෙළින් නැතහොත් වක්‍ර ආකාරයෙන්, විවෘත නැතහොත් ආවෘත ලෙස යුද්ධය ඉල්ලා හඬ නගන ඕනෑම කෙනෙක්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වෙතොත්, බ්‍රෙස්ට් ගිවිසුම තොණ්ඩුවක් යයි කියමින් උඩුබුරන ඕනෑම කෙනෙක් වෙතොත්, ඔහුට නොපෙනෙන දෙයක් ඇත. රුසියාවේ කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ බෙල්ල වටා තොණ්ඩුවක් දමන්නේ කෙරෙන්ස්කි සහ ඉඩම්හිමියන්ද, ධනපතියන් සහ කුලාකයන්ද බව ඔහුට පෙනෙන්නේ නැත... (සභාවෙන් හඬක්: "මිර්බාහ්!" කලබල ස්වභාවය.) ඔවුන් කෑගැසුවාවේ; හැම රැස්වීමකදීම ඔවුන් කරන්නේ එයයි. ජනතාව අතර ඔවුන්ගේ කටයුතුවලට කිසිම සහයෝගයක් නැත! (අත්පොළසන් සහ කලබල ස්වභාවය.)

මේ මිනිසුන් වැටී සිටින තත්වය දෙස බලන විට ඔවුන්ට පිළිතුරු දීමට ඇත්තේ කෑගැසීමේ, සන්නියෙන් මෙන් දෙඩවීමේ හා බැණීමේ සහ අසංවර ලෙස හැසිරීමේ මාර්ගය පමණක් වීම ගැන මම මඳක් වත් පුදුම නොවෙමි. (අත්පොළසන්.) ඔවුන්ට වෙනත් තර්ක නොමැති විට... (සභාවෙන් හඬක්: "අපට තර්ක තිබෙනවා!" කලබල ස්වභාවය.)

මෙම යුද්ධය යටපත් කිරීම සඳහා මොන තරම් වධ වේදනා විඳින්නට සිදු වීද යනු රුසියානු සොල්දදුවන් අතුරෙන් සියයට අනූ නව දෙනෙක්ම දනිති. යුද්ධය නව සමාජවාදී සහ ආර්ථික පදනමක් මත තැබීම සඳහා (සභාවෙන් කෑගැසීම්: "ඒක කරන්න මිර්බාහ් ඔබට ඉඩ දෙන්නේ නැත!") මොන තරම් දැවැන්ත පරිශ්‍රමයක් අවශ්‍ය වන්නේද යන්න සහ ප්‍රථමයෙන්ම අපට කොල්ලකාරී යුද්ධය කෙළවරක් කිරීමට සිදුවූ බව ඔවුහු දනිති. අධිරාජ්‍යවාදයේ වියරු වැටුනු බලවේගයන් දිගටම යුද්ධ කරන බව හා සම්මේලනයෙන් ඉක්බිතිව ගතවූ මාස තුන තුළ ඔවුන් පාතාලයට තවත් පියවර කීපයකින් සමීප වූ බව දන්නා රුසියානු සොල්දදුවෝ මෙම යුද්ධයට සම්බන්ධ වීමට කැමති නොවෙති. සාමය ප්‍රකාශයට පත් කිරීමේ අගය වටහා ගත් අප, ට්‍රොට්ස්කි සහෝදරයාගේ නායකත්වයෙන් යුත් අපගේ බ්‍රෙස්ට් නියෝජිත මණ්ඩලය මාර්ගයෙන් සාමයේ අගය සියලුම රටවල කම්කරුවන්ට අවබෝධ කරමින් අපගේ යුතු කම සියලුම ජාතීන් වෙත ඉටු කළ පසු, අප විවෘත ලෙස අවංක ප්‍රජාතන්ත්‍රවාදී සාමයක් යෝජනා කළ පසු, කෝපයෙන් උමතු වූ සියලුම රටවල ධනපතියෝ එම යෝජනාව අසාර්ථක කළහ. අප ගත යුතු ස්ථාවරය ප්‍රමාදවී සිටීම හැර අන් කිසිවක් විය නොහැකිය. ඒ එසේ වුවත්, අද තවමත් ශක්තිය සහිත වන මෙම වියරු වුණු අධිරාජ්‍යවාදී කණ්ඩායම්, දැන් කොයි කාටත් පෙනෙන ලෙසට ළඟාවෙමින් සිටින ඒ පාතාලය තුළට ඇද වැටෙනු දැකීමට ජනතාවට ඉඩ ලැබෙනු ඇත... (අත්පොළසන්.) උවමනාවෙන් ඇස් පියා නොගන්නා සැම දෙනාටම එය පෙනෙනු ඇත. යුද්ධය දිග්ගැස්සීම පිණිස වියරු වැටුනු අධිරාජ්‍යවාදී පක්ෂය තමන්ට හැකි සැම ප්‍රයත්නයක්ම දරු මෙම මාස තුන හමාරක කාලය තුළ, පාතාලය නියත වශයෙන්ම සමීප වී තිබේ. අප තවමත් යුද්ධය සඳහා සූදනම් නැති බව අපි දන්නෙමු, හඟින්නෙමු, වටහාගෙන සිටින්නෙමු. යුද්ධයෙන් අදහස් වන්නේ කුමක්ද යන්න ව්‍යවහාරයෙන් දන්නා ආයුධ දරන මිනිසුන් වන සොල්දදුවන් කියන්නේ එයයි. බ්‍රෙස්ට් තොණ්ඩුව වහාම ඉවත දැමිය යුතුයයි කියා කෑගසන්නේ මෙන්ෂෙවික්වරුන්, දක්ෂිණ සමාජවාදී-ප්‍රජාතන්ත්‍රවාදීන් සහ කෙරෙන්ස්කි අනුගාමිකයන් වන ව්‍යවස්ථානුකූල-ප්‍රජාතන්ත්‍රවාදීන් ය. ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ අනුගාමිකයන් තවමත් සිටින්නේ කොහේද යනු, දක්ෂිණ සමාජවාදී-විප්ලවවාදීන්ගේ සහ ව්‍යවස්ථානුකූල-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ගෝලබාලයන් සිටින්නේ කොහේද යනු ඔබ දන්නෙහිය. යුද්ධය වෙතට නැඹුරු වන වාම සමාජවාදී-විප්ලවවාදීන්ගේ කථා ද එම කඳවුරෙහිදී බලවත් සේ අත්පොළසන් දී පිළිගනු ලැබෙනු ඇත. කලින් කථිකයින් කීවාක් මෙන් වාම සමාජවාදී-විප්ලවවාදීහු අසීරු තත්වයකට වැටී සිටිති: ඔවුහු වැරදි රිය මැදිරියට ගොඩවී සිටිති. (අත්පොළසන්.)

මහා විප්ලව පැන නගින්නේ ජනතාව තුළින්, ගැඹුරෙන්ම බවත්, ඒ සඳහා මාස ගණන් හා අවුරුදු ගණන් ගතවන බවත් අපි දන්නෙමු. එමෙන්ම, විප්ලවය අතර තුරදී වාම සමාජවාදී-විප්ලවවාදී පක්ෂය සිතන්නටවත් නොහැකි තරම් චපලත්වයක් දැක්වීම ගැනත් අපි පුදුම නොවෙමු. ට්‍රොට්ස්කි මෙම චපලකම් ගැන අපට මෙහිදී කීවේය. මට එකතු කිරීමට තිබෙන්නේ ඔක්තෝබර් 26 දින ආණ්ඩුවට සම්බන්ධ වන ලෙසට අප වාම සමාජවාදී-විප්ලවවාදී සහෝදරවරුන්ට ආරාධනා කළ විට ඔවුන් එය ප්‍රතික්ෂේප කළ බවත්, ක්‍රාස්නොව් පෙට්‍රොග්‍රෑඩයේ දොරකඩට පැමිණ සිටි කල ඔවුන් අප සමග නොසිටි බවත්, ඒ අනුව ඔවුන් අපට නොව ක්‍රාස්නොව්ට ආධාර කළ බවත් පමණකි. මෙම චපලකම් ගැන අපි පුදුම නොවෙමු. එසේය. මෙම පක්ෂය බොහෝ දුරක් ගොස් ඇත. නමුත් සහෝදරවරුනි, කොයි දේටත් සීමාවක් තිබිය යුතුය.

විප්ලවය අත් දැකීමෙන් සහ ව්‍යවහාරයෙන් උගෙන ගනු ලැබෙන බව අපි දනිමු. විප්ලවය නියම විප්ලවයක් වන්නේ කෝටි ගණන් ජනයා එක හඬින්, එකාවන්ව නැඟී සිටින විට පමණක් බව අපි දනිමු. (ලෙනින්ගේ වචන අත්පොළසන් හඬින් යටවී යයි. සභාවෙන් "සෝවියට් සභා දිනේවා!" යන හඬ නැගෙයි.) අප නව ජීවනයකට ඔසවා තබන මෙම අරගලය එකොළොස් කෝටි පණස් ලක්ෂයක් ජනතාව විසින් පටන් ගන්නා ලද එකකි. මෙම මහා අරගලය ඉතාමත් සාවධානව විමර්ශනය කළ යුතුය. (මහ හඬින් අත්පොළසන්.) ඔක්තෝබරයේදී, 1917 ඔක්තෝබර් 26 දින සෝවියට් රජය පිහිට වූ අවස්ථාවේදී,... (කලබල ස්වභාවය, ඝෝෂා සහ අත්පොළසන්) අපගේ පක්ෂය සහ මධ්‍යම විධායක කාරක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සභාවේ එහි නියෝජිතයන්, ආණ්ඩුවට සම්බන්ධවන ලෙසට වාම සමාජවාදී-විප්ලවවාදීන්ට ආරාධනා කළ විට, ඔවුහු එය ප්‍රතික්ෂේප කළහ. වාම සමාජවාදී-විප්ලවවාදීන් අපගේ ආණ්ඩුවට සම්බන්ධ වීම ප්‍රතික්ෂේප කළ විට ඔවුන් සිටියේ අප සමග නොව අපට විරුද්ධවය. (වාම සමාජවාදී-විප්ලවවාදීන් අසුන් ගෙන සිටි තැන්වල කලබල ස්වභාවය.) ඔබ කැමති නැති දේ කීමට මට සිදුවීම ගැන මම කණගාටු වෙමි. (දකුණු පැත්තේ කලබල ස්වභාවය වැඩි වෙයි.) නමුත් මොනවා කරන්නද? යම් විධියකින් ක්‍රාස්නොව්, ඒ කොසාක් සේනා පතියා... (කලබල ස්වභාවය හා සෝෂාකිරීම් නිසා ලෙනින්ගේ කථාවට බාධා වේ.) ඔක්තෝබර් 26 දින ඔබ කළ යුතු දේ ඔබම නොදන, එහා මෙහා වැනෙමින් අප සමග එක් වීම ප්‍රතික්ෂේප කළ විට... (මිනිත්තු කීපයක් යන තෙක් කලබල ස්වභාවය.) ඇත්ත බොහොම තිත්තයි! එහා මෙහා වැනෙමින් සිටි අය තමන්ට උවමනා කරන්නේ කුමක්දැයි නොදන අප සමග එක්වීම ප්‍රතික්ෂේප කර,අන් අයගේ ප්‍රබන්ධයන්ට කැමැත්තෙන් කන් දුන් බව මම නැවතත් ඔබට මතක් කරමි. මා ඔබට කීවා, යුද්ධයට ගිය සොල්දදුවා... (කලබල ස්වභාවය සහ අත්පොළසන්.) මීට කලින් කථා කළ කථිකයා වේදිකාවේ සිටියදී නියෝජිතයන්ගෙන් බහුතරය ඇයට බාධා කළේ නැත. නමුත් මෙය බලාපොරොත්තු විය යුතු දෙයක් ලෙස සලකමි. මේ මිනිස්සු බලාපොරොත්තු වන්නේ සම්මේලනයෙන් පිටවී යාමට නම්, එය කුණුගොඩ ඉවත් වීමක් ලෙස සලකමු! (කලබල ස්වභාවය සහ දකුණු පැත්තේ අසුන්වල කැළඹිල්ල. නිහඬවන ලෙස සභාපතිවරයා සභාවට ආයාචනා කරයි.)

එනිසා සහෝදරවරුනි, බ්‍රෙස්ට් ගිවිසුම අත්සන් කිරීමෙන් අප ගත් මග නිවැරදි බව මුළු සිදුවීම් මාලාවෙන්ම ප්‍රකට වී තිබේ. තවද, අප හුස්ම ගැනීමට තරම් කාලයක් දිනාගත් බව, පසුගිය සෝවියට් සභා සම්මේලනයේදී විරාමය ගැන දුර්වල විහිළු කළ අයද දැක සහ දැනගෙන ඇත. ඒ සඳහා අපට පුදුම එළවන තරම් මහත් පරිශ්‍රමයක් දරන්නට සිදු වූ බව සැබෑය. නමුත් මෙම විරාම කාලය තුළ අපගේ කම්කරුවෝ සහ ගොවි ජනයා සමාජවාදය වෙත එල්ල වූ දැවැන්ත පියවරක් ගත්හ. ඒ අතර, ඊට ප්‍රතිකූල වශයෙන් බටහිර බලවත්තු පාතාලය දෙසට යන දැවැන්ත පියවරක් ගත්හ. මෙම යුද්ධයේ සෑම සතියක්ම පාසා අධිරාජ්‍යවාදය වඩ වඩාත් වේගයෙන් එම තාලය දෙසට ඇදෙන්නේය.

මේ අනුව බලන කල අප පත්වී සිටින තත්වයේ දුෂ්කරතාවය නිසා අපගේ උපක්‍රම හෙළා දකින අයගේ හැසිරීම ගැන මට විස්තර කළ හැක්කේ ඔවුන් සම්පූර්ණයෙන්ම විනෂ්පත වී සිටින බව කීමෙන් පමණකි. මෙය වටහා ගැනීමට අයෙක් කළ යුත්තේ ගත වූ මාස තුන හමාර ගැන මතක්

කිරීම පමණක් බව මම නැවතත් කියමි. පසුගිය සම්මේලනයේදී කියන ලද සමහර දේ ගැන එම සම්මේලනයේ සිටි සහෝදරවරුන්ට මතක් කරන්නෙමි. එම සම්මේලනයේ වාර්තාව හෝ ඒ ගැන පුවත් පත් වාර්තා හෝ කියවන ලෙස එහි නොසිටි සහෝදරවරුන්ට නිර්දේශ කරන්නෙමි. සිදුවීම් අනුව අපගේ උපක්‍රම නිවැරදි බව ඔප්පුවී ඇතැයි යනු එවිට ඔවුන්ට අවබෝධ වනු ඇත. ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණත් ජාත්‍යන්තර සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණත් වෙන් කරන සීමා රේඛාවන් තිබිය නොහැකිය. වෙනත් රටවලද නොවැලැක්විය හැකි ලෙසම පිපිරීම් ඇරඹෙනු ඇත. ඒවා ඉක්මන් කිරීම සඳහා අපි අපට හැකි සියල්ලම බ්‍රෙස්ට් ගිවිසුම කාලයේදී කෙළෙමු. අප රටේ 1905 සහ 1917 විප්ලව ජනිත කරන ලද්දේ ඉමහත් දුෂ්කරතාවයන් මධ්‍යයේ බව එම විප්ලවවලට සහභාගී වූ අය නැතහොත් ඒවා ගැන කල්පනාකාරී ලෙස සහ බරපතල ලෙස සිතා බැලූ සහ පරීක්ෂාකර බැලූ අය දන්නවා ඇත.

රුසියාව ඒසා මහත් පිපිරීම්වලින් දෙදරුම් කනු ඇතැයි යනු 1905 ජනවාරියට හෝ 1917 පෙබරවාරියට හෝ මාස දෙකකට පෙර දැන ගැනීමට කිසිම විප්ලවවාදියෙකුට පුළුවන් කමක් තිබුණේ නැත. ඔහුට කොතරම් හොඳ පළපුරුද්දක් හා දැනුමක් තිබුණත්, ඔහුට ජනතාවගේ ජීවිතය ගැන කොතරම් හොඳ අවබෝධයක් තිබුණත්, එය දැනගැනීමේ හැකියාවක් නොවීය. එක් එක් සෝෂාවක් කෙරෙහි එල්බ ගනිමින්, සාමය කෙළවර කිරීමට හා යුද්ධය සඳහා ඉදිරියට පැනීමට සමානවන ආයාචනා නිකුත් කිරීම යනු අන්ත වික්ෂිප්තතාවයට පත් සහ සම්පූර්ණයෙන්ම උන්මත් තත්වයට පත් මිනිසුන්ගේ ප්‍රතිපත්තියය. මේ බව ඔප්පු කිරීමට මගේ හෝ වෙනත් කිසිවෙකුගේ හෝ සැකයට භාජනය නොවන අයෙකුගේ කියමනක් ගැන සඳහන් කරන්නෙමි. මා සඳහන් කරන්නේ ''ගෝලස් තෘදෙවෝව ක්‍රිස්තියන්ස්ත්ව''[59] පත්‍රයේ පළ කෙරුණු, ස්පිරිදෝනවා සහෝදරියගේ කථාවේ සඳහන් කොටසක් ගැනය.එම කථාව නිවැරදි ලෙස වාර්තා නොවූ බවට අභියෝගයක් නොවීය. ජූනි 30 දින කරන ලද මෙම කථාවට කොහෙත්ම අදාළ නොවන හා ජර්මන්වරුන්ට රූබල් කෝටි 200 ක් වටිනා රෙදි පිළි ද්‍රව්‍ය භාර දෙන ලෙසට ඔවුන් අපවෙත අවසාන නිවේදනයක් නිකුත් කළ බවක් කියන ජේළි තුනක් ස්පිරිදෝනවා සහෝදරිය විසින් ඇගේ කථාවට ඇතුළත් කරන ලදී.

තමන්ගේ ඉතාමත් අවංක නියෝජිතයන් එවැනි බොරු නැමති වගුරකට දක්කන පක්ෂයක් මුළුමනින්ම විනාශයට ඉරණම් වූවකි. බ්‍රෙස්ට් ගිවිසුම අත්සන් කිරීමට අප දැරූ මහා පරිශ්‍රමයන් හා වින්ද චිත්ත සන්තාපය ගැන නොදැන සිටීමට ගොවීන්ට පුළුවන් කමක් නැත. එම පක්ෂයේ අවංකතම සාමාජිකයන් පවා කියන ප්‍රබන්ධවලින් හා ගොතන කථාවලින්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එම සාමයේදී විඳින්නට සිදුවූ අමාරුකම් අතිශෝක්තියෙන් දැක්වීමේ අවශ්‍යතාවයක් ඇත්තෙන්ම නැත. සත්‍යය ජනතාව සමග බව අපි දන්නෙමු. අපි ඒ අනුව මාර්ග දේශකත්වය ලබන්නෙමු. ඒ අතර මේ පක්ෂය සන්නි රෝගයෙන් ඇඹරෙමින් සිටී. සාමය පිළිබඳ සත්‍ය තත්වයේ ස්ථාවරය අනුව බලන කල එවැනි අන්ත වික්ෂිප්ත තත්වයෙන් පැන නගින හැසිරීම ඕනෑම ප්‍රකෝප කිරීමකට වඩා හානිකර වේ. විශේෂයෙන්ම විප්ලවය කෙරෙහි දක්වන විද්‍යාත්මක ආකල්පයක් අනුව අවශ්‍ය වන පරිදි, සමස්තයක් වශයෙන් රුසියාවේ තිබෙන සියලුම පක්ෂ සංසන්දනය කර බලන්නෙමු නම් එය එසේ වේ. සියළුම පක්ෂවල සම්බන්ධකම් සමස්-තයක් වශයෙන් ගෙන සලකා බැලීමට අයෙක් කිසි කලෙකත් අමතක නොකළ යුතුය. තනි පුද්ගලයන් හා කණ්ඩායම් කරුණු වරදවා වටහා ගන්නට ඉඩ තිබේ; අවුලට පත්වන්නට ඉඩ තිබේ. තමන්ගේම හැසිරීම ගැන කරුණු දැක්වීමට අසමත් වීමට පුළුවන. නමුත් අපි රුසියාවේ තිබෙන පක්ෂ සියල්ලම සමස්තයක් වශයෙන් ගෙන ඒවායේ සම්බන්ධ-කම් විමර්ශනය කරන්නෙමු නම් වරදක් සිදුවිය නොහැකිය. වාම සමාජ-වාදී-විප්ලවවාදීන්ගේ ආයාචනා ඇසෙන විට දූන් දක්ෂිණ සමාජවාදී-විප්ලවවාදීන්, කෙරෙන්ස්කි, සාවින්කොව් සහ වෙනත් අය කියන්නේ කුමක්ද යන්න බලන්න... ඇත්තෙන්ම ඔවුහු උමතුවෙන් මෙන් අත්පො-ළසන් දෙති. මේ මොහොතේ රුසියාව යුද්ධයක පැටලවීමට ඔවුන් බොහොම සතුටු වනු ඇත. එසේ කිරීම මිල්යුකොව්ගේ උවමනාවට ගැලපෙන්නේය. එනිසා ඒ ආකාරයෙන් කථා කිරීම, බ්‍රෙස්ට් ගිවිසුම තොණ්ඩුවකට සමාන කිරීම යනු රුසියානු ගොවියාගේ බෙල්ලට තොණ්ඩුව දැමීමකි. බොල්ෂෙවික්වරුන් සමග රණ්ඩුවක් ගැන කී මීට පෙර කථාකළ කපීකයා මෙන් ඔවුන් බොල්ෂෙවික්වරුන්ට විරුද්ධව සටන් කිරීම ගැන කථා කරන විට මා පිළිතුරු දෙන්නේ මෙසේය: නැත සහෝදරවරුනි, මේය රණ්ඩුවක් නොවේ. නියම සහ නොවෙනස් කළ හැකි වියෝගයකි. මොනයම්,නැගෙන ඝෝෂා අසා තමන් මත් වීමට ඉඩ නොතබා, ජනතාවට සත්‍ය ප්‍රකාශ කරමින්, පවත්නා තත්වයේ මුළු වගකීමටම කර ගසන අය සහ එවැනි ඝෝෂාවලින් මත් වී, තමන්ගේ කැමැත්ත නොමැතිවම, සතුරාගේ, නැතහොත්, ප්‍රකෝපකාරීන්ගේ කාර්ය ඉටු කරන අය ඔවුනො-වුන්ගෙන් වෙන්වී යාමකි. (අත්පොළසන්.)

මම මගේ වාර්තාවේ මුල් කොටස මෙතෙකින් හමාර කරමි. මෙම මාස තුන හාමාරක කාලය තුළ උන්මත් අධිරාජ්‍යවාදී යුද්ධය, එනම් අධිරාජ්‍යවාදී රාජ්‍යයන්, පාතාලය ආසන්නයට ගමන් කර ඇති අතර ඔවුහු ජනතාවද ඒ දෙසට දක්කති. තුවාල ලත් මෙම මෘගයා අපගේ පණ ඇති දේහයෙන් මස්කුට්ටි ගණනාවක් ඉරාගෙන ඇත. අපගේ සතුරන් කොතරම් නම් වේගයකින් පාතාලය වෙතට ළඟාවෙමින් සිටීද යත්, ඔවුන්ට මාස තුන හමාරකට වැඩි කාලයක් තිබුණත්, අධිරාජ්‍යවාදී සාතනය විසින් තවත් ඒ සමාන හානියක් අපට කළත්, විනාශවන්නේ අප නොව ඔවුන් ය. එසේ කියන්නේ, ඔවුන්ගේ ප්‍රතිරෝධන ශක්තිය හීන වී යාමේ සීඝ්‍රතාවය විසින් ඔවුන් පාතාලය දෙසට වේගයෙන් අදිනු ලබන හෙයිනි. අනිත් අතට, මේ මාස තුන හමාරෙන් පසුව ආරෝග්‍ය සම්පන්න මොට්යන් හා නිරෝගී ජීවේන්ද්‍රියන් රැසක් අපට තිබෙන බව පෙන්වීමට පුළුවන. ඝෝෂාව සහ කලබලය නොමැතිව වුවද, කර්මාන්තයෙහි සහ අන් සෑම තැනෙකමත් කුඩා පරිමාණ සංස්කරණාත්මක වැඩ කෙරෙමින් පවතී. එයින් දැනටමත් ඉතාමත් ප්‍රයෝජනවත් ප්‍රතිඵල ලැබී තිබේ. එසේ තවත් මාස තුනක්, මාස හයක්, මුළු ශීත සෘතුවක් අපට වැඩ කර ගැනීමට ලැබුණහොත් අපි ඉදිරියට ගමන් කරන්නෙමු. ඒ අතර අරගලයෙන් විඩාවට පත්ව සිටින බටහිර යුරෝපීය අධිරාජ්‍යවාදී මෘගයා එවැනි තරඟයකට මුහුණ දීමට සමත් නොවනු ඇත. එසේ කියන්නේ අධිරාජ්‍යවාදය විනාශය කරා ගෙන යනු ඇති බලවේගයන් — තවමත් ආත්ම විශ්වාසය නොමැතිව සිටියත් — අධිරාජ්‍යවාදය තුළම මෝරමින් තිබෙන හෙයිනි. මේ හා සම්බන්ධ ක්ෂේත්‍රයෙහි පටන් ගෙන තිබෙන දේ, මූලික වෙනස්කම් සහිතව සහ අඩිතාලමෙන්ම පටන් ගෙන තිබෙන දේ මාස තුන හමාරකින් වෙනස් නොවනු ඇත. මෙම සංස්කරණාත්මක, කුඩා පරිමාණ, නිර්මා-ණාත්මක වැඩ ගැන කථා කරනු ලබන්නේ ඉතා අඩුවෙනි. එනිසා, අප ඒ ගැන තවත් කථා කළ යුතු යයි මට හැඟේ. කලින් කථා කළ කපීකයාගේ පහරදීම් ගැන සලකා බලන කල මට මේ ගැන නිහඬව සිටිය නොහැක. මධ්‍ය විධායක කාරක සභාව 1918 අප්‍රේල් 29 දින සම්මත කළ යෝජනාව ගැන මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි.* සෝවියට් ආණ්ඩුවේ හදිසි කර්තව්‍යයන් ගැන ඒ අවස්ථාවේ කථාවක් කළ මම, අපගේ තත්වයෙහි සිතන්නටවත් බැරි තරම් වූ දුෂ්කරතාවයන් ඇතත්, ස්වදේශයෙහි දී මූලික වශයෙන් අවධානය යොමු විය යුත්තේ නිර්මාණාත්මක වැඩ කෙරෙහි බව පෙන්වා දුන්නෙමි.

මෙහිදී අප මිථ්‍යාවන් කිසිවක් කෙරෙහි විශ්වාසය නොතැබිය යුතුය. මෙම කටයුතු කොතරම් දුෂ්කර වුවත්, අපි ඒ සඳහා අපගේ පරිශ්‍රමයන් සියල්ලම යොමු කළ යුත්තෙමු. ඔබට අපගේ අත් දැකීම් ගැන කීමට මට පුළුවන. අප මෙම කටයුතු සම්බන්ධයෙන් විශාල පියවරයන් තබා තිබෙන බව එම අත්, දැකීම්වලින් පෙනේ. අපගේ එක් එක් වැරදි අල්ලා ගන්නා ධනපතියන් කරන ලෙසට බාහිර ප්‍රතිඵල ගැන පමණක් බලන්නෙමු නම්,

---

* මෙහි පිටු 78–81 බලන්න.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අයෙකුට කීමට තරම් ජයග්‍රහණයක් නොමැති සේ ය. නමුත් අප එම කටයුතු දෙස බලන්නේ ඊට ඉඳුරාම විරුද්ධ දෘෂ්ටි කෝණයකිනි. නිදසුනක් ලෙසට ගංගා නැව් හමුදාව පරිපාලනය කිරීම ගැන කථා කරන ධනපතියෝ, අප එය බොහෝ වරක් ප්‍රතිසංස්කරණය කළ බව පෙන්වා දෙමින් සෝවියට් ආණ්ඩුවට එම කාර්යය ඉටු කිරීමේ පුළුවන් කමක් නැතැයි ද්වේෂ සහගත සතුටකින් යුතුව පළ කරති. ඊට පිළිතුරු දෙමින් මා කියන්නේ ගංගානැව් හමුදාවේ පරිපාලනය නැවත නැවතත් ප්‍රතිසංස්කරණය කරන ලදැයි කීම ඇත්තක් බවය. අපි දුම්රිය සේවාවල පරිපාලනයද එසේම ප්‍රතිසංස්කරණය කෙළෙමු. නුදුරේදී අපි ආර්ථික මණ්ඩලයෙහි ඊටත් වඩා ප්‍රතිසංවිධානයක් කරන්නට යන්නෙමු. පරිවර්තනය යන්නෙහි මුළු අර්ථය එයයි. වෙනත් වචනවලින් කියතොත්, සමාජවාදය කිසිවක් නොදත් අයගේ සාකච්ඡාවට ගෝචරවූ ඇදහිල්ලක ක්ෂේත්‍රයේ සිට, පොතේ දැනුම, නැතහොත් වැඩ පිළිවෙළ පිළිබඳ ක්ෂේත්‍රයේ සිට, ප්‍රායෝගික වැඩ පිළිබඳ ක්ෂේත්‍රයට සේන්දු වී ඇත. ඒ අනුව අද කම්කරුවෝ ඔවුන්ගේම අත්වලින් සමාජවාදය සදමින් සිටිති.

පොතෙන් ලබාගත් දැනුම පදනම් කරගෙන සමාජවාදය ගැන අප තර්ක කළ කාලය දැන් ගෙවී ඇතැයි, රුසියාවේ එම කාලය ගෙවී ඇතැයි, මම විශ්වාස කරමි. අද සමාජවාදය ගැන සාකච්ඡා කළ හැක්කේ අත් දැකීම පදනම් කරගෙන පමණකි. ඉතිහාසයේ ප්‍රථම වතාවට විප්ලවය විසින් ධනපති නිලධාරි ක්‍රමයේ පැරණි යන්ත්‍රය වන ධනපති පරිපාලන ක්‍රමය, ඉවත දමා කම්කරුවන්ටම හා ගොවිජනයාටම මෙම කාර්යයෙහි යෙදෙනු හැකි තත්වයන් නිර්මාණය කරනු ලැබ තිබේ. විප්ලවයේ මුළු අර්ථයම රැඳී තිබෙන්නේ මෙම කරුණ තුළය. මෙම කාර්යය ඉතාමත් දුෂ්කර එකකි. එම දුෂ්කරතාවය අපටම සැඟවීම මෝඩ කමකි. එය දුෂ්කර කාර්යයක් වී තිබෙන්නේ, රට පාලනය කිරීමේ අදහස් මාත්‍රයක් දුරීම සම්බන්ධයෙන් පවා කෝටි සංඛ්‍යාත ජනතාව ධනපතියන් සහ ඉඩම් හිමියන් විසින් ශත වර්ෂ ගණන් තිස්සේ එහු බඳින සහ තලා මරා දමන ලද හෙයිනි. දැන් රුසියාවේ මුළු දේහයම යුද්ධයෙන් තුවාල වී සහ පහරවැදී ඔත්පලව පවතින නිසා ජනතාව මරණාසන්න වන තෙක් පහර දෙනු ලැබූ මිනිසෙකුගේ තත්වයට පත්ව සිටින කල, සාර්වරු, ඉඩම් හිමියන් සහ ධනපතියන් අන්තයටම කඩාකප්පල් වූ රටක් අපට තබා ගොස් ඇති කල, දරුණු හා භයානක කඩාකප්පල් වීම මධ්‍යයේම සති කීපයක් තුළදී, මාස කීපයක් තුළදී නව කාර්යය, එනම්, ගොඩනැගීමේ නව කටයුතුවලට කර දීමේ වගකීම භාර ගැනීමට කම්කරුවන්ට හා කුලී ශ්‍රමය සූරා නොකන හා ධාන්‍යවලින් ලාභ නොගන්නා ගොවිජනයාවට සිදුවී තිබේ. ඔව්, මෙය ඉතාමත් දුෂ්කර කර්තව්‍යයකි. නමුත් එය ඉතාමත් අගනා කර්තව්‍යයක්ද

වන්නේය. එම වැඩ සඳහා කැප කරන සෑම මාසයක්ම අපගේ ඉතිහාසයේ අවුරුදු විස්සක් තරම් නොවේනම් දහයක් පමණවත් වටින්නේය. ඔව්, අපට අපගේ ආඥාව නිතර වෙනස් කිරීමට සිදු වේ. ආඥා ගැන විමසා බැලූ කල දැනගත හැකි මෙම සත්‍යය පිළිගැනීමට අපි බිය නොවෙමු. අපි තවමත් අංග සම්පූර්ණ හා නිමකළ යමක් නිපදවා නැත්තෙමු. වගන්ති සහ ඡේද තුළ ඇතුළත් කළහැකි සමාජවාදයක් ගැන අපි නොදනිමු. දැන් මෙම සම්මේලනය වෙත සෝවියට් ව්‍යවස්ථාවක් ඉදිරිපත් කිරීමට අපට හැකි වී තිබේ නම්, එසේ වී තිබෙන්නේ සෝවියට් සභා රට සෑම තන්හිම පිහිටුවා ඒවා උරගා බලා තිබෙන හෙයිනි; ඔබම එම ව්‍යවස්ථාව නිර්මාණය කර එය රට මුළුල්ලේම අත් හදා බැලූ හෙයිනි. ඔක්තෝබර් විප්ලවයෙන් පසුව හය මසක් හා ප්‍රථම සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනයෙන් පසුව අවුරුද්දක් පමණ ගෙවී ගිය තැන පමණකි, ව්‍යවාහරයේ දැනට පවතින දෙය ලිවීමට අපට හැකි වී තිබෙන්නේ[60].

ආර්ථික ක්ෂේත්‍රයෙහි දී අප සමාජවාදය ගොඩනැගීම ආරම්භ කර තිබෙන්නේ දැන්ය. එහිදී නව විනයක් ගොඩනැගිය යුතුව තිබේ. අපට එවැනි අත් දැකීමක් නැත. අප එම අත් දැකීම ලබන්නේ වෙනස් කිරීම් හා ප්‍රතිසංස්කරණය කිරීම් මගිනි. අපගේ ප්‍රධාන කර්තව්‍යය එයය. සෑම නව සමාජ ක්‍රමයක්ම සඳහා මිනිසුන් අතර නව සම්බන්ධයක්, නව විනයක් අවශ්‍ය වන බව අපි කියමු. වැඩවසම් විනය නොමැතිව ආර්ථික ජීවිතය කිසිසේත් පවත්වා ගත නොහැකි වූ කාලයක් විය. එය කස පහරේ විනය විය. එසේම එය ධනපතියන්ගේ පාලනයේ කාලයක්ද විය. එවිට විනයදායක බලය වූයේ කුසගින්නය. නමුත් දැන්, සෝවියට් විප්ලවය සමග, සමාජවාදී විප්ලවයේ ආරම්භය සමග සම්පූර්ණයෙන්ම නව ප්‍රතිපත්ති මත විනය ගොඩනැගිය යුතුව තිබේ. එය කම්කරුවන්ගේ සහ දුප්පත් ගොවිජනතාවගේ සංවිධාන ශක්තිය කෙරෙහි තබන විශ්වාසයේ විනයක්, සහෝදරත්වයේ විනයක්, අතිශය අන්‍යෝන්‍ය ගරුත්වයේ විනයක්, අරගලයේදී දක්වන ස්වාධීනත්වයේ හා ක්‍රියාරම්භකතාවයේ විනයක් විය යුතුය. පරණ ධනපති විධි යොදා ගන්නා ඕනෑම කෙනෙක්, දුර්භික්ෂයේ සහ අගහිඟකමේ අවස්ථාවෙහි පැරණි ධනපති ක්‍රමයෙන් තර්ක කරන — මම තනිවම මගේ ධාන්‍ය විකුණාගත හොත්,මට වැඩි ලාභයක් ලැබෙනු ඇත; එමෙන්ම මම තනිවම ධාන්‍ය සපයා ගැනීමට යතොත්, මට එය වඩාත් පහසුවෙන් ලබාගත හැක — ඒ ආකාරයට තර්ක කරන ඕනෑම කෙනෙක්, වඩාත් පහසු මාර්ගය තෝරා ගැනීමට ඉඩ තිබෙන නමුත් ඔහු කිසි කලෙකත් සමාජවාදය වෙත නොළඟෙනු ඇත.

සුපුරුදු ධනපති සම්බන්ධකම් පිළිබඳ පැරණි රජදහන තුළ සිට කටයුතු කිරීම සරලය, පහසුය. නමුත් අළුත් මාවතක යාමට අපට උවමනා වී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තිබේ. එම මාර්ගයේ යාම සඳහා අප සහ සියලුම ජනතාව කෙරෙහි උසස් මට්ටමක දේශපාලන විඥානයක් හා සංවිධානයක් අවශ්‍යය ඒ සඳහා වැඩි කාලයක් අවශ්‍යවන අතර එහිදී වඩාත් බරපතල වැරදි සිදුවේ. නමුත්, වැරදි නොකරන්නේ ප්‍රායෝගික වශයෙන් යමක් කිරීමට ප්‍රයත්න නොදරන අය පමණක් බව අපි කියන්නෙමු.

රැස්වීම අදහස් කරන ලෙසට, වෙනස් කිරීම්, සංශෝධනයන් සහ පැරැන්න වෙතට ආපසු යාම කෙනෙකුට නිතර දක්නට ලැබෙන පරිදි කෙරෙන අත්හද බැලීම් සමාලෝචනයට භාජනය වූ කාල සීමාවට අන්තර්ගත වේනම්, එය ප්‍රධාන කාරණය නොවේ. එය මෙම කාලසීමාවේ ප්‍රධාන අර්ථය හා අගය නොවේ. වැටුප් වැඩි කිරීමේ නියෝගයක් පමණක් අපේක්ෂා කළ නිලධාරීන්ගේ ආණ්ඩු යන්ත්‍රය යටගියාවට අයත් දෙයක් වී තිබේ.දැන් අපට කටයුතු කිරීමට සිදුවී තිබෙන්නේ ආර්ථික පරිපාලනය තමන් අතට ගන්නා කම්කරුවන්ගේ සංවිධාන සමගය. අන් අයට වඩා නරක තත්වයන් යටතේ වැඩ කළ හා තත්වයන් වැඩි දියුණු කරන සේ ඉල්ලීමට සාධාරණ අයිතියක් ඇති, දුම්රිය කම්කරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අපට සිදුවේ. හෙට ගංගා මාර්ග ප්‍රවාහණ කම්කරුවන් ඔවුන්ගේ ඉල්ලීම් ඉදිරිපත් කරනු ඇත. අනිද්ද මධ්‍යම ගොවිජනයා ඔවුන්ගේ ඉල්ලීම් ඉදිරිපත් කරනු ඇත. කම්කරුවන්ට අපගේ ඉතාමත් අවධාන සහගත සැලකිල්ල ලැබෙන අතර ඔහුගේ අවශ්‍යතාවයන් ආරක්ෂාකිරීමට අපගේ ආඥවන් සියල්ලම කැප කර තිබේ. නමුත් තමන් සිටින්නේ කම්කරුවන්ටත් වඩා නරක තත්වයක යයි මධ්‍යම ගොවියෝ බොහෝ විට හඟිති. මම ඔවුන් ගැන පසුව සඳහන් කරන්නෙමි. මෙම තරුණ ග්‍රහණය කිරීමේ හැකියාව කලින් කථා කළ කථිකයාට කොහෙත්ම නොතිබිණි. මේ සියල්ලම නිසා අතිමහත් දුෂ්කරතාවයන් ඇතිවේ. නමුත් එම දුෂ්කරතාවයන් පැන නගින්නේ, ශත වර්ෂ ගණනකට පසු ප්‍රථම වතාවට කම්කරුවන් හා දුප්පත් ගොවි ජනතාව තමන්ම, තමන්ගේ අත්වලින්ම මුළු රුසියාවේ ආර්ථික ජීවිතය සංවිධානය කරන හෙයිනි. ඒ අනුව සාධාරණ ඉල්ලීම් දීමේ මාර්ගයන් සොයා ගැනීමට අපට සිදුවේ. එනිසා ආඥවන් වෙනස් කිරීමට සහ පරිපාලන ක්‍රමය යළි සකස් කිරීමට අපට සිදු වේ. ධනපති පුවත්පත් තදින් අල්ලා ගන්නා සහ ඇත්තෙන්ම බහුලව පවතින මෙම වැරදීම් සහ අසාර්ථක වීම් හා සමගම එක්වරම, අපි ජයග්‍රහණද ලබා ගන්නෙමු. අපි මෙම අර්ධ වැරදීම්වලින් සහ අර්ධ අසාර්ථකවීම්වලින් පාඩම් උගෙන ගන්නෙමු. අපි සමාජවාදය ගොඩ නගන ආකාරය අත්දැකීමෙන් උගෙන ගන්නෙමු. අනිත් අතට, ඉල්ලීම් වර්ෂාවන් අප වෙත එල්ලවන විට අපි මෙසේ කියන්නෙමු: එය විය යුතු දෙයකි. සමාජවාදය යන්නෙහි අර්ථය ඇත්තෙන්ම එය ය. එය යටතේ හැම කෙනෙකුටම

තමන්ගේ තත්වයන් වැඩි දියුණු කර ගැනීමට සහ සැම දෙනාටම ජීවිතයේ යහපත භුක්ති විඳීමට උවමනා වේ. නමුත් රට දුප්පත්ය.එය දුප්පත්කමෙන් පීඩිතව සිටී. එනිසා ඉල්ලීම් සියල්ලම වහාම දීමට පුළුවන් කමක් කොහෙත්ම නැත. කඩාකප්පල් වීම මධ්‍යයේ නව ප්‍රාසාදයක් ගොඩනැගීම දුෂ්කර වනවා මෙන්ම එයද දුෂ්කරය. නමුත්, සාමය හා සන්සුන්තාවය පවතින කලෙක සමාජවාදය ගොඩනැගිය හැකියයි විශ්වාස කරන අය බරපතල මුළාවකට වැටී සිටිති. සෑම තැනෙකම එය ගොඩනගනු ලැබෙනු ඇත්තේ කඩාකප්පල් වීමේ කාලයකය; දුර්භික්ෂයේ කාලයකය. එය සිදුවිය යුත්තේ ඒ ආකාරයටය. නියම අදහස් ඇති ජනයා අපට හමුවූ විට අපි මෙසේ කියන්නෙමු: දහස් ගණන්, දස දහස් ගණන්, ලක්ෂ ගණන් කම්කරුවන් සහ වැඩ කරන ගොවිජනතාව ඔවුන්ගේම අත්වලින්, නව සමාජවාදී ප්‍රාසාදය ගොඩනැගීමේ කටයුතු ආරම්භ කර ඇත. දැන් ගම්බද පෙදෙස්වල ගැඹුරු විප්ලවයක් ආරම්භ වෙමින් පවතී. අන්‍යයන්ගේ ශ්‍රමය සූරා නොකන හෝ ධාන්‍යවලින් ලාභ නොඋපයන හෝ ගොවි ජනයාට විරුද්ධව එහි කුලාකයෝ උද්ඝෝෂණය කරති, අවහිර කරති. එනිසා එහිදී ඉටු කළයුතු කර්තව්‍යය වෙනස්ය. නගරයේ දී කළ යුතු වන්නේ පැක්ටරි සහ ලෝහ කර්මාන්තය සංවිධානය කිරීමය. යුද්ධයෙන් සිදුවී තිබෙන අලාභ හානි මධ්‍යයේ එහිදී කළ යුතු භාණ්ඩ බෙදහැරීම, අමුද්‍රව්‍ය බෙදහැරීම සහ වෙනත් ද්‍රව්‍ය බෙද හැරීම ඉතා දුෂ්කර කර්තව්‍යයක් වේ. නගරයේ කම්කරුවෝ මෙම කාර්යය ඉටු කිරීමට උගෙන ගනිති. ඒ සඳහා මධ්‍යම පරිපාලන ආයතන පිහිටුවා ගනිති. එහිදී ශ්‍රේෂ්ඨ ආර්ථික මණ්ඩලය ප්‍රතිසංස්කරණය කිරීමට අපට සිදුවේ. එසේ කළ යුතු වන්නේ, අවුරුද්ද ආරම්භයේ සම්මත කළ නීති දැනටමත් කල් ඉක්ම ගොස් ඇති හෙයිනි. කම්කරු ව්‍යාපාරය ඉදිරියට ගමනේ යෙදෙන අතර, පරණ කම්කරු පාලනය දැනටමත් යල් පැන ගොස් ඇත. දැන් වෘත්තීය සමිති මුළු කර්මාන්තයේම පරිපාලන මණ්ඩලවල කලලයන් බවට පත් වෙමින් තිබේ. (අත්පොළසන්.) මෙම ක්ෂේත්‍රයෙහි දැනටමත් කර ඇති දේ බොහෝය. නමුත් අපට තවමත් විශිෂ්ඨ ජයග්‍රහණ ගැන වහසි කීමට පුළුවන් කමක් නැත. පුරුදු පරිදි ආඥව සම්මත කර ඇති නමුත් එය ක්‍රියාත්මක කරන්නේ නැතැයිද, තවත් එකක් මේ දැන් සම්මත කර තිබෙන නමුත් තුන් මාසයක් යන විට එය වෙනස් කෙරෙතැයිද, ඒ අතර ධනපති ක්‍රමය යටතේ මෙන්ම ලාභ ගැරීම සිදුවෙතැයිද යනාදිය කියන ධනපතියන් හා සම්බන්ධ කොටස්වල, ධනපතියන්ගේ, ඉඩම් හිමියන්ගේ සහ කුලාකයන්ගේ ප්‍රචාරය ගෙනයාමට ඔවුන්ට තවත් බොහෝ කලකට ඉඩ ලැබෙන බව අපි දනිමු. ඇත්ත තමයි. එක පහරින් ලාභ ගැරීම නැවැත්විය හැකි විශ්වීය අඳුනක් ගැන අපි නොදන්නෙමු. ධනපති ක්‍රමයේ පුරුදු කම් ඉතා බලවත්ය. මෙම පුරුදු කම් යටතේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගත වර්ෂ ගණන් කාලයක් තිස්සේ හැදුණු වැඩුණු ජනයා යළි ශික්ෂණය කිරීම පහසු කාර්යයක් නොවේ. ඒ සඳහා දීර්ඝ කාලයක් ගත වනු ඇත. නමුත් අපගේ සටන් අවිය සංවිධානය බව අපි කියන්නෙමු. අපි සියලු දෙයක්ම සංවිධානය කළ යුත්තෙමු. සියලු දෙයක්ම අප අතට ගත යුත්තෙමු. කුලාකයන් සහ ලාභ ගරන්නන් මැඩලීමට පියවරක් පාසාම පරීක්ෂාකාරී විය යුත්තෙමු. ඔවුන්ගේ සෑම අඩියක්ම පාලනය කරමින් ඔවුන්ට විරුද්ධව සමාවක් නැති යුද්ධයක් ප්‍රකාශ කොට, ඔවුන්ට නිදහසේ හුස්ම ගැනීමට කිසි කලෙකත් ඉඩ නොදිය යුත්තෙමු. (අත්පොලසන්.)

නව වෙනස්කිරීම් ජනිත කරන නව දුෂ්කරතාවයන් හමුවන නිසා ආඥාවන් වෙනස් කිරීම නොවැළැක්විය හැකි බව අපි අත්දැකීමෙන් දන්නෙමු. ආහාර සම්පාදනය පිළිබඳ ප්‍රශ්නයේ දී දූන් අපි දුප්පත් ගොවිජනතාව සංවිධානය කිරීමේ අවස්ථාව වෙත එළඹ සිටින්නෙමු. එසේ වූ කල, ඉහත අපගේ සහෝදරවරු වූ වාම සමාජවාදී විප්ලවවාදීහු අප සමග එක මග යාමට නොකැමතිව වෙනත් මගක් ගන්නා බව අවංකවම — ඔවුන්ගේ අංක භාවය ගැන සැක ඇති කර ගැනීමට අපට හේතුවක් නැත — කියති නම්, අපි ඔවුන්ට මෙසේ දැඩි ලෙස පිළිතුරු දෙමු: එයින් අදහස් වන්නේ නුඹලා සමාජවාදයට පිටු පෑ බවයි, නුඹලාම නුඹලාගේ වල කපාගෙන ඇත. (අත්පොළසන්.)

සහෝදරවරුනි! ප්‍රධාන ප්‍රශ්නය වන්නේ ආහාර ප්‍රශ්නයයි. අපගේ ප්‍රතිපත්ති සකස් කිරීමේදී අප වැඩියෙන්ම අවධානය යොමු කරන්නේ එය කෙරෙහිය. ජල සහ දුම්රිය ප්‍රවාහණ ක්‍රම වැඩි දියුණු කිරීම, යුද්ධ කොමිසාර් අංශයේ ගබඩා හිස් කිරීම, ලාභ ගැරීමට විරුද්ධව සටන් කිරීම වැනි, පිටත සිට බලන්නාට නොපෙනෙන කුඩා පියවරයන් රැසක්ම ගෙන ඇති අතර ඒ සියල්ලම එල්ල කර ඇත්තේ ආහාර සම්පාදනය නිසි පදනමක් මත තැබීම වෙතය. අපගේ රට පමණක් නොව, යුද්ධයට පෙර කිසි කලෙකත් දුර්භික්ෂය යනු කුමක්දැයි නොදත්, ඉතාමත් ශිලාචාර රටවල් පවා දූන් පවතින්නේ අන්ත ආපද තත්වයකය. එම තත්වය ඇති කරන ලද්දේ එක් හෝ තවත් කණ්ඩායමක ආධිපත්‍යය සඳහා අධිරාජ්‍යවාදීන් කළ ඔවුන්ගේ අරගලය විසිනි. බටහිර රටවල කෝටි ගණන් ජනතාව කුසගිනි වේදනා විඳිමින් සිටිති. සමාජ විප්ලවය අනිවාර්‍යය වන්නේ මේ නිසාය. සමාජ විප්ලවය පැන නගින්නේ වැඩ සටහන්වලින් නොව, කෝටි ගණන් ජනයා මෙසේ කියන හෙයිනි' ''ජීවත්ව කුසගින්නේ දැවෙනවාට වඩා විප්ලවය වෙනුවෙන් මිය යාම යෙහෙකි.'' (අත්පොළසන්.)

භයානක ව්‍යසනයක්, එනම්, දුර්භික්ෂය, අප මත කඩා වැටී ඇත. අපගේ තත්වය දුෂ්කරවත්ම, ආහාර අර්බුදය වඩාත් උග්‍රවත්ම, ධනපතියෝ සෝවියට් බලයට විරුද්ධව ඔවුන්ගේ අරගලය උත්සන්න කරති. චෙකොස්ලොවැකියානු හමුදා කැරැල්ල[61] බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදීන් විසින් මිළට ගත් මිනිසුන්ගේ කැරැල්ලක් බව ඔබ දන්නෙහිය. සෝවියට් සභාවලට විරුද්ධව එක් හෝ තවත් තැනක සිදුවන කැරළි ගැන අපට නිතර අසන්නට ලැබේ. කුලාකයන්ගේ කැරළි ප්‍රදේශයෙන් ප්‍රදේශයට පැතිරී යන්නේය. දොන් ප්‍රදේශයේ ක්‍රාස්නොව් නැගී සිටී. පෙට්‍රොග්‍රෑඩයේදී ඔහු පැමිණ ඔහුගේ කඩුව භාරදුන් විට රුසියානු කම්කරුවෝ කරුණාභරිතව ඔහුට නිදහස්ව යන්නට දුන්හ. එය සිදුවූයේ බුද්ධිමතුන්ගේ පූර්වමත තවමත් බලවත් නිසා සහ ඔවුන් මරණ දඬුවමට විරුද්ධත්වය ප්‍රකාශ කළ නිසාය. ක්‍රාස්නොව් නිදහස් කර ඔහුට යන්නට දෙන ලද්දේ බුද්ධිමතුන් මරණ දඬුවමට විරුද්ධ මතයක් දැරූ හෙයිනි. කම්කරුවන්ට හා ගොවි ජනයාට වෙඩිතබන ක්‍රාස්නොව්ට අද වෙඩිතබා මැරීමේ දඬුවම නියම නොකරන මහජන උසාවියක් ඇතොත් එය දැකීමට මම සතුටු වෙමි. ජෙර්ෂින්ස්කි කොමිසම[62] ජනයා වෙඩිතබා මැරීමට නියම කළත් එහි වරදක් නැති බවත්, එහෙත්, යමෙක් ප්‍රතිවිප්ලවවාදියෙක් බව හා ඔහු වෙඩිතබා මැරිය යුතු බව උසාවියන් විසින් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන ලද හොත් එය වැරදි බවත් අපට කියනු ලැබේ. එතරම් දුරට මුණ ඉච්චාවෙන් වංචාවෙහි ගිලී සිටින මිනිස්සු දේශපාලන මෘත ශරීර වෙති. (අත්පොළසන්.) නැත. මුණ ඉච්චාවෙන් වංචා කාරයෙක් වීමට නොකැමති විප්ලවවාදියෙකුට මරණ දඬුවම අත්හැර දැමීමට පුළුවන් කමක් නැත. වෙඩි තැබීම්වලින් තොර විප්ලවයක් හෝ සිවිල් යුද්ධ කාලයක් හෝ කිසි කලෙකත් නොවීය.

අපගේ ආහාර සම්පාදනය මහා ව්‍යසනයක් හා සමාන තත්වයකට පත්ව ඇත. අපි අපගේ විප්ලවයේ ඝෝරතම කාලසීමාවට පැමිණ සිටින්නෙමු. අපි අන් සියල්ලටම වඩා විපත්බර කාල සීමාවට මුහුණ පා සිටින්නෙමු. කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ රුසියාවේ මීට වඩා දුෂ්කර කාලයක් කිසිකලෙකත් ඇති නොවීය. මෙම දුෂ්කරතාවය අස්වැන්න නෙළන තෙක් පවතිනු ඇත. මම මගේ කාලයේදී පක්ෂයේ මත වෙනස්කම් හා විප්ලවවාදී මත භේද බොහෝ දැක ඇත්තෙමි. එනිසා එවැනි අනාදර අවස්ථාවකදී, වැඩි වැඩියෙන් අය සන්නිරෝග ස්වභාවයට යටවෙමින්, ''මම සෝවියට් සභාවලින් ඉල්ලා අස්වෙමි'' යි කියමින් මරණ දඬුවම අහෝසි කිරීමට ආඥා පැනවීම ගැන කථා කරනු දැකීමෙන් මම පුදුම නොවෙමි. නමුත් තියුණු අරගල පවතින අවස්ථාවක, නීතියක් වෙනස් කළ නොහැකි වීම නිසා ඇණ සිටින තැනැත්තේ දුර්වල විප්ලවවාදියෙකි. පරිවර්තනීය කාල සීමාවකදී නීතිවල තිබෙන්නේ තාවකාලික වටිනාකමක් පමණකි. එමෙන්ම නීතිය විප්ලවයට බාධකයක් වන කල එය අවලංගු හෝ සංශෝධනය හෝ කළ යුතුය. සහෝදරවරුනි, දුර්භික්ෂය වඩාත්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දරුණු වූ තරමට, එසේම දරුණු පියවරයන් මගින් මෙම භයානක ව්‍යසනයට විරුද්ධව සටන් කළ යුතු බව පැහැදිලි වන්නේය.

සමාජවාදය දූන් ඇඳහිල්ලක් නොවන බව නැවතත් කියමි. සමහර විට දූන් එය වැඩ පිළිවෙළක්ද නොවන්නේය. අපගේ පක්ෂය තවමත් අළුත් වැඩ පිළිවෙළක් සකස් කර නැත. නමුත් පැරණි වැඩ පිළිවෙළෙහි දූන් ඇති වටිනාකමක් නැත. නමුත් පැරණි වැඩ පිළිවෙළෙහි දූන් ඇති වටිනාකමක් නැත. (අත්පොළසන්.) අද සමාජවාදය සංයුක්ත වන්නේ නිසි සහ සමාන ලෙස පාන් බෙදා දීමෙන්ය. (අත්පොළසන්.) යුද්ධයෙන් අපට ඉතිරි වී තිබෙන්නේ ආර්ථික කඩාකප්පල් වීම පිළිබඳ උරුමයකි. "අපට පසුව ලෝකය විනාශ වෙද්දෙන්" යයි කියන කෙරෙනිස්කිගේ, ඉඩම්හිමියන්ගේ සහ කුලාකයන්ගේ ප්‍රතිපත්ති නිසා රට මොන තරම් පහත් තත්වයකට වැටී තිබේද යත්, "එය තව තවත් නරක් වූ තරමට හොඳා" යයි ඔවුහු කියති. යුද්ධයෙන් අපට උරුම වී තිබෙන දුෂ්කරතාවයන් ඉතා දරුණු හෙයින් ආහාර පිළිබඳ මෙම ප්‍රශ්නය තුළ සමාජවාදී ක්‍රමයේ මුළු සාරාර්ථයම අපට දක්නට හැකි වේ. අපි මෙම ප්‍රශ්නය අප අතට ගෙන ඊට ප්‍රායෝගික විසඳුමක් සෙවිය යුත්තෙමු. එනිසා, පාන් සම්බන්ධයෙන් කළ යුත්තේ කුමක්දැයි යනු අපි අපගෙන්ම අසන්නෙමු. ගොවීන් මෙම තත්වය වාසියට හරවා ගනිමින් ධාන්‍යවලින් රූබල් දහස් ගණන් ලාභගනිද්දී හා ඒ අතරම ඔවුන් තමන් වැඩ කරන ගොවීන් ලෙසට හා සමහරවිට වාම සමාජවාදී විප්ලවවාදීන් ලෙසට පවා හඳුන්වා ගනිද්දී, අපි පැරණි ධනපති ක්‍රියාමාර්ගයම අනුව යා යුත්තෙමු ද? (අත්පොළසන් සහ කලබල ස්වභාවය.) ඔවුහු මෙසේ තර්ක කරති: ජනතාව කුසගින්නේ පෙළෙති; ධාන්‍ය මිළ වැඩි වනු ඇත. නගරවල ජනයා නිරාහාරව සිටිත් නම් මම මගේ මඩිය පුරවාගන්නෙමි. එසේම සාගතය තවත් දරුණු වෙතොත්, මම තවත් දහස් ගණනක් උපයා ගන්නෙමි. මෙවැනි තර්ක ඉදිරිපත් කිරීම ගැන දෙස් පැවරිය යුත්තේ තනි පුද්ගලයන්ට නොවන බව මම දනිමි. ඉඩම්හිමි සහ ධනපති සමාජයේ මුළු අශෝභන උරුමයම, ජනතාවට මෙසේ තර්ක කිරීමට, සිතීමට හා ජීවත්වීමට උගන්වා ඇත. අනිත් අතට කෝටි ගණන් ජනතාවගේ ජීවිතය යළි හැඩ ගැස්වීම යනු අතිශයින්ම අමාරු කටයුත්තකි. ඒ සඳහා දීර්ඝ ලෙස සහ අනවරථ වශයෙන් වැඩ කිරීම අවශ්‍යවේ. අප මෙම කාර්යයට යන්තම් අතගැසුවා පමණකි. කුසගින්නේ වධවේදනා විඳින හා සමාජවාදී ක්‍රමයෙන් පාන් බෙදීමේ යහපතක් නොදකින, එනිසා තමන් ගැන බලාගැනීමට කඩිනම් වන හා අන් සියල්ලම ගැන නොතකා හරින එක් එක් පුද්ගලයාට ජනයාට දෙස් කීමට අපි කිසි කලෙකත් අදහස් නොකරමු. මෙම මිනිසුන්ට දෙස් කිව නොහැකිය. නමුත් අප කථා කරන්නේ පක්ෂවල නියෝජිතයන් ගැන,

නිශ්චිත පක්ෂයකට සම්බන්ධ අය ගැන, විශාල ජනකායයන් ගැන වනවිට, ඔවුන් ප්‍රශ්නය දෙස බැලිය යුත්තේ, වේදනාවටපත්, හිරිහැර විඳින, සාගින්නේ පෙළෙන පුද්ගලයාගේ — ඔහුට විරුද්ධව අත එසවීමට කිසිවෙක් සිතන්නේවත් නැත — ස්ථාවරයෙන් නොව, නව සමාජයක් ගොඩනැගීමේ ස්ථාවරයෙන් බව අපි කියමු.

සියල්ලක්ම නිරවුල් ලෙස සහ සන්සුන් ලෙස සිදුවන විට කිසි කලෙකත් සමාජවාදය ගොඩනැගිය නොහැකි බව මම නැවතත් කියන්නෙමි. ඉඩම් හිමියන් හා ධනපතියන් දක්වන උමතු ප්‍රතිවිරෝධයකින් තොරව සමාජවාදය සාර්ථක කිරීම කිසි කලෙකත් නොහැකි වනු ඇත. අපගේ තත්වය වඩාත් නරක් වූ තරමට ඔවුහු සතුටින් අතුල් පිරිමදිති; තව තවත් කැරළි ගසති. අපගේ තත්වය වඩාත් නරක් වූ තරමට, අප අතර සිටින කඩාකප්පල් කාරයින් සංඛ්‍යාව වැඩි වෙයි; වඩාත් උත්සුක්ත ලෙස ඔවුහු චෙකොස්ලොවැකියානු සහ ක්‍රාස්නොව් වර්ගයේ ක්‍රියාවන්හි යෙදෙති. මේවාට විරුද්ධව සටන් කළ යුත්තේ පැරණි ආකාරයෙන් නොවන බව අපි කියමු. කළ යුතුව තිබෙන්නේ කරත්තය කන්ද පහළට පෙරළී යාමට ඉඩ දීම නොව, දුෂ්කර වූවත් එය ඉදිරියට, කන්ද උඩහට ඇදගෙන යාමය. මහජන කොමිසාර් මණ්ඩලය ආහාර ප්‍රශ්නය සලකා නොබැලූ, අප දහස් ගණනින් නිර්දේශ, නියමයන් හා ආඥවන් නිකුත් නොකළ හා දූර්භික්ෂයට විරුද්ධව සටන් කරන ආකාරය ගැන සාකච්ඡා නොකළ එකම සතියක්වත්, එකම දවසක්වත් නොවූ බව අපි හොඳින්ම දන්නෙමු. විශේෂ මිළ නියම කිරීමක්, නියමිත මිළ පැනවීමක්, ධාන්‍ය ඒකාධිකාරයක් අවශ්‍ය නැතැයිද, ජනතාවට නිදහසේ වෙළඳුම් කිරීමට ඉඩ දිය යුතු යයිද සමහරු කියති. පොහොසතුන් තවත් පොහොසත් වනු ඇත. ඒ අතර දුප්පතුන් සාගින්නේ මිය යනු ඇත. කවදත් ඔවුන්ට සිදු වූයේ එයය. නමුත් සමාජවාදියෙකුට එසේ තර්ක කළ නොහැකිය; මේ අවස්ථාවේදී, කන්දේ බෑවුම ඉතාමත් තියුණු තැනට පැමිණි විට සහ කරත්තය අමාරුම හෙළේ ඉහළට ඇදගෙන යායුතුව තිබෙන විට, සමාජවාදය පක්ෂය තුළ වෙනස් කම් පිළිබඳ ප්‍රශ්නයක් නොව, ප්‍රායෝගික ප්‍රශ්නයක් වී තිබේ. එය නම් ධාන්‍යවලින් ලාභගැරීම නොකරන ගොවිජනයා සමග සන්ධාන ගත වෙමින් කුලාකයන්ට විරුද්ධව සටන් කර අපගේ බලය රැකගත හැකිද යන්න පිළිබඳ ප්‍රශ්නයකි; එය නම් දූන්, අපට සටන් කිරීමට හා ඉතාමත් බරපතල වැඩ කටයුතුවලට මුහුණ පෑමට තිබියදී අපගේ බලය රැකගත හැකිද යන්න පිළිබඳ ප්‍රශ්නයකි. ඔවුහු දුප්පත් ගොවි කාරක සභා[63] ගැන කථා කරති. කුලාකයන් පරාජය කර නිර්දය ලෙස මර්දනය කර දැමීමට ඉතාමත් දැඩි සහ නිර්දය පියවරයන් ගත යුතු බව සාගිනි වේදනා තමන්ම දුටු අයට පැහැදිලිවම වැටහෙනු ඇත. මෙය කොතරම් තදබල සහ දැඩි

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

පියවරක්ද යනු දුප්පත් ගොවි ජනතාවගේ කාරක සභා සංවිධානය කිරීමට කටයුතු කරගෙන ගිය අපට සම්පූර්ණයෙන්ම අවබෝධ විය. නමුත් මෙම අරගලය කිරීමේ එකම විධිය වන්නේ ගම්බද දුප්පතුන් සමග සහ තොග ඇති නමුත් ලාභගැරීමේ උවමනාවක් නැති අය සමග, එනම්, දුෂ්කරතාවයන් ජයගැනීමට කඩිනම්ව කටයුතු කරන හා ධාන්‍ය අතිරික්තයන් රජය අතර පත්වීම හා ඒවා වැඩ කරන ජනතාව අතර බෙදු දෙනු ලැබීම සහතික කිරීමේ උවමනාව ඇති අය සමග නාගරික ජනතාව ඇතිකරගන්නා සන්ධානයකි. එම අරගලය කිරීමේ එකම ක්‍රමය එවැනි සන්ධානයක් වන්නේය. අනිත් අතට මෙම අරගලය කිරීමේ මාර්ගයද වැඩ සටහන් නිකුත් කිරීම හා කථා පැවැත්වීම නොවේ. සියලුම කරදර හිරි හැර සහ දුෂ්කරතාවයන් තිබියදීම සමාජවාදයට එක එල්ලේ යන මාවතේ ගමන් කරන්නේ කවුද, කුලාකයන්ගේ කපටිකම්වලට හා රැවටිලිවලට යටත් වන්නේ කවුද යන්න, දුර්භික්ෂයට විරුද්ධව කරන මෙම අරගලයෙන් පෙනී යනු ඇත.

කලින් කථා කළ කපීකයා මෙන්, ඉතාමත් අවංක වන අතර එනිසාම මුළාවට වැටීමට බොහෝ ඉඩ ඇති සහ අදහස් වෙනස් වීමට බොහෝවිට බඳුන්වන අය තමන්ට බොල්ෂෙවික්වරුන් සමග වැඩ කිරීමට බැරි නිසා අස්වන බව කියන අය වාම සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ සිටිත් නම් අපි ඒ ගැන මිනිත්තුවක් හෝ පසුතැවිලි නොවෙමු. මෙවැනි අවස්ථාවක, ලක්ෂ ගණන් ජනතාව සාගින්නෙන් මියයද්දී ධාන්‍ය විශාල තොග රැස්කරගත් අය සිටිනවිට, පසුගිය අගෝස්තුවේදී නියමිත ධාන්‍ය මිල දෙගුණ කිරීමට පෙර — එම මිල වැඩි කිරීම පිළිබඳ සියළුම ප්‍රජාතන්ත්‍රවාදීහු විරෝධය පළ කළහ, — එම ධාන්‍ය නොවිකුණූ අය සිටින විට, සාගතය නිසා ජනතාව පෙර නොවූ විරූ තරම් දුක් වේදනා විඳින බව දැන දැනම මධ්‍යම ගොවියන් ධාන්‍ය විකුණන මිලට ධාන්‍ය විකිණීමට අකමැති අන් අය සිටිනවිට, පිටව යන සමාජවාදියෝ වෙත්නම් ඔවුහු ජනතාවගේ සතුරෝ වෙති; ඔවුහු විප්ලවය විනාශ කිරීමට කැසකවන්නෝ වෙති; පීඩනයට සහයෝගය දෙන්නෝ සහ ධනපතියන්ගේ මිතුරෝ වෙති. එවැනි මිනිසුන්ට විරුධව යුද්ධයක් කළ යුතුය; සමාවක් නැති යුද්ධයක් කළ යුතුය! (පොදුවේ අත්පොළසන් දෙති. වාම සමාජවාදී-විප්ලවවාදීන් බොහෝ දෙනෙක් එයට සහභාගි වෙති.) සතුරාගේ කථාවෙන් තමන් මුළාවීමට මොහොතකට හෝ ඉඩ තබමින්, අපරීක්ෂාකාරී සහ කල්පනාව නැති වාම සමාජවාදී-විප්ලවවාදීන් සමහර විට කියන ලෙසට, මෙය ගොවිජනතාවට විරුද්ධව යුද්ධ කිරීමකැයි කියන තැනැත්තේ දහස් වරක් වැරදිය. හේ දහස් වරක් වරද්දගත් අයෙකි. නැත මෙය ඉතා සුළු අල්පතරයක් වන ගම්බද කුලාකයන්ට විරුද්ධ සටනකි. එය සමාජවාදය බේරාගැනීම සහ රුසියාව තුළ නිසි ලෙස පාන් බෙදා දීම සඳහා කරන සටනකි. (සභාවෙන්: ‘‘භාණ්ඩ ගැන කොහොමද?’’) අපි ගොවිජනතාවගෙන් අති බහුතරය සමග එක්ව සටන් කරන්නෙමු. අපි මෙම සටන දිනන්නෙමු. එවිට සමාජවාදය යන්නෙහි අර්ථය යුරෝපයේ සෑම කම්කරුවෙකුටම ප්‍රායෝගික වශයෙන් පෙනෙනු ඇත.

තමන්ගේ මුළු ජීවිත කාලයේදීම වෙහෙසී වැඩ කළ ඕනෑම කෙනෙකුගෙන් අපට මෙම අරගලයේදී ආධාරය ලැබෙනු ඇත. එවැනි කෙනෙකුට සමාජවාදය යන්න විද්‍යානුකූල ලෙස නොවැටහෙන්නට පුළුවන. නමුත් තමන්ගේ පාන්කෑල්ල උපයාගත්තේ ලොකු මිළක් ගෙවා බව ඔහු දන්නේය. අප කරන දේ ඔහුට වැටහෙනු ඇත. එම මිනිසා අපගේ පැත්ත ගනු ඇත. ඉතා උග්‍ර ජාතික විපත් අවස්ථාවක, විප්ලවයේ සියළුම ජයග්‍රහණයන් අවදානමට ලක්ව තිබෙන අවස්ථාවක, රටේ යටත් වූ සහ නිදහස් යන සෑම පෙදෙසකම සිටින ස්කරපාද්ස්කිලා කම්කරුවන්ගේ සහ ගොවිජනතාවගේ රජය දුර්භික්ෂයේ පිහිටෙන් පෙරළා දමා ඉඩම්හිමියන් නැවත බලයට පත් කිරීමට බෙල්ල දික් කරගෙන බලා සිටින විට, ධාන්‍ය අතිරික්තයන් හිමිකරගෙන සිටීමට සහ එම ධාන්‍ය සඟවා තබාගෙන සිටීමට සමත් කුලාකයන් ගැන කිවයුත්තේ, එවැනි අවස්ථාවක කුලාකයන්ට විරුද්ධව නිර්දය යුද්ධයක් ප්‍රකාශ කිරීම අපගේ යුතුකම බවය. සාගින්නෙන් පෙළෙන ජනතාවත්, සමාජවාදී විප්ලවයත් දරුණු දුෂ්කරතාවයට සහ දැඩි හිරිහැරයට පත් මෙම අවස්ථාවේදී මඟ හැර යන සහ ධනපති පංතියේ බොරු ප්‍රබන්ධයත් පුනරුච්ඡාරනය කරන තැනැත්තේ දුර්වල සමාජවාදියෙකි.

මෙය ගොවිජනතාවට විරුද්ධව යුද්ධ කිරීමකැයි කීම බොරුවකි; එය දහස්වරක්ම බොරුවකි! ව්‍යවස්ථානුකූල-ප්‍රජාතන්ත්‍රවාදී පුවත්පත් තීරුවල මෙය සිය ගණන් වර කියා තිබෙනු දුටිමි. එනිසා කම්කරුවන් ගොවිජනයාගෙන් වෙන්වී ඇතැයි කියමින් ඔවුන් හඬා වැළපෙනු දැකීම මට පුදුමයක් නොවේ. ‘‘ගොවිජනයිනි, ඇස් හැර බලාපල්ලා, සිහි කල්පනාව ඇති කර ගනිල්ලා, බෝල්ෂෙවික්වරු අත්හැර දමාපල්ලා!’’ යනුවෙන් ඔවුන් කියනු ඇසෙන විට හා ලියා ඇති දේ කියවන විට මට කිසිසේත් පුදුම සිතෙන්නේ නැත. ඔවුන් අතරදී මෙය ගැලපෙන්නේය. මෙම මිනිසුන් සේවය කරන්නේ ඔවුන්ගේ ස්වාමියාට ය. එය ඔවුන්ගේ කාර්යය වී තිබේ. නමුත් එවැනි කථා කියන තත්වයට පහළ වැටෙන සමාජවාදියෙකුගේ හම පොරවාගෙන සිටීමට මගේ කැමැත්තක් නැත. (මහ හඬින් අත්පොළසන්.) සහෝදරවරුනි, ආහාර ප්‍රශ්නය විසඳීම සිතන්නට පවා බැරි තරම් දුෂ්කරතාවයන්ගෙන් ගහණ කර්තව්‍යයක් බව අපි දන්නෙමු. මෙහිදී මුහුණ පාන්නට සිදුවන දුර්මතයන් ඉතා බලවත්ය. මෙහිදී හමුවන උවමනාවන්, කුලාක උවමනාවන් ඉතාමත් ගැඹුරට මුල් බැස ඇත. මෙහිදී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

භේදය, නිශ්චලනය, ග්‍රාමීය ජීවිතයේ විසිරුණු ස්වභාවය, නූගත්තම යන මේ සියල්ලම බොහෝ විට අපට විරුද්ධ එක්සත් වී සිටී. නමුත් මෙම දුෂ්කරතාවයන් තිබුණත් අපට පසුබැසීමට පුළුවන් කමක් නැති බව අපි කියන්නෙමු. දුර්භික්ෂය කිසිසේත් ලඝුකොට තැකිය හැකි දෙයක් නොවේ. මෙම දුර්භික්ෂයේදී ජනතාවට ආධාර නොලැබෙන්නේ නම්, ඔවුන් ස්කරපාද්ස්කිගේ තුරුල්ලට දක්කීමට පවා සාගින්න සමත් වනු ඇත. මෙය ගොවිජනතාවට විරුද්ධව කරන සටනකැයි කීම බොරුවකි! එසේ කියන ඕනෑම කෙනෙක් අන්ත අපරාධකාරයෙකි. එවැනි කථාවන් අසා තමන් සන්නි රෝගයෙන් දහලන තත්වයට පත්වීමට ඉඩ හළ අය මහා අවාසනාවකට ගොදුරු වී ඇත. නැත. අප දුප්පත් ගොවියාට තබා මධ්‍යම ගොවියාටවත් විරුද්ධව සටන් කරන්නේ නැත. රුසියාව මුළුල්ලේම මධ්‍යම ගොවීන්ට ඇත්තේ ස්වල්පතම ධාන්‍ය අතිරික්තයන් පමණකි. විප්ලවයට පෙර දශක ගණන් තිස්සේ මධ්‍යම ගොවීන් ජීවත් වූයේ කම්කරුවන්ටත් වඩා නරක තත්වයන් යටතේය. විප්ලවයට පෙර ඔවුන්ගේ ජීවිතය නොසිඳුනු නැතිබැරිකම හා පීඩනය සහිත එකක් විය. මෙම මධ්‍යම ගොවිජනයා කෙරෙහි අප ක්‍රියාත්මක කරන්නේ එකඟත්වයක් ඇති කරගැනීමේ ප්‍රතිපත්තියකි.

සමාජවාදී විප්ලවය යනු සියළුම වැඩ කරන ජනයා එක සමාන වන තත්වයකි. ශ්‍රමය කුලියට ගැනීමෙන් හෝ ලාභ ගැරීමෙන් අන්‍යයන්ගේ ශ්‍රමය සූරා නොකන මධ්‍යම ගොවියාට වඩා නාගරික කම්කරුවා ලබා ගන්නේ නම් එය අසාධාරණ වනු ඇත. ගොවිජනයා කම්කරුවන්ටත් වඩා නැති බැරිකමින් හා පීඩනයෙන් දුක්විඳිති. ඔවුහු කම්කරුවන්ටත් වඩා අමාරු තත්වයෙන් කල් ගෙවති. ඔවුන්ගේ තත්වයන් වැඩි දියුණු කරගැනීම සඳහා කටයුතු කිරීමට ඔවුන්ට සංවිධාන හෝ වෘත්තීය සමිති හෝ නැත. කම්කරුවන්ගේ සංගම් තිබියදීම විවිධ කර්මාන්ත අතර වේතන මට්ටම් සමාන කිරීමට ප්‍රයත්න දරමින් රැස්වීම් දුසිම් ගණන් පැවැත්වීමට අපට සිදුවේ. එසේ කළත් වේතන අතර සම මට්ටමක් ඇතිකර ගත හැකි නොවේ. මේ සඳහා දීර්ඝ කාලයක් අවශ්‍ය වන බව සිහි බුද්ධිය ඇති සෑම කම්කරුවෙක්ම දන්නේය. කම්කරු කොමිසාර් අංශයට පැමිණිලි කොතරම් විශාල සංඛ්‍යාවක් ලැබේදැයි බලන්න! සෑම කර්මාන්තයක්ම හිස ඔසවමින් තිබෙන බව ඔබට පෙනෙනු ඇත. පැරණි විධියට ජීවත් වීමට ඔවුහු කැමති නොවෙති. වහළුන් මෙන් ජීවත්වීමේ උවමනාවක් තමන්ට නැතැයි ඔවුහු කියති. මෙම දුප්පත් අනාථ රටෙහි අපට කරන්නට අවශ්‍ය වී තිබෙන්නේ එයට සිදු වූ තුවාළ සුව කිරීමය. සම්පූර්ණයෙන්ම මෙන් බිඳ වැටී ඇති එහි ආර්ථික ජීවිතය මොන ආකාරයෙන් හෝ බේරා ගත යුත්තෙමු. මෙය කළ හැක්කේ සංවිධාන කිරීමෙන් පමණකි. ගොවිජනතාව

සංවිධානය කිරීම පිණිස, අපි දුප්පත් ගොවි කාරක සභා ආඥාවක් නිකුත් කෙළෙමු. මෙයට විරුද්ධ විය හැක්කේ සමාජවාදයේ සතුරන්ට පමණකි. අපගේ අදහසේ හැටියට රෙදිපිළි ද්‍රව්‍ය මිළ අඩු කිරීම සාධාරණ බව අපි කීවෙමු. අපි සියල්ලක්ම පාහේ ලේඛන ගත කරමින් ජනසතු කරන්නෙමු. (අත්පොළසන්.) ඒ අනුව කර්මාන්තයේ නිෂ්පාදිතයන් බෙදහැරීම ක්‍රමවත් කිරීමට අපට හැකිවනු ඇත.

අපි මෙසේ කීවෙමු: දුප්පත් ගොවීන් සඳහා අඩකින්ද මධ්‍යම ගොවීන් සඳහා සියයට 25 කින්ද රෙදිපිළි ද්‍රව්‍යවල මිළ අඩු කරනු. සමහර විට මෙම පරිමාණයන් වැරදි වන්නට පිළිවන. ප්‍රශ්නයට අප ඉදිරිපත් කළ විසඳීම නිවැරදි යයි අපි නොකියමු. අපි එසේ නොකියමු. ප්‍රශ්නය නිවැරදි ලෙස විසඳීමට, එහි ගොස් ඒ සඳහා එක්ව කටයුතු කරන්න. (අත්පොළසන්.) ඔබගේ ප්‍රධාන පරිපාලන කාර්යාලවල හාන්සි පුටුවලට වී හිඳගෙන සිටිමින්, ලාභ ගැරීමට විරුද්ධව සටන් කිරීමෙන් හා තමන්ගේ කැත වැඩ රහසිගත ලෙස කරන වංචා කරුවන් ඇල්ලීමට උත්සාහ කිරීමෙන් ප්‍රශ්නය විසඳෙන්නේ නැත.

අප සමාජවාදය සමීපයට ඇත්ත වශයෙන්ම එළඹෙන්නේ ආහාර කොමිසාර් අංශය, කෘෂිකර්මාන්ත කොමිසාර් අංශයද සමග එක්ව සියළුම භාණ්ඩ ජනසතු කර ඒවාට මිළ නියම කළ පසු පමණකි. සමාජවාදය සමීපයට එන්නේ නගරවල වැඩ කරන ජනතාව සහ ග්‍රාමීය දුප්පතුන්, එනම්, අන්‍යයන් කුලී වැඩෙහි යෙදවීමෙන් හෝ ලාභ ගැරීමෙන් හෝ අනුන් කොල්ල නොකන හා අනුන්ගේ ශ්‍රමය සූරා නොකන වැඩ කරන සියල්ලන්ම පමණකි. ධාන්‍ය සඳහා රූබල් සියයක් හෝ ඊට වැඩි මුදලක් ඉල්ලන තැනැත්තා කුලී ශ්‍රමය යොදගන්නා අය මෙන්ම ලාභ ගරන්නෙකි. සමහර විට ඔහු ඊට වඩා නරක, දරුණු ලාභ ගරන්නෙක් වන්නට පිළිවන. අන්ත දුෂ්කරතාවයන්ගෙන් පිරි අඩ වසරක සෝවියට් පාලනයෙන් පසුව අපි දැන් දුප්පත් ගොවිජනයා සංවිධානය කිරීමේ කටයුත්ත වෙත පැමිණ සිටින්නෙමු. සති භාගයක සෝවියට් පාලනයෙන් පසු අප එම කටයුත්ත පටන් නොගැනීම කණගාටුවට කරුණකි — අපගේ වරද ඇත්තේ එහිය! දුප්පත් ගොවිජනතාව සහ ආහාර ආඥාදායකත්වය සංවිධානය කිරීමට ආඥාව[64] ගෙන ආවේ හය මාසයක ප්‍රමාදයකින් පසුවය යන දෝෂාරෝපනය අපට එල්ල කරන ලද්දේ නම්, අපි එය සතුටින් පිළිගන්නෙමු. සමාජවාදය හුදු වාක්‍ය ඛණ්ඩයක තත්වයෙන් මිදී එය ප්‍රායෝගික දෙයක් වෙමින් පවතින්නේ දැන් පමණක් බවත්, ඒ අප මෙම මග ගත් නිසා පමණක් බවත් අපි කියන්නෙමු. සමහර විට මෙම ආඥාව හරිහැටි සකස් වී නොතිබෙන්නට පිළිවන. එහි සඳහන් පරිමාණයන් වැරදි වන්නට පිළිවන. අපි ඒවා කෙසේනම් නිර්ණය කරගනිමුද? එය නිර්ණය කළ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හැක්කේ අපගේ පළපුරුද්ද අනුව පමණකි. දුම්රිය සේවකයන්ට වෘත්තිය සමිතිද ඇතත්, අපි කීවරක් නම් ඔවුන්ගේ වැටුප් ක්‍රම වෙනස් කෙළෙමුද? ඒ අතර දුප්පත් ගොවිජනතාවට එක වැටුප් ක්‍රමයක්වත් නැත! දුප්පත් ගොවි ජනතාව ගැන වූ ආඥාවෙහි සඳහන් පරිමාණයන් නිවැරදිද යනු අපි සියලු දෙනාම සහයෝගයෙන් පරීක්ෂා කර බලමු. දුප්පත් ගොවීන්ට සියයට පණහකින් සහ මධ්‍යම ගොවීන්ට සියයට විසි පහකින් මිළ අඩු කිරීමත්, පොහොසත් ගොවීන්ගෙන් සියල්ලම ගැනීමත් හරිද බලමු. මෙම පරිමාණයන් හරිද, නැද්ද බලමු.

සටනක් කිරීම අවශ්‍ය වේ නම්, මොහොතක හෝ පැකිලීමකින් තොරව එඩිතර ආඥා නිකුත් කරමින් අපි එම සටන කරන්නෙමු. එය සමාජවාදය සඳහා — ඇදහිල්ලක් සඳහා නොව, වැඩ සටහනක්, පක්ෂයක් හෝ කණ්ඩායමක් සඳහා නොව, ජීවමාන සමාජවාදය සඳහා, රුසියාවේ ප්‍රමුඛතා දිස්ත්‍රික්කවල සාගින්නෙන් පෙළෙන ලක්ෂ ගණන් ජනතාව අතර පාන් බෙදා දීම සඳහා, තිබෙන කොතැනින් හෝ ධාන්‍යය රැගෙන ඒවා නිසිලෙස බෙදා හැරීම සඳහා කරන නියම සටනක් වනු ඇත. ගොවි ජනතාව සත්‍යය දැනගත් කල, ඔවුන් අතට ආඥාව ලැබුණු කල, ඔවුන් එය පරීක්ෂා කර, ව්‍යවහාරයෙන් අත්හදා බලා, එය නිවැරදි කළ යුත්තේ කෙසේදැයි අපට කියන කල — එවිට අපි එය නිවැරදි කරන්නෙමු; පරිමාණයන් වෙනස් කරන්නෙමු — ඔවුන් මෙම කාර්යය කර බලා එහි ප්‍රායෝගික දුෂ්කරතාවයන් අවබෝධ කරගත් කල, මෙම ගොවි ජනයා, ඔවුන්ගෙන් සියයට අනූ නවයක්ම අපගේ පැත්ත ගනු ඇති බවත්, එසේ අපේ පැත්ත ගනිමින් අප වැඩ කරන මිනිසාගේ ආරෝග්‍ය සම්පන්න සහජාසය පෙන්නුම් කරන බැව් කියනු ඇති බවත්,නියම ප්‍රශ්නය, මූලික සහ ඉතා වැදගත් ප්‍රශ්නය වන සමාජවාදය තීරණය වන්නේ මෙයින් පමණක් බවත්, අපට නිසැක යයි මම නැවතත් කියන්නෙමි. අපි භාණ්ඩ සඳහා නිසි මිළ ස්ථාපිත කරන්නෙමු. අපි ධාන්‍ය, රෙදිපිළි හා වෙනත් සියලු භාණ්ඩ සඳහා ඒකාධිකාරයක් පිහිටුවන්නෙමු. එවිට ජනතාව මෙසේ කියනු ඇත: ''එසේය. සමාජවාදය විසින් ආරම්භ කරන ලද ශ්‍රමය බෙදහැරීම, පාන් සහ වෙනත් නිෂ්පාදන බෙදා හැරීම කලින් පැවති තත්වයට වඩා හොඳය''. ජනතාව කියන්නට පටන්ගෙන ඇත්තේ එයයි. දුෂ්කරතාවයන් රැසක් ඇත. වැරදීම් බොහෝ ඇත. අප විසින් නොසඟවනු ලබන, එසේම, එළිමහනට ඇද දමනු හා නින්දවට හසු කරනු ලබන සිදුවීම් ඇත. අපගේ කණ්ඩායම් ලාභ ගැරීමට යටවීමේ, ධනපති සිරිත් විරිත් විසින් ජනයා ඇද දමනු ලබන ගොහොරු කලපුවෙහි ගිලී යාමේ අවස්ථා ඇත. ජනතාව එක පහරින්ම යළි හැඩගැස්විය නොහැකි බව අපි දනිමු. කෝටි ගණන් ජනතාව එක් වරම සමාජවාදය පිළිබඳ විශ්වාසයෙන් ආශ්වාදමත් කළ නොහැකි බව අපි දනිමු. (ඔවුන්ට එම විශ්වාසය ලබා ගත හැක්කේද? ඇත්තෙන්ම ඔවුන්ගේම ඔළුවෙන් නොවේ? නැත. එය ලබාගත හැක්කේ ඔවුන්ගේ අත් දැකීමෙනි). මේ සියල්ලම එසේ තිබිය දීම, ලාභ ගැරීමෙන් තොරව පාන් ලබා ගතහැකි යයි ද, ධාන්‍යවලින් ලාභගැරීම නො කරන්නේ ගම්බද දුප්පත් ගොවීන් පමණක් වන හෙයින් දුර්භික්ෂයෙන් මිදීමේ එකම මාර්ගය වන්නේ දුප්පත් ගොවි ජනතාවත්, නාගරික, පැක්ටරි, කාර්මික කම්කරුවනුත් අතර සන්ධානයක් ඇතිකර ගැනීම යයිද කීමට ජනතාව පටන් ගෙන ඇත. එසේය. මධ්‍යම ගොවියා අපගේ ආඥාවන් දැක බලා, ඒවා තමන්ම කියවා, ඒවා දක්ෂිණාංශික සමාජවාදී-විප්ලවවාදීන්ගේ සහ කුලාකයන්ගේ ආරක්ෂකයන්ගේ කථා සහ අපවාද සමග සංසන්දනය කර බැලූ වහාම, ඔහු කියනු ඇත්තේ දුප්පත් ගොවිජනයාට එක පරිමාණයක් සහ මධ්‍යම ගොවීන්ට තවත් පරිමාණයක් ක්‍රියාත්මක කිරීමෙන්ද, වන්දි නොගෙවා කුලාකයන්ගෙන් ධාන්‍ය ගැනීමෙන්ද අප කරන්නේ නිවැරදි දෙයක් බවය. අප සමාජවාදීන් ලෙසට කටයුතු කරන බව ඔහු නොකියන්නට ඉඩ තිබේ. ඔහු එම වචනය නොදැන සිටිනවා විය හැකිය. නමුත් ඔහු ධාන්‍යවලින් ලාභ නොගරන නිසා, එසේම මෙවැනි, සමාජවාදී විප්ලවයට දරුණුතම අන්තරායක් එල්ලවී තිබෙන අවස්ථාවක ධාන්‍යවලින් ලාභ ගැරීම ජනතාවට විරුද්ධව කරන මහා අපරාධයකැයි යන්න ඔහු වටහා ගනු ඇති නිසා, ඔහු අපගේ ඒකාන්ත මිතුරා වේ.

පාන් බෙදදීම ආඥාවකින් කළ නොහැකිය. නමුත්, පැක්ටරි, නාගරික කම්කරුවන් සහ ගැමි දුප්පතුන්, එනම්, ශ්‍රමකරුවන් කුලියට නොගන්නා සහ ලාභ ගැරීමෙහි නොයෙදෙන වැඩ කරන ගොවිජනයා අතර මෙම සන්ධානය ඇති කිරීමට සහ වැඩි දියුණු කිරීමට දීර්ඝ හා අනවරත ලෙස ප්‍රයත්න දැරීමෙන් පසුව, අප මෙය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට පටන්ගත් පසු, පක්ෂයට විරුද්ධව සන්නි රෝගයෙන් මෙන් කෑගැසීමෙන් එම සන්ධානය පලුදු කිරීමට නොහැකි වනු ඇත. (අත්පොළසන්.)

ඉඩම් සමාජ සන්තක කරන බවට පොරොන්දුවක් ගොවිජනතාවට දීමෙන් අප කළේ ඔවුන්ට සහනයක් දීමය. ජනසතු කිරීම එක පහරින් කළ නොහැකි බව අපි වටහා ගත්තෙමු. අප ඔක්තෝබර් 26 දින සම්මත කළ නීතියට ඔබගේ ඉල්ලීම පරිදි ඉඩම් සමාජ සන්තක කිරීම ඇතුළත් කිරීමෙන් අප කළේ වරදක් බව අපි දන්නෙමු. එය වාම සමාජවාදී-විප්ලවවාදීන්ට දුන් සහනයක් විය. ආණ්ඩුව තුළ සිටීම ප්‍රතික්ෂේප කළ ඔවුහු, මෙම නීතිය සම්මත කළ හොත් පමණක් රැඳී සිටින බව කීහ. අදාළ නැති කරුණු ඉදිරිපත් කිරීමේදී ද, මා හමුවීමට ආ බවත්, තමා යටහත් පහත් බවකින් ආයාචනා කළ බවත් කීමේදීද, ස්පිරිදෝනවා දහස් වරක්ම වැරදි විය. සහෝදරවරුනි, ඔබ බොහෝ දෙනෙක් මා හමුවීමට පැමිණ ඇත.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ඇය කියන දේ එසේ සිදු නොවන්නට ඇති බවත්, කිසිම සහෝදරයෙකුට එසේ නොසලකනු ලබන බවත් ඔබ දන්නෙහිය. කිසියම් පක්ෂයක් නියෝජනය කරන හොඳම කථිකයා සුරංගනා කථා පැතිරවීමෙහි යෙදෙන්නේ නම්, එය දුර්වල පක්ෂයක් විය යුතුය. (කලබල ස්වභාවය.) ස්පිරිදෝනවා සහෝදරිය මට එවූ ලිපියක් මා වෙත ඇත. ඈ බොහෝ අවස්ථාවල මාවෙත ලිපි එවා ඇත. මම හෙට එම ලිපිය සොයාගෙන ඒ ගැන තොරතුරු දන්වන්නෙමි. ඇය මෙසේ ලියන්නීය: ''කෘෂිකාර්මික කොමියුන සඳහා විසිලක්ෂයක් දීම ඔබ ප්‍රතික්ෂේප කරන්නේ මන්ද? ඈ මෙසේ ලියන්නේ කෘෂිකර්මාන්ත කටයුතු භාර මහජන කොමිසාර් සෙරෙද — ඔහුගේ කටයුතු ගැන ඇයට වැටහෙන්නේ නැත — කෘෂිකාර්මික කොමියුන සඳහා කෝටියක මුදලක් වෙන් කිරීමට යෝජනා කළ දිනයේම ය. (දීර්ඝ වශයෙන් අත්පොළසන්.) ස්පිරිදෝනවා සහෝදරිය එයම ඇගේ කථාවේදීත් කී බව ඔබට ඇසුනේය. නමුත්, යම් පක්ෂයක ඉතාමත් අවංක අය, ප්‍රචාරක අරමුණු ඉටු කරගැනීම සඳහා සුරංගනා කථා පැතිරවීම දක්වා පහත වැටෙන විට, එය දුර්වල පක්ෂයක් විය යුතුය. කිසියම් පක්ෂයක් නියෝජනය කරන හොඳම සහ අවංකම කථිකයා, සෝවියට් ආණ්ඩුව ගැන එවැනි සුරංගනා කථා පැතිරවීමට තරම් පහතට වැටෙන විට එය ඇත්ත වශයෙන්ම දුර්වල පක්ෂයක් විය යුතුබව මම නැවතත් කියමි! ඔවුන්ම ඔවුන්ගේ වල කපාගැනීමකි! කෘෂිකාර්මික කොමියුන සඳහා කෝටියක් මුදල් වෙන් කර තිබෙන බව කෘෂිකර්මාන්ත කටයුතු භාර කොමිසාර් කාර්යාලයට පැමිණ කියවා දැනගන්නා සෑම ගොවියෙක්ම, අන්‍ය කිසියම් කෙනෙකුගේ කථාවලට වඩා තමන්ගේම ඇස් හා කන් කෙරෙහි විශ්වාසය තබමින්, සමහරු සුරංගනා කථා පැතිරවීමට තරම් පහත වැටී සිටින බව අවබෝධ කරගනිමින් එම පක්ෂයට පස්ස හරවනු ඇත. (අත්පොළසන්.) මගේ කථාව අවසන් කරමින් එක් දෙයක් පමණක් කීමට අදහස් කරමි. අස්වැන්න රැස් කරන තෙක්, සාගතයෙන් පීඩිත පෙට්‍රොග්‍රෑඩ් සහ මොස්කව් පෙදෙස්වලට අස්වැන්න ගෙන එන තෙක්, අප ඉදිරියේ ඇත්තේ රුසියානු විප්ලවයේ දුෂ්කර අවධියකි. විප්ලවය මුදා ගැනීමෙහි සමත් වන එකම දෙය නම්, නාගරික කම්කරුවන් සහ ගැමි දුප්පතුන්, එනම්, ධාන්‍යවලින් ලාභ ගැරීමෙහි නොයෙදෙන වැඩකරන ගැමි පොදුජනයා අතර ඇති කරගන්නා ඇත්ත වශයෙන්ම සමීප වූ සන්ධානයක් වේ.

සියලු අමාරු කම් මධ්‍යයේම, වැඩ කරන සියළු ජනතාවන්ගේ සන්ධානය රුසියාවේ පමණක් නොව, ලෝකය මුළුල්ලේම වර්ධනය වෙමින්,

පැතිරෙමින් හා ශක්තියෙන් වැඩෙමින් පවතින බව අපගේ සම්මේලනයෙන් පෙනේ. අපගේ විප්ලවය ගැන පැතිර ගොස් ඇති අවබෝධය ඉතාමත් ස්වල්පය, අතිශයින්ම ස්වල්පය. එහි පවතින යුද්ධමය පුවත්පත් පාලනය කිසිම තොරතුරක් ඇතුළු වීමට ඉඩ නොදේ. විදේශයේ සිට ආපසු පැමිණි සහෝදරවරු අපට ඒ ගැන කියා ඇත. නමුත් ඒ සියල්ලම එසේ වුවත්, හුදු සහජාසය පමණක් අනුව යමින් යුරෝපීය කම්කරුවෝ බොල්ෂෙවික් ආණ්ඩුවට සහයෝගය දක්වති. යුරෝපය තුළ, අධිරාජ්‍යවාදී යුද්ධය තවදුරටත් කෙරීගෙන යන රටවල් තුළ සමාජවාදී විප්ලවයට සහයෝගය වර්ධනය වන බව දක්වන කට හඬවල් සංඛ්‍යාව මහා රාශියකි. කරුණු අවබෝධ කරගත් කම්කරුවන් හා ගොවිජනයා සියලු දෙනාම අතර සුප්‍රසිද්ධ වූ නම් ඇති ක්ලේරා සෙට්කින් සහ ප්‍රාන්ස් මේරිං වැනි ජර්ම සමාජවාදීන් සහ වෙනත් පුරුෂයන් සහ ස්ත්‍රීන් බොල්ෂෙවික් ආණ්ඩුවට කෘතඥතාවය, සහයෝගය හා ආධාරය පළ කොට ඇත. ඉතාලියේ ලට්සාරි, ට්සිමර්වෝල්ඩ්හිදී බොල්ෂෙවික්වරුන් ගැන අවිශ්වාස සහගත බවක් දැක්වූ, ඒ මහළු පක්ෂ ලේකම් දැන් අපට සහයෝගය ප්‍රකාශ කිරීම නිසා සිරගතව සිටී.

විප්ලවය ගැන අවබෝධය වර්ධනය වෙමින් පවතී. ට්සිමර්වෝල්ඩ් සම්මේලනයේදී[65] මහත් සැකයෙන් යුතුව බොල්ෂෙවික්වරුන් දෙස බැලූ ප්‍රංශයේ සහෝදරවරු, පසුගිය ද ජාත්‍යන්තර සම්බන්ධතා කාරක සභාව[66] නමින් ප්‍රකාශනයක් නිකුත් කරමින් බොල්ෂෙවික් ආණ්ඩුවට ආධාර කරන ලෙසට බලවත් ආයාචනයක් කළ අතර, කුමණ පක්ෂයක් හෝ අතිධාවන කාරී ලෙස කටයුතු කිරීම ගැන විරුද්ධත්වය පළ කළහ.

එනිසා සහෝදරවරුනි, අප ඉදිරියේ තිබෙන කාල සීමාව කොතරම් දුෂ්කර සහ අසීරු වුවත්, ඇත්ත ප්‍රකාශ කිරීම සහ මේ ගැන ජනතාවට අවබෝධයක් දීම අපගේ යුතුකම වන්නේය. එසේ කියන්නේ ස්වකීය ක්‍රියාරම්භකතාවය හා සංවිධානාත්මක භාවය පාමින්, ඉල්ලීම් එකින් එක ඉදිරිපත් කරමින් සමාජවාදී සමූහාණ්ඩුව ආරක්ෂා කරන ජනතාව පමණක් අපට ආධාර කිරීමෙහි සමත්වන හෙයිනි. එනිසා සහෝදරවරුනි, අප තෝරාගත් සහ සිදුවීම් විසින් සනාථ කරන ලද මාවත ඔස්සේ අපි ගමන් කරන්නෙමු නම්, අපි දැඩි ලෙස හා අචල ලෙස මෙම මාවතේ ඉදිරියට යමු නම්, කිසිම වදන් හරඹයක්, මුළාවක්, රැවටිල්ලක් හෝ සන්නිරෝගයක් හේතුකොට ගෙන අප නිවැරදි මාවතෙන් බැහැරට වැටීමට අපි ඉඩ නොතබන්නෙමු නම්, අපගේ බලය රැක ගැනීමටත්, රුසියාව තුළ සමාජවාදයේ ජයග්‍රහණය ඉදිරියට ගෙනයාමටත් එමගින් ලෝක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමාජවාදී විප්ලවය ඉදිරියට ගෙනයාමටත්, සෑම අවස්ථාවක්ම අපට තිබෙන බව අපි කියන්නෙමු. (ඝෝෂාකාරී ලෙස සහ දීඝ වශයෙන් අත්පොළසන් සහ ප්‍රීතිඝෝෂා.)

පත්‍ර වාර්තාව, 1918 ජූලි 6 හා 7 දිනවල "ඉස්වෙස්තියා වට්-සික්", අංක 139 හා 140 කලාප-වල පළවිය. මධ්‍යම විධායක කාරක සභාව විසින් පළ කරන ලද "පස්වැනි සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනය. සම්පූර්ණ වාර්තාව" යන පොතෙහි ප්‍රථම වරට සම්පූර්ණ-යෙන් පළවිය

වි. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති. 5 වැනි මුද්‍රණය, වෙළුම 36, පිටු 505–528

ප්‍රෙස්නායා දිස්ත්‍රික්කයේ රැස්වීමකදී කළ කථාව

1918 ජූලි 26

(ලෙනින්ගේ පැමිණීම, නැගී සිට දීර්ඝ ලෙස අත්පොළසන් සහිත ප්‍රීති ඝෝෂා කිරීමෙන් පිළිගන්නා ලදී. "ජාත්‍යන්තර ගීය" ගායනා කරන ලදී). ලෙනින්, ඔහුගේ කථාවෙන් සෝවියට් ව්‍යවස්ථාවේ වැදගත් අංග ලක්ෂණ සහ මූලික කරුණු ගැන පැහැදිලි සහ කාටත් වැටහෙන ආකාර-යෙන් විස්තර කළේය. සෝවියට් සභා යනු ජනතාව විසින් ආණ්ඩු කිරීමේ ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතිය ය. සෝවියට් සභා යම් කිසිවෙකුගේ මොළයෙන් නිර්මාණය කරගන්නා ලද්දක් නොව, ජීවමාන යථාර්ථයේ නිෂ්පාදනයක් විය. ප්‍රථම වතාවට ඒවා මතුවූයේ සහ සංවර්ධනය වූයේ අපගේ නොදියුණු රටේ ඉතිහාසයේදීය. නමුත්, ඒවා වාස්තවික වශයෙන් සමස්ත ලෝකයේම වැඩකරන ජනතා ආණ්ඩු ආකෘතිය බවට පත්විය යුත්තේය.

මේ දක්වා පැවති සියලු ව්‍යවස්ථාවලින් ආරක්ෂා කෙරුණේ පාලක පංතිවල උවමනාවන්ය. වැඩ කරන ජනතාවට සේවයක් කළ, දිගටම සේවයක් කරනු ඇති සහ සමාජවාදය සඳහා කරන සටනේ බලවත් අවියක් වූ එකම ව්‍යවස්ථාව සෝවියට් ව්‍යවස්ථාවය. ධනපති ව්‍යවස්ථාවලත් සෝවියට් ව්‍යවස්ථාවෙහිත් එන "පුවත්පත් හා රැස්වීම් නිදහස" සඳහා වූ ඉල්ලීම් අතර වෙනස ගැන ලෙනින් සහෝදරයා ඉතාමත් උචිත ලෙස පැහැදිලි කළේය. එහිදී පුවත්පත් පළ කිරීමේ සහ රැස්වීමේ නිදහස තනිකරම ධනපතියන්ගේ ඒකාධිකාරයක් විය. එම තත්වය යටතේ ධනප-තියන් ඔවුන්ගේ සැප පහසු සහිත ශාලාවලට රැස්ව බැංකුවල මුදල් යොදා ඔවුන්ගේ විශාල දිනපතා පත්‍ර නිකුත් කළේ බොරු සහ අපවාද පැතිරවී-මේ සහ පොදු ජනතාවගේ සිත් දූෂ්‍ය කිරීමේ අරමුණ ඇතිවය. එහිදී කම්කරු පුවත්පත්වල බෙල්ල හිර කර තබන ලද අතර, කොල්ලකාරී

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

යුද්ධය ගැන ඒවා දුරු අදහස් ගැන වචනයක්වත් පළ කිරීමට ඒවාට ඉඩ නොදෙන ලදී. එහිදී යුද්ධයට විරුද්ධ අය දඩයම් කරන ලද අතර, ඔවුන්ගේ රැස්වීම් තහනම් කරන ලදී. නමුත්, මෙහි, සෝවියට් රුසියාවෙහි, කම්කරු පුවත්පත් පවතින අතර ඒවා වැඩ කරන ජනතාවට සේවය කරයි. රුසියාවේ අපි සැප පහසු සහිත නිවාස සහ ස්ථාන ධනපතියන්ගෙන් අත්පත් කරගෙන කම්කරුවන්ගේ සමාජශාලා ලෙසට යොදා ගැනීම සඳහා ඒවා කම්කරුවන්ට පවරා දුන්නෙමු. එය රැස්වීමේ නිදහස ව්‍යවහාරයට නැඟීම විය. ආගම ඇදහීම පෞද්ගලික දෙයකි. සෝවියට් සමූහාණ්ඩුව සියළුම ජාතීන්ගේ වැඩ කරන ජනතාව එක්සත් කළේය; එය ජාතික වෙනසක් නොතකා වැඩ කරන ජනතාවගේ උවමනාවන් ආරක්ෂා කළේය. සෝවියට් සමූහාණ්ඩුව ආගමික ප්‍රභේදයන් ගැන තැකීමක් නොකළේය. සියළුම ආගම්වලට ඉහළින් සිටි එය ආගම සෝවියට් රාජ්‍යයෙන් වෙන් කිරීමට ප්‍රයත්න දැරුවේය. සෑම පැත්තකින්ම මංකොල්ලකරුවන් විසින් වටකරනු ලැබ සිටින සෝවියට් සමූහාණ්ඩුවට මුහුණපාන්නට සිදුවී තිබෙන දුෂ්කර තත්වය ගැන ලෙනින් විස්තර කළේය. අධිරාජ්‍යවාදයේ ප්‍රහාරයන්ට විරුද්ධව මුළු ශක්තිය යොදා සටන් කරන රතුහමුදාව, අපගේ මිතුරාවන ජාත්‍යන්තර නිර්ධන පංතිය අපගේ ආධාරයට එන තෙක් සෝවියට් සමූහාණ්ඩුව ආරක්ෂා කරනු ඇතැයි යන ස්වකීය විශ්වාසය ලෙනින් සහෝදරයා විසින් ප්‍රකාශ කරන ලදී.(ලෙනින් සහෝදරයාගේ කථාවෙන් පසුව දීර්ඝ සහ ඝෝෂාකාරී ලෙස අත්පොලසන් දීමෙන් එය පිළිගන්නා ලදී. ''ජාත්‍යන්තර ගීය'' ගායනා කරන ලදී.)

ප්‍රථමයෙන් 1957 දී ''කොමියුනිස්ට්'' සඟරාවේ, අංක 5 කලාපයෙහි පළ කරන ලදී

වී. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 36, පිටු 535–536

සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ, මොස්කව් සෝවියට් සභාවේ, පැක්ටරි කාරක සභාවල සහ මොස්කව් වෘත්තීය සමිතිවල ඒකාබද්ධ සැසි වාරයකදී කළ කථාව

1918 ජූලි 29[67]

(අත්පොළසන්. එය ප්‍රීතිඝෝෂා දක්වා වර්ධනය වෙයි). සහෝදරවරුනි අළුත් අස්වැන්න රැස්කරගන්නා තෙක් කාලය, රුසියාවේ ආරම්භ වී ඇති සමාජවාදී විප්ලවයේ ඉතාමත් දුෂ්කර, හිරිහැරදායක සහ තීරණාත්මක අදියර වනු ඇති බව පක්ෂ පුවත්පත් මගින්, සෝවියට් ආයතනවලදී සහ ජනතාව අතර අප ගෙනයන උද්ඝෝෂණයේදී මා පෙන්වා දුන් ප්‍රථම අවස්ථාව මෙය නොවේ. දැන් මෙම තීරණාත්මක අදියර එහි උච්චස්ථානයට පත්ව තිබෙන බව අප කිව යුතු කාලය එළඹ ඇතැයි මම සිතමි.අප එසේ කිවයුත්තේ අධිරාජ්‍යවාදී ලෝකයේ, අධිරාජ්‍යවාදී රටවල ආධාර කරුවන් කවුදැයි යනුත්, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවේ ආධාර කරුවන් කවුදැයි යනුත් දැන් සම්පූර්ණයෙන්ම හා අවසාන වශයෙන් පැහැදිලි වී ඇති හෙයිනි. යුද්ධමය ස්ථාවරයෙන් බලන කල සෝවියට් සමූහාණ්ඩුවේ තත්වය මනාව පැහැදිලි වී තිබෙන්නේ දැන් බව ප්‍රථමයෙන්ම කිව යුතුය. මුල් අවස්ථාවේදී බොහෝ දෙනෙක් කල්පනා කළේ චෙකොස්ලොවැකියානු කැරැල්ල ප්‍රතිවිප්ලවවාදී කැරළි මාලාවේ එක් සිදුවීමක් ලෙසටය. මෙම කැරැල්ලට බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ ප්‍රාග්ධනය, බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදීන් සහභාගි වීම ගැන පුවත්පත්වල පළවූ වාර්තා ගැන අපි ප්‍රමාණවත් තරම් සැලකිල්ලක් නොදැක්වීමු. මූර්මන්ස්ක්හි, සයිබීරියානු සේනා අතර සහ කුබාන්හි සිදුවීම් ඇති වූ ආකාරයත්, චෙක්වරුන් සමග එක්වූ බ්‍රිතාන්‍යන් සහ ප්‍රංශවන්, බ්‍රිතාන්‍ය ධනපතියන්ගේද සහයෝගය ඇතිව සෝවියට් පාලනය පෙරළා දැමීමට ප්‍රයත්න දැරුවේ කෙසේද යන්නත්, අපි මතකයට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නැගිය යුත්තෙමු. මේ සියලු කරුණුවලින්ම පෙනෙන්නේ වෙකොස්-ලොවැකියානු ව්‍යාපාරය අනිකත් නොව, සෝවියට් රුසියාවේ බෙල්ල ඇඹරීමට සහ නැවතත් රුසියාව අධිරාජ්‍යවාදී යුද පිටිය කරා ඇදගෙන යාමට, බොහෝ කාලයක් තිස්සේම බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදීන් හැඩගැස්වූ ප්‍රතිපත්තියේ එක පුරුකක් වන බවය. අප මුහුණ පා සිටින්නේ එක ප්‍රතිවිප්ලවවාදී පහර දීමක් ලෙසට ගත හැකි වෙක් ප්‍රහාරයෙන් සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව ආරක්ෂා කිරීමේ අරගලයට පමණක් නොවේ; අප මුහුණ පා සිටින්නේ පොදු වශයෙන් ප්‍රතිවිප්ලවීය ප්‍රහාරයන්ට විරුද්ධව කරන අරගලයට පමණක්ද නොව, මුළු මහත් අධිරාජ්‍යවාදී ලෝකයේම දවැන්ත ප්‍රහාරයට විරුද්ධව කරන අරගලයකටය. එනිසා දුන් මෙම අර්බුදය විසඳනු ලැබිය යුත්තේ සෝවියට් රුසියාවේ පුළුල් ජනතාව විසිනි.

වෙකොස්ලොවැකියානු කැරල්ලට බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍ය-වාදීන්ගේ සෘජු සම්බන්ධය කල් තබාම ඇති කරන ලද්දක් බව මම ප්‍රථමයෙන්ම ඔබට මතක් කරන්නෙමි. වෙකොස්ලොවැකියානු කොමියු-නිස්ට් පක්ෂයේ ප්‍රධාන නිල පුවත් පත වන "ප්‍රැකොප්නික් ස්වබෝදී" පත්‍රයෙහි ජූනි 28 වැනි දින පළවී තිබී, නැවත අපගේ පත්‍රවල මුද්‍රණය කරන ලද ලිපියක් ගැන ඔබට මතක් කරන්නෙමි:

"මුදලේ මුල් කොටස ලෙසට රූබල් තිස් ලක්ෂයක් මාර්තු 7 වැනි දින ප්‍රංශ කොන්සල්වරයාගෙන් ජාතික මණ්ඩල දෙපාර්තුමේන්තුව වෙත ලැබුණේය.

මෙම මුදල ජාතික මණ්ඩලයේ නිලධාරියෙක් වන සීප් මහතා නැමැත්-තෙකුට භාර දෙන ලදී.

මෙම සීප් මහතාම මාර්තු 9 වැනි දින තවත් විසිලක්ෂයක්ද, මාර්තු 25 දින තවත් දශ ලක්ෂයක්ද භාර ගත් අතර, මාර්තු 26 දින ජාතික මණ්ඩ-ලයේ උප සභාපති බහුමිල් වෙර්මාක් මහතාට ලක්ෂ දහයක් ලැබුණේය. අප්‍රියෙල් 3 වැනි දින සීප් මහතාට තවත් ලක්ෂ දහයක් ලැබුණේය.

මාර්තු 7 සිට අප්‍රියෙල් 4 දක්වා කාලය තුළ ප්‍රංශ කොන්සල්වරයා ජාතික මණ්ඩල දෙපාර්තුමේන්තුවට ගෙවූ මුළු මුදල රූබල් 80 ලක්ෂයක් විය.

පහත සඳහන් ගෙවීම් කරන ලද දින සඳහන් කර නැත. සීප් මහතාට ලක්ෂ දහයයි; බහුමිල් වෙර්මාක් මහතාට ලක්ෂ දහයයි; සීප් මහතාට තවත් ලක්ෂ දහයයි.

ඊට අමතරව විස්තර සඳහන් නැති අයෙකුට රූබල් 1,88,000 ක් ගෙවා ඇත. එකතුව රූබල් 31,88,000 කි. ඉහත සඳහන් අසූ ලක්ෂයක් මෙයට එකතු කළ කල්හි ප්‍රංශ ආණ්ඩුවෙන් ජාතික මණ්ඩල දෙපාර්තු-මේන්තුවට රූබල් 1,11,88,000 ක් ගෙවන ලද බව අපට පෙනේ.

බ්‍රිතාන්‍ය කොන්සල් වරයාගෙන් දෙපාර්තුමේන්තුවට පවුම් 80,000

ක් ලැබුණි. ඒ අනුව බලන කල, මාර්තු 7 දින පටන් පහර දීම සිදුවූ දින දක්වා චෙක් ජාතික මණ්ඩලයේ නායකයන්ට රූබල් 1 කෝටි 50 ලක්ෂ-යක් පමණ මුදලක් ප්‍රංශ සහ බ්‍රිතාන්‍ය ආණ්ඩුවලින් ලැබුණු අතර මෙම මුදලට වෙකොස්ලොවැකියානු හමුදාව ප්‍රංශ සහ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට විකුණන ලදී".

මෙම වාර්තාව පුවත් පත් වල පළවූ අවස්ථාවේදී ඔබ වැඩි දෙනෙක් එය කියවූ බව නිසැකය. සෝවියට් ආණ්ඩුව පෙරළා දැමීමට සහ හැකි සෑම ආකාරයකින්ම එහි පාර හරස් කිරීමට අධිරාජ්‍යවාදීන් සහ බ්‍රිතාන්‍ය-යේ සහ ප්‍රංශ මූල්‍යාධිකාරීන් ඔවුන්ට හැකි සියල්ලක්ම කරනු ඇතැයි යන්න ගැන අපි කිසි කලෙකත් සැක නොකෙළෙමු. නමුත් අපට මෙහි දී මුහුණ පාන්නට සිදුවී තිබෙන්නේ, ක්‍රමානුකූලව, පිළිවෙළක් අනුව සහ පැහැදිලි ලෙසම දීර්ඝ කාලයක් තිස්සේ සකස් කළ සැලසුම් අනුව, සෝවියට් සමූහාණ්ඩුවට විරුද්ධව ක්‍රියාත්මක කෙරෙන ප්‍රතිවිප්ලවවාදී යුද්ධමය සහ මූල්‍යමය ව්‍යාපාරයකට බවත්, මාස ගණන් තිස්සේ බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදයේ නියෝජිතයන් එම ව්‍යාපාරය සූදානම් කරමින් සිටි බවත්, පෙනී යාමට තරම් එම අවස්ථාවේදී පින්තූරය සම්පූර්ණ වී නො තිබිණි. සිදුවීම් පිළිබඳ පොදු ප්‍රවණතාවය පැහැදිලිව පෙනෙන්නේ දැන්ය. එය පැහැදිලිවන්නේ සිදුවීම් සමස්තයක් වශයෙන් ගෙන පුනරීක්-ෂණය කර බලන විටය; වෙකොස්ලොවැකියානු ප්‍රතිවිප්ලවවාදී ව්‍යාපා රය මූර්මන්ස්ක් ගොඩ බැසීම සමග සසඳන විටය; ඈත උතුරේ දුම්රිය සේවකයන් හා වෙනත් කම්කරුවන් දහස් ගණනින් මෙම ගැලවුම් කරු-වන් සහ විමුක්ති දායකයන් කෙරෙන් පැන දුවන බවත්, තමන්ගේ නියම නම් ඔවුන්ට නොකියන බවත්, මෙම නව අධිරාජ්‍යවාදී මංකොල්ල කරු-වන් තවත් පැත්තකින් රුසියාවේ කොටස් කඩන බවත්, අපට පුවත්පත් වලින් කියවන්නට ලැබුණු විටය. බ්‍රිතානීන් මූර්මන්ස්ක් හි යුද්ධ භටයන් දස දහසකට අධික සංඛ්‍යාවක් ගොඩබස්වා ඇති බවත්, මූර්මන්ස්ක් ආරක්ෂා කිරීමේ මුවාවෙන් ඔවුන් ඇත්ත වශයෙන්ම ඉදිරියට ගමන් ගැනීමට පටන්ගෙන තිබෙන බවත්, ඔවුන් කෙම් සහ සොරෝකි අත්පත් කරගෙන සොරෝකි සිට නැගෙනහිරට ගමන් කර ඇති බවත්, ඔවුන් සෝවියට් නිලධාරීන්ට වෙඩි තැබීමට පටන්ගෙන ඇති බවත්, අපි දනිමු. ඈත උතුරු ප්‍රදේශයේ දුම්රිය කම්කරුවන්ද පොදු වශයෙන් සියළුම කම්කරුවන්ද දහස් ගණන් එම ආරක්ෂකයින්ගෙන් ගැලවී පැන දුවන බව අපි පුවත්පත්වලින් දැනගතිමු. එනම් රුසියාව තුළට වෙනත් තැනකින් කඩා පනින එම නව අධිරාජ්‍යවාදීන්ගෙන්, දඩයක්කාරයින්ගෙන් ඔවුන් ගැලවී පැන දුවන බව අපි දැන ගතිමු. එම සත්‍යයන් එක්රැස් කළ විට සිදුවීම්වල පොදු සම්බන්ධතාවය අපට පැහැදිලිව පෙනේ. තවද රුසියාවට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විරුද්ධව ගසනු ලබන ඉංග්‍රිසි-ප්‍රංශ ප්‍රහාරයේ ස්වභාවය මෙය බව තහවුරු කරන අළුත් තොරතුරුද අපට ඉතා මෑත දී ලැබී ඇත.

රුසියාවට විරුද්ධව ගසන මෙම අධිරාජ්‍යවාදී ප්‍රහාරය ස්වරූපයෙන් ජර්මන් ප්‍රහාරයට සමාන නොවන බව භූමි ශාස්ත්‍රීය කරුණු සැලකිල්ලට ගත් පමණින්ම පෙනේ. ජර්මනියට මෙන් රුසියාව සමග පොදු දේශ සීමාවක් ඔවුනට නැත. හමුද ශක්තියද ඊට වඩා අඩුය. බ්‍රිතාන්‍යයේ යුද්ධ ශක්තියෙහි යටත්විජිතවාදී සහ නාවුක හමුදමය ස්වරූපය නිසා, ඇය දශක ගණන් තිස්සේ ගෙන ගිය රටවල් අල්ලා ගැනීමේ යුද්ධවලදී වෙනස් ප්‍රහාරක ක්‍රම අනුගමනය කිරීමටත්, ප්‍රධාන වශයෙන්ම තම ගොදුරෙහි සැපයුම් මාර්ග කපා හැරීමට උත්සාහ කිරීමටත්, බෙල්ල හිර කිරීමේ ක්‍රමයට වැඩි පක්ෂපාත කමක් දැක්වීමටත්, ආධාර දීමේ මුවාවෙන් විවෘත, සෘජු, නිරුවත් සහ සම්පූර්ණ යුද්ධ බලය යෙදවීමටත් ඇයට සිදුවිය. රුසියානු සොල්දදුවන් සහ කම්කරුවන් අතර බොහෝ කලක පටන් අපකීර්තියට පත් සහ මෑතදී තීහරෙට්ස්කයා ගම අල්වා ගත් අලෙක්සියෙව් බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදයේ ආධාරය උපයෝගී කරගත් බව මෑතදී ලැබුණු තොරතුරු අනුව නිසැක ලෙස පෙනේ. එහි කැරැල්ල වඩාත් කැපී පෙනෙන එකක් විය. නැවතත් ඊට හේතුව වූයේ, බ්‍රිතාන්‍ය හා ප්‍රංශ අධිරාජ්‍යවාදයේ හස්තය එයට සමබන්ධ වීමය.

අවසාන වශයෙන් බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදීන් බාකු හිදී ඉතාමත් ඵලදයක පියවරක් තැබීමට සමත් වූ බව ඊයේ ලැබුණු තොරතුරුවලින් කියවේ. බාකු සෝවියට් සභාව තුළ අපගේ පක්ෂයට වඩා, එනම්, බෝල්ෂෙවික්වරුන්ට සහ එහි වාම සමාජවාදී-විප්ලවවාදීන්ට වඩා, තිහක පමණ වැඩිඡන්දයක් ලබා ගැනීමට ඔවුන් සමත් වී තිබේ. එහි වාම සමාජවාදී-විප්ලවවාදීන් සංඛ්‍යාව අවාසනාවකට මෙන් ඉතා සුළුය. එහෙත් ඔවුහු මොස්කව් වාම සමාජවාදී-විප්ලවවාදීන් ගේ කැත සූදු සෙල්ලම්වලට හා ද්‍රෝහි කම්වලට[69] සහභාගි නොවී අධිරාජ්‍යවාදයට හා යුද්ධයට විරුද්ධව කරන අරගලයේදී සෝවියට් ආණ්ඩුවට පක්ෂපාතව සිටියහ. බාකු සෝවියට් සභාව තුළ සෝවියට් ආණ්ඩුවට පක්ෂව සිටින හා මේ දක්වා වැඩි ඡන්දයක් දිනාගෙන සිටි මෙම කොටස ඉක්මවා, බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදීහු තිහක පමණ වැඩි ඡන්දයක් දිනාගෙන සිටිති. මෙයට හේතු වූයේ දෂ්නාක්ත්සුත්යුන් පක්ෂයේ[70], එනම් අර්මීනියානු අර්ධ-සමාජවාදීන් ගේ වැඩි කොටස අපට විරුද්ධව ඔවුන්ගේ පැත්ත ගත් හෙයිනි. (විදුලි පුවත කියවයි.)

"ජූලි 26 දින මහජන කොමිසාර් කර්ගානව්ගේ නියෝගය අනුව ආජිකාබුල් හට කණ්ඩායම ආජිකාබුල්හි සිට ආල්යත් අසල ස්ථානයකට පසු බැස්සේය. ෂෙමාහා හට කණ්ඩායම ෂෙමාහාවෙන් සහ මරාසාවෙන්

පසුබැසීමෙන් අනතුරුව සතුරෝ පිර්සගාත් ගංගා මිටියාවත දිගේ ඉදිරියට එන්නට පටන් ගත්හ. සතුරාගේ පෙරමුණු බල ඇණිය සමග ප්‍රථම ගැටුම කුබාලා ග්‍රාමය අසලදී ඇති විය.

ඒ හා සමගම දකුණෙන්, කූරාව පැත්තෙන් විශාල අශ්වාරෝහක හමුදවක් පිර්සගාත් දෙසට ඉදිරියට එන්නට පටන් ගත්තේය. එවැනි තත්වයක් යටතේ ආජිකාබුල් රැක ගැනීම සඳහා අප සතු සියළුම හමුද තුන් පැත්තක සටනට යෙදීම අවශ්‍ය විය — ආජකාබුල්වලින් බටහිර පැත්තේද, නවාගි-පිර්සගාත් මිටියාවතට උතුරෙන් සහ දකුණෙන්ද හමුද රැඳවිය යුතු විය. හමුද එසේ විසුරුණු ස්වභාවයකින් යොදවන ලද්දේ නම්, අපට උපසේවා හමුද නොමැති තත්වයක් ඇතිවන්නට තිබුණු අතර, අපට අශ්වාරෝහක හමුදවක් නොමැති නිසා සතුරාට පහර දිය නොහැකි තත්වයකටද පත්වන්නට තිබුණි. තවද, එම තත්වය යටතේ උතුරෙන් හෝ දකුණෙන් පෙරමුණ බිඳුනහොත් ආජිකාබුල්හි හට කණ්ඩායම අනතුරට පත්වන්නට ද ඉඩ තිබුණි. මෙම තත්වය අනුව සහ හමුදවල ශක්තිය ආරක්ෂා කරගනු සඳහා ආජිකාබුල්හි සිට ආල්යත් අසල ස්ථානයකට පසු බසින ලෙස හට කණ්ඩායමට අණ දෙන ලදී. පසු බැසීම මනා පිළිවෙළින් කරන ලදී. වැදගත් දුම්රිය යන්ත්‍රස්ථාන සහ ආජිකාබුල් දුම්රිය ස්ථානයද, බූමිතෙල් සහ තෙල් ටැංකිද පුපුරුවා හරින ලදී. පොදු ප්‍රහාරයේ කොටසක් ලෙසට දගෙස්තානයෙහි ද සතුරා ක්‍රියාත්මකව සිටී. ජූලි 24 දින සතුරා විශාල හමුද සහිතව සතර පැත්තකින් ඉදිරියට ආවේය. පැය විසි හතරක් සටන් කර අපි සතුරාගේ සටන් අගල් අල්ලාගත්තෙමු. සතුරා විසිරී ගොස් කැලෑවට පසු බැස්ස අතර ඇදිරි වැටීම නිසා තවදුර ලුහු බැඳ යාම කළ නොහැකි විය. ජූලි 24 දින ගුරාවෙන් ජයග්‍රහණ පිළිබඳ පුවත් අසන්නට ලැබුණි. එහි නගරය අවට සටන් සිදු වෙමින් පවතී. සතුරා දැඩි ලෙස සහ සංවිධානාත්මක ලෙස ප්‍රතිරෝධය දක්වයි. සතුරු හමුදවලට අණ දෙන්නේ කලින් සිටි දගෙස්තාන් නිලධාරීන්ය. ගුරාව අවට සටන්-වලදී දගෙස්තානයේ ගොවිජනයා කාර්යශීලී ලෙස ඊට සහභාගි වෙති.

බාකුහි දක්ෂිණාංශික පක්ෂ ඒවායේ හිස ඔසවා සිටිමින් බ්‍රිතාන්‍යයන් ගෙන්වා ගැනීම සඳහා බලවත් ලෙස ව්‍යාපාර ගෙන යති. මෙම ව්‍යාපාරයට යුද හමුද නිලධාරීන්ගේ බලවත් සහයෝගය ලැබෙන අතර, එය පෙරමුණේ හමුද අතර දියත් කර තිබේ. ඉංග්‍රිසි-මිත්‍ර ප්‍රචාරය නිසා යුද්ධ හමුදව අසංවිධාන වී ඇත. වෙහෙසට පත් හා බලාපොරොත්තු සුන් වූ ජනතාව අතර බ්‍රිතාන්‍ය පැත්තට නැඹුරු වීම බොහෝ දුර ඉදිරියට ගොස් ඇත.

දක්ෂිණාංශික පක්ෂවල සත්‍යයෙන් තොර ප්‍රකෝපකාරී ක්‍රියාවල බල පෑම යටතේ කැස්පියන් නැව් කණ්ඩායම බ්‍රිතාන්‍යයන් හා සම්බන්ධයෙන් ප්‍රතිවිරෝධී යෝජනා කීපයක් අනුමත කර තිබේ. බ්‍රිතාන්‍යය කුලී සේවයෙහි යෙදෙන්නවුන්ගේ සහ බ්‍රිතාන්‍යයේ ස්වේච්ඡා ඒජන්තවරුන්ගේ බහට රැවටුනු එය ඉතා මෑතක් දක්වාම බ්‍රිතාන්‍ය ආධාරය අවංක එකකැයි යන අන්ධ විශ්වාසය දැරුවේය.

අළුත්ම වාර්තා අනුව බ්‍රිතානීන් පර්සියාවෙහි ඉදිරියට එමින් සිටින බව පෙනේ. ඔවුහු රෙෂ්ට් (ගිල්ජාන්) අල්වාගෙන ඇත. එහිදී කුචුක්-ඛාන්ට සහ බාකු පෙදෙසෙන් පැන ගිය මුස්සාවත්වරුන්ගේ[71] නායකත්වය යටතේ ඔහුට එකතු වූ ජර්මන් හා තුර්කි කණ්ඩායම්වලට විරුද්ධව ඔවුන් දින

https://liberationbase.wordpress.com

හතරක් සටන් කර ඇත. රෙෂ්ට් සටනෙන් පසුව බ්‍රිතාන්‍යයෝ අපගේ ආධාර ඉල්ලූහ. නමුත් පර්සියාවේ සිටින අපගේ නියෝජිතයෝ එය ප්‍රතික්ෂේප කළහ. බ්‍රිතාන්‍යයෝ රෙෂ්ට්හි ඔවුන්ගේ තත්වය ප්‍රබල කර ගත්හ. නමුත් ඔවුනට පර්සියාවේ හමුද නොමැති තරම්ය. එන්සෙලිහි ඔවුනට සිටින්නේ භටයන් පණහක් පමණක් බව අපි දනිමු. ඔවුනට පැට්‍රෝල් අවශ්‍ය වී ඇත. ඒ වෙනුවට අපට කාර්දීමට ඔවුන් කැමැත්ත පළ කර ඇත. පැට්‍රෝල් නැතිව ඔවුනට කිසිවක් කරගත නොහැකිය.

ජූලි 25 දින දේශපාලන සහ යුද්ධ තත්වය ගැන සාකච්ඡා කිරීම පිණිස සෝවියට් සභාවේ දෙවැනි සැසිවාරය පවත්වන ලදී. එහිදී දක්ෂිණාංශික පක්ෂ විසින් බ්‍රිතාන්‍යීන් පිළිබඳ ප්‍රශ්නය මතුකරන ලදී. කොකේසියාවේ අතිවිශේෂ කොමිසාර් වන ෂඋමියාන් සහෝදරයා, පස්වැනි සෝවියට් සභා සම්මේලනයේ යෝජනාව සහ මධ්‍යම මහජන කොමිසාර් මණ්ඩලය වෙනුවෙන් ස්ටාලින් එවූ විදුලි පුවත ගෙන හැර දක්වා බ්‍රිතාන්‍යයන් කැඳවීමට විරුද්ධව කථා කරමින් මෙම ප්‍රශ්නය න්‍යාය පත්‍රයෙන් ඉවත් කරන ලෙස බල කර සිටියේය. ෂඋමියාන් සහෝදරයාගේ යෝජනාව වැඩි ඡන්ද කීපයකින් පරාජය කරන ලදී. එවිට මධ්‍යම ආණ්ඩුවේ නියෝජිතයා ලෙසට ඔහු බලවත් විරෝධය ප්‍රකාශ කළේය. පෙරමුණ වෙත ගිය සහෝදරවරුන් ඉදිරිපත් කළ වාර්තාවලට නියෝජිතයෝ සවන් දුන්හ. දක්ෂිණ සමාජවාදී-විප්ලවවාදීන්ගේ, දක්ෂිණ දෂ්නාක්වරුන්ගේ සහ මෙන්ෂෙවික්වරුන්ගේ ඡන්ද 259 ක් පක්ෂවද, බොල්ෂෙවික්වරුන්ගේ, වාම සමාජවාදී-විප්ලවවාදීන්ගේ සහ වාම දෂ්නාක්වරුන්ගේ ඡන්ද 236 ක් විරුද්ධවද ලැබීමෙන්, බ්‍රිතාන්‍යයන් කැඳවීමත්, මහජන කොමිසාර් මණ්ඩලයේ අධිකාරය පිළිගන්නා සියළුම පක්ෂවල සාමාජිකයන් ඇතුළත් ආණ්ඩුවක් පිහිටුවීමත් සඳහා යෝජනාවක් සම්මත කරන ලදී. වාමාංශය මෙම යෝජනාව තියුණු ලෙස හෙළා දැක්කේය. මෙම යෝජනාව ලජ්ජාවට හේතුවන ද්‍රෝහී කමක් ලෙසටත්, රුසියාවේ කම්කරුවන් හා ගොවි ජනතාව කෙරෙහි දක්වන නිරුවත් ගුණමකු කමක් ලෙසටත් විස්තර කළ ෂඋමියාන් සහෝදරයා, තමා මධ්‍යම ආණ්ඩුවේ නියෝජිතයා ලෙසට එම යෝජනාව ගැන කිසිම වග කීමකට නොබැඳෙන බව ප්‍රකාශ කළේය. බොල්ෂෙවික්වරුන්ද වාම සමාජවාදී-විප්ලවවාදීන් සහ වාම දෂ්නාක්වරුන් කණ්ඩායම වෙනුවෙන්ද ප්‍රකාශයක් ඉදිරිපත් කෙරිණ. ඔවුන් සභාග ආණ්ඩුවට සම්බන්ධ නොවන බවත්, මහජන කොමිසාර් මණ්ඩලය ඉල්ලා අස්වන බවත් එයින් කියන ලදී. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් කැඳවා ගැනීමෙන්, ඇත්ත වශයෙන්ම රුසියානු සෝවියට් ආණ්ඩුවෙන් වෙන්වූ ආණ්ඩුවකට සෝවියට් රුසියාවෙන් ආධාර නොලැබෙනු ඇතැයි ෂඋමියාන් සහෝදරයා වාමාංශික පක්ෂ තුන වෙනුවෙන් ප්‍රකාශ කළේය. ප්‍රාදේශීය සෝවියට් සභාව අනුගමනය කළ බ්‍රිතාන්‍යීන් කැඳවා ගැනීමේ ද්‍රෝහී ප්‍රතිපත්තිය නිසා, එයට රුසියාවත්, සෝවියට් ආණ්ඩුවට ආධාර කරන පක්ෂත් නැතිව ගියේය.

මහජන කොමිසාර් මණ්ඩලය ඉල්ලා අස්වීමට කළ තීරණය නිසා දක්ෂිණාංශික පක්ෂ අන්ත අවුලට පත්විය. මෙම තත්වය ගැන ආරංචිය පැතිර ගිය විට දිස්ත්‍රික්කවල හා පෙරමුණෙහි හැඟීම් එක්වරම වෙනස්විය. රුසියාවෙන් බිඳී වෙන්වීමට සහ සෝවියට් ආණ්ඩුව පෙරළා දැමීමට

අපේක්ෂා කළ ද්‍රෝහීන් විසින් තමන් රවටන ලද බව සේලරුවන්ට අවබෝධ විය. ජනතාව බ්‍රිතාන්‍යීන් ගැන නැවත වරක් කල්පනා කරමින් සිටිති. මහජන කොමිසාර් මණ්ඩලයේ ඉල්ලා අස්වීම ගැන සාකච්ඡා කිරීමට ඊයේ විධායක කාරක සභාවේ හදිසි රැස්වීමක් පවත්වන ලදී. ජූලි 31 දිනට නියමිත සෝවියට් සභා රැස්වීමේදී බලය පිළිබඳ ප්‍රශ්නය ගැන තීරණයක් කරන තෙක් මහජන කොමිසාර්වරු ඔවුන්ගේ තනතුරුවල සිටිමින් ඔවුන් කලින් ඉටු කළ කාර්යයන්හි තවදුරටත් නිරත විය යුතු බව එහිදී තීරණය කරන ලදී. ඇතිවෙන්නට යන ප්‍රතිවිප්ලවයට විරුද්ධව සටන් කිරීම සඳහා හදිසි පියවරයන් ගැනීමට විධායක කාරක සභාව තීරණය කර ඇත. ඉංග්‍රිසි-ප්‍රංශ පක්ෂවල ආරක්ෂාව යටතේ සතුරා ඔහුගේ කටයුතු කරගෙන යයි. බාකු මහජන කොමිසාර් මණ්ඩලයේ පක්ෂ බියුරෝ සභාව''.

තමන් සමාජවාදීන් යයි කියා ගන්නා නමුත් ධනපතියන් සමග සම්බන්ධකම් කිසි කලෙකත් අත් නොහැරිය මෙහි සිටින අයට නොවෙනස් ලෙසටම, මේ මිනිස්සු බාකු ආරක්ෂා කිරීමට බ්‍රිතාන්‍යීන් කැඳවීමට පක්ෂව තීරණය කර ඇත[72]. සෝවියට් සමූහාණ්ඩුව ආරක්ෂා කිරීමට අධිරාජ්‍යවාදී හමුදවලට කරන එවැනි ආරාධනයක අර්ථය ගැන අපි දැනටමත් ඉතා හොඳින් දන්නෙමු. සමාජවාදී-විප්ලවවාදීන් ගෙන් කොටසක් වන ධනපතියන් විසින් හා මෙන්ෂෙවික්වරුන් විසින් ඉදිරිපත් කරනු ලබන මෙම ආරාධනයේ අර්ථය අපි දන්නෙමු. තිබිළිසි හි සහ ජෝර්ජියාවේ මෙන්ෂෙවික් නායකයන් ඉදිරිපත් කළ මෙම ආරාධනයේ අර්ථය අපි දන්නෙමු.

අධිරාජ්‍යවාදීන්ට කිසි කලෙකත් ආරාධනා නොකළ සහ ඔවුන් සමග ගසා කෑමේ ගිවිසුම්වලට කිසිකලෙකත් නො එළඹුනු එකම පක්ෂය බොල්ෂෙවික් පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය පමණක් බවත්, එය කළේ මෙම බෙලි කැපුම් කාරයන්ගේ බලය වැඩි වූ අවස්ථාවල ඔවුන් හමුවේ පසු බැසීම පමණක් බවත්, දැන් අපට කිව හැකිය. (අත්පොළසන්.) ජෝර්ජියාවේ නිදහස ආරක්ෂාකර ගැනීමට යයි කියමින් ජර්මන් අධිරාජ්‍යවාදීන් සමග කෙළින්ම සන්ධානයක් ඇති කරගත් මෙන්ෂෙවික් වරුන් සෑම තැනකදීම කළ ද්‍රෝහිකම් නිසා කොකේසියාවේ කොමියුනිස්ට් සහෝදරවරු ඉතා අමාරු අඩියකට පත්වූ බව අපි දනිමු.

ජෝර්ජියාවේ මෙම නිදහස මහා බොරුවක් වී තිබෙන බව ඔබ දන්නෝහිය. එයින් ඇත්ත වශයෙන් සිදු වූයේ ජර්මන් අධිරාජ්‍යවාදීන් විසින් සම්පූර්ණයෙන්ම ජෝර්ජියාව අල්ලා ගැනීම සහ බොල්ෂෙවික් කම්කරුවන්ට සහ ගොවිජනයාට විරුද්ධව ජර්මන් බයිනෝත්තු සහ මෙන්ෂෙවික් ආණ්ඩුව අතර සන්ධානයක් ඇති වීමය. එනිසා තත්වයෙන් මතුවන අන්තරායට ඇස් වසා නොගෙන බාකු සහෝදරවරු මෙසේ කියන විට ඔවුහු දහස් වරක් නිවැරදි වූහ: අපට හානියක් සිදු නොවේ නම්,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අපගේ හමුදා ආක්‍රමණිකයන්ගේ බයිනෝත්තු සමග සන්ධානයකින් නොබැඳේ නම්, සමාජවාදී ප්‍රතිසංස්කරණයන් කරගෙන යාමේ අපගේ කටයුත්තට බාධාවක් නොවේ නම්, එම කොන්දේසි යටතේ අපගේ භූමියෙන් කොටසක් දී වුවද අධිරාජ්‍යවාදී බලවතෙකු සමග සාමය ඇති කර ගැනීමට අපි කිසි කලෙකත් විරුද්ධ නොවෙමු.

නමුත් දැන් සිදුවී තිබෙන ලෙසට, බාකු ප්‍රදේශය ආරක්ෂා කිරීමට යයි කියා බ්‍රිතාන්‍යයන් කැඳවා ගැනීමෙන් ඔවුන් කරන්නේ, දැනට මුළු පර්සියාවම ගිලගෙන සිටින සහ දකුණු කොකේසියාව අල්ලා ගැනීමට බොහෝ කලක සිට හමුදා ඉදිරියට ගෙන එමින් සිටි බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදීන්ට තමන් කැමැත්තෙන්ම යටත් වීමය. අපගේ බාකු සහෝදරවරුන්ගේ තත්වය කොතරම් දුෂ්කර වුවත් එවැනි සාමයක් ඇති කර ගැනීමට ප්‍රතික්ෂේප කිරීමෙන් ඔවුන් ගෙන තිබෙන්නේ නියම සමාජවාදීන් හට තරම්වන එකම පියවර වන බව අපි කිවයුත්තෙමු. කිසිම සැකයක් හෝ මොහොතක පැකිලීමක් හෝ නොමැතිව එසේ කිව යුත්තෙමු. වෙන් වූ ප්‍රදේශයක වුව තිබෙන ඔබගේ ස්වාධීන සමාජවාදී ආණ්ඩුව අධිරාජ්‍යවාදී යුද්ධයේ වහලෙකු බවට පරිවර්තනය කරන්නේ නැතිව, ඔවුන්ට ආරාධනා කිරීම නො කළ හැක්කක් හෙයින්, බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදීන් සමග කිසිම එකඟත්වයක් ඇති කර ගැනීම දැඩි ලෙස ප්‍රතික්ෂේප කිරීම අපගේ බාකු සහෝදරවරුන්ට ගත හැකි වූ එකම මග විය.

එනිසා, පොදු වශයෙන් කරුණු සිදුවන ආකාරය දෙස බලන කල, බාකු සිදුවීම්වල වැදගත්කම ගැන අපට කිසිම සැකයක් නැත. මධ්‍යම ආසියාවේ නගර ගණනාවක ප්‍රතිවිප්ලවවාදී කැරළි ඇති වී තිබෙන බවට ඊයේ ආරංචි ලැබිණ. එය ඉන්දියාවේ කඳවුරු බැඳ ගෙන සිටින බ්‍රිතාන්‍යයන්ගේ ආධාර අනුබල ඇතිව සිදුවන්නක් බව පැහැදිලිය. ඇෆ්ගනිස්ථානය සම්පූර්ණයෙන්ම තම ආධිපත්‍යයට යටත් කරගත් ඔවුන් බොහෝ කලක පටන්ම ඔවුන්ගේ යටත් විජිත පුළුල් කරගැනීමටත්, ජාතීන් ගේ ගෙල මිරිකා ගැනීමටත්, සෝවියට් රුසියාවට පහර දීමටත්, පදනමක් සකස් කරගත්හ. දැන් වෙනම තිබෙන මෙම පුරුක් අපට මනාව පැහැදිලි වී ඇති නිසා අපගේ සමූහාණ්ඩුවේ යුද්ධමය සහ පොදු ක්‍රියාමාර්ගමය තත්වය සම්පූර්ණයෙන්ම පෙනී යන්නේය. උතුරෙන් මූර්මන්ස්ක්, නැගෙනහිරින් චෙකොස්ලොවැකියානු පෙරමුණ, ගිනිකොනින් තුර්කිස්තානය, බාකු සහ අස්ත්‍රඛාන් — බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදයේ දම්වැලෙහි පුරුක් සියල්ලම පාහේ එකට අමුණා තිබෙන බව අපට පෙනේ.

මෙහිදීද ඉඩම් හිමියන්, ධනපතියන් සහ කුලාකයන්, උක්‍රේනියාවේ සහ රුසියාවෙන් වෙන්වූ වෙනත් පෙදෙස්වල ඒ ඉඩම් හිමියන්, ධනපතියන් හා කුලාකයන් ක්‍රියා කළ ආකාරයට බොහෝ සෙයින්ම සමාන ලෙසින් ක්‍රියාත්මක වනු අපට දක්නට ලැබේ. සම්පූර්ණයෙන්ම ස්වාභාවික හේතු නිසා ඔවුහු සියළු දෙනාම සෝවියට් ආණ්ඩුව කෙරෙහි දැල්වෙන වෛරයක් ඇතිව සිටිති. බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදයේ අතවැස්සන් මෙන් කටයුතු කරන ඔවුහු කුමණ ආකාරයෙන් හෝ සෝවියට් ආණ්ඩුව දුර්වල කිරීමට ඔවුන්ට හැකි සියල්ලක්ම කළහ. රුසියාව අභ්‍යන්තරයේ බලවේගවලින් පමණක් මෙය කළ නොහැකි බව වටහාගත් ඔවුහු, මාර්තව් වැනි මහත්වරු මෙන් වචනවලට හා ආයාචනාවලට පමණක් සීමා නොවී, ඒ සඳහා වඩාත් ඵලදායක අරගල ක්‍රම, එනම් යුද්ධමය ප්‍රහාරයන් යොදා ගැනීමට තීරණය කළහ. අපගේ අවධානය ප්‍රධාන වශයෙන් යොමු විය යුත්තේ එය දෙසටය. අපගේ උද්ඝෝෂණය හා ප්‍රචාරය පිළිබඳ සියළු කටයුතු ඉලක්ක කළ යුත්තේ එය වෙතටය. අපගේ සෝවියට් වැඩ කටයුතු සියල්ලෙහිම ගුරුත්වාකර්ෂණ කේන්ද්‍රය මාරු කළ යුත්තේ ඒ අනුවය.

මූලික කරුණ නම්, දැන් ක්‍රියාශීලීව සිටින්නේ අනිත් සභාගයේ අධිරාජ්‍යවාදී හමුදාවන් වීමයි. අපගේ රටෙන් කොටසක් අල්වා ගෙන එය කඳවුරු පෙදෙසක් ලෙසට උපයෝගී කර ගෙන සිටින්නේ ජර්මන් හමුදා නොව, ඉංග්‍රීසි-ප්‍රංශ හමුදා වීමයි. මේ දක්වා ඔවුන්ගේ භූමිශාස්ත්‍රීය තත්වය නිසා ඍජු මාර්ගයකින් රුසියාවට පහර දීමට හැකියාවක් ඔවුන්ට නොතිබිණි. ලෝක ආධිපත්‍යය සඳහා ප්‍රයත්න දරමින් හතර අවුරුද්දක් තිස්සේ මුළු ලෝකයම ලෙයින් නැහැ වූ බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදය සෝවියට් සමූහාණ්ඩුවේ ගෙල හිර කිරීමේ සහ නැවතත් රුසියාව අධිරාජ්‍යවාදී යුද්ධයට ඇද දැමීමේ අරමුණ ඇතිව වක්‍ර මාර්ගයකින් රුසියාවට පහසුවෙන් අත පෙවිය හැකි තරම් දුරට සමීප වී ඇත. සහෝදරවරුනි, ඔක්තෝබර් විප්ලවයේ ආරම්භයේ පටන්ම අපගේ ප්‍රධාන අරමුණ වූයේ අධිරාජ්‍යවාදී යුද්ධය කෙළවරක් කිරීම බව ඔබ සියළු දෙනාම හොඳින් දන්නෙහිය. නමුත් කොතරම් වීරත්වයක් පැවත්, කොතරම් සංවිධානව හා විනය සම්පන්නව සිටියත්, ඕනෑම තනි රටක නිර්ධන පංතික බලවේගයන්ට හා විප්ලවවාදී ජනතාවට තනිවම ජාත්‍යන්තර අධිරාජ්‍යවාදය පෙරළා දැමිය හැකිය යන මායා අදහස අපි කිසි කලෙකත් නොදැරුවෙමු. එය කළ හැකි වන්නේ ලෝකයේ කම්කරුවන්ගේ ඒකාබද්ධ පරිශ්‍රමයන් මගින් පමණකි.

කෙසේ හෝ වේවා, අප කර තිබෙන්නේ, මුළු ලෝකයේම ධනපතියන් සමග එක රටක ඇති සියළු සම්බන්ධකම් කපා හැරීමය. අපගේ ආණ්ඩුව කිසිම වර්ගයක හෝ එකම අධිරාජ්‍යවාදී නූලකින්වත් බැඳී නැත. අපගේ විප්ලවයේ ඉදිරි මග කුමක් වුවත් එය කිසි කලෙකත් එම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නූල්වලින් නො බැඳෙනු ඇත. අපගේ පාලනය පැවති අට මසක කාලය තුළ අධිරාජ්‍යවාදයට විරුද්ධ විප්ලවීය ව්‍යාපාරය දැවැන්ත පියවරයන් තබා ඉදිරියට ගොස් ඇත. එමෙන්ම, අධිරාජ්‍යවාදයේ ප්‍රධාන මධ්‍යස්ථානවලින් එකක් වන ජර්මනියේ සිදුවීම් 1918 ජනවාරියේදී ආයුධ සන්නද්ධ සට්ටනයකට හේතු වූ අතර එම ව්‍යාපාරය ලේ ගැලීම් සහිතව මර්දනය කිරීමට හෙතුවිය[73]. කිසිම රටක කිසිම විප්ලවවාදී ආණ්ඩුවක් නොකළ ලෙසින් අපි අපගේ යුතුකම ජාත්‍යන්තර සහ ලෝක ව්‍යාප්ත පරිමාණයෙන් ඉටු කර ඇත්තෙමු. නමුත් එය එකම රටක් දරන පරිශ්‍රමයන් මගින් ඉටුකළ හැකිය යනු සිතීමෙන් අපි කිසි කලෙකත් අපම රවටා නොගත්තෙමු. අපගේ පරිශ්‍රමයන් අනිවාරණීය වශයෙන්ම ලෝක ව්‍යාප්ත විප්ලවය වෙත මග පෙන්වන බවත්, අධිරාජ්‍යවාදී ආණ්ඩු විසින් ආරම්භ කරන ලද යුද්ධය එම ආණ්ඩුවලම ප්‍රයත්නයන් මගින් නැවැත්විය නොහැකි බවත් අපි දැන සිටියෙමු. එය නැවැත්විය හැක්කේ සියළු නිර්ධන පංතිකයින්ගේ ප්‍රයත්නයන් මගින් පමණකි. එනිසා වෙනත් රටවල ධනපති පංති පාලනය පවතිද්දී අප බලයට පත් වූ විට, නිර්ධන පංතික කොමියුනිස්ට් පක්ෂය වශයෙන් අපගේ කර්තව්‍යය වූයේ, අපගේ හදිසි කර්තව්‍යය වූයේ, සමාජවාදී විප්ලවයේ නැගී එන ගිනිජාලාව වැඩි කරනු වස් හැකිතරම් ගිනි පුළිඟු රැසක් විසුරුවන සමාජවාදයේ ගිනිහුල ලෙසට එම බලය රැක ගැනීම ය.

සැම තැනෙකදීම මෙය දුෂ්කර කර්තව්‍යයක් විය. අපට එය ඉටු කළ හැකි වූයේ සමාජවාදී සමූහාණ්ඩුවේ ජයග්‍රහණයන් ආරක්ෂා කිරීමට නිර්ධන පංතිය නැගීසිටි හෙයිනි. මෙම කර්තව්‍යය මුල් කොට ගෙන ඉතාමත් වෙහෙස කාරී සහ දුෂ්කර තත්වයක් පැන නැගී තිබේ. එසේ වූයේ වචනයේ ඍජු අර්ථයෙන් කිසිම රටක සමාජවාදී විප්ලවය තවමත් ආරම්භවී නැති හෙයිනි. ඉතාලිය සහ ඔස්ට්‍රියාව වැනි රටවල එය ඉතාමත් ආසන්න වී ඇති නමුත් තවමත් ආරම්භ වී නැත. නමුත් එය ආරම්භ වී නැති නිසාම බ්‍රිතානීන් ගේ සහ ප්‍රංශවන්ගේ, ඒ අනුව, ලෝක අධිරාජ්‍යවාදයේ නව ජයග්‍රහණයන්ට මුහුණ දීමට අපට සිදු වී තිබේ. බටහිර දෙසින් ජර්මන් අධිරාජ්‍යවාදය යුද්ධ කාමී සහ රටවල් අල්ලා ගැනීමට මාන බලන අධිරාජ්‍යවාදී බලවේගයක් ලෙසට තවමත් පෙනී සිටී. ඒ අතර රුසියාවේ උතුරු-නැගෙනහිරෙන් සහ දකුණෙන් රට තුළට කාවැදීමට බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදයට හැකි වී තිබේ. ඒ අනුව රුසියාව නැවතත් අධිරාජ්‍ය වාදී යුද්ධයට ඇද දැමීමටත් ලෝකයේ මෙතෙක් නොදක්නා ලද වීරූ පරිමාණයකින් ස්වකීය වැඩ සහ ප්‍රචාරක කටයුතු කරගෙන යන මෙම ස්වාධීන සමාජවාදී රාජ්‍යය වන රුසියාව සුන් කර දැමීමටත් එම බලවේගය සූදානම්ව සිටින බව අපට මනාව පැහැදිලිය. තවද, බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදය විශාල ජයග්‍රහණයක් අත්පත් කරගෙන, සැම පැත්තකින්ම අප වට කරගෙන, සෝවියට් බලය සුන් කර දැමීමට එයට හැකි සියල්ලක්ම කරයි. බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදයේ ජයග්‍රහණය පංති අරගලය සමග අභේද්‍ය ලෙස සම්බන්ධ වී තිබෙන බව අපි හොඳින්ම දනිමු.

සූරා කන්නන්ගේ ආර්ථික බලයේ අඩිතාලම් අහිමිවන තත්වයට පත්වන විට, ඔවුන්ගේ දේපල, එනම්, කෝටි සංඛ්‍යාත කම්කරුවන් ගේ සහ ගොවිජනතාවගේ ශ්‍රමය උපයෝගි කරගැනීමට ආධාරකාරීවන සහ ඉඩම් හිමියන්ට සහ ධනපතියන්ට ධනවත් වීමට ඉඩ සලසන, මා යළිත් කිවයුතු ලෙසට, ධනපතියන්ගේ සහ ඉඩම් හිමියන්ගේ පෞද්ගලික දේපල, අහිමිවන තත්වයට පත්වන විට, තමන්ගේ රට සහ ස්වාධීනත්වය ගැන වූ කථා සියල්ලම ඔවුනට අමතක වන්නේය. අපි නිතරම මේ බව කීවෙමු. විප්ලවවලින් ඒබව ඔප්පු වන්නේය. අධිරාජ්‍යවාදී බලවතුන් සමග සන්ධානයන් ඇති කර ගැනීමේ දී, කොල්ලකාරී ගිවිසුම් ඇති කරගැනීමේදී සහ ඉංග්‍රිසි-ප්‍රංශ අධිරාජ්‍යවාදයට රට පාවාදීමේ දී, කැඩෙට්වරුන්, දක්ෂිණ සමාජවාදී-විප්ලවවාදී සහ මෙන්ෂෙවික් වරුන් සියළු වාර්තා බිඳ හෙළා ඇති බව අපි මනා සේ දන්නෙමු. උක්‍රෙනියාව සහ තිබිලිසි මීට හොඳ නිදසුනකි, චෙක්වරුන් සමග මෙන්ෂෙවික්වරුන් සහ දක්ෂිණ සමාජවාදී-විප්ලවවාදීන් ඇති කරගත් සන්ධානය මෙය ඔප්පු කිරීමට ප්‍රමාණවත් සාක්ෂියක් වන්නේය. තවද, යරස්ලාව්ල් සුදු හමුදවල[74] යහපත පිණිස රුසියානු සමූහාණ්ඩුව යුද්ධයට පැටලීමට උත්සාහ කරමින් වාම සමාජවාදී-විප්ලවවාදීන් කළ දෙයින් ඉතා පැහැදිලිවම පෙනෙන්නේ ධනපතියන්ගේ පංති ලාභ අහිමිවන තත්වයක් ඇතිවන විට ඔවුන් රට විකිණීමට හා තමන්ගේ ජනතාවට විරුද්ධව ඕනෑම විදේශිකයෙකු සමග එකඟත්වයකට ඒමට කැමතිවන බවය. සියළු කාලයේදීම සහ සියළු රටවලම ධනපතියන්ගේ පංති උවමනාව සහ පංති ප්‍රතිපත්තිය පිළිබඳ නීතිය මෙය බව අවුරුදු සියයකට වැඩි විප්ලව ඉතිහාසයෙන් පෙන්නුම් කරන ලද පසු, මෙම සත්‍යය නැවත නැවතත් රුසියානු විප්ලවයෙන් ඔප්පු වී තිබේ. එනිසා සෝවියට් සමූහාණ්ඩුවේ ජාත්‍යන්තර තත්වයේ වර්තමාන උග්‍රවීම, රටතුළ පංති අරගලය උග්‍රවීම හා සමග සම්බන්ධ වී තිබීම පුදුමයට කරුණක් නොවේ.

මේ හා සම්බන්ධයෙන්, ආහාර අර්බුදය උග්‍රවීම හා සම්බන්ධයෙන් අළුත් අස්වැන්න රැස් කර ගන්නා තෙක් කාලය, ඉතාමත් දුෂ්කර කාල සීමාව වනු ඇති බව අපි බොහෝ විට කියා ඇත්තෙමු. දුර්භික්ෂයේ මහා උවදුරෙන් රුසියාව පෙළෙන්නේය. අධිරාජ්‍යවාදී පල් හොරුන්ගේ උපක්‍රමය රුසියාවේ ධාන්‍ය නිපදවන පෙදෙස් ඇගෙන් වෙන් කිරීම වී තිබෙන නිසාම දුර්භික්ෂය උපමා නො කළ හැකි තරමට භයානක වී තිබේ. ඔවුන්ගේ උපායයන් ලොකු තේරුමක් ඇතිව සකස් කර ඇති අතර එහි ඉලක්කය

https://liberationbase.wordpress.com

වී තිබෙන් නේ දුර බැහැර තිබෙන ධාන්‍ය නිපදවන පෙදෙස්වල සමාජ සහ පංති සහයෝගය ලබා ගැනීමය. ඔවුහු කුලාකයන් බලවත්ව සිටින, පොහොසත් ගොවීන්, යුද්ධයේ පිහිටෙන් තරවූ, අන්‍යයන් ගේ, එනම්, දුප්පතුන්ගේ ශ්‍රමය සූරා කැමෙන් ජීවත් වන ගොවීන් බලවත්ව සිටින පෙදෙස් සොයා යති. මේ මිනිසුන් රූබල් ලක්ෂ ගණන් ගොඩ ගසාගෙන සිටින බවත්, ඔවුන් වෙත විශාල ධාන්‍ය තොග තිබෙන බවත් ඔබ දන්නෙහිය. ජාතික අභාග්‍යයන් උපයෝගි කර ගෙන තර වූයේත්, අගනුවර ජනතාව විඳින දුක් ගැහැට වැඩි වූ තරමට වැඩියෙන් සොරාගැනීමේ සහ ලාභ වැඩි කරගැනීමේ අවස්ථාව ලබන්නේද මේ මිනිසුන් බවත් ඔබ දන්නෙහිය. රුසියාවේ ප්‍රතිවිප්ලවවාදී ව්‍යාපාරයේ ප්‍රධාන සහ ඉතාමත් වැදගත් රුකුල වූයේ මෙම කුලාකයන් බව ඔබ දන්නෙහිය. මෙහිදී පංති අරගලය එහි නිධානයේ පතුලටම පිවිසියේය. එක් අතකින් කාලකණ්ණි කුලාකයන් අතලොස්සක් ද, අනිත් අතින් අතිවිශාල ශ්‍රමකරු බහුතරය වන දුප්පත් ගොවි ජනයා සහ ධාන්‍ය අතිරික්තයන් නැතිව සිටින, බොහෝ කලකට පෙර ස්වකීය අතිරික්තයන් පාරිභෝජනයට ගෙන නිම කළ, ලාභ ගැරීමට යොමු නොවූ මධ්‍යම ගොවීන් ද අතර පංති අරගලය දැල්වී නොයා ඉතිරි වූ එකම ගමක්වත් නොමැත. මෙම පංති අරගලය සෑම ගමක්ම විනිවිද ගොස් ඇත.

අපගේ දේශපාලන සැලසුම් තීරණය කරන විට සහ අපගේ ආඥ ප්‍රසිද්ධියට පත් කරන විට — මෙහි සිටින අයගෙන් වැඩි දෙනෙක් ඒවා ගැන හොඳින් දනිති — මා නැවතත් කියන ලෙසට, දුප්පත් ගොවි ජනතාව සංවිධානය කිරීම ගැන අපගේ ආඥවන් කෙටුම්පත් කිරීමෙහි සහ ඒවා සම්මත කිරීමෙහි අප යෙදී සිටින විට, අප මුහුණ දෙන්නට යන්නේ මුළු විප්ලවයේම ඉතාමත්ම තීරණාත්මක සහ මූලික ප්‍රශ්නයටය, බලය පිළිබඳ ප්‍රශ්නයටය යන්න අපි දැන සිටියෙමු. අප මුහුණ දෙන්නට යන්නේ, බලය නිර්ධන පංතිය අතෙහි පවතිනු ඇද්ද, තමන් සමග කිසිම විරෝධත්වයක් නොමැති දුප්පත් ගොවි ජනතාව තමන් වෙත ඒකරාශී කරගැනීමට ඔවුන්ට හැකි වෙද්ද, තමන්ට එකඟත්වයක් දක්වන ගොවි ජනයා දිනා ගැනීමෙහි සහ විසිරී, අසමගිව සහ ගම් මුළුල්ලේ පැතිරී සිටින, ඒ අතින් නාගරික කම්කරුවන්ට වඩා පසුබා සිටින, මෙම මුළු ජනකායම එක්සත් කිරීමෙහි ඔවුන් සමත් වෙද්ද, අනිත් කඳවුරට, විරුද්ධව, ඉඩම් හිමියන්ගේ, අධිරාජ්‍යවාදීන්ගේ හා කුලාකයන්ගේ කඳවුරට විරුද්ධව එම ජන කොටස් එක්සත් කිරීමට කම්කරුවන්ට හැකි වෙද්ද, යන ප්‍රශ්නයට බව අපි දැන සිටියෙමු.

අපගේ ඇස් ඉදිරියේම ගම්බද දුප්පත් ගොවි ජනතාව ඉතා ඉක්මනින්ම ඒකරාශී වීමට පටන් ගෙන සිටිති. විප්ලවය ගුරුවරයෙක් යයි කියනු

ලැබේ. ඕනෑම පක්ෂයක ඇති කිසියම් ව්‍යාජ ස්වභාවයන් වෙතොත් ඒ හේතුකොට ගෙන එම පක්ෂය අප්‍රමාදවම ඊට සුදුසු තැනට වැටෙන බව පංති අරගලය ඇත්ත වශයෙන්ම ව්‍යවහාරයෙන් උගන්වයි. අපි වාම සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ ප්‍රතිපත්තිය දැක ඇත්තෙමු. ඔවුන් ගේ කොන්ද පණ නැති කම සහ මෝඩ කම නිසා, ආහාර ප්‍රශ්නය ඉතාමත්ම උග්‍ර තත්වයේ පැවති අවස්ථාවේ දී ඔවුහු එහා මෙහා වැනෙන්නට පටන් ගත්හ. ඒ අනුව එම පක්ෂය යරස්ලාව්ල් සුදු හමුදාවල ඉත්තෙක් බවට පත්වූ නිසා, එය පක්ෂයක් වශයෙන් දර්ශන පථයෙන් අතුරුදහන් විය. (අත්පොළසන්).

සහෝදරවරුනි, ලැබෙන්නට තිබෙන අළුත් අස්වැන්න ඉතා සරු බව අප දන්නා නමුත් එය තවමත් රැස්කර ගත නොහැකිව තිබෙන අවස්ථාවක, "දැන් බැරිනම් කවදාවත් බැරිය!" කියමින් සියල්ල පරදුවට තබා දරන ප්‍රයත්නයක යෙදෙන කුලාකයන් විසින් කුසගින්නෙන් පීඩිත පෙට්‍රොග්‍රෑඩ් සහ මොස්කව් නගරවල ජනයා කැරළි ගැසීමට යොමු කරනු ලබන විටෙක, ආහාර අර්බුදය සම්බන් ද කර ගෙන තියුණු වෙමින් පවතින පංති අරගලයේ පසුබිම ගැන සැලකිල්ලට ගත් කල රුසියාව තුළ හමායන කැරළි රැල්ල ගැන වටහා ගැනීමට පුළුවන. යරස්ලාව්ල්හි කැරැල්ලක් ඇති වී තිබේ. බ්‍රිතාන්‍යයන්ගේ සහ ප්‍රංශයන්ගේ බලපෑම එයින් අපට දැක ගත හැකිය. ප්‍රතිවිප්ලවවාදී ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ උපායයන් අපට එ තුළින් දක්ක හැකිය. සමාජවාදය සඳහා නැතිවම බැරි දෙයක් වන ධාන්‍ය ඒකාධිකාරය පිළිබඳ ප්‍රශ්නය මතු වූ හැම අවස්ථාවකම ඔවුහු එයට විරුද්ධ වූහ. නිසැක ලෙසම ධනපතියන් එක්සත් වෙනු ඇත්තේ එතැනදීය. මෙහිදී ගැමියාට වඩා ශක්තිමත් ලෙස ධනපතියන්ට ආධාර ලැබෙන්නේය. සමාජවාදී සහ ධනපති බලවේග අතර සටන නොවැළැක්විය හැකි ලෙසටම ඇති වන්නේය. මොනවා සිදු වුවත්, අද නැත්නම් හෙට, එක් හෝ වෙනත් ප්‍රශ්නයක් මුල් කර ගෙන එම සටන සිදු වනු ඇත. වැනි වැනී සිටිය හැක්කේ නිදසුනක් ලෙසට අපගේ වාම සමාජවාදී-විප්ලවවාදීන් වැනි බොරු සමාජවාදීන්ට පමණකි. මෙම ප්‍රශ්නය හා සම්බන්ධයෙන්, මෙම මූලික ප්‍රශ්නය සම්බන්ධයෙන් සමාජවාදීන් වැනෙනසුලු තත්වයක් පෙන්වන විට, ඔවුහු බොරු සමාජවාදීන් පමණක් නොව, තුට්ටුවක් නොවටිනා අයද වෙති. විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙන් එවැනි සමාජවාදීහු ප්‍රංශ සේනාපතියන් අතෙහි නටන ඉත්තන් හා සමාන තත්වයකට පත්වූහ. එම ඉත්තන්ගේ ක්‍රියා කලාපය කෙබඳුද යනු කලින් පැවති වාම සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ කලින් පැවති මධ්‍යම කාරක සභාව විසින් ප්‍රදර්ශනය කරන ලදී.

සහෝදරවරුනි, ප්‍රතිවිප්ලවවාදී රුසියානු ධනපතියන්ගේ සහ බ්‍රිතාන්‍ය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හා ප්‍රංශ අධිරාජ්‍යවාදීන්ගේ ඒකාබද්ධ ප්‍රයත්නයන් ගේ ප්‍රතිඵලයක් ලෙසට, අප රටේ සිවිල් යුද්ධය දැන් සිදුවන්නේ, අප සමහර දෙනෙක් අපේක්ෂා නොකළ පැත්තකිනි; එය ඇති වෙතැයි අප සමහර දෙනෙක් පැහැදිලිව අවබෝධ කර නොගත් පැත්තකිනි. එපමණක් නොව, එය පිට දේශයෙහි කෙරෙන යුද්ධය සමග අභේද්‍ය සමස්තයක් ලෙසට සංයෝග වී තිබේ. කුලාක කැරැල්ලත්, චෙකොස්ලොවැක් හමුද කැරැල්ලත්, මූර්මන්ස්ක් සිද්ධීනුත් යන මේවා, රුසියාව යටකරගෙන එන ඒ යුද්ධයේම කොටස්ය. එක පැත්තකින් ආ යුද්ධයෙන් අප ගැලවී ගත්තේ ඉතා විශාල ආලාභ හානි විඳ ගනිමින් හා නො ඇදහිය හැකි තරම් අවාසිකාරී සාමයකට අත්සන් තැබීමෙනි. අප අත්සන් තබන්නේ කොල්ලකාරී ගිවිසුමකට යයි අපි දැන සිටියෙමු. නමුත්, අපට අපගේ ප්‍රචාරක කටයුතු සහ සංස්කරණාත්මක වැඩ දිගටම කර ගෙන යා හැකි බවත්, ඒ මාර්ගයෙන් අධිරාජ්‍යවාදී ලෝක-යේ බිඳවැටීමක් ඇති කළ හැකි බවත් අපි කීවෙමු. අපි සාර්ථක ලෙස එය කර ඇත්තෙමු. ජර්මනිය දැන් අප සමග සාකච්ඡා කරන්නේ බ්‍රෙස්ට්-ලිතොව්ස්ක් සාම ගිවිසුම පදනම් කරගෙන අපෙන් කී කෝටියක් උදුරා ගත යුතු ද යන්න ගැනය. නමුත් ජූනි 28 දින ආඥාව මගින් අප ප්‍රකාශයට පත් කළ ජනසතු කිරීම් සියල්ලම ඇය විසින් පිළි ගනු ලැබ තිබේ[75]. ඇය සමූහාණ්ඩුවේ පුද්ගලික ඉඩම් හිමිකම ගැන ප්‍රශ්නය මතු කර නැත. ස්පිරි-දෝනවා සහ වාම සමාජවාදී විප්ලවවාදීන්ගේ එවැනි නායකයන් පතුරුවන, එමෙන්ම ඉඩම් හිමියන්ට වාසි සලසන හා කරුණු කිසිවක් නොදත්තවුන් හා කළු සියය පිරිස් විසින් පුනරුච්ඡාරනය කරනු ලබන, බොරුවලට දෙන බලවත් පිළිතුරක් ලෙසට මෙම කරුණ අවධාරණය කළ යුතුය. මෙම බොරු නිෂ්ප්‍රභා කළ යුතුය.

වැදගත් කාරණය මෙයයි. සාම ගිවිසුම කොතරම් කටුක වුවත්, අපි ස්වදේශයෙහි සමාජවාදය ගොඩනැගීමේ කටයුතු කරගෙන යාම සඳහා නිදහස එමගින් දිනා ගත්තෙමු. අප ඒ කරා යොමු වූ පියවරයන් ගෙන තිබෙන අතර, ඒ ගැන තොරතුරු බටහිර යුරෝපයේ පැතිර යන විට, එම ආරංචි පෙර කිසි කලෙකත් නො වූ විරූ තරම් බලවත් ප්‍රචාරයක ස්වභා-වයකින් යුක්තය.

මේ අනුව, එක පැත්තකින්, එක සභාගයක් සමග වූ යුද්ධයෙන් අප මිදෙන විට, ඒ හා සමගම වෙනත් පැත්තකින් එල්ලවන අධිරාජ්‍යවාදී ප්‍රහාරයකට මුහුණ දීමට අපට සිදුවී තිබේ. අධිරාජ්‍යවාදය ලෝක ව්‍යාප්ත ප්‍රපංචයකි. එය මුළු ලෝකයම, මුළු පෘථිවියම බෙදගැනීම සඳහා, එක් හෝ තවත් සොරු කණ්ඩායමක ආධිපත්‍යය සඳහා කරන අරගලයකි. දැන් වෙනත් ගිජුලිහිණි රංචුවක්, එනම් ඉංග්‍රිසි-ප්‍රංශ ගිජුලිහිණියෝ අපගේ උගුරුදණ්ඩ වෙත කඩා පනිමින් නැවතත් අප යුද්ධය වෙතට ඇද ගෙන

යාමේ තර්ජනය එල්ල කරති. යුද්ධය සිවිල් යුද්ධය සමග අවිච්ඡේද සමස්තයක් වන සේ ඒ දෙකම සංයෝජනය වෙමින් පවතී. යුද්ධය පිළිබඳ ප්‍රශ්නය, යුද්ධ ක්‍රියා පිළිබඳ ප්‍රශ්නය අපගේ විප්ලවයේ ප්‍රධාන සහ මූලික ප්‍රශ්නය ලෙසට නැවතත් ඉදිරියට පැමිණ තිබෙන කල්හි, අපගේ වර්තමාන දුෂ්කරතාවයන්ට හේතුවී තිබෙන්නේ එයයි. ජනතාවට යුද්ධය එපා වී තිබෙන නිසා, පෙර කිසිකලෙකත් නොවූ විරූ තරම් එයින් හෙම්බත් වී සිටින නිසා යුද්ධයක් සිවිල් යුද්ධයත් සංයෝජනය වීම අපගේ සියළු අමාරුකම්වලට හේතුව වී තිබේ. රුසියානු ජනතාව යුද්ධයෙන් කොතරම් අන්ත ලෙස දුබල වී සහ වෙහෙසවී සිටිත් ද යත්, ඔවුහු මරණාසන්න වන තෙක් පහර දෙනු ලැබූ සහ ශක්තියක් හෝ වැඩ කිරීමේ හැකියාවක් පැමෙහි සමත් නොවන මිනිසෙකු හා සමාන තත්වයක සිටිති. එසේම සාර්වාදයද, ඒකාධිපත්‍යයද, ධනපතියන්ද, කෙරෙන්ස්කි ද විසින් කොල්ලකන ලද සහ පෙළන ලද රටක සම්පූර්ණයෙන්ම යටවී යන පරිද්දෙන් කෙරුනු හතර අවුරුද්දක් පමණ වූ මෙම යුද්ධය නිසා, ස්වාභාවික හේතු රැසක්ම අනුව රුසියානු ජනතාව තුළ එපා වූ හැඟීමක් ඇති වී තිබේ. දැන් අපට මුහුණ පාන්නට වී තිබෙන අතිශය දුෂ්කරතාවයන්ගේ එක ප්‍රධාන ප්‍රභව මූලයක් වන්නේ එයයි.

නමුත්, ඒ ආකාරයෙන් වූ සිදුවීම් නිශ්චිත ලෙසම යුද්ධය කැඳවීමට හේතු විය. අපි නැවතත් යුද්ධයට ඇද දමනු ලැබ සිටින්නෙමු. අපි යුද්ධ තත්වයට පත්ව සිටින්නෙමු. එය සිවිල් යුද්ධයක්, අපට විරුද්ධව එක්සත් වී සිටින කුලාකයන්ට, ඉඩම් හිමියන්ට සහ ධනපතියන්ට විරුද්ධව යුද්ධ-යක් පමණක් නොවේ. දැන් බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදයටද මුහුණ දීමට අපට සිදුවී තිබේ. අධිරාජ්‍යවාදීන්ගේ යුද්ධ හමුද රුසියාවට විරුද්ධව ගමන් කරවීමට හැකි තත්වයකට ඔවුන් තවමත් පත්ව නැත. ඔවුන්ට බාධාව වී තිබෙන්නේ භූමි ශාස්ත්‍රීය තත්වයන්ය. නමුත් අපගේ සතුරන්ට ආධාර කිරීම සඳහා ඔවුහු ඔවුනට හැකි සියලු ශක්තියක්ම යොදති. ඔවුන්-ගේ කෝටි ගණන් මුදල්, ඔවුන්ගේ රාජ්‍යතන්ත්‍රීය සම්බන්ධකම් හා බලවේග යන සියල්ලම යොදති. අපි යුද්ධ තත්වයකට පත්ව සිටිමු. අපට එයින් ජය ගෙන මතුවීමට පුළුවන. නමුත් මෙහිදී අපට බලවත් සතුරෙකුට මුහුණ දීමට සිදු වේ. එය මර්දනය කිරීමට ඉතා අපහසු සතුරෙකි. එම සතුරා නම්, යුද්ධය එපා වූ තත්වයයි; යුද්ධය ගැන ඇති වෛරය හා පිළි-කුළයි. අපි මෙය ජයගත යුත්තෙමු. නො එසේ නම් අපට මෙම ප්‍රශ්නය, යුද්ධය පිළිබඳ ප්‍රශ්නය විසඳාගත හැකි නොවේ. එය අපගේ කැමැත්ත අකැමැත්ත අනුව පවතින ප්‍රශ්නයක් නොවේ. නැවතත් අපගේ රට යුද්ධ-යට ඇද දමා තිබෙන අතර, දැන් විප්ලවයේ ප්‍රතිඵලය සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ යුද්ධයෙන් දිනන්නේ කවුද යන්න මතය. ප්‍රධාන සටන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කරුවන් චෙක්වරුන් වන නමුත් නියම ගාමක හා මෙහෙයවන බලය බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදීහු වෙති. රුසියානු සමාජවාදී ඒකාබද්ධ සෝවියට් සමූහාණ්ඩුවේ පැවැත්ම පිළිබඳ මුළු ප්‍රශ්නයම, රුසියානු සමාජවාදී විප්ලවයේ මුළු ප්‍රශ්නයම යුද්ධය හා සම්බන්ධ ප්‍රශ්නයක් වන සේ සරල වී තිබේ. ජනතාව අධිරාජ්‍යවාදී යුද්ධයෙන් ගොඩ ආ තත්වය ගැන සලකා බලන කල අති දැවැන්ත දුෂ්කරතාවයන් අප හමුවේ ඇත. අපගේ කර්තව්‍යය පැහැදිලිය. මොනයම් හෝ රැවටිල්ලක් අතිශයින්ම හානිදායක වනු ඇත. ඇත්ත තිත්ත වුවත් එය කම්කරුවන්ගෙන් සහ ගොවි ජනතාවගෙන් සැඟවීම අපි අපරාධයක් කොට සලකන්නෙමු. ඊට ප්‍රතිකූල ලෙසට හැකි තරම් පැහැදිලි හා විචිත්‍ර ආකාරයෙන් සත්‍ය ඔවුන්ට අවබෝධ කොට දිය යුතුය.

ඔව්, අපගේ හමුද සාපරාධී දුර්වලතාවයක් පෙන්නුම් කළ අවස්ථා තිබී ඇත. චෙක්වරු සිම්බිර්ස්ක් අල්ලාගත් අවස්ථාවේ අපගේ හමුද පසු බැසීම ඒ පිළිබඳ නිදර්ශනයකි. යුද්ධ හමුද යුද්ධයෙන් විඩා පත්ව ඇති බවත්, ඒවාට යුද්ධය එපා වී තිබෙන බවත්, අපි දන්නෙමු. නමුත් අධිරාජ්‍යවාදය ජාත්‍යන්තර වශයෙන් පරාජයට පත් කරන තෙක්, එය අධිරාජ්‍යවාදී යුද්ධය කරා රුසියාව ඇද ගැනීමේ ප්‍රයත්නයක යෙදීම සහ රුසියාව පොඩි පට්ටම් කර දැමීමට උත්සාහ කිරීම ද ස්වාභාවික දෙයකි. අප කැමති වුනත් නැතත් ප්‍රශ්නය ඉදිරිපත් වී තිබෙන්නේ පහත සඳහන් ආකාරයෙනි: අපි යුද්ධයට කොටුවී සිටින්නෙමු. විප්ලවයේ ඉරණම රැඳී පවතින්නේ යුද්ධයේ ප්‍රතිඵලය මතය. අපගේ ප්‍රචාරක කටයුතුවල, අපගේ සියළු දේශපාලන, විප්ලවවාදී සහ සංස්කරණාත්මක කටයුතුවල මූල් සහ අන්තිම කථාව විය යුත්තේ එයයි. අපි ඉතා කෙටිකාලයක් තුළ බොහෝ දේ කර ඇත්තෙමු, නමුත් කාර්යය අවසානය දක්වා ගෙනයා යුතුය. අපගේ කටයුතු සියල්ලම මූළුමනින්ම සහ එකක් නැර මෙම ප්‍රශ්නයට සම්බන්ධ කළ යුත්තේය. විප්ලවයේ ඉරණම සහ ප්‍රතිඵලය, රුසියානු සහ ලෝක විප්ලවයේ ඉරණම දැන් රැඳී පවතින්නේ මෙම ප්‍රශ්නය විසඳෙන ආකාරය මතය. විප්ලව කීපයක් නොමැතිව ලෝක අධිරාජ්‍යවාදයට වර්තමාන යුද්ධයෙන් ඉවත්විය නොහැකි බව ඇත්තකි. අවසානයේදී සමාජවාදය ජයගැනීමෙන් මිස වෙනත් ආකාරයකින් මෙම යුද්ධය කෙළවර විය නො හැකිය. නමුත් දැන් අපගේ කර්තව්‍යය වී තිබෙන්නේ සමාජවාදයේ මෙම බලවේගය, සමාජවාදයේ මෙම ගිනිහුල, මුළු ලෝකයම කෙරෙහි ක්‍රියාශීලී බලපෑමක් විහිදුවන මෙම සමාජවාදයේ උල්පත පවත්වාගැනීම, රැක ගැනීම සහ නගා සිටුවීම ය. එසේම දැන් පවතින තත්වය අනුව මෙම කර්තව්‍යය යුද්ධමය කර්තව්‍යයක් වන්නේය.

අප මෙවැනි තත්වයකට පත්වූ ප්‍රථම අවස්ථාව මෙය නොවේ. සාමය සඳහා අපට ගෙවන්නට සිදුවූ මිළ කොතරම් අධික වුවත්, එය අපෙන් අපේක්ෂා කළ කැප කිරීම් කොතරම් දරුණු වුවත්, අපගෙන් තව තවත් භූමි ප්‍රදේශ සොරා ගැනීමට සතුරා කොතරම් උත්සාහ දැරුවත්, මහත් අවාසිදායක තත්වයන් මධ්‍යයේ වුවද, රුසියාව මේ දක්වා සාමය භුක්ති වින්ද බවත්, ඇගේ සමාජවාදී ජයග්‍රහණයන් තහවුරු කර ගත හැකි තත්වයක ඇය පසුවූ බවත්, අපි බොහෝ දෙනෙක් කියා ඇත්තෙමු. අප බොහෝ දෙනෙක් බලාපොරොත්තු වූවාටත් වඩා දුරක් අපි මෙම දිශාවට ගොස් ඇත්තෙමු. නිදසුනක් ලෙසට අපගේ කම්කරු පාලනය එය ආරම්භ වූ මුල් ආකෘතිවල පටන් බොහෝ දුරක් ඉදිරියට ගොස් ඇත. අද අපි රාජ්‍ය පරිපාලනය සමාජවාදී ක්‍රමයකට පරිවර්තනය කරනු දැක්ක හැකි තත්වයකට පත්ව සිටින්නෙමු. අපි අපගේ ප්‍රායෝගික කටයුතු අතින් විශාල ඉදිරි පියවරයන් තබා ඇත්තෙමු. දැන් අපගේ කර්මාන්ත සම්පූර්ණයෙන්ම මෙහෙයවනු ලබන්නේ කම්කරුවන් විසිනි. නමුත් එම කාර්යය සාමකාමී තත්වයන් යටතේ දිගටම කරගෙන යාම වටපිටාවෙ සිදුවීම් විසින් වලක්වනු ලැබේ. ඔවුහු නැවතත් අප යුද්ධයට ඇද දැමූහ. එනිසා අපගේ සෑම ධෛර්යයක්ම යෙදීමටත්, සියළු දෙනාම කැඳවා ආයුධ ගන්නා ලෙස කීමටත් අපට සිදු වේ. මෙම කාරණයෙහි දී දෙගිඩියාවෙන් පසුවීම ඕනෑම කොමියුනිස්ට්වාදියෙකුට නින්දවකි.

ගොවිජනතාව අතර දක්නට ලැබෙන වැනෙන සුලු භාවය අපේ පුදුමයට කරුණක් නොවේ. ධනපතියන් තමන්ගේ පංති සතුරා ලෙස සැලකීමට දශක ගණනක් සිටම පුරුදුවී සිටින සහ එම සතුරාට විරුද්ධව සටන් කිරීම පිණිස ස්වකීය බලවේගයන් එක්සත් කිරීමට උගෙන ගෙන සිටින කම්කරුවන් ලැබූ දැනුම ගොවි ජනතාවට ලැබී නැත. ගොවි ජනතාව, කම්කරුවන් මෙන් එවැනි විශ්වවිද්‍යාලීය අධ්‍යාපනයක් නොලැබූ බව අපි දනිමු. එක් අවස්ථාවක ඔවුහු කම්කරුවන්ගේ පැත්ත ගත්හ. නමුත්, දැන් ගොවි ජනතාව බෙදී යන වැනෙනසුලු භාවයේ කාල සීමාවක් අපට දක්නට තිබේ. කුලාකයන් නියමිත මිළට අඩුවෙන් ගොවිජනතාවට ධාන්‍ය විකුණූ අවස්ථා ගණනාවක් ගැන අපි දන්නෙමු. ඔවුන් එසේ කරන්නේ කුලාකයන් ගොවිජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන බවක් පෙන්වීමට ය. මේ කිසිවකින් අපි පුදුම නොවෙමු. නමුත් කොමියුනිස්ට් කම්කරුවා නොසැලෙයි. කම්කරු පංතිය නොසැලී සිටියි.එහෙත් ගොවිජනතාව අතර කුලාක ජීවගුණය බලවත් වේ නම්, එය මනාව වටහාගත හැකි දෙයකි. චෙක්වරු පාලනය කරන සහ බොල්ෂෙවික්වරු නොමැති පෙදෙස්වල දක්නට ලැබෙන පින්තූරය මෙසේය: ප්‍රථමයෙන් චෙක්වරු ගැලවුම්කාරයෝ ලෙස හුවා දක්වනු ලැබේ. නමුත් මෙම ධනපති පංති පාලනය සති කීපයක් පැවති පසු, චෙක් වරුන්ට විරුද්ධව සහ සෝවියට්

https://liberationbase.wordpress.com

ආණ්ඩුවට පක්ෂව දවැන්ත ව්‍යාපාරයක් උද්ගත වන්නේය. එසේ සිදු වන්නේ, වෙළඳාම් කිරීමේ නිදහස සහ ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය ගැන වූ සියළු කථා වලින් එකම දෙයක් අදහස්වන බවත්, ඒ ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ පාලනය බවත්, ගොවිජනතාවට අවබෝධ වීමට පටන් ගන්නා හෙයිනි.

කම්කරුවන් ඒකරාශී වීමට සැලැස්වීම සහ මීළඟ සති කීපය තුළ කරන සියළු දේ සියල්ලම යුද්ධය පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා කැප කරන සංවිධානයක් නිර්මාණය කිරීම අපගේ කාර්යය වන්නේය. අපි දැන් බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදයට විරුද්ධවත්, රුසියාව තුළ ඇති ධනපති පංතික සහ ධනවාදී සියල්ලට විරුද්ධවත් සමාජවාදී විප්ලවය අසාර්ථක කිරීමට සහ අප යුද්ධයට පැටලීමට උත්සාහ කරන සියල්ලන්ටම විරුද්ධවත්, යුද වැදී සිටිමු. දැන් උද්ගත වී තිබෙන්නේ කම්කරුවන්ගේ සහ ගොවි ජනතාවගේ ජයග්‍රහණයන් සියල්ලම නැතිව යාමේ අවදානම සහිත තත්වයකි. අපට නිර්ධන පංතියේ පුළුල් සහයෝගය ලැබෙන බවද, එවිට අන්තරාය සම්පූර්ණයෙන්ම වැලැක්විය හැකි බවද, තමන්ගේ පංතිය වෙනුවෙන් සටන් කිරීමට සහ සමාජවාදී විප්ලවය රැක ගැනීමට නිර්ධන පංතියේ නව පිරිස් ඉදිරියට එනු ඇති බවද, ඒකාන්ත යයි අපට විශ්වාස කළ හැකිය. දැන් තිබෙන තත්වය අනුව පෙනෙන්නේ අරගලය ප්‍රධාන ප්‍රශ්න දෙකක් මුල් කරගෙන සිදුවන බවයි. එසේම විප්ලවයේ ගිනි දැල් නිසා සියළුම පාක්ෂික ප්‍රධාන ප්‍රශ්න පිළිබඳ වෙනස්කම් මැකී ගොස් ඇත. තොර තෝංචියක් නැතිව තමන්ගේ වාමාංශිකභාවය ගැන අපට මතක් කරමින් සිටින වාම සමාජවාදී-විප්ලවවාදියා, ඇත්ත වශයෙන්ම සෝවියට් ආණ්ඩුවට විරුද්ධව කැරළි ගසන අතර විප්ලවවාදී වදන් මාලා නැමති මිහි දුම පිටු පස සැඟවී සිටියත්, ඔහු යෙරස්ලාව්ල් සුදු හමුදාවල කුලී සේවකයෙක්ම වන්නේය. ඉතිහාසයේදී හා විප්ලවයේදී ඔහු ඉටු කරන කාර්ය භාරය එය ය! අද අරගල භූමියේදී අන්‍යෝන්‍ය වශයෙන් සටන් අභිමුඛව සිටින්නේ පංති දෙකක් පමණකි. පංති අරගලය කෙරෙන්නේ, වැඩ කරන ජනතාවගේ උවමනාවන් ආරක්ෂා කරන නිර්ධන පංතිය සහ ඉඩම් හිමියන්ගේ හා ධනපතියන්ගේ උවමනාවන් ආරක්ෂා කරන අය අතරය. නූගත් ජනතාව රැවටීමට යොදගන්නා ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලයක් ගැන සහ ස්වාධීන රාජ්‍යයක් ආදිය ගැන වූ කථා සියල්ලම චෙක් ව්‍යාපාරයෙන් සහ කොකේසියානු මෙන්ෂෙවික් ව්‍යාපාරයෙන් හෙළිදරව් වී තිබේ. මේ කථා සියල්ලම පිටුපසින් සිටින්නේ එකම බලවේගයන්ය. ඒ ඉඩම් හිමියන් සහ ධනපතියන් ය. එමෙන්ම චෙක් හමුද කැරැල්ල පිටුපසින් ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ පාලනය

එන්නේය. එය සිදුවන්නේ ජර්මන්වරුන් රට අල්ලාගත් පසු එම පාලනය එන ආකාරයෙන්ම ය. යුද්ධය කරනු ලබන්නේ එය සඳහාය!

සහෝදරවරුනි, කම්කරුවන් වෙන කවරදකටවත් වඩා ඔවුන් ගේ පිරිස් එක්සත් කර ගත යුතුය. මෙම අරගලයේදී ඔවුන් සංවිධානය සහ විනය පිළිබඳ ආදර්ශයක් දිය යුතුය. අධිරාජ්‍යවාදය සමග සියළු බැමි කපා හළ එකම රට ලෙසට තවමත් තිබෙන්නේ රුසියාව පමණය. අපට සිදුවී තිබෙන බරපතල තුවාලවලින් ලේ ගලා යන බව ඇත්තය. අධිරාජ්‍යවාදී මෘගයා හමුවේ පසු බසිමින් අපි කාලය ලබා ගත්තෙමු. තැනෙක දී දෙකක දී ඌ වෙත පහරක් එල්ල කෙළෙමු. නමුත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව ලෙසට අපි ස්වාධීනව සිටියෙමු — අපගේ සමාජවාදී වැඩ කටයුතු කරමින් අපි මුළු ලෝකයේම අධිරාජ්‍යවාදයට විරුද්ධ වූයෙමු. එනිසා එන්න එන්නම ලෝකයේ කම්කරුවන්ට මෙම අරගලය ගැන පැහැදිලි වැටහීමක් ඇති වන්නේය. ඒ අනුව නැගී එන ඔවුන්ගේ කෝපය විසින් ඔවුන් වඩ වඩාත් අනාගත විප්ලවයට සමීප කරනු ලැබේ. අරගලය කෙරෙන්නේ මෙය ගැනය. එය සිදුවන්නේ අධිරාජ්‍යවාදය සමග අත්වැල් බැඳගෙන ගමනේ නොයෙදෙන සහ ලෝකය පාලනය කළ යුත්තේ ප්‍රංශවන්ද නැතහොත් ජර්මානුන්ද යන්න තීරණය කරනු සඳහා ජනතාව දශලක්ෂ ගණනින් ඝාතනය කිරීමට ඉඩ නොදෙන එකම රට අපගේ සමූහාණ්ඩුව වන නිසාය. බලහත්කාරයෙන් සහ විප්ලවවාදී මාර්ගයෙන් ලෝක අධිරාජ්‍යවාදී යුද්ධයෙන් බිඳී වෙන් වුනු සහ සමාජවාදී විප්ලවයේ ධජය නැංවූ එකම රට අපගේ සමූහාණ්ඩුවය. නමුත් නැවතත් එය යුද්ධය වෙත ඇදගෙන යනු ලැබේ. එය යුද්ධ අගල් වෙතට තල්ලු කරනු ලැබේ. චෙක්වරු ජර්මානුන්ට විරුද්ධව යුද්ධ කළා දෙන්. රුසියානු ධනපති පංතිය ඔවුනට උවමනා පැත්ත තෝරා ගත්තා දෙන්. තමන් ගන්නේ කුමණ අධිරාජ්‍යවාදීන්ගේ පැත්තද යනු, සමහරවිට ස්පිරිදෝනවා ගේ සහ කම්කොව් ගේ කැමැත්ත පවා ඇතිව මිල්යුකොව් තීරණය කර ගත්තා දෙන්. නමුත් මෙය සමාජවාදී විප්ලවයේ ඉරණම තීරණය කරන ප්‍රශ්නයක් වන නිසා එය ඔවුන්ට උවමනා විධියට තීරණය කරන්න ඉඩ නොදෙනු පිණිස අපි අපගේ ජීවිත පරිත්‍යාග කිරීමට සූදනමින් සිටින බව ප්‍රකාශ කළ යුත්තෙමු. (අත් පොළසන්.) විඩාපත් භාවය ඉතාමත් බලවත් වන සහ යුද්ධමය සටන් කිරීමේ ශක්තිය අඩුම තත්වයක පවතින සරාතව්, සමාරා සහ සිම්බිර්ස්ක් ගුබෙර්නියා පළාත්වල ගොවි ජනතාව අතර හැඟීම් වෙනසක් සිදුවී තිබෙන බව මම දනිමි. කොසාක්වරු සහ චෙක්වරු කළ මහා විනාශය ඔවුන් අත් දැක ඇත. ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලයෙහි සහ "බ්‍රෙස්ට් ගිවිසුම භංගවේවා!" යන ඝෝෂාවල නියම අර්ථය කුමක්ද යන්න ඔවුන් රසබලා ඇත. ඒ සියල්ලෙන්ම සිදුවන්නේ ඉඩම් හිමියාට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සහ ධනපතියාට සිංහාසනයට නැගීමේ මග සකස් වීම පමණක් බව ඔවුහු අවබෝධ කරගෙන සිටිති. එනිසා දැන් ඔවුහු සෝවියට් බලයේ ඉතාමත් දැඩි පක්ෂවාදීන් වෙමින් සිටිති. විප්ලවයේ මුලින්ම ගමන් කරන පෙට්‍රොග්‍රෑඩ් සහ මොස්කව් කම්කරුවන් තත්වය තේරුම් ගනු ඇතැයිද, කාලයේ දරුණු තත්වය ගැන අවබෝධ කරගනු ඇතැයිද, අන් කවරදා කටත් වඩා අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කරනු ඇතැයිද, සමාජවාදී විප්ලවයේ යහපත පිණිස ඉංග්‍රීසි-ප්‍රංශ සහ චෙක් යන ආක්‍රමණයන් දෙකම සුනුවිසුනු කරනු ඇතැයිද යන්න ගැන මට අල්ප මාත්‍ර හෝ සැකයක් නොමැත. (අත්පොළසන්.)

"සමස්ත — රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ, මොස්කව් සෝවියට් සභාවේ, මොස්කව් පැක්ටරි කාරක සභා සහ වෘත්තීය සමිති නියෝජිතයන්ගේ සහ සෝවියට් සභා නියෝජිතයින්ගේ සමස්ත රුසියා සම්මේලනයේ ඒකාබද්ධ සැසිවාරය, 1918 ජූලි 29" නැමති පොතෙහි ප්‍රථම වරට 1918 දී පළ කරන ලදී

"සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාව, පස්වැනි රැස්වීම් වාරය. සම්පූර්ණ වාර්තාව" යන පොතෙහි 1919 දී පළ කරන ලදී

වි. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය-වෙළුම 37, පිටු 1–19

සහෝදර කම්කරුවනි, අවසාන, තීරණාත්මක සටන සඳහා පෙරට යමු!

LIBERATIONBASE

සතුරෝ සෝවියට් සමූහාණ්ඩුව වට කර ගෙන සිටිති. නමුත් එය ස්වදේශයෙහිත් විදේශයෙහිත් සතුරන් පරාජය කරනු ඇත. ජයග්‍රහණය සහතික කරනු ඇති ජීව ගුණයක් වැඩ කරන ජනතාව කෙරෙහි දැනටමත් දක්නට ලැබේ. ලෝක කම්කරු විප්ලවයේ ජයග්‍රහණය ඈත නොවේය යන සහතිකයෙන් අප දිරිගන්වන බටහිර යුරෝපයේ විප්ලවවාදී අග්නි ජාලයේ පුළිඟු සහ පිපුරුම් අපට දැන් දැන් නිතරම දක්නට ලැබේ.

රුසියානු සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවේ වර්තමාන බාහිර සතුරා බ්‍රිතාන්‍ය, ප්‍රංශ, ඇමෙරිකානු හා ජපාන අධිරාජ්‍යවාදය වන්නේය. මෙම සතුරා රුසියාවට පහර දෙමින් සිටී, අපගේ දේශ භූමිය කොල්ල කමින් සිටී. ඔවුන් අර්හාංගල්ස්ක් පෙදෙස අල්වා ගෙන (ප්‍රංශ පුවත් පත් කියන පරිදි) ව්ලැදිවස්තොක් සිට නිකොල්ස්ක්-උසුරීස්කි දක්වා ඉදිරියට විත් ඇත. මෙම සතුරන් චෙකොස්ලොවැකියානු සේනාවල සේනාපතියන්ට හා නිලධාරීන්ට අල්ලස් දී ඇත. පෙබරවාරියේ දී ජර්මන්වරු පහර දුන් තරම්ම දරුණු ලෙස හා ගිජු ලෙස මෙම සතුරෝ සාමකාමී රුසියාවට පහර දෙති. වෙනසකට ඇත්තේ, බ්‍රිතානීන් හා ජපානුන් රුසියානු භූමි භාගයන් අල්ලා ගැනීමට හා සෝවියට් ආණ්ඩුව පෙරළා දැමීමට මහත් සේ උනන්දු වන්නේ "පෙරමුණ නැවත පිහිටුවීම" සඳහා, නැතහොත් බ්‍රිතාන්‍යය හා ජර්මනිය අතර කෙරෙන අධිරාජ්‍යවාදී (වඩාත් සරල ලෙස කියතොත්, කොල්ලකාරී) යුද්ධයට රුසියාව අද්ද ගැනීම සඳහා වීමය.

බ්‍රිතාන්‍ය සහ ජපාන ධනපතියන්ට රුසියාවේ ඉඩම්හිමි සහ ධනපති

https://liberationbase.wordpress.com

බලය යළි ස්ථාපිත කිරීමට උවමනා වී තිබෙන්නේ යුද්ධයේදී කොල්ලකා ගන්නා වස්තුව ඔවුන් සමග බෙදා ගැනීම සඳහා ය. රුසියානු කම්කරුවන් හා ගොවිජනතාව බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ ප්‍රාග්ධනයට බැඳ තැබීමටත්, සිය කෝටි ගණින් දෙන ලද ණය මුදල් සඳහා ඔවුන් මිරිකා පොලී ලබා ගැනීමටත්, අප රටේ දැල්වී තිබෙන සහ ලෝකය මුළුල්ලේම පැතිරීයාමේ තර්ජනය සහිත සමාජවාදී විප්ලව ගින්න නිවා දැමීමටත් බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ ධනපතියන්ට උවමනා කර තිබේ.

බ්‍රිතාන්‍ය සහ ජපාන අධිරාජ්‍යවාදී මිලේච්ඡයෝ රුසියාව අල්ලාගෙන යටත් කර ගැනීමට තරම් ශක්තිමත් නොවෙති. අසල්වැසි ජර්මනියටවත් එතරම් ශක්තියක් නැත. උක්‍රේනියාවේ "අත්දැකීමෙන්" ඒ බව පෙනී ගියේය. බ්‍රිතාන්‍යින්ගේ සහ ජපානුන්ගේ උපාය වූයේ අපට බලාපොරොත්තු රහිත ලෙසින් ගෙන පහර දීමය. ඔවුන්ගේ උපාය අසාර්ථක විය. පෙට්‍රොග්‍රෑඩ් කම්කරුවෝද ඔවුන් අනුව මොස්කව් කම්කරුවෝද, ඔවුන් අනුව මුළු මධ්‍යම ප්‍රදේශයේම කම්කරු ජනතාවද වඩ වඩාත් එක්සත්ව, වඩ වඩාත් ධෛර්ය සම්පන්න ලෙස හා වඩ වඩාත් විශාල පිරිස් සහිතව නැගී සිටිති. එය අප ජයගන්නා බව කියන ඒකාන්ත ලක්ෂණයකි.

බ්‍රිතාන්‍ය සහ ජපාන ධනපති සොරුන් සාමකාමී රුසියාවට පහර ගසන කල, සෝවියට් ආණ්ඩුවේ අභ්‍යන්තර සතුරා සමග සන්ධානයක් ඇති කර ගැනීමටද ඔවුහු බලාපොරොත්තු වෙති. එම අභ්‍යන්තර සතුරා කවරෙක්ද යන්න අපි කවුරුත් දනිමු. කම්කරුවන්ගේ සහ වැඩ කරන ගොවිජනතාවගේ, එනම්, තමන්ගේ අසල්වැසි ගොවි ජනතාවගේ ලේ උරා නොබොන ගොවිජනතාවගේ, ආණ්ඩුවට වෛර කරන ධනපතියන්, ඉඩම් හිමියන්, කුලාකයන් සහ ඔවුන්ගේ පැටවුන් එම සතුරා වන්නේය.

කුලාක කැරළි රැල්ලක් රුසියාව හරහා හමා යන්නේය. කුලාකයාට සෝවියට් ආණ්ඩුව හලාහල වස මෙනි. ඔහු එයට වෛර කරන්නේය ලක්ෂගණන් කම්කරුවන්ගේ බොටුව බිඳ දැමීමට, ඔවුන් මරා දැමීමට ඔහු සූදානම් ය. කුලාකයන් බලවත් වුවහොත්, ඔවුන් ඉඩම් හිමියන් සහ ධනපතියන් සමග සන්ධාන ගතව ලක්ෂ ගණනින් කම්කරුවන් ඝාතනය කරනු ඇති බවත්, කම්කරුවන්ගේ කොන්ද කැඩෙන තත්ත්වයන් යළි ඇති කරන බවත්, පැය අටේ වැඩ දිනය අවලංගු කර මෝල් සහ ෆැක්ටරි ධනපතියන්ට ආපසු පවරා දෙනු ඇති බවත් අපි හොඳින් දන්නෙමු.

ඉහත ඇතිවූ යුරෝපීය විප්ලව සියල්ලෙහිදීම කම්කරුවන්ගේ දුර්වල කම නිසා සමූහාණ්ඩුවක සිට රාජාණ්ඩුවක් දක්වා, වැඩ කරන ජනතාවගේ

ආණ්ඩුවක සිට සූරා කන්නන්ගේ, පොහොසතුන්ගේ හා පරපුට්ටන්ගේ සර්වාධිකාරයක් දක්වා ආපසු යාමට කුලාකයන් සමත් වූ කල සිදු වූයේ එයයි. අපගේ ඇස් හමුවේම මෙය ලත්වියාවේදී, ෆින්ලන්තයේදී, උක්‍රේනියාවේදී සහ ජෝර්ජියාවේදී සිදුවිය. කෑදර, පිම්බුනු හා මෘග කුලාකයෝ සෑම තැනෙකදීම කම්කරුවන්ට සහ පොදු වශයෙන් දුප්පතුන්ට විරුද්ධව ඉඩම් හිමියන් සහ ධනපතියන් සමග අත්වැල් බැඳ ගත්හ. කුලාකයෝ සෑම තැනෙකදීම නොසිතිය හැකි තරම් කෲර ලෙසට කම්කරුපංතියෙන් පළිගත්හ. ඔවුහු තම රටේ කම්කරුවන්ට විරුද්ධව සෑම තැනෙකදීම විදේශ ධනපතියන් සමග අත්වැල් බැඳ ගත්හ. කැඩෙට්වරුන්, දක්ෂිණ සමාජවාදී-විප්ලවවාදීන් සහ මෙන්ෂෙවික්වරුන් කටයුතු කළේ ඒ ආකාරයටය. ඒ බව වටහා ගැනීමට ඔවුන් "චෙකොස්ලොවැකියා" ප්‍රදේශවලදී කළ හපන්කම් මතක් කිරීම ප්‍රමාණවත්ය. වාම සමාජවාදී-විප්ලවවාදීන් අන්ත මෝඩයන් සහ චපලයන් ලෙස කටයුතු කරමින් මොස්කව් නගරයේ කැරළි ගැසීමෙන් යරස්ලාව්ල්හි සුදු හමුදාවලටත්, කසාන්හි චෙක්වරුන්ට සහ සුදු පිරිස්වලටත් ආධාර දී කළේ ද එයම ය. මෙම වාම සමාජවාදීවිප්ලවවාදීන් කෙරෙන්ස්කිගේ සහ ඔහුගේ මිතුරන්ගේත්, ප්‍රංශ අධිරාජ්‍යවාදීන්ගේත් ප්‍රශංසාවට ලක් වීම පුදුමයට කරුණක් නොවේ.

ඒ ගැන සැකයක් නොමැත. කුලාකයෝ සෝවියට් ආණ්ඩුව කෙරෙහි වියරු විරෝධයක් දක්වන සතුරෝ වෙති. එක්කෝ කුලාකයන් විසින් කම්කරුවන් අති විශාල සංඛ්‍යාවන් මරා දමනු ලැබෙනු ඇත. නැතහොත් කම්කරු ජනතාවගේ ආණ්ඩුවට විරුද්ධ ජනගහනයෙන් සුළු පිරිසක් වන මෙම කොල්ලකාරී කුලාකයන්ගේ කැරළි කම්කරුවන් විසින් නිර්දය ලෙස මර්දනය කෙරෙනු ඇත. මැද මාවතක් තිබිය නොහැකිය. සාමයක් තිබිය නොහැකිය. ඔවුනොවුන් රණ්ඩු කරගෙන සිටියත්, ඉඩම් හිමියාද, සාර්ද, පූජකයාද සමග බේරුමක් කර ගැනීම කුලාකයාට ඉතා පහසු හෙයින්ද, කම්කරු පංතිය සමග බේරුමක් කර ගැනීම ඔහුට කිසි කලෙකත් කළ නොහැකි හෙයින්ද, සාමයක් තිබිය නොහැකිය.

කුලාකයන්ට විරුද්ධව කරන සටන අවසාන, තීරණාත්මක සටන ලෙස හැඳින්වීමට අප කැමති වන්නේ එනිසා ය. තවත් කුලාක කැරළි බොහෝ ගණනක් ඇතිවීම හෝ විදේශ ධනපති ක්‍රමයෙන් සෝවියට් ආණ්ඩුවට තවත් බොහෝ පහරවල් එල්ල වීම හෝ සිදු නොවිය හැකි දෙයක් ලෙසට හැඳින්වීමක් එයින් අදහස් නොකෙරේ. "අවසාන" සටන යනුවෙන් අදහස් කෙරෙන්නේ, අවසාන සහ සංඛ්‍යාවෙන් විශාලතම සූරා කන පංතිය අප රට තුළ අපට විරුද්ධව කැරළි ගසා තිබෙන බවය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කුලාකයෝ ඉතාමත් මෘග, අනුකම්පා විරහිත සහ දරුණු සූරා කන්නෝ වෙති. වෙනත් රටවල ඉතිහාසයේදී, ඔවුහු යළි යළිත් ඉඩම් හිමියන්ගේ, සාර්වරුන්ගේ, පූජකයන්ගේ සහ ධනපතියන්ගේ පාලනය ප්‍රතිෂ්ඨාපනය කර ඇත්තාහ. කුලාකයෝ සංඛ්‍යාවෙන් ඉඩම් හිමියන්ට හා ධනපතියන්ට වඩා බොහෝ අධික වෙති. එසේ වුවත් ඔවුහු ජනගහන-යේ අල්පතරයක්ම වෙති.

කොල්ල කරුවන් විසින් උක්‍රේනියාව සහ වෙනත් පෙදෙස් රුසියා-වෙන් උදුරා ගැනීමට පෙර පැවති තත්ත්වයෙන් රුසියාව ගනිමින්, රට තුළ ගොවිජන පවුල් එක් කෝටි පණස් ලක්ෂයක් ඇතැයි සිතමු. මෙම එක් කෝටි පණස් ලක්ෂයෙන් සමහරවිට කෝටියක්ම දුප්පත් ගොවි ජනයා වෙති. ඔවුන් ජීවත් වන්නේ තමන්ගේ ශ්‍රම ශක්තිය විකිණීමෙනි. නැතහොත් ඔවුහු පොහොසතුන්ගේ වහල් සේවයට බැඳී සිටිති. එසේත් නැතහොත් ඔවුහු ධාන්‍ය අතිරික්තයන් නොමැතිව, යුද්ධයේ කරදර නිසා අන්ත දරිද්‍රතාවයට පත්ව සිටිති. ඉන් තිස් ලක්ෂයක් පමණ මධ්‍යම ගොවි ජනයා සේ සැලකිය යුතුය. ඒ අතර කුලාකයන්, පොහොසත් ගොවීන් සහ ධාන්‍යවලින් ලාභ ගරන පවුල් විසි ලක්ෂයක්වත් නොමැති තරමය. මෙම සිත්පිත් නැති ලේ මාපිලුන් තර වූයේ ජනතාව යුද්ධ කාලයේදී වින්ද නැති බැරි කම් උපයෝගි කර ගනිමිනි. ධාන්‍යවල සහ වෙනත් නිෂ්පාදිතවල මිළ වැඩි කිරීමෙන් ඔවුන් රූබල් දහස් ගණන් හා ලක්ෂ ගණන් මුදල් ගරා ගෙන ඇත. මෙම මකුළුවන් තරවී සිටින්නේ යුද්ධයෙන් විනාශයට පත් ගොවි ජනයා අමාරුවේ දැමීමෙනි; නැතහොත් සාගින්නේ පෙළෙන කම්කරුවන් අමාරුවේ දැමීමෙනි. මෙම කූඩැල්ලෝ වැඩකරන ජනතාවගේ ලේ උරා බීහ; නගරවල සහ පැක්ටරිවල කම්කරුවන් නිරා-හාරව සිටියදී පොහොසත් වූහ. මෙම ලේ බොන පිශාචයෝ වතුකාර ඉඩම් ඔවුන් අතට එකතු කර ගනිමින් සිටි අතර තව දුරටත් දුප්පත් ගොවි ජනතාව වහල් කරගෙන සිටිති.

කුලාකයන්ට විරුද්ධව අනුකම්පා විරහිත යුද්ධයක් කළ යුතුය! ඔවුන් නසා දැමිය යුතුය! ඔවුන් ආරක්ෂා කළ පක්ෂ වන දක්ෂිණ සමාජවාදී-විප්ලවවාදීන්ට, මෙන්ෂෙවික්වරුන්ට සහ අද වාම සමාජවාදී-විප්ලවවාදී-න්ට වෛරය සහ පිළිකුළ දැක්විය යුතුය! කුලාකයෝ තමන්ගේම රටේ කම්කරුවන්ට විරුද්ධව විදේශ ධනපතියන් සමග සන්ධානයක් ඇති කර ගනිමින් සිටිති. ඔවුන්ගේ කැරළි අයෝමය හස්තයකින් මැඩලීම කම්ක-රුවන්ගේ යුතුකම වන්නේය.

කුලාකයෝ ගම්බද ගොවිජනතාවගේ නූගත්කම, අසමගිය සහ කනිවූ ස්වාභාවය තමන්ගේ වාසියට හරවා ගනිති. ඔවුහු ගොවිජනයා කම්කරුව-න්ට විරුද්ධව උසිගන්වති. ධාන්‍යවලින් ලාභ ගැරීමෙන් "කළකට පසු

යමක් හම්බ කරගැනීමට", රූබල් සියයක් වැනි මුදලක් උපයාගැනීමට ඉඩදීමෙන් (හා ඒ සමගම දුප්පත් ගොවීන්ගෙන් රූබල් දහස් ගණනක් සොරා ගැනීමෙන්) ඔවුහු සමහර විට ගොවිජනතාවට අල්ලස් දෙති. කුලා-කයෝ මධ්‍යම ගොවීන්ගේ ආධාරය දිනා ගැනීමට උත්සාහ කරන අතර සමහර විට සාර්ථක ලෙස එසේ කරති.

නමුත් කම්කරු පංතිය මධ්‍යම ගොවිජනයා සමග රණ්ඩුවක් ඇති කර ගැනීමට හේතුවක් නැත. කම්කරුවන්ට කුලාකයා සමග බේරුමක් ඇති කරගත නොහැකි නමුත් ඔවුන් මධ්‍යම ගොවියා සමග එකඟත්වයක් ඇති කර ගැනීමට උත්සාහ කිරීම සුදුසු ය. ඔවුහු මධ්‍යම ගොවියා සමග එකඟත්වයක් ඇති කරගැනීමට උත්සාහ කරති. කම්කරු ආණ්ඩුව, බොල්ෂෙවික් ආණ්ඩුව, මෙය වචනයෙන් නොව ක්‍රියාවෙන් ඔප්පුකර ඇත.

"ඉඩම් සමාජ සන්තක කිරීමේ" නීතිය සම්මත කිරීමෙන් හා එය දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමෙන් අපි ඒබව ඔප්පු කෙළෙමු. එම නීතිය බොහෝ තැන්වලදී මධ්‍යම ගොවියාගේ උවමනාවන්ට සහ අදහස්වලට ඉඩදී ඇත.

(පසුගිය ද) මිළ තුන්ගුණ කිරීමෙන් අපි ඒ බව ඔප්පු කෙළෙමු[76]. අප එසේ කළේ, වර්තමාන නිෂ්පාදිත භාණ්ඩවල මිළ අනුව බලන කල මධ්‍යම ගොවියන්ගේ ආදායමෙහි අනුපාතය අඩු බව හා එය වැඩි කළ යුතු බව අපට සම්පූර්ණයෙන්ම වැටහෙන හෙයිනි.

පංති විඥනය ඇති සෑම කම්කරුවෙක්ම මධ්‍යම ගොවියාට මෙය තේරුම් කර දෙනු ඇත; එසේම සාර්ලාගේ, ඉඩම් හිමියන්ගේ සහ ධනප-තියන්ගේ ආණ්ඩුවට වඩා බොහෝ සෙයින් සමාජවාදය මධ්‍යම ගොවියාට යහසාධක වනු ඇතැයි යන්නද ඔහු ඉවසිලිමත් ලෙස, නිරන්තර ලෙස සහ නැවත නැවතත් එම ගොවියාට පෙන්නුම් කර දෙනු ඇත.

කම්කරුවන්ගේ ආණ්ඩුව මධ්‍යම ගොවියාට කිසි කලෙකත් හානියක් කර නැත; කිසි කලෙකත් හානියක් කරන්නේද නැත. නමුත් සාර්වරුන්-ගේ, ඉඩම් හිමියන්ගේ, ධනපතියන්ගේ සහ කුලාකයන්ගේ ආණ්ඩුව මධ්‍යම ගොවියාට නිතර හානි කළේය. එපමණක් නොව, එම ආණ්ඩුව ඔහුගේ ගෙල හිර කොට තැබුවේය, කොල්ල කෑවේය, සම්පූර්ණයෙන්ම විනාශ කළේය. මෙය කිසිම විශේෂයක් නොමැතිව, රුසියාවද ඇතුළුව, සියළුම රටවල් සම්බන්ධයෙන් සත්‍ය වේ.

පංති විඥනය ඇති කම්කරුවාගේ වැඩ පිළිවෙළ වන්නේ, දුප්පත් ගොවිජනතාව සමග සමීප තම සන්ධානය සහ සම්පූර්ණ සමගිය ය; මධ්‍යම ගොවි ජනයාට සහන දීම සහ ඔවුන් සමග එකඟත්වයක් ඇති කර ගැනීමය;

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කුලාකයන්, ඒ ලේ මාපිලුන්, ලේ බොන පිශාචයින්, ජනතාව කොල්ල කන්නන් සහ සාගතය උපයෝගී කර ගනිමින් තර වන්නවුන් නිර්දය ලෙස මර්දනය කිරීමය. කම්කරු පංතියේ ප්‍රතිපත්තිය එයයි.

1918 අගෝස්තු 6 දිනෙන් පසුව එම අගෝස්තු මස මුල් භාගයේදී ලියන ලදී

ප්‍රථමයෙන් ම 1925 ජනවාරි 17 දින "රබෝචයා මස්ක්වා", අංක 14 හි පළ කරන ලදී

වි. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 37, පිටු 38–42

ඇමෙරිකානු කම්කරුවන්ට ලිපිය

සහෝදරවරුනි! 1905 විප්ලවයට සහභාගි වූ සහ ඔබගේ රටෙහි අවුරුදු ගණනාවක් වාසය කළ බොල්ෂෙවික්වරයෙක් මගේ ලිපිය ඔබ අතට පත් කිරීමට ඉදිරිපත් වී සිටී[77]. මා ඔහුගේ යෝජනාව භාර ගත්තේ ඉතා සතුටිනි. එයට හේතුව, ධනපති ලාභ බෙදගැනීම සඳහා ලෝකය මුළුල්ලේම ජාතීන් ඝාතනය කිරීමට ඉදිරිපත් වූ තරුණම, ශක්තිමත්ම හා නවතම අධිරාජ්‍යවාදය වන ඇමෙරිකානු අධිරාජ්‍යවාදයේ බුරුලක් නොදෙන සතුරන් වන ඇමෙරිකානු කම්කරු පංතියට හරියටම මෙම අවස්ථාවේ ඉතාමත් වැදගත් කාර්ය භාරයක් පැවැරී තිබීමය. ප්‍රථම සමාජවාදී සමූහාණ්ඩුවේ බොටුව බිඳ දැමීම සඳහා මෘග ඉංග්‍රීසි ප්‍රංශ අධිරාජ්‍යවාදය ආරම්භ කර තිබෙන ආයුධ සන්නද්ධ ප්‍රහාරයට, මෙම නව වහල් හිමියන් වන ඇමෙරිකානු කෝටිපතියන්ගේ අනුමැතිය — එය ඍජු හෝ වක්‍ර වුවත්, විවෘත හෝ වංචනික ආවෘත ස්වභාවයෙන් යුක්ත වුවත්, එහි වෙනසක් නැත — හරියටම මෙම අවස්ථාවේදී පුද කිරීමෙන් ඔවුන් ලේ තැවරුනු අධිරාජ්‍යවාදයේ ලේ තැවරුනු ඉතිහාසයේ විශේෂයෙන්ම සංවේගදායක පිටුවක් පෙරළා ඇත.

නවීන ශිෂ්ටාචාර ඇමෙරිකාවේ ඉතිහාසය ආරම්භ වූයේ ඒ ශ්‍රෙෂ්ඨ, සැබැවින්ම විමුක්තිකාමී, සැබැවින්ම විප්ලවවාදී යුද්ධ අතුරෙන් එකකිනි. වර්තමාන අධිරාජ්‍යවාදී යුද්ධය වැනි, උදුරාගත් දේශභූමි හෝ අසාධාරණ ලෙස අත්පත් කරගත් වාසි හෝ බෙදු ගැනීමේදී රජවරුන්, ඉඩම් හිමියන් හෝ ධනපතියන් අතර ඇතිවූ ආරාවුල් නිසා කරන ලද රටවල් යටත් කිරීමේ යුද්ධ අති විශාල සංඛ්‍යාව සමග සසඳා බලන කල, එවැනි යුද්ධ ඉතා විරලය. ඒ යුද්ධය වූ කලී ඇමෙරිකාව පීඩාවට පත් කළ හා ඇය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යටත් විජිත බන්ධනයේ වූ බ්‍රිතාන්‍ය පල් හොරුන්ට විරුද්ධව ඇමෙරිකානු ජනතාව කළ යුද්ධයක් විය. මේ "ශිෂ්ටාචාර" ලේ මාපිල්ලු එද ඇමෙරිකාවට කළ සේම, අද තවමත් ඉන්දියාවේ, ඊජිප්තුවේ සහ ලෝකයේ සියළු පෙදෙස්වලම කෝටි ගණන් ජනතාව පීඩනයට පත්කරමින් ඔවුන් යටත් විජිත වහල් භාවයේ තබාගෙන සිටිති.

එද මෙද තුර අවුරුදු 150 ක් පමණ ගෙවී ගොස් ඇත. ධනපති ශිෂ්ටාචාරයේ සියළුම අනර්ඝ ප්‍රතිඵල ලැබී තිබේ. සාමූහික මිනිස් පරිශ්‍රමයට අදළ වන නිෂ්පාදනීය බලවේගයන්ගේ සංවර්ධන මට්ටම අතින්ද, යන්ත්‍ර සහ නවීන ඉන්ජිනේරු විද්‍යාවේ විශ්මයන් සියල්ල උපයෝගි කර ගැනීම අතින්ද, ඇමෙරිකාව නිදහස් හා උගත් ජාතීන් අතර මුල් තැන ගෙන ඇත. ඒ අතරම නරකාදියෙහි හා සැප සම්පතෙහි පෙරළි පෙරළී සිටින උද්ධච්ච කෝටිපතියන් අතලොස්සද, නිරතුරුවම හිඟමනට ආසන්න දිවිපෙවෙතක් ගෙවන දශ ලක්ෂ සංඛ්‍යාත වැඩ කරන ජනතාවද අතර පාතාලයක් බඳු පරතරය අතින්ද ඇමෙරිකාව ප්‍රමුඛ රටක් බවට පත්වී තිබේ. වැඩවසම් වහල් ක්‍රමයට විරුද්ධව විප්ලවවාදී යුද්ධයක් කිරීමෙන් ලෝකයාට ආදර්ශයක් දුන් ඇමෙරිකානු ජනතාව, දැන් මෙම නැවුම් ධනපති වේතන වහල් ක්‍රමය යටතේ පත්ව සිටින්නේ ධනවත් නරාධමයන්ගේ යහපත පිණිස පිලිපීන ජනතාව "නිදහස් කරගැනීමේ" මුවාවෙන් 1898 දී ඔවුන්ගේ බෙල්ල හිර කළ[78] සහ දැන් 1918 දී රුසියානු සමාජවාදී සමූහාණ්ඩුව ජර්මානුන්ගෙන් "ආරක්ෂා කිරීමේ" මුවාවෙන් එහි බෙල්ල කරකවන කුලියට ගන්නා ලද දමරිකයන්ගේ තත්වයට ය.

කෙසේ හෝ වේවා අධිරාජ්‍යවාදය විසින් ජාතීන් ඝාතනය කරනු ලැබීම සිදුවූ සතර වසර ගෙවී ගියේ සම්පූර්ණයෙන්ම ප්‍රතිඵල විරහිතව නොවේ. බ්‍රිතාන්‍ය සහ ජර්මන් යන පල්හොරු කණ්ඩායම් දෙකම ජනතාව රවටන බව අවිවාදී සහ ප්‍රකට කරුණු අනුව සම්පූර්ණයෙන්ම හෙළිදරව් වී තිබේ. කොල්ලකා ගත් වස්තුව බෙද ගැනීමට සොරුන් කරන යුද්ධය කෙරෙහි ධනපති ක්‍රමයේ පොදු නීතිය ක්‍රියාත්මක වන ආකාරය හතර අවුරුද්දක යුද්ධයේ ප්‍රතිඵලවලින් හෙළිදරව් වී තිබේ. ධනවත්ම හා ශක්තිමත්ම එවුන් වැඩියෙන්ම වාසි ගත්හ, වැඩියෙන්ම ඩැහැගත්හ. ඒ අතර දුර්වලයන් කොල්ලකෑම, ඔවුන්ට හිරිහැර කිරීම, ඔවුන් පාගා දැමීම සහ ඔවුන්ගේ බෙල්ල මිරිකීම අන්තය දක්වාම කෙරිණි.

"යටත් විජිත වහළුන්" සංඛ්‍යාව අනුව බලන කල වඩාත්ම ශක්තිමත් වූයේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පල් සොරුන් ය. බ්‍රිතාන්‍ය ධනපතියන්ට "ඔවුන්ගේ" දේශ භූමි වලින් (එනම්, ශතවර්ෂාධික කාලයක් තිස්සේ ඔවුන් ඩැහැගත් දේශ භූමි වලින්) එක අඟලක් වත් ඔවුන්ට අහිමි වී නැති

නමුත්, ඔවුහු අප්‍රිකාවේ ජර්මන් යටත් විජිත සියල්ලම අල්ලා ගත්හ. ඔවුහු මෙසපොතේමියාව සහ පලස්තීනය අල්ලා ගත්හ. ග්‍රීසියේ බෙල්ල මිරිකා ගත් ඔවුන් රුසියාව කොල්ලකෑම ආරම්භ කර තිබේ.

ජර්මන් අධිරාජ්‍යවාදී පල් හොරුන් "ඔවුන්ගේ" යුද්ධ හමුදවල සංවිධානය හා විනය අතින් වඩාත්ම ශක්තිමත් නමුත් යටත් විජිත අතින් දුර්වලය. ඔවුන්ට ඔවුන්ගේ යටත් විජිත සියල්ලම අහිමිව ගොස් ඇත. නමුත් ඔවුහු යුරෝපයෙන් අඩක්ම කොල්ල කෑහ. එසේම කුඩා රටවල් වැඩි ගණනක් විනාශයට පත් කළේ ඔවුන්ය. දෙපැත්තෙන්ම කෙරුනු මහා "විමුක්ති" යුද්ධයේ හැටි එසේය! ඉංග්‍රිසි-ප්‍රංශ සහ ජර්මන් ධනපතියන් යන පල්හොරු කණ්ඩායම් දෙකම, ඔවුන්ගේ අන්තේවාසිකයන් වන සමාජ-ජාත්‍යාන්මාදවාදීන් සමග, එනම්, "තමන්ගේ" ධනපති පංතියේ පැත්ත ගත් සමාජවාදීන්ද සමග "තමන්ගේ රට ආරක්ෂා කළ" හැටි අගනේය!

ඇමෙරිකානු කෝටිපතියෝ සමහර විට අන් සියල්ලන්ටම වඩා ධනවත් සහ භූමි ශාස්ත්‍රීය වශයෙන් ඉතාමත් සුරක්ෂිත තත්වයක සිටින අය වූහ. අන් සියල්ලන්ටම වඩා වාසි අත්කරගෙන ඇත්තේ ඔවුන්ය. ඔවුහු සියළුම රටවල්, ඉතාමත්ම ධනවත් රටවල් පවා තමන්ගේ ශාඛා බවට හරවා ගෙන සිටිති. ඔවුහු ඩොලර් ප්‍රකෝටි ගණනින් ධනය රැස්කර ගත්හ. ඒ හැම ඩොලරයකම කැත කුණු තැවරී ඇත. බ්‍රිතාන්‍ය සහ ඇගේ මිතුරන් අතරත්, ජර්මනිය සහ ඇගේ ප්‍රවේණි දේශයන් අතරත් ඇති කරගත් ගිවිසුම්වල ද, කොල්ලයෙන් ගත් වස්තුව බෙද ගැනීමෙ ගිවිසුම්වලද, කම්කරුවන් පීඩනයට පත් කිරීම සහ ජාත්‍යන්තර සමාජවාදීන් නැසීම සඳහා ඇති කර ගත් අන්‍යොන්‍ය "ආධාර" ගිවිසුම්වලද, කැත කුණු එම ඩොලර්වල තැවරී තිබේ. සෑම රටකම පොහොසතුන් තවත් පොහොසත් කළ, දුප්පතුන් තවත් දුප්පත් කළ "ලාභදයක" යුද්ධ කොන්ත්‍රාත්වල කැත කුණෙන් සෑම ඩොලරයක් කිලුටු වී තිබේ. ඒ සෑම ඩොලරයකම ලේ තැවරී ඇත. කොල්ල කෑ වස්තුවෙන් වැඩි කොටස අයත් විය යුත්තේ බ්‍රිතාන්‍ය සොරුන්ටද, නැතහොත්, ජර්මන් සොරුන්ටද යන්න තීරණය කිරීමටත්, ලෝකය මුළුල්ලේම දුර්වල ජාතීන්ගේ බෙල්ල ඇඹරවීමේදී ප්‍රමුඛත්වය දැරිය යුත්තේ බ්‍රිතාන්‍ය ගහලයන්ද, නැතහොත්, ජර්මන් ගහලයන්ද යන්න තීරණය කිරීමටත් කරන ලද ඒ ශ්‍රෙෂ්ඨ, උත්තම, විමුක්තිකාමී සහ ශුද්ධ යුද්ධයේදී මරණ ලද කෝටියක සහ අබ්බාගාත කරන ලද දෙකෝටියක ජනතාවගෙන් ගලා ගිය ලේ සාගරයෙන් එම ඩොලර් තෙත් වී ඇත.

ජර්මන් සොරු යුද්ධයේදී වධ හිංසා කිරීම පිළිබඳ සියළු වාර්තා බිඳ දැමූහ. බ්‍රිතාන්‍යයෝ යටත් විජිත අල්ලා ගැනීම අතින් පමණක් නොව

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පිළිකුල දනවන ඔවුන්ගේ වංචනිකත්වයේ සූක්ෂමකම අතින්ද සියළු වාර්තා බිඳ හෙළූහ. අද මේ දිනයේදී පවා බ්‍රිතාන්‍ය-ප්‍රංශ සහ අමෙරිකානු ධනපති පුවත්පත් බෙදහරින කෝටි සංඛ්‍යාත ඒවායේ පිටපත් මගින් රුසියාව ගැන බොරු හා අපවාද පතුරුවති. රුසියාව ජර්මනුන්ගෙන් ''ආරක්ෂා කිරීම'' ඔවුන්ට අවශ්‍ය යයි කියමින් ඔවුන් ගෙනයන කොල්ලකාරී ආක්‍රමණය එම පුවත්පත් විසින් සාධාරණ කර පෙන්වනු ලැබේ!

මෙම කැත සහ භයානක බොරුව හෙළි කිරීමට වචන රැසක් අවශ්‍ය නොවේ. එක සුප්‍රසිද්ධ කරුණක් පමණක් පෙන්වාදීම ඒ සඳහා ප්‍රමාණවත් වේ. 1917 ඔක්තෝබරයේදී, රුසියානු කම්කරුවන් ඔවුන්ගේ අධිරාජ්‍යවාදී ආණ්ඩුව පෙරළා දැමීමෙන් අනතුරුව, සෝවියට් ආණ්ඩුව, එනම්, විප්ලව-වාදී කම්කරුවන්ගේ සහ ගොවිජනතාවගේ ආණ්ඩුව සාධාරණ සාමයක්, රටවල් අල්ලාගැනීමෙන් හා වන්දි අය කිරීමෙන් තොර සාමයක්, සියළුම ජාතීන්ට සමාන අයිතිවාසිකම් සහතික කරන සාමයක්, ඇති කරන ලෙස යෝජනා කළේය. තවද, එය එවැනි සාමයක් සඳහා යෝජනා යුද්ධකාරී රටවල් සියල්ලම වෙත ඉදිරිපත් කළේය.

අපගේ යෝජනාව පිළිගැනීම ප්‍රතික්ෂේප කළේ බ්‍රිතාන්‍ය-ප්‍රංශ සහ ඇමෙරිකානු ධනපතියන් ය. පොදු සාමයක් ගැන අප සමග කතා කිරීම පවා ප්‍රතික්ෂේප කළේ ඔවුන්ය! සියළුම ජාතීන්ගේ අවශ්‍යතාවයන්ට ද්‍රෝහී වූයේ ඔවුන්ය. අධිරාජ්‍යවාදී මිනිස් ඝාතනය දිග්ගැස්සුවේ ඔවුන්ය.

රුසියාව නැවත යුද්ධයට ඇද ගැනීමේ බලාපොරොත්තුව කෙරෙහි විශ්වාසය තබමින් සාම සාකච්ඡාවලට සහභාගි වීමට ප්‍රතික්ෂේප කිරීමෙන්, රටෙන් කොටසක් අල්ලා ගැනීමේ කොන්දේසි සහිත සහ බලහත්කාරී වූ බ්‍රෙස්ට් සාමය රුසියාව මත පැටවීමේ නිදහස, ඔවුන්ට වඩා කොල්ලකාරිත්වයෙන් නො අඩු, ජර්මන් ධනපතියන්ට දුන්නේ ද ඔවුන්ම ය!

බ්‍රිතාන්‍ය-ප්‍රංශ සහ ඇමෙරිකානු ධනපතියෝ බ්‍රෙස්ට් සාමය නිසා දැන් අපට ''දෝෂාරෝපනය'' කරති. ඔවුන්ගේ එම වංචාවට වඩා පිළිකුල් සහගත තවත් දෙයක් ගැන සිතීමත් අපහසු ය. බ්‍රෙස්ට් සාකච්ඡාවන්, පොදු සාම සාකච්ඡාවන් බවට හැරවීමේ හැකියාව ඇතිව තිබුණු රටවල ඒ ධනපති-යෝම දැන් අපගේ ''චෝදකයෝ'' වෙති! යටත් විජිත කොල්ලකෑමෙන් සහ ජාතීන් ඝාතනය කිරීමෙන් වාසි සලසා ගත්තේද, බ්‍රෙස්ට් ගිවිසුමෙන් පසුව මුළු වර්ෂයක්ම පමණ යුද්ධය දිග්ගැස්සුවේද ඉංග්‍රීසි-ප්‍රංශ අධිරාජ්‍යවාදී ගිජුලිහිණියන්ම වන නමුත්, ඔවුහු අපට ''චෝදනා'' නගති. සාධාරණ සාමයක් සඳහා යෝජනා සියළුම රටවලට ඉදිරිපත් කළාවූද, සාර් සහ බ්‍රිතාන්‍ය-ප්‍රංශ ධනපතියන් අතර ඇති කරගෙන තිබුණු රහස්, සාපරාධී

ගිවිසුම් ඉරාදමා, ප්‍රසිද්ධ කර, මහජන නින්දවට ලක් කළාවූද, බොල්ෂෙ-වික් වරුන්ට චෝදනා කරති.

අධිරාජ්‍යවාදී බන්ධන, නැතහොත්, අති නීච අධිරාජ්‍යවාදී ගිවිසුම්, අධිරාජ්‍යවාදී යදම් පිළිබඳ වළල්ල බිඳ දැමීම ගැනත්, කඩා බඳ ගෙන නිදහස කරා යාම සහ ඒ සඳහා මහා පරිත්‍යාගයන් කිරීම ගැනත්, අධිරාජ්‍ය-වාදීන් විසින් කැබලි කරනු සහ කොල්ල කනු ලබද්දී වුව, සමාජවාදී රටක් ලෙසට අධිරාජ්‍යවාදී යුද්ධයෙන් ඉවත්ව සිටිමින් මුළු ලෝකයටම පෙනෙන ලෙසට සාමයේ ධජය, සමාජවාදයේ ධජය එසවීම ගැනත්, මුළු ලෝකයේම කම්කරුවෝ, ඔවුන් සිටින රට කුමක් වුවත් ඒ ගැන නොතකා, අපට ශුභ ප්‍රාර්ථනා කරති, අපට හිතවත් කම් දක්වති, අපට ප්‍රසාදය පළ කරති.

මේ නිසා ජාත්‍යන්තර අධිරාජ්‍යවාදී කල්ලිය අපට වෛර කිරීම, අපට ''චෝදනා'' කිරීම පුදුමයට කරුණක් නොවේ. අපගේ දක්ෂිණ සමාජවාදී-විප්ලවවාදීන් සහ මෙන්ෂෙවික්වරුන් ඇතුළු අධිරාජ්‍යවාදීන්ගේ සියළු අන්තේවාසිකයන් ද අපට ''චෝදනා කිරීම'' පුදුමයක් නොවේ. බොල්-ෂෙවික්වරුන් කෙරෙහි අධිරාජ්‍යවාදයේ මෙම මුරබල්ලන් දක්වන වෛරය සහ ලෝකයේ පංති විඥානය ඇති කම්කරුවන් දක්වන හිතවත් කම, අපගේ සත්ව්‍යාපාරය සාධාරණ බව අන් සියල්ලටම වඩා හොඳින් අපට ඒත්තු ගන්වයි.

ධනපති පංතිය පරදවා ජයග්‍රහණය ලැබීම සඳහා, බලය කම්කරුවන් අතට පත්වනු දැකීම සඳහා, ලෝක නිර්ධන පංති විප්ලවය ආරම්භ කරනු සඳහා, රටෙන් කොටසක් කැප කිරීම හා අධිරාජ්‍යවාදය හමුවේ අත්වන බරපතල පරාජය වීම් විඳගැනීමේ කැප කිරීම ඇතුළු වූ, විශාලම පරිත්‍යා-ගයන් කිරීම ගැන පැකිලීමක් දැක්වීමට අපට නොහැකි බව, අප නො-පැකිල එම පරිත්‍යාගයන් කළ යුතු බව, වටහා ගැනීමට අසමත්වන තැනැ-ත්තා සමාජවාදියෙක් නොවේ. සමාජවාදී සත්ව්‍යාපාරයේ ඉදිරි ගමන සඳහා නියම තල්ලුවක් දීම පිණිස ''තමන්ගේ'' රට විශාලතම පරිත්‍යාගයන් කිරීමට කැමති වන බව ක්‍රියාවෙන් ඔප්පු නොකරන තැනැත්තා සමාජවාදි-යෙක් නොවේ.

''ඔවුන්ගේ'' ව්‍යාපාරය උදෙසා, එනම් ලෝකාධිපත්‍යය දිනාගැනීම සඳහා බෙල්ජියමේ සහ සර්බියාවේ සිට පලස්තීනය සහ මෙසපොතේමි-යාව දක්වා රටවල් සමූහයක්ම විනාශ කර ඒවායේ බොටුව බිඳ දැමීමට බ්‍රිතාන්‍ය සහ ජර්මන් අධිරාජ්‍යවාදීන් කිසිම පැකිලීමක් දැක්වූයේ නැත. නමුත්, සමාජවාදීන් ''ඔවුන්ගේ'' ව්‍යාපාරය උදෙසා, මුළු ලෝකයේම වැඩ කරන ජනතාව ප්‍රාග්ධනයෙන් නිදහස් කර ගැනීමේ ද, විශ්වීය හා

https://liberationbase.wordpress.com

කල් පවත්නා සාමය දිනා ගැනීමේද, සත්ව්‍යාපාරය උදෙසා කැප කිරීම් රහිත මාවතක් හමුවන තෙක් සිටිය යුතුද? ඔවුන් "ඔවුන්ගේ" ධනපති පංතිය විසින් නිර්මිත "පීතෘ භූමියේ" ඒකස්ථභාවය හා සුරක්ෂිතතාවය ලෝක සමාජවාදී විප්ලවයේ අවශ්‍යතාවයන්ට වඩා ඉහළින් තැබිය යුතු ද? ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ සිටිමින් එසේ යයි සිතන නරාධමයන්, නැතහොත්, ධනපති සඳවාරයට දන නමස්කාර කරන නිවටයන් තුන් යලක්ම හෙළා දකින ලද්දෝ වෙති.

ජර්මන් අධිරාජ්‍යවාදය සමග අප "ගිවිසුමක්" ඇති කර ගත්තේ යයි ඉංග්‍රිසි-ප්‍රංශ සහ ඇමෙරිකානු ගිජුලිහිණියෝ අපට "චෝදනා" කරති. "ඔවුන්ගේම" රටවල කම්කරුවන් අප කෙරෙහි දක්වන හිතවත් කම නිසා බියෙන් ගැහෙමින් කම්කරුවන්ගේ ආණ්ඩුවට අපවාද නගන ඔවුන් මොන තරම් වංචනිකයෝ සහ අධමයෝ වෙත් ද! නමුත් ඔවුන්ගෙ වංචාව හෙළිදරව් කෙරෙනු ඇත. "සමාජවාදීන්" විසින් කම්කරුවන්ට විරුද්ධව, වැඩ කරන ජනතාවට විරුද්ධව (ඔවුන්ගේම හෝ විදේශ) ධනපතියන් සමග ඇතිකර ගන්නා ලද ගිවිසුමක් හා ධනපති පංතිය පරාජය කර සිටින කම්කරුවන් විසින් කම්කරුවන් ආරක්ෂා කිරීම සඳහා ධනපති පංතියේ විවිධ කණ්ඩායම් අතර පවතින ප්‍රතිවිරෝධතාවයන් නිර්ධන පංතියේ වාසියට යොදා ගනුවස්, එක වර්ණයක ධනපතියන් සමග තවත් වර්ණයක ධනපතියන්ට විරුද්ධව ඇති කර ගන්නා ලද ගිවිසුමක් අතර වෙනස තමන්ට නොපෙනෙන සැටියක් ඔවුහු පෙන්වති.

ඇත්ත වශයෙන්ම සෑම යුරෝපීයයෙකුටම මෙම වෙනස ඉතා හොඳින් පෙනෙයි. ඇමෙරිකානු ජනතාවට ඔවුන්ගේ ඉතිහාසයෙන්ම ඒ පිළිබඳව ඉතාමත් සිත් කාවදින "නිදර්ශනයක්" දක්නට ලැබුණු බව තව මොහොතකින් මම පෙන්වා දෙන්නෙමි. නොයෙක් නොයෙක් ගිවිසුම් ඇත. fagots et fagots* ඇතැයි ප්‍රංශුවන් කියන මෙනි.

1918 දී නිරායුධව හා නැගී ගත නොහැකිව, ලෝක සමාජවාදී විප්ලවය සම්පූර්ණයෙන් මෝරන තෙක් ජාත්‍යන්තර නිර්ධන පංතියේ සහයෝගය කෙරෙහි විශ්වාසය තබා සිටි රුසියාවට විරුද්ධව ජර්මන් ගිජුලිහිණියන් ඔවුන්ගේ සේනා උසිගැන්නූ කල, මම මොහොතක් හෝ නොපැකිල ප්‍රංශ රාජාණ්ඩුවාදීන් සම ගිවිසුමකට එළඹීමට කටයුතු කෙළෙමි. වච නයෙන් බොල්ෂෙවික්වරුන්ට හිතවත් කම් පෑ, එහෙත් ක්‍රියාවන් අනුව ප්‍රංශ අධිරාජ්‍යවාදයට සූවච සහ කීකරු ලෙස සේවය කළ ප්‍රංශ යුද්ධ නිලධාරියෙක් වූ කපිතන් සදූල් මා හමුවීමට දෙලුබෙර්සක් නැමති ප්‍රංශ නිලධාරියා කැඳවා ගෙන ආවේය. "මම රාජාණ්ඩුවාදියෙක් වෙමි. මගේ එකම අරමුණ ජර්මානුන් පරාජයට පත් කිරීම ය" යි දෙලුබෙර්සක් මට ප්‍රකාශ කළේය. "එය නොකීවත් වැටහෙන දෙයකි (cela va sans dıre) මම කීවෙමි. නමුත් ජර්මන් ආක්‍රමණයට බාධා පැමිණවීම පිණිස දුම්රිය මාර්ග පුපුරවා දැමීමෙන් අපට සේවයක් කිරීමට සූදනම්ව සිටි පුපුරන ද්‍රව්‍ය පිළිබඳ විශේෂඥයන් වූ ප්‍රංශ හමුද නිලධාරීන්ගේ සේවාවන් ගැන දෙලුබෙර්සක් සමග "ගිවිසුමකට" එළඹීමට මට එයින් කිසිම බාධාවක් සිදු නොවීය. මෙය පංති විඥනය ඇති සෑම කම්කරුවෙක්ම අනුමත කරනු ඇති සමාජවාදයේ යහපත පිණිස ඇති කරගන්නා ලද ගිවිසුමක් පිළිබඳ ආදර්ශයකි. ප්‍රංශ රාජාණ්ඩුවාදීනුත් මාත් අතට අත දුන්නෙමු. නමුත් අප එසේ කළේ ඔවුන් මෙන්ම අපද තමන්ගේ "හවුල්කරුවා" කැමැත්තෙන්ම තමන් එල්ලා දමනු ඇති බව දැන දැනම ය. නමුත් එක්තරා කලකට අපගේ අවශ්‍යතාවයන් සම්පාත විය. ඉදිරියට එමින් සිටි ම්ලේච්ඡ ජර්මානුන්ට විරුද්ධව හා රුසියානු සහ ලෝක සමාජවාදී විප්ලවයේ යහපත පිණිස අපි එවැනිම වෛරව ස්වභාවයක් ඇති වෙනත් අධිරාජ්‍යවාදීන්ගේ ප්‍රතිවිරුද්ධ උවමනාවන් උපයෝගි කර ගත්තෙමු. මෙසේ කිරීමෙන් අපි රුසියාවේ සහ වෙනත් රටවල කම්කරු පංතියේ අවශ්‍යතාවයන් ඉටු කෙළෙමු. අපි මුළු ලෝකයේම නිර්ධන පංතිය ශක්තිමත් කර, ධනපති පංතිය දුර්වල කෙළෙමු. සෑම යුද්ධයකදීම ඉතාමත් සාධාරණ වන සහ අත්‍යවශ්‍ය වන විධි ක්‍රම, එනම්, උපායෙන් සටන මග හැරීම, ප්‍රයෝගය හා පසු බැසීම මෙහි දී යොද ගත්තෙමු. අප එසේ කළේ දියුණු රටවල් ගණනකම සීඝ්‍රයෙන් මෝරා එන විප්ලවය සම්පූර්ණයෙන් මේරූ අවස්ථා එළඹෙන තෙක් ඒ ගැන අපේක්ෂාවෙනි.

ඉංග්‍රිසි-ප්‍රංශ සහ ඇමෙරිකානු අධිරාජ්‍යවාදී මෝරුන් කොතරම් කෝපයකින් පුපුර පුපුරා සිටියත්, ඔවුන් අපට මොන තරම් අවලාද නැගුවත්, දක්ෂිණ සමාජවාදී-විප්ලවවාදී, මෙන්ෂෙවික් සහ වෙනත් සමාජ-දේශප්‍රෙමී ප්‍රවෘත්ති පත්‍රවලට දශලක්ෂ ගණනින් අල්ලස් දීමට ඔවුන් වැය කරන මුදල කොතරම් වුවත්, ඉංග්‍රිසි ප්‍රංශ හමුද රුසියාව වෙත එල්ලකරන ප්‍රහාරයක් නිසා ජර්මන් අධිරාජ්‍යවාදී ගිජුලිහිණියන් සමග එවැනිම "ගිවිසුමක්" ඇති කර ගැනීම අවශ්‍ය වුවහොත් එසේ කිරීමට මම තත්පරයක් හෝ නොපැකිලෙන්නෙමි. මගේ උපක්‍රමවලට, රුසියාවේ, ජර්මනියේ, ප්‍රංශයේ, බ්‍රිතාන්‍යයේ, කොටින් කියතොත්, සමස්ත ශිෂ්ටාචාර ලෝකයේම පංති විඥනය ඇති කම් කරුවන්ගේ අනුමැතිය ලැබෙනු ඇති බව මම ඒකාන්ත වශයෙන් දන්නෙමි. එවැනි උපක්‍රම අනුගමනය කිරීමෙන් සමාජවාදී විප්ලවයේ කර්තව්‍යයන් පහසු කෙරෙනු ඇත. එම විප්ලවය ඉක්මන් කෙරෙනු ඇත. ජාත්‍යන්තර ධනපති පංතිය

* දේවල් දේවල්ම ය. — සංස්කාරක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දුර්වල කෙරෙනු ඇත. ධනපති පංතිය පරාජය කරමින් සිටින කම්කරු පංතියේ තත්වය ශක්තිමත් කෙරෙනු ඇත.

ඇමෙරිකානු ජනතාව, ඔවුන්ගේ විප්ලවයේ වාසිය තකා දීර්ඝ කලකට පෙර මෙම උපක්‍රම අනුගමනය කළහ. ඔවුන් බ්‍රිතාන්‍ය පීඩකයන්ට විරුද්ධව ඔවුන්ගේ විමුක්ති යුද්ධය කරන අවස්ථාවේදී, උතුරු ඇමෙරිකා එක්සත් ජනපදය ලෙසට දැන් හැඳින්වෙන ප්‍රදේශයෙන් කොටසක් හිමිකර ගෙන සිටි ප්‍රංශ සහ ස්පාඤ්ඤ පීඩකයෝද ඔවුන්ට විරුද්ධව සිටියහ. ඇමෙරිකානු ජනතාව කළ ඒ මහා ආයාසමත් අරගලයේදී පීඩකයන් දුර්වල කිරීම සහ පීඩනයට විරුද්ධව විප්ලවවාදී ආකාරයෙන් සටන් කරන වුන් ශක්තිමත් කිරීම සඳහා ඔවුහු සමහර පීඩකයන්ට විරුද්ධව අනිත් පීඩකයන් සමග "ගිවිසුම්වලට" එළඹුනහ. එසේ කරන ලද්දේ පීඩිත ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කරනු පිණිස ය. ඇමෙරිකානු ජනතාව, ප්‍රංශුවන්, ස්පාඤ්ඤයන් සහ බ්‍රිතානීන් අතර පැවති ගැටුම් තමන්ගේ වාසියට හරවා ගත්හ. සමහර විට ඔවුහු ප්‍රංශ සහ ස්පාඤ්ඤ පීඩකයන්ගේ සේනා සමග උරෙනුර ගැටී සිටිමින් පවා බ්‍රිතාන්‍ය පීඩකයන්ට විරුද්ධව සටන් කළහ. ප්‍රථමයෙන් බ්‍රිතානීන් පරාජය කර දැමූ ඔවුහු, ඊළඟට ප්‍රංශුවන්ගෙන් සහ ස්පාඤ්ඤයන්ගෙන් (අඩ වශයෙන් වන්දි ගෙවීමේ මාර්ගයෙන්) නිදහස් වූනහ.

ඓතිහාසික සටන යනු නෙව්ස්කි මාවතේ පදික වේදිකාව නොවේ යයි ඒ ශ්‍රේෂ්ඨ රුසියානු විප්ලවවාදියා වන චෙර්නිෂෙව්ස්කි වරක් කීයේය[79]. විප්ලවය පහසුවෙන් සහ වල ගොඩැලි නොමැතිව සිදුවෙතැයිද, ආරම්භයේ පටන්ම විවිධ රටවල නිර්ධන පංතිකයන්ගේ ඒකාබද්ධ ක්‍රියාකාරිත්වය ඇතැයිද, පරාජයවීම් නොවන බවට සහතිකයන් ඇතැයිද, විප්ලවයේ මාවත පුළුල්, නිදහස් හා සෘජුයයි ද, ජයග්‍රහණය කරා යන ගමනේදී ඉතාමත් බරපතල අලාභ හානි විඳීමට "වට කරන ලද බල කොටුවකට" වී නිසි කල් එන තෙක් සිටීමට සිදු නොවේ යයිද, නැතහොත්, ඉතාමත් පටු, දුර්ගම, වටවංගු සහිත සහ අන්තරාදායක දුර්ග මාර්ග ඔස්සේ මග සොයා යාමට අයෙකුට සිදු නොවෙතැයිද, යන "කොන්දේසිය මත" පමණක් කෙරෙන නිර්ධන පංති විප්ලවයකට විප්ලවවාදියෙක් එකඟ නොවනු ඇත. එවැනි විප්ලවයක් බලාපොරොත්තුවන අයෙක් විප්ලවවාදියෙක් නොවේ. ඔහු ධනපති බුද්ධිමතුන්ගේ පණ්ඩිතමානයෙන් නිදහස් නොවූවෙකි. එවැනි පුද්ගලයෙක් නිරතුරුවම ප්‍රතිවිප්ලවවාදී ධනපතියන්ගේ කඳවුරට ලිස්සා වැටෙන බව දක්නට ලැබෙනු ඇත. අපගේ දක්ෂිණ සමාජවාදී-විප්ලවවාදීන්ට, මෙන්ෂෙවික්වරුන්ට සහ (ඊට වඩා අඩු ලෙස) වාම සමාජවාදී-විප්ලවවාදීන්ට පවා සිදුවී තිබෙන්නේ එය ය.

ධනපතියන් කියන්නක්ම දෝංකාර නංවන මෙම මහත්වරු විප්ලවයේ "වියවුල" ගැනද, කර්මාන්තය "විනාශ කිරීම" ගැන ද, විරැකියාව සහ ආහාර හිඟය ගැනද අපට දෝෂාරෝපනය කිරීමට සතුටු වෙති. අධිරාජ්‍යවාදී යුද්ධය සතුටින් පිළිගත් හා එයට ආධාර කළ, එසේ නැතහොත් යුද්ධය දිගටම කරගෙන යාම සඳහා කෙරෙන්ස්කි සමග "ගිවිසුමකට" ඇතුළු වූ ඒ අයම, මෙම චෝදනා නැගීම මොන තරම් වංචනිකද! මෙම සියළුම අභාග්‍යයන් ඇති වී තිබෙන්නේ මෙම අධිරාජ්‍යවාදී යුද්ධය නිසාය. දීර්ඝ කාලයක් තිස්සේ, විනාශකාරී ලෙස, ප්‍රතිගාමී ලෙස ජාතීන් ඝාතනය කිරීමෙන් උරුමකොට ලද දරුණු දුෂ්කරතාවයන් හා දුක් වේදනා මග හැරීමේ පුළුවන් කමක් යුද්ධයෙන් උපන් විප්ලවයට නොමැත. කර්මාන්තය "විනාශ කිරීම" ගැන හෝ "ත්‍රස්තය" ගැන හෝ අපට දෝෂාරෝපනය කිරීම, එක්කෝ වංචාවකි; එසේ නැතහොත් අඥාන අති පණ්ඩිත කමකි. දරුණු පංති අරගලයේ උත්සන්නතාවයෙන් උච්ඡතම වන විප්ලවය යනුවෙන් හැඳින්වෙන අවස්ථාව පිළිබඳ මූලික කොන්දේසි වටහා ගැනීටම ඇති නොහැකියාව එවැනි චෝදනා නැගීමෙන් හෙළි දරව් වන්නේය.

මෙවැනි වර්ගයේ "චෝදකයන්" පංති අරගලය පිළිගන්නා විටදී වුවද, ඔවුහු එය වාචක වශයෙන් පමණක් පිළි ගැනීමට සීමාවෙති. ඇත්ත වශයෙන්ම ඔවුහු පංති "එකඟතාවය" සහ "සහයෝගිතාවය" පිළිබඳ අමන මනෝරාජ්‍යයට නැවත නැවතත් ලිස්සා වැටෙති. එසේ කියන්නේ, නිතරම, අනිවාරණීය වශයෙන්ම සහ සෑම රටකම පංති අරගලය විප්ලවවාදී යුග වලදී සිවිල් යුද්ධයේ ආකාරය ගන්නා හෙයින්ද, යුද්ධයේ අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා ඉතාමත් තදබල විනාශය, ත්‍රස්තය හා විධිමත් ප්‍රජාතන්ත්‍රවාදය සීමා කිරීම විරහිත සිවිල් යුද්ධයක් ගැන සිතීම පවා නොහැකි හෙයින් ද වේ. මෙම අවශ්‍යතාවය නොදක්නේ, වටහා නොගන්නේ හා නොහඟින්නේ මොස්තරකාර පාර්ලිමේන්තුවාදීන්ගේ ස්වරූපය ගත්, ක්‍රිස්තියානි හෝ එසේ නැතහොත්, "ලෝකායත්ත" සෙවෙල් ගති ඇති දේශනා කාරයෝ පමණක් වෙති. මිනිස් වර්ගයාගේ ඉතාමත් විශාල ප්‍රශ්න, අරගලයෙන් හා යුද්ධයෙන් විසඳීම ඉතිහාසයේ අවශ්‍යතාවයක් වී තිබිය දී, අතිශය උද්යෝගයෙන් හා අධිෂ්ඨානයෙන් යුතුව සටනට බසිනවා වෙනුවට, මෙකී හේතුව නිසා විප්ලවය මග හැර යාම කළ හැක්කේ, ජීවයෙන් තොර "මප්ලර් කාරයෙකුට" පමණකි.

ඇමෙරිකානු ජනතාවට අයත් වූ විප්ලවවාදී සම්ප්‍රදායක් ඇත. ඇමෙරිකානු නිර්ධන පංතියේ හොඳම නියෝජිතයෝ එය අනුගමනය කරති. ඔවුන් බොල්ෂෙවික්වරුන් කෙරෙහි ඔවුන්ගේ සම්පූර්ණ සහයෝගිතාවය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ප්‍රකාශ කර ඇත. ඔවුන්ගේ එම සම්ප්‍රදය යනු දහ අටවැනි ශත වර්ෂයේ බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව කරන ලද විමුක්ති යුද්ධයත්, දහනව වැනි ශත වර්ෂයේදී කරන ලද සිවිල් යුද්ධයත් වන්නේය. කර්මාන්තයේ සහ ජාතික ආර්ථිකයේ සමහර අංග ''විනාශ කිරීම'' ගැන පමණක් සැලකිල්ලට ගන්නෙමු නම්, 1870 වර්ෂයේ ඇමෙරිකාව, යම් යම් කරුණු අතින්, 1860 වර්ෂයේ ඇමෙරිකාවට වඩා පිටුපසින් සිටියේය. නමුත් මෙම කරුණු හේතුවක් කොට ගනිමින් 1863–1865 ඇමෙරිකානු සිවිල් යුද්ධයේ දැවැන්ත, ලෝක-ඓතිහාසික, ප්‍රගතිශීලී සහ විප්ලවවාදී වැදගත්කම ප්‍රතික්ෂේප කරන ඕනෑම කෙනෙක්, මොන තරම් අති පණ්ඩිතයෙක්, නැතහොත්, මොට්ටයෙක් වන්නේද!

නිග්‍රෝ වහල් ක්‍රමය, එනම්, වහල් හිමියන්ගේ පාලනය පෙරළා දැමීම උදෙසා අවුරුදු ගණනක් දිග්ගැසුණු සිවිල් යුද්ධයක් මගින්, සෑම යුද්ධයක්ම හා සමග ඇතිවන ඉමක් කොනක් නැති විනාශය, අලාභ හානිය හා ත්‍රස්තය මගින්, රට ගමන් කරවීම සුදුසු වූ බව ධනපති පංතියේ නියෝජිතයෝ වටහා ගත්හ. නමුත් දැන් අප හමුවේ තිබෙන්නේ ඊට වඩා බොහෝ සෙයින් විශාල කර්තව්‍යයකි. ධනපති පංතියේ වේතන-වහල් ක්‍රමය පෙරළා දැමීමේ, ධනපති පංතියේ පාලනය පෙරළා දැමීමේ කර්තව්‍යයට අපි මුහුණ පා සිටින්නෙමු. එසේවූ කල, දැන්, ධනපති පංතියේ නියෝජිතයෝ හා ආරක්ෂකයෝ ද, එසේම, ධනපති පංතියට බිය වූ ප්‍රතිසංස්කරණවාදී-සමාජවාදියෝද විප්ලවය මග හරිති; සිවිල් යුද්ධය අවශ්‍ය බව වටහා ගැනීමට දැන් ඔවුහු අසමත් වෙති, අකැමති වෙති.

ඇමෙරිකානු කම්කරුවෝ ධනපති පංතිය පසු පස නොයනු ඇත. සිවිල් යුද්ධය ධනපති පංතියට විරුද්ධව කරන එකක් නිසා ඔවුන් අප සමග සිටිනු ඇත. මෙය මෙසේ යයි කියන මගේ විශ්වාසය මුළු ලෝක ඉතිහාසයෙන්ම සහ ඇමෙරිකානු කම්කරු ව්‍යාපාරයේ මුළු ඉතිහාසයෙන්ම, ශක්තිමත් කෙරෙන්නේය. ඇමෙරිකානු නිර්ධන පංතියේ සද්දරණීය නායකයන්ගෙන් කෙනෙක් වන යුජින් ඩෙබ්ස්ගේ කියමනක් මට මතක් වේ. වර්තමාන සාපරාධී යුද්ධය සඳහා මුදල් වෙන් කිරීමට පක්ෂව තමාගේ ඡන්දය දෙනවාට වඩා වෙඩි කෑම යෙහෙකැයි ඔහු කීවේය. නිර්ධන පංති ස්ථාවරය අනුව තමා දන්නේ එකම ශුද්ධ යුද්ධයක් පමණක් බවත්, එය නම්, මිනිස් වර්ගයා වේතන වහල් ක්‍රමයෙන් මුද ගැනීම සඳහා ධනපති පංතියට විරුද්ධව කරන යුද්ධය බවත් ඔහු කීවේය. ඔහු මෙම ප්‍රකාශය කළේ "What shall I fight for" (''මා සටන් කරන්නේ කුමක් සඳහාද'') යනුවෙන් ''සාධාරණත්වයට ආයාචනය'' ("Appeal to Reason[80]) නැමැති පත්‍රයේ මා හිතන හැටියට 1915අග භාගයේදී ලියූ ලිපියකය. (1916 දී ස්විට්සර්ලන්තයේ, බර්න්හි පැවැත්වුනු ප්‍රසිද්ධ රැස්වීමක දී මම මෙම ලිපිය උපුටා දැක්වූයෙමි).

ඇමෙරිකන් කෝටිපතියන්ගේ නායකයා සහ ධනපති මෝරුන්ගේ සේවකයා වන විල්සන් විසින් ඩෙබ්ස් සිරගත කර තබනු ලැබීම ගැන මම පුදුමයට පත් නොවෙමි. නියම ජාත්‍යන්තරවාදීන්ට, විප්ලවවාදී නිර්ධන පංතියේ නියම නියෝජිතයින්ට ධනපතියන්ගේ ම්ලේච්ඡභාවය පෙන්වූවා වේ! ඔවුන් දරුණු සහ ම්ලේච්ඡ වූ තරමට ජයග්‍රාහී නිර්ධන පංති විප්ලවයේ දිනය තව තවත් ළං වනු ඇත.

අපගේ විප්ලවයෙන් සිදුවී ඇති විනාශය ගැන අපට දෝෂාරෝපනය කරනු ලැබේ... චෝදකයෝ කවුද? ධනපති පංතියේ අනුචරයින්ය. එසේ චෝදනා කරන්නේ යුද්ධයේ සතර වර්ෂය තුළ යුරෝපා සංස්කෘතිය සම්පූර්ණයෙන්ම පාහේ විනාශ කළ සහ යුරෝපය වනචාරී තත්වය, ම්ලෙච්ඡත්වය හා සාගතය දක්වා පහත දැමූ ඒ ධනපතියන්ගේම ආවතේව කාරයන්ය. මෙම නෂ්ටාවශේෂ මත, මෙම අබලන්වූ සංස්කෘතිය මත යුද්ධයේ විනාශය සහ සුන්බුන් මධ්‍යයේ සහ එසේම යුද්ධය නිසා නැසී ගිය මිනිස් ගති සහිත මිනිසුන් සමග, සමාජවාදය ගොඩනැගීම නොකළ යුතු යයි මෙම ධනපතියෝ දැන් අපට බල කරති. මෙම ධනපතියෝ කොතරම් නම් මානුෂික හා යහපත් අය වෙත්ද?

නැවතත් ත්‍රස්තය අරඹා ඇතැයි ඔවුන්ගේ සේවකයෝ අපට දෙස් නගති... බ්‍රිතාන්‍ය ධනපතියන්ට ඔවුන්ගේ 1649 අවුරුද්ද අමතක වී ඇත. ප්‍රංශ ධනපතියන්ට ඔවුන්ගේ 1793 අවුරුද්ද අමතක වී ඇත. ධනපතියන් විසින්, ඔවුන්ගේම යහපත පිණිස, වැඩවසම් ක්‍රමයට විරුද්ධව ත්‍රස්තය ක්‍රියාත්මක කරනු ලබන විට එය යුක්ති සහගත සහ සාධාරණ විය. ධනපති පංතියට විරුද්ධව ත්‍රස්තය යෙදවීමට තරම්, කම්කරුවන් හා දුප්පත් ගොවි ජනතාව එඩිතර වූ කල, එය මහා භයානක සහ සාපරාධී විය! එක සූරාකන අල්පතරයක් වෙනුවට තවත් සූරාකන අල්පතරයක් ආදේශ කිරීම පිණිස ත්‍රස්තය උපයෝගි කරගන්නා විට, එය යුක්ති සහගත සහ සාධාරණ විය. සූරාකන සෑම අල්පතරයක්ම නෙරපා දැමීම පිණිස, ඇත්ත වශයෙන්ම අති විශාල බහුතරයෙහි අවශ්‍යතාවයන් ඉටු කරනු සඳහා, නිර්ධන පංතියේ, අර්ධ නිර්ධන පංතියේ, කම්කරු පංතියේ සහ දුප්පත් ගොවිජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කරනු සඳහා ත්‍රස්තය යෙදීමට පටන් ගන්නා විට, එය මහා භයානක සහ සාපරාධී විය!

ජාත්‍යන්තර අධිරාජ්‍යවාදී ධනපතියෝ, ''ඔවුන්ගේ'' යුද්ධයේදී, ලෝකය පාලනය කරනු ලැබිය යුත්තේ බ්‍රිතාන්‍ය ගිජුලිහිණියන් විසින්ද, නැතහොත්, ජර්මන් ගිජුලිහිණියන් විසින්ද යන්න තීරණ කරනු පිණිස

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

කළ යුද්ධයේදී, මිනිසුන් එක් කෝටියක් මරා දමා සහ දෙකෝටියක් අබ්බාගාතයන් කර ඇත්තාහ.

අපගේ යුද්ධය නිසා, පීඩකයන්ට සහ සූරාකන්නන්ට විරුද්ධව පීඩිත සහ සූරාකනු ලබන ජනයා කරන යුද්ධය නිසා පන්ලක්ෂයක් හෝ දශ ලක්ෂයක් දෙනා නැසෙතොත්, කලින් නැසීම යුක්ති සහගත වන අතර පසුව සිදුවූ නැසීම සාපරාධී බව ධනපතියන් කියනු ඇත.

නිර්ධන පංතියට කියන්නට තිබෙන්නේ ඊට හාත්පසින්ම වෙනස් දෙයකි.

සියළුම විප්ලව විසින් උගන්වන ලද, එසේම, කම්කරුවන්ට ඔවුන්ගේ ගුරුවරුන් වන නවීන සමාජවාදයේ නිර්මාතෘවරයන් විසින් උරුම කොට දෙන ලද, ශ්‍රෙෂ්ඨ සත්‍යය ඉතාමත් විචිත්‍ර ලෙස හා ඉතාමත් සිත් කාවදින ලෙස නිදර්ශනයට නැගීමක් මහා භයංකර අධිරාජ්‍යවාදී යුද්ධය මධ්‍යයේ නිර්ධන පංතියට දක්නට ලැබෙන්නේය. මෙම සත්‍යය නම්, සූරාකන්නන්ගේ ප්‍රතිරෝධය තරයේ මර්දනය කිරීමෙන් තොරව කිසිම විප්ලවයක් සාර්ථක විය නොහැකි බවය. කම්කරුවන් සහ වෙහෙසී වැඩ කරන ගොවිජනතාව වන අප රාජ්‍ය බලය අල්වාගත් කල, සූරාකන්නන්ගේ ප්‍රතිරෝධය මර්දනය කිරීම අපගේ යුතුකම වූයේය. අපි මෙම කටයුත්ත කරමින් සිටියෙමු. අපි ඒ ගැන ආඩම්බර වෙමු. අප කණගාටු වන්නේ ප්‍රමාණවත් තරම් දැඩිව සහ අධිෂ්ඨානයෙන් යුතුව එය නොකිරීම ගැනය.

සෑම රටකමසමාජවාදී විප්ලවයට විරුද්ධව ධනපතියන් අනිවාරණීය වශයෙන්ම දරුණු ප්‍රතිරෝධයක් දක්වන බවත්, මෙම විප්ලවයේ වර්ධනය සමග මෙම ප්‍රතිරෝධයද වැඩෙන බවත් අපි දන්නෙමු. නිර්ධන පංතිය මෙම ප්‍රතිරෝධනය තරයේ මැඩලනු ඇත. ප්‍රතිරෝධය දක්වන ධනපතියන්ට විරුද්ධව කරන අරගලයේදී නිර්ධන පංතිය අවසානයේදී ජයග්‍රහණය සහ බලය ලැබීම සඳහා සුදුසුවන සේ මේරූ තත්වයට පත් වනු ඇත.

අපගේ විප්ලවයේදී සිදුවන සෑම අත් වැරුද්දක්ම ගැන මුළු ලෝකයටම ඇසෙන සේ දූෂිත ධනපති පුවත් පත් හඬ තැළුවා වේ. අපි අපගේ අත් වැරදි නිසා දුර්මුඛ නොවන්නෙමු. විප්ලවය ආරම්භ වී තිබෙන නිසා මිනිසුන් ශුද්ධ වන්තයින් වී නැත. ශත වර්ෂ ගණන් තිස්සේ පීඩිතව හා පෑගී සිටි, දුප්පත්කම, ම්ලේච්ඡභාවය සහ නූගත්කම නැමති දුෂ්චරිතය තුළ බලෙන් ගිල්වනු ලැබ සිටි, වෙහෙසී වැඩ කරන පංති, විප්ලවයක් කරන විට වැරදීම් සිදුවීම නොවැලැක්විය හැකිය. මා කලින් පෙන්වා දී ඇති පරිදි ධනපති සමාජයේ මළ කුණ පෙට්ටියක බහා ඇණගසා වළලා දැමීමට නුපුළුවන. අප මධ්‍යයේම කුණු වී දිරාපත් වන ධනපති ක්‍රමයේ මළ කුණ වාතය අපිරිසිදු කරයි; අපගේ ජීවිතවලට විෂ කවයි; පැරණි, මරණාසන්න හා කුණුවන දෙයින් විහිදෙන දහසක් නූල් හා බන්ධන වලින් අළුත්, නැඹුල් සහ පෞරුෂතා සහිත සියල්ල පටලවා තබයි.

ධනපතියනුත්, ඔවුන්ගේ ආවතේව කාරයනුත් (අපගේම මෙන්ෂෙවික්වරුන් සහ දක්ෂිණ සමාජවාදී-විප්ලවවාදීන් ඇතුළුව) මුළු ලොවටම හඬගා කියන අප අතින් සිදු වන සෑම වැරදි සියයකටම දස දහසක් බැගින් ශ්‍රෙෂ්ඨ හා වීර ක්‍රියා කරනු ලැබේ. මේවා ඉටු කරනු ලබන්නේ තමන්ගේ ජයග්‍රහණ ගැන ලෝකයට හඬගා කීමේ පුරුද්දක් (හා අවස්ථාවක්) නැති ජනතාව විසින් පැක්ටරි දිස්ත්‍රික්කයක, නැතහොත්, ඈත පිටිසර ගමක දෛනික ජීවිතයේදී කරනු ලබන සරල හා අප්‍රසිද්ධ කටයුතුවල ස්වභාවයෙන් වන නිසා, ඒවා වඩාත් ශ්‍රෙෂ්ඨය, වඩාත් වීරෝදාරය.

නමුත් එහි අනිත් පැත්ත සිදු වුවත් — එවැනි උපකල්පනයක් වැරදි බැව් මම දනිමි — අප කරන නිවැරදි කාර්යයන් සියයකට වැරදීම් දස දහසක් බැගින් සිදු වුවත්, එවැනි තත්වයක් යටතේ වුවත්, අපගේ විප්ලවය ශ්‍රෙෂ්ඨ හා අපරාජිත වනු ඇත. ලෝක ඉතිහාසය හමුවේ එය එසේ වනු ඇත. මන්දයත්, ප්‍රථම වතාවට අල්පතරය නොව, පොහොසතුන් පමණක් නොව, උගතුන් පමණක් නොව, නියම වශයෙන්ම ජනතාවම, වැඩ කරන ජනතාවගෙන් අති බහුතරයම, තමන් අතින්ම නව ජීවිතයක් ගොඩ නගන හෙයිනි; ඔවුන් ඔවුන්ගේම අත් දැකීමෙන් සමාජවාදයේ සංවිධාන කටයුතුවලදී හමුවන ඉතාමත් දුෂ්කර ප්‍රශ්න විසඳා ගන්නා හෙයිනි.

එවැනි වැඩ කටයුතු කිරීමේදී, කෝටි ගණන් සාමාන්‍ය කම්කරු හා ගොවි ජනයා තමන්ගේ මුළු ජීවිතයම ප්‍රතිසංවිධානය කරනුවස් ඉතාමත් උවමනාවෙන් හා ආශාවෙන් වැඩ කිරීමේදී සිදුවන සෑම වැරැද්දක්ම, සූරාකන අල්පතරය ලබාගන්නා ''ඇදක් කුදක් නැති'' ජයග්‍රහණ, ජනතාවට වංචා කිරීමේ හා ඔවුන් රැවටීමේ ජයග්‍රහණ දහස් ගණනකට හා ලක්ෂ ගණනකට වඩා අගනේය. එසේ කියන්නේ කම්කරුවන්ට හා ගොවි ජනතාවට නව ජීවිතය ගොඩනැගීම ගැන උගෙන ගත හැක්කේ, ධනපතියන් නොමැතිව කටයුතුකිරීමට උගෙන ගත හැක්කේ එවැනි වැරදි මගින් පමණක් වන හෙයිනි; ඔවුන්ට ජයග්‍රාහී සමාජවාදය කරා යාමට මාර්ගයක් කපා ගනු ඇත්තේ මේ මාර්ගයෙන්, දහස් ගණන් බාධක මැද්දෙන්, පමණක් වන හෙයිනි.

එක පහරකින්, 1917 (පැරණි ක්‍රමය) ඔක්තෝබර් 25–26 දින එක රාත්‍රියකින්, පුද්ගලික ඉඩම් හිමිකම සම්පූර්ණයෙන්ම අවලංගු කළ, දැන් මාසයෙන් මාසය අති දැවැන්ත දුෂ්කරතාවයන් ජයගනිමින් හා තමන්ගේ වැරදි තමන්ම හද ගනිමින්ද, ආර්ථික ජීවිතයේ නවතාවයන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සංවිධානය කිරීමේ, කුලාකයන්ට විරුද්ධව සටන් කිරීමේ, වැඩ කරන ජනතාවට (පොහොසතුන්ට නොව) ඉඩම් සැපයීමේ සහ මහාපරිමාණ කොමියුනිස්ට් කෘෂිකර්මාන්තයට පරිවර්තනය වීමේ ඉතාමත් දුෂ්කර කර්තව්‍යයන් ප්‍රායෝගික ආකාරයෙන් විසඳාගනිමින්ද සිටින ගොවි ජනතාවගේ විප්ලවවාදී වැඩ කටයුතුවලදී ඔවුන් අතින් වැරදි සිදුවන්නේය.

විශාලතම පැක්ටරි සහ යන්ත්‍රස්ථාන සියල්ලම පාහේ, දැනටමත්, මාස කීපයක් තුළ ජනසතු කර සිටින, මුළු කර්මාන්ත අංශයන්ම කළමනාකරණය පිළිබඳ කර්තව්‍යයන් ඉටු කිරීමට අවශ්‍ය උගෙනුම, අමාරු, දෛනික වැඩ කිරීම තුළින් ලබාගන්නා, ජාතික ව්‍යවසායයන් ක්‍රියාත්මක කරන, උදාසීනත්වයේ, සුළු ධනපති චිත්ත ස්වභාවයේ සහ ආත්මාර්ථයේ බලවත් ප්‍රතිරෝධය ජයගනිමින් සිටින සහ නව සමාජ සම්බන්ධකම් සඳහා, නව ශ්‍රම විනයක් සඳහා, කම්කරු වෘත්තීය සමිති ඔවුන්ගේ සාමාජිකයන් කෙරෙහි ගෙන එන නව බලපෑමක් සඳහා ගලින් ගල තබමින් මෙන් පදනම් දමමින් සිටින, අපගේ කම්කරුවන්ගේ විප්ලවවාදී වැඩ කටයුතුවලදී ඔවුන් අතින් වැරදීම් සිදුවන බව ඇත්තය.

1905 තරම් ඈත කාලයකදී මහා ජනතා උත්සන්නියෙන් නිර්මාණය වුනු සෝවියට් සභාවල වැඩ කටයුතුවලදී ඒවා අතින් වැරදීම් සිදුවන්නේය. කම්කරුවන්ගේ සහ ගොවිජනතාවගේ සෝවියට් සභා යනු නව වර්ගයක රාජ්‍යයකි; නව සහ උසස් වර්ගයක ප්‍රජාතන්ත්‍රයකි; නිර්ධන පංති ආඥාදායකත්වයේ ආකෘතියකි; ධනපති පංතිය නැතිව සහ ධනපති පංතියට විරුද්ධව රාජ්‍ය පරිපාලනය කිරීමේ ක්‍රමයකි. ප්‍රථම වතාවට ප්‍රජාතන්ත්‍රවාදය ජනතාවගේ සේවය සඳහා යෙදී ඇත්තේ මෙහිදීය. ප්‍රජාතන්ත්‍රවාදය, මේ දක්වාම සියළුම ධනපති සමූහාණ්ඩුවල, ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී ධනපති සමූහාණ්ඩුවේ පවා පවතින ධනපතියන්ගේ ප්‍රජා තන්ත්‍රයක් වීම කෙළවර වී ඇත. ප්‍රථම වතාවට නිර්ධන පංතියේ සහ අර්ධ නිර්ධන පංතියේ ආඥාදායකත්වය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රශ්නය විසඳීමට, ජනතාව දශ කෝටියක් දෙනා සම්බන්ධ වන පරිමාණයකින් ප්‍රයත්න දරති. මෙම ප්‍රශ්නය විසඳීමෙන් තොරව සමාජවාදයක් තිබිය නොහැකිය.

අති පණ්ඩිතයන්, නැතහොත්, ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී හෝ පාර්ලිමේන්තුවාදී හෝ පූර්වමතයන්ගෙන් තමන්ගේ කල්පනාවන් දුස්සාධ්‍ය ලෙස අසුරා ගත් අය, අපගේ සෝවියට් සභා ගැන, නිදසුනක් ලෙසට ඒවාට තෝරා පත් කිරීම සඳහා ඍජු ඡන්දයක් නොවීම ගැන, වික්ෂිප්තව ඔවුන්ගේ හිස්ගෙඩි සැලුවාවේ. මහා පෙරළි ඇතිවූ 1914–1918 කාල පරිච්ඡේදයේදී මේ මිනිසුන්ට කිසිවක් අමතක වී නැත. එසේම එම කාලය තුළ ඔවුන් කිසි දෙයක් උගෙන ගෙනද නැත. නිර්ධන පංති ආඥාදායකත්වය

සමග වැඩ කරන ජනතාවගේ නව ප්‍රජාතන්ත්‍රවාදය ඒකාබද්ධ කිරීම — සිවිල් යුද්ධය සමග ජනතාව පුළුල්තම ලෙස දේශපාලනයට සහභාගිවීම ඒකාබද්ධ කිරීම — එවැනි ඒකාබද්ධතාවයක් ඇති කිරීම එක පැහැර ක්‍රියාත්මක කළ හැකි නොවේ. තවද වැරහැලි වී ගොස් තිබෙන පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ අනුබැඳියාවට එය ගැලපෙන්නේද නැත. නව ලෝකයක සමෝච්ඡ රේඛා, නැතහොත්, සමාජවාදයේ ලෝකය සෝවියට් සමූහාණ්ඩුවේ ස්වරූපයෙන් අප හමුවේ මතු වී එන්නේය. ලෝකය සද නිම කළ ආකාරයෙන්, ජුපිටර් දෙවියාගේ හිසෙන් පැන නගින මිනර්වා දෙව්දුව මෙන්[82] පහළ නොවීම පුදුමයට කරුණක් නොවේ.

පැරණි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවල විධිමාත්‍ර සමානාත්වතාවය සහ රැස්වීමේ නිදහස පිළිබඳ අලංකාර වදන් ඇතුලත් විය. එහෙත්, අපගේ නිර්ධන පංති සහ ගොවිජන සෝවියට් ව්‍යවස්ථාව විධිමාත්‍ර සමානාත්මතාවය පිළිබඳ වංචාව ඉවත ලන්නේය. ධනපති සමූහාණ්ඩුවාදියෝ සිංහාසන පෙරළා දමන විට, ඔවුහු රාජාණ්ඩුවාදීන් සහ සමූහාණ්ඩුවාදීන් අතර විධිමාත්‍ර සමානාත්මතාවය ගැන සැලකිල්ලක් නොදැක්වූහ. මතු වී තිබෙන්නේ ධනපති පංතිය පෙරළා දැමීමේ ප්‍රශ්නයක් වන කල, ධනපතියන්ට හිමිකම් පිළිබඳ සමානාත්මතාවයක් දෙන ලෙස ඉල්වීම කළ හැක්කේ ද්‍රෝහීන්ට, නැතහොත්, මොට්ටයන්ට පමණකි. හොඳම ගොඩනැගිලි ධනපතියන්ට අයත්ව තිබියදී, කම්කරුවන්ට හා ගොවි ජනතාවට රැස්වීමේ නිදහස තුට්ටුවක් තරම් වත් වටිනා දෙයක් නොවේ. අපගේ සෝවියට් සභා නගරවල හා ගම්වල තිබෙන හොඳම ගොඩනැගිලි පොහොසතුන්ගෙන් රාජසන්තක කර, ඒවා සියල්ලම කම්කරුවන්ගේ හා ගොවිජනතාවගේ සංගම් රැස්වීම් පැවැත්වීම සඳහා ඔවුන්ට පවරා දී ඇත. අපගේ රැස්වීමේ නිදහස, එනම්, වැඩකරන ජනතාව සඳහා රැස්වීමේ නිදහස මෙයයි! අපගේ සෝවියට් සමාජවාදී ව්‍යාවස්ථාවේ අර්ථය හා සන්ධාරය මෙයයි!

අපගේ සෝවියට් සමූහාණ්ඩුවට තවදුරටත් මුහුණ පාන්නට සිදුවන දුෂ්කරතාවයන් කොතරම් වුවත් එය අනභිභවනීය බව අප එතරම් දැඩි ලෙස විශ්වාස කරන්නේ එහෙයිනි.

වියරු වැටුන අධිරාජ්‍යවාදීන් අපට ගසන සෑම පහරක්ම, ජාත්‍යන්තර අධිරාජ්‍යවාදීන් අපට හිමි කර දෙන සෑම පරාජයක්ම විසින් තව තවත් කම්කරු හා ගොවි ජනතා කොටස් අරගලයට පොළඹවන හෙයින්ද, මහා කැප කිරීම් ඉල්ලන එම පහරවල් හා පරාජයවීම් ඔවුන්ට උගෙනුම, පන්නරය හා පොදුජන පරිමාණයෙන් වීරත්වය ගෙන දෙන හෙයින්ද සෝවියට් සමූහාණ්ඩුව අනභිභවනීය ය.

සහෝදර ඇමෙරිකානු කම්කරුවනි, විවිධ රටවල විප්ලවය විවිධ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ආකාරයෙන්, විවිධ සීඝ්‍රතාවයෙන් වර්ධනය වන හෙයින් (එය එසේම විය යුතුය), සමහර විට ඉක්මණින්ම ඔබගේ ආධාරය නොලැබෙනු ඇති බව අපි දන්නෙමු. යුරෝපීය නිර්ධන පංති විප්ලවය, මෑතදී ඉතමත් සීඝ්‍ර ලෙස සංවර්ධනය වෙමින් පැවති නමුත්, කෙසේ හෝ වේවා, එය මීළඟ සති කීපය තුළ දැල්වී නොයනු ඇතැයි අපි දන්නෙමු. ලෝක විප්ලවය අනිවාරණීය වශයෙන්ම සිදුවනු ඇතැයි යන්න මත විශ්වාසය තබා අපි කටයුතු කරන්නෙමු. නමුත් විප්ලවය කිසියම් නියමිත දිනක එනු ඇතැයි යන්න විශ්වාස කිරීමට තරම් අපි මෝඩයෝ නොවෙමු. අපි, 1905 දී සහ 1917 දී අපගේ රටේ විප්ලව දෙකක් දැක ඇත්තෙමු. එනිසා විප්ලව යනු ඇණවුම හෝ එකඟත්වය අනුව සාදන ලද්දක් නොවන බව අපි දන්නෙමු. සමාජවාදී නිර්ධන පංතියේ අපගේ රුසියානු කණ්ඩායම ප්‍රමුඛත්වයට පැමිණියේ අපගේ ඇති විශේෂ සුදුසු කමක් නිසා නොව ආශ්‍රිත තත්වයන් නිසා, එනම්, රුසියාවේ අන්ත නොදියුණු කම නිසා බවත්, ලෝක විප්ලවය ආරම්භ වීමට පෙර තනි විප්ලව ගණනාවක් පරාජය වීමට ඉඩ තිබෙන බවත්, අපි දන්නෙමු.

මේ සියල්ලම එසේ වුවත් අප පරාජය කළ නොහැකි බව අපි දන්නෙමු. එසේ කියන්නේ මිනිස් වර්ගයාගේ ධෛර්ය නැසීමේ පුළුවන් කම අධිරාජ්‍යවාදී ඝාතනයට නොමැති හෙයිනි. මිනිස් වර්ගයා එය පරාජය කරනු නිසැකය. අධිරාජ්‍යවාදී යුද්ධයේ වධක යදම් බිඳලූ ප්‍රථම රට අපේ රට විය. මෙම යදම් බිඳීමට කළ අරගලයේදී අපට අතිශයින්ම දරුණු අනතුරු සිදුවිය. නමුත් අපි ඒ යදම් බින්දෙමු. අධිරාජ්‍යවාදීන්ට යටහත් කමෙන් අප නිදහස් ය. අධිරාජ්‍යවාදය සම්පූර්ණයෙන්ම පෙරළා දැමීම සඳහා කරන අරගලයේ ධජය, අපි මුළු ලෝකයාටම පෙනෙන සේ ඔසවා ඇත්තෙමු.

අප දැන් සිටින්නේ, ලෝක සමාජවාදී විප්ලවයේ බල සේනා විත් අපට ආධාර දෙන තෙක්, සතුරන් විසින් වටලනු ලැබූ බලකොටුවක් තුළට වී සිටින කලෙක මෙනි. එම බල සේනා ඇත්තේය. ඒවා අපගේ සේනාවන්ට වඩා ගණනින් විශාලය. අධිරාජ්‍යවාදයේ ම්ලේච්ඡතාවයන් තවදුරටත් පවතින කාලය දීර්ඝ වත්ම එම බලසේනා මේරූ තත්ත්වයට පත්වෙති, වර්ධනය වෙති, ශක්තියෙන් වැඩෙති, කම්කරුවෝ ඔවුන්ගේ සමාජ-ද්‍රෝහීන්ගෙන්, ගොම්පර්ස්ලාගෙන්, හෙන්ඩර්සන්ලාගෙන්, රෙනොදෙල්ලාගෙන් හා රෙනෙර්ලාගෙන් වෙන් වී ඉවත්වෙමින් සිටිති. හෙමින්, හෙමින්, එහෙත් ඒකාන්ත ලෙසම කොමියුනිස්ට්වාදී, බොල්-ෂෙවික් උපක්‍රම පිළිගනිමින් සිටින කම්කරුවෝ නිර්ධන පංති විප්ලවය දෙසට ගමනේ යෙදෙති. නැසී යන සංස්කෘතිය සහ නැසී යන මිනිස් වර්ගයා බේරා ගැනීමෙහි සමත් වන්නේ එම විප්ලවය පමණකි.

කොටින් කියතොත්, ලෝක නිර්ධන පංති විප්ලවය අනභිභවනීය නිසා, අපි අනභිභවනීය වන්නෙමු.

එන්. ලෙනින්

1918 අගෝස්තු 20 ''ප්‍රාව්ද'', අංක 178, 1918 අගෝස්තු 22

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 37, පිටු 48-64

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ, මොස්කව් සෝවියට් සභාවේ, පැක්ටරි කාරක සභාවල සහ වෘත්තීය සමිතිවල ඒකාබද්ධ රැස්වීම

1918 ඔක්තෝබර් 22[83]

යෝජනාව

අධිරාජ්‍යවාදී යුද්ධයට විරුද්ධව නිර්ධන පංතිය සහ ගොවිජනතාව ගෙන යන විප්ලවවාදී ව්‍යාපාරය මෑතදී සෑම රටවලම, විශේෂයෙන්ම, බෝල්කන් රටවල, ඕස්ත්‍රියාවේ හා ජර්මනියේ ඉමහත් ජයග්‍රහණයන් අත්කර ගෙන ඇත. එසේ වුවත්, මෙම ජයග්‍රහණයන් නිසා ජාත්‍යන්තර ධනපති පංතිය උරණ වී ඇත. ඒ අනුව විප්ලවය සුන්කර දැමීම සඳහා, වර්තමානයේ විප්ලවයේ ප්‍රධාන නිජ බිම වන සෝවියට් බලය විනාශ කර දැමීම සඳහා, ප්‍රතිවිප්ලවය ක්‍රියාත්මක කරන බලවේගයක් ලෙසට තමන් ඉක්මණින් සංවිධානය වීම, දැන් ඉංග්‍රීසි-ඇමෙරිකන් හා ප්‍රංශ අධිරාජ්‍යවාදීන්ගේ නායකත්වයෙන් යුත් ජාත්‍යන්තර ධනපති පංතියට අත්‍යවශ්‍ය වී තිබේ.

පරාජය වී සහ අභ්‍යන්තර වශයෙන් මහා විප්ලවීය ව්‍යාපාරයක තර්ජනයට ලක්ව සිටින ජර්මන් ධනපති පංතිය හා ජර්මන් ආණ්ඩුව ගැලවීමේ මගක් සොයා දඟලමින් සිටිති. ප්‍රමාද වී සිටිමින් ශීත ඍතුව දක්වා කාලය ගෙවා ගැනීමට හා නව ආරක්ෂක බලකොටු පෙළක් මගින් රට යුද්ධමය වශයෙන් ආරක්ෂා කිරීමට කටයුතු සූදානම් කිරීමට තවමත් අපේක්ෂා කරන එක් උපනතියක්ද, විප්ලවවාදී නිර්ධන පංතියට සහ බොල්ෂෙවික්වරුන්ට විරුද්ධව ඉංග්‍රීසි-ප්‍රංශ අධිරාජ්‍යවාදීන් සමග එකඟත්වයක් ඇති කර ගැනීමට කඩිමුඩියේ කටයුතු කරන තවත් උපනතියක්ද, ජර්මනියේ පාලක කණ්ඩායම් තුළ ඇත. නමුත් මෙයින් පසුකී උපනතිය සමග බේරුම් කර ගැනීමකට එළඹීම ජයග්‍රාහකයන් වන ඉංග්‍රීසි-ප්‍රංශ අධිරාජ්‍යවදීන් එක එල්ලේම ප්‍රතික්ෂේප කරන හෙයින්, බොල්ෂෙවික් අන්තරාය පෙන්වා ඔවුන් බිය ගැන්වීමටත්, බොල්ෂෙවික්වරුන්ට විරුද්ධව, නිර්ධන පංති විප්ලවයට විරුද්ධව එම අධිරාජ්‍යවාදීන්ට ස්වකීය සේවය පිදීමෙන් ඔවුන්ට අල්ලස් දීමටත් එම උපනතියට අයත් පිරිස් උත්සාහ කරති.

ජර්මනියට යටත් වූ හෝ ජර්මනියෙන් අල්ලා ගන්නා ලද හෝ රටවල ධනපති පංතිය ඊටත් වඩා උනන්දුවෙන් එන්ටෙන්ට් ගිවිසුමේ[84] රටවල් සමග එකඟත්වයක් ඇති කර ගැනීමට කටයුතු කරති. සූරාකනු ලබන වැඩ කරන ජනතාව යටත් කර ස්වකීය බලය පවත්වා ගැනීම විදෙශීය බයිනෝත්තු නොමැතිව කිසිසේත්ම කළ නොහැකි බව ධනපති පංතිය දන්නා, විශේෂයෙන්ම පින්ලන්තය, උක්‍රේනියාව ආදිය වැනි රටවල පවතින තත්ත්වය එසේය.

මෙම ආශ්‍රිත කරුණු හේතු කොටගෙන සෝවියට් බලය පහත සඳහන් විශේෂ තත්ත්වයට මුහුණ පා සිටියි. එක් අතකින් පෙර කිසිම කලෙක අපි දැන් තරම් ජාත්‍යන්තර නිර්ධන පංතික විප්ලවයට ආසන්නව නොසිටියෙමු. අනිත් අතින්, පෙර කිසිම කලෙක අපි දැන් තරම් අන්තරායාභිමුඛ තත්වයකට පත්ව නොසිටියෙමු. අන්‍යොන්‍ය වශයෙන් එකිනෙකා කාගන්නා හා දුර්වල කරන, දළ වශයෙන් සමාන වන, අධිරාජ්‍යවාදී කණ්ඩායම් දෙකක් දැන් නැත. ඇත්තේ එක ජයග්‍රාහකයන් කණ්ඩායමක් පමණකි. ඒ ඉංග්‍රීසි-ප්‍රංශ අධිරාජ්‍යවාදීන්ය. මුළු ලෝකයම ධනපතියන් අතර බෙදගැනීමට ඔවුහු අපේක්ෂා කරති. මොන පාඩුවක් හෝ විඳ රුසියාවේ සෝවියට් බලය පෙරළා දමා ඒ වෙනුවට ධනපති බලය ආදේශ කිරීමට එම ජයග්‍රාහකයන් කණ්ඩායම බලාපොරොත්තු වෙයි. දකුණෙන නිදසුනක් ලෙසට ඩාඩනල්ස් සහ කළු මුහුද ඔස්සේ හෝ බල්ගේරියාව හා රුමේනියාව ඔස්සේ හෝ රුසියාවට පහර දීමට ඔවුහු සූදානම් වෙමින් සිටිති. එපමණක් නොව, එක එල්ලේම, නැතහොත්, නිහඬ එකඟතාවයක් පාමින්, ජර්මන් ආණ්ඩුව එහි හමුද උක්‍රේනියාවෙන් ඉවත් කර ගනු ඇත්තේ, එය ඉංග්‍රීසි-ප්‍රංශ හමුද විසින් අත්පත් කරගන්නා ලද පසුව පමණක් බවත්, නොඑසේ වුවහොත් නොවැලැක්විය හැකිවන උක්‍රේනියානු කම්කරුවන්ගේ හා ගොවිජනතාවගේ ජයග්‍රහණයට සහ උක්‍රේනියානු කම්කරු ගොවිජන ආණ්ඩුවක් පිහිටුවීමට ඉඩ නොලැබෙන ආකාරයට බවත්, ඉංග්‍රීසි-ප්‍රංශ අධිරාජ්‍යවාදීන්ගෙන් කොටසක් හෝ බලාපොරොත්තු වෙති.

ක්‍රස්නොව්ට සහ සුදු හමුදවලට පිටුපසින් සිටින, ඊට වඩා බොහෝ භයානක බලවේගයක් වන, ඉංග්‍රීසි-ඇමෙරිකානු හා ප්‍රංශ හමුද ප්‍රමුඛ කොට ගත් ජාත්‍යන්තර ප්‍රතිවිප්ලවවාදී ධනපති පංතියේ බලවේගය අපට විරුද්ධව ප්‍රහාරයකට කටයුතු සූදානම් කරමින් සිටී. මෙය සත්‍ය කරුණකි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඒ ගැන වැටහීමක් ඇත්තේ සෑම අයටම නොවේ. ඒ පිළිබඳ අවබෝධය කම්කරු හා ගොවි පුළුල් ජනතාව අතර ගැඹුරට කාවැදී නැත. එනිසා අපි වෙහෙස නොබලා, මෙම අවබෝධය ජනතාව තුළට කාවැද්දීමට කටයුතු කළ යුත්තෙමු. දකුණු පෙරමුණ ශක්තිමත් කිරීමට හා අපට දැන් තිබෙනවාට වඩා අතිශයින් බලවත් රතුහමුදාවක් ඇති කිරීමට සහ ආයුධ සන්නද්ධ කිරීමට ඉතාමත් අනලස් අවධානය යෙදිය යුත්තෙමු. යුද්ධ හමුදාව ශක්තිමත් කිරීමට පූර්වතාවය දීමත්, ඒ සම්බන්ධයෙන් අප ප්‍රමාණවත් ලෙසට කටයුතු කර තිබේද යනු හා අළුත් පියවරයන් ගත හැකිද, ගත යුතුද යනු යළි යළිත් පරීක්ෂා කර බැලීමත්, සෑම කම්කරු සංවිධානයකම, දුප්පත් ගොවිජනතාවගේ සෑම සංගමකම, සෑම සෝවියට් ආයතනයකම යුතුකම වන්නේය.

අපගේ කම්කරුවන්ගේ සහ ගොවිජනතාවගේ ඉරියව්වෙහි කැපී පෙනෙන වෙනසක් ඇති වී තිබේ. ජනතාව ඔවුන්ගේ අන්ත යුද්ධ විඩාව ජය ගෙන සිටිති. යුද්ධ හමුදාවක් ගොඩනගනු ලැබේ. ගොඩනගා තිබේ. නව කොමියුනිස්ට් විනයක්, කම්කරු පංතියේ පංති විඥනයෙන් හෙබි විනයක් ඇති වී තිබේ. මෙම කරුණ හේතු කොට ගෙන, අපගේ සමාජවාදී දේශ භූමිය ආරක්ෂා කිරීම හා ජාත්‍යන්තර නිර්ධන පංති විප්ලවයේ ජයග්‍රහණය අත්පත් කර ගැනීම අපට පුළුවනැයිද, අපි එය කරන්නෙමුයි ද යන විශ්වාසදායක බලාපොරොත්තුව ඇති කර ගැනීමට සෑම ඉඩක්ම ඇත.

''ඉස්වෙස්තිය'', අංක 231, 1918 ඔක්තෝබර් 23

වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 37, පිටු 126–128

පිතිරිම් සරෝකින්ගේ වැරදි පිළිගැනුම

පිතිරිම් සරොකින්ගේ ඉතා වැදගත් ලිපියක් අද ''ප්‍රාව්ද''[85] පත්‍රයෙහි පළ කර තිබුණි. එය සෑම කොමියුනිස්ට් පාක්ෂිකයෙකුගේම විශේෂ අවධානයට ලක් විය යුතුය. ප්‍රථමයෙන් ''උතුරු ද්විනා විධායක කාරක සභාවේ ඉස්වෙස්තියා''[86] පත්‍රයෙහි පළ කර තිබුණු මෙම ලිපියෙන් පිතිරිම් සරෝකින් කියන්නේ ඔහු දක්ෂිණාංශික සමාජවාදී-විප්ලවවාදී පක්ෂයෙන් ඉවත් වන බවත්, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයේ ඔහුගේ අසුනෙන් ඉවත් වන බවත්ය. එසේ කිරීමට හේතු දක්වමින් ඔහු කියන්නේ, අන් අය සඳහා පමණක් නොව තමන් සඳහාමවත් දේශපාලන විසඳුම් සොයා ගැනීම ඔහුට දුෂ්කර වී ඇති නිසා ඔහු ''සම්පූර්ණයෙන්ම දේශපාලන කටයුතුවලින් ඉවත් වන'' බවයි. ඔහු මෙසේද ලියයි: ''විප්ලවයේ පසුගිය අවුරුද්දෙන් මම එක සත්‍යයක් උගෙන ගත්තෙමි. දේශපාලනඥයන් අතින් වැරදීම් සිදුවිය හැකිය. දේශපාලනය සමාජමය වශයෙන් ප්‍රයෝජනවත් විය හැකිය. එය සමාජමය වශයෙන් හානිකර වන්නටද පිළිවන. එහෙත් විද්‍යාත්මක සහ අධ්‍යාපනික කටයුතු නිතරම ප්‍රයෝජනවත්ය. එමෙන්ම නිතරම ජනතාවට අවශ්‍යය...'' මෙම ලිපිය අත්සන් කර තිබෙන්නේ ''පිතිරිම් සරෝකින්, සාන්ත පීටර්ස්බර්ග් විශ්ව විද්‍යාලයේ සහ මනෝ-ස්නායුවේදී විද්‍යායතනයේ කථිකාචාර්ය, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයේ හිටපු සාමාජික හා සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ හිටපු සාමාජික'' යනුවෙනි.

ප්‍රථමයෙන්ම, මෙය ඉතා වැදගත් ''මානුෂික ලියවිල්ලක්'' නිසා එය ගැන සඳහන් කිරීම වටනේය. තමන්ගේ දේශපාලනයෙහි වැරදි සහගත භාවය පිළිගැනීමේදී සරෝකින් දක්වන අවංක භාවය හා සෘජුභාවය අපට නිතර දක්නට ලැබෙන්නක් නොවේ. තමන් අනුගමනය කරන දේශපාලන ක්‍රියාමාර්ගය වැරදි බව අවබෝධ කරගන්නා දේශපා-

https://liberationbase.wordpress.com

ලනඥයෝ බොහෝ අවස්ථාවලදී කරන්නේ තමන් පෙරමුණු මාරු කරන බව වසං කර තැබීමට උත්සාහ කරමින්, එක්තරා දුරකට ඊට අදල නොවන හේතු ''නිර්මාණය'' කිරීමාදියට යොමු වීමයි. කිසියම් කෙනෙක් තමන්ගේ දේශපාලන වරද ඍජු ලෙස හා අවංකව පිළිගැනීමම වැදගත් දේශපාලන ක්‍රියාවකි. විද්‍යාත්මක කටයුතු ''නිතරම ප්‍රයෝජනවත්ය'' යි කියන විට පිතිරිම් සරෝකින් සාවද්‍යය. මෙම ක්ෂේත්‍රයෙහිදී ද වැරදි සිදුවේ. ඒ බව සනාථ කෙරෙන සේ විඥත ප්‍රතිගාමීන් නොවන පුද්ගලයන්, මුරණ්ඩු ලෙසින් ප්‍රතිගාමී දර්ශනික අදහස් ඉදිරිපත් කරන අවස්ථා පිළිබඳ නිදර්ශන රුසියානු සාහිත්‍යයෙන්ද දක්නට හැකිය. අනිත් අතට, ප්‍රසිද්ධ පුද්ගලයෙක්, පොදු මහජනයා දන්නා සහ වගකිව යුතු දේශපාලන තනතුරක් දරමින් සිටි කෙනෙක්, තමන් දේශපාලනයෙන් ඉවත් වන බවට කරන ප්‍රකාශයද, දේශපාලන කටයුත්තකි. පිළිගන්නා ලද දේශපාලන වරද, ඉහතදී ජනතාව කෙරෙහි බලපෑමක් කළ මුළු මහත් පක්ෂ විසින්ම කරන ලද්දක් නම්, එවැනි දේශපාලන වරදක් ගැන අවංක පාපෝච්චාරණයක් කිරීම, බොහෝ දෙනෙකුට මහත් දේශපාලන යහපතක් සලසන්නක් විය හැකිය.

විශේෂයෙන්ම මෙම අවස්ථාවේදී පිතිරිම් සරෝකින්ගේ ලිපියෙහි වැදගත්කම ඉමහත්ය. එය, අප සියළු දෙනාම බරපතල ලෙස කල්පනා කර බැලිය යුතු සහ තරයේ උගත යුතු ''පාඩමකි''.

ධනපති සමාජයේ තීරණාත්මක බලවේගයන් වන්නේ නිර්ධන පංතිය හා ධනපති පංතිය බවත්, ඒ අතරතුර තත්වයක් දරන සියළුම සමාජ කොටස් සුළු ධනේශ්වර ආර්ථික ප්‍රවර්ගයට අයත් බවත්, ඔවුන් අනිවාර්ණීය වශයෙන්ම මෙම තීරණාත්මක බලවේගයන් අතර එහා මෙහා වැනෙන බවත්, සෑම මාක්ස්වාදියෙක්ම බොහෝ කලක සිට දැන සිටි සත්‍යයකි. එහෙත්, මෙම සත්‍යය ශාස්ත්‍රීය වශයෙන් පිළිගැනීමත්, ප්‍රායෝගික යථාර්ථයේ සංකීර්ණ තත්ත්වයන් යටතේ එය අනුව බැසගත යුතු නිගමනයන්ට එළඹ ගැනීමත් අතර, අති විශාල පරතරයක් තිබේ.

පිතිරිම් සරෝකින් වූ කලී, ඉතාමත් පුළුල් මහජන හා දේශපාලන ප්‍රවණතාවයක් වන මෙන්ෂෙවික් සමාජවාදී-විප්ලවවාදී ප්‍රවණතාවය නියෝජනය කරන්නෙකි. මෙය එකම ප්‍රවණතාවයක් බවත්, මෙන්ෂෙවික්වරුන් සහ සමාජවාදී-විප්ලවවාදීන් යන දෙපිරිසම, ධනපති පංතිය හා නිර්ධන පංතිය අතර අරගලය සම්බන්ධයෙන් දක්වන ඔවුන්ගේ ආකල්ප අතින් ඔවුන් අතර ඇත්තේ ඉතා සුළු වෙනසක් බවත්, විශේෂයෙන්ම, 1917 පෙබරවාරි විප්ලවයෙන් පසුව ඇති වූ සිදුවීම්වලින් ඉතා පැහැදිලි ලෙස හා සිත් කාවදින ලෙස ඔප්පු විය. මෙන්ෂෙවික්වරු සහ සමාජවාදී-විප්ලවවාදීහු යනු, සුළු ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදීන් වර්ග දෙකක් වෙති. අදළ ප්‍රවණතාවයෙහි ආර්ථික හරය හා මූලික දේශපාලන ස්වභාව ලක්-

ෂණය එයයි. මෙම ප්‍රවණතාවයෙහි මුල් අවධියේදී එය කොතරම් නිරන්තර ලෙස ''සමාජවාදී'' වර්ණයෙන් පෙනී සිටින්නේද යන්න දියුණු රටවල ඉතිහාසය අනුව අපි දන්නෙමු.

මාස ගණනකට පෙර, මෙම ප්‍රවණතාවයේ අනුගාමිකයන් එතරම් බලවත් ලෙස බෝල්ෂෙවික්වරුන් කෙරෙන් ඉවතට තල්ලු කළේත්, නිර්ධන පංති විප්ලවයෙන් ඉවතට තල්ලු කළේත්, දැන් විරුද්ධත්වයේ සිට මධ්‍යස්ථ තත්ත්වයට ඒමට ඔවුන් පොළඹවන්නේත්, කුමණ කරුණු ද? මෙම වෙනසට ප්‍රථම වශයෙන්ම හේතු වූයේ, ජර්මනියේ විප්ලවය[87] හා වෙනත් රටවල විප්ලව හමුවේ ජර්මන් අධිරාජ්‍යවාදය බිඳ වැටීම හා ඉංග්‍රීසි-ප්‍රංශ අධිරාජ්‍යවාදය ගැන කරුණු හෙළිදරව් වීමත්, දෙවැනිව, ධනපති ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මායා මත ඉවත්වී යාමක් ය.

ප්‍රථම හේතුව ගෙන බලමු. එකිනෙකට වෙනස් පිතෘභූමි අවුරුදු සිය දහස් ගණන් තිස්සේ පැවතීම නිසා දේශප්‍රේමය ඉතාමත් ගැඹුරු ලෙස මුල් බැසගත් හැඟීමක් වී තිබේ. අපගේ නිර්ධන පංති විප්ලවයේ ඉතාමත් කැපී පෙනෙන, එමෙන්ම අති විශේෂ යයි කිව හැකි දුෂ්කරතාවයක් වූයේ, දේශ ප්‍රේමයෙන් ඈත්ව අන්තය දක්වා ගිය අදියරක්වූ බ්‍රෙස්ට් සාම සමය පසු කිරීමට සිදු වීමය. මෙම සාමය විසින් අවුස්සන ලද අප්‍රසන්නතාවය, අමනාපය හා බලවත් කෝපය ගැන තේරුම් ගැනීම දුෂ්කර නොවීය. ලෝක නිර්ධන පංති විප්ලවයේ ඉහළම අවශ්‍යතාවයන් ඉටු කරනු වස්, අප උත්කෘෂ්ඨ ජාතික කැප කිරීම් කරමින් සිට බව හා කළ යුතු වූ බව පිළිබඳ සත්‍යය අගය කරනු ඇතැයි යන්න අපට මාක්ස්වාදීන් වශයෙන් බලාපොරොත්තු විය හැකි වූයේ නිර්ධන පංති විඥනය ඇති පෙරමුණු බල ඇණියෙන් පමණකි. විප්ලවය මෝරමින් තිබුණේය යන ස්ථිර අවබෝධය ඇති කර ගැනීම හෝ එයට කොන්දේසි විරහිත ලෙස කැප වීමට යොමු වීම හෝ වෙත එළඹීමේ මාර්ගයක් මාක්ස්වාදීන් නොවන දෘෂ්ටිවාදීන්ටත්, වැඩ වර්ජන හා විප්ලවය නැමති පාසලේ දීර්ඝ පුහුණුවක් ලැබූ නිර්ධන පංතියට අයත් නොවන වැඩ කරන පුළුල් ජනතාවටත් තිබුණේ නැත. ඉතාමත් හොඳ අර්ථයෙන් බැලුවත්, අප අනුගමනය කළ උපක්‍රම ඔවුන්ට පෙනුනේ, පුදුම සහගත, අන්ධ භක්තික ක්‍රියාවන් මෙන්ද, එමෙන්ම, විදේශයේ කිසියම් දෙයක් සිදුවෙතැයි යන භාවික, මනෝරාජික සහ අවිශ්වාස සහගත බලාපොරොත්තුව උදෙසා දස කෝටි ගණන් ජනතාවගේ සැබෑමය සහ සුපැහැදිලි අවශ්‍යතාවයන් අතිධාවනකාරී ආකාරයෙන් කැප කිරීමක් මෙන්ද වේ. ඒ අතර සුළු ධනේශ්වර පංතියේ ආර්ථික තත්වය නිසාම, ඔවුහු ධනපති පංතියට හෝ නිර්ධන පංතියට හෝ වඩා දේශප්‍රේමී වෙති.

නමුත් අප කී දේම සිදු විය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එකම සතුරා වශයෙන් පෙනෙන්නට සිටි ජර්මන් අධිරාජ්‍යවාදය බිඳ වැටුනේය. (ප්ලෙහානව්ගේ කියමනක් යොදතොත්) "සිහින රැවටිල්ලක්" වූ ජර්මන් විප්ලවය සත්‍යයක් විය. සුළු ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ මනඃකල්පිතය විසින් ප්‍රජාතන්ත්‍රයේ මිතුරෙකු ලෙස හා පීඩිතයන්ගේ ආරක්ෂකයෙකු ලෙස පින්තාරු කරන ලද ඉංග්‍රීසි-ප්‍රංශ අධිරාජ්‍යවාදය, ජර්මන් සමූහාණ්ඩුව මත හා ඕස්ත්‍රියන් ජනතාව මත බ්‍රෙස්ට් ගිවිසුමටත් වඩා දරුණු කොන්දේසි පැටවූ අතර, "නිදහස්" සමූහාණ්ඩුවාදීන්ගේ — ප්‍රංශුවන්ගේ සහ ඇමෙරිකානුන්ගේ — හමුද පොලිස් හේවායන් බවටත්, මිනී මරුවන් බවටත්, කුඩා සහ දුර්වල ජාතීන්ගේ ස්වාධීනත්වය සහ නිදහස නසා දමන්නන් බවටත් හරවා ගත් අති භයානක මෘගයෙකුගේ ස්වභාවය ගත්තේය. ඉංග්‍රීසි-ප්‍රංශ අධිරාජ්‍යවාදය කෙබඳුද යන්න ලෝක ඉතිහාසය විසින් අනුකම්පා විරහිත ලෙස, තරයේ හා අවංකවම හෙළිදරව් කරන ලදී. රුසියානු විප්ලවය සමාජවාදී විප්ලවයක් බවට පරිවර්තනය කිරීම විශ්වාස ගත නොහැකි දෙයක් නොවන බවත්, වෙනත් විකල්පයක් නොමැති හෙයින්, එය අවශ්‍යතාවයක් බවත්, ඉහත දී (කලින් වටහා ගත් පරිදි) තම රටේ යහපතට කෙළින්ම හේතු නොවන කිසිම දෙයක් ගැන ඇසීමට පවා නොකැමති වූ රුසියානු දේශප්‍රේමීන්ට ලෝක ඉතිහාසය විසින් ඔප්පු කර පෙන්වන ලදී. ලෝක සමාජවාදී විප්ලවය, ලෝක බොල්ෂෙවික්වාදය ජයග්‍රහණය නොකරන්නේ නම් ඉංග්‍රීසි-ප්‍රංශ අධිරාජ්‍යවාදය සහ ඇමෙරිකන් අධිරාජ්‍යවාදය අනිවාරණීය වශයෙන්ම රුසියාවේ ස්වාධීනත්වය හා නිදහස විනාශ කරනු ඇත.

ඉංග්‍රීසීන් කියන්නාක් මෙන් සත්‍ය කරුණු යටපත් කළ නොහැක. එසේම, ලෝක ඉතිහාසය ඉතා වැදගත් සන්ධිස්ථානයකට පැමිණ තිබෙන බව සලකුණු කරන කාරණා මෑත මාසවලදී අපි දුටුවෙමු. රුසියාවේ සුළු ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදීන් බොල්ෂෙවික්වාදයට වෛර කළත්, අපගේ පක්ෂ අභ්‍යන්තර අරගලය නිසා කාවැදුනු වෛරයක් එසේ ඔවුන් කළ ඇතත්, ප්‍රථමයෙන්ම බොල්ෂෙවික්වාදයට විරුද්ධත්වය දැක්වීමේ සිට මධ්‍යස්ථභාවය දක්වාද, ඊළඟට බොල්ෂෙවික්වාදයට ආධාර කිරීම දක්වාද හැරෙන සේ, මෙම කරුණු විසින් ඔවුන්ට බල කරනු ලැබේ. මෙම ප්‍රජාතන්ත්‍රවාදී දේශප්‍රේමීන් අප කෙරෙන් ඉවතට තල්ලු කළ වාස්තවික තත්වයන් දැන් අතුරුදහන් වී ගොසින්ය. දැන් ලෝකයේ පවත්නා තත්ත්වයන් ඔවුන්ට බලකරන්නේ අපවෙතට හැරෙන ලෙසට ය. පිතිරිම් සරෝකින් ඔහුගේ පෙරමුණ වෙනස් කිරීම අහම්බෙන් සිදු වූවක් නොවේ. එය මුළු පංතියක්ම, සමස්ත සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදයම අනිවාරණීය වශයෙන්ම පෙරමුණ වෙනස් කරන බව පෙන්වන සංකේතයකි. මෙම කරුණ සැලකිල්ලට ගෙන, එයින් ප්‍රයෝජන ගැනීමට අසමත් වන අයෙක් වෙතොත් ඔහු හොඳ සමාජවාදියෙක් නොවේ; මාක්ස්වාදියෙක් නොවේ.

එපමණක්ද නොවේ. සාමාන්‍ය වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි විශ්වාසය තැබීම හා එය සර්වාර්ථ සිද්ධකය ලෙස සැලකීමද, එය ධනපති ප්‍රජාතන්ත්‍රයක් බව හා එහි ප්‍රයෝජනවත් කම හා අවශ්‍ය කම ඓතිහාසික සීමාවන්ට යටත් බව වටහා ගැනීමට නොහැකි වීමද, සියළුම රටවල සුළු ධනේශ්වරයන් කෙරෙහි දශක ගණන් තිස්සේ සහ ශතවර්ෂ ගණන් තිස්සේ දක්නට ලැබුණු විශේෂ අංග ලක්ෂණයකි. ලොකු ධනපතියාගේ කට්ට සනකම ය. ධනපති ක්‍රම යටතේ පවතින කල්හි අන් සෑම රාජ්‍ය ආකෘතියක් මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවද නිර්ධන පංතිය මර්දනය කිරීමේ යන්ත්‍රයක් මිස අන් කිසිවක් නොවන බව ඔහු දනියි. සෑම ධනපති රාජ්‍ය යන්ත්‍රයකම සැබෑ නායකයන් හා ඉතාමත් ගැඹුරු, (එනිසාම, නිතරම පාහේ සැඟවී තිබෙන) උල්පත් සමග කිට්ටු සම්බන්ධකමක් ඇතිව සිටින ලොකු ධනපතියා මෙය දන්නේය. සුළු ධනපතියාගේ ආර්ථික තත්ත්වය නිසා ඔහුට මෙම සත්‍යය වටහා ගැනීම සාමාන්‍ය වශයෙන් වඩාත් අපහසු වන්නේය. එසේම ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව යනුවෙන් අදහස් කෙරෙන්නේ, "පිරිසිදු ප්‍රජාතන්ත්‍රවාදය" යයිද, "නිදහස් ජනතා රාජ්‍යයක්" යයි ද, පංතිමය නොවන හෝ පංති ඉක්මවූ හෝ ජනතා පාලනයක්, නැතහොත්, ජනතා කැමැත්තෙහි පිළිබිඹුවක් යයිද ආදී වශයෙන් වූ සංකල්පනා සන්තර්පනය කිරීමට පවා ඔහු පෙළඹෙයි. සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදියා තියුණු පංති අරගලයෙන්ද, ව්‍යාපාර වස්තු වෙළෙඳ පොළෙන්ද, "යථාර්ථ" දේශපාලනයෙන්ද, වඩාත් දුරස්තර තත්වයක සිටින නිසා, ඔහුගේ මෙම දුර්මත බැහැර කිරීම අනිවාරණීය වශයෙන්ම දුෂ්කරය. ඉතාමත් සීඝ්‍ර ලෙස හා ප්‍රචාරය මගින් පමණක් මෙම දුර්මත දුරලීමට අපේක්ෂා කිරීම මාක්ස්වාදය සමග කිසිසේත් නොගැලපෙන්නේය.

එහෙත් සීඝ්‍ර වේගයෙන් පෙරළී එන ඉතිහාසය යෝධ යකුළක් මෙන්ද, අසමසම සේ ප්‍රකර්ෂවත් අර්බුද මගින්ද ක්‍රියාත්මක වෙමින් සුපුරුදු හා ස්ථාපිත වූ සියල්ල පොඩි පට්ටම් කූර දමන විට, ඉතාමත් දුර්වාරණීය දුර්මතයන් පවා බිඳ වැටේ. ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය කෙරෙහි තබන බොළඳ විශ්වාසය හා "පිරිසිදු ප්‍රජාතන්ත්‍රවාදය" සමග "නිර්ධන පංති ආඥාදායකත්වය" සංසන්දනය කර බැලීමේ බොළඳ පුරුද්ද "සාමාන්‍ය ප්‍රජාතන්ත්‍රවාදියාගේ" සිත තුළ ස්වාභාවික හා අනිවාරණීය ලෙස හැඩ ගැසුනක් විය. එහෙත්, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයට පක්ෂ වූ අර්හාන්ගල්ස්ක්, සමාරා, සයිබීරියා හා දකුණු පෙදෙස්වල අය ලැබූ අත්දැකීම් නම්, ඉතාමත් දුර්වාරණීය දුර්මත පවා විනාශ කිරීමට සමත් වනු ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

උසස්ම ආදර්ශය කොටගන්නා ලද විල්සන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව ඉතාමත් නිර්ලජ්ජිත ලෙස දුර්වල හා කුඩා ජාතීන් පීඩාවට පත් කිරීමට හා යටපත් කිරීමට ඉතාමත් උන්මත්තක ස්වභාවයෙන් ක්‍රියා කරන අධිරාජ්‍යවාදයක් බව ව්‍යවහාරයෙන් ඔප්පු විය. සාමාන්‍ය "ප්‍රජාතන්ත්‍රවාදියා" මෙන්ෂෙවික්වරයා හා සමාජවාදී-විප්ලවවාදියා මෙසේ සිතීය. "වඩාත් උසස් රාජ්‍ය ආකෘතියකැයි කියන, කිසියම් සෝවියට් ආණ්ඩුවක් ගැන අපට හීනෙන්වත් සිතන්නට පුළුවන්ද? දෙවියෝ අපට සාමාන්‍ය ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක්වත් දෙත්වා!" සන්සන්දනීය වශයෙන් සාමකාමී "සාමාන්‍ය" කාලවලදී ඔහුට මෙම "බලාපොරොත්තුව" සිතින් අගේ කරමින් දශක ගණනක් කල් ගෙවන්නට පුළුවන් කම තිබුණි.

එසේ වුවද, ලෝක සිදුවීම් ඇති වී තිබෙන ආකාරය අනුව හා ඉංග්‍රීසි-ප්‍රංශ හා ඇමෙරිකානු අධිරාජ්‍යවාදීන් සමග සියළු රුසියානු රාජාණ්ඩුවාදීන් ඇති කරගත් සන්ධානය ආශ්‍රයෙන් ලබාගත් අමිහිරි පාඩම් අනුව ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව යනු ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් බව ව්‍යවහාරයෙන් ඔප්පු වී තිබේ. අධිරාජ්‍යවාදය විසින් ඉතිහාසය හමුවේ තබන ලද ගැටළු ගැන සලකා බලන කල, එය දැනටමත් යල් පැන ගිය ආණ්ඩුවකි. එක්කෝ සියළුම දියුණු රටවල සෝවියට් ආණ්ඩුව ජයග්‍රහණය කළ යුතුය. නැතහොත්, ඉතාමත් ප්‍රතිගාමී, ඉතාමත් දරුණු අධිරාජ්‍යවාදයක් වන හා ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩු ආකෘතිය මැනවින් උපයෝගී කර ගැනීමෙ කෘෘරහස්ත භාවයක් ලබා සිටින, එමෙන්ම, දුර්වල හා කුඩා ජාතීන්ගේ ගෙල මිරිකමින් ලෝකය මුළුල්ලේම ප්‍රතිගාමීත්වය ප්‍රතිෂ්ඨාපනය කරන ඉංග්‍රීසි ඇමෙරිකන් අධිරාජ්‍යවාදය ජයග්‍රහණය කරනු ඇත. වෙනත් විකල්පයක් නොමැති බව ඉහත සඳහන් ගැටළුවලින් පෙනේ.

එකක් නැතහොත් අනික.

මැද මාවතක් නැත. මෑතක් වන තුරුම, මෙය බොල්ෂෙවික්වරුන්ගේ අන්ධ භක්තික අදහසක් වශයෙන් සලකන ලදී.

එහෙත්, එය නිවැරදි බව ඔප්පු විය.

පිතිරිම් සරෝකින් ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයේ ඔහුගේ අසුන අත්හැර තිබේ නම්, එය හේතු විරහිතව සිදු වූවක් නොවේ. ඒ වූ කලී, මුළු පංතියක්ම පෙරමුණ වෙනස් කරන බව, සුළු ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදීන් පෙරමුණ වෙනස් කරන බව පෙන්වන සංකේතයකි. ඔවුන් අතර භේදයක් ඇතිවීම වැලැක්විය නොහැකිය. ඉන් එක කොටසක් අපේ පැත්තට එනු ඇත. තවත් කොටසක් මධ්‍යස්ථ වනු ඇත. ඉතිරි තුන්වැනි කොටස රුසියාව ඉංග්‍රීසි-ඇමෙරිකන් ප්‍රාග්ධනයට විකුණන හා විදේශ බයිනේත්තුවල ආධාරයෙන් විප්ලවය මර්දනය කිරීමට බලාපොරොත්තු වන රාජාණ්ඩුවාදී ව්‍යවස්ථානුකූල ප්‍රජාතන්ත්‍රවාදීන් සමග උවමනාවෙන්ම සම්බන්ධ

වනු ඇත. මෙන්ෂෙවික්වරුන් හා සමාජවාදී-විප්ලවවාදීන් අතර දක්නට ලැබෙන, බොල්ෂෙවික්වාදයට විරුද්ධත්වයෙන් ඉවත්ව ප්‍රථමයෙන් මධ්‍යස්ථ භාවයත්, ඊළඟට බොල්ෂෙවික්වාදයට ආධාර කිරීම දක්වා හැරීම සැලකිල්ලට ගනිමින්, එයින් ප්‍රයෝජන ගැනීම වර්තමානයේ ඉතාමත් හදිසි දේශපාලන කර්තව්‍යයන්ගෙන් එකකි.

පක්ෂය ජනතාව වෙත නිකුත් කරන සෑම සටන් පාඨයක්ම කලක දී පාෂාණීභූත හා අවලංගු තත්වයට පත්වන නමුත්, ඒවා ආවශ්‍යක කළ තත්වයන් වෙනස් වීමෙන් පසුව වුවද බොහෝ දෙනෙකුට ඒවා වලංගුව පවතී. මෙය වැලැක්වීමට නොහැකි අඩුපාඩුවකි. එහෙත් අපි එය වැලැක්වීමට, පරාජය කිරීමට උගෙන නොගන්නෙමු නම්, අප පක්ෂ ප්‍රතිපත්තියේ නිවැරදි භාවය සහතික කළ හැකි නොවේ. අපගේ නිර්ධන පංති විප්ලවයේදී මෙන්ෂෙවික්වරුන් හා සමාජවාදී-විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදීන් සමග අප ඉතාමත් තියුණු මත වෙනස්කම් ඇතිව සිටි කාලය ඓතිහාසික වශයෙන් අවශ්‍ය කාල පරිච්ඡේදයක් විය. මෙම ප්‍රජාතන්ත්‍රවාදීන් අපගේ සතුරන්ගේ කඳවුරට එකතු වී ධනපති හා අධිරාජ්‍යවාදී ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් පිහිටුවීමට කටයුතු කළ විට ඔවුනට විරුද්ධව තදබල අරගලයක් කිරීම නොවැලැක්විය හැකි අවශ්‍යතාවයක් විය. මෙම අරගලයේ සටන් පාඨ රැසක්ම දැන් සනාවී පාෂාණීභූත වී ඇත. මෙම ප්‍රජාතන්ත්‍රවාදීන් අතර පෙරමුණු මාරුවක් ආරම්භ වී තිබෙන, අහම්බෙන් නොව, ජාත්‍යන්තර තත්ත්වය තුළ ගැඹුරට මුල් විහිදුනු සහ අපගේ පැත්තට නැඹුරු වූ පෙරමුණු මාරුවක් ආරම්භවී තිබෙන නව කල පරිච්ඡේදය ගැන, නිසි ලෙස තක්සේරු කිරීමට හා එයින් සාර්ථක ලෙස ප්‍රයෝජන ගැනීමට හරස්වන, එම පාෂාණීභූත සටන්පාඨ බාධකයක් ලෙසට ක්‍රියාත්මක වේ.

මෙම පෙරමුණු මාරුවට අනුබල දීම හා පෙරමුණ මාරු කරන අය සමග අන්‍යොන්‍ය වශයෙන් ශුභපැතුම් හුවමාරු කර ගැනීම පමණක් ප්‍රමාණවත් නොවේ. එවැනි වෙනසක් ඇති වීමට බරපතල හා දූරගාමී ඓතිහාසික හේතු ඇතැයි යන්න අවබෝධ කරගත් දේශපාලනඥයෙක් තමා ඉටු කරන්නට උත්සාහ ගන්නේ කුමක්දැයි දන්නේ නම්,ඔහු සුළු ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී පොදු ජනතාවගේ විවිධ කොටස් හා කණ්ඩායම් අතර මෙම වෙනස ඇති කිරීමට උගත යුතුය. මර්දනය කළ යුත්තේ කවුද යන්නත්, එකඟත්වයක් ඇති කරගත යුත්තේ කවුරුන් සමගද, කුමණ අවස්ථාවකද හා කෙසේද යන්නත් විප්ලවවාදී නිර්ධන පංතිකයා දැන සිටිය යුතුය. විදේශීය අධිරාජ්‍යවාදී "මිත්‍රයන්ට" රුසියාව විකුණන ඉඩම් හිමියන්, ධනපතියන් හා ඔවුන්ගේ වන්දි භට්ටයින් මර්දනය කිරීම සඳහා ඔවුනට විරුද්ධව ත්‍රස්තය උපයෝගී කර ගැනීමෙන් වැලකී සිටීම විහිළු-

https://liberationbase.wordpress.com

වක් හා අන්ත මෝඩ කමක් වන්නේය. ඔවුනට ''කරුණු අවබෝධ කර දීමට'', නැතහොත්, පොදුවේ ''මානසික වශයෙන් බලපෑමට'' ප්‍රයත්න දැරීම අර්ථයක් නැති බොරු වැඩක් වනු ඇත. එහෙත් සුළු ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදීන් අප වෙතට හැරෙන සේ සිදුවීම් විසින් ඔවුන්ට බල කෙරෙන විට ඔවුන් සම්බන්ධයෙන් මර්දනයේ හා ත්‍රස්තයේ උපක්‍රම පමණක් යොදා ගැනීමට උවමනාවක් දැක්වීම ඊට වඩා, නැතහොත්, ඊට සමාන විහිළුවක් හා අන්ත මෝඩකමක් වේ.

නිර්ධන පංතියට මෙම ප්‍රජාතන්ත්‍රවාදීන් සෑම තැනකදීම හමුවේ. ගම්බද දිස්ත්‍රික්කවල අපගේ කර්තව්‍යය වී තිබෙන්නේ, ඉඩම් හිමියා විනාශ කිරීම හා සූරා කන්නාගේත්, කුලාක ලාභගරන්නාගේත් ප්‍රතිරෝධනය පොඩි පට්ටම් කර දැමීමය. මෙම කටයුත්තෙහිදී අපට සැකයෙන් තොරව විශ්වාසය තැබිය හැක්කේ අර්ධ නිර්ධනයන්, එනම්, ''දුප්පත් ගොවියන්'' කෙරෙහි පමණකි. මධ්‍යම ගොවියා අපගේ සතුරෙක් නොවේ. ඔහු වැනුණේය. දැනුදු වැනෙන්නේය. ඉදිරියේදීත් වැනෙනු ඇත. වැනෙන්නා කෙරෙහි බල පෑමත්, සූරා කන්නා පෙරළා දැමීම සහ ක්‍රියාත්මක සතුරා පරාජය කිරීමත් යන්න එකම කර්තව්‍යයක් නොවේ. ඉහත විස්තර කරන ලද හේතු අනුව, මධ්‍යම ගොවීන් අප පැත්තට හැරීම දැන් අනිවාරණීය වන නිසා, මෙම අවස්ථාවේ ඉටු කළ යුතු කර්තව්‍යය වී තිබෙන්නේ මධ්‍යම ගොවියා සමග එකඟත්වයක් ඇති කර ගැනීමය. එසේ කිරීමේදී, කුලාකයාට විරුද්ධව කරන සටන මොහොතකට හෝ අත් නොහැරිය යුතු මෙන්ම, ස්ථිර විශ්වාසය තැබිය යුත්තේද දුප්පත් ගොවියා කෙරෙහි පමණකි.

හස්ත කාර්මිකයාටද, ශිල්පියාටද, වැඩි වශයෙන් සුළු ධනපති තත්ත්වයක් ගන්නා, නැතහොත්, සුළු ධනපති අදහස් දරන කම්කරුවාටද, එමෙන්ම, කාර්යාල සේවකයන් හා හමුදා නිලධාරීන් බොහෝ දෙනෙකුටද, විශේෂයෙන්ම, පොදු වශයෙන් බුද්ධිමතුන්ටද, මෙය අදාළ වන්නේය. මෙම කොටස් අතර සිදුවන පෙරමුණු මාරුව උපයෝගි කර ගැනීමට අප පක්ෂය අසමත් වන අවස්ථා නිතර දක්නට ලැබෙන බව ඉතා පැහැදිලි කරුණකි. මෙම අසමර්ථ කම කෙළවර කළ හැකිය. එමෙන්ම කෙළවර කළ යුතුය.

වෘත්තීය සමිති තුළ සංවිධානය වූ නිර්ධන පංතිකයන්ගේ අති බහුතරයක සහයෝගය අපට ලැබෙන්නේය. අප වෙතට හැරෙමින් සිටින අඩුවෙන්ම නිර්ධන පංතික වන සහ වැඩියෙන්ම සුළු ධනේශ්වර වන වැඩ කරන ජනයා පොදු සංවිධානයට ඇතුළත් කිරීමටත්, ඔවුන් පොදු නිර්ධන පංතික විනයට යටත් කිරීමටත්, අපි උගත යුත්තෙමු. මෙහිදී තත්වානුකූල සටන් පාඨය වන්නේ, මෙම කොටස්වලට විරුද්ධව සටන්

LIBERATIONBASE

කිරීම නොව, ඔවුන් දිනා ගැනීමය. ඔවුන් කෙරෙහි බලපෑමටත්, වැනෙන අයට කරුණු අවබෝධ කර දීමටත්, මධ්‍යස්ථ තත්වයක සිටින අයගෙන් ප්‍රයෝජන ගැනීමටත්, පස්සෙන් ඇදෙන, නැතහොත්, ''ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය'' හෝ ''දේශප්‍රේමී ප්‍රජාතන්ත්‍රවාදය'' හෝ පිළිබඳ මායා මතවලින් ඉතා මෑතදී නිදහස් වන්නට පටන් ගත් අයට පොදුජන නිර්ධන පංති බලපෑම මගින් අධ්‍යාපනයක් දීමටත් අප සමත් විය යුතුය.

වැඩ කරන ජනතාව අතරින් අපට ප්‍රමාණවත් තරම් ස්ථිර සහයෝගයක් දැනටමත් ලැබෙන්නේය. හයවැනි සෝවියට් සභා සම්මේලනයෙන් මෙය සක්සුදක් සේ පැහැදිලි විය[88]. අපි ධනපති බුද්ධිමතුන්ට බිය නොවමු. එහෙත්, ඔවුන් අතර සිටින කඩාකප්පල් කාරයන්ටත්, සුදු හමුදාවලටත් විරුද්ධව කරන අරගලය අපි මොහොතකටවත් නොනවත්වන්නෙමු. එසේ වුවත් මෙම අවස්ථාවේ සටන් පාඨය වන්නේ, අප කෙරෙහි දක්වන ඔවුන්ගේ ආකල්පය සම්බන්ධයෙන් ඔවුනතර ඇතිවෙමින් තිබෙන වෙනස ප්‍රයෝජනයට ගනිමු යන්නය. සෝවියට් පාලනයේ තැන්වලට රිංගා ගත් ඉතාමත් නරක ධනපති විශේෂඥයන් බොහෝ දෙනෙක් තවමත් සිටිති. ඔවුන් ඉවතට ඇද දමා, ඒ වෙනුවට, ඊයේ අපගේ ඒකාන්ත සතුරන්ව සිටි හා දැනට මධ්‍යස්ථ තත්ත්වයක් පමණක් දරන විශේෂඥයන් පත් කිරීම ඉතාමත් වැදගත් කර්තව්‍යයන් අතුරෙන් එකක් වන්නේය. එය, ''විශේෂඥයන්'' සමග සම්බන්ධකම් ඇති සෑම සෝවියට් කාරක වරයෙකුගේම, සෑම උද්ඝෝෂකයෙකුගේ, ප්‍රචාරකයෙකුගේ හා සංවිධායකයෙකුගේම කර්තව්‍යය වන්නේය.

සංකීර්ණ හා වේගයෙන් වෙන්ස්වන තත්වයන් යටතේ ඉටු කරන වෙනත් සෑම දේශපාලන කටයුත්තක් සඳහා මෙන්ම, මධ්‍යම ගොවියා සමගත් ඊයේ මෙන්ෂෙවික්වරයෙක්ව සිටි කම්කරුවා සමගත්, ඊයේ කඩාකප්පල්කාරයෙක්ව සිටි කාර්යාල සේවකයා හා විශේෂඥයා සමගත්, එකඟත්වයක් ඇතිකර ගැනීම සඳහා සෑහෙන තරම් දක්ෂකමක් තිබීම අවශ්‍ය බව ඇත්තකි. මෙහිදී ප්‍රධාන වන්නේ අප කලින් ලබාගත් පළ පුරුද්දෙන් සැනසී නොසිට, සෑම තත්වයක්ම යටතේ වැඩ කරගෙන යාමත්, සියළු තත්වයන් යටතේම තව තවත් විශාල යමක් සඳහා ප්‍රයත්න දැරීමත්, සෑම තත්වයක්ම යටතේ සරල කර්තව්‍යවල සිට දුෂ්කර කර්තව්‍යයන් කරා ඉදිරියට යාමත්ය. නො එසේ නම්, කිසිම ප්‍රගතියක් ලැබිය හැකි නෙවේ; විශේෂයෙන්ම සමාජවාදය ඉදිකිරීමේ ප්‍රගතියක් ඇතිකරගත හැකි නොවේ.

පසුගිය දිනක, ණය දෙන සමූපකාර සමිති සම්මේලනයක නියෝජිත පිරිසක් මා හමුවීමට පැමිණියහ. ණය දෙන සමූපකාර බැංකුව සමූහාණ්ඩුවේ මහජන බැංකුව සමග ඒකාබද්ධ කිරීමට විරුද්ධත්වය ප්‍රකාශ කරන

https://liberationbase.wordpress.com

සම්මේලනයේ යෝජනාව[89] ඔවුහු මට පෙන්වූහ. මා මධ්‍යම ගොවීන් සමග එකඟත්වයක් ඇති කරගැනීමට පක්ෂ බවත්, සමූපකාරයන් බොල්ෂෙවික්වරුන්ට විරුද්ධ තත්වයේ සිට මධ්‍යස්ථ තත්වයක් ගන්නා පරිද්දෙන් වුවද ඔවුන්ගේ ආකල්පය වෙනස්කිරීම මා උසස් ලෙස අගය කරන බවත්, එහෙත් එකඟත්වයක් ඇති කරගැනීම සඳහා පදනමක් කොට ගත හැක්කේ, ඔවුන්ගේ විශේෂ බැංකුව සමූහාණ්ඩුවේ එකම බැංකුව සමග ඒකාබද්ධ කිරීමට ඔවුන්ගේ කැමැත්ත දීමෙන් පමණක් බවත්, මම ඔවුනට කීවෙමි. එවිට එම නියෝජිතයෝ ඔවුන්ගේ යෝජනාව වෙනුවට වෙනත් යෝජනාවක් ආදේශ කළහ. ඔවුහු එය සම්මේලනයෙන් අනුමත කරවා ගත්හ. ඒකාබද්ධ කිරීමට විරුද්ධ සියල්ල එයින් ඉවත් කර තිබිණි. එහෙත්... එහෙත්, ඔවුන් යෝජනා කර තිබුණේ, සමූපකාරකයන්ගේ විශේෂ ණය සංගමයක් සඳහා සැලැස්මකි. එය කිසි ලෙසකින්වත් විශේෂ බැංකුවට වඩා වෙනස් නොවූවකි! එසේ කිරීම විහිළුවකි. එවැනි වචන හරඹයකට රැවටෙන්නේ මෝඩයෙක් පමණකි. එහෙත්, එවැනි එක... ''ප්‍රයත්නයක්'' ''අසාර්ථක වීම'' අපගේ ප්‍රතිපත්තියට කිසිසේත් බාධාකාරී නොවේ. අපි සමූපකාරකයන් හා මධ්‍යම ගොවීන් සමග එකඟත්වයක් ඇති කර ගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කෙළෙමු — අනුගමනය කරන්නෙමු. ඒ අතරම අපි සෝවියට් ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා සෝවියට් සමාජවාදී නිර්මාණ කටයුතු වෙනස් කිරීමට දරන සියළු ප්‍රයත්නයන්ද මඩින්නෙමු.

සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන් වැනෙනසුලු භාවයක් දැක්වීම අනිවාරණීය දෙයකි. චෙක්වරුන් ජයග්‍රහණ කීපයක් ලබාගත් පමණින් සන්ත්‍රාසයෙන් කුලප්පුවූ මෙම ප්‍රජාතන්ත්‍රවාදීහු, ඔවුන්ගේ සන්ත්‍රාසය පතුරුවා හැරීමටත්, ''දිනුම්'' පැත්තට පැන ගැනීමටත්, නින්දිත ආකාරයෙන් හෝයියා කියා ඔවුන් පිළිගැනීමටත් සූදානම් වූහ. දැන් වුවද, නිදර්ශනයක් වශයෙන්, ඉංග්‍රිසි-ඇමෙරිකන් ක්‍රස්නොව් සුදු හමුදව ලබන කිසියම් අර්ධ ජයග්‍රහණයක් වුවද, මෙම ප්‍රජාතන්ත්‍රවාදීන් අතර අනිත් අතට වැනීමක් පටන් ගැනීමත්, සන්ත්‍රාසය වැඩි වීමත්, සන්ත්‍රාසය පැතිර වීමේ, ද්‍රෝහී වීමේ සහ අධිරාජ්‍යවාදීන් පැත්තට පැනයාමේ අවස්ථා වැඩි වීමත්, යනාදිය සඳහා ප්‍රමාණවත් වන බව අප මොහොතකටවත් අමතක නොකළ යුතුය.

අපි එය දන්නෙමු. අපි එය කිසි කලෙකත් අමතක නොකරන්නෙමු. සෝවියට් ආණ්ඩුව සඳහා අප දිනාගෙන තිබෙන, එසේම, අර්ධනිර්ධන පංතිකයන්ගේ ආධාරය ලබන, පිරිසිදු නිර්ධන පංති පදනම ශක්තිමත්ව හා දැඩිව පවතිනු ඇත. අපගේ හමුදව අචලය. ඒ බව අපි දැනටමත් පළ පුරුද්දෙන් දන්නෙමු. එසේ වුවද, බරපතල ලෝක ඓතිහාසික වෙනස්කම් විසින්, පක්ෂයෙන් බාහිර මෙන්ෂෙවික් හා සමාජවාදී-විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදී ජනයා අප වෙතට හැරෙන සේ ඔවුනතර අනිවාරණීය වෙනස්වීම් ඇතිකෙරෙන කල, මෙම පෙරමුණ වෙනස් කිරීමෙන් ප්‍රයෝජන ගැන්මටත්, එයට අනුබල දීමටත්, විවිධ ජන කණ්ඩායම් හා කොටස් අතර එම වෙනස ඇති කරවීමටත්, ඔවුන් සමග එකඟත්වයක් ඇති කර ගැනීමට හැකි සියල්ලක්ම කිරීමටත්, එමගින් සමාජවාදය ගොඩනැගීම පහසු කිරීමටත්, සමාජවාදයේ ජයග්‍රහණය ප්‍රමාද කරන ආර්ථික කැඩුම් බිඳුම්, අවිද්‍යාව හා අදක්ෂතාවයන් නිසා වැටෙන බර අඩු කිරීමටත් අපි උගත යුත්තෙමු — උගෙන ගන්නෙමු.

1918 නොවැම්බර් 20 දින ලියන ලදී

1918 නොවැම්බර් 21 දින, ''ප්‍රාව්ද'', අංක 252 හි පළ කරන ලදී

වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 37, පිටු 188-197

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සංස්කාරකගේ සටහන්

1 එන්. ඒ. නෙක්‍රාසව්ගේ, "රුසියාවේ හොඳින් ජීවත්වන්නේ කවුද" නැමැති පද්‍ය ග්‍රන්ථයෙනි.

2 මෙහි සඳහන් වන්නේ 1918 මාර්තු මස ඉතාමත් අවාසි සහගත හා අහිතකාරී තත්වයන් යටතේ සෝවියට් රුසියාව ජර්මනිය සමග අත්සන් කරන ලද බ්‍රෙස්ට් සාම ගිවිසුම ගැනය.

3 1807 ජූලි මස ප්‍රංශය, ප්රුසියාව සමග අත්සන් කරන ලද ටිල්සිට් සාම ගිවිසුම නිසා ප්රුසියාවට අසීරු හා අවමාන සහගත තත්වයකට මුහුණ දීමට සිදුවිය. එයට විශාල භූමි ප්‍රමාණයක් අහිමි විය. ප්‍රැන්ක් කෝටි දහයක කප්පම් මුදලක් ප්‍රංශයට ගෙවන ලදී. ගිවිසුම අනුව තම හමුදව සොල්දදුවන් 40 දහසක් දක්වා අඩු කිරීමට සිදුවිය. නැපෝලියන්ගේ අන පරිදි ඔහුට අතිරේක හමුද සැපයීමට හා එංගලන්තය සමග වෙළදාම නතර කිරීමට එය බැඳී සිටියේය.

4 "අති විශේෂ හතරවැනි සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනය" — බ්‍රෙස්ට් ලිටොව්ස්ක් සාම ගිවිසුම අනුමත කිරීම පිළිබඳ තීරණය කිරීම සඳහා 1918 මාර්තු 14–16 දිනවල මොස්කව් නුවරදී රැස්විය.

සම්මෙලනයට පූර්ණ ඡන්ද බලය අයිති නියෝජිතයෝ 1232 සහභාගි වූහ. ඔවුන්ගෙන් 795 ක් බොල්ෂෙවික්වරුද 283 ක් වාම සමාජවාදී විප්ලවවාදීහු ද 25 ක් මධ්‍යම වාම සමාජවාදීහුද, 21 මෙන්ෂෙවික්වරුද 11 මෙන්ෂෙවික් ජාත්‍යන්තරවාදීහු හා අනෙක් අයද වූහ. සම්මේලන සභාවේදී, සාම ගිවිසුම අනුමත කිරීම; පෙත්‍රොගැඩ්වල සිට මොස්කව්වලට අගනුවර මාරු කිරීම; "විධිසික්" තෝරා පත් කිරීම ආදී ප්‍රශ්න සාකච්ඡාවට භාජනය කෙරිණ. විදේශ කටයුතු භාර මහජන උප

https://liberationbase.wordpress.com

කොමිසාර්වර ජී. වී. චිචෙරින් සාම ගිවිසුම ගැන සභාවට දනුම් දුන් පසු එම ප්‍රධාන ප්‍රශ්නය ගැන සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාව (වට්සික්) වෙනුවෙන් වී. අයි. ලෙනින් වාර්තාවක් ඉදිරිපත් කළේය. සාම ගිවිසුම අත්සන් කිරීමට විරුද්ධව වාම සමාජවාදී-විප්ලව-වාදී කණ්ඩායම වෙනුවෙන් බී. ඩී. කම්කොව් ද වාර්තාවක් ඉදිරිපත් කළේය.

බ්‍රෙස්ට් සාම ගිවිසුමට, මෙන්ෂෙවික්වරුද දක්ෂිණාංශික හා වාමාංශික සමාජවාදී-විප්ලවවාදීහුද මැක්සිමලිස්ට්වරුද ආරාජිකවාදීහු හා වෙනත් අයද සමගි පෙරමුණක් ලෙස විරුද්ධ වූහ. තියුණු වාද විවාද වලට පසු නම් කැඳවා කරන ලද ඡන්ද විමසීමකින් පසුව සාම ගිවිසුම අනුමත කිරීමේ ලෙනින්ගේ යෝජනාව බහුතර ඡන්ද සංඛ්‍යාවකින් සම්මත විය. සාම ගිවිසුම සම්මත කිරීම නිසා වාම සමාජවාදී-විප්ලවවා-දීහු මහජන කොමිසාර් මණ්ඩලයෙන් ඉවත් වූහ. සාම ගිවිසුමක් අත්සන් කිරීම නිසා රටේ ආරක්ෂාවට හා විප්ලවයේ ජයග්‍රහණයට හානි සිදුවන්-නේ යයි විශේෂ ප්‍රකාශනයක් ඉදිරිපත් කළ ''වාම කොමියුනිස්ට්වාදීහු ඡන්දය විමසීමට සහභාගි නොවූහ. සාම ගිවිසුම අනුමත කිරීමට ඡන්දය දීනේ වැලකී සිටීම මගින් ''වාම කොමියුනිස්ට්වාදීහු'' පක්ෂයේ හත්වැනි සම්මේලනයේ හා අතිවිශේෂ හතරවැනි සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනයේ කොමියුනිස්ට් කණ්ඩායමේ තීරණ ද සම්මේලනය දිනවල පැවැත්වූ පක්ෂ මධ්‍යම කාරක සභාව ගත්, සාම ගිවිසුම අනුමත කිරීමට විරුද්ද වීම වැලැක්වීමට ගත් තීරණයද කඩ කළහ.

රටේ අගනුවර වශයෙන් මොස්කව් නම් කළ සම්මේලනය මධ්‍යම විධායක කාරක සභාවට නියෝජිතයින් 200 ක් පත්කර ගත්තේය.

සාම ගිවිසුම අනුමත කිරීමට සම්මේලනය ගත් තීරණය ප්‍රාදේශීය සෝවියට් සභාද පක්ෂ සාඛාද පොදු ජනතාවද විසින් එම දිනවලදී පවත්වන ලද රැස්වීම් හා සභා මගින් අනුමත කරන ලදී.

5 මෙහි දී සඳහන් කෙරෙන්නේ කම්කරු ගොවිජන සහ සොල්දදු සෝවි-යට් සභා තුළ නියෝජිතයන් ඇතිව සිටි මෙන්ෂෙවික් සහ සමාජවාදී විප්ලවවාදීගේ සුළු ධනපති පක්ෂ ගැනය. එහෙත් කල් නොගොස්ම මෙන්ෂෙවික්වරු සහ සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදීහු ප්‍රතිවිප්ලවවාදී මාර්-ගයට පිවිසියහ, ප්‍රතිවිප්ලවවාදී සමාජවාදී-විප්ලවවාදී (දක්ෂිණාංශික හා මධ්‍යම) හා මෙන්ෂෙවික් පක්ෂවල නියෝජිතයන් ''වට්සික්'' සභාවෙන් හා ප්‍රාදේශීය සෝවියට් සභාවලින් නෙරපා දැමීමට තීරණය කල ''වට්සික්'' සභාව එම තීරණය ''ඉස්වෙස්තිය වට්සික්'' නො 123 හි ජූනි 18 වැනි දින ප්‍රසිද්ධ කරන ලදී.

6 එස්ඒර්වරු (සමාජවාදී-විප්ලවවාදියෝ) — රුසියාවේ සුළු ධනවාදී පක්ෂයකි. 1901 අගදී සහ 1902 මුලදී මෙම පක්ෂය බිහිවිය. අධිරාජ්‍ය-වාදී ලෝක යුද්ධය කාලයේ දී (1914–1918) එස්ඒර් බහුතරය සමාජ-ජාතෝන්මාදවාදී පිළිවෙතක් ගෙන ගියහ. 1917 පෙබරවාරි මස ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ ජයග්‍රහණයෙන් පසුව එස්ඒර්වරු මෙන්ෂෙවි-ක්වරු හා කැඩෙට්වරු සමග ප්‍රතිවිප්ලවවාදී තාවකාලික ආණ්ඩුවේ ආධාර කරුවෝ වූහ. එහි නායකයෝ එම රජයේ සාමාජිකයෝ වූහ. ඉඩම් හිමියන්ගේ ඉඩම් අයිතිය අහෝසි කිරීම වැනි ගොවි ජනතා ඉල්ලීම් එස්ඒර් නායකයින් විසින් ඉවත ලන ලදී. ඔවුහු ඉඩම් හිමියන්-ගේ ඉඩම් අල්ලාගත් ගොවීන්ට විරුද්ධව මර්ධනකාරී හමුද මෙහෙය-වූහ. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු එස්ඒර්වරු ඉඩම් හිමියන්, ධනපතියන් හා විදේශීය ආක්‍රමණිකයින් සමග එකතුව සෝවියට් රජයට විරුද්ධව සටන් කළහ.

මෙන්ෂෙවික්වරු — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය තුළ වූ අවස්ථාවාදී උපනතියක සාමාජිකයෝ. 1903 දී පවත්වන ලද රු. ස. ප්‍ර. ක. පක්ෂයේ දෙවැනි සම්මේලනයේදී පක්ෂයේ මධ්‍යම සංවිධානවලට ඡන්දය විමසීමේදී ලෙනින්ගේ ප්‍රධානත්වයෙන් යුත් විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට ඡන්ද බහුතර සංඛ්‍යාවක්ද අවස්ථාවාදීන්ට ඡන්ද අල්පතර සංඛ්‍යාවක්ද ලැබිණ. එතැන් සිට ලෙනින්වාදී පිළට බොල්ෂෙවික්වාදීන් (බහුතරය) හා අවස්ථාවාදී පිළට මෙන්ෂෙවික්වා-දීන් (අල්පතරය) යන හැඳින්වීම් ලැබිණ.

1905–1907 විප්ලව සමයේදී විප්ලවයකදී කම්කරු පංතියට ඇති නායකත්වයටද කම්කරු පංතිය හා ගොවි ජනතාව අතර සමගියට ද මෙන්ෂෙවික්වරු විරුද්ධ වූහ. ඔවුන්ගේ අදහස අනුව විප්ලවයකදී නායකත්වය ගත යුතු වූ ලිබරල් ධනපති පංතිය සමග සමගියකට කම්ක-රුවන් පැමිණිය යුතු යයි ඔවුහු කියා සිටියහ. 1905–1907 විප්ලවය පරාජය වීමත් සමග ප්‍රතිගාමීත්වය ඉස්මතු වූ අවස්ථාවේ බහුතරය මෙන්ෂෙවික්වරු ලික්විඩේටර්වරුන් බවට පත්වූහ. කම්කරු පංතියේ විප්ලවවාදී නීතිවිරෝධී පක්ෂය විසුරුවා හරින ලෙස ඔවුහු ඉල්ලා සිටියහ.

1917 පෙබරවාරි මාසයේදී ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය ජය-ගැනීමෙන් පසුව මෙන්ෂෙවික්වරු ධනපති තාවකාලික රජයට ඇතුළු වූහ. ඔවුහු එහි අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිවලට ආධාර දෙමින් සූදනම් වෙමින් තුබූ සමාජවාදී විප්ලවයට විරුද්ධව කටයුතු කළහ.

1917 ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු මෙන්ෂෙවික්වරු සෝවියට් රජය පෙරලා දැමීම සඳහා කුමන්ත්‍රණ හා කැරළි සංවිධානය කරන ප්‍රතිවිප්ලවවාදී පක්ෂයක් ලෙස විවෘතවම පෙනී සිටියහ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

7 මෙහි සඳහන් වන්නේ තාවකාලික ආණ්ඩුව විසින් 1918 අප්‍රියෙල් 18 වැනි දින (මැයි 1) මිත්‍ර රාජ්‍යයන්ට යවන ලද විදේශ ඇමති කැඩෙට්වාදී පී. එන්. මිල්යුකොවගේ ලිපිය නිසා පැන නැගි අප්‍රියෙල් දේශපාලන අර්බුදය ගැනය. සාර් රජය විසින් ඇතිකර ගන්නා ලද සම්මුතිවලට එකඟව ක්‍රියාකරන බවත් යුද්ධය ජයග්‍රාහී අවසානයක් දක්වා කරගෙන යන බවත් එම ලිපියෙන් තාවකාලික රජය පොරොන්දු විය. තාවකාලික රජයේ එම අධිරාජ්‍යවාදී ප්‍රතිපත්ති නිසා වැඩ කරන ජනතාවැව කැළඹිල්ලට පත්වූහ. අප්‍රෙල් 21 (මැයි 4) බොල්ෂෙවික් පක්ෂයේ නායකත්වය යටතේ පෙට්‍රොග්‍රෑඩ් කම්කරුවෝ සාමය ඉල්ලමින් පෙළපාලි පැවැත්වූහ. එම පෙළපාලිවටට ලක්ෂයට වඩා කම්කරුවෝ හා සොල්දාදුවෝ සහභාගි වූහ. මොස්කව්, උරාල් උක්‍රයිනා හා වෙනත් නගර හා ප්‍රදේශවලද විරුද්ධත්වය දැක්වීමේ පෙළපාලි හා රැස්වීම් පවත්වන ලදී. බොහෝ නගරවල සෝවියට් සභාවලින් පෙට්‍රොග්‍රෑඩ් සෝවියට් සභාව වෙත මිල්යුකොව්ගේ ලිපියට විරුද්ධව යෝජනා හා ප්‍රකාශන ගලා ආහ.

අප්‍රියෙල් පෙළපාලි විසින් රාජ්‍ය අර්බුදයට මුල්ගල් තබන ලදී. පොදු ජනතාවගේ බලපෑම නිසා විදේශ ඇමති පී. එන්. මිල්යුකොව්ට හා යුද්ධ ඇමති ඒ. අයි. ගුච්කොව්ට ද විශ්‍රාම යෑමට සිදුවිය. මැයි 5(18) දින පළමුවැනි සභාග රජය පිහිටුවන ලදී. එම රජයට ධනපති ඇමතිවරුන් 10 ක් සමග එස්ආර් පක්ෂයෙන් ඒ. එෆ්. කෙරෙන්ස්කි හා වී. එම්. චෙර්නොව්ද මෙන්ෂෙවික් පක්ෂයෙන් අයි. ජී. ට්සෙරතේලි හා එම්. අයි. ස්කෝබෙලෙව් ද ඇතුලත් වූහ. ධනපතීන්ගේ පැත්ත ගත් එස්ආර්වරුන් හා මෙන්ෂෙවික්වරුන් විසින් ධනපති තාවකාලික රජය ආරක්ෂා කරන ලදී.

8 ධනපති තාවකාලික රජයේ අන පරිදි 1917 ජූනි 18 (ජූලි 1) රුසියානු හමුදාව යුද පෙරමුණේ සටන් ආරම්භ කළේය. එය මරණීය ලෙස පරාජයට පත් විය.

9 ජූලි 3–4 (16–17) දිනවලදී, තාවකාලික රජයේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්ති නිසා කෝපයට පත්ව සිටි පොදු ජනතාව විසින් පෙට්‍රොග්‍රෑඩ්වල පෙළපාලි පවත්වන ලදී. එම පෙළපාලි අවිගත් නැගිටීමක් දක්වා වර්ධනය වීමට ඉඩ තිබිණ.

එම අවස්ථාවේදී විප්ලවවාදී අර්බුදය රට තුළ මෝරා ගොස් නොතිබූ නිසාද යුද හමුදාව හා පළාත්බද පොදු ජනතාව අගනුවර සිදුවන කැරැල්ලකට ආධාර දීමට සූදානම්ව නොසිටි නිසාද අවිගත් නැගිටීමකට බොල්ෂෙවික් පක්ෂය විරුද්ධ විය. එහෙත් අවිගත් නැගිටීම ආරම්භ විය. එය නැවැත්වීමට අවකාශ නොතිබිණි. නැගී සිටීමට සංවිධානාත්මකභාවය හා සාමකාමී ස්වරූපය දීම සඳහා එයට සහභාගී වීමට බොල්ෂෙවික්වරු තීරණය කළහ. පෙළපාලි කරුවෝ සියලුම බලය සෝවියට් සභාවෙත පවරන ලෙස ඉල්ලා සිටියහ. එහෙත් සෝවියට් සභාවල නායකත්වය ගෙන සිටි මෙන්ෂෙවික් හා එස්ආර්වරු රාජ්‍ය බලය ලබාගැනීම ප්‍රතික්ෂේප කළහ.

මෙන්ෂෙවික්-එස්ආර් මධ්‍යම විධායක කාරක සභාවේ අනුමැතිය ඇතිව තාවකාලික ආණ්ඩුව පෙළිපාළිය මර්ධනය කිරීම සඳහා ජුන්කර්වරු හා ප්‍රතිවිප්ලවවාදී කොසැක් හමුදා යෙදවූවේය. ඔවුහු පෙළපාළියට වෙඩි තැබූහ. යුද පෙරමුණෙන්ද ප්‍රතිගාමී යුද හමුදා ගෙන්වන ලදී.

ජූලි 4(17) රාත්‍රියේදී මධ්‍යම කාරක සභාවේ හා පක්ෂ කමිටුවල සාමාජිකයෝ සංවිධානාත්මක ලෙස පෙළපාලි නැවැත්වීමට තීරණය කළහ. එය, නියම වේලාවට පසුබැසීම හා විප්ලවයේ ප්‍රධාන බලවේග විනාශවීමෙන් ආරක්ෂා කිරීම කළ හැකි වූ පක්ෂයේ නිවැරැදි පියවරක් විය.

පෙළපාලි මැඩලීමෙන් පසුවද තාවකාලික රජය බොල්ෂෙවික් මුද්‍රණාල විනාශ කිරීම හිරභාරයට ගැනීම, සෝදිසි, යුදෙව් සංහාරය වැනි මර්ධන කාරී ක්‍රියා දිගටම කරගෙන ගියේය. මෙන්ෂෙවික්වරු හා එස්ආර්වරුද ඇත්ත වශයෙන් ප්‍රතිවිප්ලවවාදී වදකයින් බවට පත්වූහ.

10 මෙහි සඳහන්වන්නේ 1917 අගෝස්තුවල ධනපතීන් හා ඉඩම් හිමියන් සංවිධානය කළ ත්‍රස්තවාදී ක්‍රියාවක් වූ කර්නිලව් කැරැල්ල ගැනය. කැරැල්ලට නායකත්වය දුන්නේ සාර් හමුදාවේ ජෙනරල් වරයෙකු වූ හමුදා ප්‍රධාන අනදෙන නිලධාරී කර්නිලව් විසිනි. මෙම කුමන්ත්‍රණකරුවන්ගේ අරමුණ වූයේ පෙට්‍රොග්‍රෑඩ් අල්ලා ගැනීම, බොල්ෂෙවික් පක්ෂය විනාශ කිරීම, සෝවියට් සභා විසුරුවා හැරීම, රට තුළ යුද්ධ ආඥාදායකත්වය පිහිටුවීම හා නැවතත් රාජාණ්ඩුවක් පිහිටුවීමය. කැරැල්ල ආරම්භ වූයේ අගෝස්තු 25 (සැප්තැම්බර් 7) දින දීය.

බොල්ෂෙවික් පක්ෂයේ ඉල්ලීම පරිදි පෙට්‍රොග්‍රෑඩ් කම්කරුවෝද විප්ලවවාදී සොල්දාදුවෝ හා සේලරුවෝද කැරැලිකරුවන්ට විරුද්ධව නැගී සිටියහ. අගනුවර කම්කරුවන්ගෙන් රතු ආරක්ෂක හමුදා කණ්ඩායම් පිහිටුවන ලදී. සමහර ප්‍රදේශවල විප්ලවවාදී කමිටු පිහිටුවන ලදී. කර්නිලව් හමුදාවේ ඉදිරි ගමන නවත්වන ලදී. බොල්ෂෙවික්වරුන්ගේ උද්ඝෝෂණය නිසා එම හමුදාව කැලිවලට කැඩී යාමට පටන්ගත්තේය. පොදු ජනතාවගේ බලපෑම යටතේ, කර්නිලව් හා ඔහුගේ ආධාර කරුවන්

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

සිරභාරයට ගැනීම සඳහා නියෝග නිකුත්කිරීමට තාවකාලික ආණ්ඩුවට සිදුවිය. ඔවුන් උසාවිය ඉදිරියට පමුණුවන ලදී.

11 කොසැක්වරු — ප්‍රවේණිදස වැඩවසම් ක්‍රමයේ වියගසෙන් නිදහස්වී පැන ගිය ගොවීන් හා නගරබද දුප්පත් ජනතාව. රුසියාවේ ඈත ප්‍රදේශවල පදිංචිවූ මොවුහු මුල් කාලයේ නිදහස් ලෙස ජීවත් වූහ.

දහ අටවැනි ශත වර්ෂය වනවිට කොසැක්වරු බද්දට රජයේ ඉඩම් වැඩකරන කොටසක් බවට පත්වූහ. එම නිසා විශේෂ තත්වයන් යටතේ යුදහමුදාවේ සේවය කිරීමට ඔවුන්ට සිදුවිය. විප්ලවවාදී ව්‍යාපාරය මැඩපැවැත්වීම සඳහා ඒකාධිපති සාර් රජය විසින් යොදන ලද විශේෂ යුද හමුදා ද මොවුන්ගෙන් සමන්විත විය.

12 පැරිස් කොමියුනය 1871– පැරිසියේ නිර්ධන පංතික විප්ලවය විසින් නිර්මාණය කරන ලද ඉතිහාසයේ පළමුවැනි අත්හදා බැලීම වූ නිර්ධන පංතියේ ආඥාදායකත්වය ය. කම්කරු පංතියේ විප්ලවවාදී ආණ්ඩුවය. 1871 මාර්තු 18 ද සිට මැයි 28 දක්වා දින 72 ක් එම ආණ්ඩුව පැවතිණි.

13 'දියල නරෝද්' පිරිස — 1917 මාර්තු සිට 1918 ජූලි දක්වා 'දියල නරෝද්' පත්‍රය ප්‍රධාන පුවත්පත කොට ගත් විප්ලවවාදී-සමාජවාදීන්. ප්‍රතිවිප්ලවවාදී කටයුතු නිසා පත්‍රය තහනම් කරන ලදී.

14 කැඩෙට්වරු — රුසියානු ලිබරල්-රාජාණ්ඩුවාදී ධනපති පංතියේ ප්‍රධාන පක්ෂය වූ ව්‍යවස්ථානුකූල-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකයෝ. කැඩෙට් පක්ෂය 1905 ඔක්තෝබර් මස පිහිටුවන ලදී. ධනපති පංතියේ නියෝජිතයෝ, ඉඩම් හිමියන්ගේ සෙම්ස්ත්වො සංවිධානවල නායකයෝ සහ ධනපති බුද්ධිමත්හු මෙම පක්ෂයේ සාමාජිකයෝ වූහ. පසුව එම පක්ෂය අධිරාජ්‍යවාදී ධනපති පංතික පක්ෂයක් බවට පත්විය.

පළමුවැනි ලෝක යුද්ධයේදී කැඩෙට්වරු සාර්වාදී රටවල් යටත්කර ගැනීමේ විදේශ ප්‍රතිපත්තියට ආධාර කළහ. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේදී රාජාණ්ඩුව ආරක්ෂා කිරීමට උත්සාහ දැරූහ. ධනපති තාවකාලික ආණ්ඩුවේ ප්‍රධාන තනතුරු ඉසිලූ කැඩෙට්වරු ජනතා විරෝධී ප්‍රතිවිප්ලවවාදී පිළිවෙත් ක්‍රියාත්මක කළහ. ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණයෙන් පසු කැඩෙට්වරු සෝවියට් බලයේ පරම හතුරෝ වූහ. එසේම ඔවුහු සියළු සන්නද්ධ ප්‍රතිවිප්ලවීය ක්‍රියාවන්ට හා ආක්‍රමණිකයන්ගේ ව්‍යාපාරවලට සහභාගී වූහ.

15 වාමාංශික සමාජවාදිසමාජවාදීයෝ (වාමාංශික එස්ආර්වරු) — වාමාංශික සමාජවාදී-විප්ලවවාදීන්ගේ (ජාත්‍යන්තරවාදීන්) පක්ෂය 1917 නොවැම්බර් 19–28 (දෙසැම්බර් 2–11) දිනවලදී පැවැත්වූ ඔවුන්ගේ පළමුවැනි සමස්ත-රුසියා සම්මේලනයේදී සංවිධානාත්මක ලෙස පිහිටුවා ගන්නා ලදී. ඒ දක්වා වාමාංශික එස්ආර්වරු සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ වාමාංශික පිළ ලෙස පළමුවැනි ලෝක යුද්ධ කාලයේ සිටම සිටියහ.

සෝවියට් සභාවල දෙවැනි සමස්ත රුසියා සම්මේලනයේදී වාමාංශික එස්ආර්වරු එස්ආර් කණ්ඩායමේ බහුතරය වූහ. එස්ආර් පක්ෂය සම්මේලනයට සහභාගි වීමේ ප්‍රශ්නයේදී ඔවුහු භේද වූහ. දක්ෂිණාංශික එස්ආර්වරු පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ නියෝග පිළිපදිමින් සම්මේලනයෙන් නැගිට ගියහ. වාමාංශික එස්ආර්වරු සම්මේලනයට සහභාගී වූ අතර වැදගත් ප්‍රශ්නවලදී බොල්ෂෙවික්වරුන් සමග ඡන්දය දුන්හ. බහුතරය ගොවීන්ගේ සහයෝගය ලබමින් සිටි වාමාංශික එස්ආර්වරුන් සමග එකම කඳවුරකට පැමිණීම අවශ්‍යයැයි කල්පනා කළ බොල්ෂෙවික් පක්ෂය සෝවියට් ආණ්ඩුවට ඇතුලුවන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියහ. එහෙත් වාමාංශික එස්ආර්වරු එය ප්‍රතික්ෂේප කළහ. 1917 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල කළ සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් වාමාංශික එස්ආර්වරු සෝවියට් ආණ්ඩුවට ඇතුලු වීමේ සම්මුතියකට පක්ෂ දෙක එළඹුනහ. මහජන කොමිසාර් මණ්ඩලයේ පොදු ප්‍රතිපත්ති අනුගමනය කිරීමට එකඟ වූ වාමාංශික එස්ආර්වරු මහජන කොමිසාර් මණ්ඩලයටද ඇතුලත් වූහ.

බොල්ෂෙවික්වරුන් සමග සහයෝගීතාවයෙන් කටයුතු කිරීමට එකඟ වූ නමුත් වාමාංශික එස්ආර්වරු සමාජවාදය ගොඩනැගීමේ මූලික ප්‍රශ්නවලදී බොල්ෂෙවික්වරුන් සමග එකඟ නොවූහ. නිර්ධන පංතික ආඥාදායකත්වයට විරුද්ධ වූහ. 1918 ජනවාරි-පෙබරවාරි මාසවලදී වාමාංශික එස්ආර් පක්ෂයේ මධ්‍යම කාරක සභාව බ්‍රෙස්ට් සාම ගිවිසුම අත්සන් කිරීමට විරුද්ධව සටනක් ගෙනගියහ. එය අත්සන් කිරීමෙන් හා සෝවියට් සභාවල හතරවැනි සම්මේලනයේදී එය අනුමත කිරීමෙන් පසු ඔවුහු මහජන කොමිසාර් මණ්ඩලයෙන් ඉවත් වූහ. 1918 ග්‍රීෂ්ම කාලයේදී ගම්බද විප්ලවය ආරම්භයේ සිට හා ගම්බද දුප්පතුන්ගේ කොමිටි පිහිටුවීමේදී වාමාංශික එස්ආර්වරුන් අතර සෝවියට් විරෝධී උපනති පැන නැගිණ. ජූලි මාසයේදී වාම එස්ආර්වරුන්ගේ පක්ෂයේ මධ්‍යම කාරක සභාව මොස්කව්හි ජර්මන් තානාපති තුමා ඝාතනය කිරීමද සෝවියට් විරෝධී ත්‍රස්තවාදී කැරැල්ලක්ද සංවිධානය කළේය. ඔවුන් එසේ කළේ එම මාර්ගයෙන් බ්‍රෙස්ට් සාම ගිවිසුම කඩාකප්පල් කර

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රුසියාව හා ජර්මනිය අතර යුද්ධ ගිණි දැල්වීම සඳහාය. කැරැල්ල මැඩ පැවැත්වීමෙන් පසු සෝවියට් සභාවල පස්වැනි සමස්ත-රුසියා සම්මේලනයේදී, වාමාංශික එස්ආර් පක්ෂයේ නායකයින්ගේ අදහස් දරණ අනෙක් සාමාජිකයින්ද සෝවියට් සභාවලින් නෙරපීමට තීරණය විය. පොදු ජනතාවගේ සහයෝගීතාවය සම්පූර්ණයෙන්ම නැතිවීමෙන් පසු වාමාංශික එස්ආර් පක්ෂය සෝවියට් බලයට විරුද්ධව අවිගත් සටනක් ආරම්භ කළේය. බොල්ෂෙවික් පක්ෂයත් සමග සහයෝගීතාවයෙන් කටයුතු කල වාම එස්ආර් පක්ෂයේ සමහර කොටස් වලින් ''ජනතා කොමියුනිස්ට් පක්ෂය'' හා ''විප්ලවවාදී කොමියුනිස්ට් පක්ෂය'' නැමති පක්ෂ බිහිවිය. පසුව එම පක්ෂවල බහුතරය බොල්ෂෙවික්වාදී කොමියුනිස්ට් පක්ෂයට බැඳුනහ.

16 රාජ්‍ය දූමා සභාව — 1905 විප්ලවය නිසා සාර්වාදී රජයට කැඳවීමට සිදුවූ නියෝජිත මන්ත්‍රණ සභාව, නාමික වශයෙන් එය ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවක් වූ නමුදු ව්‍යවහාරික ලෙස එය බලය රහිත විය. එයට නියෝජිතයින් පත්කරන ලද්දේ පොදුජන නොවන ආකාරයකිනි. වැඩකරන පංතිවල හා රුසියාවේ ජීවත්වූ රුසියානු නොවන ජාතීන්ගේ ඡන්ද බලය කපාදමන ලදී. බහුතරය කම්කරුවන්ට හා ගොවීන්ට ඡන්ද බලය අහිමි විය. පළමුවැනි රාජ්‍ය දූමා සභාව (1906 අප්‍රියෙල් ජූලි) හා දෙවැනි රාජ්‍ය දූමා සභාව (1907 පෙබරවාරි — ජූනි) සාර්වාදී රජය විසින් විසුරුවා හරින ලදී. 1907 ජූනි 3 දින රාජ්‍ය පෙරළියක් ඇතිකරමින්, සාර් රජය නැවත මැතිවරන නීතියක් සම්මත කළේය. ඒ මගින් කම්කරුවන්ගේද ගොවීන්ගේ හා නගරබද සුළු ධනපතීන්ගේද ඡන්ද බලය කපා දැමු අතර තුන්වැනි (1907–1912) හා හතරවැනි (1912–1917) රාජ්‍ය දූමා සභාවල ඉඩම් හිමියන්ගේ හා මහා ධනපති පංතියේ ප්‍රතිගාමී කඳවුරේ බලය වැඩි කළේය.

17 ලෙනින් මෙහි අදහස් කරන්නේ යුද පෙරමුනෙන් පැමිණි නිලධාරියෙකු වූ දූබාසව් විසින් 1917 සැප්තැම්බර් 21 දින (ඔක්තෝබර් 4) පෙට්‍රොග්‍රැඩ් සෝවියට් සභාවේදී කරන ලද කථාව ගැනය.

18 පින්ලන්ත විප්ලවය, එහි සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකයින්ගේ ප්‍රධානත්වයෙන් 1918 ජනවාරි 27 දින ආරම්භ විය. ස්වින්හුවූද්ගේ ධනපති රජය පෙරලා දැමු කම්කරුවෝ රාජ්‍ය බලය ඔවුන් අතට ගත්හ. ජනවාරි 29 වැනි දින පින්ලන්තයේ විප්ලවවාදී රජය බලධාරී සෝවියට් සභා පිහිටුවන ලදී.

එහෙත් නිර්ධන පංතිය ජයග්‍රහණය කළේ දකුණු පින්ලනතයේ පමණකි. උතුරු පින්ලන්තයේ බලය රැකගත් ස්වින්හුවූද් රජය, ප්‍රතිවිප්ලවවාදී බලවේගයන් රැස්කර ජර්මන් කයිසර් රජයේද ආධාර ඉල්ලා සිටියේය. ජර්මනියේ මැදිහත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මාස තුනක් මුළුල්ලේ පැවති බිහිසුනු සටන්වලට පසු 1918 මැයි දෙවැනි දින පින්ලන්තයේ කම්කරු විප්ලවය මර්ධනය කරන ලදී. රට තුළ විවෘත ත්‍රස්තය ක්‍රියාත්මක විය. දහස් ගණන් විප්ලවවාදී කම්කරුවන් හා ගොවීන් මරා දමූ අතර සිර ගෙවල්වල දමා තාඩන පීඩන කරන ලදී.

19 මෙම සඳහන ''රුසියානු සහ පින්ලන්ත සමාජවාදී සමූහාණ්ඩු අතර ගිවිසුම'' ගැනය. ලෙනින්ගේ නායකත්වයෙන් යුත් කොමිසමක් විසින් මාර්තු 1 දින එයට අත්සන් තබන ලදී.මහජන කොමිසාර් මණ්ඩලයෙන් අනුමත කරන ලද එම ගිවිසුම 1918 මාර්තු 18 වැනි දින 'ඉස්වෙස්තිය ව්ට්සික්' නො 45 හි ප්‍රසිද්ධ කරන ලදී. පින්ලන්තයේ රාජ්‍ය ස්වෛරීභාවය පිළිගැනීම මත පදනම් වූ මෙම ගිවිසුම, ස්වාධිපත්‍යය සඳහා ජාතීන්ගේ අයිතිය පිළිබඳ ප්‍රතිපත්තිය සෝවියට් ආණ්ඩුව විසින් නිතරම අනුගමනය කරනු ලබන බවට සාක්ෂියක් විය.

20 'සෝවියට් ආණ්ඩුවේ හදිසි කර්තව්‍යයන්' යන කෘතියෙහි ලෙනින්ගේ අත් පිටපතෙහි සිරස්තලය යොද තිබුණේ ''වර්තමාන තත්වය යටතේ සෝවියට් ආණ්ඩුව ඉටු කළයුතු කර්තව්‍යයන් ගැන ප්‍රවාද'' යනුවෙනි.

1918 අප්‍රියෙල් 26 වැනි දින පැවැත්වුනු. පක්ෂයේ මධ්‍යම කාරක සභා රැස්වීමේදී මෙම ප්‍රවාද ගැන සාකච්ඡා කර ඒවා ඒකමතික ලෙස අනුමත කළ මධ්‍යම කාරක සභාව, ඒවා 'ප්‍රාව්ද' සහ 'ඉස්වෙස්තියා ව්ට්සික්' පත්‍රවලත්, වෙනම පොත් පිංචක් ලෙසටත් පළ කිරීමටද තීරණය කළේය. එම වර්ෂයේම නිව්යෝක්හිදී ඉංග්‍රීසි බසින් ද, ජිනීවාහිදී ප්‍රංශ බසින් ද මෙම පොත පළ කෙරින. මෙහි සංක්ෂිප්ත ජර්මන් අනුවාදයක් එජ්. ප්ලැටන්ගේ සංස්කාරකත්වයෙන් සූරික්හිදී "Am Tage nach der Revolution" යන නමින් පළ විය.

''සෝවියට් ආණ්ඩුවේ හදිසි කර්තව්‍යයන් ගැන ප්‍රවාද'' සාරාංශ කොට ගෙන එය යෝජනාවක් මෙන් සමස්ත-රුසියා මධ්‍යම විධායක කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීමට පක්ෂ මධ්‍යම කාරක සභාව ලෙනින්ට පැවරුවේය (මෙම වෙළුමෙහි 35–75 පිටු බලන්න).

21 ලෙනින්ගේ යෝජනාවක් අනුව ගිය මහජන කොමිසාර් මණ්ඩලය, ''මහජන කොමිසාර්වරුන්ගේ සහ ජ්‍යෙෂ්ඨ ආණ්ඩුවේ සේවකයන්ගේ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

හා නිලධාරීන්ගේ පාරිශ්‍රාමික ප්‍රමාණය'' 1917 නොවැම්බර් 18 (දෙසැම්බර් 1) දින අනුමත කළේය. මෙම තීරණය අනුව මහජන කොමිසාර්වරයෙකුගේ ඉහළම මාසික වැටුප රූබල් 500 ක් ලෙසත්, ඔහුගේ පවුලෙහි සිටින වැඩ නො කළහැකි සෑම සාමාජිකයෙකුම වෙනුවෙන් අතිරේක රූබල් 100 බැගිනුත් ගෙවීමට නියම කරන ලදී. මෙය දළ වශයෙන් කම්කරුවෙකුගේ සාමාන්‍ය මාසික වැටුපට සමාන විය. මෙම නියෝගයෙන් විශේෂඥයන්ට කරන ගෙවීම් පිළිබඳ සීමාවක් නොකරන ලද බව, කම්කරු මහජන කොමිසාර් ඒ. ජී. ෂ්ලියාප්නිකව්ගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් ම.කො.ම.1918 ජනවාරි 2(15) දින ලෙනින් විසින් ලියන ලද විස්තරයකින් පැහැදිලි කළ අතර, විද්‍යාඥයන්ට හා කාර්මික ශිල්පීන්ට වැඩි පාරිශ්‍රාමික ගෙවීම එමගින් අනුමත කළේය.

[22] නොවයා ෂිස්න් පිරිස — ''නොවයා ෂිස්න්'' පත්‍රය ප්‍රසිද්ධ කළ මෙන්ෂෙවික්-ජාත්‍යන්තරවාදී කණ්ඩායම. එය 1917 අප්‍රියෙල් 18 (මැයි 1) සිට 1918 ජූලි දක්වා පළවිය. ඔක්තෝබර සමාජවාදී විප්ලවයට හා සෝවියට් බලය ස්ථාපිත කිරීමට විරුද්ධ ආකල්පයක් පත්‍රය ගෙන ගියේය.

[23] විදේශ වෙළඳාම පාලනය කිරීම සෝවියට් බලයේ ප්‍රථම දිනවල සිටම කරන ලදී. ලෙනින් 1917 දෙසැම්බර් මාසයේදී, විදේශ වෙළඳාම පිළිබඳ රාජ්‍ය ඒකාධිකාරයක් ඇති කිරීම පිළිබඳ ප්‍රශ්නය ඉදිරිපත් කළේය. විදේශ වෙළඳාම පිළිබඳ පනත 1918 අප්‍රියෙල් 22 දින මහජන කොමිසාර් මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

[24] ''බදු අයකර ගැනීම පිළිබඳ 1917 නොවැම්බර් 24 දින පනත වෙනස්කිරීමේ හා එයට සංශෝධන එකතු කිරීමේ පනතක් 1918 ජූනි මස මහජන කොමිසාර් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. එමගින් දේපල හා ආදායම් බදු වඩාත් දැඩි ලෙස පාලනය කෙරිණි.

[25] පාරිභෝගික සමුපකාර සංවිධාන පිළිබඳ ආඥාව — මෙය 1918 අප්‍රියෙල් 10 දින මහජන කොමිසාර් මණ්ඩලය විසින් පිළිගෙන අප්‍රියෙල් 11 වැනි දින මධ්‍යම විධායක කාරක සභාව විසින් සම්මත කරන ලදී. ලෙනින්ගේ අත්සන සහිතව එය අප්‍රියෙල් 13 වැනි දින 'ප්‍රාව්ද' නො. 71 ද, අප්‍රියෙල් 16 වැනි දින 'ඉස්වෙස්තියා වට්සික්' නො. 75 ද පළ විය. ලෙනින් විසින් එහි සංශෝධන කීපයක්ම කරන ලදී. ඡේද 11, 12, හා 13 සම්පූර්ණයෙන්ම ලියන ලද්දේ ලෙනින් විසිනි. මහජන කොමිසාර් මණ්ඩලය හා මධ්‍යම විධායක කාරක සභාව විසින් එය පිළිගන්නා ලද්දේ ලෙනින් ඉදිරිපත් කළ සංශෝධනවලට පසුවය.

[26] 1918 අප්‍රියෙල් මස 3 දින සමස්ත මහා වෘත්තීය සමිති මධ්‍යම මණ්ඩලය විසින් පිළිගනු ලැබ එම මසම 'නරොද්නොය හසියායිස්ත්ව නැමති සඟරාවේ පළකරන ලද ''ශ්‍රම විනය පිළිබඳ ලියවිල්ල'' ගැනය මෙහි සඳහන් වන්නේ. රටේ සියළුම ව්‍යවසායයවල අභ්‍යන්තර පාලනය පිළිබඳ දැඩි නීති පැනවීමද පිළිගත් වැටුප් සීමාවන් ඇති කිරීම හා ශ්‍රම ඵලදායකත්වය පිළිබඳ ගිණුම් තැබීමක් ආරම්භ කිරීමද කෑලි ගණනට ගෙවීම හා වැඩි පුර නිපදවන ප්‍රමාණය සඳහා පාරිතෝශික දීමනා ගෙවීමද ශ්‍රම විනය කඩකරන්නන්ට විරුද්ධව දැඩි දඬුවම් පැමිණවීමටද වෘත්තීය සමිති මණ්ඩලය යෝජනය කළේය. වෘත්තීය සමිති මධ්‍යම මණ්ඩලයේ යෝජනා ආධාර කර ගනිමින් ලෝහ කම්කරුවන්ගේ වෘත්තීය සමිතියේ මධ්‍යම කාරක සභාව කෑලි ගණනට ගෙවීමේ ක්‍රමයද, පාරිතෝශික ගෙවීම් ක්‍රමයද ක්‍රියාත්මක කරන ලෙස තම සංවිධානවලට චක්‍ර ලේඛනයකින් දැනුම් දුන්නේය. කෑලි ගණනට ගෙවීමේ ක්‍රමය 1918 දෙසැම්බර් මස නිකුත් කරන ලද සෝවියට් කම්කරු ආඥා පනත මගින් නීති ගත කරන ලදී.

[27] ''පරිපාලනය මධ්‍යගත කිරීම, මහා මාර්ග ආරක්ෂා කිරීම හා ප්‍රවාහනය උසස් කිරීම පිළිබඳ'' මහජන කොමිසාර් මණ්ඩලයේ ''ආඥපනත'' ගැනය මෙහි සඳහන් වන්නේ ප්‍රවාහනය පිළිබඳ මහජන කොමිසාර් අංශයේ යෝජනාව පරිදි දුම්රිය දෙපාර්තමේන්තුවේ කටයුතුවලට වෙනත් ආයතනවල මැදිහත් නොවීම පිළිබඳ ආඥා කෙටුම්පත 1918 මාර්තු 18 දින සලකා බැලූ මහජන කොමිසාර් මණ්ඩලය ලෙනින්ගේ පහත දැක්වෙන කොන්දේසි අනුව ආඥාව නැවත කෙටුම්පත් කිරීමට විශේෂ කාරක සභවකට බාර දෙන ලදී: 1 මහා මධ්‍යගතකරනය. 2 දුම්රිය සංවිධානවල තෝරා පත්කිරීම පරිදි සියළුම ප්‍රාදේශීය සංවිධානවල වගකිව යුතු පුද්ගලයන් — අඥාව ක්‍රියාත්මක කරන්නන් පත්කිරීම. 3. ඔවුන්ගේ අණ විවාදයෙන් තොරව ඉටුකිරීම. 4. ආරක්ෂක යුද්ධ කණ්ඩායම්වලට ආඥාදායක බලතල. 5. ප්‍රවාහනයට යොදා ඇති දුම්රිය හා ඒවාහි පිහිටීම පිළිබඳ ගණන් තැබීමක් නොපමාව කිරීම. 6. තාක්ෂණික අංශයක් පිහිටුවීම. 7. ''ඉන්දන''. විශේෂ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද කෙටුම්පත මාර්තු 21 වැනි දින සලකා බැලූ මහජන කොමිසාර් මණ්ඩලය ලෙනින්ගේ සංශෝධන ගණනාවක්ම ඇතුලත් කිරීමෙන් එය පසු සම්මත කරන ලදී. සමස්ත-රුසියා දුම්රිය පරිපාලන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මංඩලයේ තුළ මෙන්ෂෙවික් වරුන්ගේ හා වාම එස්එර් වරුන්ගේ බලපෑම වැඩි අංශ එයට සතුරු ආකල්පයක් දක්වූ නිසා මාර්තු 23 වැනි දින ප්‍රවාහනය පිළිබඳ මහජන කොමිසාර් අංශය ආඥව වෙනස්කිරීම පිළිබඳ ප්‍රශ්නය මහජන කොමිසාර් මණ්ඩලයට ඉදිරිපත් කළේය. විරුද්ධවාදීන්ගේ පහරගැසීම්වලට පිළිතුරු දුන් ලෙනින් දුම්රිය මාර්ගවල කඩාකප්පල් කිරීම් හා දූෂන මර්ධනය කිරීමට දැඩි පියවර ගැනීමේ අවශ්‍යතාවය පෙන්වාදී ආඥවේ දැඩි බව වැඩි කරන සංශෝධන එකතු කළේය. එම සංශෝධන සමග ආඥව අවසාන වශයෙන් රජය විසින් මාර්තු 23 දින සම්මත කරන ලද අතර මාර්තු 26 දින ''ඉස්වෙස්තිය වටසික්'' නො 57 පතෙහි ලෙනින්ගේ අත්සන සහිතව පළ කරන ලදී.

28 'නෝවයා ෂිස්න්' — 22 වන සටහන බලන්න.

'වපිරියොද්' (පෙරට යමව්) — මෙන්ෂෙවික් දිනපතා ප්‍රවෘත්ති පත්‍රයකි. 1917 මාර්තු සිට මොස්කව්හි මෙන්ෂෙවික් සංවිධානයේ ප්‍රධාන පුවත් පත ලෙස පළ වූ අතර අනතුරුව රු. ස. ප්‍ර. ක. ප. (මෙන්ෂෙවික්) කාරක සභාවේ මොස්කව් සංවිධානයේ හා මධ්‍යම ප්‍රදේශයේ ප්‍රධාන පත්‍රය ලෙස පළ විය. 1918 අප්‍රියෙල් 2 දින සිට එය මෙන්ෂෙවික්වරුන්ගේ මධ්‍යම කාරක සභාවේ ප්‍රධාන පත්‍රය විය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු ප්‍රතිවිප්ලවවාදී කටයුතු නිසා දෙවරක්ම පත්‍රය වසාදමන ලදී.1919 පෙබරවාරි මස සමස්ත-රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ අන පරිදි එය තහනම් කරන ලදී.

'දියල නරෝද්' ('මහජන ව්‍යාපාරය') — අංක 13 සටහන බලන්න.

'නාෂ් වියෙක්' ('අපේ සමය') — 'රෙච්' නැමැති ප්‍රතිවිප්ලවවාදී කැඩෙට් පක්ෂයේ ප්‍රධාන පත්‍රයේ නම්වලින් එකකි. 1906 පෙබරවාරි සිට 1917 ඔක්තෝබර් 26 (නොවැම්බර් 8) දක්වා පළ විය. පසුව (1918 අගෝස්තු දක්වා) වෙනත් නම්වලින් එය පළ විය.

29 1905 ඔක්තෝබර් — ඔක්තෝබර් සමස්ත මහා වැඩ වර්ජනය.
1917 පෙබරවාරි — පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය.
1917 ඔක්තෝබර් — ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් සමාජවාදී විප්ලවය.

30 ලෙනින් සඳහන් කරන්නේ එංගල්ස්ගේ ''ඩූරිං විරෝධය'' යන කෘතිය ගැනය. උපුටා දැක්වීම එයිනි. කාල් මාක්ස් හා ෆ්‍රෙඩරික් එංගල්ස්. තෝරාගත් කෘති, වෙළුම 20, පිටු 264)

31 ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලය කැඳවීම පිළිබඳව ධනපති තාවකාලික රජය 1917 මාර්තු 2(15) තම ප්‍රකාශනයකින් දැනුම් දුන්නේය. ජූනි 14(27) දින ධනපති තාවකාලික රජය ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලය තෝරාපත් කිරීමේ මැතිවරනය සැප්තැම්බර් 17(30) පැවත්වීමට තීරණය කළේය. එහෙත් අගෝස්තු මාසයේදී රජය විසින් මැතිවරනය නොවැම්බර 12(25) දක්වා කල්දමන ලදී.

ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලය කැඳවීම සඳහා ඡන්දය විමසන ලද්දේ ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසුවය. එනම් නියම කරගත් දිනය වන නොවැම්බර් 12(25) දිනදීය. එම ඡන්දය විමසන ලද්දේ, ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පෙර සකස් කරන ලද ඡන්ද ලැයිස්තු අනුවය. විප්ලවයට පසුව රටේ ඇතිවූ නව දේශපාලන බලතුලනය එම ලැයිස්තුවලින් පිළිඹිබු නොවූ නිසා ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලයේ ආසන බහුතරය දක්ෂිණාංශික එස්එර්වරුන්ට හා මෙන්ෂෙවික්වරුන්ට හිමිවිය. 1918 ජනවාරි 5(18) දින සෝවියට් රජය විසින් පෙට්‍රොග්‍රෑඩ්හිදී ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලය කැඳවන ලදී. එහි සිටි ප්‍රතිවිප්ලවවාදී බහුතරය විසින් මධ්‍යම විධායක කාරක සභාව ඉදිරිපත් කළ ''වැඩකරන ජනතාවගේ හා සූරාකනු ලබන ජනතාවගේ අයිතිය'' පිළිබඳ ආඥ පනත ප්‍රතික්ෂේප කරන ලදී, එසේම එය සෝවියට් රජය පිළිගැනීමද ප්‍රතික්ෂේප කළේය. ජනවාරි 6(19) මධ්‍යම විධායක කාරක සභාවේ විශේෂ ආඥපනතකින් ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය විසුරුවා හරින ලදී. සෝවියට් රජය විසින් ගන්නා ලද එම තීරණය රුසියාවේ කම්කරු, සොල්දදු හා ගොවි ජනතාව අනුමත කළහ.

32 ජාතික ආර්ථිකයේ ප්‍රශ්න විසඳීම සඳහා රුසියාවේ විද්‍යාඥයන් සංවිධානය කර ගැනීමේ වැදගත් අවධියක් ''විද්‍යා සහ තාක්ෂණික වැඩ සඳහා කෙටුම්පත් සැලැස්ම'' යන ලිපියෙන් සලකුණු වෙයි.

විද්‍යා ඇකඩමිය සමග සාකච්ඡා, ලෙනින් සහ සෝවියට් ආණ්ඩුව විසින් 1918 ජනවාරියෙහිදී අරඹන ලදී. සාකච්ඡා ගෙන යාමෙහි යෙදුනු අධ්‍යාපන කොමිසාර් අංශයේ කටයුතු ලෙනින් විසින් මෙහෙයවන ලදී. මාර්තු අවසානයේදී සෝවියට් ආණ්ඩුවට ප්‍රකාශයක් කළ විද්‍යා ඇකඩමිය, රටේ ස්වාභාවික සම්පත් පිළිබඳ ගවේශනයක් කිරීමට තමන් සූදනම් බව දන්වීය. ඒ අනුව, ''රටේ කර්මාන්ත නිවැරදි ලෙස බෙදාහැරීම සහ ආර්ථික සම්පත් ඉතාමත් තර්කානුකූල ලෙස පාවිච්චි කිරීම පිළිබඳ ප්‍රශ්න ක්‍රමාණුකූල ලෙස විසඳීමේ හදිසි කර්තව්‍යය'' විද්‍යා ඇකඩමියට පවරන යෝජනාවක්, ලෙනින්ගේ සභාපතිත්වයෙන් අප්‍රියෙල් 12 දින පැවැත්වුනු ම. කො. ම. රැස්වීමේදී සම්මත කෙරින. අදළ විද්‍යාත්මක පර්යේෂණයන් කිරීම සඳහා මුදල් සැපයීමේ අවශ්‍යතාවය ම. කො. ම. පිළිගත්තේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

[33] විද්‍යා ඇකඩමිය විසින් 1915 ආරම්භකරන ලද ස්වාභාවික නිෂ්පාදන බලවේගයන් සොයා බැලීම පිළිබඳ කොමිසමේ වාර්තාව මෙහිදී ලෙනින් අදහස් කරයි. ලෙනින්ගේ උපදෙස් පරිදි කොමිසමේ වැඩ කටයුතු වඩාත් පුළුල් කෙරිණි. 'බගාත්ස්ත්ව රුසී' 'රුසියාවේ සම්පත්' නමින් පොත් පෙළක් ද 'රුසියාවේ ස්වාභාවික නිෂ්පාදන බලවේග' නමින් පොත් කාණ්ඩයක්ද මුද්‍රණය කර පළ කිරීම ආරම්භ විය. විප්ලවයට පසු අවුරුදු 3 ක (1918–1920) කාලයකදී විප්ලවයට පෙර අවුරුදු 3 ක කාලයකට වඩා හතර ගුණයක් එම කොමිසම විද්‍යා පර්යේෂණාත්මක පොත් ප්‍රසිද්ධ කළේය.

[34] ලෙනින් සෝවියට් ආණ්ඩුවේ හදිසි කර්තව්‍යයන් ගැන ඉදිරිපත් කළ වාර්තාව 1918 අප්‍රියෙල් 29 දින රැස්වීමේදී සාකච්ඡා කළ මධ්‍ය විධායක කාරක සභාව ලෙනින්ට කළ නියමයක් අනුව ඔහු ''සෝවියට් ආණ්ඩුවේ හදිසි කර්තව්‍යයන් ගැන ප්‍රවාද හය'' ලීවේය. මැයි 3 දින එම ප්‍රවාදවලට සංශෝධන කීපයක් ඇතුලත් කරන ලදුව පක්ෂයේ මධ්‍යම කාරක සභාව ඒකමතිකව එය අනුමත කළේය. මැයි 4 දින ලෙනින්ගේ ප්‍රවාද ''සියළුම සෝවියට් සභාවල වැඩ කටයුතුවලට පදනම විය යුතුය'' යන සටහන සමග ඒවා ප්‍රාදේශීය සෝවියට් සභා වෙත යවන ලදී.

[35] මෙම සඳහන කර ඇත්තේ ජර්මනිය සමග බ්‍රෙස්ට්-ලිතොව්ස්ක් සාම ගිවිසුම ඇති කරගැනීම සම්බන්ධයෙන් 1918 මුල් භාගයේදී පැන නැගුනු ''වාම කොමියුනිස්ට්වාදීන්'' නැමති පක්ෂ විරෝධී කණ්ඩායම ගැනය.

ශ්‍රම විනය සම්බන්ධයෙන් තනි පුද්ගල කළමණාකරණය ඇරඹීම ගැනත්, කර්මාන්තයෙහි ධනපති විශේෂඥයන් නියුක්ත කරවීම ගැනත් ''වාම කොමියුනිස්ට්වාදීහු''විරුද්ධ වූහ.ලෙනින්ගේ නායකත්වය අනුගමනය කළ පක්ෂය ''වාම කොමියුනිස්ට්වාදීන්'' නිරුත්තර කළේය.

[36] ''කොමියුනිස්ට්'' — ''වාම කොමියුනිස්ට්වාදීන්'' ගේ නිල ප්‍රකාශනය වූ සතිපතා සඟරාවකි. මෙය 1918 ජුනි සිට අප්‍රියෙල් දක්වා මොස්කව්හි පළ විය. පළවූයේ කලාප 4 ක් පමණකි.

[37] මෙම වචන ගෙන ඇත්තේ සල්තිකොව් — ෂෙද්රින්ගේ ''පිට පළාතක මිනිසෙකුගේ සාන්ත පීටර්ස්බර්ග් දිනපොත'' නැමති නව කථාවෙනි.

[38] ග්‍රීක පුරාණයේ රූමත් තරුණයෙකි. ඔහු ජලය මත පතිතවූ තම පිළිබිඹුවට ආලය කළේය. මෙම යෙදුම යොදනු ලබන්නේ තමාටම ආලයකරන්නන් හුවා දැක්වීම සඳහාය.

[39] ගොගොල්ගේ ''මළ ගිය ඇත්තෝ'' කථාවෙහි එන සාහසික ඉඩම් හිමි චරිතයක් වන ''නස්ද්‍රියොව්'' ගේ නම අනුව ගත් යෙදුමකි.

[40] ජුන්කර්වරු — ප්රුසියාවේ ඉඩම් හිමි රදළවරු

[41] ලෙනින් උපුටා දක්වන්නේ එංගල්ස් ''ප්‍රංශයේ සහ ජර්මනියේ ගොවිජන ප්‍රශ්නය'' යන කෘතියෙහි විස්තර කර තිබෙන මාක්ස්ගේ ප්‍රකාශයන් ගෙනි. (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, මොස්කව් 1973, වෙළුම 3, පිටු 474)

[42] මෙහි ලෙනින් සඳහන් කරන්නේ, ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට හා නිර්ධන පංතියේ ආඥාදායකත්වයට විරුද්ධව මෙන්ෂෙවික්වරුන් ඉදිරිපත් කළ ප්‍රධාන කොන්දේසිවලින් එකක් පිළිබඳවය. එන්. සුහානව්ගේ ''විප්ලවය ගැන සටහන්'' නැමැති පොතින් මෙන්ෂෙවික්වරු එම ප්‍රතිවිප්ලවවාදී අදහස් ඉදිරිපත් කළහ. ලෙනින් ''අපගේ විප්ලවය ගැන (එන් සුහානව්ගේ ලිපි ගැන)'' නැමැති ලිපියෙන් එම පොත දැඩි විවේචනයට ලක්කළේය.

[43] මජ්ලර් කාරයා — රුසියානු ගත්කතුවරයක් වන ඒ. පී. චේහව් ලියූ එම නමින් යුත් කථාවේ එන චරිතයකි. එය සියළු නවතාවයන් ක්‍රියාරම්භකතාවයන් පිළිකුල් කරන පටු අදහස් දරන අමනයකුගේ පිළිබිඹුවකි.

[44] 'ස්නාමිය තෘද' — එස්ආර්වරුන්ගේ දිනපතා පළවූ ප්‍රධාන පුවත්පත. 1917 සැප්තැම්බර් සිට පළ විය. 1917 දෙසැම්බර් සිට එය වාමාංශික එස්ආර් පක්ෂයේ ප්‍රධාන පත්‍රය බවට පත්විය. 1918 වාමාංශික එස්ආර්වරුන්ගේ කැරැල්ල අවස්ථාවේ පත්‍රය තහනම් කරන ලදී.

[45] මෙහි අදහස් වන්නේ, 1917 ජූනි 11(24) දින සෝවියට් සභාවල පළමුවැනි සමස්ත-රුසියා සම්මේලනයේ සභාපති මණ්ඩලයේද, පෙට්‍රොග්‍රෑඩ් කම්කරු හා සොල්දාදු නියෝජිතයින්ගේ සෝවියට් සභාවේ විධායක කාරක සභාවේද, ගොවි නියෝජිත සෝවියට් සභාවේ විධායක කාරක සභාවේ හා සම්මේලනයේ සියළුම කණ්ඩායම්වල බ්‍යුරෝවේද ඒකාබද්ධ සාකච්ඡා සභාවේදී තාවකාලික රජයේ ඇමැති ට්සෙරතේලි විසින් පෙට්‍රොග්‍රෑඩ් කම්කරුවන්ගේ හා සොල්දාදුවන්ගේ සාමකාමී පෙළපාලිය පිළිබඳ ප්‍රශ්නය සාකච්ඡා කිරීමේදී කරන ලද කථාව ගැනය. ට්සෙරතේලිගේ කථාව අපවාද සහගත ප්‍රතිවිප්ලවවාදී එකක් විය. රජයට විරුද්ධව කරන කුමන්ත්‍රණ පිළිබඳ හා ප්‍රතිවිප්ලවවාදී කටයුතු පිළිබඳ බොල්ෂෙ-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වික්වරුන්ට චෝදනා කළ ඔහු බොල්ෂෙවික්වරුන් සමග එකතුව යන කම්කරුවන් නිරායුධ කිරීම සඳහා තීරණාත්මක පියවරයන් ගන්නා බවටද තර්ජනය කළේය.

46 "ලිබර්දන්වරු" — මොස්කව් බොල්ෂෙවික් පුවත්පත වූ 'සොට්සල් ඩිමොක්‍රැට්' හි දෙමියාන් බෙද්නි විසින් පළ කරන ලද "ලිබෙර්දන්" නැමැති උපහාසාත්මක ලිපියට පසු, මෙන්ෂෙවික් නායකයින් වන ලීබෙර් හා දන් ඇතුළු ඔවුන්ගේ සගයින්ට පටබැඳි උපහාසාත්මක නාමය.

47 ලෙනින් මෙම වචන ගෙන තිබෙන්නේ, ඒ. එ ස්. පුෂ්කින්ගේ කාව්‍යයකිනි. සූර්යයාට අධිපති දෙවියා සහ කලාවන්ගේ ආරක්ෂකයා වන පීබස් අපලෝන් වෙත අවිශිෂ්ට කවියෙකු විසින් යවන ලද ඔහුගේ කවි ගැන වූ පුෂ්කින්ගේ කාව්‍යය කෙළවර වූයේ පහත සඳහන් වචනවලිනි.

ඔහු කියවද්දී ඇනුමක් පිටකළ පීබස් මෙසේ ඇසීය.
මේ කවිකාරයාගේ වයස කීයද?
ඔහු මෙම ගෙරවිලි පද බැඳීමට කොතරම් කලක් ගෙවී ද?
"ඔහු අවුරුදු පසළොසකි" යි එරාටෝ පිළිතුරු දුනි.
"නමුත් අවුරුදු පසළොසකි", "වැඩිනැත? මා ස්වාමීනි".
"එසේනම් ඉපළ ඔහුගේ තැග්ග විය යුතුය".

48 27 වැනි සටහන බලන්න.

49 බුර්සාක්වරු — ආගමික පාසලක ශිෂ්‍ය පූජකවරු. ශිෂ්‍යාගාරයක (බුර්සා) මොවුහු ජීවත් වූහ. දැඩි විනයකට යටත්ව සිටි මොවුන්ට දැඩි හා කෲර වදබන්දන පමුණුවන ලදී. ඔවුන් ගැන රුසියානු ගත්කතුවරයෙකු වූ එන්. ජී. පමියලොව්ස්කිගේ "බුර්ස කථා" හි ලියා ඇත.

50 "වර්තමාන දේශපාලන ගැන ප්‍රවාද" කෙටුම්පත 1918 මැයි 10 දින ලෙනින් විසින් ලියන ලදුව රු. කො. (බො.) පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් එදිනම සාකච්ඡාවට භාජනය කරන ලදී. සංස්කරණය කරන ලද ප්‍රවාද මැයි 13 වැනි දින මධ්‍යම කාරක සභාව විසින් අනුමත කරන ලදී. එම ප්‍රවාද පදනම්කරගනිමින් මධ්‍යම විධායක කාරක සභාවේ ඇරයුම පරිදි එදිනම ලෙනින් මොස්කව් නාගරික පක්ෂ සාකච්ඡා සභාවේදී වාර්තාවක් ඉදිරිපත් කළේය. බහු ඡන්ද සංඛ්‍යාවකින් ලෙනින්ගේ එම ප්‍රවාද සාකච්ඡා සභාවේදී සම්මත විය.

මැයි 14 වැනි දින පැවති මධ්‍යම විධායක කාරක සභාවේ සහ මොස්කව් සභාවේ ඒකාබද්ධ රැස්වීමට ලෙනින් ඉදිරිපත් කළ වාර්තාව මගින් "වාර්තමාන දේශපාලන තත්වය පිළිබඳ ප්‍රවාද" සම්පූර්ණයෙන්ම වැඩි දියුණු කරන ලදී. එදිනම මොස්කව් දිස්ත්‍රික්ක සාකච්ඡා සභාවේදීද මැයි 15 රු. කො. (බො.) ප. මොස්කව් පලාත්බද සාකච්ඡා සභාවේදීද ලෙනින්ගේ ප්‍රවාද සම්මත විය.

51 ඔක්තෝබර්වාදීන් — ඔක්තෝබර් වාදී පක්ෂයේ සහ ඔක්තෝබර් 17 සංගමයේ සාමාජිකවරු. 1905 විප්ලවයට බිය වූ සාර් විසින් ජනතාවට "සිවිල් අයිතිවාසිකම් පිළිබඳ පදනමේ ස්ථිරතාවයක්" පොරොන්දුවෙමින් ඔක්තෝබර් 17 වැනි දින ප්‍රසිද්ධ කරන ලද ප්‍රකාශනයට පසු එම පක්ෂය බිහිවිය. එම පක්ෂය මහා කර්මාන්තකරුවන් හා ධනපති ක්‍රමයට ගොවිතැන්කළ ඉඩම් හිමියන් නියෝජනය කළ අතර ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කළේය. මොස්කව් කර්මාන්තකරුවෙකු වූ ඒ. අයි. ගුච්කොව් හා ඉඩම්හිමියෙකු වූ එම්. බී. රොද්සියාන්කො එහි නායකයෝ වූහ. ඔක්තෝබර්වරු සාර් රජයේ විදේශ හා ස්වදේශ ප්‍රතිපත්තිවලට සහයෝගය දුන්හ. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු ඔවුහු විදේශීය ආක්‍රමණිකයින් ගෙනගිය සෝවියට් විරෝධී කැරැලිවලට සහභාගී වූහ.

52 "දුර්භික්ෂය ගැන (පෙට්‍රොග්‍රෑඩ් කම්කරුවන්ට ලිපිය)" — ලෙනින් විසින් මෙම ලිපිය ලියන ලද්දේ පුතිලව් කර්මාන්ත ශාලාවේ (දැන් කීරව් කර්මාන්ත ශාලාව) මිලට ගැනීම පිළිබඳ කොමිසමේ සභාපති වන එම කර්මාන්ත ශාලාවේ බොයිලේරු අංශයේ කම්කරුවෙකු වූ ඒ. වී. ඉවනොව් සමග සාකච්ඡා කිරීමෙන් පසුවය.

කුලාකයින්ට, ධාන්‍යවලින් ලාභගරන්නන්ට, කඩාකප්පල්කාරයින්ට හා අල්ලස් ගන්නන්ට විරුද්ධව කුරුස යුද්ධයක් සඳහා විශ්වාසදයක කම්කරු හමුදවක් පිහිටුවීමට ලෙනින් කළ නියමය ක්‍රියාත්මක කරමින් පෙට්‍රොග්‍රෑඩ් කම්කරුවෝ 1918 ජූනි ආරම්භයේදී කම්කරුවන් 400 කගෙන් යුත් ආහාර සපැයීමේ පළමුවැනි හමුදව පිටත්කර යැවූහ.

53 ප්‍රථම සමස්ත-රුසියා ආර්ථික මණ්ඩල සම්මේලනය 1918 මැයි 26 සිට ජූනි 4 දක්වා මොස්කව්හි පවත්වන ලදී. පලාත් පහක්ද ගුබේර්නියා තිහක් හා දිස්ත්‍රික්ක ආර්ථික මණ්ඩලද එසේම ශ්‍රේෂ්ඨ ආර්ථික මණ්ඩලයේ වෙන් වෙන් අංශද වෘත්තීය සමිති හා කම්හල් හා පැක්ටරි කොමිටිද නියෝජනය කරන නියෝජිතයෝ 252 ක් එයට සහභාගී වූහ.

පළමුවැනි සාකච්ඡා වාරයේදී ලෙනින්, ආර්ථික ගොඩනැගීම් පිළිබඳ වර්තමාන කර්තව්‍යයන් හා ජනසතු කරන ලද ව්‍යවසායයන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කළමනාකරනය සංවිධානය කිරීම පිළිබඳ කථාවක් කළේය. සමාජවාදී නිෂ්පාදන ක්‍රමය සංවිධානය කිරීම හා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස මධ්‍යගත කිරීමේ මූලධර්ම මත කළමනාකරනයටද, කළමනාකරනය මධ්‍යගත කිරීමටද විරුද්ධව සම්මේලනයේදී ''වාමාංශික කොමියුනිස්ට්වරු, ආරාජික-සින්ඩිකලිස්ට්වරු, මෙන්ෂෙවික්වරු හා වාමාංශික විප්ලවවාදී-සමාජවාදීහු කථා කළහ. එහෙත් සම්මේලනයේ දී බහුතර ඡන්ද සංඛ්‍යාවකින් බොල්ෂෙවික්වරුන්ගේ යෝජනා සම්මත විය. කර්මාන්ත අංශ පමණක් නොව පුද්ගලික මහා වෙළඳ ආයතනද ඉදිරියටත් සමාජවාදී ලෙස සමාජ සන්තක කිරීම අත්‍යවශ්‍ය යැයි සම්මේලනය පිළිගත්තේය. ව්‍යවසායයන් කළමනාකරනය පිළිබඳ නීති මාලාවක්ද, නගරය හා ගම අතර නිෂ්පාදන භාණ්ඩ හුවමාරුව හා ශ්‍රෙෂ්ඨ ආර්ථික මණ්ඩලය ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳ නීතිද සම්මේලනය සම්මත කළ අතර ශ්‍රම විනය හා ශ්‍රම නිෂ්පාදනය ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ගද සම්මේලනය සකස් කළේය.

54 ශ්‍රෙෂ්ඨ ආර්ථික මණ්ඩලය පිහිටුවීමට තීරණය කරන ලද්දේ ඔක්තෝබර් සමාජවාදී විප්ලවය ජයග්‍රහණය කළ අවධියේදීමය.

ශ්‍රෙෂ්ඨ ආර්ථික මණ්ඩලය සංවිධානය කිරීමේ කෙටුම්පත පිළියෙළ කරන ලද්දේ මහජන කොමිසාර් මණ්ඩලය විසින් පත්කරන ලද විශේෂ කොමිටියක් මගිනි.

ශ්‍රෙෂ්ඨ ආර්ථික මණ්ඩලය පිහිටුවීම පිළිබඳ ප්‍රශ්නය සාකච්ඡා කිරීමේදී, ශ්‍රෙෂ්ඨ ආර්ථික මණ්ඩලය කම්කරු ආඥාදායකත්වයේ සටන්කාමී සංවිධානයක් කළ යුතු බවද එයට ව්‍යවස්ථාදායක බලතල පැවරිය යුතු බවද මධ්‍යම විධායක කාරක සභාවේ බොල්ෂෙවික් කණ්ඩායම කියා සිටියේය. දෙසැම්බර් 1(14) දින ශ්‍රෙෂ්ඨ ආර්ථික මණ්ඩලය පිළිබඳ ප්‍රශ්නය මධ්‍යම විධායක කාරක සභාවේදී සාකච්ඡාවට භාජනය කරන ලදී. ශ්‍රෙෂ්ඨ ආර්ථික මණ්ඩලය පිළිබඳ ආඥාව සම්මත කරන ලදුව දෙසැම්බර් 5(18) දින තාවකාලික කම්කරු හා ගොවිජන රජයේ පත්‍රය නොම්මර 25 හි ප්‍රසිද්ධ කරන ලදී.

ශ්‍රෙෂ්ඨ ආර්ථික මණ්ඩලයේ වැඩ කටයුතු සංවිධානය කිරීම ගැන විශාල උනන්දුවක් දැක්වූ ලෙනින් එයට මග පෙන්වමින් ආර්ථික මණ්ඩලයේ සම්මේලනවලදී කථා පැවැත්වූවේය. ශ්‍රෙෂ්ඨ ආර්ථික මණ්ඩලයේ වැඩ කටයුතු ක්‍රමවත් කිරීම ගැන මහජන කොමිසාර් මණ්ඩලයේ සභාවලදී නිතරම සාකච්ඡා කරන ලදී. විශාල කර්මාන්ත ජනසතු කිරීම අවසාන වූ පසු ශ්‍රෙෂ්ඨ ආර්ථික මණ්ඩලය සෝවියට් දේශයේ රාජ්‍ය කර්මාන්ත පාලනය කරන ආයතනයක් බවට පත් විය.

55 1861 දී රුසියාවේ ප්‍රවේණිදස ක්‍රමය අහෝසි කරන ලදී.

56 ශ්‍රෙෂ්ඨ ආර්ථික මණ්ඩලය විසින් පිළියෙළ කරන ලද ''ජනසතු ව්‍යවසායයන් කළමණාකරනය සඳහා රෙගුලාසි කෙටුම්පත'' 1918 මැයි 28–30 දිනවලදී පළමුවැනි සමස්ත-රුසියා ආර්ථික මණ්ඩල සම්මේලනයේ නිෂ්පාදනය සංවිධානය කිරීම පිළිබඳ අංශයේ සභාවාරයේදී සාකච්ඡාවට භාජනය කෙරිණි. ''වාමාංශික කොමියුනිස්ට්වරුන්ගේ'' බලපෑම යටතේ, නිෂ්පාදනයෙහි ඒක පුද්ගල පාලනය ඇතිකිරීම හා ජනසතු කරන ලද ව්‍යවසායයන්ගේ කළමනාකරනය මධ්‍යගත කිරීම ආදිය ගැන පක්ෂයේ ප්‍රතිපත්තිවල ප්‍රතිවිරුද්ධ ''රෙගුලාසි'' කෙටුම්පතක් පිළිගැනීමට එයට සිදුවිය.

එම අංශය විසින් සංස්කරණය කරන ලද 'රෙගුලාසි' කෙටුම්පත කියවා බැලූ ලෙනින් දැනට ප්‍රසිද්ධ කර ඇති ලෙනින්ගේ උපදෙස් ආධාරකොට ගනිමින්, ජූනි 2 දින පිහිටුවන ලද විශේෂට ඒකාග්‍රතා කොමිසමේ දී සලකා බලන ලෙස යෝජනා කළේය. ''වාමාංශික කොමියුනිස්ට්වාදීන්ගේ විරුද්ධත්වය තිබියදීම ඒකාග්‍රතා කොමිසම ඉදිරිපත් කළ කෙටුම්පත පළමුවැනි සමස්ත-රුසියා ආර්ථික මණ්ඩල සම්මේලනය විසින් අනුමත කරන ලදී.

57 පස්වැනි සෝවියට් සභා සම්මෙලනය 1918 ජූලි මස 4 දින මොස්කව් හි බොල්ෂොයි රඟහලේදී ආරම්භ විය.

ඡන්දබලය හිමි නියෝජිතයෝ 1164 සම්මේලනයට සහභාගී වූහ. ඉන් 773 ක් බොල්ෂෙවික්වරුද, වාමාංශික සමාජවාදී-විප්ලවාදීහු 353 ක්ද මැක්සිමලිස්ට්වරු (වාමාංශික එස්ආර්වරු) 17 ක්ද, ආරාජිකවාදීහු 4 ක්ද මෙන්ෂෙවික්-ජාත්‍යන්තරවාදීහු 4 ක්ද වෙනත් පක්ෂ සාමාජිකයෝ 3 ක්ද අපාක්ෂිකයෝ 10 ඒ අතර වූහ.

සමස්ත-රුසියා මධ්‍යම විධායක කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද පහත දැක්වෙන න්‍යාය පත්‍රය සම්මේලනය අනුමත කළේය: සමස්ත-රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ සහ මහජන කොමිසාර් මණ්ඩලයේ වාර්තා; ආහාර ප්‍රශ්නය; සමාජවාදී රතු හමුදාවක් සංවිධානය කිරීම; රුසියානු සමාජවාදී සමූහාණ්ඩුවේ ව්‍යවස්ථාව; සමස්ත-රුසියා මධ්‍යම විධායක කාරක සභාවට තෝරා පත්කරගැනීමේ ඡන්ද විමසීම.

සමස්ත-රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ වාර්තාව එහි සභාපති වයි. එම්. ස්වෙර්ද්ලොව් විසින් ඉදිරිපත් කරන ලද අතර මහජන කොමිසාර් මණ්ඩලයේ වාර්තාව ලෙනින් විසින් ඉදිරිපත් කරන ලදී.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමස්ත-රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ හා මහජන කොමිසාර් මණ්ඩලයේ වාර්තා දැඩි විවාදවලට භාජනය වීමෙන් පසු "සෝවියට් ආණ්ඩුවේ විදේශීය සහ දේශීය ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම අනුමත කරන" බව කියමින් කොමියුනිස්ට් කණ්ඩායම ඉදිරිපත් කළ යෝජනාව සම්මේලනය විසින් වැඩි ඡන්දයෙන් අනුමත කරන ලදී. සෝවියට් ආණ්ඩුව කෙරෙහි විශ්වාසයක් නොමැති බවද, බ්‍රෙස්ට්-ලිතොව්ස්ක් සාම ගිවිසුම හෙළා දකින ලෙසද, සෝවියට් ආණ්ඩුවේ විදේශීය හා දේශීය ප්‍රතිපත්තිය වෙනස් කරන ලෙසද කියන වාම සමාජවාදී — විප්ලවවාදීන්ගේ යෝජනාවක් ප්‍රතික්ෂේප විය.

සම්මේලනයේදී පරාජය වූ වාම එස්ආර්වරු විවෘත සටනට එළඹෙමින් ජූලි 6 දින මොස්කව්හි ප්‍රතිවිප්ලවවාදී කැරැල්ලක් ඇති කළහ. රැස්වීම ජූලි 9 දින දක්වා කල් තැබූ සම්මේලනය, එම දින නැවත රැස්වී ජූලි 6–7 දිනවල සිදුවීම් ගැන ආණ්ඩුව ඉදිරිපත් කළ වාර්තාව ඇසූ අතර වාම එස්ආර්වාදීන්ගේ සාපරාධී කටයුතු මර්දනය කිරීමට ආණ්ඩුව ගත් අධිෂ්ඨාන සහගත පියවරයන් සම්පූර්ණයෙන්ම අනුමත කළේය. තම නායකයින් අනුගමනය කරන වෙනත් එස්ආර්වාදීන්ද සෝවියට් සභාවලින් නෙරපන බව සම්මේලනය වැඩි දුරටත් දන්වා සිටියේය.

ආහාර ප්‍රශ්නය ගැන මහජන කොමිසාර් ඒ. ඩී. ට්සුරුපාගේ යෝජනාවක් සම්මත කළ සම්මේලනය එයින් ධාන්‍ය ඒකාධිකාරය අනුමත කොට කුලාක ප්‍රතිරෝධය දැඩි ලෙස මර්දනය කිරීමේ අවශ්‍යතාවය ගැන අවධාරණය කළේය. එසේම දුප්පත් ගොවි කාරක සභා පිහිටුවීමද එයින් අනුමත කරන ලදී. වැඩ කරන ජනයා ඉටුකරන අනිවාර්ය යුද්ධ සේවය පදනම් කරගෙන රතු හමුදාව සංවිධානය කර ශක්තිමත් කිරීම සඳහා ගතයුතු මූලික පියවරයන් විස්තර කරමින් කොමියුනිස්ට් කණ්ඩායම ඉදිරිපත් කළ යෝජනාවක්ද ජූලි 10 දින පවත්වන ලද අවසාන සම්මේලනය විසින් අනුමත කරන ලදී. සෝවියට් රටෙහි වැඩ කරන ජනතාවගේ ජයග්‍රහණයන් නීතිමය වශයෙන් තහවුරු කළ රු. ස. ඒ. සෝ. ස. ව්‍යවස්ථාවද සම්මේලනයෙන් අනුමත විය.

58 "කලින් කථා කළ කථිකයා" වූයේ වාම සමාජවාදී-විප්ලවවාදී නායකයන්ගෙන් කෙනෙක් වූ එම්. ඒ. ස්පිරිදෝනවා ය. සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ ගොවිජන අංශයේ වැඩ ගැන ඉදිරිපත් කරන ලද ඇගේ අතිරේක වාර්තාව සෝවියට් ආණ්ඩුවේ සහ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රතිපත්තිය වෙත ප්‍රතිවිප්ලවවාදී පහරවල් ගණනාවක් එල්ල කර තිබිණි.

59 "ගෝලස් තෘදොවෝව ක්‍රෙස්තියාන්ස්ත්ව" (ශ්‍රමකරු ගොවි ජනතා හඬ) 1917 නොවැම්බරයේ පටන් 1919 මැයි 13 දක්වා පෙට්‍රොග්‍රෑඩයේ පළවූ දිනපතා පත්‍රයකි. එය ගොවි නියෝජිතයින්ගේ සමස්ත-රුසියා සෝවියට් සභාවේ දෙවැනි මන්ත්‍රණ සභාවේ ප්‍රධාන පත්‍රය විය. 1918 ජූලි 10 දක්වා වාමාංශික එස්ආර්වරු පත්‍රයේ නායකත්වය දැරූහ. 1918 නොවැම්බර් 6 දින සිට පත්‍රය කෘෂිකර්මය පිළිබඳ මහජන කොමිසාර් අංශයේ ප්‍රධාන පුවත් පත විය. එය 1919 මැයි 31 දක්වා පළවිය.

60 මෙම සඳහන පස්වැනි සමස්ත-රුසියා සෝවියට් සභා සම්මේලනයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද, රුසියානු සමාජවාදී ඒකාබද්ධ සෝවියට් සමූහාණ්ඩුවේ කෙටුම්පත් ව්‍යවස්ථාව (මූලික නීතිය) ගැනය.

ව්‍යවස්ථා කෙටුම්පත පිළියෙළ කරන ලද්දේ 1918 අප්‍රියෙල් 1 දින සමස්ත-රුසියා මධ්‍යම විධායක කාරක සභාව විසින් පත්කරනු ලැබූ වයි. එම්. ස්වර්ද්ලොව්ගේ ප්‍රධානත්වයෙන් යුත් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය විසිනි. එය සෝවියට් සභාවේ පස්වැනි සම්මේලනයට ඉදිරිපත් කිරීමට පෙර රු.කො.(බො.)ප. මධ්‍යම කාරක සභාවේ වි.අයි. ලෙනින්ගේ ප්‍රධානත්වයෙන් යුත් විශේෂ මණ්ඩලයකට අවසාන කෙටුම්පත් පිළියෙළ කිරීම සඳහා භාර දෙන ලදී. ලෙනින්ගේ යෝජනාවක් පරිදි රු. ස. ඒ. සෝ. සංගමයේ ව්‍යවස්ථා මාලාවට එහි පෙරවදනක් ලෙස "වැඩකරන හා සූරාකනු ලැබූ ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය" ඇතුලත් කරන ලද අතර සෝවියට් සමූහාණ්ඩුවේ ජාතීන්ට හා වංශ වලට සාමානාත්මතාවය දෙන වගන්තියක්ද රු. ස. ඒ. සෝ. ස. වාසය කරන විදේශිකයින්ට දේශපාලන අයිතිවාසිකම් දීම පිළිබඳ වගන්තියක්ද එසේම දේශපාලන හේතූන් නිසා පීඩනයට භාජනය වන විදේශිකයින්ට ආරක්ෂාව සැලසීම පිළිබඳ වගන්තියක්ද එකතු කරන ලදී. රු. කො. (බො.) පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් අනුමත කරන ලද කෙටුම් පත සම්මත කිරීම සඳහා සෝවියට් සාභාවල පස්වැනි සම්මේලනයට ඉදිරිපත් කරන ලදී. ස. රු. ම. වි. කා. සභාවේ විශේෂ කාරක සභාවක් මගින් අවසාන වශයෙන් සංස්කරණය කිරීමෙන් පසු ජූලි මස 10 දින රු. ස. ඒ. සො. සංගමයේ ව්‍යවස්ථාව සම්මේලනය විසින් අනුමත කරන ලදී.

රු. ස. ඒ. සෝ. ස. ව්‍යවස්ථාව රටේ මූලික නීතිය ලෙසට 1918 ජූලි 19 දින පළ කරන ලදුව, එදින පටන් එය වලංගු කරන ලදී.

https://liberationbase.wordpress.com

61 මෙම සඳහන කර ඇත්තේ, මෙන්ෂෙවික්වරුන්ගේ සහ සමාජවාදී-විප්ලවවාදීන්ගේ ක්‍රියාත්මක සහයෝගය ඇතිව අධිරාජ්‍යවාදී හවුල විසින් සංවිධානය කරන ලද චෙකොස්ලොවැකියානු හමුදා කණ්ඩායම්වල ප්‍රතිවිප්ලවවාදී කැරැල්ල ගැනය. චෙකොස්ලොවැකියානු හමුදව වූ කලී යුද්ධ සිරකරුවන් ලෙස අල්වා ගන්නා ලද චෙක් සහ ස්ලොවැකියානු භටයන්ගෙන්,එනම් කලින් ඔස්ත්‍රො-හංගේරියානු යුද්ධ හමුදවේ සේවය කළ භටයන්ගෙන් සංයුක්ත කොට ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයට පෙර රුසියාවේ පිහිටුවන ලද්දකි. එම හමුදවල ආයුධ රජයට භාර දීම සහ ඒවායේ රුසියානු නිලධාරීන් ඉවත් කිරීම යන කොන්දේසිවලට යටත් කොට 1918 මාර්තු 26 දින අත්සන් කළ ගිවිසුමක් අනුව එම හමුදාවලට ව්ලැඩිවොස්ටොක් හරහා රුසියාවෙන් පිටව යාමට අවසර දෙන ලදී. නමුත් එම හමුදාවල ප්‍රතිවිප්ලවවාදී නිලධාරීහු, එක්සත් ජනපදයේ, බ්‍රිතාන්‍යයේ සහ ප්‍රංශයේ අධිරාජ්‍ය-වාදීන්ගේ ආධාරය ඇතිව හා උපදෙස් අනුව මැයි මස අගදී ආයුධ සන්නද්ධ කැරැල්ලක් ඇති කළහ. සුදු හමුදා සහ කුලාකයන් සමග සමීප සම්බන්ධතාවයක් ඇතිව කටයුතු කළ කැරළි කරුවෝ උරාල්, වොල්ගා සහ සයිබීරියා යන ප්‍රදේශවල විශාල කොටසක් අල්වා ගෙන සෑම තන්හිම යළිත් ධනපති පාලනය පිහිටවූහ.

කැරැල්ල ආරම්භවූ වහාම, රුසියාවේ චෙකොස්ලොවැකියානු කොමියුනිස්ට් කණ්ඩායම්වල මධ්‍යම විධායක කාරක සභාව, එම හමුදාවල සාමාන්‍ය භට පිරිස් වෙත ජූනි 11 දින ආයාචනයක් නිකුත් කළ අතර කැරැල්ලේ ප්‍රතිවිප්ලවවාදී ස්වභාවය හෙළිදරව් කරමින්, කැරැල්ල අවසන් කොට රතු හමුදවට සම්බන්ධ වන ලෙස චෙකො-ස්ලොවැකියනු සේනාංකවලට ආයචනා කළේය. තම නිලධාරීන් විසින් තමන් රවටන ලද බව අවබෝධ කරගත් එම හමුදවල සාමාන්‍ය භටයෝ සෝවියට් බලයට විරුද්ධව සටන් කිරීම ප්‍රතික්ෂේප කොට තම හමුද හැර ගියහ. චෙක් සහ ස්ලොවැකියානු භටයින් 1200 ක් පමණ රතු හමුදවට බැඳී සටන් කළහ.

1918 සරත් සෘතුවේදී වෝල්ගා ප්‍රදේශය රතු හමුදව විසින් නිදහස්කරන ලදී. 1920 දී චෙක් හමුදව සම්පූර්ණයෙන්ම සමූලඝාතනය කරනු ලැබිණ.

62 මෙම සඳහන කර ඇත්තේ පීලික්ස් ජෙර්ෂින්ස්කිගේ ප්‍රධානත්වයෙන් පැවැති ''මහජන කොමිසාර් මණ්ඩලයේ සමස්ත රුසියා අති විශේෂ කොමිසම'' ගැනය. එය ''ප්‍රතිවිප්ලවයට, කඩාකප්පල් කාරී ක්‍රියාවන්ට සහ ලාභ ගැරීමට විරුද්ධව නිර්දය ලෙස සටන් කිරීම'' පිණිස, 1917 දෙසැම්බර් 7 (20) දින පිහිටුවන ලදී. එය නිර්ධන පංතියේ ආඥාදායකත්වයේ එක් ප්‍රධාන අංශයක් විය. සමස්ත-රුසියා අති විශේෂ කොමිසම ප්‍රතිවිප්ලවවාදීන්ගේ විනාශකාරී කටයුතුවලට විරුද්ධව කළ අරගලයේදී හා සෝවියට් සමූහාණ්ඩුවට ආරක්ෂාව සැලසීමේදී ඉතා වැදගත් කාර්ය කොටසක් ඉටු කළේය. 1921 දී පැවැති සමස්ත-රුසියා සෝවියට් සභාවල නවවැනි සම්මේලනය සමස්ත-රුසියා අති විශේෂ කොමිසමේ ඒ ඒ අංශ ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණයන් ආරක්ෂා කිරීමට කළ වීරෝදාර ක්‍රියාවන් ගැන යෝජනාවක් මගින් සඳහන් කරමින්, රටේ ආරක්ෂක බලය තහවුරුවී ඇති නිසා කොමිසමේ ක්‍රියාකාරී ක්ෂෙත්‍රය පටු කිරීමට යෝජනා කළේය. 1922 පෙබරවාරි 6 දින සමස්ත-රුසියා ම. වි. කා. සභාව සමස්ත-රුසියා අතිවිශේෂ කොමිසම විසුරුවා හැරීමට යෝජනාවක් සම්මත කළේය.

63 ''දුප්පත් ගොවි කාරක සභා'' — පහළින් දක්වෙන ක්‍රියාරාම්භකතාවය අනුව දුප්පත් ගොවි කාරක සභා පිහිටුවීමට අනුබල දෙමින්, සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාව 1918 ජූනි 11 දින නිකුත් කළ ''ගම්බද දුප්පතුන් සංවිධානය කිරීම සහ ඔවුන්ට භාණ්ඩ නිෂ්පාදනය ගැන'' වූ ආඥාව මගින් මෙම කාරක සභාව පිහිටුවන ලදී. 1918 නොවැම්බර් වනවිට කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ දුප්පත් ගොවි කාරක සභා 105000 ක් පිහිටුවා තිබිණි.

දුප්පත් ගොවී කාරක සභාවල ප්‍රායෝගික වැඩ ගම්වල සියළුම කටයුතු සඳහා යොදවන ලදී. ව්‍යවාහාරික ලෙස ගමේ නිර්ධන පංති ආඥාදායකත්වය ක්‍රියාත්මක කිරීමේදී ඒවා ප්‍රමුඛස්ථානයක් ගත්හ. ගමේ සමාජවාදී තරඟ ආරම්භ කිරීමේදී මෙම කාරක සභා සංවිධාන බොහෝ සේ උපකාරී වූහ.

කුලාක ප්‍රතිවිප්ලවය මර්දනය කිරීමේදී ද, ඔවුන්ගේ දේපල ඔවුන්ට අසන්තක කිරීමෙන් ඔවුන්ගේ ආරාක්ෂක ශක්තිය දුර්වල කිරීමේදී ද, ඉඩම් හිමි දේපල ක්‍රමය අවසාන වශයෙන් අහෝසි කිරීමේදී සහ දුර්භික්ෂයට පත් නාගරික කම්කරුවන්ට සහ රතු හමුදවට ආහාර සැපයීමේදී ද මෙම කාරක සභා ඉතා ප්‍රමුඛ කාර්ය කොටසක් ඉටු කළහ. රජයේ ගොවිපළවල් සමග ගම්වල සමාජවාදී වර්ගයේ ආර්ථික සංවිධානයේ ප්‍රථම මධ්‍යස්ථාන බවට පත්වූ ආටල සහ කොමියුන වැනි සාමූහික කෘෂිකාර්මික ව්‍යවසායයන් සංවිධානය කිරීමේදී මෙම කාරක සභා කාර්යශීලී ලෙස ඊට සහභාගී විය.

මෙම කාරක සභා විසින් කරන ලද වැඩ කටයුතු කම්කරු පංතිය සහ ගොවිජනතාව අතර සන්ධානය තහවුරු කිරීම සහ මධ්‍යම ගොවීන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සෝවියට් බලය පැත්තට දිනා ගැනීම සඳහා බෙහෙවින් වැදගත් විය.

1918 ශරත් සමය වන විට, මෙම කාරක සභා සමාජවාදී විප්ලවයෙන් ඒවාට පැවරුනු ඓතිහාසික කාර්ය කොටස සම්පූර්ණ කර තිබුණි. එනිසා සියළුම වොලොස්ට් සහ ග්‍රාමීය සෝවියට් සභා සඳහා නව තෝරාපත් කිරීම් කරන ලෙස 1918 නොවැම්බරයේ පැවැත්වුනු අති විශේෂ සමස්ත-රුසියා සෝවියට් සභා සම්මේලනය යෝජනා කළේය, ඒ සඳහා නිලවරණ පවත්වන ලද පසු දුප්පත් ගොවිකාරක සභාවල ක්‍රියාකාරීත්වය නතර කළ යුතු බවත්, ඒවායේ උපකරණ සහ ලේඛන නව සෝවියට් සභාවලට භාර දිය යුතු බවත් අපේක්ෂා කරන ලදී.

64 ලෙනින් සඳහන් කරන්නේ ආහාර කොමසාරිස්ගේ අති විශේෂ බලතල ගැන සමස්ත-රුසියා මධ්‍යම විධායක කාරක සභාව 1918 මැයි 18 දින නිකුත් කළ ආඥාව ගැන ය. ආහාර සම්පාදනය සහ ඒවා බෙදා හැරීම මධ්‍යගත කිරීම සඳහා ප්‍රතිපාදනයන්ද, කම්කරුවන්ගේ ධාන්‍ය එකතු කිරීමේ ව්‍යාපාර ගෙන යාම සහ කුලාකයන්ට විරුද්ධව සටන් කිරීමට දුප්පත් ගොවිජනයාට ආධාර කිරීම සඳහා පියවරයන්ද එම ආඥාවෙහි අන්තර්ගත විය.

65 මෙහි සඳහන් වන්නේ 1917 සැප්තැම්බර් 5—12 දිනවල ස්ටොක්හොල්ම්වල පවත්වන ලද ට්සිමර්වොල්ඩ් සාකච්ඡා සභාව ගැනය. විවිධ රටවල සමාජවාදී පක්ෂවල වාමාංශික කණ්ඩායම් මෙය නියෝජනය කළහ. බහුතරය නියෝජිත කණ්ඩායම් මධ්‍යස්ථාවාදී තත්වයක් ගත්හ.

66 ජාත්‍යන්තර සම්බන්ධතා කාරක සභාව — ජාත්‍යන්තර සම්බන්ධතා පුනරුත්ථාපනය කිරීමේ කාරක සභාව මෙය ප්‍රංශ ජාත්‍යන්තරවාදීන් විසින් 1916 ජනවාරි මස පිහිටුවන ලදී. මෙය සංවිධානය කරන ලද්දේ ප්‍රංශයේ සමාජ-ජාත්‍යාන්මාදවාදී සංවිධාන සමග බල තුලනය කිරීම සඳහා ප්‍රංශ සමාජවාදීන්ගේ විප්ලවවාදී-ජාත්‍යන්තර සංවිධානය පිහිටුවීමේ පළමුවැනි උත්සාහය වශයෙනි. ජාත්‍යන්තරවාදී කොටස් ඒකරාශී කිරීම සඳහා එම කාරක සභාව උපයෝගී කරගැනීම අත්‍යාවශ්‍ය යැයි ලෙනින් අදහස් කළේය. අයි. එෆ්. අර්මන්ද් කාරක සභාවේ වැඩ සඳහා ලෙනින්ගේ උපදෙස් පරිදි සහභාගී විය.

ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ බලපෑම සහ වර්ධනය වන, ප්‍රංශ කම්කරු පංති ව්‍යාපාරය නිසා මෙම කාරක සභාව විප්ලවවාදී-ජාත්‍යන්තර කොටස් ඒකරාශී කරන මධ්‍යස්ථානයක් විය. 1920 දී එය ප්‍රංශ කොමියුනිස්ට් පක්ෂයට එකතු විය.

67 සෝවියට් සමූහාණ්ඩුවේ පැන නැගුනු දුෂ්කර යුද්ධමය සහ ආර්ථික තත්වය නිසා. 1918 ජූලි 29 දින මෙම සැසිවාරය පවත්වන ලදී. එයට සාමාජිකයෝ 2000 සහභාගී වූහ. එහිදී ලෙනින්ගේ වාර්තාව අනුව, කොමියුනිස්ට් කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් ඒකමතික ලෙස සම්මත විය. සමාජවාදී පිතෘභූමිය අන්තරායට ලක් වී තිබෙන බව පිළිගත් එම යෝජනාව, සියළුම සංවිධානවල සහ වැඩ කරන ජනතාවගේ කටයුතු සමූහාණ්ඩුවේ ආරක්ෂාවේ අවශ්‍යතාවයන්ට යටත් කළ යුතු බවටද, තත්වය ගැන පොදු ජනතාවට විස්තර කර දීමට පුළුල් ව්‍යාපාරයක් ගෙන යායුතු බවටද, ප්‍රතිවිප්ලවවාදී ධනපතියන් සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරිත්වය වැඩි කළ යුතු බවටද, යුද්ධ හමුදාවේ සහ ආහාර කර්මාන්තයේ වැඩ කිරීමට ආණ්ඩුවේ නිලධාරීන් සංඛ්‍යාවක් මාරු කළ යුතු බවටද, ධාන්‍ය සැපයුම සඳහා දැඩි අරගලයක් සංවිධානය කළ යුතු බවටද බලවත් ලෙස ඉල්ලුම් කළේය.

68 ''ස්‍යකොජ්නික් ස්වබොදි'' (නිදහසේ පුරෝගාමියා) — සතිපතා පුවත් පතක් වූ මෙය සෝවියට් රුසියාවේ චෙකොස්ලොවැකියානු කොමියුනිස්ට් කණ්ඩායම්වල ප්‍රධාන නිල පත්‍රය විය. එය 1918 ජූනි පටන් 1919 මැයි දක්වා මොස්කව්හි පළ කරන ලදී. පළවූයේ කළාප 42 කි.

ලෙනින් සඳහන් කරන්නේ මෙම පත්‍රයේ 1918 ජූනි 28 දින පළ කෙරුණු ''කෝටි ගණන් ප්‍රංශ මුදල්'' යන ලිපිය ගැනය.

69 මෙම සඳහන පස්වැනි සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනය රැස්වෙමින් තිබියදී 1918 ජූලි 6-7 දිනවලදී වාම සමාජවාදී-විප්ලවවාදීන් ගැසූ කැරැල්ල ගැනය.

70 ''දෂ්න ක්ත්සූත්‍යූන් පක්ෂය'' — අර්මීනියානු ජාතික පක්ෂයකි. එය තුර්කි අර්මීනියන්වරු තුර්කි ආධිපත්‍යයෙන් මුදගනීමේ අරමුණ ඇතිව 1890 මුල් භාගයේදී පිහිටුවන ලද්දක් විය. ධනපති පංතිය හැරුණු විට ජාතික බුද්ධිමතුන්ද සුළු ධනපති පංතියද එයට ඇතුළත් වූහ. එසේම ජාතිකවාදී හා සමාජවාදී වදන්වලින් රවටනු ලැබූ කම්කරුවෝ හා ගොවියෝද එයට අතුළත් වූහ. 1905–1907 විප්ලව කාලයේදී දෂ්නාක්ත්සූත්‍යූන් එස්එර් වරුන්ට වඩාත් කිට්ටු විය. 1907 දී පක්ෂ සම්මේලන විසින් නරෝද්නික්වාදී ස්වරූපයෙන් යුත් ''සමාජවාදී'' වැඩ පිළිවෙළක් සම්මත කරගන්නා ලදී.

LIBERATION BASE
https://liberationbase.wordpress.com

1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු දශ්නාක්වරු ධනපති තාවකාලික රජයේ ප්‍රතිපත්ති වලට සහයෝගය දුන්හ. ඔක්තෝබර් විප්ලවයෙන් පසුව දශ්නාක්වරු, මෙන්ෂෙවික්වරුන්ද, සමාජවාදී—විප්ලවවාදීන්ද, මුස්සාවත්වරුන්ද සමග සෝවියට් බලයට විරුද්ධව ප්‍රතිවිප්ලවවාදී පෙරමුණක් ඇති කරගත්හ. 1918 සහ 1920 අතර කාලයේ දී ඔවුහු අර්මීනියාවේ ධනපති ජාතිකවාදී ප්‍රතිවිප්ලවවාදී ආණ්ඩුවේ ප්‍රධානත්වය දැරූහ. ඔවුන්ගේ කටයුතු නිසා, අර්මීනියාව විදේශීය අධිරාජ්‍යවාදීන්ගේ යටත් විජිතයක් බවට හා සෝවියට් සමූහාණ්ඩුවට විරුද්ධව ඇඟිලි ගැසීම්වල යෙදුනු බ්‍රිතාන්‍යයන්ට සහ ප්‍රංශවන්ටත්, සුදු හමුදවලටත් එගං වීමේ පාලම් මගක් බවටත් පත්වන තත්වයක් ඇති විය. බොල්ෂෙවික් පක්ෂයේ නායකත්වය ඇතිව සහ රතුහමුද සේනාංකවල ආධාරය ඇතිව අර්මීනියාවේ වැඩ කරන ජනතාව 1920 නොවැම්බරයේදී දශ්නාක් පාලනය පෙරළා දමූහ. සෝවියට් බලය ට්‍රාන්ස්කොකේසියාවේ ජයග්‍රහණයට පත්වීමෙන් පසුව දශ්නාක් ත්සුත්සුන් සංවිධාන මර්දනය කරන ලදී.

71 මුස්සාවත්වරු — අසර්බයිජානයේ ප්‍රතිවිප්ලවවාදී ධනපති හා ඉඩම් හිමියන්ගේ "මුස්සාවත්" පක්ෂයේ සාමාජිකවරු. එම පක්ෂය 1912 ආරම්භ විය. තුර්කිවරුන්ගේද පසුව බ්‍රිතාන්‍ය ආක්‍රමණිකයින්ගේද සහාය ඇතිව 1918 ජූලි සිට 1920 දක්වා ඔවුහු අසර්බයිජානය පාලනය කළහ. බාකු කම්කරුවන්ගේ හා ගොවීන්ගේද ඔවුන්ට ආධාරයට පැමිණි රතු හමුදවේද ඒකාබද්ධ උත්සාහයේ ප්‍රතිඵලයන් වශයෙන් මුස්සවත් රජය පෙරලා දමන ලදී. මුස්සාවත් සංවිධාන මර්දනය කරන ලදී.

72 තුර්කි ප්‍රහාරය හා සම්බන්ධයෙන් නගරයේ දේශපාලන සහ යුද්ධමය තත්වය ගැන සාකච්ඡා කිරීමට 1918 ජූලි 25 දින බාකු සෝවියට් සභාවේ හදිසි රැස්වීමක් පවත්වන ලදී. බාකු ආරක්ෂාකිරීමේ මුවාව යටතේ "ආධාරයට" බ්‍රිතාන්‍ය හමුද කැඳවිය යුතුයයි මෙන්ෂෙවික්වරු, දශ්නාක්වරු සහ සමාජවාදී-විප්ලවවාදීහු බල කළහ. බාකු සෝවියට් සභාවල බොල්ෂෙවික් නායකයෝ (ෂවුමියාන්, අසිස්බේකව්, ජපරිද්සෙ, සේවින් හා වෙනත් අය) දැඩි ලෙස මෙම ද්‍රෝහි ඉල්ලීම් ඉවත ලූහ. නමුත් බොල්ෂෙවික්වරුන්ගේ මෙම පරිශ්‍රමයන් නොතකාම බ්‍රිතාන්‍ය හමුද කැඳවීම සඳහා යෝජනාවක් වැඩි ඡන්ද සුළු ගණනකින් සම්මත කරන ලදී.

අල්පතරය ලෙස ඉතිරි වූ බොල්ෂෙවික්වරු — බාකු මහජන

කොමිසාර් මණ්ඩලයේ සාමාජිකයෝ තවදුරටත් මහජන කොමිසාර් මණ්ඩලයේ සිටීම ප්‍රතික්ෂේප කළහ. එහෙත්, පැනනැගී ඇති තත්වයන් යටතේ ඉන් අස්ව යෑම වරදක් බව ඔවුහු ඉක්මනින්ම වටහා ගත්හ. බාකු සෝවියට් සභාවේ විධායක කාරක සභාවේ හදිසි රැස්වීමකදී බලය පිළිබඳ ප්‍රශ්නය අවසානයක් දක්වා විසඳෙන තුරු මහජන කොමිසාර්වරු තම ධුරයන්ගේ රැඳීමට තීරණය කළහ.

සටනකින් තොරව බලය අත් නොහැරීමටත්, බාකු ආරක්ෂා කිරීමේ කටයුතු ඉක්මණින් සංවිධානය කිරීමටත්, සියළු බලමුළු සටනට සූදානම් කිරීමටත්, නගරය සහ සෝවියට් බලය ආරක්ෂා කරන ලෙසට කම්කරුවන් වෙත ආයාචනා කිරීමටත් ජූලි මස 27 දින පැවැත්වුනු බොල්ෂෙවික් වරුන්ගේ නාගරික සාකච්ඡා සභාව තීරණය කළේය.

කෙසේ හෝ වේවා, දශ්නාක්වරුන්ගේ, සමාජවාදී-විප්ලවවාදීන්ගේ සහ මෙන්ෂෙවික් වරුන්ගේ ද්‍රෝහිකම් නිසා අසර්බයිජානයේ කොමියුනිස්ට්වාදීන්ගේ සහ බාකු නිර්ධන පංතියේ දියුණු කොටසෙහි ප්‍රයත්නයන් ව්‍යර්ථ විය. දශ්නාක් භට පිරිස් පෙරමුණෙන් ඉවත්ව ගිය අතර එයින් සැදුනු කපොලු ඔස්සේ තුර්කි හමුද පෙරට ආහ. විදේශීය හමුදවල සහ ඔවුන්ගේ ඒජන්තවරුන්ගේ දැවැන්ත ප්‍රහාරය හමුවේ ජූලි 31 දින සෝවියට් බලය තාවකාලික වශයෙන් පරාජයට පත්විය. විදේශීය ආක්‍රමණය හැර බාකු රාජ්‍ය බලය බිඳ වැටීමට තවත් හේතුවක් නම් අසර්බයිජාන් පක්ෂ සංවිධානය හා බාකු මහජන කොමිසාර් මණ්ඩලය බාකු නිර්ධන පංතිය හා අසර්බයිජාන් වැඩකරන ගොවිජනතාව අතර ශක්තිමත් සංවිධානයක් ගොඩ නගා නොතිබීමය. එසේම ජාතික ප්‍රශ්නය විසඳීමේදීද වැරැදි රාශියක් කර තිබිණි. මුස්සාවත්වරු, දශ්නාක්වරු හා වෙනත් ප්‍රතිවිප්ලවවාදීහු මෙම වැරැදි ප්‍රයෝජනයට ගත්හ.

එන්ටෙන්ට් මිත්‍ර ගිවිසුමේ ඒජන්තවරුන් වූ, සමාජවාදී විප්ලවවාදීහු, මෙන්ෂෙවික්වරු සහ දශ්නාක්වරු, ඊනියා මධ්‍යම කැස්පියන් ප්‍රදේශයේ ආඥාදයකත්වය නමින් ප්‍රතිවිප්ලවවාදී ආණ්ඩුවක් පිහිට වූහ. අසර්බයිජානයේ සෝවියට් නායකයන් සිර කරන ලදී. සමාජවාදී-විප්ලවවාදීන්ගේ සහ මෙන්ෂෙවික්වරුන්ගේ සෘජු අනුබලය ඇතිව, බ්‍රිතාන්‍ය ආක්‍රමණිකයෝ සැප්තැම්බර් 20 දින රාත්‍රියේ බාකු කොමිසාර්වරු 26 දෙනෙකු (එස්. ජී. ෂවුමියාන්, එම්. ඒ. අසිස්බේකොව්, පී. ඒ. ජපරිද්සේ, අයි. ටී. පියොලෙතොව්, වයි. ඩී. සෙවින්, ජී. එන්. කොර්ගානව්, එම්. ජී. වෙසිරොව් සහ වෙනත් අය) වෙඩි තබා මැරූහ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

73 ඔක්තෝබර් සමාජවාදී විප්ලවය ජර්මනියේ විප්ලවීය ව්‍යාපාරයේ වර්ධනය කෙරෙහි මහත් බලයක් පෑවේය. සෝවියට් නියෝජිත මණ්ඩලය සමග බ්‍රෙස්ට්-ලිතොව්ස්ක් හි දී පවත්වන ලද සාම සාකච්ඡාවේදී ජර්මන් ආණ්ඩුව ඉදිරිපත් කළ අති දුෂ්කර ඉල්ලීම් නිසා ජර්මන් කම්කරුවන් ගේ කෝපය ඇවිස්සී ගිය අතර එය 1918 ජනවාරි මස අගදී සහ පෙබරවාරි මස මුලදී මහා දේශපාලන වැඩ වර්ජනයක් ඇති වීමට හේතු විය.

ජනවාරි 28 වැනි දින නීතිවිරෝධී ලෙස සටන් කළ ''ස්පාටකස්'' කණ්ඩායමේ හඬගෑම ලෙස බර්ලින් කම්කරුවෝ දහස් ගණනක් වැඩ අත්හිටුවා තමන්ගේ සෝවියට් සභා තෝරා පත් කර ගත්හ. වැඩ වර්ජනය ජර්මනියේ නගර 39 කට පැතිර ගියේය. එයට කම්කරුවෝ පහලොස් ලක්ෂයක් පමණ සහභාගි වූහ.බොහෝ ස්ථානවල සෝවියට් සභා පිහිටුවා ගන්නා ලද අතර ක්‍රියාකාරී කොමිටිද පත්කරගන්නා ලදී.

පෙබරවාරි 4 දින වැඩට එන ලෙස හමුද නායකත්වය කම්කරුවන්ට දැනුම් දුන්නේය. හමුදාවේ හා පොලිසියේද එමෙන්ම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නායකයින්ගේ සහයෝගය ඇතිව කයිසෙර් රජය වැඩ වර්ජනය මර්ධනය කළේය.

74 මෙයින් සඳහන් කෙරෙන්නේ 1918 ජූලි 6 දින ආරම්භ වූ යරස්ලාව්ල් සුදු හමුද කැරැල්ල ගැනය. එය සංවිධානය කරන ලද්දේ දක්ෂිණ සමාජවාදී-විප්ලවවාදී බී. වී. සාවින්කොව් ගේ නායකත්වයෙන් යුත් වූ ප්‍රතිවිප්ලවවාදී ''රට සහ නිදහස ආරක්ෂා කිරීමේ සංගමය'' විසිනි. එම වකවානුවේ සෝවියට් රුසියාවේ ඇති වූ අනිත් ප්‍රතිවිප්ලවවාදී කැරළි මෙන්ම, මෙම කැරැල්ලද මෙන්ෂෙවික් වරුන්ගේ සහ සමාජවාදී-විප්ලවවාදීන්ගේ ක්‍රියාශීලි සහභාගිත්වය ඇතිව එන්ටේන්ට් මිත්‍ර ගිවිසුමේ අධිරාජ්‍යවාදීන් විසින් සූදනම් කරන ලද්දක් විය. එය රුසියාව ආක්‍රමණය කිරීම සඳහා වූ පොදු සැලැස්මේ කොටසක් විය. එය මොස්කව් හි වාම සමාජවාදී-විප්ලවවාදීන් ගේ කැරැල්ල සමග එක්වර සිදුවන සේ ක්‍රියාත්මක කෙරින.

කැරැල්ල ආසන්නයේදී එස්ආර්වරු හා මෙන්ෂෙවික්වරු විශාල සංඛ්‍යාවක්ද එසේම සුදු හමුද නිලධාරීන් විශාල සංඛ්‍යාවක්ද යරස්ලාව්ල් වල රැඳී සිටියහ. ජූලි 6 දින කැරැලිකරුවෝ නගරයේ මධ්‍යම දිස්ත්‍රික්ක අල්වා ගත්හ. පරිපාලන ගොඩනැගිලිද, තැපැල් ස්ථාන, විදුලි පනිවුඩ ස්ථාන හා වෙනත් ආයතනද ඔවුන් යටතට පත්විය. පාක්ෂිකයින් හා සෝවියට් නිලධාරීන් කෲර ලෙස මර්ධනය කිරීම ඇරැඹිණ.

කැරැලිකරුවෝ නගරයේ කම්කරු ප්‍රදේශ අල්ලා ගැනීමට තැත්කළ නමුත් තීරණාත්මක ප්‍රතිරෝධයකට මුහුණ දීමට ඔවුන්ට සිදුවිය. කර්මාන්තායතනවල පක්ෂ සංවිධාන පොදු ජනතාව තමන් වටා ඒකරාශී කරගත් අතර කැරැල්ල මැඩපැවැත්වීම සඳහා ඔවුන් මෙහෙයවූහ. අවිගත් කම්කරුවෝ සහ රතු හමුදාවේ කොටස් කැරැලි කරුවන් සමග සටන් ඇරැඹූහ. යරස්ලාව්ල් කම්කරුවන්ට ආධාර සඳහා සෝවියට් රජය යුද හමුදව හා අවිගත් කම්කරුවන්ද පිටත් කළේය. 1918 ජූලි 21 දින එම කැරැල්ල මර්ධනය කරන ලදී.

75 ලෙනින් සඳහන් කරන්නේ මහා පරිමාණ කර්මාන්ත ජන සතු කිරීම සඳහා 1918 ජූනි 28 දින මහජන කොමිසාර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ආඥාව ගැනය. මෙම ආඥාව මගින් රූබල් 2,00,000 පටන් දශ ලක්ෂය දක්වා සහ ඊට වැඩි වූ ස්ථාවර ප්‍රාග්ධනයක් සහිත විශාල කාර්මික ව්‍යවසායයන් සියල්ලම ජනසතු කෙරින. පෞද්ගලික හිමිකම් සහිත වූ සියළුම දුම්රිය සේවාවන් සහ නාගරික සේවාවන් (ජල සම්පාදනය, ගෑස්, ට්‍රෑම් සේවය ආදිය) ජන සතු කර ප්‍රාදේශීය සෝවියට් සභා යටතට පත් කරන ලදී.

76 මෙම සඳහන කර ඇතතේ, ධාන්‍ය අත්කර ගැනීමේ මිළ තෙගුණ කරමින් 1918 රැස්කරන ලද ධාන්‍ය අස්වැන්න සඳහා ගෙවන නියමිත මිළ ගැන මහජන කොමිසාර් මණ්ඩලය විසින් 1918 අගෝස්තු 6 දින සම්මත කළ තීරණය ගැනය.

77 ලිපිය එක්සත් ජනපදයට යැවීම, නොබෝ කලකට පෙර එහි ගිය බොල්ෂෙවික්වරයෙක් වන එම්. එම්. බොරෝදින් විසින් සංවිධානය කරන ලදී. විදේශීය යුද්ධ ආක්‍රමණය හා අධිරාජ්‍යවාදීන් විසින් සෝවියට් රුසියාව වටකර තිබූ මෙම අවස්ථාවේදී එම කටයුත්ත කිරීම සඳහා අමාරුකම් රාශියක් මැඩ ඉදිරියට යාමට සිදුවිය. ලිපිය සමග රු. ස. ඒ. සෝ. ස. ව්‍යවස්ථාවෙන් පිටපතක්ද, ආක්‍රමණික කටයුතු නවත්වන ලෙස බල කරමින් සෝවියට් ආණ්ඩුව ජනාධිපති විල්සන් වෙත යැවූ ලිපියෙන් පිටපතක් ද විය. සුප්‍රසිද්ධ ඇමෙරිකානු සමාජවාදියෙක් හා පත්‍රකලාවේදියෙක් වූ ජෝන් රීඩ් මහතාගේ සහයෝගය ඇතිව එම ලිපිය පුවත්පත්වල පළකරන ලදී.

මෙම ලිපිය ඉංග්‍රිසි බසින් (මදක් සම්පිණ්ඩනය කර) ඇමෙරිකානු සමාජවාදී පක්ෂයේ වාමාංශයේ වාර පත්‍ර වලද, “The Class Straggle” (පංති සටන) නැමැති නිව්යෝක් සඟරාවේද, ජෝන් රීඩ් සහ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

සෙන් කතයාමා සහභාගි වූ ප්‍රකාශනය වූ "The Revolutionary Age" (විප්ලවීය යුගය) යන බොස්ටන් සති පතා පත්‍රයෙහිද, 1918 දෙසැම්බරයේදී පළ විය. ඊට පසු එය කුඩා පොතක් ලෙසට පළ කරන ලදුව බොහෝ වරක් ඇමෙරිකානු සහ බටහිර යුරෝපීය පුවත් පත් වල නැවත පළවිය.

ඇමෙරිකානු කම්කරුවන්ට යැවූ ලිපිය ඇමෙරිකානු වාමාංශික සමාජවාදීන් විසින් පුළුල් ලෙස ප්‍රයෝජනයට ගන්නා ලදී. එය ඇමෙරිකානු හා යුරෝපීය රටවල කම්කරු හා කොමියුනිස්ට්වාදී ව්‍යාපාරයේ වර්ධනය සඳහා මහත් සේ උපකාරී විය. එසේම එම ලිපිය නිසා සෝවියට් රුසියාව ආක්‍රමණය කිරීමට විරුද්ධව කරන ව්‍යාපාරය ශක්තිමත් විය.

78 ස්පාඤ්ඤ යටත් විජිතවාදීන්ට විරුද්ධව කියුබාවේ සහ පිලිපයිනයේ ඇතිවූ ජාතික විමුක්ති ව්‍යාපාරය තමන්ගේ වාසියට හරවා ගැනීමේ ප්‍රයත්නයක් දරමින් එක්සත් ජනපද අධිරාජ්‍යවාදීහු 1898 දී ස්පාඤ්ඤයට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කළහ. ස්වාධීන සමූහාණ්ඩුවක් පිහිටුවීම ප්‍රකාශයට පත් කර සිටි පිලිපයිනයේ ජනතාවට ආධාර කිරීමට යයි කියා ඔවුහු පිලිපයිනයට හමුද ගොඩ බැස්සවූහ. 1898 දී පැරිසියේදී අත්සන් කළ ගිවිසුම අනුව පරාජිත ස්පාඤ්ඤය පිලිපයිනය සම්බන්ධයෙන් අයිතිවාසි කම් අත්හැර එය ඇමෙරිකා එක්සත් ජනපදයට පැවරුවේය. 1899 දී ඇමෙරිකානු අධිරාජ්‍යවාදීහු අති දුෂ්ට ලෙස පිලිපයින් සමූහාණ්ඩුවට පහර දුන්හ. පිලිපයින් ජනතාවගේ දැඩි විරුද්ධතාවයට පිළිතුරු දෙමින් අමෙරිකානු හමුදව පිලිපයින් සාම කාමී හමුදව මරා දැමීමට හා මෘග ලෙස මර්ධනය කිරීම කළේය. ඇමෙරිකානු හමුදව අති විශාල වුවත් පිලිපයින් ජනතාව මර්ධන කිරීම ඔවුන්ට ලෙහෙසියෙන් කළ නොහැකි විය. ආක්‍රමණිකයන්ට විරුද්ධව පිලිපයින් ජනතාව ගරිල්ලා යුද්ධය ක්‍රියාත්මක කරන ලද නමුත්, ගොවි ජනයා ඔවුන්ගේ නිදහස සඳහා කළ සටන ඉඩම් හා වඩා හොඳ තත්වයන් සඳහා කරන අරගලයක් සමග එකට සම්බන්ධ කිරීම නිසා බියට පත් ඉඩම් හිමියෝ හා ධනපතියෝ එක්සත් ජනපද අධිරාජ්‍යවාදීන් සමග එකඟත්වයකට පැමිණියහ. 1901 දී පිලිපයිනයේ ජාතික විමුක්ති ව්‍යාපාරය මර්දනය කරන ලදින් එය එක්සත් ජනපද යටත් විජිතයක් විය.

79 ඇමෙරිකානු ආර්ථික විද්‍යාඥයෙක් වූ ජී. එච්. කේරි මහතාගේ ''ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති තුමාට දේශපාලන-ආර්ථික ලිපි'' නැමැති පොතට එන්. ජී. චෙර්නිෂෙව්ස්කි ලියූ විමර්ෂණාත්මක ලිපියෙහි මෙසේ ලියා ඇත. ''ඓතිහාසික මාවත යනු නේව්ස්කි මාවතේ පදික වේදිකාව නොවේ. එය දූවිලි, කසල මඩවගුරු, කාන්තාර ගහණ ක්ෂෙත්‍රයක් තුළින් වැටී ඇත. දූවිලි කැමට හා සපත්තු අපිරිසිදු කර ගැනීමට බියවන අයෙක් ඇත්නම් සමාජයෙහි වැඩකිරීමට නොබසින ලෙස ඔහුට අපි උපදෙස් දෙමු.''

80 "Appeal to Reason" (සාධාරණත්වයට ආයාචනය) — 1895 දී කැන්සස් ජනපදයේ ජෙරාර්ඩ් හි ආරම්භ කරන ලද ඇමෙරිකානු සමාජවාදී ප්‍රවෘත්ති පත්‍රයක් විය. සමාජවාදී අදහස් ප්‍රචාරය කළ එය කම්කරුවන් අතර ඉතාමත් ජනප්‍රිය විය. පළමුවැනි ලෝක යුද්ධය කාලයේ දී එය ජාත්‍යන්තරවාදී පිළිවෙතක් අනුගමනය කළේය.

ඩෙබ්ස් ගේ ලිපිය 1915 සැප්තැම්බර් 11 දින මෙම පත්‍රයේ පළ විය. එහි සිරස්තලය වූයේ 'When I shall fight' ''මා සටන් කරන්නේ කවර අවස්ථාවකද'' යන්නය. ලෙනින් එය සඳහන් කර තිබෙන්නේ මතකින් විය යුතුය.

81 දහහත්වැනි ශතවර්ෂයේ එංගලන්තයේ සිදුවූ ධනපති විප්ලවයේදී, 1646 දී පළමුවැනි කාල් රජතුමා මරා දමන ලදී. රාජාණ්ඩුව හා සාමි මණ්ඩලය අහෝසි කරන ලද අතර සමූහාණ්ඩුවක් පිහිටුවන ලදී. එය 1660 දක්වා පැවතියේය.

දහ අටවැනි ශතවර්ෂයේ ප්‍රංශයේ පැවති ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේදී, 1793 සැප්තැම්බර් 4–5 දිනවලදී ප්‍රතිවිප්ලවවාදීන්ගේ ත්‍රස්තවාදී කටයුතුවලට (විප්ලවය ප්‍රමුඛ ලෙස ගෙන ගිය ජී. පී. මරාත්, ජී. ෂොම් මරාදැමීම) පිළිතුරු වශයෙන් විප්ලවයේ සතුරන්ට විරුද්ධව මර්ධනකාරී පිළිවෙතක් ගෙන යමින් ත්‍රස්තය දවසේ ප්‍රධාන කාර්ය කොට ගන්නා ලදී.

82 ''ජුපිටර්'' සහ ''මිනේර්වා'' — පුරාණ රෝම දෙවිවරුය. ජුපිටර්, අහසට, එළියට හා වැස්සට අධිපති දෙවියා වූ අතර පසුව රෝමානුවරුන්ගේ ප්‍රධානම දෙවියා විය. මිනේර්වා යුද්ධයට, කලාවන්ට, විද්‍යාවන්ට හා අත්කම්වලට අධිපති දෙව් දුව විය. මිථ්‍යා කථා අනුව මිනේර්වා උපන්නේ ජුපිටර්ගේ හිසෙනි.

83 1918 ඔක්තෝබර් 22 දින පැවති මෙම රැස්වීමේදී ලෙනින් ජාත්‍යන්තර තත්වය ගැන වාර්තාවක් ඉදිරිපත් කළේය. රෝගීව සිටීමෙන් පසු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඔහු ප්‍රසිද්ධියේ පෙනී සිටි ප්‍රථම අවස්ථාව එය විය. මෙහි පළ කර තිබෙන යෝජනාව එම රැස්වීමේ දී අනුමත විය. ලෙනින් ජාත්‍යන්තර තත්වය ගැන කළ වාර්තාව අනුව පසුව එය සුළු වශයෙන් සංශෝධනය කර හයවැනි සෝවියට් සභා සම්මේලනය විසින් අනුමත කරන ලදී.

84 එන්ටෙන්ට් ගිවිසුම (ත්‍රිපාක්ෂික ගිවිසුම) — බ්‍රිතාන්‍ය, ප්‍රංශ හා රුසියානු අධිරාජ්‍යවාදී කඳවුර ය. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී (1914–1918) එයට ඇමරිකාව, ජපානය, ඉතාලිය හා වෙනත් රටවල්ද සහභාගි විය. එන්ටෙන්ට් රටවල් යෞවන සෝවියට් රජයට විරුද්ධව ආක්‍රමණකාරී කටයුතුවලට සහභාගි විය.

85 ප්‍රාව්ද — කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන පුවත්පත. 1912 මැයි මස සිට පළවේ.

86 ලෙනින් පිතිරිම් සරෝකින් ගේ ලිපියෙන් කොටස් උපුටා දක්වා ඇත්තේ එය (1918 නොවැම්බර් 20 දින අංක 18) ප්‍රාව්ද පත්‍රයේ පළවූ ආකාරයෙනි. එම ලිපිය "උතුරු ද්විනා විධායක කාරක සභාවේ ඉස්වෙස්තියා" පත්‍රයෙහි මුලින් පළවූ බව එහි වැරදි ලෙස සඳහන්ව තිබුණි. ඇත්ත වශයෙන්ම උතුරු ද්විනා ගුබර්නියා පළාතේ විධායක කාරක සභාවේ පත්‍රය හැඳින්වුනේ "ක්‍රිස්තියාන්ස්කිය ඉ රබෝචිය දූමි" නමිනි. එම ලිපිය 1918 ඔක්තෝබර් 29 දින පත්‍රයේ අංක 75 දරන කලාපයෙහි පළ විය.

87 ජර්මන් විප්ලවය සිදුවූයේ 1918 නොවැම්බර් මාසයේදීය.

88 "කම්කරු, ගොවිජන, කොසැක් සහ රතු හමුද නියෝජිතයන් ගේ අතිවිශේෂ හය වැනි සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනය" 1918 නොවැම්බර් 6 සිට 8 දක්වා මොස්කව්හි දී පවත්වන ලදී. එය විවෘත කිරීම ඔක්තෝබර් සමාජවාදී විප්ලවයේ සංවත්සරය සමග එකට යෙදිනි.

ලෙනින් ඔක්තෝබර් සමාජවාදී විප්ලවයේ සංවත්සරය සහ ජාත්‍යන්තර තත්වය ගැන වාර්තා ඉදිරිපත් කළේය. ලෙනින් විසින් ලියන ලද සහ සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාවේද, මොස්කව් සෝවියට් සභාවේද, පැක්ටරි කාරක සභාවල සහ වෘත්තීය සමිති වලද ඒකාබද්ධ රැස්වීමේදී 1918 ඔක්තෝබර් 22 දින අනුමත කරන ලද (මෙහි 210–212 පිටු බලන්න) යෝජනාවක් සම්මේලනය විසින් ඒකමතිකව සම්මත කරන ලදී. සාම සාකච්ඡා ආරම්භ කරන ලෙස රුසියාවට විරුද්ධව යුද්ධ කරන රටවල ආණ්ඩුවලට ආයාචනා කරන යෝජනාවක්ද, විප්ලවවාදී නීත්‍යානුකූල භාවයත්, සෝවියට් නිර්මාණක කටයුතුත්, දුප්පත් ගොවි කාරක සභා වොලොස්ට් හා ග්‍රාමීය සෝවියට් සභා සමග සංයෝජනය කිරීමත් ගැන යෝජනා ගණනාවක්ද සම්මේලනය විසින් අනුමත කරන ලදී. ජර්මනියේ ආරම්භ වූ විප්ලවය පිළිබඳ ප්‍රවෘත්තිය සම්මේලනයේ නියෝජිතයෝ මහත් සතුටින් පිළිගත්හ. ඔවුහු ජර්මනියේ කම්කරුවන්, සොල්දාදුවන් හා සේලරුවන් අරම්භ කළ කැරැල්ලට සහයෝගය ප්‍රකාශ කළහ.

සෝවියට් බලය පැවති ප්‍රථම වර්ෂයේදී එය ලැබූ ප්‍රතිඵල සම්පිණ්ඩනය කළ සම්මේලනය නුදුරු අනාගතයේ සෝවියට් ආණ්ඩුවේ වැඩ සඳහා වැඩ පිළිවෙළක් සකස් කළේය.

89 ලෙනින් අදහස් කරන්නේ මොස්කව් මහජන බැංකුවේ කොටස් හිමියන්ගේ අති විශේෂ සම්මේලනය විසින් 1918 නොවැම්බර් 16 දින සම්මත කරන ලද, යෝජිත ජනසතු කිරීමට විරුද්ධව එල්ල කරන ලද යෝජනාව ගැනය. ම. කො. ම. 1918 දෙසැම්බර් 2 දින නිකුත් කළ ආඥාව අනුව මොස්කව් මහජන බැංකුව ජනසතු කර එහි සියළුම වත්කම් සහ බැරකම් රු. ස. ඒ. සෝ. ස. ජාතික බැංකුවට පවරන ලදී. මොස්කව් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිසංවිධානය කර, එය රු. ස. ඒ. සෝ. ස. ජාතික බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සමුපකාර දෙපාර්තමේන්තුව බවට පරිවර්තනය කරන ලදී.

17—2663

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නාමාවලිය

පළමුවැනි අලෙක්සාන්දර් (රොමානොව්) (1777–1825) — රුසියානු අධිරාජයා (1801–1825)

අලෙක්සෙයෙව්, මිහයිල් වසීල්යෙවිච් (1857–1918) — සාර් හමුදාවේ ජෙනරාල් වරයෙකි. රාජාණ්ඩුවාදියෙක් හා ප්‍රතිවිප්ලවවාදියෙකි. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු යුද හමුදාවේ ප්‍රධාන අණදෙන නිලධාරි තනතුර දැරුවේය. පසුව ටික කලක් කේරෙන්ස්කිගේ යුද හමුදාවේ හමුදා මූලස්ථානය භාර ප්‍රධානියා ලෙස කටයුතු කළේය. රුසියාවේ, සිවිල් යුද්ධය කාලයේදී උතුරු කොකේසියාවේ සංවිධානය කරන ලද සුදු හමුදාවාදී "ස්වේච්ඡා හමුදාවේ" ප්‍රධානියා ලෙස කටයුතු කළේය

ඉසුව්, ඉෂිසිප් අන්ද්‍රෙයිවිච් (1878–1920) — සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, මෙන්ෂෙවිකයෙකි. 1917 දී මෙන්ෂෙවික්වරුන්ගේ මොස්කව් කාරක සභාවේ සිටි අතර මොස්කව් නගර සභාවේ සාමාජිකයෙකුද විය.

එංගල්ස් (Engels), ෆ්‍රෙඩ්රික් (1820–1895) — පිටුව 53

ඔසින්ස්කි, එන්. (ඔබලෙන්ස්කි, වී. වී.) (1887–1938) — 1907 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකි. — "වාම කොමියුනිස්ට්වාදියෙකි", "වාම කොමියුනිස්ට්වරුන්ගේ" න්‍යායාචාර්ය වරයාය.

ක්ලවුසෙවිත්ස් (Clausewitz), කාර්ල් (1780-1831) — ප්රුසියානු ජෙනරාල් වරයෙකි. යුද්ධ ක්‍රම පිළිබඳ මහා විද්‍යාඥයෙකි. නැපෝලියන් යුද්ධ හා වෙනත් යුද්ධ පිළිබඳ පොත් ගනණාවකම කර්තෘවරයාය.

කවෙන්නියාක් (Cavaignac), ලුයී එෂෙන් (1802–1857) — ප්‍රංශ ජෙනරාල් වරයෙකි, ප්‍රතිගාමී දේශපාලනඥයෙකි. 1848 ජූනි මාසයේ වූ යුද්ධ ආඥාදායකත්වයේ නායකයා විය. පැරිස් කම්කරුවන්ගේ ජූනි කැරැල්ල කෲර ලෙස මර්ධනය කළේද මොහුය.

කලේදින්, අලෙක්සේයි මක්සීමවිච් (1861–1918) — සාර් හමුදාවේ ජෙනරාල්වරයෙකි. දොන් කොසැක් අතමාන් වරයාය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු දොන්වල කොසැක් ප්‍රතිවිල්ලවවාදීන්ට නායකත්වය දුන්නේය. සුදු හමුදාවාදී "ස්වේච්ඡා හමුදාව" ගොඩනැගීමට සහභාගි විය. කොසැක් ත්‍රස්තවාදී කැරැල්ල මෙහෙයවීය.

කරේලින්, ව්ලදීමිර් අලෙක්සාන්ද්‍රවිච් (1881–1938) — වාමාංශික සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ (වාම එස්ආර්) ප්‍රාරම්භකයෙකි. එහි මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකි. 1918 ජූනි වාම එස්ආර් කැරැල්ල මෙහෙයවූ එක් නායකයෙකි.

කර්නිලව්, ලාව්ර් ගියොර්ගියෙවිච් (1870-1918) — සාර් හමුදාවේ ජෙනරාල් වරයෙකි. 1917 ජූලි-අගෝස්තුවලදී රුසියානු හමුදාවේ ප්‍රධාන අනදෙන නිලධාරියා ලෙස කටයුතු කළේය. අගෝස්තුවලදී ප්‍රතිවිප්ලවවාදී කැරැල්ල මෙහෙයවීය. කැරැල්ල මැඩපැවැත්වීමෙන් පසු හිරභාරයට ගත්, නමුත් පසුව හිරෙන් පැනගොස් දොන් හි "ස්වේච්ඡා හමුදාවේ" එක් සංවිධායකයෙකු ලෙස කටයුතු කළ අතර පසුව එහි නායකයා විය.

කිෂ්කින්, නිකලායි මිහායිලවිච් (1864–1930) — කැඩෙට් පක්ෂයේ එක් නායකයෙක්. ධනපති තාවකාලික රජයේ සමාජ සේවා ඇමති ධූරය දැරුවේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලව ආසන්නයේදී පෙට්‍රොග්‍රෑඩ් හි ආඥාදායකයා ලෙස පත්කරන ලදී. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් රජයට විරුද්ධව සටන් මෙහෙය වීය.

කුචුක් හාන් (විපත 1921)—ඉරානයේ දේශපාලනඥයෙකි. වාණිජ ධනපති පංතියේ හා ඉඩම් හිමියන් කොටසකගේ අවශ්‍යතාවයන් ආරක්ෂා කළේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කෙරෙන්ස්කි, අලෙක්සාන්දර් පියෝදරවිච් (1881–1970) විප්ලවවාදී-සමාජවාදියෙකි. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු අධිකරන ඇමති ධුරයද, යුද්ධ හා නාවික කටයුතු භාර ඇමති ධුරයද පසුව ධනපති තාවකාලික රජයේ නායකයා හා ප්‍රධාන අණදෙන නිලධාරි තනතුරුද දැරුවේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් රජයට විරුද්ධ සටන් මෙහෙයවීය. 1918 දී විදේශය බලා පැන ගියේය.

කෝර්ගානව්, ග්‍රිගොරි නිකලායෙවිච් (1886–1918) — බකූ මහජන කොමිසාර් මණ්ඩලයේ යුද්ධ කොමිසාර් වරයාය. 1918 දී බකූ කොමිසාර් වරුන් 25 ක් සමග ඔහුද බ්‍රිතාන්‍ය ආක්‍රමණිකයින් විසින් වෙඩිතබා මරා දමන ලදී.

ක්‍රස්නොව්, පියෝතර් නිකලායෙවිච් (1869–1947) — සාර් හමුදාවේ ජෙනරාල් වරයෙකි. 1917 අගෝස්තු කර්නිලව්වාදී කැරැල්ලට සහභාගි විය. සෝවියට් විරෝධී කැරැල්ල අවස්ථාවේදී කෙරෙන්ස්කි විසින් පෙට්‍රොග්‍රෑඩ්වලට යවන ලද කොසැක් හමුදාව මෙහෙයවීය. 1918–1919 අවුරුදුවලදී දොන් හි කොසැක් සුදුහමුද මෙහෙය වූයේය.

ගේ, ඒ. යූ. (විපත 1919) රුසියානු අරාජිකවාදියෙක්. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් බලයට ආධාර කළේය. 3 වැනි හා 4 වැනි සැසිවාරවල මධ්‍යම විධායක කාර්ක සභාවේ සාමාජිකයෙකුව සිටියේය.

ගෙගෙච්කෝරි, යෙව්ගේනි පෙත්‍රොවිච් (උපත 1879) — මෙන්ෂෙවික් වරයෙක්, 1917 නොවැම්බර් සිට කොකේසියානු ප්‍රතිවිප්ලවවාදී රජයේ අගමැති ධුරය දැරුවේය. පසුව ජෝජියානු මෙන්ෂෙවික්වාදී රජයේ විදේශකටයුතු භාර ඇමති ධුරයද උප අගමැති ධුරයද ඉසිලුවේය. 1921 දී ජෝජියාවේ සෝවියට් බලය ගොඩ නැගූ පසු විදේශගත විය.

ගොගෙන්ත්සොලෙර්න් — දෙවනි විල්හෙල්ම් (ගොගෙන්ත්සොලෙර්න්) බලන්න.

ගොම්පර්ස් (Gompers), සැමුවෙල් (1882–1940) — ඇමෙරිකානු වෘත්තීය සමිති ව්‍යාපාරයේ නායකයෙක්. ඇමෙරිකානු කම්කරු බල මණ්ඩලයේ (AFL) එක් නායකයෙකි. ධනපති පංතිය සමග පංති සහයෝගීතාවයෙන් වැඩ කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. කම්කරු පංතියේ විප්ලවවාදී සටන්වලට විරුද්ධ විය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට සහ සෝවියට් රජයට සතුරු ආකල්පයක් දැක්විය.

ගොත්ස්, අබ්රාම් ර්පයිලවිච් (1882-1940) — එස්ආර් පක්ෂයේ එක් නායකයෙකි. 1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු පෙට්‍රොග්‍රෑඩ් කම්කරු හා සොල්දදු නියෝජිතයින්ගේ සෝවියට් සභාවේ සාමාජිකයෙකු විය. ප්‍රතිවිප්ලවවාදී සංවිධානයක් වූ "රට හා විප්ලවය ආරක්ෂා කිරීමේ කාරක සභාවේද" සාමාජිකයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් රජයට විරුද්ධව සටන් මෙහෙය වූයේය.

චෙර්නොව්, වික්තර් මිහායිලවිච් — (1876–1952) එස්ආර් පක්ෂයේ එක් නායකයෙක් හා න්‍යායාචාර්ය වරයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී වාමාංශික වදන්මාලාවලට මුවා වී සමාජ-ජාත්‍යාන්මාදවාදී ප්‍රතිපත්තියක් ගෙනගියේය. 1917 මැයි අගෝස්තු මාසවලදී ධනපති තාවකාලික රජයේ කෘෂිකර්ම ඇමති ධුරය දැරූ අතර ඉඩම් හිමියන්ගෙන් ඉඩම් අල්ලාගත් ගොවීන් කෲර ලෙස මර්ධනය කිරීමේ ප්‍රතිපත්තියක් ගෙනගියේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් විරෝධී කැරැලි සංවිධානය කළේය.

චෙර්නිෂෙව්ස්කි, නිකලායි ගව්රීලවිච් (1828–1889) — රුසියානු විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදියෙක් හා ලේඛකයෙක්, ද්‍රව්‍යවාදී දර්ශනිකයෙක්, සාහිත්‍ය විචාරකයෙක්. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සම්භාවනීය ප්‍රාරම්භකයෙක්.

ජෙර්ෂින්ස්කි ෆේපලික්ස් එද්මුන්දවිච් — (1877–1926) සෝවියට් රජයේ හා කොමියුනිස්ට් පක්ෂයේ සම්භාවනීය නායකයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයේ ජයග්‍රහනයෙන් පසු ප්‍රතිවිප්ලවවාදීන්ට සහ කඩාකප්පල්කාරයින්ට විරුද්ධව සටන් කිරීම සඳහා පිහිටුවන ලද සමස්ත-රුසියා අතිවිශේෂ කොමිසමේ (චෙකා) සභාපති ලෙස කටයුතු කළේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ට්සෙරතෙලි, ඉරාක්ලි ගෙයෝර්ගියෙවිච් (1882–1959) — මෙන්ෂෙවික්-වාදයේ එක් නායකයෙක්. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු පෙට්‍රොග්‍රෑඩ් විධායක සභාවේ සාමාජිකයෙකු ලෙසද මධ්‍යම විධායක කාරක සභාවේ පළමුවැනි සැසිවාරයේ නියෝජිත-යෙකු ලෙසද සිටියේය. 1917 මැයි මස ධනපති තාවකාලික රජයට තැපැල් හා විදුලි පනිවුඩ භාර ඇමතිවරයා ලෙස ඇතුළු විය. ජූලි සිද්ධීන්වලට පසු ස්වදේශ කටයුතු භාර ඇමති ධුරයට පත්විය. බොල්ෂෙවික්වරු ඝාතනය කිරීමේ කටයුතු සංවිධානය කළේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු ජෝර්ජියාවේ ප්‍රතිවිප්ලවවාදී මෙන්ෂෙවික්වාදී රජයේ නායකයෙකුව සිටියේය.

ට්සෙත්කින් (Zetkin), ක්ලාරා (1857-1933) ජර්මන් හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ සම්භාවනීය නායිකාවකි. ජර්මනියේ කොමියුනිස්ට් පක්ෂය ආරම්භ කළ අයගෙන් කෙනෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී විප්ලවවාදී ජාත්‍යන්තර ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර සමාජ-ජාතොන්මාදවාදයට විරුද්ධව කටයුතු කළේය. කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ තුන්වැනි සාකච්ඡා සම්මේලනයේදී කොමින්ටෙර්නයේ විධායක සභාවට තේරී පත්විය.

LIBERATIONBASE

ටේයිලර් (Taylor), ෆ්‍රෙඩ්රික් විල්සන් (1856-1915) — ඇමෙරිකානු ඉංජිනේරුවෙක්. 1905–1906 අවුරුදුවලදී ඇමෙරිකානු යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ සංගමයේ සභාපති ධුරය දැරුවේය. වැඩ දිනය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම හා නිෂ්පාදන මාධ්‍යයන් හා ශ්‍රම උපකරණ ප්‍රතිඵලදායක ලෙස යොදා ගැනීම ඉලක්කය කොට ඉදිරිපත් කළ ශ්‍රම සංවිධානය ක්‍රමයේ නිර්මාතෘ වරයාය.

ට්‍රොට්ස්කි (බ්‍රොන්ෂ්තෙයින්), ලියෙව් දවිදවිච් (1879–1940) — 1897 සිට රු. ස. ප්‍ර. ක. ප. සාමාජිකයෙකි. මෙන්ෂෙවික්වාදියෙකි. 1905–1907 විප්ලවයේ පරාජයෙන් පසු ඈවරකරන්නෙක් (ලික්විඩේටර්වරයෙක්) බවට පත්විය. යුද්ධය සාමය හා විප්ලවය පිළිබඳ ප්‍රශ්නවලදී ලෙනින්ට හා බොල්ෂෙවික් වරුන්ට විරුද්ධව සටන් මෙහෙයවීය. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී මධ්‍යස්ථවාදී පිළිවෙතක් අනුගමනය කළේය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට අනතුරුව විදේශයේ සිට රුසියාවට පැමිණි පසු බොල්ෂෙවික් පක්ෂයට බඳවා ගන්නා ලදී.එහෙත් ට්‍රොට්ස්කි බොල්ෂෙවික් ප්‍රතිපත්ති පිළිගත්තේ නැත.

ඔහු විවෘතව හා රහසිගතව ලෙනින්වාදයට සහ පක්ෂයේ ප්‍රතිපත්ති වලට විරුද්ධව සටන් මෙහෙයවූයේය.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු ඔහු රජයේ වගකිවයුතු තනතුරු කීපයක්ම ඉසිලුවේය. එහෙත් පක්ෂයේ මූලික ප්‍රතිපත්තිවලට සහ සෝවියට් සංගමයේ සමාජවාදය ගොඩනැගීමේ වැඩ පිළිවෙළට විරුද්ධව කටයුතු කළේය. 1927 දී ඔහු පක්ෂයෙන් නෙරපන ලදී. 1929 දී රටින් පිටුවහල් කරනු ලැබ 1932 දී සෝවියට් පුරවැසිභාවයද නැති කරන ලදී.

ඩෙබ්ස් (Debs), යූජින් වික්ටර් (1855-1926) — ඇමෙරිකාවේ කම්කරු ව්‍යාපාරයේ ප්‍රධාන පෙළේ නායකයෙකි. 1900–1901 අවුරුදුවලදී ගොඩනගනලද සමාජවාදී පක්ෂයට කේන්ද්‍රස්ථානය වූ සමාජ-ප්‍රජා-තන්ත්‍රවාදී පක්ෂයේ එක් සංවිධායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී (1914–1918) ජාත්‍යන්තරවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර සමාජ-ජාතොන්මාදවාදීන් විවේචනය කරමින් ඇමෙරිකාව යුද්ධයට සහභාගි වීමට විරුද්ධව ප්‍රචාරක කටයුතු ගෙන ගියේය. අධිරාජ්‍ය විරෝධී ප්‍රචාරක කටයුතු නිසා 1918 දී සිරභාරයට ගන්නා ලදී. 1921 දී ඔහුට සමාව ලැබිණ.

තුර්ගේනියෙව්, ඉවාන් සෙර්ගේයවිච් — (1818-1883) රුසියානු ලේඛකයෙක්.

දබ්රලූබොව්, නිකලයි අලෙක්සාන්ද්‍රවිච් — (1836–1861) රුසියානු විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රිකයෙක්. සාහිත්‍ය විචාරකයෙක් හා ද්‍රව්‍යවාදී-දර්ශනිකයෙක්. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සම්භාවනීය ප්‍රාරම්භකයෙක්.

දාන් (ගුර්විච්), ෆේපයෝදර් ඉල්යිච් (1871–1947) මෙන්ෂෙවික් නායකයෙකි. 1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු පෙට්‍රොග්‍රෑඩ් සෝවියට් සභාවේ සාමාජිකයෙකුවද මධ්‍යම විධායක කාරක සභාවේ සභාපති මණ්ඩලයේ සාමාජිකයෙකුවද සිටියේය. ඔක්තෝබර් සමා-ජවාදී විප්ලවයට පසු සෝවියට් රජයට විරුද්ධව සටන් කළේය.

ලූතව්, අලෙක්සන්දර් ඉල්යිච් (1864-1921) සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි,

https://liberationbase.wordpress.com

ඔරෙන්බුර්ග් කොසැක් හමුදවේ අතමාන්වරයා. කොසැක් ප්‍රතිවිප්ලවවාදීන්ගේ නායකයෙක්.

පළමුවැනි නැපෝලියන් (බොනපාට්) (1796–1821) — 1804–1814 හා 1815 ප්‍රංශ අධිරාජයා.

දෙවැනි නිකොලායි (රොමානොව්) (1868–1918) — අවසාන රුසියානු අධිරාජයා, 1894 සිට 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය දක්වා සාර් රජ තනතුරු දැරුවේය.

ප්ලෙහානව්, ගියෝර්ගි වලෙන්තිනවිච් (1856–1918) — රුසියානු හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ සම්භාවනීය නායකයකු වූ මොහු රුසියාවේ මාක්ස්වාදය ප්‍රචාරය කළ පුරෝගාමියාය. රු. ස. ප්‍ර. ක. ප. දෙවැනි සම්මේලනයට පසු (1903) ප්ලෙහානව් අවස්ථාවාදය වැලඳ ගත්තේය. පසුව මෙන්ෂෙවිකයින්ට එකතු විය. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී සමාජ-ජාත්‍යොන්මාදවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය.

1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු මෙන්ෂෙවික්වරුන්ගේ අන්ත දක්ෂිණාංශික ආරක්ෂාවාදී ''යෙදින්ස්ත්වො'' කණ්ඩායමට නායකත්වය දුන්නේය. රුසියාව සමාජවාදය සඳහා තවම මෝරා නැති බව කියමින් බොල්ෂෙවික් වරුන්ටද, සමාජවාදී විප්ලවයටද විරුද්ධ විය. ඔහු ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට විරුද්ධ ආකල්පයක් දක්වූ නමුත් සෝවියට් රජයට විරුද්ධ සටන්වලට සහභාගි නොවීය.

පක්‍රොව්ස්කි, මිහයිල් නිකලායෙවිච් (1868–1932) — 1905 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකි. ප්‍රධාන පෙළේ සෝවියට් රාජ්‍ය සේවකයෙකි, සමාජ සේවකයෙක් හා ඉතිහාසඥයෙකි. බ්‍රෙස්ට් සාම ගිවිසුම අත්සන් කරන කාලයේ ''වාමාංශික කොමියුනිස්ට්වාදියෙකි''.

පමියලොව්ස්කි, නිකලායි ගෙරාසිමවිච් (1835-1863) — රුසියානු ලේඛකයෙක් හා ප්‍රජාතන්ත්‍රවාදියෙකි. ප්‍රසිද්ධ 'සැමනේරි සටහන්'' නමින් පළවූ කතාවල කර්තෘ වරයාය.

පළමුවැනි ශ්‍රේෂ්ඨ පීටර් (1672–1725) — රුසියානු සාර් රජ හා සමස්ත රුසියානු මහා අධිරාජයා (1682–1725)

බගයෙව්ස්කි. එම්. පී. (1881-1918) — දොන් ප්‍රදේශයේ ප්‍රතිවිප්ලවවාදී කටයුතුවලට සහභාගි විය. ප්‍රතිවිප්ලවවාදී ''දොන් ආණ්ඩුවට'' ඇතුලත් විය. ප්‍රතිවිප්ලවවාදී කටයුතු නිසා සිරභාරයට ගෙන නඩු අසා වෙඩිතබා මරාදමන ලදී.

බුහාරින්, නිකලායි ඉවානවිච් (1888-1938) — ප්‍රකාශකයෙක් හා අර්ථ ශාස්ත්‍රඥයෙක්. 1906 සිට රු. ස. ප්‍ර. ක. පක්ෂයේ සාමාජිකයෙකි. රජය, නිර්ධන පංතික ආඥාදායකත්වය, ස්වාධිපත්තිය සඳහා ජාතීන්ගේ ඇති අයිතිය හා වෙනත් ප්‍රශ්නවලදී මාක්ස්වාදී නොවන ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු වගකිවයුතු රාජ්‍ය තනතුරු කීපයක් ඉසිලුවේය. 1918 දී බ්‍රෙස්ට් සාම ගිවිසුම අත්සන් කිරීමේදී පක්ෂ විරෝධී ''වාමාංශික කොමියුනිස්ට්වරුන්ගේ'' කණ්ඩායමට නායකත්වය දුන්නේය. 1928 සිට දක්ෂිණාංශික අවස්ථාවාදී උපනතියට නායකත්වය දුන්නේය. පක්ෂවිරෝධී කටයුතු නිසා 1937 දී පක්ෂයෙන් නෙරපන ලදී.

මීර්බාහ් (Mirbach), විල්හෙල්ම් (1871-1918) ජර්මානු රාජ්‍ය දූතයෙකි. 1918 අප්‍රියෙල් මස සිට මොස්කව්හි ජර්මන් තානාපතිවරයාය. 1918 ජුලි 6 දින වාම එස්ආර් වරුන් විසින්, ජර්මනිය හා සෝවියට් රුසියාව අතර යුද්ධ ගිනි ඇවිලවීමේ අරමුන ඇතිව මරා දමන ලදී.

මිල්යුකොව්, ඉවාන් නිකලායෙවිච් (1859–1943) — කැඩෙට් පක්ෂයේ ආරම්භකයෙක් හා නායකයෙකි. 1917 දී ධනපති තාවකාලික රජයේ විදේශ කටයුතු භාර ඇමතිව සිටියේය. අධිරාජ්‍යවාදී යුද්ධය ''ජයග්‍රාහි අවසානයක් දක්වා'' ගෙනයාමේ ප්‍රතිපත්තිය ගෙන ගියේය.

මාක්ස් (Marx), කාල් (1818–1883).

මාර්තව්, එල්. (ට්සෙදර්බාවුම්, යූලි ඕසිපවිච්) (1873-1923) — මෙන්ෂෙවික් නායකයෙක්. පළමුවැනි අධිරාජවාදී ලෝක යුද්ධය කාලයේදී මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු මෙන්ෂෙවික් ජාත්‍යන්තරවාදීන්ගේ කණ්ඩායමට නායකත්වය දුන්නේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් රජයට විරුද්ධව වැඩ කළේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මෙරිංග් (Mehring), ප්‍රන්ත්ස් (1846-1919) — ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ වාමාංශික පිළේ එක් නායකයෙකි. ජර්මන් කොමියුනිස්ට් පක්ෂය ගොඩනැගීමේදී මූලික වැඩකොටසක් ඉටුකළේය.

රෙනෙර් (Renner), කාර්ල් (1870-1950) — ඕස්ත්‍රියානු දේශපාලනඥයෙකි. ඕස්ත්‍රියානු දක්ෂිණාංශික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නා නායකයා හා න්‍යායාචාර්යවරයාය. ''ජාතික-සංස්කෘතික ස්වාධිපත්‍යය නැමැති ධනපති-ජතිකවාදී න්‍යායයේ එක් කර්තෘවරයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී සමාජ-ජාතෝත්‍යාන්මාදවාදියෙකි.

රෙනොදෙල් (Renaudel), පියර් (1871-1935) — ප්‍රංශ සමාජවාදී පක්ෂයේ එක් සංශෝධනවාදී නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයෙදී (1914–1918) සමාජ-ජාතෝත්‍යාන්මාදවාදියෙකි.

රොමානොව් — දෙවැනි නිකොලායි (රොමානොව්) බලන්න.

ලට්සසාරි (Lazzari), කොන්ස්තන්තිනො (1857–1927) — ඉතාලියානු කම්කරු ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. ඉතාලියානු සමාජවාදී පක්ෂයේ එක් ප්‍රාරම්භකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී පක්ෂයේ මධ්‍යස්ථවාදී උපනතියට නායකත්වය දුන්නේය. 1917 ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු රුසියාවේ සෝවියට් රජයට සහයෝගයෙන් කටයුතු කළේය. කොමින්ටෙර්න් හි දෙවැනි හා තුන්වැනි සාකච්ඡා සභාවලට සහභාගි විය.

ලීබෙර් (ගොල්ද්මන්), මිහයිල් ඉසාකවිච් (1880–1937) — බුන්ද් සංවිධානයේ එක් නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී (1914–1918) සමාජ-ජාතෝත්‍යාන්මාදවාදියෙකි. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු පෙට්‍රොග්‍රෑඩ් කම්කරු හා සොල්දදු නියෝජිත බලමණ්ඩලයේද මධ්‍යම විධායක කාරක සභාවේ පළමුවැනි සැසිවාරයේ සභාපති මණ්ඩලයේද සාමාජිකයෙකුව සිටියේය. මෙන්ෂෙවික්වාදී පිළිවෙතක් ගෙනගියේය. සභාග රජයක් සඳහා පක්ෂපාතිත්වය දැක්වූවේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට සතුරු ආකල්පයක් දැක්වූවේය.

ලීබ්ක්නෙහ්ත් (Liebknecht), කාර්ල් (1871–1919) — ජර්මන් හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ වාමාංශික පිළේ එක් නායකයෙක්. පළමුවැනි අධිරාජ්‍යවාදී ලෝක යුද්ධය කාලයේදී විප්ලවවාදී ජාත්‍යන්තර පිළිවෙතක් අනුගමනය කළේය. ලීබ්ක්නෙහ්ත් ජර්මන් කොමියුනිස්ට් පක්ෂය ආරම්භ කළ අයගෙන් කෙනෙක් වූ අතර 1919 බර්ලින් නැගීසිටීමද මෙහෙය වූයේය. එම නැගීසිටීම මැඩපැවැත්වීමෙන් පසු ප්‍රතිවිප්ලවවාදීන් විසින් කෲර ලෙස මරා දමන ලදී.

ලුබෙර්සක් (Lubersac), ජාන් — ප්‍රංශ හමුද නිලධාරියෙකි. සිටුවරයෙක් හා රාජාණ්ඩුවාදියෙකි. 1917–1918 අවුරුදුවල රුසියාවේ සිටි ප්‍රංශ හමුද නිලධාරී මණ්ඩලයේ සිටියේය.

ලෙනින්, ව්ලදීමීර් ඉල්යිච් (1870–1924)

දෙවැනි විල්හෙල්ම් (ගොගෙන්ත්සොලෙර්න්) (1859–1941) — ජර්මන් අධිරාජයා හා ප්රුසියානු රජතුමාය. (1888–1918).

විල්සන් (Wilson), වුඩ්රෝ (1856–1924) — 1913–1921 අවුරුදුවල ඇමෙරිකානු ජනාධිපති වරයා. අධිරාජ්‍යවාදී රටවල් විසින් සෝවියට් රුසියාව ආක්‍රමණය කිරීම සංවිධානය කළ අයගෙන් කෙනෙකි. —

වින්නිචෙන්කො, ව්ලදීමිර් කිරිලවිච් (1880-1951) — උක්‍රෙනියන් ධනපති ජාතිකවාදියෙක්. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු උක්‍රෙනියන් ප්‍රතිවිප්ලවවාදී රාදවේ සංවිධායකයෙක් හා නායකයෙක් ලෙස කටයුතු කළේය. 1918–1919 උක්‍රෙනියාවේ ධනපති ජාතිකවාදී රජයේ නායකයාය.

ෂවුමියාන්, ස්තෙපාන් ගියෝර්ගියෙවිච් (1878–1918) — කොමියුනිස්ට් පක්ෂයේ සහ සෝවියට් රජයේ සම්භාවනීය නායකයෙකි. 1900 සිට පක්ෂයේ සාමාජිකයෙකි. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු බකූ නගරයේ කම්කරු නියෝජිතයින්ගේ සෝවියට් සභාවේ සභාපතිව සිටියේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු කොකේසියාව පිළිබඳ තාවකාලික අතිවිශේෂ කොමිසාර් හා බකූ මහජන කොමිසාර් මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කළේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

1918 අගෝස්තු මස බකු කොමියුනය බිඳවැටීමෙන් පසු බ්‍රිතාන්‍ය ආක්‍රමණිකයින් විසින් මෙන්ෂෙවික්වරුන්ගේ හා එස්ආර් වරුන්ගේ ආධාරය ඇතිව සිරභාරයට ගන්නා ලදුව බකු මහජන කොමිසාර් වරු 26 දෙනා සමග වෙඩි තබා මරා දමන ලදී.

ෂෙයිදමාන් (Scheidemann) පිලිප් (1865–1939) — ජර්මානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ අති දක්ෂිණාංශික අවස්ථාවාදී පිළේ නායකයෙකි. 1918 ජර්මනියේ නොවැම්බර විප්ලවය කාලයේ මහජන බල මණ්ඩලය තුළ සිටියේය. එම බල මණ්ඩලය ධනපති පංතියේ අවශ්‍යතාවය ආරක්ෂා කළ ආයතනයකි. 1918–1921 අවුරුදු වලදී ජර්මන් කම්කරු පංතිය කුරිරු ලෙස මර්ධනය කිරීම සංවිධානය කළ අයගෙන් කෙනෙකි.

ස්කරපාද්ස්කි, පාවෙල් පෙත්රොවිච් (1873–1945) — සාර් හමුදාවේ ජෙනරාල් වරයෙක්. ඔක්තෝබර් වාදියෙකි. 1918 අප්‍රියෙල් සිට දෙසැම්බර් දක්වා උක්රයිනයේ ධනපති රජයේ නායකයා විය. ජර්මන් අධිරාජ්‍යවාදීන්ගේ හෙන්චයියෙකි.

ස්පිරිදෝනව, මරියා අලෙක්සාන්ද්‍රව්නා (1884–1941) — එස්ආර් පක්ෂයේ නායිකාවකි. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු එස්ආර් පක්ෂයේ වාමාංශික පිළ සංවිධානය කිරීමට සහභාගි වූවාය. 1917 නොවැම්බර් මස එහි මධ්‍යම කාරක සභාවටද ඇතුලත් වූවාය. 1918 ජූලි මස වාම එස්ආර්වාදීන්ගේ ප්‍රතිවිප්ලවවාදී කැරැල්ලට උද්‍යෝගයෙන් සහභාගි වූ අයගෙන් කෙනෙකි.

ස්ටාලින්, යෝසිෆ් විසරියොනවිච් (1879–1953) — 1898 සිට පක්ෂයේ සාමාජිකයෙකි. 1912 සිට රු. ස. ප්‍ර. ක. (බො.) මධ්‍යම කාරක සභාවේ සාමාජිකත්වය ඉසිලුවේය.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට සූදනම් වන කාලයේ සහ විප්ලවය කාලයේ නැගීසිටීම සූදනම් කිරීම සඳහා පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් පිහිටුවන ලද යුද්ධ-විප්ලවවාදී කොමිටියට ඇතුලත් විය.

1917 නොවැම්බර් සිට 1923 ජූලි දක්වා ජාතික ප්‍රශ්න පිළිබඳ මහජන කොමිසාර් ලෙසද 1919 මාර්තු සිට රජයේ පාලන අංශය භාර මහජන කොමිසාර් ලෙසද පසුව (1922 අප්‍රියෙල් දක්වා) කම්කරු හා ගොවි පරීක්ෂක කටයුතු පිළිබඳ මහජන කොමිසාර් ලෙසද කටයුතු

කළේය. රු. කො. (බො.) පක්ෂයේ දේශපාලන බල මණ්ඩලයේ සාමාජිකයෙකි. සිවිල් යුද්ධය කාලයේදී සමූහාණ්ඩුවේ හා යුද පෙරමුණු ගණනාවක යුද්ධ විප්ලවවාදී කොමිටියේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කළේය.

1922 පක්ෂ මධ්‍යම කාරක සභාවේ ප්‍රධාන ලේකම් ධූරයට තේරී පත්විය. 1941 සිට මහජන කොමිසාර් මණ්ඩලයේ සභාපති ධූරයද පසුව අමාත්‍ය මණ්ඩලයේ සභාපති ධූරයද දැරුවේය.

පක්ෂ මධ්‍යම කාරක සභාවේ ප්‍රධාන ලේකම් ධූරයේ දීර්ඝ කාලයක් වැඩ කළ ස්ටාලින් පක්ෂයේ අනෙකුත් නායකයින් සමග සමාජවාදය ගොඩ නැගීම සඳහා විශාල සටනක් ගෙන ගියේය. පක්ෂ විරෝධී උපනති විනාශ කිරීමේදී විශේෂයෙන්ම ට්‍රොට්ස්කිවාදය හා දක්ෂිණාංශික අවස්ථාවාදය විනාශකිරීමේදී ඔහු විශාල මෙහෙයක් ඉටු කළේය.

ඒ කෙසේ වෙතත්, කොමියුනිස්ට් පක්ෂය විසින් මාක්ස්-ලෙනින් වාදයට විරුද්ධ පුද්ගලාභිවාදනය නමින් හඳුන්වන ලද, සෝවියට් සමාජය තුළ සිදුවූ වැරැදිද ඔහුගේ නම හා සම්බන්ධය.

ස්තලිපින්, පියෝතර් අර්කාදියෙවිච් (1862–1911) — සාර් රුසියාවේ රාජ්‍ය නායකයෙක්. 1906–1911 අවුරුදු වලදී ඇමති මණ්ඩලයේ සභාපති හා විදේශ කටයුතු භාර ඇමති ලෙස ක්‍රියාකළේය. විප්ලවවාදී ව්‍යාපාරය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව කරන ලද කෲර පීඩන මරණීය දණ්ඩන හා සිර ගෙවල ලෑම ආදිය (ස්තලිපින් ප්‍රතිගාමීත්වය) ඔහුගේ නම හා සම්බන්ධය.

සරෝකින්, පිතිරිම් අලෙක්සාන්ද්‍රවිච් (1889–1968) ධනපති සමාජ විද්‍යාඥයෙක්. එස්ආර් වාදියෙක්. 1917 දක්වා පෙට්‍රොග්‍රෑඩ් විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙක් ලෙස වැඩ කළේය. 1919–1922 දක්වා පෙට්‍රොග්‍රෑඩ් උසස් අධ්‍යාපන ආයතනවල සමාජ විද්‍යා ගුරුවරයෙකු ලෙස කටයුතු කළේය. ප්‍රතිවිප්ලවවාදී කටයුතු නිසා රටින් නෙරපන ලදී.

සදූල් (Sadoul), ජාක් (1881–1956) — ප්‍රංශ හමුද නිලධාරියෙක්. ප්‍රංශ සමාජවාදී පක්ෂයේ සාමාජිකයෙක්. 1917 දී ප්‍රංශ යුද්ධ හමුද නියෝජිතයෙකු ලෙස රුසියාවට පැමිණියේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයේ ආභාෂය ලැබ කොමියුනිස්ට්වාදී දෘෂ්ටිය පිළිබඳ උද්යෝගයක් දැක්වූ ඔහු ස්වකැමැත්තෙන් රතු හමුදවට බැඳුනේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සෝවියට් රුසියාව එන්ටෝන්ටෙ හමුද විසින් ආක්‍රමණය කිරීමට විරුද්ධව පුවත් පත් මගින් උද්ඝෝෂණය කළේය.

<u>සවින්කොව්, බරිස් වික්තරවිච්</u> (1879–1925) — එස්ආර් පක්ෂයේ නායකයෙක්. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු ධනපති තාවකාලික රජයේ නියෝජ්‍ය යුද ඇමති තනතුරද පසුව පෙත්‍රොග්‍රෑඩ් හමුද අග්‍රාණ්ඩුකාර තනතුරද ඉසිලුවේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු ප්‍රතිවිප්ලවවාදී කැරැලි කීපයක්ම සංවිධානය කළ අතර සෝවියට් සමූහාණ්ඩුවට විරුද්ධ යුද්ධ ආක්‍රමනවලට සහයෝගය දුන්නේය. පසුව විදේශගත විය.

<u>සෙම්යොනොව්, ග්‍රිගෝරි එම්.</u> (1890–1946) — බයිකාල් සමුද්‍රය ප්‍රදේශයේ කොසැක් හමුදවල අතමාන්වරයා. සෝවියට් රජයට විරුද්ධව ඇත පෙරදිග හමුද මෙහෙයවූයේය. බයිකාල් හා අමූර් ගඟ ප්‍රදේශවල ප්‍රතිවිප්ලවවාදී රජයේ සංවිධායකයාය.

<u>සෙරෙද, සෙමියොන් පf්ජනුතියෙවිච්</u> (1871–1933) — සම්භාවනීය සෝවියට් රාජ්‍ය නායකයෙකි. 1903 දී බොල්ෂෙවික් පක්ෂයට බැඳුනු ඔහු ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් සභාවල සහ ආර්ථික අංශයේ වගකිවයුතු තනතුරු දැරුවේය.

<u>හින්දෙන්බුර්ග් (Hindenburg), පාවුල්</u> (1847–1934) — ජර්මන් යුද හමුද හා රාජ්‍ය නායකයෙක්, ජෙනරල්- පිල්ඩ් මාර්ෂල්. ජර්මන් අධිරාජ්‍ය-වාදයේ ප්‍රතිගාමී හා ජාත්‍යොන්මාද වාදී නියෝජිතයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී ජර්මන් හමුදවේ පෙරදිග යුද පෙරමුණ මෙහෙයවූයේය. පසුව ජර්මන් හමුද මූලස්ථානයේ ප්‍රධාන තනතුරට පත්විය. සෝවියට් රජයට විරුද්ධව කළ හමුද ආක්‍රමණය සංවිධානය කළේය. 1918 ජර්මනියේ නොවැම්බර් විප්ලවය මර්ධනය කිරීමට සහභාගි විය. 1925–1934 අවුරුදුවලදී වෙයිමර් සමූහාණ්ඩුවේ ජනාධිපති තනතුර ඉසිලුවේය.

<u>හෙන්ඩර්සන් (Henderson), ආතර්</u> (1863–1935) — ලේබර් පක්ෂයේ හා බ්‍රිතාන්‍ය වෘත්තීය සමිති ව්‍යාපාරයේ නායකයෙකි. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු අධිරාජ්‍යවාදී යුද්ධය තවදුරටත් කරගෙන යෑම දිරිගැන්වීම සඳහා රුසියාවට පැමිණියේය. 1919 දී බර්න් (දෙවැනි) ජාත්‍යන්තරය සංවිධානය කිරීමට සහභාගි විය. බ්‍රිතාන්‍යයේ ධනපති රජයන්ට කීපවතාක්ම ඇතුළු විය.

පාඨකයින් වෙතටයි

මෙම පොතෙහි අඩංගු කරුණු, අනුවාදය හා මුද්‍රණය පිළිබඳව ඔබගේ අදහස් දන්වා එවීමෙන් ප්‍රගති ප්‍රකාශක මන්දිරයේ කෘතඥතාව ඔබට හිමිවේ. ඔබගේ වෙනත් යෝජනා ඇතොත් අපි එය කරුණාවෙන් බාර ගනිමු.

අපේ ලිපිනය:

Progress Publishers,
17, Zubovsky Boulevard,
Moscow, USSR

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

- කෘතිය: ලෙනින් තෝරාගත් කෘති වෙළුම් දොළහ, වෙළුම 8
- කතෘ/පරිවර්තක: වී.අයි. ලෙනින්/උ. මු. අබයරත්න
- ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
- පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-22
- ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-22, V2:2019-05-29
- පිටු ගණන: 272
- භාෂා මාධ්‍ය: සිංහල
- ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com